පටුන

මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ භාවිතයට පහසු යුනිකෝඩ් අකුරු ක්‍රමයට සකසා http://pitaka.lk වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# සංයුත්ත නිකාය

# 4

ධර්මවිනය උගත් පණ්ඩිත

**මහාස්ථවිරයන් වහන්සේලාගේ**

ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**

**ඒ. පී. ද සොයිසා මහතා**

**විසින්**

**සිංහලට පරිවර්තනය කරන ලදී.**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# අනුශාසක මණ්ඩලය

පැලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නායක මාහිමියන්වහන්සේ

මාලිගාකන්දේ විද්‍යොදය පිරිවෙනේ B.A., PH.D. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ

කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ

පින්වත්තේ සද්ධර්මාකර පරිවෙණාධිපති ශ්‍රී විසුද්ධාචාර්ය ධර්මකීර්ති ශ්‍රී පෝහද්දරමුල්ලේ ඤාණානන්දාභිධාන අමරපුර සිරි සද්ධම්මවංස නිකායේ මහා නායක ස්ථවිරයන්වහන්සේ

වැලිතර මහාකප්පිණ මුදලින්දාරාමස්ථ රාජපක්ෂ පරිවෙණාධිපති ගරු රත්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන්වහන්සේ

බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ

බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඤාණවිමල ස්ථවිරයන්වහන්සේ

රත්දොඹේ මහාචෛත්‍ය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සොමාලොක නායක ස්ථවිරයන්වහන්සේ

අඹගහපිටියේ සුගත ශාසනොදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ

අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ

ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ

බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ

මාදම්පේ සුනන්දොදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ

රත්දොඹේ සංඝරාජ විහාරස්ථ ශික්ෂාලංකාර පරිවෙණාධිපති බලපිටියේ පණ්ඩිත විසුධාලොක ස්ථවිරයන්වහන්සේ

මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ

පණ්ඩිත එච්. නන්දසාර මහතා

ආචාර්‍ය්‍ය ආර්‍ය්‍යරත්න රේරුකාන මහතා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පටුන



# සංයුත්ත නිකාය

# 4

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

**සීමාසහිත**
**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.
http://pitaka.lk

ප්‍රථම මුද්‍රණය - 1956
දෙවැනි මුද්‍රණය - 2013

**ත්‍රිපිටකය**

**සංයුත්ත නිකාය 4**

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
පාලිත සේනානායක

අක්ෂර සංයෝජනය:
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනය:
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක 'පාළි' නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඤාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැඟීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත්

යොමු කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාළි පොත් සමාගම පාළි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැගීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඤාණවිමල මහානායක ස්ථවිර**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය

කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මග පෙන්වූ මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඤාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මග පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගනේවත්ත මහතාටත්, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තුතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තුතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2013 මාර්තු

# සංඥාපනය

සිංහල ත්‍රිපිටක ධර්ම පොත් පෙළේ දොළොස් වෙනිවූ මේ පොතට සංයුත්ත නිකායේ ඛන්ධක වර්ගයේ අවසානය දක්වා සංයුත්තද අන්තර්ගත කළෙමි. මහ සඟි පහ අතුරෙන් මෙම නිකාය එක සඟියකි. පළමුවෙනි සඞ්ගායනාවේදී සංයුත්ත නිකාය භාරකරන ලද්දේ මහා කාශ්‍යප ශ්‍රාවක තෙරුන්වහන්සේට වේ. මේ නිකාය සගාථ වර්ගය, නිදාන වර්ගය, ඛන්ධක වර්ගය, සළායතන වර්ගය, මහා වර්ගයයි කොටස් පහකට බෙදා තිබේ. එහි ඇති සංයුත්ත පනස් හතරෙහි සූත්‍ර 7762 ක් වෙත්.

මේ පොත් ලියා ප්‍රසිද්ධ කිරීමට නොයෙක් පළාත්වල සංඝයා වහන්සේලා දුන් ආධාරය මහත් උපකාරයක් විය.

මේ පොත් පෙළ කියවීමට නොයෙක් තරාතිරම්වල පින්වතුන් දක්වන උනන්දුව ප්‍රීතියට කරුණක් වේ. සමහර පාඨශාලා ශිෂ්‍යයන් විසින්ද මේ පොත් පිළිවෙළට කියවීමට පටන් ගෙන තිබේ.

බොහෝ වැඩ කටයුතුවල යෙදී සිටින කාලයක, ශාසන ආලයෙන් ආචාර්ය ආයඞරත්න රේරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාර මහත් බව නැවතත් දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආයඞරත්න රේරුකාන මහත්මයාගෙන් ආධාර ලැබුණා පමණක් නොව රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන් වහන්සේද, පින්වත්තේ සද්ධර්මාකර පිරිවෙනේ ආචාර්ය මණ්ඩලයද, තල්පාවිල රත්නසිරි ස්ථවිරයන් වහන්සේද ආධාර කළෝය.

මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත් බෞද්ධ උපාසක පින්වතුන්ටත් සාමාජිකයින් වශයෙන් පොත් ගැනීමට බැඳී සිටින පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

21 - 12 - 54

# සූත්‍ර ගැන දැනගත යුතු කරුණු ස්වල්පයක්

**බණවර** - 'අකුරු' අටක් එක පදයක් වේ. පද සතරක් ග්‍රන්ථයක් වේ. එනම් අකුරු තිස්දෙකක් ග්‍රන්ථයක් වේ. අකුරු 32 කින් යුත් ග්‍රන්ථ දෙසිය පණහක් බණ වරෙක් වේ. එබැවින් බණ වරක අකුරු අටදහසක් ඇත්තේය.

**නිදානය** - ඒ ඒ සූත්‍රවල උත්පත්ති ස්ථානයයි - සැවැත් නුවර, රජගහ නුවර ආදි ස්ථානයි.

**පුද්ගල තෙම** - ඒ ඒ සූත්‍ර ධර්මයන් දේශනා කිරීමට කාරණ වූ පුද්ගලයායි.

**උද්දේශය** - තේරුම්කර සිහිකරවන කරුණ - හෝ සූත්‍රයේ මාතෘකාව.

**නිර්දේශය** - විස්තර සහිත තේරුම් කිරීම.

**සූත්‍රනාමය** - සූත්‍රනාම නොයෙක් ආකාරයෙන් යෙදී තිබෙන බව පෙනේ - (1) මාතෘකාව අනුව යෙදෙන නාම - මහාසතිපට්ඨාන සූත්‍රය,

(2) දෙශනා කරනු ලැබූ පුද්ගලයා අනුව දෙන නාම - සිගාලෝවාද සූත්‍රය.

(3) සිදුවූ කරුණක් අනුව දෙන නාමය - මහාපරිනිබ්බාණ සූත්‍රය.

(4) බුදුරජාණන් වහන්සේ විසින් අනුමත කරන නාමය අනුව ලැබෙන නාමය - සීහනාද සූත්‍රය

(5) බුදුරජාණන් වහන්සේගෙන් අසන ලද ප්‍රශ්නවලට උත්තර වශයෙන් දෙශනා කරන ලද සූත්‍ර - සක්කපඤ්හ සූත්‍රය.

(6) ඒ ඒ කරුණු මාතෘකා කරගෙන විස්තර කර දීමට දෙශනා කරනලද සූත්‍රවලට දී තිබෙන නාම - සාමඤ්ඤඵල සූත්‍රය.

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා
ඒ නම් මත **click** කරන්න, නැතිනම් වම් පස
**bookmarks** තීරුව භාවිතා කරන්න.



# පටුන

පිට

## 3. ඛන්ධක වර්ගය

1. ඛන්ධක සංයුත්තය
(8) ඛජ්ජනීය වර්ගය 1325
(9) ථෙර වර්ගය 1369
(10) පුප්ඵ වර්ගය 1432
(11) අන්ත වර්ගය 1473
(12) ධර්මකථික වර්ගය 1484
(13) අවිජ්ජා වර්ගය 1506
(14) කුක්කුල වර්ගය 1520
(15) දිට්ඨි වර්ගය 1531
2. රාධ සංයුත්තය
(1) පළමුවෙනි වර්ගය 1555
(2) දෙවෙනි වර්ගය 1567
(3) ආයාචන වර්ගය 1577
(4) උපනිසින්න වර්ගය 1591
3. දිට්ඨි සංයුත්තය
(1) සොයෙච පෙයාාල වර්ගය 1603
(2) පෙයාාල වර්ගය 1695
(3) පෙයාාල වර්ගය 1726
(4) පෙයාාල වර්ගය 1735
4. ඔක්කන්ත සංයුත්තය 1744
5. උප්පාද සංයුත්තය 1755
6. කිලෙස සංයුත්තය 1766
7. ශාරිපුත්ත සංයුත්තය 1771
8. නාග සංයුත්තය 1779
9. සුපණ්ණ සංයුත්තය 1788
10. ගන්ධබ්බ සංයුත්තය 1792
11. වලාහක සංයුත්තය 1798
12. වච්ඡගොත්ත සංයුත්තය 1804
13. ධ්‍යාන සංයුත්තය 1809

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# සංයුත්ත නිකාය

# 3. ඛන්ධක වර්ගය

## 1. ඛන්ධ සංයුක්තය.

### 8. ඛජ්ජනීය වර්ගය.

(නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස)

### 1. අස්සාද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, අශ්‍රැතවත් පුථුජ්ජනතෙමේ රූපයාගේ ආශ්වාදයද, (රසවිඳීම) ආදීනවයද, (දෝෂයද) නිස්සරණයද තත්වූ පරිදි නොදනියි, වේදනාවගේ ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද, තත්වූ පරිදි නොදනියි.

"සංඥාවගේ ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිදි නොදනියි. සංස්කාරයන්ගේ ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිදි නොදනියි. විඥානයාගේ ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිදි නොදනියි.

3. "මහණෙනි, ශ්‍රැතවත් ආර්යශ්‍රාවකතෙමේ රූපයාගේ ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූපරිදි දනියි. වේදනාවගේ ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද, තත්වූ පරිදි දනියි. සංඥාවගේ ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිදි දනියි සංස්කාරයන්ගේ ආශ්වාදයද, ආදීනවයද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නිස්සරණයද තත්වූ පරිදි දනියි. විඤ්ඤාණයාගේ ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිදි දනියි" වදාළේය.

**(පළමුවෙනි අස්සාද සූත්‍රය නිමි.)**

---

## 2. සමුදය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, අශ්‍රැතවත් පුථුජ්ජනතෙමේ රූපයාගේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද, තත්වූ පරිදි නොදනියි. වේදනාවගේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිදි නොදනියි. සංඥාවගේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිදි නොදනියි. සංස්කාරයන්ගේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිදි නොදනියි. විඥානයාගේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද, තත්වූ පරිදි නොදනියි.'

3. "මහණෙනි, ශ්‍රැතවත් ආර්යශ්‍රාවකතෙමේ රූපයාගේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිදි දනියි. වේදනාවගේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිදි දනියි. සංඥාවගේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිදි දනියි. සංස්කාරයන්ගේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිදි දනියි. විඥානයාගේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිදි දනීයයි" වදාළේය.

**(දෙවෙනි සමුදය සූත්‍රය නිමි.)**

---

## 3. අරහන්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකතෙමේ රූපයාගේ හටගැණීමද, විනාශයද, ආස්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූපරිදි දනියි. වේදනාවගේ හටගැණීමද, විනාශයද, ආස්වාදයද, ආදීනවයද, නිස්සරණයද, තත්වූපරිදි දනියි. සංඥාවගේ හටගැණීමද, විනාශයද, ආස්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූපරිදි දනියි. සංස්කාරයන්ගේ හටගැණීමද, විනාශයද, ආස්වාදයද, ආදීනවයද, නිස්සරණයද, තත්වූ පරිදි දනියි. විඤ්ඤාණයාගේ හටගැණීමද, විනාශයද, ආස්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූපරිදි දනියි, යනුයි.

**(තුන්වෙනි අරහන්ත සූත්‍රය නිමි.)**

---

## 4. අරහන්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, රූපය අනිත්‍යය. යමක් අනිත්‍යද එය දුකය. යමක් දුකද එය අනාත්මය. යමක් අනාත්මද 'එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවෙයි.' මෙසේ මෙය තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුයි.

"වේදනාව අනිත්‍යය, යමක් අනිත්‍යද එය දුකය. යමක් දුකද එය අනාත්මය. යමක් අනාත්මද 'එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවෙයි.' මෙසේ මෙය තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් දතයුතුයි.

"සංඥාව අනිත්‍යය. යමක් අනිත්‍යද එය දුකය යමක් දුකද එය අනාත්මය. යමක් අනාත්මද 'එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවෙයි.' මෙසේ මෙය තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් දතයුතුයි.

"සංස්කාරයෝ අනිත්‍යය. යමක් අනිත්‍යද එය දුකය. යමක් දුකද එය අනාත්මය. යමක් අනාත්මද 'එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවෙයි.' කියා මෙසේ මෙය තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් දතයුතුයි.

"විඥ්ඤාණය අනිත්‍යය. යමක් අනිත්‍යද එය දුකය. යමක් දුකද එය අනාත්මය. යමක් අනාත්මද 'එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි ඒ මාගේ ආත්මය නොවෙයි.' කියා මෙසේ මෙය තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් දතයුතුයි.'

3. "මහණෙනි, මෙසේ දක්නාවූ, ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවක තෙමේ රූපයෙහිද කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයන්හිද කලකිරෙයි. විඥ්ඤාණයෙහිද කලකිරෙයි. කලකිරුනේ නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේයයි ඥාණය ඇති වෙයි. ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවන ලදී. කටයුතුකොට නිමවන ලද්දේය. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැත්තේයයි දනියි.

4. "මහණෙනි, ලෝකයෙහි යම් පමණ සත්වයන් වාසය කරන ස්ථාන වෙත්ද, යම් පමණ භවාග්‍රව වෙත්ද, යම් මේ රහත්හු වෙත්ද, ඒ රහත්හුම ලෝකයෙහි අග්‍ර වෙත්. ශ්‍රේෂ්ඨ වෙත්"යි භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය.

5. මෙය වදාරා සුගතයන් වහන්සේ නැවතත් මෙසේද වදාළේය.

(1) "රහත්හු ඒකාන්තයෙන් සැප ඇත්තෝය. ඔවුන්ට තෘෂ්ණාව නැත. (නව වැදෑරුම්) මානය සිඳින ලදී. මොහය නමැති දැල පලා දමන ලදී.

(2) "ඔව්හු තෘෂ්ණාව නැති බවට පැමිණියහ. ඔවුන්ගේ සිත පිරිසිදුය. ලෝකයෙහි නොඇලුණාවූ ආශ්‍රව රහිතවූ ඔව්හු ශ්‍රෙෂ්ඨවූහ.

(3) "පඤ්චස්කන්ධයන් පිරිසිඳ දැන (සද්ධා, හිරි, ඔතප්ප, බාහුසච්ච විරිය, සති, සඤ්ඤා යන මේ) සත් ධර්මය ගෝචරකොට ඇත්තාවූ සත්වැදෑරුම් බෞද්ධාංග රත්නයෙන් සමන්විතවූ, ත්‍රිවිධ ශික්ෂාවෙහි හික්මුණාවූ, ප්‍රශංසාවට සුදුසුවූ සත්පුරුෂවූ, බුදුරජාණන් වහන්සේගේ ඖරෂපුත්‍රවූ ඒ මහාවීරයෝ දුරු කළ භය ඇතිව හැසිරෙත්.

(4) "දස අංගයකින් සමන්විතවූ, මහා නාගවූ, සමාධියෙන් යුත් සිත් ඇති ඔව්හු ලෝකයෙහි ශ්‍රේෂ්ඨයෝ වෙති. ඔවුන්ට තෘෂ්ණාව නැත්තේය.

(5) "අර්හත්ඵල ඥානය ලැබුවාවූ, ඔවුන්ගේ මේ අන්තිම ආත්මයයි. බ්‍රහ්මචරියාවගේ සාරයවූ යම් රහත් ඵලයක් වේද ඒ පිණිස සෙවිය යුතු අන්ප්‍රත්‍යයක් නැතැයි ප්‍රත්‍යක්ෂ වශයෙන් දැනගත්තාහු වෙත්.

(6) "ඔව්හු ත්‍රිවිධ මානයන්හි කම්පා නොවෙත්. පුනරුත්පත්තියෙන් මිදුණාහ. දන්තභූමියයයි නම්ලද රහත්ඵලයට පැමිණියාවූ ඔව්හු ලොකයෙහි දිනුවාහු නම් වෙති.

(7) "අතීතවූද, වර්තමානවූද, අනාගතවූද, ස්කන්ධයන් කෙරෙහි ඔවුනට නන්දි සංඛ්‍යාත ඇල්මක් නැත. ඔව්හු ලෝකයෙහි බුදුවරයෝ අති උත්තමයහයි සිංහනාද කරත්."

**(හතරවෙනි අරහන්ත සූත්‍රය නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

## 5. සීහො සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, රූපය අනිත්‍යයි, යමක් අනිත්‍ය නම් එය දුකය. යමක් දුක නම් එය අනාත්මය. යමක් අනාත්ම නම් 'එය මාගේ නොවේය. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවෙයි.' මෙසේ මේ තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුයි.

"වේදනාව අනිත්‍යයි, යමක් අනිත්‍ය නම් එය දුකය. යමක් දුක නම් එය අනාත්මය. යමක් අනාත්ම නම් 'එය මාගේ නොවේය. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවෙයි.' මෙසේ මෙය තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුයි.

"සංඥාව අනිත්‍යයි, යමක් අනිත්‍ය නම් එය දුකය. යමක් දුක නම් එය අනාත්මය. යමක් අනාත්ම නම් 'එය මාගේ නොවේය. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවෙයි.' මෙසේ මෙය තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුයි.

"සංස්කාරයෝ අනිත්‍යයි, යමක් අනිත්‍ය නම් එය දුකය. යමක් දුක නම් එය අනාත්මය. යමක් අනාත්ම නම් 'එය මාගේ නොවේය. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවෙයි.' මෙසේ මෙය තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුයි.

"විඥානය අනිත්‍යය, යමක් අනිත්‍ය නම් එය දුකය. යමක් දුකනම් එය අනාත්මය. යමක් අනාත්ම නම් 'එය මාගේ නොවෙයි. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවෙයි.' මෙසේ මෙය තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් දතයුතුයි.

3. "මහණෙනි, මෙසේ දන්නාවූ ආර්යශ්‍රාවකතෙමේ රූපය කෙරෙහිද කලකිරෙයි. වේදනාව කෙරෙහිද කලකිරෙයි. සංඥාව

කෙරෙහිද කලකිරෙයි. සංස්කාරයන් කෙරෙහිද කලකිරෙයි. විඥානය කෙරෙහිද කලකිරෙයි. කලකිරුනේ නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේය යන නුවණ පහළවෙයි. ඉපදීම ක්ෂයවිය. බ්‍රහ්මචර්යාවෙහි වැස නිමවන ලද්දේය. කටයුතුකොට නිමවන ලද්දේය. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දනී.

"මහණෙනි, සත්වාවාසයෝ යම් පමණ වෙත්ද, භවාග්‍ර යම් පමණ වෙත්ද, යම් ඒ රහත්වූ වෙත්ද, ඔව්හු ලෝකයෙහි අග්‍රවෙති. ශ්‍රෙෂ්ඨ වෙතියි" වදාළේය.

**(පස්වෙනි සීහො සූත්‍රය නිමි.)**

---

## 6. ඛජ්ජන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය.

2. "මහණෙනි, මෘගයන්ට රජවූ සිංහතෙම සවස් කාලයෙහි ස්වකීය වාසස්ථානයෙන් නික්මෙයි. නික්මී ඇඟ කිලිපොලයි. ඇඟ කිලිපොවා හාත්පස සිව්දිග බලයි. හාත්පස සිවුදිග බලා තුන්වරක් සිංහනාද කරයි. තුන්වරක් සිංහනාද කොට ගොදුරු පිණිස නික්මෙයි.

"මහණෙනි, නාදකරන්නාවූ මෘගයන්ට රජවූ සිංහයාගේ නාදය යම්කිසි තිරිසන්ගත ප්‍රාණීහු අසත්ද, ඔව්හු බෙහෙවින් බියටද, තැති ගැණීමටද, සංවේගයටද පැමිණෙත්. බිලවල වාසය කරන සත්වයෝ බිලවලට පිවිසෙත්. ජලයෙහි වසන සත්වයෝ එහිවූ වාසස්ථානලට පිවිසෙත්. වනයෙහි වසන සත්වයෝ එහි වාසස්ථානවලට පිවිසෙත්. පක්ෂීහු අහසට නැගෙත්.

3. "මහණෙනි, ගම් නියම්ගම් රාජධානිවල දැඩිවූ වරපට වලින් බඳනාලද රජහුගේ යම් ඒ හස්ථිහු වෙත්ද, ඔව්හුද ඒ බන්ධනයන් සිඳගෙන බිඳගෙන මලමුත්‍ර හෙලමින් ඒ මේ අත පලායත්.

"මහණෙනි, තිරිසන්ගත සතුන් අතුරෙහි මෘගයන්ට රජවූ සිංහතෙමේ මෙසේ මහත් ඍද්ධි ඇත්තේද, මෙසේ මහේශාක්‍යවූයේද, මෙසේ මහත් ආනුභාව ඇත්තෙක්ද වෙයි.

4. "මහණෙනි, එපරිද්දෙන්ම වනාහි අර්හත්වූ අෂ්ට විද්‍යා පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්තවූ, යහපත් ගති ඇත්තාවූ, සියලු ලෝකයන් දත්තාවූ, අති උතුම්වූ පුරිසදම්ම සාරථිවූ දෙව් මිනිසුන්ට ශාස්තෘවූ චතුස්සත්‍යයාවබෝධකළාවූ භාග්‍යවත්වූ තථාගතයන් වහන්සේ යම් කලෙක්හි ලොව උපදීද, ඒ භාග්‍යවත්තෙමේ 'මේ රූපය වෙයි. මේ රූපයාගේ හේතුව වෙයි. මේ රූප නිරෝධයයි.

'මේ වේදනාව වෙයි, මේ වේදනාවේ හේතුව වෙයි, මේ වේදනාවේ නිරෝධයයි.

'මේ සංඥාව වෙයි, මේ සංඥාවේ හේතුව වෙයි, මේ සංඥාවේ නිරෝධයයි.

'මේ සංස්කාරයෝය. මේ සංස්කාරයන්ගේ හේතුවය, මේ සංස්කාරයන්ගේ නිරෝධයයි.

'මේ විඥානයය, මේ විඥානයාගේ හේතුවය, මේ විඥාන නිරෝධයයි' දහම් දෙසයි.

4. "මහණෙනි, දීර්ඝායුෂ ඇති වර්ණවත්වූ, සැප බහුලවූ, උසස් විමානවල වාසය කරන්නාවූ යම් ඒ දෙවියෙක් වෙත්ද, ඔව්හුද තථාගතයන් වහන්සේගේ ධර්මදේශනාව අසා 'පින්වත්නි, අපි වනාහි අනිත්‍යවූවාහුම නිත්‍යයයි සිතුවෙමු.

'පින්වත්නි, අපි වනාහි අස්ථිරවූවාහුම ස්ථිරයයි සිතුවෙමු.

'පින්වත්නි, අපි වනාහි අසදාකාලිකවූවාහුම සදාකාලික යයි සිතුවෙමු.

'පින්වත්නි, අපි වනාහි අනිත්‍යවූ අස්ථිරවූ සදාකාලික නොවූ පඤ්චස්කන්ධයෙන් යුක්තවූවෝ වෙමුයයි. බොහෝසේ බියට තැති ගැනීමට සංවේගයට පැමිණෙත්.

5. "මහණෙනි, මෙසේ තථාගතතෙමේ දෙවියන් සහිත ලෝකයා අතරෙහි මෙසේ මහත් ඍද්ධි ඇත්තේ මෙසේ මහේශාක්‍යවූයේ මෙසේ මහත් ආනුභාව ඇත්තේ වෙයි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය. ශාස්තෲවූ සුගතයන් වහන්සේ මෙය වදාරා නැවත මෙසේ වදාළේය.

1. "දෙවියන් සහිත ලෝකයාගේ ශාස්තෲවූ අප්‍රති පුද්ගලවූ බුදුරජතෙමේ පඤ්චස්කන්ධයද, පඤ්චස්කන්ධයාගේ හේතුවද හටගැන්මද, පඤ්චස්කන්ධ නිරෝධයද, දුක් සංසිඳීමට පමුණුවන්නාවූ, ආර්ය අෂ්ටාංගික මාර්ගයද දැන ධර්මචක්‍රය පැවැත්වීමද,

2. "එකල දීර්ඝායුෂ්කවූ වර්ණවත්වූ යසස් ඇත්තාවූ යම් ඒ දෙවියෝවූවාහුද, ඔව්හු කෙලෙසුන්ගෙන් මිදුනාවූ ගුණයෙන් යුක්තවූ රහතුන් වහන්සේගේ දේශනාව අසා 'පින්වත්නි, පඤ්චස්කන්ධය නොයික්ම සිටියාවූ අපි වනාහි අනිත්‍යයම්හයි' අවශෙෂ සිවුපාවුන් සිංහයාට යම්සේද එමෙන් භයපත්වූවාහු තැති ගැනීමට පැමිණියාහු වෙති."

**(හයවෙනි ඛජ්ජන සූත්‍රය නිමි.)**

---

## 7. පිණ්ඩොල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, පෙර විසූ උත්පත්ති පිළිවෙළ සිහිකරන්නාවූ යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ නොයෙක් පෙර විසූ උත්පත්ති පිළිවෙළ සිහිකරද්ද, ඒ සියලුදෙනා, උපාදානස්කන්ධ පස හෝ එයින් එක්තරා ස්කන්ධයක් හෝ සිහිකරත්.

"මහණෙනි, 'අතීතකාලයෙහි මම මෙබඳු රූප ඇත්තෙක් වීමියි' සිහිකරන තැනැත්තේ රූපයම සිහිකරයි. 'අතීත කාලයෙහි මෙබඳු වේදනා ඇත්තෙක් වීමියි', මහණෙනි, මෙසේ හෝ සිහිකරන තැනැත්තේ වේදනාවම සිහිකරයි. අතීත කාලයෙහි මෙබඳු සංඥා ඇත්තෙක් වීමියි', මහණෙනි, මෙසේ හෝ සිහිකරන තැනැත්තේ සංඥාවම සිහිකරයි. 'අතීත කාලයෙහි මෙබඳු සංස්කාර ඇත්තෙක් වීමියි', මහණෙනි, මෙසේ හෝ සිහිකරන තැනැත්තේ සංස්කාරයන්ම සිහිකරයි. 'අතීත කාලයෙහි මෙබඳු විඥාන ඇත්තෙක් වීමියි', මහණෙනි, මෙසේ හෝ සිහිකරන තැනැත්තේ විඥානයම සිහිකරයි.

**3.** "මහණෙනි, රූපය කුමකැයි කියව්ද? මහණෙනි, විකාරයට හෙවත් වෙනස්වීමට පැමිණෙනුයි එහෙයින් රූපයයි කියනු ලැබේ. කුමකින් වෙනසට පැමිණෙයිද? සීතයෙන්ද වෙනසට පැමිණෙයි. උෂ්ණයෙන්ද වෙනසට පැමිණෙයි. බඩගින්නෙන්ද වෙනසට පැමිණෙයි. පිපාසයෙන්ද වෙනසට පැමිණෙයි, ඩැහැ ලේ බොන ඇටමැසි, විද ලේබොන මදුරුවා, අව් සුළං සර්පාදී දීර්ඝ ජාතික සතුන්ගේ ස්පර්ශයෙන්ද, වෙනසට පැමිණෙයි. මහණෙනි, වෙනසට පැමිණෙනුයි එහෙයින් වනාහි රූපයයි කියනු ලැබේ.

**4.** "මහණෙනි, වේදනාව කුමකැයි කියව්ද? මහණෙනි විඳිනුයි. එහෙයින් වනාහි වේදනාවයයි කියනු ලැබේ. කුමක් විඳීද? සැපද විඳියි. දුකද විඳියි. අදුක්ඛම සුඛයද, (උපෙක්ෂාව) විඳියි. මහණෙනි, විඳිනුයි එහෙයින් වනාහි වේදනාවයයි කියනු ලැබේ.

**5.** "මහණෙනි, සංඥාව කුමකැයි කියව්ද? මහණෙනි, හඳුනනුයි එහෙයින් වනාහි සංඥාවයයි කියනු ලැබේ. කුමක් හඳුනාද? නිල්වූ දේ නිල්යයිද, හඳුනයි. කසාවන් දෙය කසාවන්

යයිද හඳුනයි. ලෙහෙවන් දෙය ලේවන්යයිද හඳුනයි. සුදු දෙය සුදුයයිද හඳුනයි. මහණෙනි, හඳුනයි හඳුනයිනුයි සංඥාවයයි කියනු ලැබේ.

**6.** "මහණෙනි, කුමක් වනාහි සංස්කාරයන්යයි කියව්ද? මහණෙනි, හේතු ප්‍රත්‍යයන් විසින් නිපදවන ලද දේ පිළියෙල කරත්. එහෙයින් සංස්කාරයයි කියනු ලැබෙත්. කිනම් හේතු ප්‍රත්‍යයන් විසින් නිපදවන ලද්දක් පිළියෙල කරද්ද? හේතු ප්‍රත්‍යයන් විසින් නිපදවන ලද රූපය රූපයවීම පිණිස පිළියෙළ කරත්. සංඛතවූ වේදනාව වේදනාව වීම පිණිස පිළියෙළ කරත්. සංඛතවූ සංඥාව සංඥාව වීම පිණිස පිළියෙල කරත්. සංඛතවූ සංස්කාරයන් සංස්කාරවීම පිණිස පිළියෙල කරත්. සංඛතවූ විඥානය විඥානයවීම පිණිස පිළියෙල කරත්. මහණෙනි, සංඛතය (හෙතු ප්‍රත්‍යයන් විසින් නිපදවන ලද දේ) පිළියෙල කරන හෙයින් සංස්කාරයෝයයි කියනු ලැබෙත්.

**7.** "මහණෙනි, කුමක් විඥානයයි කියව්ද? මහණෙනි, විශෙෂයෙන් දැනගනියි. එහෙයින් විඥානයයි කියනු ලැබේ. කුමක් දැනගනීද? ඇඹුල් රසද, විශෙෂයෙන් දනී. තිත්ත රසද විශෙෂයෙන් දනී කුළුරසද විශෙෂයෙන් දනී. මිහිරි රසද විශෙෂයෙන් දනී. කර රසද විශෙෂයෙන් දනී. මිශ්‍ර රසද විශෙෂයෙන් දනී. ලුණු රසද විශේෂයෙන් දනී දිය රසද විශේෂයෙන් දනී. මහණෙනි, මෙසේ වනාහි අරමුණ විශෙෂයෙන් දැනගන්නා හෙයින් විඥානයයි කියනු ලැබේ.

**8.** "මහණෙනි! එහිදී ඇසූ පිරූ තැන් ඇති ආර්යශ්‍රාවක තෙමේ මෙසේ සලකයි. 'මම වනාහි දැන් රූපය නිසා පෙළෙමි. දැන් මම වනාහි පවත්නා රූපය නිසා යම් සේ පීඩාවට පැමිණෙම්ද, එපරිද්දෙන්ම මම අතීත කාලයෙහිද, රූපය නිසා පීඩාවට පැමිණියෙමි. මම වනාහි අනාගත රූපය කෙරෙහිද, කැමති වන්නෙම් නම් දැන් වර්තමාන රූපය නිසා යම්සේ පීඩාවට පැමිණෙම්ද, එපරිද්දෙන්ම මම අනාගත රූපය නිසාද පීඩාවට පැමිණෙන්නෙමියි' කියායි, හෙතෙමේ මෙසේ සලකා අතීත රූපය කෙරෙහි බලාපොරොත්තු රහිත වෙයි. අනාගත රූපය

(ගැන) නොකැමැති වෙයි. පවත්නා රූපයෙහි කළකිරීම පිණිසද, නොඇලීම පිණිසද, නැති කිරීම පිණිසද පිළිපන්නේ වෙයි.

**9.** "මම වනාහි දැන් වේදනාවෙන් පීඩා විඳිමි. යම්සේ දැන් පවත්නා වේදනාවෙන් පෙළෙම්ද, අතීතයෙහිද මම මෙපරිදිම වේදනාවෙන් පෙළුනෙමි. මම වනාහි අනාගත වේදනාව කැමති වන්නෙම් නම් යම් සේ දැන් පවත්නා වේදනාවෙන් පෙළෙම්ද, එපරිදි මම අනාගත කාලීන වේදනාවෙන් පීඩා විඳින්නෙමියි' කියා හෙතෙමේ මෙසේ සලකා අතීත වේදනාව කෙරෙහි බලාපොරොත්තු රහිත වෙයි. අනාගත වේදනාව (ගැන) නොකැමැති වෙයි. පවත්නා වේදනාව කෙරෙහි කළකිරීමටද, නොඇලීමටද, නැතිකිරීමටද පිළිපන්නේ වෙයි.

**10.** "මම වනාහි දැන් සංඥාවෙන් පීඩා විඳිමි. යම්සේ දැන් පවත්නා සංඥාවෙන් පෙළෙම්ද, අතීතයෙහිද මම මෙපරිදිම සංඥාවෙන් පෙළුනෙමි. මම වනාහි අනාගත සංඥාව කැමති වන්නෙම් නම් යම් සේ දැන් පවත්නා සංඥාවෙන් පෙළෙම්ද, එපරිදි මම අනාගත කාලීන සංඥාවෙන් පීඩා විඳින්නෙමියි' කියා හෙතෙම මෙසේ සලකා අතීත සංඥාව කෙරෙහි බලාපොරොත්තු රහිත වෙයි. අනාගත සංඥාව (ගැන) නොකැමැති වෙයි. පවත්නා සංඥාව කෙරෙහි කළකිරීමටද, නොඇලීමටද, නැති කිරීමටද පිළිපන්නේ වෙයි.

**11.** "මම වනාහි දැන් සංස්කාරයන් නිසා පීඩා විඳිමි. දැන් (මම) සංස්කාරයන් නිසා යම් සේ පෙළෙම්ද එපරිද්දෙන්ම මම අතීත සංස්කාරයන් නිසා පෙළුනෙමි. මම වනාහි අනාගත සංස්කාරයන් කෙරෙහි සතුටු වන්නෙම් නම්, යම්සේ දැන් පවත්නා සංස්කාරයන් නිසා පීඩා විඳිම්ද, එපරිද්දෙන්ම මම අනාගත සංස්කාරයන් නිසා පීඩා විඳින්නෙමියි' කියා හෙතෙම මෙසේ සලකා අතීත සංස්කාරයන් කෙරෙහි බලාපොරොත්තු රහිත වෙයි. අනාගත සංස්කාරයන් කෙරෙහිද සතුටු නොවෙයි. පවත්නා සංස්කාරයන්හි කළකිරිම පිණිසද, නොඇලීම පිණිසද, නැතිකිරීම පිණිසද, පිළිපන්නේ වෙයි.

12. 'මම වනාහි දැන් විඥානය නිසා පෙළෙමි. දැන් වනාහි පවත්නා විඥානය නිසා යම් සේ පෙළෙම්ද, එසේම මම අතීත විඥානය නිසාද පීඩාවට පැමිණියෙමි. මම වනාහි අනාගත විඥානය ගැන සතුටුවන්නෙම් නම් දැන් පවත්නා විඥානය නිසා යම් සේ පෙළෙම්ද එපරිද්දෙන්ම මම අනාගත විඥානය නිසාද පීඩාවට පැමිණෙන්නෙමි' කියායි.

'හෙතෙම මෙසේ සලකා අතීත විඥානය කෙරෙහි බලාපොරොත්තු රහිත වෙයි. අනාගත විඥානයෙහි නො කැමැති වෙයි. පවත්නා විඥානයෙහි කළකිරීම පිණිසද නොඇලීම පිණිසද, නැතිකිරීම පිණිසද පිළිපන්නේ වෙයි.

13. "මහණෙනි, නුඹලා කුමකැයි සිතන්නහුද, රූපය නිත්‍යය හෝ වෙයිද? අනිත්‍ය හෝ වෙයිද?" "ස්වාමීනි අනිත්‍යයි." "යමක්වනාහි අනිත්‍යයනම් එය දුක් හෝ වෙයිද, සැප හෝ වෙයිද?" "ස්වාමීනි දුකය," "යමක් වනාහි අනිත්‍යයද, දුක් ද පෙරලෙනසුලුද, 'මෙය මාගේය. මෙය මම වෙමි. මෙය මාගේ ආත්මයයි' දැකීමට සුදුසුවේද?" "ස්වාමීනි, එය නොවේමය."

14. "මහණෙනි, නුඹලා කුමකැයි සිතන්නහුද? වේදනාව නිත්‍යය හෝ වෙයිද, අනිත්‍ය හෝ වෙයිද?" "ස්වාමීනි, අනිත්‍යයි." "යමක් වනාහි අනිත්‍ය නම් එය දුක් හෝ වෙයිද, සැප හෝ වෙයිද?" "ස්වාමීනි, දුකය" යමක් වනාහි අනිත්‍යයද, දුක්ද, පෙරලෙන සුලුද, 'මෙය මාගේය. මෙය මම වෙමි. මෙය මාගේ ආත්මයයි' දැකීමට සුදුසුවේද?" "ස්වාමීනි, එය නොවේමය."

15. "මහණෙනි, නුඹලා කුමකැයි සිතන්නහුද? සංඥාව නිත්‍යය හෝ වෙයිද, අනිත්‍ය හෝ වෙයිද?" "ස්වාමීනි, අනිත්‍යයි." "යමක් වනාහි අනිත්‍යය නම් එය දුක් හෝ වෙයිද, සැප හෝ වෙයිද?" "ස්වාමීනි, දුකය "යමක් වනාහි අනිත්‍යයද, දුක්ද පෙරලෙන සුලුද, 'මෙය මාගේය. මෙය මම වෙමි. මෙය මාගේ ආත්මයයි' දැකීමට සුදුසු වේද?" "ස්වාමීනි, එය නොවේමය."

16. "මහණෙනි, නුඹලා කුමකැයි සිතන්නහුද? සංස්කාරයෝ නිත්‍යය හෝ වෙයිද, අනිත්‍ය හෝ වෙයිද?" "ස්වාමීනි, අනිත්‍යයි"

"යමක් වනාහි අනිත්‍යය නම් එය දුක් හෝ වෙයිද, සැප හෝ වෙයිද?" "ස්වාමීනි, දුකය." "යමක් වනාහි අනිත්‍යයද, දුක්ද, පෙරලෙන සුලුද, 'මෙය මගේය. මෙය මම වෙමි. මෙය මාගේ ආත්මයයි" දැකීමට සුදුසුවේද?" "ස්වාමීනි, එය නොවේමය."

17. "මහණෙනි, නුඹලා කුමකැයි සිතන්නහුද? විඥානය නිත්‍යය හෝ වෙයිද, අනිත්‍යය හෝ වෙයිද?" "ස්වාමීනි, අනිත්‍යය" "යමක් වනාහි අනිත්‍යය නම් එය දුක් හෝ වෙයිද සැප හෝ වෙයිද?" "ස්වාමීනි, දුකය." "යමක් අනිත්‍යය නම් දුක නම් පෙරලෙනසුළු නම් 'එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි' දැකීමට සුදුසුවේද?" "ස්වාමීනි, එය සුදුසු නොවේමය."

18. "මහණෙනි, එහෙයින් මේ ශාසනයෙහි (භික්ෂුව විසින්) අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම් වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ අතීතවූද, අනාගතවූද, දැන් පවත්නාවූද, යම්කිසි රූපයක් වේද, ඒ සියලු රූප 'එය මාගේ නොවේය. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවෙයි' කියා මෙසේ මෙය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දත යුතුයි.

19. "අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරොසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ අතීතවූද, අනාගතවූද, දැන් පවත්නාවූද, යම්කිසි වේදනාවක් වේද, ඒ සියලු වේදනා 'එය මාගේ නොවේය. එය මම නොවෙමි. එය මාගේ ආත්මයද නොවෙයි' කියා මෙසේ මෙය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දත යුතුයි.

20. "අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ අතීත වූද, අනාගතවුද, දැන් පවත්නාවූද, යම්කිසි සංඥාවක්වේද, ඒ සියලු සංඥාවන් එය මාගේ නොවේය. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවෙයි' කියා මෙසේ මෙය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දත යුතුයි.

**21.** "අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ අතීත වූද, අනාගතවූද, දැන් පවත්නාවූද, යම්කිසි සංස්කාරයෝ වෙත්ද, ඒ සියලු සංස්කාරයෝ 'එය මාගේ නොවේය. එය මම නොවෙමි. එය මාගේ ආත්මයද නොවෙයි' කියා මෙසේ මෙය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දත යුතුයි.

**22.** "අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ අතීතවූද, අනාගතවූද, දැන් පවත්නාවූද, යම්කිසි විඥානයක් වේද, ඒ සියලු විඥානය 'එය මාගේ නොවේය. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවෙයි' කියා මෙසේ මෙය තත්වූ පරිදි මනා නුවණින් දත යුතුයි.

**23.** "මහණෙනි, මේ ආර්යශ්‍රාවකතෙමේ (සසර පැවැත්ම) විනාශ කරන්නේයයි කියනු ලැබේ. රැස් නොකරන්නේය, දුරුකරන්නේය. අල්වා නොගන්නේය, විසුරුවා හරින්නේය, එකතු නොකරන්නේය, නිවන්නේය, නොදල්වන්නේයයි කියනු ලැබේ.

**24.** "කුමක් විනාශ කරයිද, රැස් නොකරයිද? රූපය විනාශ කරයි. රැස් නොකරයි. වේදනාව විනාශ කරයි, රැස්නොකරයි. සංඥාව විනාශ කරයි, රැස් නොකරයි. සංස්කාරයන් විනාශකරයි, රැස් නොකරයි. විඥානය විනාශ කරයි, රැස්නොකරයි. කුමක් දුරුකරයිද, අල්වානොගනීද? රූපය දුරුකරයි, අල්වා නොගනියි. වේදනාව දුරුකරයි, අල්වා නොගනියි. සංඥාව දුරුකරයි, අල්වා නොගනියි. සංස්කාරයන් දුරුකරයි, අල්වානොගනියි. විඥානය දුරුකරයි, අල්වා නොගනියි කුමක් විසුරුවාහරියිද, එකතු නොකරයිද? රූපය විසුරුවා හරියි, එකතු නොකරයි. වේදනාව විසුරුවා හරියි. එකතු නොකරයි. සංඥාව විසුරුවා හරියි, එකතු නොකරයි. සංස්කාරයන් විසුරුවා හරියි, එකතුනොකරයි. විඥානය විසුරුවා හරියි, එකතු නොකරයි. කුමක් නිවයිද, නොදල්වයිද? රූපය නිවයි, නොම දල්වයි. වේදනාව නිවයි,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නොම දල්වයි. සංඥාව නිවයි, නොම දල්වයි. සංස්කාරයන් නිවයි, නොම දල්වයි. විඥානය නිවයි, නොම දල්වයි.

**25.** "මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවකතෙමේ රූපයෙහිද කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයන් කෙරෙහිද කලකිරෙයි. විඥානය කෙරෙහිද කලකිරෙයි. කලකිරුනේ නොඇලෙයි. නොඇලීමෙන් (කෙලෙසුන් කෙරෙන්) මිදෙයි. මිදුනු කල්හි මිදුනෙමියි යන නුවණ පහළවෙයි. ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචර්‍යාවෙහි වැස නිමවන ලද්දේය. කටයුතුකොට නිමවන ලද්දේය. මේ ආත්මභාවයෙහි කෙලෙසුන් දුරුකරනු පිණිස කළයුතු අනිකක් නැත්තේයයි" දනියි.

**26.** "මහණෙනි, මේ භික්ෂුතෙමේ රැස් කරන්නේද නොවේ. විනාශ කරන්නේද නොවේයයි කියනු ලැබේ. විනාශ කොට සිටියේ වෙයි. දුරුකරන්නේද නොවෙයි. අල්වා ගන්නේද නොවෙයි. දුරුකොට සිටියේ වෙයි. විසුරුවන්නේද නොවෙයි. එකතු කරන්නේද නොවෙයි. විසුරුවා සිටියේ වෙයි. නිවන්නේද නොවෙයි. දල්වන්නේද නොවෙයි. නිවා සිටියේ වෙයි යනුයි.

**27.** "කුමක් රැස් නොකරන්නේද, කුමක් විනාශ නොකරන්නේද, කුමක් විනාශකොට සිටියේද? රූපය රැස් නොකරයි. නොම විනාශ කරයි. විනාශකොට සිටියේ වෙයි.

"වේදනාව රැස් නොකරයි. නොම විනාශ කරයි. විනාශ කොට සිටියේ වෙයි.

"සංඥාව රැස් නොකරයි. නොම විනාශ කරයි. විනාශ කොට සිටියේ වෙයි.

"සංස්කාරයන් රැස් නොකරයි. නොම විනාශ කරයි. විනාශකොට සිටියේ වෙයි.

"විඥානය රැස් නොකරයි. නොම විනාශ කරයි. විනාශ කොට සිටියේ වෙයි.

**28.** "කුමක් දුරු නොකරයිද, අල්වා නොගනීද, දුරුකර සිටියේද? රූපය නොම දුරුකරයි. නොම අල්වා ගනියි. දුරුකර සිටියේ වෙයි.

"වේදනාව නොම දුරුකරයි. නොම අල්වාගනියි. දුරුකර සිටියේ වෙයි.

"සංඥාව නොම දුරුකරයි. නොම අල්වාගනියි. දුරුකර සිටියේ වෙයි.

"සංස්කාරයන් නොම දුරුකරයි. නොම අල්වා ගනියි. දුරුකර සිටියේ වෙයි.

"විඥානය නොම දුරුකරයි. නොම අල්වා ගනියි. දුරු කර සිටියේ වෙයි.

**29.** "කුමක් නොම විසුරුවයිද, නොම එකතු කරයිද? විසුරුවා හැර සිටියේ වෙයිද?

"රූපය නොම විසුරුවයි. නොම එකතුකරයි. විසුරුවා සිටියේ වෙයි.

"වේදනාව නොම විසුරුවයි. නොම එකතුකරයි. විසුරුවා සිටියේ වෙයි.

"සංඥාව නොම විසුරුවයි නොම එකතු කරයි. විසුරුවා සිටියේ වෙයි.

"සංස්කාරයන් නොම විසුරුවයි. නොම එකතුකරයි. විසුරුවා සිටියේ වෙයි,

"විඥානය නොම විසුරුවයි. නොම එකතුකරයි. විසුරුවා සිටියේ වෙයි."

**30.** "කුමක් නොනිවයිද? කුමක් නොම දල්වයිද? නිවාසිටියේ වෙයිද?"

"රූපය නොම නිවයි. නොම දල්වයි. නිවා සිටියේවෙයි.

"වේදනාව නොම නිවයි. නොම දල්වයි. නිවා සිටියේ වෙයි.

"සංඥාව නොම නිවයි. නොම දල්වයි. නිවා සිටියේ වෙයි. "සංස්කාරයන් නොම නිවයි. නොම දල්වයි. නිවා සිටියේ වෙයි.

"විඥානය නොම නිවයි. නොම දල්වයි. නිවා සිටියේ වෙයි.

"මහණෙනි, මෙසේ කෙළෙසුන් කෙරෙන් මිදුනු සිත් ඇති භික්ෂුව ශක්‍රයා සහිතවූ බ්‍රහ්මයා සහිතවූ ප්‍රජාපතී සහිතවූ දෙවියෝ දුරදීම නමස්කාර කරත්. (කෙසේද?)

"නුඹවහන්සේ යමක් (යම් ආර්යවංස ප්‍රතිපදාවක්) සඳහා සිතන්නෙහිද, යමකට කැමති වන්නෙහිද, එය අපි නොදනිමු. පුරුෂ ශ්‍රෙෂ්ඨයන් වහන්ස, ඔබට නමස්කාර වේවා. පුරුෂොත්තමයන් වහන්ස, ඔබට නමස්කාරවේවා" කියායි.

**(හත්වෙනි පිණ්ඩොල සූත්‍රය නිමි.)**

---

## 8. පිණ්ඩොල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත්පුර සමීපයෙහිවූ න්‍යග්‍රොධාරාමයෙහි වැඩ වාසය කරති.

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ කිසියම් කරුණක් සඳහා භික්ෂු සංඝයා බැහැර කරවා පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන කිඹුල්වත් නුවරට පිඬු පිණිස පිවිසියේය. කපිලවස්තු නගරයෙහි පිඬු පිණිස හැසිර බතින් පසු පිණ්ඩපාතයෙන් වැලකුණේ මහාවනය යම්තැනෙක්හිද දහවල් වාසය සඳහා එහි වැඩියේය.

3. මහවනයට වැඩ (එක්තරා) බෙලිගසක් මුල දහවල් කල්ගත කිරීම පිණිස වැඩ හුන්නේය. හුදකලාව විවේකිව වැඩහුන්නාවූ භාග්‍යවතුන් වහන්සේට සිත පිළිබඳ මෙබඳු අදහසක් පහළවූයේය. 'මා විසින් භික්ෂු සංඝයා බැහැර කරන ලදී. මේ ශාසනයට අලුත පැමිණියාවූ පැවිදිව නොබෝ කල් ඇති නවක භික්ෂුහු මේ භික්ෂු සංඝයා අතර ඇත්තාහ. මා නොදක්නාවූ

ඔවුන්ගේ සිත් පෙරළීමක් වන්නේය. මැලවීමක් වන්නේය. මව නොදක්නාවූ තරුණ වසු පැටවෙකුගේ සිත යම්සේ පෙරළීමක් වන්නේද, මැලවීමක් වන්නේද, එපරිද්දෙන්ම මේ ශාසනයට අලුත පැමිණියාවූ පැවිදිව නොබෝ කල් ගියාවූ නවක භික්ෂූහු මේ භික්ෂූන් අතර ඇත්තාහ.

**4.** "මා නොදක්නාවූ ඒ භික්ෂූන්ගේ සිත් පෙරළීමක් වන්නේය. මැලවීමක් වන්නේය. ජලය නොලබන්නාවූ තරුණ බීජයන් (ලපටි පැලෑටි) ගේ යම්සේ පෙරළීමක් වන්නේද, මැලවීමක් වන්නේද, එපරිද්දෙන්ම මේ ශාසනයට අලුත පැමිණියාවූ නවක භික්ෂූහු මේ භික්ෂු සංඝයා අතර ඇත්තාහ. මා නොදක්නාවූ ඔවුන්ගේ සිත් පෙරළීමක් වන්නේය. මැලවීමක් වන්නේය. මා විසින් පෙර යම්සේ භික්ෂු සංඝයාට අවවාද කරන ලද්දේද, මම වනාහි දැනුදු එපරිද්දෙන්ම භික්ෂු සංඝයාට අවවාද කරන්නෙම් නම් ඉතා මැනවි' කියායි.

**5.** එකල්හි සහම්පතී බ්‍රහ්මතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ සිත තම සිතින් දැන ශක්තිමත් පුරුෂයෙක් හකුලන ලද අත දිගු කරන්නේ හෝ දිගු කරන ලද අත හකුලන්නේ හෝ යම්සේ නම්, එලෙසම බඹලෙව්හි අතුරුදන්වූයේ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි පහළවූයේය.

අනතුරුව සහම්පතී බ්‍රහ්මතෙමේ උතුරු සළුව එකාංශකොට පොරවා භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හි නම් එහි පැමිණ, භාග්‍යවතුන් වහන්සේට ඇඳිලිබැඳ නමස්කාරකොට, භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකෙළේය. "භාග්‍යවතුන් වහන්ස, එය එසේමය. සුගතයන් වහන්ස, එය එසේමය.

**6.** "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂු සංඝ තෙමේ පහකරන ලද්දේය. මේ ශාසනයට අලුත පැමිණියාවූ පැවිදිව නොබෝකල් ඇත්තාවූ නවක භික්ෂූහු ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ නොදක්නාවූ ඔවුන්ගේ සිත් පෙරළීමක් වන්නේය. මැලවීමක් වන්නේය. මව නොදක්නාවූ කිරිබොන වසුපැටවකුගේ සිත යම්සේ පෙරළෙන්නේද, යම්සේ මැලවෙන්නේද, එපරිද්දෙන්ම මේ ශාසනයට අලුත පැමිණියාවූ

පැවිදිව නොබෝකල් ඇත්තාවූ නවක භික්ෂූහු මේ භික්ෂූන් අතර ඇත්තාහ.

7. "භාග්‍යවතුන් වහන්සේ නොදක්නාවූ ඒ භික්ෂූන්ගේ සිත් පෙරළීමක් වන්නේය. මැලවීමක් වන්නේය. ජලය නොලබන්නාවූ ලපටි බීජයෝ යම්සේ වෙනස් වන්නේද, යම්සේ මැලවෙන්නේද, එපරිද්දෙන්ම මේ සස්නට අලුත පැමිණියාවූ පැවිදිව නොබෝකල් ඇත්තාවූ නවක භික්ෂූහු මෙහි ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ දැකීමට නොලබන්නාවූ ඔවුන්ගේ සිත් පෙරළෙන්නේය. මැලවෙන්නේය.

"ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා (කෙරෙහි) සතුටුවන සේක්වා. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයාට අවවාද කරන සේක්වා. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් පෙර භික්ෂු සංඝයාට යම්සේ අවවාද කරන ලද්දේද, දැනුදු වනාහි එපරිද්දෙන්ම භික්ෂු සංඝයාට අවවාද කරන සේක්වා"කියායි. භාග්‍යවතුන් වහන්සේ (බඹහුගේ අයදුම) තුෂ්ණීම් භාවයෙන් ඉවසා වදාළේය. එවිට සහම්පතී බ්‍රහ්මතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන, භාග්‍යවතුන් වහන්සේට වැඳ, ගෞරව දක්වා එහිම අතුරුදහන් වූයේය.

8. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි එල සමවතින් නැගී සිටියේ න්‍යග්‍රොධාරාමය යම්තැනෙක්හිද එහි වැඩියේය. වැඩ පනවන ලද අසුනෙහි වැඩ හුන්නේය. භාග්‍යවතුන් වහන්සේ වනාහි එහි වැඩහිඳ ඒ භික්ෂූහු බියපත් ස්වභාවයෙන් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි තනි තනිව හෝ දෙදෙනා බැගින් හෝ පැමිණෙන්නාහුද, එබඳුවූ ඍද්ධියක් කෙළේය. ඒ භික්ෂූහු පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නාහුය. එක්පසෙක හුන්නාවූ ඒ භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය.

9. "මහණෙනි ජීවිකාවන් අතරෙන් යම් මේ පිඬු සිඟා ජීවත්වීමක් වේද, මෙය ඉතා හීනය. මහණෙනි, පාත්‍රයක් අතින් ගෙන පිඬු සිඟා ඇවිදීමක් වේද, මෙය ලෙව්හි නින්දා කටයුත්තෙක. මහණෙනි, අර්ථය කැමති වන්නාවූ කුලපුත්‍රයෝ

අර්ථ පිණිස එයද කරති, (භික්ෂූහු) රජ අණ නොතකා සිර ගෙයින් පැන ගොස් පැවිදිවූවෝ නොවෙති. සොරුන්ගෙන් වන මරණයෙන් මිදී පැවිදිවූවෝ නොවෙති. ණය නිසා පැවිදි වූවෝ නොවෙති. රජ සොර ආදී බිය නිසා පැවිදිවූවෝ නොවෙති. අඹුදරුවන් පෝෂණය කිරීමෙහි නොසමත්ව පැවිදිවූවෝ නොවෙති. එතකුදුවුවත් ජාතිය (ඉපදීම) ජරා මරණයෙන් සෝකයන්ගෙන් ළෙහි අත් ගසා හැඬීම් වැළපීම්වලින් දුක්වලින් දොම්නස්වලින් දැඩි ආයාසවලින් යුක්තය. මේ සියලු දුක් සමූහයාගේ කෙළවර කිරීමක් දක්නහු නම් ඉතා මැනවයි කියායි.

**10.** "මහණෙනි, මේ කුලපුත්‍රතෙමේ මෙසේ පැවිදිවූයේ වෙයි. හෙතෙමේ ලෝභය බහුලකොට ඇත්තේවේද, කාමයන්හි තියුණු රාගය ඇත්තේවේද, කිපුණු සිත් ඇත්තේවේද, ද්වේෂයෙන් දූෂිත සිත් ඇත්තේ වේද, මුළාවූ සිහි ඇත්තේ වේද, යහපත් නුවණ නැත්තේ වේද, විසිරගිය සිත් ඇත්තේ වේද, අසංවරවූ සිත් ඇත්තේ වේද?

"මහණෙනි, දෙකොණ ගිනි ගත් මැද අසූචි තැවරුණ සොහොන් පෙනෙල්ල යම්සේ ගමෙහි දර පිණිස ප්‍රයෝජන නොවෙයිද, වනයෙහි දර පිණිස ප්‍රයෝජන නොවෙයිද, මහණෙනි, ගිහි සැපයෙන්ද, පිරිහුණාවූ ශ්‍රමණ අර්ථය ද සම්පූර්ණ නොකරන්නාවූ මේ පුද්ගලයාට ඊට බඳු උපමා ඇත්තේයයි මම කියමි.

**11.** "මහණෙනි, කාම කල්පනාය, ව්‍යාපාද කල්පනාය, විහිංසා කල්පනායයි මේ අකුසල් විතර්කයෝ තුනකි.

"මහණෙනි, මේ අකුසල විතර්කයෝ වනාහි කොතැන්හි ඉතිරි නොවී නිරුද්ධ වෙත්ද, සතර සතිපට්ඨානයෙහි මනාකොට පිහිටි සිතින් යුක්තව වාසය කරන්නහුට හෝ විදර්ශනා සමාධිය වඩන්නාහුට හෝ වෙත්.

"මහණෙනි, යම් මේ විදර්ශනා සමාධියක් වේද එය වැඩීමට සුදුසුමය. මහණෙනි, වඩනා ලද්දාවූ බහුලකොට කරන ලද්දාවූ

විදර්ශනා සමාධිය මහත්ඵල ඇත්තේ වෙයි. මහානිසංස ඇත්තේ වෙයි.

12. "මහණෙනි, භවදිට්ඨිය, විභව දිට්ඨියයි මේ දෘෂ්ටි දෙකකි.

මහණෙනි, එහි ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකතෙමේ මෙසේ සලකයි. යමක් මම දැඩි වශයෙන් ගනු ලබන්නේ නිදොස් වන්නෙම්ද, ලොව එබඳු කිසිවක් ඇත්තේ දෝ හෝයි කියායි. හෙතෙමේ මෙසේ දනියි. 'යමක් මම දැඩි වශයෙන් ගනු ලබන්නේ නිදොස් වන්නෙම්ද, ලොව එබඳු කිසිවක් නැත්තේය.' කියායි. හෙතෙම මෙසේ දනියි. 'මම දැඩි වශයෙන් ගන්නෙම් නම් රූපයම දැඩිකොට ගන්නෙමි. දැඩිවශයෙන් ගන්නෙම් නම් වේදනාව දැඩිකොට ගන්නෙමි. දැඩිවශයෙන් ගන්නෙම් නම් සංඥාව දැඩිකොට ගන්නෙමි. දැඩිවශයෙන් ගන්නෙම් නම් සංස්කාර දැඩිකොට ගන්නෙමි. දැඩිවශයෙන් ගන්නෙම් නම් විඥානයන්ම දැඩිකොට ගන්නෙමි.' ඒ මාගේ දැඩිකොට ගැනීම හේතුකොට ගෙන (කර්ම) භවය ඇතිවේ. භවය හේතුකොට ගෙන ජාතිය වෙයි. ජාතිය හේතුකොට ගෙන භවප්‍රත්‍යයෙන් උත්පත්තිය වෙයි. ජරාමරණ, ශෝක, පරිදේව, දුක් දොම්නස්, දැඩි ආයාසයෝ හටගන්නාහුය. මෙසේ සැපයෙන් අමිශ්‍ර දුක් සමූහයාගේ හටගැනීම වන්නේය.

13. "මහණෙනි, කුමකැයි සිතන්නහුද? රූපය නිත්‍ය හෝ වෙයිද? අනිත්‍ය හෝ වෙයිද?" "ස්වාමීනි, අනිත්‍යය." යමක් වනාහි අනිත්‍ය නම් එය දුක් හෝ වෙයිද, සැප හෝ වෙයිද?" "ස්වාමීනි, දුකය." "යමක් අනිත්‍ය නම් දුක නම් වෙනස්වන ස්වභාව නම් 'එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි' කියා දැකීමට සුදුසුවේද?" "ස්වාමීනි, සුදුසු නොවේ."

"වේදනාව නිත්‍ය හෝ වෙයිද? අනිත්‍ය හෝ වෙයිද?" "ස්වාමීනි, අනිත්‍යය" "යමක් වනාහි අනිත්‍යයනම් එය දුක් හෝ වෙයිද සැප හෝ වෙයිද" "ස්වාමීනි, දුකය" "යමක් අනිත්‍ය නම් දුක නම් වෙනස්වන ස්වභාව නම් 'එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි' කියා දැකීමට සුදුසුවේද?" "ස්වාමීනි, සුදුසු නොවේ."

"සංඥාව නිත්‍ය හෝ වෙයිද? අනිත්‍ය හෝ වෙයිද?" "ස්වාමීනි, අනිත්‍යය," "යමක් වනාහි අනිත්‍යය නම් එය දුක් හෝ වෙයිද, සැප හෝ වෙයිද" "ස්වාමීනි, දුකය." "යමක් අනිත්‍ය නම්, දුක නම් වෙනස්වන ස්වභාවනම් 'එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි" කියා දැකීමට සුදුසු වේද?" "ස්වාමීනි, සුදුසු නොවේ."

"සංස්කාරයන් නිත්‍ය හෝ වෙයිද? අනිත්‍ය හෝ වෙයිද?" "ස්වාමීනි, අනිත්‍යය," "යමක් වනාහි අනිත්‍යය නම් එය දුක් හෝ වෙයිද, සැප හෝ වෙයිද?" "ස්වාමීනි, දුකය." "යමක් අනිත්‍ය නම් දුකනම් වෙනස්වන ස්වභාවනම් 'එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි' කියා දැකීමට සුදුසු වේද?" "ස්වාමීනි, සුදුසු නොවේ."

"විඥානය නිත්‍ය හෝ වෙයිද, අනිත්‍ය හෝ වෙයිද?" "ස්වාමීනි, අනිත්‍යයි," "යමක් අනිත්‍යය නම් එය දුක් හෝ වෙයිද, සැප හෝ වෙයිද?" "ස්වාමීනි, දුකය." "යමක් අනිත්‍ය නම්, දුක නම් වෙනස්වන ස්වභාව නම් 'එය මාගේය. එය මම වෙමි. එය මගේ ආත්මයයි' දැකීමට සුදුසුවේද?" "ස්වාමීනි, සුදුසු නොවේ."

**14.** "මහණෙනි, එබැවින් අතීතවූද, අනාගතවූද වර්තමාන වූද අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද, සමීපවූද, යම්කිසි රූපයක් වේද, ඒ සියලු රූප 'එය මාගේ නොවේය. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේයයි' 'මෙසේ මෙය තත්වූ පරිදි යහපත් ප්‍රඥාවෙන් දත යුතුයි.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද, සමීපවූද යම්කිසි වේදනාවක් වේද, ඒ සියලු වේදනා එය මාගේ නොවේය. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේය'යි මෙසේ තත්වූ පරිදි යහපත් ප්‍රඥාවෙන් දත යුතුයි.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද,

සමීපවූද, යම්කිසි සංඥාවක් වේද, ඒ සියලු සංඥා 'එය මාගේ නොවේය. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේය'යි මෙසේ මෙය තත්වූ පරිදි යහපත් ප්‍රඥාවෙන් දතයුතුයි.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද, සමීපවූද, යම්කිසි සංස්කාරයෝ වේද, ඒ සියලු සංස්කාර 'එය මාගේ නොවේය. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේය'යි මෙසේ මෙය තත්වූ පරිදි යහපත් ප්‍රඥාවෙන් දත යුතුයි.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද, සමීපවූද, යම්කිසි විඥානයක් වේද, ඒ සියලු විඥානය 'එය මාගේ නොවේ එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේය'යි කියා මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් ප්‍රඥාවෙන් දත යුතුයි.

**15.** "මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්යශ්‍රාවක තෙමේ රූපය කෙරෙහිද කලකිරෙයි. වේදනාව කෙරෙහිද කලකිරෙයි. සංඥාව කෙරෙහිද කලකිරෙයි. සංස්කාරයන් කෙරෙහිද කලකිරෙයි. විඥානය කෙරෙහිද කලකිරෙයි. කලකිරුණේ නො ඇලෙයි. නො ඇලීමෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේය යන ඥානය පහළවෙයි. ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචර්යාව වැස නිමවන ලද්දේය. කටයුත්ත කොට නිමවන ලද්දේය මේ ආත්ම භාවය සඳහා කළයුතු අනිකක් නැතැයි" කියා වදාළේය.

(අටවෙනි පිණ්ඩොල සූත්‍රය නිමි.)

---

## 9. පාරිලෙය්‍යක සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ නුවර ඝොෂිතාරාමයෙහි වැඩ වාසය කරණ සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු සමයෙහි හැඳ

පොරවා පාත්‍ර සිවුරුගෙන කොසඹෑ නුවරට පිඬු පිණිස වැඩිසේක. කොසඹෑ නුවර පිඬු පිණිස හැසිර පසුබත් වේලෙහි පිණ්ඩපාතයෙන් වැළකුනේ තමන් වහන්සේම සෙනාසනය හකුළා තබා පාත්‍ර සිවුරුගෙන උපස්ථායකයන්ට කථා නොකොට භික්ෂු සංඝයාට නොදන්වා තනිව දෙවැන්නෙක් නැතිව චාරිකාවෙහි වැඩියහ.

2. ඉක්බිති එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ වැඩි නොබෝ වේලාවකින් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් යම් තැනකද එහි ගියේය. ගොස් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට මෙසේ කීවේය.

"ඇවැත්, ආනන්ද ස්ථවිරයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේම සෙනාසනය හකුළා පාත්‍ර සිවුරු ගෙන උපස්ථායකයන්ට කථා නොකොට භික්ෂු සංඝයාට නොදන්වා තනිව දෙවැන්නෙක් නැතිව චාරිකාවෙහි වැඩියහ."

3. "ඇවැත්නි, යම් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේම සෙනාසනය හකුළා පාත්‍ර සිවුරු ගෙන උපස්ථායකයන්ට කථා නොකොට භික්ෂු සංඝයාට නොදන්වා තනිව දෙවැන්නෙක් නැතිව චාරිකාවෙහි වඩිත්ද, එකල්හි භාග්‍යවතුන් වහන්සේ තනිව වාසයකිරීමට කැමති වෙති. එකල්හි කිසිවෙකු විසිනුත් භාග්‍යවතුන් වහන්සේ පසුපසින් යායුත්තේ නොවේය."

4. ඉක්බිති, භාග්‍යවතුන් වහන්සේ පිළිවෙලින් චාරිකාවෙහි හැසිරෙන්නේ, පාරිලෙය්‍යක වනය යම් තැනකද, එතැනට පැමිණිසේක. එකල්හි වනාහි, භාග්‍යවතුන් වහන්සේ "භද්දසාල" නම් වූ සල්ගසමුල පාරිලෙය්‍යක වනයෙහි වාසය කරණ සේක.

එකල්හි, බොහෝ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් යම් තැනකද, එතැනට පැමිණියහ. පැමිණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් සමග සතුටු වූහ. සතුටුවිය යුතු වූද, සිහි කටයුතු වූද, කථා අවසන් කොට එකත්පසක හුන්නාහුය. එකත්පසක

හුන්නාවූ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙසේ කීහ.

"ඇවැත් ආනන්දයෙනි, භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙන් බොහෝ කාලයකින් ධර්ම කථාවක් නො අසන ලදී. ඇවැත් ආනන්දයෙනි. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙන් ධර්ම කථාවක් අසනු කැමැත්තෙමු" යනුයි.

**5.** ඉක්බිති, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ඒ භික්ෂූන් සමග පාරිලෙය්‍යක වනයෙහි භද්දසාල නම්වූ සල්ගස් මුල යම් තැනකද, භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසක හුන්නේය. එක්පසක හුන්නාවූ ඒ භික්ෂූන්හට භාග්‍යවතුන් වහන්සේ ධර්ම කථාවකින් (කරුණු) දැක්වූහ. එහි සමාදන් කරවූහ. සිත් තියුණු කරවූහ. පැහැද වූහ.

**6.** එසමයෙහි වනාහි එක්තරා භික්ෂුවක්හට මෙවැනි අදහසක් ඇතිවිය. 'කෙසේ දන්නාවූ කෙසේ දක්නාවූ පුද්ගලයාට අනතුරුව ආශ්‍රවයන්ගේ ක්ෂයවීම වේදැයි' යනුයි. ඉක්බිති, භාග්‍යවතුන් වහන්සේ, තමන් වහන්සේගේ සිතින් ඒ භික්ෂුවගේ සිත දැන, භික්ෂූන්ට කථාකළ සේක.

"මහණෙනි, මා විසින් ධර්මය පරීක්ෂාකොට දෙශනා කරණ ලදී. සතර සති පට්ඨානයෝ පරීක්ෂාකොට දෙශනා කරණ ලදහ. සතර සම්‍යක් ප්‍රධානයෝ පරීක්ෂාකොට දෙශනා කරණ ලදහ. සතර ඍද්ධිපාදයෝ පරීක්ෂාකොට දෙශනා කරණ ලදහ. පඤ්ච ඉන්ද්‍රියයෝ පරීක්ෂාකොට දෙශනා කරණ ලදහ. පංච බලයෝ පරීක්ෂාකොට දෙශනා කරණ ලදහ. සත් බොධ්‍යාඞ්ග ධර්මයෝ පරීක්ෂාකොට දෙශනා කරණ ලදහ. ආර්ය අෂ්ටාංගික මාර්ගය පරීක්ෂාකොට දෙශනා කරණ ලදී.

"මහණෙනි, මෙසේ මා විසින් ධර්මය පරීක්ෂාකොට දෙශනා කරණ ලදී."

**7.** "මහණෙනි, මෙසේ මා විසින් ධර්මය පරීක්ෂාකොට දේශනාකොට ඇති කල්හි මේ ශාසනයෙහි එක් භික්ෂුවක්හට

"මෙවැනි අදහසක් ඇතිවිය. කෙසේ දන්නාවූ කෙසේ දක්නාවූ පුද්ගලයාහට අනතුරුව ආශ්‍රවයන්ගේ (කෙලෙසුන්ගේ) ක්ෂයවීම වේද යනුයි.

"මහණෙනි, කෙසේ දන්නාවූ කෙසේ දක්නාවූ පුද්ගලයාහට අනතුරුව ආශ්‍රවයන්ගේ ක්ෂයවීම වේද? මහණෙනි මේ ශාසනයෙහි බොහෝ ඇසූ පිරූ තැන් නැති ආර්යයන් නොදක්නාවූ ආර්ය ධර්මයෙහි දක්ෂ නොවූ ආර්ය ධර්මයෙහි නොහික්මුනාවූ සත්පුරුෂයන් නොදක්නාවූ සත්පුරුෂ ධර්මයෙහි දක්ෂ නොවූ සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුනාවූ පෘථග්ජන තෙමේ රූපය ආත්මය වශයෙන් දකියි.

"මහණෙනි, ඒ දැකීම සංස්කාර නම් වේ. ඒ සංස්කාරය කුමක් නිදානකොට කුමක් උත්පත්තිකොට කුමක් ජාතිකොට කුමක් ප්‍රභවකොට ඇත්තේද? මහණෙනි, අවිද්‍යා ස්පර්ශයෙන් හටගත් වේදනාවෙන් ස්පර්ශ කරන ලද බොහෝ ඇසූ පිරූ තැන් නැති පෘථග්ජනයාහට උපන් තෘෂ්ණාවක් වෙයිද, ඒ සංස්කාරතෙමේ එයින් හටගත්තේය.

"මහණෙනි, මෙසේ ඒ සංස්කාරද අනිත්‍යය. ප්‍රත්‍යයෙන් කරන ලදී. ප්‍රත්‍යයෙන් හටගත්තේය. ඒ තණ්හාව අනිත්‍යය. ප්‍රත්‍යයෙන් කරනලදී. ප්‍රත්‍යයෙන් හටගත්තේය. ඒ වේදනාව අනිත්‍යය. ප්‍රත්‍යයෙන් කරනලදී. ප්‍රත්‍යයෙන් හටගත්තේය. ඒ ස්පර්ශය අනිත්‍යය. ප්‍රත්‍යයෙන් කරනලදී. ප්‍රත්‍යයෙන් හටගත්තේය. ඒ අවිජ්ජාව අනිත්‍යය. ප්‍රත්‍යයෙන් කරනලදී. ප්‍රත්‍යයෙන් හටගත්තේය. මහණෙනි, මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ පුද්ගලයාට අනතුරුව ආශ්‍රවයන්ගේ ක්ෂයවීම වන්නේය.

8. "රූපය ආත්ම වශයෙන් නොගන්නේද, එසේ ද වුවත් තමා රූපවත්යයි දක්නේය. මහණෙනි, ඒ දැකීම සංස්කාර නම් වේ. ඒ සංස්කාර කුමක් නිදානකොට, කුමක් උත්පත්තිකොට, කුමක් ජාතිකොට, කුමක් ප්‍රභවකොට, ඇත්තේද?

"මහණෙනි, ඒ සංස්කාරය අවිද්‍යා ස්පර්ශයෙන් හටගත් වේදනාවෙන් ස්පර්ශකරන ලද බොහෝ ඇසූ පිරූ තැන් නැති

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පෘථග්ජනයාහට උපන් තෘෂ්ණාවක්වෙයිද, ඒ සංස්කාරය එයින් හටගත්තේය. මහණෙනි, ඒ සංස්කාරයද අනිත්‍යය. ප්‍රත්‍යයෙන් කරනලදී. ප්‍රත්‍යයෙන් හටගත්තේය. ඒ තණ්හාව අනිත්‍යය. ප්‍රත්‍යයෙන් කරනලදී. ප්‍රත්‍යයෙන් හටගත්තේය. ඒ වේදනාව අනිත්‍යය ප්‍රත්‍යයෙන් කරනලදී. ප්‍රත්‍යයෙන් හටගත්තේය. ඒ ස්පර්ශය අනිත්‍යය. ප්‍රත්‍යයෙන් කරනලදී. ප්‍රත්‍යයෙන් හටගත්තේය. ඒ අවිජ්ජාව අනිත්‍යය. ප්‍රත්‍යයෙන් කරනලදී. ප්‍රත්‍යයෙන් හටගත්තේය.

"මහණෙනි, මෙසේ දන්නාවූ, මෙසේ දක්නාවූ පුද්ගලයාහට අනතුරුව ආශ්‍රවයන්ගේ ක්ෂයවීම වෙයි.

**9.** "රූපය තමා වශයෙන් නොදක්නේද, තමා රූපවත්යයි නොදක්නේද, එසේ වුවත් රූපය තමා කෙරෙහි ඇත්තේයයි දකියි.

"මහණෙනි, ඒ දැකීම සංස්කාර නම්වේ. ඒ සංස්කාරය කුමක් නිදානකොට කුමක් උත්පත්තිකොට කුමක් ජාතිකොට කුමක් ප්‍රභවකොට ඇත්තේද? මහණෙනි, අවිද්‍යා ස්පර්ශයෙන් හටගත් වේදනාවෙන් ස්පර්ශ කරණ ලද බොහෝ ඇසූ පිරූ තැන් නැති පෘථග්ජනයාහට උපන් තෘෂ්ණාවක් වෙයිද, එයින් ඒ සංස්කාරය හටගත්තේ වෙයි.

"මහණෙනි, ඒ සංස්කාරයද අනිත්‍යයි. ප්‍රත්‍යයෙන් කරන ලදී. ප්‍රත්‍යයෙන් උපන්නේය. ඒ තෘෂ්ණාවද අනිත්‍යයි. ප්‍රත්‍යයෙන් කරන ලදී. ප්‍රත්‍යයෙන් උපන්නේය. ඒ වේදනාවද අනිත්‍යයි. ප්‍රත්‍යයෙන් කරනලදී. ප්‍රත්‍යයෙන් උපන්නේය. ඒ ස්පර්ශයද අනිත්‍යයි. ප්‍රත්‍යයෙන් කරනලදී. ප්‍රත්‍යයෙන් උපන්නේය. ඒ අවිද්‍යාවද අනිත්‍යයි. ප්‍රත්‍යයෙන් කරන ලදී. ප්‍රත්‍යයෙන් උපන්නේය. මහණෙනි, මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ පුද්ගලයාහට ආශ්‍රවයන්ගේ ක්ෂයවීම වෙයි.

**10.** "රූපය තමා වශයෙන් නොදක්නේද, තමා රූපවත් යයි හෝ නොදක්නේද, රූපය තමා කෙරෙහි ඇතැයි නොදක්නේද, එසේද වුවත් රූපයෙහි තමා ඇතැයි දකියි. ඒ දැකීම සංස්කාර

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

නම් වේ. ඒ සංස්කාර කුමක් නිදානකොට කුමක් උත්පත්තිකොට කුමක් ජාතිකොට කුමක් ප්‍රභවකොට ඇත්තේද?

"මහණෙනි, අවිද්‍යා ස්පර්ශයෙන් හටගත් වේදනාවෙන් ස්පර්ශ කරන ලද බොහෝ ඇසූ පිරූ තැන් නැති පෘථග්ජනයාහට උපන් තෘෂ්ණාවක් වෙයිද, එයින් හටගත්තේය.

"මහණෙනි, ඒ සංස්කාරයද, අනිත්‍යය. ප්‍රත්‍යයෙන් කරනලදී. ප්‍රත්‍යයෙන් උපන්නේය. ඒ තෘෂ්ණාව අනිත්‍යයි. ප්‍රත්‍යයෙන් කරන ලදී. ප්‍රත්‍යයෙන් උපන්නේය. ඒ වේදනාව අනිත්‍යය. ප්‍රත්‍යයෙන් කරන ලදී. ප්‍රත්‍යයෙන් උපන්නේය. ඒ ස්පර්ශය අනිත්‍යය. ප්‍රත්‍යයෙන් කරන ලදී. ප්‍රත්‍යයෙන් උපන්නේය. ඒ අවිද්‍යාව අනිත්‍යයි. ප්‍රත්‍යයෙන් කරන ලදී. ප්‍රත්‍යයෙන් උපන්නේය.

"මහණෙනි, මෙසේ දන්නාවූ, මෙසේ දක්නාවූ පුද්ගලයා හට අනතුරුව ආශ්‍රවයන්ගේ ක්ෂයවීම වෙයි.

11. "රූපය තමා වශයෙන් නොදක්නේද තමා රූපවත්යයි නොදක්නේද, රූපය තමා කෙරෙහි ඇතැයි හෝ නොදක්නේද, රූපයෙහි තමා ඇතැයි හෝ නොදක්නේද එසේද වුවත් වේදනාව තමා වශයෙන් දකියි. තමා වේදනාවත්යයි දකියි. වේදනාව තමා කෙරෙහි හෝ ඇතැයි දනියි. තමා වේදනායෙහි ඇතැයි දකියි. තමා සංඥාවයයි දකියි. තමා සංඥාවත්යයි කියා හෝ දකියි. සංඥාව කෙරෙහි තමා ඇතැයි කියා හෝ දකියි. තමා කෙරෙහි සංඥාව ඇතැයි කියා හෝ දකියි.

"එසේද වුවත් තමා සංස්කාරයයි දකියි. සංස්කාර තමා කෙරෙහි ඇතැයි හෝ දකියි. තමා සංස්කාර කෙරෙහි ඇතැයි හෝ දකියි. තමා විඤ්ඤාණය වසයෙන් දකියි. තමා විඤ්ඤාණවත්යයි හෝ දකියි. තමා කෙරෙහි විඤ්ඤාණය ඇතැයි හෝ දකියි.

"මහණෙනි, යම් ඒ දැකීමක් වෙයිද ඒ සංස්කාර නම්වේ. ඒ සංස්කාරය තෙමේ කුමක් නිදානකොට කුමක් උත්පත්ති කොට කුමක් ජාතිකොට කුමක් ප්‍රභවකොට ඇත්තේද?

"මහණෙනි, අවිද්‍යා ස්පර්ශයෙන් හටගත් වේදනාවෙන් ස්පර්ශ කරන ලද බොහෝ ඇසූ පිරූ තැන් නැති පෘථග්ජනයාහට උපන් තෘෂ්ණාවක් වෙයිද, එයින් ඒ සංස්කාරය හටගත්තේ වෙයි. මහණෙනි, මෙසේ ඒ සංස්කාරද අනිත්‍යයි. ප්‍රත්‍යයෙන් කරන ලදී. ප්‍රත්‍යයෙන් හටගත්තේය. ඒ තෘෂ්ණාවද අනිත්‍යයි. ප්‍රත්‍යයෙන් කරනලදී. ප්‍රත්‍යයෙන් හටගත්තේය. ඒ වේදනාවද අනිත්‍යයි. ප්‍රත්‍යයෙන් කරනලදී. ප්‍රත්‍යයෙන් හටගත්තේය. ඒ ස්පර්ශයද අනිත්‍යයි. ප්‍රත්‍යයෙන් කරනලදී. ප්‍රත්‍යයෙන් හටගත්තේය. ඒ අවිද්‍යාවද අනිත්‍යයි. ප්‍රත්‍යයන් විසින් කරන ලදහ. ප්‍රත්‍යයන්ගෙන් හටගන්නා ලදහ. මහණෙනි, මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ පුද්ගලයාහට මාර්ගයට අනතුරුව ආශ්‍රවයන් ක්ෂයකරන්නාවූ අර්හත් ඵලය වෙයි.

12. "රූපය තමා වශයෙන් නොදකියි. තමා රූපවත්යයි හෝ නොදකියි. රූපය තමා කෙරෙහි ඇතැයි නොදකියි. රූපයෙහි තමා ඇතැයි නොදකියි. වේදනාව තමා වශයෙන් නොදකියි. තමා වේදනාවත්යයි හෝ නොදකියි. වේදනාව තමා කෙරෙහි ඇතැයි හෝ නොදකියි. වේදනාවෙහි තමා ඇතැයි හෝ නොදකියි.

"සංඥාව තමා වශයෙන් නොදකියි. තමා සංඥාවත්යයි හෝ නොදකියි. සංඥාව තමා කෙරෙහි ඇතැයි හෝ නොදකියි. සංඥාවෙහි තමා ඇතැයි හෝ නොදකියි.

"සංස්කාර තමා වශයෙන් නොදකියි. තමා සංස්කාරවත් යයි හෝ නොදකියි. සංස්කාර තමා කෙරෙහිවූ ඇතැයි හෝ නොදකියි. සංස්කාරයෙහි තමා ඇතැයි හෝ නොදකියි.

"විඤ්ඤාණය තමා වශයෙන් නොදකියි. තමා විඤ්ඤාණවත්යයි හෝ නොදකියි. විඤ්ඤාණය තමා කෙරෙහි ඇතැයි හෝ නොදකියි. විඤ්ඤාණයෙහි තමා ඇතැයි හෝ නොදකියි.

13. "එසේද වුවත් මෙවැනි දෘෂ්ටි ඇත්තේ වෙයි. 'එය ආත්මයයි. එය ලෝකයයි පරලොව එය වන්නෙමි. නිත්‍යයි.

ඒකාන්තයි. සාස්වතයි. නොපෙරලෙන ස්වභාව ඇත්තේය' කියායි.

"මහණෙනි, යම් ඒ සාස්වත දෘෂ්ටියක් වේද, ඒ සංස්කාර නම් වේ. ඒ සංස්කාරය වනාහි කුමක් හේතුකොට ඇත්තේද, කුමක් හටගැනීම කොට ඇත්තේද, කුමක් ඉපදීම කොට ඇත්තේද, කුමක් ප්‍රභව කොට ඇත්තේද? අවිද්‍යා ස්පර්ශයෙන් හටගත් වේදනාවෙන් ස්පර්ශ කරනලද අශ්‍රැතවත් පෘථග්ජනයාට උපන් තෘෂ්ණාවක් වෙයිද, ඒ සංස්කාරය එයින් හටගත්තේ වෙයි. සංස්කාරය වනාහි අනිත්‍යයි. ප්‍රත්‍යයෙන් කරණ ලදී. ප්‍රත්‍යයෙන් හටගත්තේය. ඒ තෘෂ්ණාවද, අනිත්‍යයි. ප්‍රත්‍යයෙන් කරනලදී. ප්‍රත්‍යයෙන් හටගත්තේය. ඒ වේදනාවද අනිත්‍යයි. ප්‍රත්‍යයෙන් කරනලදී. ප්‍රත්‍යයෙන් හටගත්තේය. ඒ ස්පර්ශයද අනිතයි. ප්‍රත්‍යයෙන් කරනලදී. ප්‍රත්‍යයෙන් හටගත්තේය. ඒ අවිද්‍යාවද අනිත්‍යයයි. ප්‍රත්‍යයෙන් සකස්කරන ලදී. ප්‍රත්‍යයෙන් හටගත්තාහුය. මහණෙනි, මෙසේ දන්නාහට මෙසේ දක්නාහට මාර්ගයට අනතුරුව ආශ්‍රවයන් ක්ෂය කරන අර්හත් ඵලය ඇතිවෙයි.

14. "රූපය තමා වශයෙන් නොදකියි. තමා රූපවත්යයි නොදකියි. රූපය තමා කෙරෙහි ඇතැයි නොදකියි. තමා රූපයෙහි ඇතැයි නොදකියි.

"වේදනාව තමා වශයෙන් ඇතැයි නොදකියි. තමා වේදනාවත්යයි නොදකියි. වේදනාව තමා කෙරෙහි ඇතැයි නොදකියි. තමා වේදනාවෙහි ඇතැයි නොදකියි.

"සංඥාව තමා වශයෙන් නොදකියි. තමා සංඥාවත්යයි නොදකියි. සංඥාව තමා කෙරෙහි ඇතැයි නොදකියි. තමා සංඥාවෙහි ඇතැයි නොදකියි.

"සංස්කාර තමා වශයෙන් නොදකියි. තමා සංස්කාරවත්යයි නොදකියි. තමා කෙරෙහි සංස්කාර ඇතැයි නොදකියි. තමා සංස්කාරයෙහි ඇතැයි නොදකියි.

"විඤ්ඤාණය තමා වශයෙන් නොදකියි. තමා විඤ්ඤාණවත්යයි නොදකියි. විඤ්ඤාණය තමා කෙරෙහි ඇතැයි නොදකියි. තමා විඤ්ඤාණයෙහි ඇතැයි නොදකියි. මෙවැනි දෘෂ්ටි ඇත්තේද නොවෙයි. 'එය ආත්මයය. එය ලෝකයය. එය පරලොව වන්නෙමි. නිත්‍යය, ඒකාන්තය, සාස්වතය. නොපෙරලෙන ස්වභාවය' කියායි. එසේද වුවත් මෙවැනි දෘෂ්ටි ඇත්තේවෙයි. 'ඉදින් මම නොවන්නෙම් නම් මාගේ දෙයක්ද නොවන්නේය. ඉදින් මම පරලොව නොවන්නෙම් නම් පරලොවද මාගේ දෙයක් නොවන්නේය' කියායි.

**15.** "මහණෙනි, යම් ඒ උච්ඡේද දෘෂ්ටියක් වේද, ඒ සංස්කාර නම් වේ . ඒ සංස්කාරය කුමක් නිදානකොට, කුමක් උත්පත්තිකොට, කුමක් ප්‍රභවකොට ඇත්තේද?

"මහණෙනි, අවිද්‍යා ස්පර්ශයෙන් හටගත් වේදනාවෙන් ස්පර්ශ කරණ ලද බොහෝ ඇසූ පිරූ තැන් නැති පෘථග්ජනයාහට උපන් තෘෂ්ණාවක් වෙයිද, එයින් ඒ සංස්කාරය හටගත්තේ වෙයි.

"මහණෙනි, මෙසේ ඒ සංස්කාරද අනිත්‍යය. ප්‍රත්‍යයන් විසින් කරණ ලදී. ප්‍රත්‍යයන්ගෙන් හටගත්තේය. ඒ තෘෂ්ණාවද අනිත්‍යය. ප්‍රත්‍යයන් විසින් කරනලදද, ප්‍රත්‍යයන්ගෙන් හටගන්නාහුය. ඒ වේදනාවද අනිත්‍යය, ප්‍රත්‍යයන් විසින් කරනලදද, ප්‍රත්‍යයන්ගෙන් හටගන්නාහුය. ඒ ස්පර්ශයද අනිත්‍යය. ප්‍රත්‍යයන් විසින් කරනලදද, ප්‍රත්‍යයන්ගෙන් හටගන්නාහුය. ඒ අවිද්‍යාවද අනිත්‍යයහ. ප්‍රත්‍යයන් විසින් කරණ ලදහ. ප්‍රත්‍යයන්ගෙන් හටගත්තාහුය. මහණෙනි, මෙසේ දන්නාහට මෙසේ දක්නාහට මාර්ගයට අනතුරුව ආශ්‍රවයන් ක්ෂය කරන්නාවූ අර්හත්ඵලය වෙයි.

**16.** "රූපය ආත්ම වශයෙන් නොදකියි. තමා රූපවත්යයි නොදකියි. රූපය තමා කෙරෙහි ඇතැයි හෝ නොදකියි. තමා රූපය කෙරෙහි ඇතැයි හෝ නොදකියි.

"වේදනාව ආත්ම වශයෙන් නොදකියි. තමා වේදනාවත්යයි නොදකියි. වේදනාව තමා කෙරෙහි ඇතැයි නොදකියි. තමා වේදනාව කෙරෙහි ඇතැයි හෝ නොදකියි.

"සංඥාව ආත්ම වශයෙන් නොදකියි. තමා සංඥාවත්යයි නොදකියි. සංඥාව තමා කෙරෙහි ඇතැයි නොදකියි. තමා සංඥාව කෙරෙහි ඇතැයි හෝ නොදකියි.

"සංස්කාර ආත්ම වශයෙන් නොදකියි. තමා සංස්කාරවත්යයි නොදකියි. සංස්කාර තමා කෙරෙහි ඇතැයි නොදකියි. තමා සංස්කාර කෙරෙහි ඇතැයි හෝ නොදකියි.

"විඤ්ඤාණය ආත්ම වශයෙන් නොදකියි. තමා විඤ්ඤාණවත්යයි නොදකියි. විඤ්ඤාණය තමා කෙරෙහි ඇතැයි නොදකියි. තමා විඤ්ඤාණය කෙරෙහි ඇතැයි හෝ නොදකියි.

"මෙවැනි දෘෂ්ටි ඇත්තේද නොවෙයි. 'එය ආත්මයය. එය ලෝකයය. එය පරලොව වන්නේය. නිත්‍යය, ඒකාන්තය. සාස්තවය, නොපෙරලෙන ස්වභාවය' කියායි. එසේද වුවත් මෙවැනි දෘෂ්ටි ඇත්තේද නොවෙයි.

"ඉදින් මම නොවෙයි නම් මගේ දෙයක්ද නොවේ. ඉදින් මම පරලොව නොවන්නෙම් නම් මගේ දෙයක්ද නොවන්නේය' කියායි. එසේදවුවත් සද්ධර්මයෙහි සැක ඇත්තේ විචිකිච්ඡා ඇත්තේ නිෂ්ටාවට නොපැමිණියේ වෙයි.

17. "මහණෙනි, සද්ධර්මයෙහි යම් ඒ සැකයක් විචිකිච්ඡාවක් නිෂ්ටාවට නොපැමිණීමක් වේද, ඒ සංස්කාර නම්වේ. ඒ සංස්කාරය කුමක් නිදානකොට ඇත්තේද, කුමක් උත්පත්ති කොට කුමක් ජාතිකොට කුමක් ප්‍රභවකොට ඇත්තේද?

"මහණෙනි, අවිද්‍යා ස්පර්ශයෙන් හටගත් වේදනාවෙන් ස්පර්ශ කරණ ලද බොහෝ ඇසූ පිරූ තැන් නැති පෘථග්ජනයාහට උපන් තෘෂ්ණාවක් වෙයිද, එයින් ඒ සංස්කාරය හටගත්තේ වෙයි.

"මහණෙනි, ඒ සංස්කාරද අනිත්‍යයය. ප්‍රත්‍යයන් විසින් කරණලදද, ප්‍රත්‍යයන්ගෙන් හටගත්තාහුය. තණ්හාව අනිත්‍යයය. ප්‍රත්‍යයන් විසින් කරණලදද ප්‍රත්‍යයන්ගෙන් හටගත්තාහුය. ඒ

වේදනාවද, අනිත්‍යයය. ප්‍රත්‍යයන් විසින් කරණලදද ප්‍රත්‍යයන්ගෙන් හටගන්නාහුය. ඒ ස්පර්ශයද, අනිත්‍යයය. ප්‍රත්‍යයන් විසින් කරණලදද ප්‍රත්‍යයන්ගෙන් හටගත්තාහුය. ඒ අවිද්‍යාවද අනිත්‍යය. ප්‍රත්‍යයන් විසින් කරණලදද, ප්‍රත්‍යයන්ගෙන් හටගත්තාහුය.

"මහණෙනි, මෙසේ දක්නහුට මෙසේ දන්නහුට මාර්ගයට අනතුරුව ආශ්‍රවයන් ක්ෂය කරන්නාවූ අර්හත් ඵලය වෙයි."

**(නවවෙනි පාරිලෙය්‍යක සූත්‍රය නිමි.)**

---

## 10. පුණ්ණමානි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ පූර්වාරාමයෙහි මිගාරමාතු නම් ප්‍රාසාදයෙහි මහත් භික්ෂු සංඝයා සමග වාසය කළසේක. එසමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ පිරුණු සඳ ඇති එදවස පුණු පොහොය ඇති රාත්‍රියෙහි භික්ෂු සංඝයා පිරිවරා එලිමහනෙහි වැඩසිටියහ.

ඉක්බිති එක්තරා භික්ෂුවක් ආසනයෙන් නැගිට සිවුර ඒකාංශකොට පොරවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි ඇඳිලිබැඳ වැඳ භාග්‍යවතුන් වහන්සේට මෙය කීය.

2. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඉදින් මට ප්‍රශ්නයක් ඇසීම පිණිස අවකාස දෙයිද? භාග්‍යවතුන් වහන්සේගෙන් මම ප්‍රශ්නයක් අසමි" කියායි.

"මහණ, එසේනම් තුඹ ස්වකීය ආසනයෙහි හිඳ යමක් ඇසීමට කැමැත්තෙහිද, එය අසව."

ඒ භික්ෂුව "එසේය. ස්වාමීනි!"යි භාග්‍යවතුන් වහන්සේට උත්තර දී තම ආසනයෙහි ඉඳ, භාග්‍යවතුන් වහන්සේට මෙය කීය.

3. "ස්වාමීනි, මොව්හු පඤ්චොපාදානස්කන්ධයෝ නොවෙත්ද? කවරහුදයත්? රූප උපාදානස්කන්ධය, වේදනා

උපාදානස්කන්ධය, සඤ්ඤා උපාදානස්කන්ධය, සංස්කාර උපාදානස්කන්ධය, විඤ්ඤාණ උපාදානස්කන්ධය” යනුයි.

“මහණ, මොවුහු වනාහි පඤ්චොපාදානස්කන්ධයෝයි කෙසේදයත්? රූප උපාදානස්කන්ධය, වේදනා උපාදානස්කන්ධය, සඤ්ඤා උපාදානස්කන්ධය, සංස්කාර උපාදානස්කන්ධය, විඤ්ඤාණ උපාදානස්කන්ධය” යනුයි.

ඒ භික්ෂුව “යහපත. ස්වාමීනි’යි භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුව, අනුමෝදන්ව, භාග්‍යවතුන් වහන්සේගෙන් මතු ප්‍රශ්නයක් ඇසීය.

**4.** “ස්වාමීනි මේ පඤ්චොපාදානස්කන්ධයෝ වනාහි කුමක් මුල්කොට පවත්නාහුද?”

“මහණ, මේ පඤ්චොපාදානස්කන්ධයෝ ආශාව මුල්කොට පවත්නාහ.”

ඒ භික්ෂුව “ස්වාමීනි, යහපතැ”යි භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුව, අනුමෝදන්ව, භාග්‍යවතුන් වහන්සේගෙන් මතු ප්‍රශ්නයක් ඇසීය.

**5.** “ස්වාමීනි, ඒ පඤ්චොපාදානස්කන්ධයෝම උපාදානය වෙයිද, නොහොත් පඤ්ච උපාදානස්කන්ධයන් කෙරෙන් අන්‍ය වූවක් උපාදානය වෙයිද?”

“මහණ, ඒ පඤ්චොපාදානස්කන්ධයෝ උපාදානය නොවේ. පඤ්චොපාදානස්කන්ධයෙන් අන් තැනෙක්හිද උපාදාන නොවේ. එසේ වුවද, ඒ පඤ්ච උපාදානස්කන්ධයන් කෙරෙහි යම් ඇලීමක් වෙයිද, ඒ ඇලීම එහි උපාදානය වේ.

ඒ භික්ෂුව “යහපත, ස්වාමීනි”යි භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුව, අනුමෝදනාව, භාග්‍යවතුන් වහන්සේගෙන් මතුද ප්‍රශ්නයක් ඇසීය.

**6.** “ස්වාමීනි, පඤ්ච උපාදානස්කන්ධයන් කෙරෙහි පවත්නා ආශාවේ වෙනසක් ඇත්තේද?” යනුයි.

“මහණ, ඇතැයි” භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

"මහණ මේ ලොකයෙහි ඇතැමෙකුට මෙසේ අදහස් වෙයි. 'අනාගත කාලයෙහි මෙබඳු රූපය ඇත්තෙක් වන්නෙම්වා අනාගත කාලයෙහි මෙබඳු වේදනා ඇත්තෙක් වන්නෙම්වා. අනාගත කාලයෙහි මෙබඳු සඤ්ඤා ඇත්තෙක් වන්නෙම්වා. අනාගත කාලයෙහි මෙබඳු සංස්කාර ඇත්තෙක් වන්නෙම්වා. අනාගත කාලයෙහි මෙබඳු විඤ්ඤාණ ඇත්තෙක් වන්නෙම්වා. මහණ, පඤ්ච උපාදානස්කන්ධයන් පවත්නා ආශාවේ මෙසේ වෙනස් බව වන්නේය" යනුයි.

"යහපත ස්වාමීනි"යි ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුව, අනුමෝදන්ව භාග්‍යවතුන් වහන්සේගෙන් මතු ප්‍රශ්නයක් ඇසීය.

7. "ස්වාමීනි, කිනම් අර්ථයකින් ස්කන්ධයන්ට ස්කන්ධ යන ව්‍යවහාරය වන්නේද?

"මහණ, යම්කිසි අතීතවූ හෝ අනාගතවූ හෝ වර්තමානවූ හෝ අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි රූපයක් වේද, මේ රූපස්කන්ධයයි කියනු ලැබේ.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද, සමීපවූද, යම්කිසි වේදනාවක් වෙයිද මෙය වේදනා ස්කන්ධයයි කියනු ලැබේ.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද හීනවූද උතුම්වූද, දුරවූද, සමීපවූද, යම්කිසි සංඥාවක් වෙයිද මෙය සංඥා ස්කන්ධයයි කියනු ලැබේ.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද, සමීපවූද යම්කිසි සංස්කාරයෝ වෙත්ද, මෙය සංස්කාර ස්කන්ධයයි කියනු ලැබේ.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද දුරවූද, සමීපවූද යම්කිසි විඤ්ඤාණයක් වේද මේ විඤ්ඤාණස්කන්ධයයි කියනු ලැබේ. මහණ, මෙතෙකින් ස්කන්ධයන්ගේ ස්කන්ධ යන ව්‍යවහාරය වේ.

ඒ භික්ෂුව "යහපත, ස්වාමීනි"යි භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුව, අනුමෝදන්ව භාග්‍යවතුන් වහන්සේගෙන් මතු ප්‍රශ්නයක් ඇසීය.

8. "ස්වාමීනි, රූපස්කන්ධයාගේ පැනවීම පිණිස, හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද? වේදනා ස්කන්ධයාගේ පැනවීම පිණිස හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද? සංඥාස්කන්ධයාගේ පැනවීම පිණිස හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද? සංස්කාර ස්කන්ධයාගේ පැනවීම පිණිස හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද? විඤ්ඤාණ ස්කන්ධයාගේ පැනවීම පිණිස හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?

"මහණ, රූපස්කන්ධයාගේ පැනවීම පිණිස, සතර මහා භූතයෝ හේතුවය. සතර මහාභූතයෝ ප්‍රත්‍යය. වේදනා ස්කන්ධයාගේ පැනවීම පිණිස ස්පර්ශය හේතුවය. ස්පර්ශය ප්‍රත්‍යයයි. සංඥාස්කන්ධයාගේ පැනවීම පිණිස ස්පර්ශය හේතුවය. ස්පර්ශය ප්‍රත්‍යයයි. සංස්කාර ස්කන්ධයාගේ පැනවීම පිණිස ස්පර්ශය හේතුවයි. ස්පර්ශය ප්‍රත්‍යයයි. විඤ්ඤාණස්කන්ධයාගේ පැනවීම පිණිස නාමරූප හේතුවයි. නාමරූප ප්‍රත්‍යයයි.

ඒ භික්ෂුව "යහපත, ස්වාමීනි"යි භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුව, අනුමෝදනාව භාග්‍යවතුන් වහන්සේගෙන් මතු ප්‍රශ්නයක් ඇසීය.

9. "ස්වාමීනි, සක්කායදිට්ඨිය කෙසේ නම් වන්නේද?

"මහණ, මේ ලොකයෙහි ආර්යයන් නුදුටු ආර්යධර්මයෙහි අදක්ෂ, ආර්ය ධර්මයෙහි නොහික්මුණු, සත්පුරුෂයන් නුදුටු, සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂ, සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුණු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පෘථග්ජන අශ්‍රැතවත් භික්ෂුව රූපය තමා වශයෙන් දකියි. රූපය ඇතියකු හෝ තමා වශයෙන් දකියි. රූපය තමා කෙරෙහි ඇතැයි හෝ දකියි රූපයෙහි තමා ඇතැයි හෝ දකියි.

"වේදනාව තමා වශයෙන් දකියි. වේදනාව ඇතියකු හෝ තමා වශයෙන් දකියි. වේදනාව තමා කෙරෙහි ඇතැයි හෝ දකියි. වේදනාවෙහි තමා ඇතැයි හෝ දකියි.

"සංඥාව තමා වශයෙන් දකියි. සංඥාව ඇතියකු හෝ තමා වශයෙන් දකියි. සංඥාව තමා කෙරෙහි ඇතැයි හෝ දකියි. සංඥාවෙහි තමා ඇතැයි හෝ දකියි.

"සංස්කාරයන් තමා වශයෙන් දකියි. සංස්කාර ඇතියකු හෝ තමා වශයෙන් දකියි. සංස්කාර තමා කෙරෙහි ඇතැයි හෝ දකියි. සංස්කාරයන්හි තමා ඇතැයි හෝ දකියි.

"විඤ්ඤාණය තමා වශයෙන් දකියි. තමා විඤ්ඤාණය ඇත්තෙකැයි දකියි තමා කෙරෙහි විඤ්ඤාණය ඇතැයි හෝ දකියි. විඤ්ඤාණය කෙරෙහි තමා ඇතැයි හෝ දකියි. මහණ, මෙසේ වනාහි සක්කායදිට්ඨිය වේ යයි වදාළේය.

ඒ භික්ෂුව "යහපත ස්වාමීනි"යි භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුව, අනුමෝදන්ව භාග්‍යවතුන් වහන්සේගෙන් මතු ප්‍රශ්නයක් ඇසීය.

**10.** "ස්වාමීනි, කෙසේ වනාහි සක්කායදිට්ඨිය නොවන්නේද?" "මහණ මේ ශාසනයෙහි ආර්යයන් දුටු, ආර්යධර්මයෙහි දක්ෂ, ආර්ය ධර්මයෙහි හික්මුණු, සත්පුරුෂයන් දුටු, සත්පුරුෂ ධර්මයෙහි දක්ෂ සත්පුරුෂ ධර්මයෙහි හික්මුණු, ශ්‍රැතවත් ආර්යය ශ්‍රාවක තෙමේ රූපය තමා වශයෙන් නොදකියි. තමා රූපය ඇත්තෙකැයි හෝ නොදකියි. රූපය තමා කෙරෙහි ඇතැයි හෝ නොදකියි. රූපය කෙරෙහි තමා ඇතැයි හෝ නොදකියි.

"වේදනාව තමා වශයෙන් නොදකියි. තමා වේදනාව ඇත්තෙකැයි හෝ නොදකියි, වේදනාව තමා කෙරෙහි ඇතැයි හෝ නොදකියි. තමා වේදනාව කෙරෙහි ඇතැයි හෝ නොදකියි.

"සංඥාව තමා වශයෙන් නොදකියි තමා සංඥාව ඇත්තෙකැයි හෝ නොදකියි. සංඥාව තමා කෙරෙහි ඇතැයි හෝ නොදකියි. තමා සංඥාව කෙරෙහි ඇතැයි හෝ නොදකියි.

"සංස්කාරයන් තමා වශයෙන් නොදකියි. තමා සංස්කාර ඇත්තෙකැයි හෝ නොදකියි. සංස්කාර තමා කෙරෙහි ඇතැයි හෝ නොදකියි. තමා සංස්කාර කෙරෙහි ඇතැයි හෝ නොදකියි.

"විඥ්ඥාණය තමා වශයෙන් නොදකියි. තමා විඥ්ඥාණය ඇත්තෙකැයි හෝ නොදකියි. විඥ්ඥාණය තමා කෙරෙහි ඇතැයි හෝ නොදකියි. තමා විඥ්ඥාණය කෙරෙහි ඇතැයි හෝ නොදකියි. මහණ, මෙසේ සක්කායදිට්ඨිය නොවේයයි" වදාළේය.

ඒ භික්ෂුව "යහපත ස්වාමීනි"යි භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුව, අනුමෝදන්ව භාග්‍යවතුන් වහන්සේගෙන් මතු ප්‍රශ්නයක් ඇසීය.

11. "ස්වාමීනි, රූපයාගේ ආශ්වාදය කවරේද? ආදීනවය කවරේද? නිස්සරණය කුමක්ද?" වේදනාවගේ ආශ්වාදය කවරේද? ආදීනවය කවරේද? නිස්සරණය කුමක්ද? සංඥාවගේ ආශ්වාදය කවරේද? ආදීනවය කවරේද? නිස්සරණය කුමක්ද? සංස්කාරයාගේ ආශ්වාදය කවරේද? ආදීනවය කවරේද? නිස්සරණය කුමක්ද? විඥ්ඥාණයාගේ ආශ්වාදය කවරේද? ආදීනවය කවරේද? නිස්සරණය කුමක්ද?

"මහණ, රූපයක් නිසා යම් සැපයක් සොම්නසක් උපදියිද, ඒ රූපයාගේ ආශ්වාදයයි. යම් රූපයක් අනිත්‍යද දුකද, වෙනස්වන ස්වභාවයෙන් යුක්තද, මේ රූපයාගේ ආදීනවයයි. රූපයෙහි යම් ආශාව දුරු කිරීමක්, ආශාව පහකිරීමක් වෙයිද, මෙය රූපයාගේ නිස්සරණයයි.

"වේදනාව නිසා යම් සැපයක් සොම්නසක් උපදියිද, මේ වේදනාවගේ ආශ්වාදයයි යම් වේදනාවක් අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවයෙන් යුක්තද, මේ වේදනාවගේ ආදීනවයයි.

වේදනාවගේ යම් ආශාව දුරුකිරීමක්, ආශාව පහකිරීමක් වෙයිද, මේ වේදනාවගේ නිස්සරණයයි.

"සංඥාව නිසා යම් සැපයක්, සොම්නසක් උපදියිද, මේ සංඥාවගේ ආශ්වාදයයි. යම් සංඥාවක් අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවයෙන් යුක්තද, මේ සංඥාවගේ ආදීනවයයි. සංඥාවගේ යම් ආශාව දුරු කිරීමක්, ආශාව පහකිරීමක් වෙයිද, මේ සංඥාවගේ නිස්සරණයයි.

"සංස්කාරය නිසා යම් සැපයක් සොම්නසක් උපදියිද, මේ සංස්කාරයන්ගේ ආශ්වාදයයි. යම් ඒ සංස්කාරයෝ අනිත්‍ය වෙත්ද, දුක් වෙත්ද, වෙනස්වන ස්වභාවයෙන් යුක්ත වෙත්ද, මේ සංස්කාරයන්ගේ ආදීනවයයි. සංස්කාරයන්ගේ යම් ආශාව දුරු කිරීමක්, ආශාව පහකිරීමක් වෙයිද, මේ සංස්කාරයන්ගේ නිස්සරණයයි.

විඥ්ඥාණය නිසා යම් සැපයක් යම් සොම්නසක් උපදියිද, මේ විඥ්ඥාණයාගේ ආශ්වාදයයි යම් විඥ්ඥාණයක් අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවයෙන් යුක්තද, මේ විඥ්ඥාණයාගේ ආදීනවයයි. විඥ්ඥාණයෙහි යම් ආශාව දුරු කිරීමක්, ආශාව පහකිරීමක් වෙයිද මේ විඥ්ඥාණයාගේ නිස්සරණයයි" වදාළේය.

ඒ භික්ෂුව 'යහපත ස්වාමීනි'යි භාග්‍යවතුන්වහන්සේගේ වචනයට ඉතා සතුටුව, අනුමෝදන්ව භාග්‍යවතුන් වහන්සේගෙන් මතු ප්‍රශ්නයක් ඇසීය.

12. "ස්වාමීනි, කෙසේ දන්නහුට, කෙසේ දක්නහුට, මේ 'විඥ්ඥාණය සහිත සිරුරෙහිද, බාහිරද, සියලු ආරම්මණයන්හිද මමය, මාගේයයි" ගැනීම මානානුසය යන මොව්හු නොවෙත්ද?

"මහණතෙම අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද, ළඟවූද, යම්කිසි රූපයක් වේද, ඒ සියලු රූපය 'මෙය මගේ නොවෙයි. එය මම නොවෙමි එය මගේ ආත්මය නොවේයයි' මෙසේ තත්වූ පරිද්දෙන්, මනා නුවණින් දකියිද,

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද, ලඟවූද, යම්කිසි වේදනාවක් වේද, ඒ සියලු වේදනාව 'මෙය මගේ නොවෙයි. එය මම නොවෙමි. එය මගේ ආත්මය නොවේයයි' මෙසේ තත්වූ පරිද්දෙන්, මනා නුවණින් දකියිද,

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද, ලඟවූද, යම්කිසි සංඥාවක් වේද, ඒ සියලු සංඥාව 'මෙය මගේ නොවෙයි. එය මම නොවෙමි. එය මගේ ආත්මය නොවේයයි' මෙසේ තත්වූ පරිද්දෙන්, මනා නුවණින් දකියිද,

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද, ලඟවූද, යම්කිසි සංස්කාරයක් වේද, ඒ සියලු සංස්කාර 'මෙය මගේ නොවෙයි. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේයයි' මෙසේ තත්වූ පරිද්දෙන්, මනා නුවණින් දකියිද,

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද, ලඟවූද, යම්කිසි විඥ්ඥාණයක් වෙයිද, ඒ සියලු විඥ්ඥාණය මෙය මගේ නොවෙයි. එය මම නොවෙමි එය මාගේ ආත්මය නොවේයයි' තත්වූ පරිද්දෙන් මනා නුවණින්, දකියිද, මහණ මෙසේ දන්නහුට, මෙසේ දක්නහුට, මේ සවිඥ්ඥාණක සිරුරෙහිද බාහිරවූ සියලු ආරම්මණයන්හිද, 'මමය, මගේයයි' ගැනීම සහ මානානුසය යන මොහු නොවෙත්යයි" වදාළේය.

13. එසමයෙහි වනාහි එක්තරා භික්ෂුවකට සිතෙහි මෙවැනි අදහසක් ඇතිවිය. 'ස්වාමීනි, මෙසේ වනාහි රූපය අනාත්ම නම්, වේදනාව අනාත්ම නම්, සංඥාව අනාත්ම නම්, සංස්කාරයෝ අනාත්ම නම්, විඥ්ඥාණය අනාත්ම නම් අනාත්මය විසින් කරනලද කර්මයෝ කෙසේ තමා කරා පැමිණෙත්ද? එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ සිත පිළිබඳ විතර්කය තම සිතින් දැන භික්ෂූන්ට ඇමතූසේක.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

14. "මහණෙනි, මේ ශාසනයෙහි එක්තරා අඥානවූ අවිද්‍යාවෙන් යුත් හිස් පුරුෂයෙක් තෘෂ්ණාවෙන් මඩිනලද සිතින්

"පින්වත, මෙසේ වනාහි රූපය අනාත්ම නම්. වේදනාව අනාත්ම නම්, සංඥාව අනාත්ම නම්, සංස්කාරයෝ අනාත්ම නම්, විඤ්ඤාණය අනාත්ම නම් අනාත්මය විසින් කරනලද කර්මයෝ කෙසේ නම් තමා කරා පැමිණෙත්දැයි ශාස්තෘ ශාසනය ඉක්මවිය යුතුයයි හඟින්නේය. ඊට කරුණු ඇත්තේය.

15. "මහණෙනි, මා විසින් තෙපි ඒ ඒ තන්හි, ඒ ඒ ධර්මයන්හි, අසනලදුව හික්මවන ලද්දාහුය. මහණෙනි, එය කුමකැයි සිතව්ද?

"රූපය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම් එය දුක් හෝ සැප හෝ වේද?" - "ස්වාමීනි, දුකෙකි."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවයෙන් යුක්තද? 'එය මගේය. එය මම වෙමි. එය මගේ ආත්මයයි' ගැනීමට සුදුසුද? - "ස්වාමීනි, එය එසේ නොවන්නේමය."

"වේදනාව නිත්‍යද? අනිත්‍යද? - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම් එය දුක් හෝ සැප හෝ වේද?' - "ස්වාමීනි, දුකෙකි."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවයෙන් යුක්තද? 'එය මගේය. එය මම වෙමි. එය මගේ ආත්මයයි' ගැනීමට සුදුසුද?" - "ස්වාමීනි, එය එසේ නොවන්නේමය."

"සංඥාව නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම් එය දුක් හෝ සැප හෝ වේද?" - "ස්වාමීනි, දුකෙකි."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවයෙන් යුක්තද? එය මගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි' ගැනීමට සුදුසුද?" - "ස්වාමීනි, එය එසේ නොවන්නේමය."

"සංස්කාරය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"යමක් අනිත්‍ය නම් එය දුක් හෝ සැප හෝ වේද?" - "ස්වාමීනි, දුකෙකි."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවයෙන් යුක්තද? 'එය මගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි' ගැනීමට සුදුසුද?" - "ස්වාමීනි, එය එසේ නොවන්නේමය."

"විඥ්ඥාණය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම් එය දුක් හෝ සැප හෝ වේද?" - "ස්වාමීනි, දුකෙකි."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවයෙන් යුක්තද? 'එය මගේය. එය මම වෙමි. එය මගේ ආත්මයයි' ගැනීමට සුදුසුද?" - 'ස්වාමීනි එය එසේ නොවන්නේමය.

**16.** "මහණෙනි, එසේ හෙයින් අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද, ලඟවූද, යම්කිසි රූපයක් ඒ සියලු රූප, "මෙය මගේ නොවෙයි. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේයයි' මෙය මෙසේ තත්වූ පරිද්දෙන් මනා නුවණින් දතයුතුයි.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද, ලඟවූද යම්කිසි වේදනාවක් වේද, ඒ සියලු වේදනා 'මෙය මගේ නොවෙයි. එය මම නොවෙමි. එය මගේ ආත්මය නොවේයයි මෙය මෙසේ තත්වූ පරිද්දෙන් මනා නුවණින් දතයුතුයි.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද, ලඟවූද යම්කිසි සංඥාවක් වේද, ඒ සියලු සංඥා 'මෙය මගේ නොවෙයි. එය මම නොවෙමි එය මගේ ආත්මය නොවේයයි' මෙය මෙසේ තත්වූ පරිද්දෙන් මනා නුවණින් දතයුතුයි.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද,

ලඟවූද යම්කිසි සංස්කාරයක් වේද, ඒ සියලු සංස්කාර 'මෙය මගේ නොවෙයි. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේයයි' මෙය මෙසේ තත්වූ පරිද්දෙන් මනා නුවණින් දතයුතුයි.

"අතීතවූද අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද, ලඟවූද යම්කිසි විඥ්ඥාණයක් වේද, ඒ සියලු විඥ්ඥාණ 'මෙය මගේ නොවෙයි. එය මම නොවෙමි එය මාගේ ආත්මය නොවේයයි' මෙය මෙසේ තත්වූ පරිද්දෙන් මනා නුවණින් දතයුතුයි.

**17.** "මහණෙනි, මෙසේ දක්නාවූ, ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකතෙමේ රූපයෙහිද කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයෙහිද කලකිරෙයි. විඥ්ඥාණයෙහිද කලකිරෙයි. කලකිරීමෙන් (මාර්ගයට පැමිණීමෙන්) නොඇලීමෙන් (ඵලයට පැමිණීමෙන්) මිදෙයි. මිදුනු කල්හි මිදුනේයයි නුවණ (පහල) වෙයි. ජාතිය කෙළවර විය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවනලදී. කළයුත්ත කරන ලදී. මේ භවය පිණිස අනික් කළයුතු කිසිවක් නැතැයි දැනගනී" යනුයි.

**(දහවෙනි පුණ්ණමානී සූත්‍රය නිමි.)**

---

(අස්සාද සූත්‍රයද, සමුදය සූත්‍රයද, අරහන්ත සූත්‍ර දෙකද, සීහො සූත්‍රයද, බජ්ජනී සූත්‍රයද, පිණ්ඩොල සූත්‍ර දෙකද, පාරිලෙය්‍යක සූත්‍රයද, පුණ්ණමානී සූත්‍රදැයි මේ වර්ගයෙහි සූත්‍ර දසයකි.)

**(අටවෙනි බජ්ජනීය වර්ගය නිමි.)**

---

# 9. ථෙර වර්ගය

## 1. ආනන්ද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ 'ඇවැත්නි' කියා භික්ෂූහු ඇමතුවේය. 'ඇවැත්නි' කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයනට උත්තර දුන්හ. එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භික්ෂූන්ට මෙසේ වදාළ සේක.

2. "ඇවැත්නි, මන්තාණි නම් බැමිණියගේ පුත්‍රවූ ආයුෂ්මත් පුණ්ණ ස්ථවිරයෝ නවකවූ ම අපට බොහෝ උපකාර ඇත්තාහුවෙති. ඔහු අපට මේ අවවාදයෙන් අවවාද කෙරෙති.

"ඇවැත්, ආනන්ද ස්ථවිරයෙනි, (තණ්හා - මාන - දිට්ඨි වසයෙන් තදින් අල්ලාගැනීම) නිසා, 'මම වෙමි' යන හැඟීම ඇතිවෙයි. එසේ අල්ලා නොගැනීම නිසා 'මම වෙමි' යන හැඟීම ඇති නොවෙයි. කුමක් වනාහි (තණ්හා - මාන - දිට්ඨි වසයෙන් තදින් අල්ලා ගැනීම නිසා, 'මම වෙමි' යන හැඟීම ඇති වෙයිද? කුමක් වනාහි එසේ අල්ලා නොගැනීම නිසා 'මම වෙමි' යන හැඟීම ඇති නොවෙයිද?

"රූපය (තණ්හා - මාන - දිට්ඨි වසයෙන් තදින් අල්ලා ගැනීම) නිසා, 'මම වෙමි' යන හැඟීම ඇතිවෙයි. රූපය එසේ අල්ලා නොගැනීම නිසා, 'මම වෙමි' යන හැඟීම ඇති නොවෙයි.

"වේදනාව (තණ්හා - මාන - දිට්ඨි වසයෙන් තදින් අල්ලා ගැනීම නිසා, 'මම වෙමි' යන හැඟීම ඇති වෙයි. වේදනාව එසේ අල්ලා නොගැනීම නිසා, 'මම වෙමි' යන හැඟීම ඇති නොවෙයි.

"සංඥාව (තණ්හා - මාන - දිට්ඨි වසයෙන් තදින් අල්ලා ගැනීම) නිසා, 'මම වෙමි' යන හැඟීම ඇති වෙයි. සංඥාව එසේ අල්ලා නොගැනීම නිසා, 'මම වෙමි' යන හැඟීම ඇතිනොවෙයි.

"සංස්කාර (තණ්හා - මාන - දිට්ඨි වසයෙන් තදින් අල්ලා ගැනීම) නිසා, 'මම වෙමි' යන හැඟීම ඇතිවෙයි. එසේ අල්ලා නොගැනීම නිසා 'මම වෙමි' යන හැඟීම ඇති නොවෙයි.

"විඤ්ඤාණය (තණ්හා - මාන - දිට්ඨි වසයෙන් තදින් අල්ලා ගැනීම) නිසා, 'මම වෙමි' යන හැඟීම ඇති වෙයි. එසේ අල්ලා නොගැනීම නිසා, 'මම වෙමි' යන හැඟීම ඇති නොවෙයි.

**4.** "ඇවැත්, ආනන්ද ස්ථවිරයෙනි, එපරිද්දෙන්ම (තණ්හා - මාන - දිට්ඨි වසයෙන් තදින් අල්ලා ගැනීම නිසා, 'මම වෙමි' යන හැඟීම ඇතිවෙයි. එසේ අල්ලා නොගැනීම නිසා 'මම වෙමි' යන හැඟීම ඇති නොවෙයි. කුමක් වනාහි (තණ්හා - මාන - දිට්ඨි වසයෙන් තදින් අල්ලා ගැනීම නිසා, 'මම වෙමි' යන හැඟීම ඇතිවෙයිද? කුමක් වනාහි එසේ අල්ලා නොගැනීම නිසා, 'මම වෙමි' යන හැඟීම ඇති නොවෙයිද?

"රූපය (තණ්හා - මාන - දිට්ඨි වසයෙන් තදින් අල්ලා ගැනීම) නිසා, 'මම වෙමි' යන හැඟීම ඇතිවෙයි. රූපය එසේ අල්ලා නොගැනීම නිසා, 'මම වෙමි' යන හැඟීම ඇති නොවෙයි.

"වේදනාව (තණ්හා - මාන - දිට්ඨි වසයෙන් තදින් අල්ලා ගැනීම, නිසා, 'මම වෙමි' යන හැඟීම ඇතිවෙයි වේදනාව එසේ අල්ලා නොගැනීම නිසා, 'මම වෙමි' යන හැඟීම ඇතිනොවෙයි.

"සංඥාව (තණ්හා - මාන - දිට්ඨි වසයෙන් තදින් අල්ලා ගැනීම) නිසා. 'මම වෙමි' යන හැඟීම ඇතිවෙයි සංඥාව එසේ අල්ලා නොගැනීම නිසා, 'මම වෙමි' යන හැඟීම ඇති නොවෙයි.

"සංස්කාර (තණ්හා - මාන - දිට්ඨි වසයෙන් තදින් අල්ලා ගැනීම) නිසා 'මම වෙමි' යන හැඟීම ඇතිවෙයි. එසේ අල්ලා නොගැනීම නිසා, 'මම වෙමි' යන හැඟීම ඇති නොවෙයි.

"විඤ්ඤාණය (තණ්හා - මාන - දිට්ඨි වසයෙන් තදින් අල්ලා ගැනීම) නිසා, 'මම වෙමි' යන හැඟීම ඇතිවෙයි. එසේ අල්ලා නොගැනීම නිසා, 'මම වෙමි' යන හැඟීම ඇති නොවෙයි.

**5.** "ඇවැත් ආනන්දස්ථවිරයෙනි, ඒ කුමැයි හඟින්නෙහිද, රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?" "ඇවැත්නි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යය වේ නම්, ඒ සැප හෝ දුක හෝ වේද?" - 'ඇවැත්නි, දුකය.'

"යමක් වනාහි අනිත්‍යය වේද, දුක් වේද, පෙරලෙන ස්වභාව ඇත්තේ වේද, 'මේ රූපය මාගේය, මේ මම වෙමි, මේ මාගේ ආත්මයයි' ඒ රූපය මනාව බලන්නට සුදුසු වේද?" - "ඇවැත්නි, ඒ නුසුදුසුය."

"වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?" - "ඇවැත්නි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම් එය සැප හෝ දුක හෝ වේද?" - "ඇවැත්නි, දුකය."

"යමක් අනිත්‍යය වේද, දුක් වේද, පෙරලෙන ස්වභාව ඇත්තේ වේද, එය මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්ම'යයි මේ වේදනාව මනාව දක්නට සුදුසු වේද?" - "ඇවැත්නි, නුසුදුසු වේමය.

"සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?" - "ඇවැත්නි, අනිත්‍යය."

"යමක් අනිත්‍යද එය සැප හෝ දුක් හෝ වේද?" - "ඇවැත්නි, දුක්වේය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්වේද, පෙරළෙන ස්වභාව ඇත්තේ වේද එය මේ සංඥාව මගේය, මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි මනාව දක්නට සුදුසු වේද?" - "ඇවැත්නි, නුසුදුසු වේමය."

"සංස්කාරයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?" - "ඇවැත්නි, අනිත්‍යයයි."

"යමක් අනිත්‍ය වේද, එය දුක් හෝ සැප හෝ වේද" - "ඇවැත්නි, දුකයි."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, පෙරලෙන ස්වභාව ඇත්තේද, එය මේ සංස්කාරයෝ මගේය, මේ මම වෙමි, මේ මාගේ ආත්ම'යයි මනාව දක්නට සුදුසු වේද?" - "ඇවැත්නි, (සුදුසු) නොවේමය."

"විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?" - "ඇවැත්නි, අනිත්‍යයයි."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?" - "ඇවැත්නි, දුකයි."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, පෙරලෙන ස්වභාව ඇත්තේද, එය 'මේ විඤ්ඤාණය මගේය, මේ මම වෙමි. මේ මාගේ ආත්ම'යයි මනාව දක්නට සුදුසු වේද?" - "ඇවැත්නි, සුදුසු නොවේමය."

**4.** "ඇවැත් ආනන්ද ස්ථවිරයෙනි, එහෙයින් මේ ලෝකයෙහි අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, යම්කිසි රූපයෙක් වේද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ යම් රූපයක් වේද, දුරෙහි හෝ සමීපයෙහි හෝ යම් රූපයෙක් වේද, ඒ සියලු රූපය මේ රූපය මාගේ නොවේය. මේ මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේ'යයි මේ රූපය මෙසේ තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුයි.

**5.** "තමා පිළිබඳවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමාන වූද යම්කිසි වේදනාවක් වේද, දුරෙහි හෝ සමීපයෙහි හෝ යම් වේදනාවක් වේද, ඒ සියලු වේදනාව 'මේ වේදනාව මාගේ නොවේය, මේ මම නොවෙමි, මේ මාගේ ආත්මය නොවේ' යයි මෙසේ මේ වේදනාව සම්‍යක් ප්‍රඥාවෙන් තත්වූ පරිද්දෙන් දත යුතුය.

**6.** "තමා කෙරෙහි පවත්නාවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ අතීත වූද, අනාගතවූද, වර්තමානවූද, යම්කිසි සංඥාවක් වේද, දුරෙහි හෝ සමීපයෙහි හෝ යම් සංඥාවක් වේද, ඒ සියලු සංඥාව 'මේ සංඥාව මාගේ

නොවේය, මේ මම නොවෙමි, මේ මාගේ ආත්මය නොවේයයි මෙසේ මේ සංඥාව තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය.

7. "තමා පිළිබඳවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද යම්කිසි සංස්කාරයෝ වෙද්ද, දුරෙහි හෝ සමීපයෙහි හෝ යම් සංස්කාරයෝ වෙද්ද, ඒ සියලු සංස්කාර සමූහය 'මගේ නොවේය, මේ මම නොවෙමි, මේ මාගේ ආත්මය නොවේ' යයි මෙසේ මේ සංස්කාරය තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය.

8. "තමා පිළිබඳවූ හෝ අනුන් පිළිබඳවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද යම්කිසි විඤ්ඤාණයෙක් වේද, දුරෙහි හෝ සමීපයෙහි හෝ යම් විඤ්ඤාණයෙක් වේද, ඒ සියලු විඤ්ඤාණය 'මේ විඥානය මගේ නොවේ, මේ (මම) නොවෙමි. මේ මාගේ ආත්මය නොවේ" යයි මෙසේ මේ විඤ්ඤාණය තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය.

9. "ඇවැත් ආනන්ද ස්ථවිරයෙනි, මෙසේ දක්නාවූ ඇසූ පිරූ තැන් ඇති ආර්යශ්‍රාවකතෙම රූපයෙහිද කලකිරෙයි, වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි, සංස්කාරයන්හිද කලකිරෙයි, විඥානයෙහිද කලකිරෙයි. කලකිරුණේ නො ඇලෙයි, නොඇලීමෙන් (කෙලෙසුන්ගෙන්) මිදුනේවෙයි. එවිට (කෙලෙසුන්ගෙන්) මිදුනෙමියි (ප්‍රත්‍යවෙක්ෂා) ඥානය ඇතිවෙයි.

"ඉපදීම ක්ෂයවූවාය, (මාර්ග) බ්‍රහ්මචර්යාව වැස නිමවන ලද්දේය. (සතර අරිමගින් කටයුතු) කෘත්‍යය කොට නිමවන ලද්දේය. මේ අර්හත්ඵලය පිණිස අනිකක් නැතැයි කියායි, ඇවැත්නි, මන්තානියගේ පුත්වූ ආයුෂ්මත් පුණ්ණ ස්ථවිර තෙමේ අලුත්වූම අපට මේ අවවාදයෙන් අවවාද කෙරෙයි. මන්තානියගේ පුත්වූ ආයුෂ්මත් පුණ්ණ ස්ථවිරයන්ගේ මේ ධර්මදෙශනාව අසා මා විසින් චතුස්සත්‍ය ධර්මය නුවණින් අවබෝධ කරන ලද්දේය."

**(පළමුවෙනි ආනන්ද සූත්‍රය නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 2. තිස්ස සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

2. එසමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේගේ නැන්දනියගේ පුත්‍රවූ ආයුෂ්මත් තිස්ස ස්ථවිර තෙම, බොහෝ භික්ෂූන්ට මෙසේ සැලකෙරෙයි- "ඇවැත්නි, කිම? මාගේ කය හටගත් බර බව ඇත්තක් සේ (අකර්මණ්‍ය වේ) මට දිශාවෝද ප්‍රකට නොවෙති. මට (පර්යාප්ති) ධර්මයෝද නොවැටහෙත්. ථීන මිද්ධය (චිත්ත චෛතසිකයන්ගේ අකර්මණ්‍ය බව) ද, මාගේ සිත මැඩගෙන සිටී (සස්නෙහි) ඇලුම් නැත්තේම බ්‍රහ්මචරියාවෙහි හැසිරෙමි. ධර්මයන්හි මට සැකයද උපදනේය."

3. ඉක්බිති බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියාහුය. පැමිණ බුදුන් වැඳ එකත්පසෙක හුන්හ. එක් පැත්තෙක හුන්නාවූම ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ දැන්වූහ:- "ස්වාමීනි! භාග්‍යවතුන් වහන්සේගේ නැන්දණියගේ පුත්වූ ආයුෂ්මත් තිස්ස ස්ථවිර තෙම බොහෝ භික්ෂූන්ට මෙසේ කියයි:- 'කිම? ඇවැත්නි, මාගේ ශරීරය හටගත් බර බවක් මෙන් (අකර්මණ්‍ය වේ.) දිශාවෝද ප්‍රකටව නොපැණෙත්, දහමද මට නොවැටහෙත්. ථීනමිද්ධයද, මාගේ සිත යටපත් කොට සිටී, (සස්නෙහි) ඇලුම් නැත්තේම බ්‍රහ්මචරියාවෙහි හැසිරෙමි. ධර්මයන්හි මට සැකයක්ද උපදනේය?"

4. එකල්හි භාග්‍යවතුන් වහන්සේ, එක්තරා මහණෙකු ඇමතූසේක:- "එව, මහණ, මාගේ වචනයෙන් 'ඇවත් තිස්ස ස්ථවිරයෙනි, ශාස්තෲන් වහන්සේ තොප කැඳවන සේකැ'යි තිස්ස භික්ෂුව කැඳවාගෙන එව," "එසේය ස්වාමීනි"යි ඒ මහණතෙම භාග්‍යවතුන් වහන්සේට උත්තරදී, ආයුෂ්මත් තිස්ස ස්ථවිරතෙම යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් තිස්සයන්ට මෙය සැළකෙළේය:- "ඇවත් තිස්ස

ස්ථවිරයෙනි, ශාස්තෲන් වහන්සේ තොප අමතන සේකැයි "ඇවත, එසේයයි' ආයුෂ්මත් තිස්ස තෙර ඒ භික්ෂුවට උත්තරදී භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූම ආයුෂ්මත් තිස්ස තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:-

**5.** "තිස්සය, තෝ 'ඇවැත්නි, මාගේ කය බර වූවාක් මෙන් කර්ම නොවෙයි. දිසාවන්ද මට ප්‍රකටව නොපැණෙති. දහම්ද මට නොවැටහෙත්. ථීනමිද්ධයද මා සිත මැඩගෙන සිටී. නො ඇලුනේම බ්‍රහ්මචරියාවෙහි හැසිරෙමි, ධර්මයෙහි මට සැකද වේ" යයි බොහෝ භික්ෂූන්ට මෙසේ කීයෙහි සැබෑද?" 'එසේය ස්වාමීනි" (කීය.)

**6.** "තිස්සය, රූපයෙහි පහනොවූ රාගය ඇත්තාවූ, පහනොවූ ඡන්දය ඇත්තාවූ, පහනොවූ ප්‍රේමය ඇත්තාවූ, පහනොවූ පිපාසය ඇත්තාවූ, පහනොවූ හාත්පස දැවිලි ඇත්තාවූ, පහනොවූ තෘෂ්ණාව ඇත්තාහට ඒ රූපයාගේ පෙරළීමවූ අනික් ප්‍රකාර ස්වභාවයකින් ශොකය වැලපීමය, දුකය, දොම්නසය, දැඩි ආයාසය යන මොහු උපදිද්ද?"- "එසේය, ස්වාමීනි"යි

"සාධු සාධු තිස්සය, තිස්සය, මේ කරුණ මෙසේම වේ.

**7.** "රූපයෙහි පහනොවූ රාගය ඇත්තාහට යම්සේද, එමෙන් වේදනාවෙහි පහනොවූ රාගය ඇති, පහනොවූ ඡන්දය ඇති, පහනොවූ පෙම් ඇති, පහනොවූ පිපාසය ඇති, පහනොවූ හාත්පස දැවිලි ඇති, පහනොවූ තෘෂ්ණාව ඇත්තාහට ඒ වෙදනාවගේ පෙරළීමවූ අන්‍යාකාර ස්වභාවයකින් ශොකය, වැලපීමය, දුකය, දොම්නසය, දැඩි ආයාසය යන මොහු උපදිද්ද?"-"එසේය, ස්වාමීනි" කීයේය. "තිස්සය, මැනවි! මැනවි!! තිස්සය, මෙය මෙසේම වන්නේය.

**8.** "වෙදනාවෙහි පහනොවූ රාගය ඇත්තාහට යම්සේද, එසේ සංඥාවෙහි පහනොවූ රාගය ඇති, පහනොවූ කැමැත්ත ඇති, පහනොවූ පෙම් ඇති, පහනොවූ පිපාසය ඇති, පහනොවූ

හාත්පස දැවිල්ල ඇති, පහනොවූ තෘෂ්ණාව ඇත්තාහට, ඒ සංඥාවගේ පෙරළීමවූ අන්‍යාකාර ස්වාභාවයෙන් ශොකය, වැලපීමය, දුකය, දොම්නසය, දැඩි ආයාසය යන මොහු උපදිද්ද?" - "එසේය ස්වාමීනි'යි (කීය.) "තිස්සය, සාදු! සාදු!! තිස්සය, මේ කාරණය මෙසේම වන්නේය.

**9.** "සංඥාවෙහි පහනොවූ රාගය ඇත්තාහට යම්සේද, එසේ සංස්කාරයන්හි පහනොවූ රාගය ඇති, පහනොවූ ඡන්දය ඇති, පහනොවූ ප්‍රෙමය ඇති, පහනොවූ පිපාසය ඇති, පහනොවූ හාත්පස දැවිල්ල ඇති, පහනොවූ තෘෂ්ණාව ඇත්තාහට ඒ සංස්කාරයන්ගේ පෙරළීමවූ අන් අයුරකින් වීමෙන් ශොකය, වැලපීමය, දුකය, දොම්නසය, දැඩි ආයාසය යන මොහු උපදිද්ද?"-"එසේය ස්වාමීනි'යි (කීය.) "තිස්සය, සාදු! සාදු!! තිස්සය, මේ කාරණය මෙසේම වන්නේය.

**10.** "සංස්කාරයන්හි පහව නොගිය රාගය ඇත්තාහට යම්සේද, එසේ විඥානයෙහි පහව නොගිය ඇලුම් ඇති, පහව නොගිය කැමැත්ත ඇති, පහව නොගිය පෙම් ඇති, පහව නොගිය පිපාසය ඇති, පහව නොගිය හාත්පස දැවිල්ල ඇති, පහව නොගිය තෘෂ්ණාව ඇත්තාහට ඒ විඤ්ඤාණයාගේ පෙරළීමවූ අන් අයුරකින් වීමෙන් ශොකය, වැලපීමය, දුකය, නොසතුටය, දැඩි ආයාසය යන මොහු උපදිද්ද?"-"එසේය, ස්වාමීනි"යි (කීය.) 'තිස්සය, සාධු! සාධු!! තිස්සය, මේ කාරණය මෙසේම වන්නේය. විඤ්ඤාණයෙහි පහව නොගිය රාගය ඇත්තාහට යම්සේද, එමෙනියි.

**11.** "ඒ කුමැයි සිතන්නෙහිද? තිස්සය, රූපයෙහි පහව ගිය ඇලුම් ඇති, පහව ගිය කැමැත්ත ඇති, පහව ගිය පෙම් ඇති, පහව ගිය පිපාසය ඇති, පහව ගිය හාත්පස දැවීම ඇති, පහව ගිය තෘෂ්ණාව ඇත්තාහට ඒ රූපයාගේ පෙරළීමවූ අන් අයුරකින් වීමෙන් ශොකය, වැලපීමය, දුකය, දොම්නසය, දැඩි ආයාසය යන මොහු උපදිද්ද?"-"ස්වාමීනි, මෙය නොවේමය" සාධු! සාධු!! තිස්සය, මේ කාරණය එසේම වෙයි. රූපයෙහි පහවූරාගය ඇත්තාහට යම්සේද, එමෙනි.

12. "වෙදනාවෙහි පහවූ රාගය ඇති, පහවූ ඡන්දය ඇති, පහවූ ප්‍රෙමය ඇති, පහවූ පිපාසය ඇති පහවූ හාත්පස දැවිල්ල ඇති, පහවූ තෘෂ්ණාව ඇත්තාහට ඒ වෙදනාවගේ පෙරළීමවූ අන් අයුරකින් වීමෙන් ශොකය, වැලපීමය, දුකය, දොම්නසය, දැඩි ආයාසය යන මොහු උපදිද්ද?"-"ස්වාමීනි, මේ කාරණය නොවේමය." "තිස්සය, සාදු! සාදු! තිස්සය, වේදනාවෙහි පහවූ රාගය ඇත්තාහට යම්සේද, මේ කාරණය එසේම වන්නේය.

13. "සංඥාවෙහි පහවූ රාගය ඇති, පහවූ ඡන්දය ඇති, පහවූ පෙම් ඇති, පහවූ පිපාසය ඇති, පහවූ හාත්පස දැවිල්ල ඇති. පහවූ තෘෂ්ණාව ඇත්තාහට ඒ සංඥාවගේ පෙරළීමවූ අන් අයුරකින් වීමෙන් ශෝකය, වැලපීමය, දුකය, දොම්නසය, දැඩි ආයාසය යන මොහු උපදිද්ද?" - "ස්වාමීනි, මෙය නොවේමය"යි කීය. "සාධු! සාධු!! තිස්සය, සංඥාවෙහි පහවූ රාගය ඇත්තාහට යම්සේද, මේ කාරණය එසේ වේමය.

14. "සංස්කාරයන්හි පහවූ රාගය ඇති, පහවූ ඡන්දය ඇති, පහවූ ප්‍රෙමය ඇති, පහවූ පිපාසය ඇති, පහවූ දැවිල්ල ඇති, පහවූ තෘෂ්ණාව ඇත්තාහට ඒ සංස්කාරයන්ගේ පෙරළීමවූ අන් අයුරකින් වීමෙන් ශෝකය, වැලපීමය, දුකය, දොම්නසය, දැඩි ආයසය යන මොහු උපදිද්ද?" - "ස්වාමීනි මෙය නොවේමය"යි (කීය.) "සාධු! සාධු!! තිස්සය, සංස්කාරයන්හි පහවූ රාගය ඇත්තාහට යම්සේද, එහෙයින් තිස්සය මෙය එසේ වේමය.

15. "විඤ්ඤාණයෙහි පහවූ රාගය ඇති, පහවූ ඡන්දය ඇති, පහවූ ප්‍රේමය ඇති, පහවූ පිපාසය ඇති, පහවූ දැවිල්ල ඇති, පහවූ තෘෂ්ණාව ඇත්තාහට ශෝකය, වැලපීමය, දුකය, දොම්නසය, දැඩි ආයාසය යන මොහු උපදිද්ද?" - "ස්වාමීනි, මෙය නොවේමය"යි (කීය.) "සාදු! සාදු!! තිස්සය, විඥානයෙහි පහවූ රාගය ඇත්තාහට යම්සේද, එහෙයින් තිස්සය, මෙය එසේ වේමය.

16. "තිස්සය, ඒ කුමැයි හඟින්නෙහිද? රූපය නිත්‍ය හෝ අනිත්‍යය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යයයි" (කීය.) "යමක්

වනාහි අනිත්‍යය වේද, එය දුක් හෝ සැප හෝ වේද?" "ස්වාමීනි, දුක්ය"යි (කීය.) "යමක් වනාහි අනිත්‍යද, දුක්වේද, පෙරලෙන ස්වභාව ඇත්තේද, 'මේ රූපය මාගේය, මේ (මම) වෙමි. මේ මාගේ ආත්ම'යයි. මෙය මනාව දක්නට සුදුසුද?" - "ස්වාමීනි, මෙය නුසුදුසුමය."

**17.** "වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?" "ස්වාමීනි, අනිත්‍යයයි" (කීය) "යමක් අනිත්‍යවේද එය දුක් හෝ සැප හෝ වේද?" "ස්වාමීනි, දුකැයි (කීය.) "යමක් අනිත්‍යද දුක්ද පෙරළෙන ස්වභාව ඇත්තේද, මේ වේදනාව මාගේය, මේ (මම) වෙමි, මේ මාගේ ආත්මයයි එය මනාව දක්නට සුදුසුද?" - "ස්වාමීනි, මෙය සුදුසු නොවේමය."

**18.** "සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද" "ස්වාමීනි අනිත්‍ය වේය." "යමක් අනිත්‍යවේද, එය දුක් හෝ සැප හෝ වේද?" "ස්වාමීනි, දුකැයි" (කීය.) "යමක් වනාහි අනිත්‍යවේද, දුක්වේද, පෙරළෙන ස්වභාව ඇත්තේවේද, 'මේ සංඥාව මාගේය, මේ (මම) වෙමි, මේ මාගේ ආත්ම'යයි එය මනාව දක්නට සුදුසු වේද?" ස්වාමීනි, මෙය සුදුසු නොවේමය."

**19.** සංස්කාරස්කන්ධය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?" "ස්වාමීනි, අනිත්‍යය'යි (කීයේය.) "යමක් වනාහි අනිත්‍ය වේද, එය දුක් හෝ සැප හෝ වේද?" -"දුක්ය, ස්වාමීනියි" (කීය.) "යමක් වනාහි අනිත්‍ය වේද?, දුක් වේද, පෙරලෙන ස්වභාව ඇත්තේ වේද, මේ සංස්කාරස්කන්ධය මාගේය මේ (මම) වෙමි. මේ මාගේ ආත්මයයි. 'එය මනාව දක්නට සුදුසුවේද?" - "මෙය සුදුසු නොවේමය, ස්වාමීනියි" (කීය.)

**20.** "විඥානය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය වේද, එය දුක් හෝ සැප හෝ වේද?" - "ස්වාමීනි, දුකය." "යමක් වනාහි අනිත්‍යද දුක්ද' පෙරලෙන ස්වභාව ඇත්තේද, 'මේ විඥානය මාගේය, මේ (මම) වෙමි. මේ මාගේ ආත්ම'යයි, ඒ විඥානය මනාව දක්නට සුදුසු වේද?" - "ස්වාමීනි, මෙය සුදුසු නොවේමය."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**21.** "එහෙයින් තිස්සය, තමා පිළිබඳවූ හෝ අනුන් පිළිබඳවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද යම්කිසි රූපයක් වේද දුර හෝ ළඟ හෝ යම් රූපයෙක් වේද, 'මේ රූපය මාගේ නොවේ. මේ (මම) නොවෙමි. මේ මාගේ ආත්මය නොවේ'යයි ඒ මේ හැම රූපය මෙසේ තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය.

**22.** "අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, යම්කිසි වේදනාවක් වේද, දුරෙහි හෝ සමීපයෙහි හෝ යම් වේදනාවක් වේද, 'මේ වේදනාස්කන්ධය මාගේ නොවේ. මේ (මම) නොවෙමි. මේ මාගේ ආත්මය නොවේ'යයි ඒ මේ සියලු වේදනාව මෙසේ තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය.

**23.** "අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, යම්කිසි සංඥාවක් වේද, දුරෙහි හෝ සමීපයෙහි හෝ යම් සංඥාවක් වේද, 'මේ සංඥාව මාගේ නොවේ. මේ (මම) නොවෙමි. මේ මාගේ ආත්මය නොවේ' යයි ඒ මේ සියලු සංඥාස්කන්ධය මෙසේ තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය."

**24.** "අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, යම්කිසි සංස්කාරස්කන්ධයක් වේද, දුරෙහි හෝ සමීපයෙහි හෝ යම් සංස්කාරස්කන්ධයක්වේද, 'මේ සංස්කාරස්කන්ධය මාගේ නොවේ. මේ (මම) නොවෙමි. මේ මාගේ ආත්මය නොවේ'යයි ඒ මේ මුලු සංස්කාරස්කන්ධය මෙසේ තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය.

**25.** "තමා පිළිබඳවූ හෝ අනුන් පිළිබඳවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, යම්කිසි විඤ්ඤාණයක්වේද, දුර හෝ සමීපයෙහි

හෝ යම් විඤ්ඤාණයක් වේද, 'මේ විඤ්ඤාණය මාගේ නොවේ. මේ (මම) නොවෙමි. මේ මාගේ ආත්මය නොවේ'යයි ඒ මේ සැම විඤ්ඤාණය මෙසේ තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය.

**26.** "තිස්සය, මෙසේ දක්නාවූ ඇසූ පිරූ තැන් ඇති ආර්යශ්‍රාවක තෙම රූපයෙහිද කලකිරෙයි, වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි, සංස්කාරයන්හිද කලකිරෙයි. විඥානයෙහිද කලකිරෙයි. කලකිරුනේ නොඇලෙයි. නොඇලීමෙන් (කෙලෙසුන්ගෙන්) මිදෙයි. මිදුණු කල්හි මිදුණේ වෙමි"යි (ප්‍රත්‍යවෙක්ෂා) ඥානය වෙයි. ජාති තොමෝ ක්ෂය වූවාය. බ්‍රහ්මචරියාවෙහි වැස නිමවන ලද්දේය. (සතර ආර්යමාර්ගයෙන් කටයුතු) කෘත්‍යය (කොට) නිමවන ලද්දේය. (මේ අර්හත්ඵලය පිණිස) අනික් කටයුත්තෙක් නැතැයි දනී.

**27.** "තිස්සය, යම් සේ වනාහි පුරුෂයෝ දෙදෙනෙක් වන්නාහුය. (ඉන්) එකෙක් මාර්ගයෙහි අදක්ෂයෙක. එකෙක් මාර්ගයෙහි දක්ෂයෙක. ඒ මාර්ගයෙහි අදක්ෂ පුරුෂ තෙම ඒ මේ මාර්ගයෙහි දක්ෂවූ පුරුෂයාගෙන් මග විචාරන්නේය. හෙතෙම මෙසේ කියන්නේයඃ- එම්බා පුරුෂය, මේ මඟය. ඒ මාර්ගයෙන් මොහොතක් යව, ඒ මඟින් මොහොතක් ගොසින් දෙමං සන්ධියක් දක්නෙහිය, එහි වම් පාර මුදා දකුණු පාර ගණු, ඒ මගින් මොහොතක් යව, එයින් මොහොතක් ගොස් තියුණු වන ලැහැබක් දක්නෙහිය. ඒ වන ලැහැබින් මොහොතක් යව. එතැනින් මොහොතක් ගොස් මහත් ගැඹුරු කුඩා විලක් දක්නෙහිය. ඒ ස්ථානයෙන් මොහොතක් යව, එතැනින් මොහොතක් ගොස් හෙබක් ද, ප්‍රපාතයක්ද, දක්නෙහිය. එතැනින් මොහොතක් යව. එයින් මොහොතක් ගොස් සිත් ප්‍රියකරන සම බිම් පෙදෙසක් දක්නෙහිය.

**28.** "තිස්සය, මා විසින් අර්ථය හඟවනු පිණිස මේ උපමා තොමෝ කරන ලදු. එහි මේ අර්ථයයිඃ- තිස්සය, මාර්ගයෙහි අදක්ෂ පුරුෂයා යයි පෘථග්ජනයාහට මේ නමෙකි. තිස්සය, මාර්ගයෙහි දක්ෂ පුරුෂයායි අර්හත්වූ සම්මා සම්බුදුන් වහන්සේට

මේ නමෙකි. තිස්සය, දෙමං සන්ධියයි විචිකිච්ඡා නීවරණයට මේ නමෙකි. තිස්සය, වම් පාර යයි අංගඅටකින් යුත් මිථ්‍යා මාර්ගයට මේ නමෙකි. ඒ කවර අටකටද? මිථ්‍යා දෘෂ්ටියටද, මිථ්‍යා සංකල්පයටද, මිථ්‍යා වචනයටද, මිථ්‍යා කර්මාන්තයටද, මිථ්‍යා ආජීවයටද, මිථ්‍යා ව්‍යායාමයටද, මිථ්‍යා ස්මෘතියටද, මිථ්‍යා සමාධියටද (යන අටටය.)

**29.** "තිස්සය, දකුණු පාරයයි, ආර්ය අෂ්ඨාංගික මාර්ගයට මේ නමෙකි. ඒ කවර අටකටද යත්? සම්‍යක් දෘෂ්ටියටද සම්‍යක් සංකල්පනයටද, සම්‍යක් වචනයටද, සම්‍යක් කර්මාන්තයටද, සම්‍යක් ආජීවයටද, සම්‍යක් ව්‍යායාමයටද, සම්‍යක් ස්මෘතියටද, සම්‍යක් සමාධියටද (යන අටටය.) තිස්සය, ගන වන ලැහැබයයි අවිද්‍යාවට මේ නමෙකි. තිස්සය, මහ ගැඹුරු විලයයි කාමයට මේ නමෙකි. 'තිස්සය, පතස ප්‍රපාතය යනු දුර්වල ක්‍රොධයට හා බලවත් ක්‍රොධයට නමෙකි. තිස්සය, සිත් ප්‍රියකරන සම බිම් පෙදෙස යනු නිවණට නමෙකි.

**30.** "තිස්සය, ශාසනයෙහි සිත අලව, තිස්සය, ශාසනයෙහි සිත අලව, අවවාදයෙන් උපකාර කෙරෙමි, මම ධර්මයෙන් උපකාර කෙරෙමි, මම ධර්මයෙන් අනුශාසනය කෙරෙමි."

භාග්‍යවතුන් වහන්සේ මේ දේශනාව කළසේක. සතුටු සිතැති ආයුෂ්මත් තිස්ස ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්තේය.

**(දෙවෙනි තිස්ස සූත්‍රය නිමි.)**

---

## 3. යමක සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ ජේතවන නම්වූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ආරාමයෙහි වැඩවෙසෙති. එකල්හි වනාහි යමක නම් මහණහට මෙබඳු ලාමක දෘෂ්ටියක් උපන්නේවෙයි.

"යම්සේ ක්ෂය කරනලද ක්ලේෂයන් ඇති (රහත්) මහණ තෙම ශරීරය බිඳීමෙන් සිඳෙන්නේද, වැනසෙන්නේද, මරණින් මත්තෙහි නොවන්නේද, එසේ භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසනලද ධර්මය දනිමි. (කියායි.)

2. "යම්සේ ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම ශරීරය බිඳීමෙන් සිඳෙන්නේය, විනාශවන්නේය, මරණින් මතු නොවන්නේ" යයි බුදුන් විසින් දෙසනලද ධර්මය එසේ දනිමි'යි යන මෙබඳු ලාමක දෘෂ්ටියක් යමක නම් භික්ෂුවට උපන්නේය"යි බොහෝ භික්ෂූහු ඇසුවාහුමය.

ඉක්බිති ඒ භික්ෂූහු ආයුෂ්මත් යමක භික්ෂුතෙම යම් තැනෙක්හිද එතැනට ගියාහුය. ගොස් ආයුෂ්මත් යමක භික්ෂුව සමග සතුටුවූහ. සතුටුවියයුතු සිහිකටයුතු කථාව කොට නිමවා එක්පැත්තක හුන්හ. එක්පැත්තක හුන්නාවූ ඒ භික්ෂූහු ආයුෂ්මත් යමක භික්ෂුවට මේ කරුණ කීහ:

3. "ඇවැත් යමකයෙනි, යම් ප්‍රකාරයකින් රහත් මහණ තෙම සිරුර බිඳීමෙන් සිඳෙන්නේද, වැනසෙන්නේද, මරණින් මතු නොවන්නේද, ඒ ප්‍රකාරයෙන් බුදුන් විසින් දෙසනලද ධර්මය (මම) දනිමි"යි තොපට මෙබඳු ලාමක දෘෂ්ටියක් උපන්නේ සැබෑදැ"යි (ඇසූහ.)

"ඇවැත්නි, යම් ප්‍රකාරයකින් රහත් මහණතෙම ශරීර භෙදයෙන් සිඳෙන්නේද, වැනසෙන්නේද, මරණින් මතු නොවන්නේද, එසේ බුදුන් විසින් දෙසූ ධර්මය (මම) දනිමියි" කීය.

4. "ඇවැත් යමකයෙනි, එසේ නොකියව, භාග්‍යවතුන් වහන්සේට බොරුවෙන් චෝදනා නොකරව, භාග්‍යවතුන් වහන්සේට බොරුවෙන් චෝදනා කිරීම නොමැනවි. භාග්‍යවතුන් වහන්සේ "රහත් මහණතෙම ශරීරය බිඳීමෙන් සිඳෙන්නේය, වැනසෙන්නේය, මරණින් මත්තෙහි නො වන්නේය"යි මෙසේ නොවදාරණසේකැයි කීහ.

මෙසේද ඒ භික්ෂූන් විසින් කියනු ලබන්නාවූ ආයුෂ්මත් යමක භික්ෂුතෙම "ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම කය බිඳීමෙන් සිඳෙන්නේද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වැනසෙන්නේද, මරණින් මත්තෙහි නොවන්නේද, ඒ ප්‍රකාරයෙන් බුදුන් විසින් දෙසනලද ධර්මය (මම) දනිමි" යි යන ලාමක දෘෂ්ටිය එසේම ස්ථිරවශයෙන්, දෘෂ්ටි වශයෙන් ගෙන පිහිටා ව්‍යවහාර කෙරෙයි. යම්හෙයකින් ඒ භික්ෂූහු ආයුෂ්මත් යමක භික්ෂුව ඒ ලාමක දෘෂ්ටියෙන් වළක්වන්නට නොහැකිවූවාහුද (එහෙයින්) ඊට අනතුරුව ඒ භික්ෂූහු හුනස්නෙන් නැගී ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරතෙම යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය, පැමිණ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයනට මේ කරුණ දැක්වූහ:-

**5.** "ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, රහත් මහණතෙම සිරුර බිඳීමෙන් සිඳෙන්නේද, වැනසෙන්නේද, මරණින් මතු නොවන්නේද, ඒ ප්‍රකාරයෙන් බුදුන් විසින් දෙසූ ධර්මය (මම) දනිමි"යි යමක නම් මහණහට මෙබඳු ලාමක දෘෂ්ටියක් උපන්නේය. ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරතෙම "යමක භික්ෂුතෙම යම් තැනෙකද, එතැනට අනුකම්පා උපදවා වඩින්නේ නම් මැනව"යි කීවාහුය.

ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ නිශ්ශබ්ද භාවයෙන් (එය) ඉවසූහ. ඉක්බිති ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිර තෙම සවස් වේලෙහි පලසමවතින් නැගීසිටියේ ආයුෂ්මත් යමක භික්ෂුව යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් යමක භික්ෂුව සමග සතුටු විය. සතුටුවිය යුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා පසකින් හිඳගත්හ. පසක හිඳගත්තාවූ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරතෙම ආයුෂ්මත් යමක (භික්ෂුවට) මෙකරුණ දැන්වීය:-

**6.** "ඇවැත් යමකයෙනි, 'ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම කය බිඳීමෙන් සිඳෙන්නේය, වැනසෙන්නේය, මරණින් මත්තෙහි නොවේයයි බුදුන් විසින් එසේ වදාළ ධර්මය (මම) දනිමි"යි යුෂ්මතුන්ට මෙබඳු ලාමක දෘෂ්ටියක් උපන්නේල, එය සැබෑදැයි" ඇසූහ.

**7.** "ඇවැත්නි, මම ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම කය බිඳීමෙන් සිඳෙන්නේය, වැනසෙන්නේය, මරණින් මතු නොවේයි බුදුන් විසින් මෙසේ දෙසනලද ධර්මය (මම) දනිමි"යි කීය.

"ඇවැත් යමකයෙනි, ඒ කුමැයි සිතන්නෙහිද? 'රූපය නිත්‍ය හෝ වේද, අනිත්‍ය හෝ වේද?" - "ඇවැත්නි, අනිත්‍යය"

"යමක් අනිත්‍යවේද, එය දුකද සැපද?"-"ඇවැත්නි, දුකැයි" (කී.)

"යමක් අනිත්‍ය වේද, දුක්වේද, පෙරලෙන ස්වභාව ඇත්තේ වේද, 'රූපය මාගේය, ඒ මම වෙමි. ඒ මාගේ ආත්මය'යි ඒ රූපය දෘෂ්ටි වශයෙන් දැකීමට සුදුසුද?" - "ඇවැත්නි, එය සුදුසු නොවේමය."

"වේදනාව නිත්‍යද, අනිත්‍යද?" - "ඇවැත්නි, අනිත්‍යයි."

"යමක් අනිත්‍යද ඒ දුකද සැපද?" - "ඇවැත්නි, දුකය."

"යමක් අනිත්‍යද, දුකද, පෙරලෙන ස්වභාව ඇත්තේද, 'එය මාගේය, එය මම වෙමි, එය මාගේ ආත්මය'යි දක්නට සුදුසුද?" - "ඇවැත්නි, එය සුදුසු නොවේ."

"සංඥාව නිත්‍යද, අනිත්‍යද?" - "ඇවැත්නි, අනිත්‍යයි"

"යමක් අනිත්‍ය නම් ඒ දුකද, සැපද?" - "ඇවැත්නි, දුකය."

"යමක් අනිත්‍ය නම් එය දුකද, පෙරලෙන ස්වභාව ඇත්තේද, 'එය මාගේය, එය මම වෙමි, එය මාගේ ආත්මය'යි දක්නට සුදුසු වේද?" - "ඇවැත්නි, එය සුදුසු නොවේ."

"සංස්කාරස්කන්ධය නිත්‍යද, අනිත්‍යද?" - "ඇවැත්නි, අනිත්‍යයි."

"යමක් අනිත්‍ය නම් ඒ දුකද, සැපද?" - "ඇවැත්නි, දුකය."

"යමක් අනිත්‍යද, දුකද, පෙරලෙන ස්වභාව ඇත්තේද, එය 'මාගේය, එය මම වෙමි, එය මාගේ ආත්මය'යි දක්නට සුදුසු වේද?" - "ඇවැත්නි, එය සුදුසු නොවේ."

"විඥාණය නිත්‍යද, අනිත්‍යද?" - "ඇවැත්නි, අනිත්‍යයි."

"යමක් අනිත්‍ය නම් ඒ දුකද, සැපද?" - "ඇවැත්නි දුකය."

"යමක් අනිත්‍යද, දුකද, පෙරලෙන ස්වභාව ඇත්තේද, එය මාගේය, එය මම වෙමි, එය මාගේ ආත්මය"යි දක්නට සුදුසුද?" - "ඇවැත්නි, එය සුදුසු නොවේ."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

8. "ඇවැත් යමකයෙනි, එහෙයින් අතීතවූ හෝ අනාගතවූ හෝ වර්තමානවූ හෝ අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි රූපයක් වේද, ඒ සියලු රූපය මාගේ නොවේ. මම නොවෙමි, මාගේ ආත්මය නොවේ' යයි මෙසේ තත්වූ පරිද්දෙන් යහපත් ප්‍රඥාවෙන් දතයුතුය.'

අතීතවූ හෝ අනාගතවූ හෝ වර්තමානවූ හෝ අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි වේදනාවක් වේද, ඒ සියලු වේදනාව මාගේ නොවේ, මම නොවෙමි, මාගේ ආත්මය නොවේ" යයි ඇතිසැටියෙන් යහපත් ප්‍රඥාවෙන් දතයුතුය.

"අතීතවූ හෝ අනාගතවූ හෝ වර්තමානවූ හෝ අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි සංස්කාරයෝ වෙත්ද? "ඒ සියලු සංස්කාරයෝ මාගේ නොවේ, මම නොවෙමි, මාගේ ආත්මය නොවේ"යයි තත්වූ පරිද්දෙන් යහපත් ප්‍රඥාවෙන් දතයුතුය.

"අතීතවූ හෝ අනාගතවූ හෝ වර්තමානවූ හෝ අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි විඥානයෙක් වේද, "ඒ සියලු විඥානය මාගේ නොවේ, මම නොවෙමි, මාගේ ආත්මය නොවේ"යයි තත්වූ පරිද්දෙන් යහපත් ප්‍රඥාවෙන් දතයුතුය.

9. ඇවැත් යමකයෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකතෙම රූපයෙහිද කලකිරේ, වේදනාවෙහිද කලකිරේ, සංඥාවෙහිද කලකිරේ, සංස්කාරයන්හිද කලකිරේ, විඥානයෙහිද කලකිරේ. කලකිරුනේ නොඇලේ, නොඇලීමෙන් (කෙලෙසුන් කෙරෙන්) මිදේ, මිදුණු කල්හි 'මිදුණේ' යයි (ප්‍රත්‍යවෙක්ෂා) ඥානය ඇතිවේ. ඉපදීම ක්ෂයවිය. මාර්ග බ්‍රහ්මචර්යාවෙහි වැස නිමවන ලද්දේය, කටයුතු කරන ලද්දේය, මේ රහත් ඵලය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගනී.

**10.** "ඇවැත් යමකයෙනි, ඒ කුමැයි හඟින්නෙහිද? රූපය "සත්වයා" යයි දක්නෙහිද' - "ඇවැත්නි, එය නොවේමය."

"වේදනාව සත්ත්වයායයි දක්නෙහිද?" - "ඇවැත්නි, එය නොවේමය."

"අතීතවූ හෝ අනාගතවූ හෝ වර්තමානවූ හෝ අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ ලාමකවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි සංඥාවක් වේද, "ඒ සියලු සංඥාව මාගේ නොවේ, මම නොවෙමි, ඒ මාගේ ආත්මය නොවේ" යයි තත්වූ පරිද්දෙන් යහපත් ප්‍රඥාවෙන් දතයුතුය.

"සංඥාව සත්ත්වයායයි දක්නෙහිද?" - "ඇවැත්නි, එය නොවේමය."

"සංස්කාර ස්කන්ධය සත්ත්වයායයි දක්නෙහිද?" - "ඇවැත්නි, එය නොවේමය."

"විඤ්ඤාණය සත්ත්වයායයි දක්නෙහිද?" - "ඇවැත්නි, එය නොවේමය."

**11.** "ඇවැත් යමකයෙනි, ඒ කුමැයි සිතන්නෙහිද?" රූපය කෙරෙහි සත්ත්වතෙම වේයයි දක්නෙහිද?" - "ඇවැත්නි, එය නොවේමය. "රූපයෙන් තොරව සත්ත්වතෙම වේයයි දක්නෙහිද?" - "ඇවැත්නි, එය නොවේමය."

"වේදනාවෙහි සත්ත්වතෙම වේයයි දක්නෙහිද?" - "ඇවැත්නි, එය නොවේමය." "වේදනාව හැර සත්ත්වතෙම වේයයි දක්නෙහිද?" - "ඇවැත්නි, එය නොවේමය."

"සංඥාවෙහි සත්ත්වතෙම වේයයි දක්නෙහිද?" - "ඇවැත්නි, එය නොවේමය." "සංඥාවෙන් තොරව සත්ත්වතෙම වේයයි දක්නෙහිද?" - "ඇවැත්නි, එය නොවේමය."

"සංස්කාරයන්හි සත්ත්වතෙම වේයයි දක්නෙහිද?" - "ඇවැත්නි, එය නොවේමය." "සංස්කාරයන්ගෙන් තොරව සත්ත්වතෙමවේයයි දක්නෙහිද?" - ඇවැත්නි, එය නොවේමය."

"විඥ්ඥාණයෙහි සත්ත්වතෙම වේයයි දක්නෙහිද?" - "ඇවැත්නි, එය නොවේමය." "විඥ්ඥාණය හැර සත්ත්වතෙම වේයයි දක්නෙහිද?" - "ඇවැත්නි, එය නොවේමය."

"ඇවැත් යමකයෙනි, රූපය, වේදනාවය, සංඥාවය, සංස්කාරය, විඥ්ඥාණය යන පස සත්ත්වයායයි දක්නෙහිද?" - "ඇවැත්නි. එය නොවේමය."

"ඇවැත් යමකයෙනි, ඒ කුමැයි හඟින්නෙහිද? ඒ මේ රූප නැත්තේ, වේදනාව නැත්තේ, සංඥාව නැත්තේ, සංස්කාර නැත්තේ විඥ්ඥාණය නැත්තේ සත්ත්වයායයි දක්නෙහිද?" - "ඇවැත්නි, එය නොවේමය."

**12.** "ඇවැත් සමකයෙනි, මෙහිදී තොපට මේ ආත්මයෙහිද සත්‍ය වශයෙන්, ස්ථිර වශයෙන්, සත්ත්වයෙකු නොලැබෙන කල්හි 'ක්ෂීණාශ්‍රවතෙම ශරීරයාගේ භෙදයෙන් සිඳෙන්නේය, වැනසෙන්නේය, මරණින් මතු නොවන්නේයයි ඒ ප්‍රකාරයෙන් බුදුන් විසින් දෙසූ ධර්මය දනිමි' යන තොපගේ ප්‍රකාශය සුදුසුද?

"ඇවැත් ශාරිපුත්‍ර ස්ථවිරයෙනි, පෙර නුවණ නැත්තාවූ මට ඒ ලාමක දෘෂ්ටිය වූයේය. ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්ගේ මේ ධර්මදේශනයම අසා ඒ ලාමක දෘෂ්ටියද, ප්‍රහීන විය. මා විසින් ධර්මයද අවබොධ කරන ලද්දේයයි" (කීය.)

**13.** "ඇවැත් යමකයෙනි, ඉදින් තොපගෙන්, ඇවැත් යමකයෙනි, ක්ෂීණාශ්‍රව භික්ෂුතෙමේ කය බිඳීමෙන් මරණින් පසු කුමක් වේදැයි අසන්නහු නම්' ඇවැත් යමකයෙනි, මෙසේ අසන ලද්දාවූ තෝ කුමකැයි කියන්නෙහිද?"

"ඇවැත්නි, මෙසේ අසන ලද්දාවූ මම මෙසේ කියන්නෙමි.

"ඇවැත්නි, රූපය අනිත්‍යයි. යමක් අනිත්‍ය නම් එය දුකය. යමක් දුකද එය නිරුද්ධවිය. එය නැතිවූයේය.

"වේදනාව අනිත්‍යය, යමක් අනිත්‍ය නම් ඒ දුකය. යමක් දුකද එය නිරුද්ධවිය. එය නැතිවූයේය.

"සංඥාව අනිත්‍යයි. යමක් අනිත්‍ය නම් ඒ දුකය. යමක් දුකද එය නිරුද්ධවිය. එය නැතිවූයේය.

"සංස්කාරයෝ අනිත්‍යහ. යමක් අනිත්‍ය නම් ඒ දුකය. යමක් දුකද එය නිරුද්ධවිය. එය නැතිවූයේය.

"විඤ්ඤාණය අනිත්‍යය, යමක් අනිත්‍ය නම් ඒ දුකය. යමක් දුකද එය නිරුද්ධවිය. එය නැතිවිය. ඇවැත්නි, එසේ අසන ලද්දාවූ මම මෙසේ කියන්නෙමියි" කීය.

**14.** "ඇවත, යමකයෙනි යහපති, යහපති, එසේවී නම් ඇවැත් යමකයෙනි, මේ කාරණයම වැඩියක් අවබොධ කර ගැනීම සඳහා තොපට උපමාවක් දක්වන්නෙමි.

"ඇවැත් යමකයෙනි, ආඪ්‍යවූ, මහත් ධන ඇත්තාවූ, රැකවල් සහිතවූ යම් ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ ඇත්තේය.

"ඔහුට අනර්ථ කැමැතිවූ, අවැඩ කැමැතිවූ, නිර්භය නොකැමැතිවූ, ජීවිතයෙන් තොර කරනු කැමැතිවූ, කිසියම් පුරුෂයෙක් ඇතිවන්නේය. ඔහුට මෙබඳු අදහසෙක් වන්නේයඃ- 'මේ ගෘහපති තෙමේ හෝ ගෘහපති පුත්‍රතෙමේ හෝ ධනයෙන් සමෘද්ධය, මහත් ධන ඇත්තේය, මහත් සම්පත් ඇත්තේය. හෙතෙමේද (ඇතුළත පිටත) මුරකරුවන්ගෙන් යුක්තය. මැඩ දිවි තොර කරන්නට පහසු නොවේමය. (ඇතුළට) වැද, දිවි තොර කරන්නෙම් නම් ඉතා යෙහෙක.' (යනුයි.)

"හෙතෙම ඒ ගෘහපතියා කරා හෝ ගෘහපති පුත්‍රයා කරා හෝ පැමිණ, 'වහන්ස, ඔබට උපස්ථාන කරන්නෙමැයි' කියන්නේය. ඒ ගෘහපති තෙමේ හෝ ගෘහපති පුත්‍රතෙමේ හෝ ඔහු ලවා උපස්ථාන කරවා ගන්නේය. ඒ උපස්ථායක තෙම පළමුව නැගිටිමින්, පසුව නිදමින්, කුමක් කරම්ද, කුමක් කරම්දැයි අසමින්, මනාව හැසිරෙමින්, ප්‍රිය වචන කථා කරමින්, උපස්ථාන කරන්නේය. උවටැන් කරන්නේය.

"ඒ ගෘහපති තෙමේ හෝ ගෘහපති පුත්‍රතෙමේ හෝ ඔහු මිත්‍රයකු වශයෙන්ද අදහන්නේය. යාලුවකු වශයෙන්ද අදහන්නේය. ඔහු කෙරෙහි විශ්වාසයට පැමිණෙන්නේය."

"ඇවත, යම් කලෙක්හි 'මේ ගෘහපති තෙමේ හෝ ගෘහපති පුත්‍ර තෙමේ හෝ මට මනාකොට විශ්වාසවූයේයයි ඔහුට සිතෙක්

වන්නේද, එවිට ඔහු රහසිගත තැනක් දැන තියුණු ආයුධයකින් ජීවිතය තොර කරන්නේය.”

“ඇවැත් යමකයෙනි, ඒ කුමැයි හඟින්නෙහිද? යම් කලෙකත් ඒ පුරුෂතෙම අසවල් ගෘහපතියා කරා හෝ ගෘහපති පුත්‍රයා කරා හෝ පැමිණ, ‘වහන්ස, උපස්ථාන කරන්නෙමි’යි කියන්නේද, එකල්හිත් හෙතෙම වධකයාමය, වධකයෙකු වුවද, ‘මාගේ වධකයෙකැ’යි නොදත්තේය.

යම් කලෙකත් හෙතෙම පළමුව නැගිටිමින්, පසුව නිදමින්, කුමක් කෙරෙම්දැයි අසමින්, මනාප සේ හැසිරෙමින්, ප්‍රියවචන කියමින්, උපස්ථාන කෙරේද, එකල්හිත් හෙතෙම වධකයෙක්මය. වධකයෙකු වුවද ‘මාගේ වධකයෙකැ’යි නොදත්තේය. යම් කලෙකත් ඔහු රහස් ස්ථානයක් දැන, තියුණු ආයුධයකින් දිවි තොර කරන්නේද, එකල්හිත් හෙතෙම වධකයෙක්මය. වධකයෙකු වුවද ‘මගේ වධකයෙකැ’යි නොදත්තේය. ඇවැත්නි, එසේය.

15. “ඇවැත්නි, එපරිද්දෙන්ම ආර්යයන් නොදක්නාවූ, ආර්ය ධර්මයෙහි අදක්ෂවූ, ආර්ය ධර්මයෙහි නොහික්මුණාවූ, සත්පුරුෂයන් නොදක්නාවූ, සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂවූ, සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුණාවූ, අශ්‍රැතවත් පෘථග්ජන තෙම රූපය තමායයි දක්නේය. තමා රූප ඇත්තෙකු කොට හෝ දක්නේය. තමා කෙරෙහි හෝ රූපය දක්නේය. රූපය කෙරෙහි හෝ තමා දක්නේය.

“වේදනාව තමා වශයෙන් දක්නේය. තමා වේදනා ඇත්තෙකු කොට හෝ දක්නේය. තමා කෙරෙහි හෝ වේදනාව දක්නේය. වේදනාව කෙරෙහි හෝ තමා දක්නේය.

‘සංඥාව තමා වශයෙන් හෝ දක්නේය. තමා සංඥාව ඇත්තෙකු කොට හෝ දක්නේය. තමා කෙරෙහි හෝ සංඥාව දක්නේය. සංඥාව කෙරෙහි හෝ තමා දක්නේය.

“සංස්කාරයන් තමා වශයෙන් හෝ දක්නේය. තමා සංස්කාරයන් ඇත්තෙකුකොට හෝ දක්නේය. තමා කෙරෙහි

හෝ සංස්කාරයන් දක්නේය. සංස්කාරයන් කෙරෙහි හෝ තමා දක්නේය.

"විඥ්ඥාණය තමායයි හෝ දක්නේය. තමා විඥ්ඥාණය ඇත්තෙකු කොට හෝ දක්නේය. තමා කෙරෙහි හෝ විඥ්ඥාණය දක්නේය. විඥ්ඥාණය කෙරෙහි හෝ තමා දක්නේය.

**16.** "හෙතෙම අනිත්‍යවූ රූපය 'අනිත්‍යවූ රූපය'යයි තත්වූ පරිද්දෙන් නොදනී. අනිත්‍යවූ වේදනාව 'අනිත්‍යවූ වේදනාව'යයි තත්වූ පරිද්දෙන් නොදනී. අනිත්‍යවූ සංඥාව 'අනිත්‍යවූ සංඥාව' යයි තත්වූ පරිද්දෙන් නොදනී. අනිත්‍යවූ සංස්කාරයන් අනිත්‍යවූ සංස්කාරයෝ' යයි තත්වූ පරිද්දෙන් නොදනී. අනිත්‍යවූ විඥ්ඥාණය 'අනිත්‍යවූ විඥ්ඥාණය'යි තත්වූ පරිද්දෙන් නොදනී. දුක්වූ රූපය 'දුක්වූ රූපය'යයි තත්වූ පරිද්දෙන් නොදනී. දුක්වූ වේදනාව 'දුක්වූ වේදනාව' යයි තත්වූ පරිද්දෙන් නොදනී. දුක්වූ සංඥාව 'දුක්වූ සංඥාව' යයි තත්වූ පරිද්දෙන් නොදනී. දුක්වූ සංස්කාරයන් 'දුක්වූ 'සංස්කාරයෝ'යයි තත්වූ පරිද්දෙන් නොදනී. දුක්වූ විඥ්ඥාණය 'දුක්වූ විඥ්ඥාණය'යි තත්වූ පරිද්දෙන් නොදනී.

**17.** "අනාත්මවූ රූපය 'අනාත්මවූ රූපය'යයි තත්වූ පරිද්දෙන් නොදනී. අනාත්මවූ වේදනාව 'අනාත්මවූ වේදනාව'යයි තත්වූ පරිද්දෙන් නොදනී. අනාත්මවූ සංඥාව 'අනාත්මවූ සංඥාව' යයි තත්වූ පරිද්දෙන් නොදනී. අනාත්මවූ සංස්කාරයෝ 'අනාත්මවූ සංස්කාරයෝ'යි තත්වූ පරිද්දෙන් නොදනී. අනාත්මවූ විඥ්ඥාණය 'අනාත්මවූ විඥ්ඥාණය'යයි තත්වූ පරිද්දෙන් නොදනී.

**18.** "ප්‍රත්‍යයන් විසින් කරනලද රූපය 'ප්‍රත්‍යයන් විසින් කරනලද රූපය'යි තත්වූ පරිද්දෙන් නොදනී. ප්‍රත්‍යයන් විසින් කරනලද වේදනාව 'ප්‍රත්‍යයන් විසින් කරන ලද වේදනාව' යයි තත්වූ පරිද්දෙන් නොදනී. ප්‍රත්‍යයන් විසින් කරනලද සංඥාව 'ප්‍රත්‍යයන් විසින් කරනලද සංඥාව'යයි තත්වූ පරිද්දෙන් නොදනී.

ප්‍රත්‍යයන් විසින් කරනලද සංස්කාරයන් ‘ප්‍රත්‍යයන් විසින් කරනලද සංස්කාරයෝ’යයි තත්වූ පරිද්දෙන් නොදනී. ප්‍රත්‍යයන් විසින් කරනලද විඥ්ඥාණය ප්‍රත්‍යයන් විසින් කරනලද විඥ්ඥාණය’යි තත්වූ පරිද්දෙන් නොදනී.

**19.** “වධකවූ රූපය ‘වධකවූ රූපය’යි තත්වූ පරිද්දෙන් නොදනී. වධකවූ වේදනාව ‘වධකවූ වේදනාව’යයි තත්වූ පරිද්දෙන් නොදනී. වධකවූ සංඥාව ‘වධකවූ සංඥාව’යයි තත්වූ පරිද්දෙන් නොදනී. වධකවූ සංස්කාරයන් ‘වධකවූ සංස්කාරයෝ”යයි තත්වූ පරිද්දෙන් නොදනී. වධකවූ විඥ්ඥාණය ‘වධකවූ විඥ්ඥාණය’යි තත්වූ පරිද්දෙන් නොදනී.

**20.** “හෙතෙම රූපයට ‘මාගේ ආත්ම’යයි පැමිණෙයි, අල්වාගනියි, පිහිටයි. වේදනාවට ‘මාගේ ආත්ම’යයි පැමිණෙයි, අල්වාගනියි, පිහිටයි. සංඥාවට ‘මාගේ ආත්ම’යයි පැමිණෙයි, අල්වාගනියි, පිහිටයි. සංස්කාරයන්ට ‘මාගේ ආත්ම’යයි පැමිණේ, අල්වාගනියි, පිහිටයි. විඥ්ඥාණයට ‘මාගේ ආත්ම’යයි පැමිණේ, අල්වාගනී, පිහිටයි. දෘෂ්ටියෙන් බැසගන්නා ලද්දාවූ, අල්වාගන්නා ලද්දාවූ, මේ පඤ්චොපාදානස්කන්ධයෝ ඔහුට දීර්ඝකාලයක් මුලුල්ලෙහි අවැඩ පිණිස, දුක් පිණිස පවතිත්.

**21.** “ආර්යයන් දක්නාවූ, ආර්ය ධර්මයෙහි දක්ෂවූ, ආර්ය ධර්මයෙහි හික්මුණාවූ, සත්පුරුෂයන් දක්නාවූ, සත්පුරුෂ ධර්මයෙහි දක්ෂවූ, සත්පුරුෂ ධර්මයෙහි හික්මුණාවූ, ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවක තෙමේම රූපය තමායයි නොදක්නේය. තමා රූපය ඇත්තෙක් කොට හෝ නොදක්නේය. තමා කෙරෙහි රූපය ඇතැයි හෝ නොදක්නේය. රූපය කෙරෙහි තමා ඇතැයි හෝ (නොදක්නේය.)

“වේදනාව තමා වශයෙන් හෝ නොදක්නේය. තමා වේදනාව ඇත්තෙක්කොට හෝ නොදක්නේය. තමා කෙරෙහි වේදනාව ඇතැයි හෝ නොදක්නේය. වේදනාවෙහි තමා ඇතැයි හෝ නොදක්නේය.

"සංඥාව තමා වශයෙන් හෝ නොදක්නේය. තමා සංඥාව ඇත්තෙකුකොට හෝ නොදක්නේය. තමා කෙරෙහි සංඥාව ඇතැයි හෝ නොදක්නේය. සංඥාවෙහිලා තමා ඇතැයි හෝ නොදක්නේය.

"සංස්කාරයන් තමා වශයෙන් හෝ නොදක්නේය. තමා සංස්කාරයන් ඇත්තෙකුකොට හෝ නොදක්නේය. තමා කෙරෙහි සංස්කාරයෝ ඇතැයි හෝ නොදක්නේය. සංස්කාරයන්හි තමා ඇතැයි හෝ නොදක්නේය.

"විඤ්ඤාණය තමා වශයෙන් හෝ නොදක්නේය. තමා විඤ්ඤාණවත්කොට හෝ නොදක්නේය. තමා කෙරෙහි විඤ්ඤාණය ඇතැයි හෝ නොදක්නේය. විඤ්ඤාණයෙහි තමා ඇතැයි හෝ නොදක්නේය.

**22.** "හෙතෙම අනිත්‍යවූ රූපය 'අනිත්‍යවූ රූපය' යයි තත්වූපරිද්දෙන් දනී. අනිත්‍යවූ වේදනාව අනිත්‍යවූ වේදනාව' යයි තත්වූපරිද්දෙන් දනී. අනිත්‍යවූ සංඥාව 'අනිත්‍යවූ සංඥාව' යයි තත්වූ පරිද්දෙන් දනී. අනිත්‍යවූ සංස්කාරයන් 'අනිත්‍යවූ සංස්කාරයෝ'යයි තත්වූ පරිද්දෙන් දනී. අනිත්‍යවූ විඤ්ඤාණය 'අනිත්‍යවූ විඤ්ඤාණය'යයි තත්වූ පරිද්දෙන් දනී.

**23.** "දුක්වූ රූපය 'දුක්වූ රූපය'යි තත්වූ පරිද්දෙන් දනී. දුක්වූ වේදනාව 'දුක්වූ වේදනාව'යයි තත්වූ පරිද්දෙන් දනී. දුක්වූ සංඥාව 'දුක්වූ සංඥාවය'යි තත්වූ පරිද්දෙන් දනී. දුක්වූ සංස්කාරයන් 'දුක්වූ සංස්කාරයෝ'යි තත්වූ පරිද්දෙන් දනී. දුක්වූ විඤ්ඤාණය 'දුක්වූ විඤ්ඤාණය'යි තත්වූ පරිද්දෙන් දනී.

**24.** "අනාත්මයවූ රූපය 'අනාත්මවූ රූපය'යයි තත්වූ පරිද්දෙන් දනී. අනාත්මයවූ වේදනාව 'අනාත්මවූ වේදනාව' යයි තත්වූ පරිද්දෙන් දනී. අනාත්මයවූ සංඥාව 'අනාත්මවූ සංඥාව'යයි තත්වූ පරිද්දෙන් දනී. අනාත්මයවූ සංස්කාරයන් අනාත්මවූ සංස්කාරයෝ'යි තත්වූ පරිද්දෙන් දනී. අනාත්මයවූ විඥානය අනාත්මවූ විඥානය'වෙතියි තත්වූ පරිද්දෙන් දනී.

**25.** "ප්‍රත්‍යයන් විසින් කරනලද රූපය 'ප්‍රත්‍යයන් විසින් කරනලද රූපය'යයි තත්වූ පරිද්දෙන් දනී. ප්‍රත්‍යයන් විසින් කරනලද වේදනාව 'ප්‍රත්‍යයන් විසින් කරනලද වේදනාව'යයි තත්වූ පරිද්දෙන් දනී. ප්‍රත්‍යයන් විසින් කරනලද සංඥාව 'ප්‍රත්‍යයන් විසින් කරනලද සංඥාව'යයි තත්වූ පරිද්දෙන් දනී. ප්‍රත්‍යයන් විසින් කරනලද සංස්කාරයන් 'ප්‍රත්‍යයන් විසින් කරනලද සංස්කාරයෝ'යයි තත්වූ පරිද්දෙන් දනී. ප්‍රත්‍යයන් විසින් කරනලද විඥානය 'ප්‍රත්‍යයන් විසින් කරන ලද විඥානය'යි තත්වූ පරිද්දෙන් දනී.

**26.** "වධකවූ රූපය 'වධකවූ රූපය'යයි තත්වූ පරිද්දෙන් දනී. වධකවූ වේදනාව 'වධකවූ වේදනාව'යි තත්වූ පරිද්දෙන් දනී. වධකවූ සංඥාව 'වධකවූ සංඥාව'යයි තත්වූ පරිද්දෙන් දනී. වධකවූ සංස්කාරයන් 'වධකවූ සංස්කාරයෝ' යයි තත්වූ පරිද්දෙන් දනී. වධකවූ විඥානය 'වධකවූ විඥානය' යයි තත්වූ පරිද්දෙන් දනී.

**27.** "ඒ ආර්ය ශ්‍රාවකතෙම 'මේ මාගේ ආත්මය'යි රූපයට නොපැමිණෙයි, නොගනී, නොපිහිටයි. 'මාගේ ආත්මය'යි වේදනාවට නොපැමිණෙයි, නොගනී, නොපිහිටයි. 'මේ මාගේ ආත්මය'යි සංඥාවට නොපැමිණෙයි. නොගණී, නොපිහිටයි සංස්කාරයන්ට 'මාගේ ආත්මය'යි නොපැමිණෙයි, නොගනී, නොපිහිටයි. විඤ්ඤාණයට 'මගේ ආත්මය'යි නොපැමිණෙයි, නොගනී, නොපිහිටයි. නොපැමිණෙන ලද්දාවූ, නොගන්නා ලද්දාවූ, මේ පඤ්චොපාදානස්කන්ධයෝ බොහෝ කලක් මුළුල්ලෙහි වැඩ පිණිස, සැප පිණිස පවතිත්යයි" ප්‍රකාශ කළහ.

**28.** "ඇවැත් සාරිපුත්‍ර ස්ථවිරයෙනි, යම් කෙනෙකුන්ට අනුකම්පා කරන්නාවූ, වැඩ කැමැතිවූ, අවවාද කරන්නාවූ, අනුශාසනය කරන්නාවූ ආයුෂ්මතුන් බඳු සබ්‍රහ්මචාරීහු වෙද්ද, ඔවුන්ට එසේ වේමය.

ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්ගේ මේ ධර්ම දේශනාවද අසා මාගේ සිත (උපාදන වශයෙන්) නොගෙන ආශ්‍රවයන් කෙරෙන් මිදුණේයි.

ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මේ සූත්‍රය වදාළහ. සතුටු සිත් ඇති ආයුෂ්මත් යමක භික්ෂුතෙම ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්ගේ කීම සතුටින් පිළිගත්තේය.

**(තුන්වෙනි යමක සූත්‍රය නිමි.)**

---

## 4. අනුරාධ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විසාලා මහනුවර සමීපයෙහිවූ මහා වනයෙහි කූටාගාර ශාලාවෙහි වැඩ වාසය කරනසේක. එකල්හි වනාහි ආයුෂ්මත් අනුරාධ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි ආරන්‍ය කුටියක වෙසෙයි.

2. ඉක්බිති බොහෝ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ ආයුෂ්මත් අනුරාධ භික්ෂුව යම්තැනෙකද, එතැනට පැමිණියාහුය. පැමිණ ආයුෂ්මත් අනුරාධ භික්ෂුව සමග සතුටුවූහ. සතුටු වියයුතු සිහි කටයුතු කථාවකොට නිමවා එක්පසෙක හුන්හ. එකත්පසෙක හුන්නාවූ අන්‍යතීර්ථකයෝ ආයුෂ්මත් අනුරාධ භික්ෂුවට මෙය කීහ.

3. "ඇවැත් අනුරාධයෙනි, යමෙක් තථාගතවෙයිද, උතුම් පුරුෂයා වෙයිද, පරම පුරුෂයා වෙයිද, උතුම් පැමිණීමට පැමිණි තැනැත්තෙක් වෙයිද, ඒ තොපගේ ශාස්තෲවූ තථාගත තෙමේ සත්ත්වයා පිළිබඳ මේ කරුණු සතර පනවයි.

"සත්වතෙම මරණින් මත්තෙහි වේයයිද, සත්වතෙම මරණින් මත්තෙහි නොවේයයිද, සත්වතෙම මරණින් මත්තෙහි වේයයිද නොමවේයයිද, සත්වතෙම මරණින් මත්තෙහි නොමවෙයි නොවන්නේද, නොවේයයිද යන සතරය."

4. මෙසේ කී කල්හි ආයුෂ්මත් අනුරාධ භික්ෂුතෙම ඒ අන්‍යතීර්ථකයන්ට මෙසේ කීය.

"ඇවැත්නි, යමෙක් තථාගතවූයේද, උතුම් පුරුෂයා වූයේද, පරම පුරුෂයා වූයේද, උතුම් පැමිණීමට පැමිණියේ වේද, ඒ ශාස්තෲවූ තථාගතයන් මරණින් මත්තෙහි සත්වතෙම වේයයි කියා හෝ සත්වතෙම මරණින් මත්තෙහි නොවේයයි කියා හෝ සත්වතෙම මරණින් මත්තෙහි වෙයි, නොම වෙයි කියා හෝ සත්වතෙම මරණින් මත්තෙහි නොම වෙයි, නොවන්නේ නොවෙයි කියා හෝ (යන) මේ සතර කරුණෙන් අන් ආකාරයක්ම පණවන සේක.

මෙසේ කී කල්හි ඒ අන්‍ය තීර්ථකයෝ ආයුෂ්මත් අනුරාධ භික්ෂුවට 'මේ භික්ෂුතෙම අලුත පැවිදිවූ නවක භික්ෂුවක් වන්නේය. නොහොත් අඥානවූ අව්‍යක්තවූ ස්ථවිරයෙක් වන්නේයයි" කීහ. ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ ආයුෂ්මත් අනුරාධ භික්ෂුවට නවක වාදයෙන්ද, බාල වාදයෙන්ද, ගරහා හුනස්නෙන් නැගිට ගියාහුය.

**5.** ඉක්බිති ඒ අන්‍ය තීර්ථකයන් ගිය නොබෝ කල්හි ආයුෂ්මත් අනුරාධ භික්ෂුවට මෙබඳු අදහසෙක් විය. ඉදින් වනාහි ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ මත්තෙහි මාගෙන් ප්‍රශ්න අසන්නාහුනම් ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ට කෙසේ විසඳන්නාවූ මම භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්ද කියන්නෙක් වෙම්ද? භාග්‍යවතුන් වහන්සේට අසත්‍යයෙන් අභිබවා නොකියන්නෙක් වෙම්ද, ලොකොත්තර ධර්මයට අනුකූල ධර්මයන් ප්‍රකාශ කරන්නෙම්ද, කරුණු සහිතවූ කිසියම් වාදයක් ගැරහිය යුතු කරුණකට නොම පැමිණෙන්නේද කියායි.

**6.** ඉක්බිති ආයුෂ්මත් අනුරාධ භික්ෂුතෙමෙ භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ ආයුෂ්මත් අනුරාධ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට මේ කරුණු කීයේය.

"ස්වාමීනි, මේ මහවෙනෙහි භාග්‍යවතුන් වහන්සේට සමීපයෙහි වන කුටියක වාසය කරමි. ස්වාමීනි එකල්හි බොහෝ

අන්‍ය තීර්ථකයෝ මම යම් තැනෙක්හිද, එතැනට පැමිණියාහ. පැමිණ මා සමග සතුටුවූහ. සතුටුවිය යුතු සිහි කටයුතු කථාවකොට නිමවා එක්පසෙක හුන්නාහුය. එක්පසෙක හුන්නාවූ ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ මට මේ කරුණ කීහ.

'ඇවැත් අනුරාධයෙනි, යමෙක් තථාගතවූ උත්තම පුරුෂවූ පරම පුරුෂවූ උතුම් පැමිණීමට පැමිණියාවූ යම් ඒ තථාගතවරයෙක්වේද, ඒ (තොපගේ) තථාගතයන් වහන්සේ සත්වයා පිළිබඳ මේ කරුණු සතර පනවයි.

'සත්වතෙම මරණින් මත්තෙහි වෙයි. සත්වතෙම මරණින් මත්තෙහි නොමවෙයි. සත්වතෙම මරණින් මත්තෙහි වන්නේත් වෙයි. නොවන්නේත් වෙයි. සත්වතෙම මරණින් මත්තෙහි නොමවෙයි. නොවන්නේත් නොවෙයි' (කියායි.)

7. "ස්වාමීනි, මෙසේ කියන ලද්දාවූ මම ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ට මෙය කීමි. 'ඇවැත්නි, යමෙක් තථාගතවූ උත්තම පුරුෂවූ, පරම පුරුෂවූ උතුම් තැනට පැමිණි යම් ඒ තථාගත කෙනෙක් වේද්ද ඒ තථාගතයන් වහන්සේ සත්වයා මේ සතර කරුණෙන් නොපමුණවත්.

'සත්වතෙම මරණින් මත්තෙහි වෙයි. සත්වතෙම මරණින් මත්තෙහි නොමවෙයි. සත්වතෙම මරණින් මත්තෙහි වන්නේත් වෙයි, නොමවන්නේත් වෙයි, සත්වතෙම මරණින් මත්තෙහි නොමවෙයි, නොවන්නේත් නොවෙයි' කියායි.

"ස්වාමීනි, මෙසේ කී කල්හි ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ මට මෙසේ කීහ. 'මේ මහණතෙම අලුත පැවිදිවූ නවකයෙක් වන්නේය. නැතහොත් අඥානවූ අව්‍යක්තයෙක් වන්නේය' කියායි. ස්වාමීනි, ඉක්බිති ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ මට නවකවාදයෙන්ද, බාල වාදයෙන්ද, නින්දාකොට හුනස්නෙන් නැගිට බැහැර ගියාහුය.

"ස්වාමීනි, ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන් ගිය කල්හි ඒ මට මෙබඳු අදහසෙක් විය. 'ඉදින් වනාහි ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ මත්තෙහි මා අතින් ප්‍රශ්න අසන්නාහුනම් ඒ

අන්‍යතීර්ථක පරිබ්‍රාජකයනට කෙසේ විසඳන්නාවූ මම භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්ද කියන්නෙක් වෙම්ද, භාග්‍යවතුන් වහන්සේට අසත්‍ය වචනයෙන් මැඩ නොකියන්නෙම්ද, ධර්මයට අනුකූල ධර්මය කියන්නෙම්ද, කරුණු සහිතවූ කිසිවාදයක් ගැරහියයුතු බවට නොපැමිණෙන්නේද" (යනුයි.)

8. "අනුරාධය, ඒ කුමැයි සිතන්නෙහිද? රූපය නිත්‍ය හෝ වේද, අනිත්‍යය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, ඒ දුක හෝ සැප හෝ වේද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යය වේද, දුක් වේද, පෙරළෙන ස්වාභාව ඇත්තේ වේද, 'එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්ම'යයි එය දක්නට සුදුසුද?" - "ස්වාමීනි, එය දක්නට සුදුසු නොවේමය."

'වේදනාව නිත්‍ය හෝ වේද, අනිත්‍යය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය වේද, එය දුක හෝ සැප හෝ වේද?" - "ස්වාමීනි, දුකය."

"යමක් අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාව ඇත්තේද, 'එය මාගේය, එය මම වෙමි, එය මාගේ ආත්ම'යයි දක්නට සුදුසුද?" - "ස්වාමීනි. එය සුදුසු නොවේමය."

"සංඥාව නිත්‍ය හෝ වේද අනිත්‍ය හෝ වේද" - "ස්වාමීනි, අනිත්‍යය."

"යම් ඒ සංඥාවක් අනිත්‍යය වේද, එය දුක හෝ සැප හෝ වේද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍ය වේද, දුකවේද, පෙරලෙන ස්වභාවඇත්තේ වේද, 'එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්ම'යයි ඒ සංඥාව දක්නට සුදුසුද?" - "ස්වාමීනි, සුදුසු නොවේමය."

"සංස්කාරයෝ නිත්‍ය හෝ වේද, අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය වේද? ඒ දුක හෝ සැප හෝ වේද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යවේද, දුකවේද, පෙරලෙන ස්වාභාව ඇත්තේ වේද? 'එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්ම'යයි දක්නට සුදුසුද?" - "ස්වාමීනි, සුදුසු නොවේමය."

"විඥ්ඤාණය නිත්‍ය හෝ වේද, අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය වේද, ඒ දුක හෝ සැප හෝ වේද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යවේද, දුක වේද, පෙරලෙන ස්වාභව ඇත්තේ වේද? එය මාගේය. එය මම වෙමි. එය මාගේ' ආත්ම'යයි දක්නට සුදුසුද" - "ස්වාමීනි, සුදුසු නොවේමය."

**9.** "එහෙයින් අනුරාධය, අතීතවූ හෝ අනාගතවූ හෝ වර්තමානවූ හෝ අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි රූපයක් වේද, 'ඒ සියලු රූපය මාගේ නොවේ. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේ'යයි මෙසේ තත්වූ පරිද්දෙන් යහපත් ප්‍රඥාවෙන් දත යුතුය.

"අතීතවූ හෝ අනාගතවූ හෝ වර්තමානවූ හෝ අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි වේදනාවක් වේද, 'ඒ සියලු වේදනා මාගේ නොවේ, ඒ මම නොවෙමි, ඒ මාගේ ආත්මය නොවේ'යයි මෙසේ තත්වූ පරිද්දෙන් යහපත් ප්‍රඥාවෙන් දත යුතුය.

"අතීතවූ හෝ අනාගතවූ හෝ වර්තමානවූ හෝ අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි සංඥාවක් වේද,

'ඒ සියලු සංඥාව මාගේ නොවේ, ඒ මම නොවෙමි, ඒ මාගේ ආත්මය නොවේ'යයි මෙසේ තත්වූ පරිද්දෙන් යහපත් ප්‍රඥාවෙන් දත යුතුය.

"අතීතවූ හෝ අනාගතවූ හෝ වර්තමානවූ හෝ අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි සංස්කාරයක් වේද, 'ඒ සියලු සංස්කාර මාගේ නොවේ. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේ'යයි මෙසේ තත්වූ පරිද්දෙන් යහපත් ප්‍රඥාවෙන් දත යුතුය.

"අතීතවූ හෝ අනාගතවූ හෝ වර්තමානවූ හෝ අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි විඥානයෙක් වේද, 'ඒ සියලු විඥාන මාගේ නොවේ, ඒ මම නොවෙමි, ඒ මාගේ ආත්මය නොවේ"යයි මෙසේ තත්වූ පරිද්දෙන් යහපත් ප්‍රඥාවෙන් දත යුතුය.

10. "මෙසේ දක්නාවූ ආර්ය ශ්‍රාවකතෙම රූපයෙහිද කලකිරේ, වේදනාවෙහිද කලකිරේ, සංඥාවෙහිද කලකිරේ, සංස්කාරයන්හිද කලකිරේ, විඥ්ඥාණයෙහිද කලකිරේ, කලකිරුණේ නොඇලේ, නොඇලීමෙන් (කෙලෙසුන්ගෙන්) මිදේ, මිදුණු කල්හි "මිදුණේයයි (ප්‍රත්‍යවෙක්ෂා) ඥානයවේ. ජාතිතොමෝ ක්ෂයවූවාය, බ්‍රහ්මචර්යාව වැස නිමවන ලද්දේය. කටයුතු කරන ලද්දේය. මේ රහත් බව පිණිස කළයුතු අනිකක් නැතැ"යි දැනගනියි.

11. "අනුරාධය, ඒ කුමැයි හඟිනෙහිද? රූපය සත්වයා යයි දක්නෙහිද?" - "ස්වාමීනි, එසේ නොවේමය."

"වේදනාව සත්වයායයි දක්නෙහිද?" - "ස්වාමීනි, එසේ නොවේමය."

"සංඥාව සත්වයායි දක්නෙහිද?" - "ස්වාමීනි. එසේ නොවේමය."

"සංස්කාරයන් සත්වයායයි දක්නෙහිද?" - "ස්වාමීනි, එසේ නොවේමය."

"විඥානය සත්වයායයි දක්නෙහිද?" - "ස්වාමීනි. එසේ නොවේමය."

12. "අනුරාධය, ඒ කුමැයි සිතන්නෙහිද? රූපයෙහි සත්වයා ඇතැයි දක්නෙහිද?" - "ස්වාමීනි එසේ නොවේමය."

"රූපයෙන් වෙන්ව සත්වයාවේයයි දක්නෙහිද?" - "ස්වාමීනි, එසේ නොවේමය."

"වේදනාවෙහි සත්වයාවේයයි දක්නෙහිද?" - "ස්වාමීනි, එසේ නොවේමය."

"වේදනාවෙන් පිටත්හි සත්වතෙම වේයයි දක්නෙහිද?" - "ස්වාමීනි, එසේ නොවේමය."

"සංඥාවෙහි සත්වතෙම දක්නෙහිද?" "ස්වාමීනි, නොවේමය."

"සංඥාවෙන් අන්තැනෙක්හි සත්වතෙම වේයයි දක්නෙහිද?" - "ස්වාමීනි, එසේ නොවේමය."

"සංස්කාරයෙහි සත්වතෙම දක්නෙහිද?" - "ස්වාමීනි, නොවේමය."

"සංස්කාරයන්ගෙන් අන් තැනෙක්හි සත්වයාවේයයි දක්නෙහිද?" - "ස්වාමීනි, එසේ නොවේමය."

"විඥානයෙහි සත්වතෙම දක්නෙහිද?" - "ස්වාමීනි, එසේ නොවේමය."

"විඥානයෙන් වෙන්ව සත්වයා දක්නෙහිද?" - "ස්වාමීනි, එසේ නොවේමය."

13. "අනුරාධය, ඒ කුමැයි සිතන්නෙහිද?" - "රූපය, වේදනාවය, සංඥාව, සංස්කාරය, විඥානය සත්වයායයි දක්නෙහිද?" - "ස්වාමීනි, එසේ නොවේමය."

"අනුරාධය, ඒ කුමැයි හඟින්නෙහිද? මේ ඒ රූප නැත්තේ වේදනාව නැත්තේ, සංඥාව නැත්තේ, සංස්කාරය නැත්තේ,

විඥානය නැත්තේ සත්වයායි දක්නෙහිද?" - "ස්වාමීනි, එසේ නොවේමය."

14. "අනුරාධය, මෙහි තා විසින් මේ ආත්මයෙහිම සත්‍ය වශයෙන්, ස්ථිර වශයෙන් සත්වයකු නොලැබිය හැකි කල්හි 'ඇවැත්නි, උත්තම පුරුෂවූ, අතිපරම පුරුෂවූ, උතුම් නිවනට පැමිණියාවූ යම් ඒ තථාගතවරයෙක්, වේද, ඒ තථාගතතෙමේ 'සත්වතෙම මරණින් මත්තෙහි වේ'යයි හෝ 'සත්වතෙම මරණින් මත්තෙහි නොවේයයි හෝ සත්වතෙම මරණින් මත්තෙහි වෙයි.' නොම වෙයි, හෝ සත්වතෙම මරණින් මත්තෙහි නොමවෙයි. නොවන්නේ නොවේයයි, හෝ යන මේ සතර කරුණෙන් වෙන්ව පනවන්නේයි තාගේ ඒ ප්‍රකාශය සුදුසුද?" - "ස්වාමීනි, මේ ප්‍රකාශය සුදුසු නොවේ."

"මැනවි. මැනවි අනුරාධය, අනුරාධය. මම පෙරද, දැනුදු, දුකද පනවමි. දුක්ඛයාගේ නිරෝධයද පනවමි."

**(සතරවැනි අනුරාධ සූත්‍රය නිමි.)**

---

## 5. වක්කලි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාප නම්වූ වේළුවනාරාමයෙහි වැඩවසනසේක. එකල්හි වනාහි ආයුෂ්මත් වක්කලි ස්ථවිරතෙමේ හටගත් ආබාධ ඇතිව දුකට පත්ව බලවත්සේ ගිලන්ව කුම්භකාර ශාලාවක වාසය කරයි.

2. ඉක්බිති ආයුෂ්මත් වක්කලි ස්ථවිරතෙමේ උපස්ථායකයන් කැඳවීය.

"ඇවැත්නි, (මෙහි) එව්, තෙපි භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණෙවු, පැමිණ මාගේ වචනයෙන් 'ස්වාමීනි, වක්කලි භික්ෂුතෙම හටගත් ආබාධ ඇත්තේය, දුකට පත්වූයේය, දැඩි ගිලන් බැව් ඇත්තේය. හෙතෙම භාග්‍යවතුන්

වහන්සේගේ පාදයන් වඳී’යයි භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් වඳිවු, මෙසේත් කියවු:- ‘ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ වක්කලි භික්ෂුව යම්තැනෙකද, එතැනට අනුකම්පා පිණිස වැඩියහොත් මැනව” කියායි.

3. “එසේය ඇවැත්නි”යි (කියා) ආයුෂ්මත් වක්කලි තෙරුන්ට උත්තරදී භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියාහ. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය කීහ:-

“ස්වාමීනි, වක්කලි භික්ෂුතෙම හටගත් රෝග ඇත්තේය, දුකට පැමිණියේය, දැඩි ගිලන්බැව් ඇත්තේය, හෙතෙම භාග්‍යවතුන් වහන්සේගේ පාදයන්වඳී. ‘ස්වාමීනි, යාඥාකරමි, භාග්‍යවතුන් වහන්සේ වක්කලි භික්ෂුතෙම යම් තැනෙකද එතැනට අනුකම්පා පිණිස වඩිනසේක්වා.” භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණිම්භාවයෙන් ඉවසා වදාළසේක.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ හැඳ පොරවා වක්කලි භික්ෂුතෙම යම් තැනෙකද, එතැනට වැඩිසේක. ආයුෂ්මත් වක්කලි තෙර දුරදීම වඩින්නාවූ බුදුරජාණන් වහන්සේ දැක, ගෞරව පිණිස ඇඳෙන් නැගිටීමට උත්සාහ කෙළේය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් වක්කලි ස්ථවිරයන්ට ‘වක්කලිය, කම්නැත, තෙපි ඇඳෙන් නො නැගිටිව් මේ පනවනලද අසුන් ඇත්තාහ. මම එහි හිඳිමියි.” වදාළසේක.

“භාග්‍යවතුන් වහන්සේ පනවන ලද අස්නෙහි වැඩහුන් සේක, භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳ ආයුෂ්මත් වක්කලි තෙරුන්ට මෙය වදාළසේක:-

“කිම? වක්කලිය, තට දුක ඉවසිය හැකිද? ඉරියව් යැපිය හැකිද? කිම? දුඃඛ වේදනාවෝ නවතිද්ද, වැඩීමට නොපැමිණෙද්ද, දුක් වේදනාවන්ගේ නැවතීම පෙනේද, දියුණුවීම නොපැනේද?”

"ස්වාමීනි, මට ඉවසාගත නොහැකිය, ඉරියව් යැපිය නොහැකිය, මගේ දැඩි දුක් වේදනාවෝ වැඩෙති, නොනවතිත්, මේ දුක් වේදනාවන්ගේ දියුණුව පෙනෙයි, නැවැත්ම නොපෙනේ."

**5.** "කිම? වක්කලිය, තට කිසි පසුතැවීමක් නොවේද, කිසි විපිළිසර බවක් නොවේද? ස්වාමීනි, මට ඒකාන්තයෙන් සුලුනොවූ පසුතැවීමක්, සුලුනොවූ විපිළිසර බවක් ඇත්තේය."

"කිම? වක්කලිය, තට තෙමේ ශීලයෙන් චෝදනා නොකෙරේද?" - "ස්වාමීනි, මට තෙමේ ශීලවශයෙන් චෝදනා නොකෙරෙයි."

"වක්කලිය, ඉදින් තට තෙමේ ශීලයෙන් චෝදනා නොකෙරේ නම්, එවිට තට කිනම් පසුතැවීමක්ද, කිනම් විපිළිසර බවක්ද?"

"ස්වාමීනි, මම බොහෝ කලෙක පටන් භාග්‍යවතුන් වහන්සේ දක්නා පිණිස යනු කැමැත්තෙමි. එහෙත් භාග්‍යවතුන් වන්සේ දක්නට යාමට තරම්වූ ශක්තියක් නැත.

**6.** "වක්කලිය, කම්නැත, මේ කුණුකය දකිනු ලැබීමෙන් කිනම් ප්‍රයෝජනයක්ද? වක්කලිය, යමෙක් වනාහි ධර්මය දකීද, හෙතෙම මා දක්නේය, යමෙක් මා දකීද, හෙතෙම ධර්මය දක්නේය.

වක්කලිය, ධර්මය දකින තැනැත්තේ වනාහි මා දකියි. මා දකින තැනැත්තේ ධර්මය දකියි.

'වක්කලිය, ඒ කිමැයි සිතන්නෙහිද? රූපය නිත්‍ය හෝ වේද, අනිත්‍ය හෝ වේද?' - 'ස්වාමීනි, අනිත්‍යය.'

'වේදනාව නිත්‍ය හෝ වේද, අනිත්‍ය හෝ වේද?' - 'ස්වාමීනි, අනිත්‍යය.'

'සංඥාව නිත්‍ය හෝ වේද, අනිත්‍ය හෝ වේද?' - 'ස්වාමීනි, අනිත්‍යය.'

'සංස්කාරයෝ නිත්‍ය හෝ වේද, අනිත්‍ය හෝ වේද?' - "ස්වාමීනි, අනිත්‍යය.'

'විඤ්ඤාණය නිත්‍ය හෝ වේද, අනිත්‍ය හෝ වේද?' - 'ස්වාමීනි, අනිත්‍යය.'

7. "එහෙයින් වක්කලිය, අතීතවූ හෝ අනාගතවූ හෝ වර්තමානවූ හෝ අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි රූපයෙක් වේද, ඒ මේ සියලු රූපය 'එය මාගේ නොවේය, එය මම නොවෙමි, එය මාගේ ආත්මය නොවේ' යයි මෙසේ තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දතයුතුය.

"අතීතවූ හෝ අනාගතවූ හෝ වර්තමානවූ හෝ අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි වේදනාවක් වේද, 'ඒ හැම වේදනාව මාගේ නොවේ. මම නොවෙමි. මාගේ ආත්මය නොවේ'යයි මෙසේ තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දතයුතුය.

"අතීතවූ හෝ අනාගතවූ හෝ වර්තමානවූ හෝ අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි සංඥාවක් වේද, 'ඒ සියලු සංඥාව මාගේ නොවේ, මම නොවෙමි, මාගේ ආත්මය නොවේ'යයි මෙසේ තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දතයුතුය.

"අතීතවූ හෝ අනාගතවූ හෝ වර්තමානවූ හෝ අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි සංස්කාරයෝ වෙද්ද, 'ඒ සියලු සංස්කාර මාගේ නොවේ, මම නොවෙමි, මාගේ ආත්මය නොවේ'යයි මෙසේ තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දතයුතුය.

"අතීතවූ හෝ අනාගතවූ හෝ වර්තමානවූ හෝ අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි විඤ්ඤානයෙක් වේද, 'ඒ සියලු විඤ්ඤානය මාගේ නොවේ, මම නොවෙමි, මාගේ ආත්මය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නොවේ’යයි මෙසේ සම්‍යක් ප්‍රඥාවෙන් තත්වූ පරිද්දෙන් දතයුතුය.

8. “මෙසේ දක්නාවූ ආර්යශ්‍රාවකතෙම රූපයෙහිද කලකිරෙයි, වේදනාවෙහිද කලකිරෙයි, සංඥාවෙහිද කලකිරෙයි, සංස්කාරයන්හිද කලකිරෙයි, විඥානයෙහිද කලකිරෙයි, කලකිරුණේ නොඇලෙයි, නොඇලීමෙන් (කෙලෙසුන් කෙරෙන්) මිදෙයි, මිදුනුකල්හි ‘මිදුණේ’ යයි දැනීම වෙයි. ජාතිය ක්ෂය විය. මාර්ගබ්‍රහ්මචර්යය වැස නිමවන ලද්දේය. කළයුත්ත කරණ ලද්දේය. මේ රහත්බව පිණිස කළයුතු අනිකෙක් නැතැයි දැනගනී.”

ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් වක්කලි ස්ථවිරයන්ට මේ අවවාදයෙන් අවවාදකොට හුනස්නෙන් නැගිට ගිජුකුළුපව්ව යම් තැනෙක්හිද, එතැනට වැඩිසේක.

9. “ඉක්බිති ආයුෂ්මත් වක්කලි ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ වැඩිය නොබෝ වේලාවකින් උපස්ථායකයන් කැඳවිය. කැඳවා “යනුමැනවි ඇවැත්නි; මා ඇඳක තබා ඉසිගිලි පර්වතය (පසෙකවූ) කාලසිලා විහාරය යම් තැනෙකද, එහි ගෙන යනු මැනව. කෙසේ නම් මා වැන්නෙක් ඇතුළු ගමෙහි කළුරිය කළයුතු යයි සිතන්නේද?” “ඇවැත එසේය කියා” ඒ භික්ෂූහු ආයුෂ්මත් වක්කලි තෙරුන්ට උත්තර දී ආයුෂ්මත් වක්කලි තෙරුන් ඇඳක තබා ඉසිගිලි පව්වෙහි (පසෙකවූ) කාලසිලා විහාරය යම් තැනෙකද, එතැනට ගෙන ගියාහුය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ රැයද ඒ දවාලෙහි ඉතිරි කොටසද ගිජ්ජකූට පර්වතයෙහි විසූසේක.

10. “ඉක්බිති දේවතාවෝ දෙදෙනෙක් රෑ පෙරයම් දසපැය ඉක්මගිය කල්හි බබලන ශරීර වර්ණයෙන් යුක්තවූවාහු මුළු ගිජුකුළුපව්ව බබුලුවාගෙන භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියාහ. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියාහුය. එකත්පස්ව සිටියාවූ එක් දේවතාවෙක් භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය:-

"ස්වාමීනි, වක්කලි භික්ෂුතෙම අර්හත් මාර්ගයට පැමිණීම පිණිස උත්සාහ කරයි. අනික් දේවතාතොම "ස්වාමීනි, ඒ වක්කලි භික්ෂුතෙම අර්හත්ඵල විමුක්තියෙන් මිදුනෙක්ව මිදෙන්නේයයි හඟිමි"යි යන මෙය කීය. ඒ දේවතාවෝ මෙය කීහ. මෙය කියා භාග්‍යවතුන් වහන්සේ වැඳ ගරුකොට එහිම නොපෙණී ගියාහුය.

11. "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ රාත්‍රියගේ ඇවෑමෙන් භික්ෂූන් ඇමතුසේක. "මහණෙනි, තෙපි එවූ, වක්කලි භික්ෂු යම් තැනෙකද, එතැනට පැමිණෙවූ, පැමිණ වක්කලි භික්ෂුවට මෙසේ කියවුඃ- 'ඇවැත් වක්කලි, භාග්‍යවතුන් වහන්සේගේද දිව්‍ය පුත්‍රයන් දෙදෙනාගේද වචනය අසව. ඇවත, මේ රැයෙහි දේවතාවෝ දෙදෙනෙක් ප්‍රථම යාමය ඉකුත්ව ගිය කල්හි බබලන ශරීර වර්ණයෙන් යුක්තව හාත්පස ගිජුකුළුපව්ව ඒකාලෝක කොට බබුලුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පැත්තෙක සිටියහ. ඇවත, එක්පැත්තෙක සිටියාවූ එක් දේවතාවෙක් භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේයඃ-

'ස්වාමීනි, වක්කලි භික්ෂුතෙම අර්හත් මාර්ගයට පැමිණීම පිණිස උත්සාහ කරයි. අන්‍ය දේවතාතොම භාග්‍යවතුන් වහන්සේට මෙය දැන්වීය. 'ස්වාමීනි, ඒ භික්ෂුව අර්හත්ඵල විමුක්තියෙන් මිදුනෙක්ව මිදෙන්නේයයි සිතමි' කියායි.

'ඇවත වක්කලි, භාග්‍යවතුන් වහන්සේද තොපට මෙසේ වදාරතිඃ- 'වක්කලිය, බිය නොවෙව, වක්කලිය බිය නොවෙව, තොපගේ මරණය ලාමක නොවන්නේය. ලාමක නොවූ කාලක්‍රියාවක් වන්නීය, යනුයි.'

'එසේය ස්වාමීනි,' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී ආයුෂ්මත් වක්කලි තෙර යම් තැනෙකද, එතැනට පැමිණියාහුය. පැමිණ ආයුෂ්මත් වක්කලි තෙරුන්ට මෙයකීහඃ-

'ඇවත වක්කලි ස්ථවිරයෙනි, භාග්‍යවතුන් වහන්සේගේද, දිව්‍යපුත්‍රයන් දෙදෙනාගේද වචනය අසවු'යි කීහ.

12. ඉක්බිති ආයුෂ්මත් වක්කලි ස්ථවිරතෙම උපස්ථායකයන් කැඳවීය. 'ඇවැත්නි, එනු මැනවි. මා ඇඳෙන් බස්වනු මැනවි. කෙසේ නම් මාවැන්නෙක් උස් අසුනෙහි හිඳ භාග්‍යවතුන් වහන්සේගේ පණිවුඩය ඇසිය යුතු යයි හඟින්නේදැයි' කීය. 'එසේය ඇවැත්නි.' කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් වක්කලි තෙරුන්ට උත්තර දී, ආයුෂ්මත් වක්කලි තෙරුන් ඇඳෙන් බැස්වූහ.

13. "ඇවත, මේ රාත්‍රියෙහි දේවතාවෝ දෙදෙනෙක් පළමු දසපැය ඉක්මගිය කල්හි බබලන ශරීර වර්ණයෙන් යුක්තව මුලු ගිජුකුළුපව්ව බබුලුවා භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද, එතැනට පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස්ව සිටියාහුය. ඇවත, එකත්පස්ව සිටියාවූ එක් දේවතාවෙක් භාග්‍යවතුන් වහන්සේට 'ස්වාමීනි, වක්කලි භික්ෂු තෙම මාර්ගයට පැමිණීම පිණිස උත්සාහ කෙරේයයි' කීය. අනික් දේවතාතොම භාග්‍යවතුන් වහන්සේට 'ස්වාමීනි, ඒ භික්ෂුතෙම අර්හත්ඵල විමුක්තියෙන් මනාව මිදුනෙක්ව මිදෙන්නේය'යි කීය.

'ඇවැත් වක්කලි ස්ථවිරයෙනි, භාග්‍යවතුන් වහන්සේද තොපට 'වක්කලිය, බිය නොවෙව, වක්කලිය බිය නොවෙව, තොපගේ මරණය අලාමක වන්නේය. කළුරිය කිරීම අලාමක වන්නේ'යයි මෙසේ වදාරත්.

'ඇවැත්නි, එසේවීනම් මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් හිසින් වඳිවු. 'ස්වාමීනි, රෝග සහිතවූ දුකට පත්වූ දැඩිසේ ගිලන්වූ වක්කලි භික්ෂුව භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් හිසින් වඳී. මෙසේද කියයි. රූපය අනිත්‍යය, ස්වාමීනි, මම එය සැක නොකරමි. යමක් අනිත්‍යය වේද, ඒ දුකයයි සැක නොකරමි.

යමක් අනිත්‍යවේද, දුක්වේද, පෙරලෙන ස්වභාව ඇත්තේ වේද, එහි මාගේ ආලයෙක් (ආශාවක්) හෝ රාගයක් හෝ ප්‍රේමයෙක් හෝ නැතැයි සැක නොකරමි. වේදනාව අනිත්‍ය වේ. ස්වාමීනි, මම එය සැක නොකරමි. යමක් අනිත්‍ය නම් ඒ

දුකයයි සැක නොකරමි. යමක් අනිත්‍ය නම් දුක් නම් පෙරලෙන ස්වභාව ඇත්තේ නම් එහි මාගේ ආලයෙක් හෝ රාගයෙක් හෝ ප්‍රේමයෙක් හෝ නැතැයි සැක නොකරමි. සංඥාව අනිත්‍ය වන්නේය, ස්වාමීනි මම එය සැක නොකරමි. යමක් අනිත්‍ය වේද, ඒ දුක් වේයයි සැක නොකරමි. යමක් අනිත්‍යද, දුක්ද, පෙරලෙන ස්වභාව ඇත්තේද, එහි මාගේ ආලයෙක් හෝ රාගයෙක් හෝ ප්‍රේමයෙක් හෝ නැතැයි සැක නොකරමි. සංස්කාරයෝ අනිත්‍යයහ. ස්වාමීනි, මම එය සැක නොකරමි. යමක් අනිත්‍යවෙද්ද, ඒ දුකැයි සැකනොකරමි. යමක් අනිත්‍යවෙද්ද, දුක්වෙද්ද, පෙරලෙන ස්වභාව ඇත්තාහු වෙද්ද, එහි මාගේ ආලයෙක්වත් රාගයෙක්වත් ප්‍රේමයෙක්වත් නැතැයි සැක නොකරමි. විඥානය අනිත්‍යය, ස්වාමීනි, මම එය සැක නොකරමි. යමක් අනිත්‍යද, ඒ දුකැයි සැක නොකරමි. යමක් අනිත්‍යද, දුක්ද, පෙරලෙන ස්වභාව ඇත්තේද, එහි මාගේ ආලයෙක් හෝ රාගයෙක් හෝ ප්‍රේමයෙක් හෝ නැතැයි සැක නොකරමි.'

'එසේය ඇවැත්නි,' කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් වක්කලි තෙරුන්ට උත්තර දී ගියාහුය.

14. ඉක්බිති ආයුෂ්මත් වක්කලි ස්ථවිරතෙම ඒ භික්ෂූන් ගිය නොබෝ වේලාවකදී ආයුධයකින් ගෙළ සිඳගත්තේය.

ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක් හිද, එතැනට පැමිණියාහ. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පැත්තෙක හුන්හ. එක් පැත්තෙක හුන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහඃ-

'ස්වාමීනි, රෝග සහිතවූ, දුකට පත්වූ, දැඩි ගිලන්වූ වක්කලි භික්ෂුව භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් හිසින් වඳී, මෙසේද කියයිඃ-

'රූපය අනිත්‍යය, ස්වාමීනි, මම එය සැක නොකරමි. යමක් අනිත්‍යද, එය දුක් යයි සැක නොකරමි. යමක් අනිත්‍යයද, දුක්ද, පෙරලෙන ස්වභාව ඇත්තේද, එහි මාගේ ආලයෙක් හෝ

රාගයෙක් හෝ ප්‍රේමයෙක් හෝ නැතැයි සැක නොකරමි. වේදනාව අනිත්‍යය. ස්වාමීනි, මම එය සැක නොකරමි. යමක් අනිත්‍යයද, ඒ දුකයයි සැක නොකරමි. යමක් අනිත්‍යයද, දුක්ද, පෙරලෙන ස්වභාව ඇත්තේද, එහි මාගේ ආලයෙක් හෝ රාගයෙක් හෝ ප්‍රේමයෙක් හෝ නැතැයි සැක නොකරමි. සංඥාව අනිත්‍යය. ස්වාමීනි, මම එය සැක නොකරමි. යමක් අනිත්‍යයද, ඒ දුකයයි සැක නොකරමි. යමක් අනිත්‍යයද, දුක්ද, පෙරලෙන ස්වභාව ඇත්තේද, එහි මාගේ ආලයෙක් හෝ රාගයෙක් හෝ ප්‍රේමයෙක් හෝ නැතැයි සැක නොකරමි. සංස්කාරයෝ අනිත්‍යයහ. ස්වාමීනි, මම එය සැක නොකරමි. යමක් අනිත්‍ය වෙද්ද, ඒ දුකයයි සැක නොකරමි. යමක් අනිත්‍යය වෙද්ද, දුක් වෙද්ද, පෙරලෙන ස්වභාව ඇත්තාහු වෙද්ද, එහි මාගේ ආලයෙක් හෝ රාගයෙක් හෝ ප්‍රේමයෙක් හෝ නැතැයි සැක නොකරමි. විඥානය අනිත්‍යය. ස්වාමීනි, මම එය සැක නොකරමි. යමක් අනිත්‍යයද, එය දුකයයි සැක නොකරමි. යමක් අනිත්‍යයද, දුක්ද, පෙරලෙන ස්වභාව ඇත්තේද, එහි මාගේ ආලයෙක් හෝ රාගයෙක් හෝ ප්‍රේමයෙක් හෝ නැතැයි සැක නොකරමි, (යනුයි.)

**15.** ඉක්බිති භාග්‍යවතුන් වන්සේ භික්ෂූන්ට අඬගා වදාළසේක. 'මහණෙනි, යමු, ඉසිගිලි පර්වත පාර්ශවයෙහි කාලසිලා විහාරය යම් තැනෙකද, යම් තැනෙක්හි වක්කලි කුලපුත්‍රයා විසින් ගෙළ සිඳින ලදද, එතැනට පැමිණෙම්හ." "එසේය ස්වාමීනි," කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බොහෝ භික්ෂූන් සමග ඉසිගිලි පව්ව පසෙහිවූ කාලසිලා විහාරය යම් තැනෙකද, එතැනට වැඩිසේක. භාග්‍යවතුන් වහන්සේ ඇඳෙහි පෙරළුණු කඳ ඇතිව සයනය කරන්නාවූ ආයුෂ්මත් වක්කලි තෙරුන් දුරදීම දුටුසේක.

**16.** එකල්හි වනාහි දුමක් අඳුරක් නැගෙනහිර දෙසට යයි. බස්නාහිර දෙසට යයි. උතුරු දිගට යයි. දකුණු දිගට යයි උඩට යයි. යටට යයි. අනුදිගට යයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූසේක. "මහණෙනි, තෙපි නැගෙනහිරට යන්නාවූද, බස්නාහිරට යන්නාවූද උතුරට යන්නාවූද, දකුණට යන්නාවූද, උඩට යන්නාවූද, පහළට යන්නාවූද, අනුදිගට යන්නාවූද, ඒ අට අඳුර දක්නහුද?" - "එසේය ස්වාමීනි."

"මහණෙනි, ඒ පවිටු මාරතෙම වක්කලි කුලපුත්‍රයාගේ (ප්‍රතිසන්ධි) විඥානය කොතැනක පිහිටියේදැ"යි වක්කලි කුලපුත්‍රයාගේ (ප්‍රතිසන්ධි විඥානය) සොයන්නේය. මහණෙනි, නොපිහිටි විඥානයෙන් (යුක්තව) වක්කලි කුලපුත්‍රතෙම (ස්කන්ධ පරිනිර්වාණයෙන්) පිරිනිවියේයයි (වදාළසේක.)

**(පස්වැනි වක්කලි සූත්‍රය නිමි.)**

---

## 6. අස්සජි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහිවූ කලන්දක නිවාප නම් තන්හි කරවනලද වේළුවනාරාමයෙහි වසනසේක. එකල්හි වනාහි හටගත් ලෙඩ ඇති දුකට පැමිණි දැඩි ගිලන් බැව් ඇති ආයුෂ්මත් අස්සජි ස්ථවිරතෙම කාශ්‍යප සිටුහු විසින් කරවනලද ආරාමයෙහි වෙසෙයි. ඉක්බිති ආයුෂ්මත් අස්සජි ස්ථවිරතෙමේ උපස්ථායකයන් කැඳවී. 'ඇවැත්නි! එවු, තෙපි භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙකද, එතැනට පැමිණෙවු, පැමිණ මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් හිසින් වඳිවු, 'ස්වාමීනි! අස්සජි භික්ෂුතෙම වැළඳුණු රෝග ඇත්තේය. දුකට පැමිණියේය. දැඩි ගිලන්බැව් ඇත්තේය. හෙතෙම භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් හිසින් වඳී"යයි (කියම්.)

2. 'මෙසේද කියවු, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ අස්සජි භික්ෂුතෙම යම්තැනෙක්හිද එතැනට අනුකම්පාව පිණිස පැමිණෙතොත් මැනවයි' (කියායි). 'එසේය ඇවැත්නි." කියා ඒ භික්ෂු ආයුෂ්මත් අස්සජි තෙරුන්ට උත්තරදී භාග්‍යවතුන්

වහන්සේ යම්තැනෙක්හිද, එතැනට පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස්ව හුන්හ, එකත්පස්ව හුන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට 'ස්වාමීනි, අස්සජි භික්ෂුතෙම වැළඳුණු රොග ඇත්තේය, දුකට පත්වූයේය, දැඩි ගිලන්බැව් ඇත්තේය, හෙතෙම භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් හිසින් වඳී, මෙසේද කියයි. 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ අස්සජි භික්ෂුතෙම යම් තැනෙක්හිද, එතැනට අනුකම්පා පිණිස වැඩියහොත් මැනව" (යනුයි.) භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දභාවයෙන් ඉවසා වදාළසේක.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස්වේලෙහි ඵලසමවතින් නැගීසිටිසේක් ආයුෂ්මත් අස්සජි භික්ෂුතෙම යම් තැනෙකද, එහි වැඩිසේක, ආයුෂ්මත් අස්සජි තෙර වඩින්නාවූ භාග්‍යවතුන් වහන්සේ දුරදීම දුටුයේමය, දැක ඇඳෙන් නැගිටින අයුරෙන් ගෞරව කෙළේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ 'අස්සජිය! කම්නැත. ඔබ ඇඳෙන් නොනැගිටුව, පනවන ලද්දාවූ මේ අසුන් වෙති, එහි මම හිඳගනිමි"යි කියා භාග්‍යවතුන් වහන්සේ පැනවූ අස්නෙහි වැඩහුන්සේක. භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳ ආයුෂ්මත් අස්සජි තෙරුන්ට මෙය වදාළසේක. "අස්සජිය, තොපට ඉවසාගත හැකිද? යැපියහැකිද? කිම! දුක් වේදනා පසුබසිද්ද, දියුණු නොවෙද්ද, මේ දුඃඛ වේදනාවන්ගේ අඩුවීම පෙනේද? දියුණුවීම නොපෙනේද?' 'ස්වාමීනි, මට ඉවසිය නොහැකිය, ඉරියව් පැවැත්විය නොහැකිය, මාගේ මේ දැඩි දුක් වේදනාවෝ වැඩිවෙති, අඩු නොවෙත්. මේ දුක් වේදනාවන්ගේ වැඩිවීම පෙනෙයි, අඩුවීම "නොපෙනෙයි," කිම අස්සජිය, තොපට කිසි පසුතැවීමක් නැත්තේද, කිසි විපිළිසරබවක් නැත්තේද?" "ස්වාමීනි, මට ස්වල්පනොවූ පසුතැවීමක් ස්වල්ප නොවූ විපිළිසර බවක් ඇතැයි" කීය. "කිම? අස්සජිය, තට තෙමේ ශීලයෙන් චොදනා නොකෙරේද," "ස්වාමීනි, මට තෙමේ ශීලයෙන් චොදනා නොකරේයයි" (කීය.) "ඉදින් අස්සජිය," තට තෙමේ ශීලයෙන් චොදනා නොකෙරේ නම් තට කුමන පසුතැවීමක්ද කවර විපිළිසර බවක්දැ?යි" (වදාළහ.)

**4.** "ස්වාමීනි, මම පෙර වනාහි ගිලන්බවද, ආශ්වාස ප්‍රාශ්වාසයන්ද සංසිඳවා කලකිරී වසමි. ඒ මම (චතුර්ථධ්‍යාන) සමාධිය නොලබමි, ස්වාමීනි ඒ සමාධිය නොලබන්නාවූ මට 'මම වනාහි කෙසේ (සාසනයෙන්) නොපිරිහෙම්දැ'යි මෙබඳු (අදහසක්) වෙයි." "අස්සජිය, සමාධියම සාරයයි සිතන්නාවූ සමාධියම ශ්‍රමණභාවයයි සිතන්නාවූ යම් ඒ මහණ බමුණෝ වෙද්ද, ඒ සමාධිය නොලබන්නාවූ ඔවුන්ට 'අපි නොපිරිහෙන්නමෝ වෙමුවා'යි මෙබඳු අදහසෙක් වෙයි.

"අස්සජිය, ඒ කුමකැයි සිතන්නෙහිද? රූපය නිත්‍ය හෝ වේද, අනිත්‍ය හෝ වේද?" "ස්වාමීනි! අනිත්‍යය."

"වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි අනිත්‍ය"ය.

"සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"සංස්කාරයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙද්ද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?" "ස්වාමීනි, අනිත්‍යය."

**5.** එහෙයින් අස්සජිය, අතීතවූ හෝ අනාගතවූ හෝ වර්තමානවූ හෝ තමා පිළිබඳවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි රූපයෙක් වේද, ඒ සියලු 'රූපය මාගේ නොවේ, මම නොවෙමි, මාගේ ආත්මය නොවේයයි' මෙසේ තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය.

"අතීතවූ හෝ අනාගතවූ හෝ වර්තමානවූ හෝ අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි වේදනාවක් වේද, 'ඒ සියලු වේදනාව මාගේ නොවේ, මම නොවෙමි, මාගේ ආත්මය නොවේයයි' මෙසේ තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය.

"අතීතවූ හෝ අනාගතවූ හෝ වර්තමානවූ හෝ අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි සංඥාවක් වේද, 'ඒ සියලු සංඥාව මාගේ නොවේ, මම නොවෙමි, මාගේ ආත්මය නොවේයයි' මෙසේ තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය.

"අතීතවූ හෝ අනාගතවූ හෝ වර්තමානවූ හෝ අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම් හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි සංස්කාරයෝ වෙද්ද, 'ඒ සියලු සංස්කාරයෝ මාගේ නොවෙත්. මම නොවෙමි, මාගේ ආත්මය නොවෙත්යයි' මෙසේ තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය.

"අතීතවූ හෝ අනාගතවූ හෝ වර්තමානවූ හෝ අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි විඥ්ඥාණයෙක් වේද, 'ඒ සියලු විඥ්ඥාණය මාගේ නොවේ. මම නොවෙමි මාගේ ආත්මය නොවේයයි' මෙසේ තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය.

**6.** මෙසේ දක්නාවූ ආර්යශ්‍රාවකතෙම රූපයෙහිද කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයන්හිද කලකිරෙයි. විඥ්ඥාණයෙහිද කලකිරෙයි. කලකිරුණේ නොඇලෙයි. නොඇලීමෙන් (ක්ලෙශයන් කෙරෙන්) මිදේ. මිදුණු කල්හි (කෙලෙසුන් ගෙන්) මිදුණේයයි යන දැනීමවේ. ජාතිය ක්ෂයවිය. මාර්ග බ්‍රහ්මචර්යාව වැස නිමවන ලද්දේය. කළයුතු දැය කොට නිමවන ලද්දේය. මේ අර්හත් ඵලය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගනී.

**7.** "හෙතෙම ඉදින් සැප වේදනාවක් විඳීද, "ඒ සැප වේදනාව අනිත්‍යයයි දැනගනී. තෘෂ්ණාවෙන් බැසනොගන්නා ලද්දීයයි දැනගනී. සතුටු නොවන ලද්දීයයි දැනගනී. ඉදින් දුඃඛ වේදනාව විඳීද, ඒ දුක්ඛ වේදනාව අනිත්‍යයයි දැනගනී. තෘෂ්ණාවෙන් බැස නොගන්නා ලද්දීයයි දැනගනී. සතුටු නොවන ලද්දීයයි

දැනගනී. ඉදින් උපෙක්ෂා වේදනාව විඳීද, ඒ උපෙක්ෂා වේදනාව අනිත්‍යයයි දැනගනී. තෘෂ්ණාවෙන් බැස නොගන්නා ලද්දීයයි දැනගනී. සතුටු නොවන ලද්දීයයි දැනගනී.

8. "හෙතෙම ඉදින් සැප වේදනාව විඳීද, නොඇලුනේ ඒ සැප වේදනාව විඳී. ඉදින් දුඃඛවේදනාව විඳීද, (දුක කෙළවරවී සැප ලැබේවායි) නොඇලුනේ ඒ දුඃඛ වේදනාව විඳී. ඉදින් උපේක්ෂා වේදනාව විඳීද, නොඇලුනේ ඒ උපේක්ෂා වේදනාව විඳී, හෙතෙම කය කෙළවර කොට ඇති වේදනාව විඳින්නේ 'කය කෙළවර කොට ඇති වේදනාව විඳීමයි' දැනගනී. දිවි කෙළවරකොට ඇති වේදනාව විඳින්නේ දිවි කෙළවර කොට ඇති වේදනාව විඳීමයි' දැනගනී. කය බිඳීයාමෙන් පසු ජීවිතය කෙළවරවීමෙන් මෙහිම සතුටු නොවන ලද්දාවූ ඒ සියලු වේදනා සිහිල් බවට පැමිණෙන්නාහුයයි දැනගනී.

9. "අස්සජිය, යම්සේ වනාහි තෙල් නිසාද, වැටිය නිසාද, තෙල් පහන දැල්වෙන්නේද, ඒ තෙලද, වැටියද ක්ෂයවීමෙන් හේතුව නැතිව යාමෙන් පහන නිවෙන්නේද, අස්සජිය, එපරිද්දෙන්ම මහණතෙම කය කෙළවරකොට ඇති වේදනාව විඳින්නේ 'කය කෙළවරකොට ඇති වේදනාව විඳිමියි' දැනගනී. දිවි කෙළවරකොට ඇති වේදනාව විඳින්නේ 'දිවි කෙළවර කොට ඇති වේදනාව විඳීමියි' දැනගනී. කය බිඳීමෙන් මත්තෙහි ජීවිතක්ෂයවීමෙන් මෙහිම නොසතුටුවන ලද්දාවූ සියලු වේදනාවෝ සිහිල් වන්නාහුයයි දැන ගනීයයි" වදාළසේක.

**(හයවෙනි අස්සජි සූත්‍රය නිමි.)**

---

## 7. ඛෙමක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි බොහෝ ස්ථවිර භික්ෂූහු කොසොඹෑ නුවර සමීපයෙහිවූ ඝොසිතාරාමයෙහි වෙසෙති. එකල්හි වනාහි ආයුෂ්මත් ඛෙමක ස්ථවිරතෙම උපන් රොග ඇත්තේ, දුකට පත්වූයේ, දැඩි ගිලන්

බැව් ඇත්තේ, බදරිකාරාමයෙහි වාසය කරයි. ඉක්බිති ස්ථවිර භික්ෂූහු සවස් වේලෙහි විවේකයෙන් නැගී සිටියාහු, ආයුෂ්මත් දාසක භික්ෂුව කැඳවූහ.

2. "ඇවැත් දාසක, එනු මැනව. ඔබ ඛෙමක භික්ෂුව යම් තැනකද, එතැනට පැමිණෙව. පැමිණ, ඛෙමක භික්ෂුවට මෙසේ කියව. 'ඇවත් ඛෙමක, ස්ථවිර භික්ෂූහු ඔබට මෙසේ කීහුः- 'කිම? ඇවැත්නි, ඔබට ඉවසිය හැකිද? කිම? යැපිය හැකිද? කිම? දුක්ඛ වේදනාවෝ අඩුවෙත්ද? වැඩි වෙත්ද? ඒ දුඃඛ වේදනාවන්ගේ අඩුවීම පෙනේද? වැඩිවීම නොපෙනේද? (යනුයි.)

"එසේය, ඇවැත්ති,' කියා ආයුෂ්මත් දාසක භික්ෂුතෙම ස්ථවිර භික්ෂූන්ට උත්තරදී ආයුෂ්මත් ඛෙමක භික්ෂුතෙම යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් ඛෙමක භික්ෂුවට මෙය කීයේය. 'ඇවැත් ඛෙමක, ස්ථවිර භික්ෂූහු ඔබට මෙසේ කීහ. 'ඇවැත්නි, කිම? ඔබට ඉවසාගත හැකිද? කිම? ඉරියවු යැපිය හැකිද? කිම? දුඃඛ වේදනාවෝ අඩුවෙද්ද? වැඩි නොවෙද්ද, මේ දුඃඛ වේදනාවන්ගේ අඩුවීම පෙනේද? වැඩිවීම නොපෙනේදැ?"යි කියායි.

"ඇවැත්නි, මට ඉවසාගත නොහැකිය. ඉරියවු යැපිය නොහේ. මාගේ දැඩි දුඃඛ වේදනාවෝ වැඩි වෙති. අඩු නොවෙති. මේ දුඃඛ වේදනාවන්ගේ වැඩිවීම පෙනෙයි. අඩුවීම නොපෙනේයයි" (කීය.)

3. ඉක්බිති ආයුෂ්මත් දාසක භික්ෂුතෙම ස්ථවිර භික්ෂූහු යම් තැනෙක (වෙසෙද්ද,) එතැනට පැමිණියේය. පැමිණ, ස්ථවිර භික්ෂූන්ට මේ කරුණ දැන්වීයः- "ඇවැත්නි, ඛෙමක භික්ෂුතෙම මෙසේ කියයිः- 'ඇවැත්නි, මට ඉවසාගත නොහේ. (ඉරියවු) යැපිය නොහේ. මාගේ දැඩි දුඃඛ වේදනාවෝ වැඩි වෙති. අඩු නොවෙති. ඒ දුඃඛ වේදනාවන්ගේ වැඩිවීම පෙනේ. අඩුවීම නොපෙනේය (යනුයි.)

"ඇවැත් දාසක, එනු මැනවි. ඔබ ඛෙමක භික්ෂුතෙම යම්තැනක වෙසේද, එතැනට එළඹෙව. එළඹ, ඛෙමක භික්ෂුවට මෙසේ කියවः- ඇවැත්නි, ස්ථවිර භික්ෂූහු තොපට මෙසේ කීහුः-

4. "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ පඤ්ච-උපාදානස්කන්ධයෝ වදාරණ ලද්දාහුය. ඔහු කවරහුද? රූප උපාදානස්කන්ධය, වෙදනා උපාදානස්කන්ධය, සඤ්ඤා උපාදානස්කන්ධය, සංස්කාර උපාදානස්කන්ධය, විඤ්ඤාන උපාදානස්කන්ධය (යන මොහුය.) ආයුෂ්මත් ඛෙමක ස්ථවිරතෙමේ මේ පඤ්ච-උපාදානස්කන්ධයන්හි මමයයි කියා හෝ මගේයයි කියා හෝ කිසිවක් දකීදැ?"යි (කියායි.)

"එසේය. ඇවැත්නි'යි ආයුෂ්මත් දාසක භික්ෂුතෙම ස්ථවිර භික්ෂූන්ට උත්තරදී ආයුෂ්මත් ඛෙමක භික්ෂුව යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් ඛෙමක භික්ෂුවට මෙය කීයඃ- "ඇවැත් ඛෙමක, ස්ථවිර භික්ෂූහු මෙසේ කීහඃ- "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ පඤ්ච-උපාදානස්කන්ධයෝ වදාරණ ලදහ. ඔහු කවරහුද? රූපොපාදානස්කන්ධය, වෙදනොපාදානස්කන්ධය, සංඥොපාදානස්කන්ධය, සංස්කාරොපාදානස්කන්ධය, විඤ්ඤානොපාදානස්කන්ධය (යන පසය.) ආයුෂ්මත් ඛෙමක භික්ෂු තෙමේ මේ පඤ්ච-උපාදානස්කන්ධයන්හි මමයයි කියා හෝ මගේයයි කියා හෝ කිසිවක් දකීද?" (යනුයි.)

"ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ පඤ්චඋපාදානස්කන්ධයෝ දෙසන ලද්දාහුය. ඔහු කවරහුද? රූපොපාදානස්කන්ධය; වෙදනොපාදානස්කන්ධය; සංඥොපාදානස්කන්ධය, සංස්කාරොපාදානස්කන්ධය, විඥානොපාදානස්කන්ධය; (යන පසය) ඇවැත්නි, මම මේ පඤ්චොපාදානස්කන්ධයන්හි වනාහි මමයයි කියා හෝ මගේයයි කියා හෝ කිසිවක් නොමදකිමි'යි (කීය.)

10. ඉක්බිති ආයුෂ්මත් දාසක භික්ෂුතෙම ස්ථවිර භික්ෂූහු යම් තැනෙක්හිද එතැනට එළඹියේය. එළඹ, ස්ථවිර භික්ෂූන්ට මෙය දැන්විය. 'ඇවැත්නි, ඛෙමක භික්ෂුතෙම මෙසේ කීයේයඃ- 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ පඤ්චොපාදානස්කන්ධයෝ වදාරණ ලද්දාහ. ඔහු කවරහුද? රූපොපාදානස්කන්ධය, වෙදනොපාදානස්කන්ධය,

සංඥොපාදානස්කන්ධය, සංස්කාරොපාදානස්කන්ධය, විඥානොපාදානස්කන්ධය (යන පසය.) ඇවැත්නි, මේ පඤ්චොපාදානස්කන්ධයන්හි වනාහි මමයයි කියා හෝ මගේ යයි කියා හෝ කිසිවක් නොදකිමි' (යනුයි.)

11. "ඇවැත් දාසක, එනු මැනවි. ඔබ ඛෙමක භික්ෂුතෙම යම් තැනෙකද, එතැනට පැමිණෙව. පැමිණ, ඛෙමක භික්ෂුවට මෙසේ කියවː-

"ඇවැත් ඛෙමක; ස්ථවිර භික්ෂූහු ඔබට මෙසේ කීහː- "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ පඤ්චොපාදානස්කන්ධයෝ වදාරණ ලද්දාහුය. ඔහු කවරහුද? රූපොපාදානස්කන්ධය, වෙදනොපාදානස්කන්ධය, සංඥොපාදානස්කන්ධය, සංස්කාරොපාදානස්කන්ධය, විඥානොපාදානස්කන්ධය (යන පසය.) ආයුෂ්මත් ඛෙමක භික්ෂුතෙම ඉදින් මේ පඤ්චොපාදානස්කන්ධයන්හි මමයයි කියා හෝ මගේයයි කියා හෝ කිසිවක් නොදක්නේල, එසේවී නම් ආයුෂ්මත් ඛෙමක භික්ෂුතෙම අර්හත්වූ ක්ෂීණාශ්‍රවයෙකැයි" කියාවේ.

"එසේය. ඇවැත්නි, කියා ආයුෂ්මත් දාසක භික්ෂුතෙම ස්ථවිර භික්ෂූන්ට උත්තරදී ආයුෂ්මත් ඛෙමක භික්ෂුතෙම යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් ඛෙමක භික්ෂුවට මේ කාරණය සැළකෙළේය.

"ඇවැත්නි; ඛෙමක ස්ථවිර භික්ෂූහු තොපට මෙසේ කීවාහුය. 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ පඤ්චොපාදානස්කන්ධයෝ වදාරණ ලදහ. ඔහු කවරහුද? රූපොපාදානස්කන්ධය, වෙදනොපාදානස්කන්ධය, සංඥොපාදානස්කන්ධය, සංස්කාරොපාදානස්කන්ධය, විඥානොපාදානස්කන්ධය (යන පසය.) ඉදින් ආයුෂ්මත් ඛෙමක භික්ෂු තෙම මේ පඤ්චොපාදානස්කන්ධයන්හි මමයයි කියා හෝ මගේයයි කියා හෝ කිසිවක් නොදක්නේල. එසේවීනම් ආයුෂ්මත් ඛෙමක භික්ෂුතෙමේ ක්ෂය කරනලද ආශ්‍රවයන් ඇති රහත් කෙනෙක' (යනුයි.)

12. "ඇවැත්නි, භාග්‍යවතුන්වහන්සේ විසින් මේ පඤ්චොපාදානස්කන්ධයෝ වදාරණ ලද්දාහ. ඔහු කවරහුද? රූපොපාදානස්කන්ධය, වේදනොපාදානස්කන්ධය, සඤ්ඤුපාදානස්කන්ධය, සංස්කාරෝපාදානස්කන්ධය, විඤ්ඤාණුපාදානස්කන්ධය, (යන පසය) ඇවැත්නි, මම මේ පඤ්චොපාදානස්කන්ධයන්හි මමයයි කියා හෝ මගේයයි කියා හෝ කිසිවක් මම නොදනිමි. මම රහත්වූ ක්ෂයකළ ආශ්‍රවයන් ඇත්තේද නොමවෙමි. එහෙත් මා විසින් මේ පඤ්චොපාදානස්කන්ධයන්හි මම වෙමියි නොගැනීම අවබෝධ කරනලදී. ('මෙය මම වෙමියි නොදක්නෙමි'යි කීය.)

13. ඉක්බිති ආයුෂ්මත් දාසක භික්ෂුතෙම ස්ථවිර භික්ෂූහු යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ, ස්ථවිර භික්ෂූන්ට මෙය කීයේය. "ඇවැත්නි, ඛෙමක භික්ෂුතෙම මෙසේ කීයේය. "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ පඤ්චොපාදානස්කන්ධයෝ වදාරණලදහ, ඔහු කවරහුද? රූපොපාදානස්කන්ධය, වේදනොපාදානස්කන්ධය, සංඥොපාදානස්කන්ධය, සංස්කාරොපාදානස්කන්ධය, විඤ්ඤානොපාදානස්කන්ධය (යන පසය.) ඇවැත්නි, මේ පඤ්චොපාදානස්කන්ධයන්හි මමයයි කියා හෝ මගේයයි කියා හෝ කිසිවක් මම නොදකිමි. (මම) අර්හත් ක්ෂීණාශ්‍රවයෙක්ද නොවෙමි. එහෙත් මා විසින් මේ පඤ්චොපාදානස්කන්ධයන්හි මම වෙමි නොගැනීම අවබොධ කරන ලදී. "මෙය මම වෙමියි නොමදක්නෙමි"යි (කීය.)

14. "ඇවැත්, දාසක එනු මැනවි. ඔබ ඛෙමක භික්ෂුතෙම යම්තැනකද, එතැනට පැමිණෙව, පැමිණ, ඛෙමක භික්ෂුවට මෙසේ කියව. "ඇවැත් ඛෙමක, ස්ථවිර භික්ෂූහු ඔබට මෙසේ කීහ. ඇවැත් ඛෙමක මේ යමකට මම වෙමියි කියන්නෙහිද? ඒ කුමකට 'මම වෙමි'යි කියන්නෙහිද? රූපය "මම වෙමියි කියන්නෙහිද? රූපය හැර 'මම වෙමි'යි කියන්නෙහිද? වේදනාව මම වෙමියි කියන්නෙහිද? වේදනාව හැර මම වෙමියි කියන්නෙහිද? සංඥාව 'මම වෙමි'යි කියන්නෙහිද? සංඥාව

හැර මම වෙමියි කියන්නෙහිද? සංස්කාරයන් මම වෙමියි කියන්නෙහිද? සංස්කාරයන් හැර 'මම වෙමියි කියන්නෙහිද? විඤ්ඤාණය මම වෙමි"යි කියන්නෙහිද? විඤ්ඤාණය හැර 'මම වෙමි'යි කියන්නෙහිද? ඇවැත් ඛෙමක මේ යමක් මම වෙමි'යි කියන්නෙහිද? ඒ කුමක් මම වෙමි'යි කියන්නෙහිද? (යනුයි.)

**15.** "එසේය, ඇවැත්නි," කියා ආයුෂ්මත් දාසක භික්ෂු තෙම ස්ථවිර භික්ෂූන්ට උත්තරදී ආයුෂ්මත් ඛෙමක භික්ෂු තෙම යම් තැනෙක්හි (වෙසේද) එතැනට පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් ඛෙමක භික්ෂුවට මෙය කීයේය. 'ඇවැත් ඛෙමක, ස්ථවිර භික්ෂූහු ඔබට මෙසේ කීය. 'ඇවැත් ඛෙමක, මේ යමක් මම වෙමියි කියන්නෙහිද? ඒ කුමක් මම වෙමියි කියන්නෙහිද? රූපය මම වෙමියි කියන්නෙහිද? රූපය හැර මම වෙමියි කියන්නෙහිද? වේදනාව මම වෙමියි කියන්නෙහිද? වේදනාව හැර මම වෙමියි කියන්නෙහිද? සංඥාව මම වෙමියි කියන්නෙහිද? සංඥාව හැර මම වෙමියි කියන්නෙහිද? සංස්කාරයෝ මම වෙමියි කියන්නෙහිද? සංස්කාරයන් හැර මම වෙමියි කියන්නෙහිද? විඤ්ඤාණය මම වෙමියි කියන්නෙහිද? විඤ්ඤාණය හැර මම වෙමියි කියන්නෙහිද? ඇවැත් ඛෙමක, මේ යමක් මම වෙමියි කියන්නෙහිද? ඒ කුමක් මම වෙමියි කියන්නෙහිද?" (යනුයි.)

**16.** "ඇවැත් දාසක, කම් නැත, මේ නැවත නැවත යාමෙන් ඊමෙන් කවර ප්‍රයෝජනද?

"ඇවැත්නි, සැරයටිය ගෙණ එව. ස්ථවිර භික්ෂූහු යම් තැනෙක්හිද, එතැනට මමම යන්නෙමියි කීය.

ඉක්බිති ආයුෂ්මත් ඛෙමක භික්ෂූතෙම සැරයටියෙහි එල්බගෙන ස්ථවිර භික්ෂූහු යම්තැනෙක (වෙසෙද්ද) එතැනට පැමිණියේය. පැමිණ, ස්ථවිර භික්ෂූන් සමග සතුටුවිය. සතුටු විය යුතු සිහිකටයුතු කථාව කොට නිමවා එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ ආයුෂ්මත් ඛෙමක භික්ෂුවට ස්ථවිර භික්ෂූහු මෙසේ කීවාහුය. "ඇවැත් ඛෙමක, මේ යමක් මම වෙමියි කියන්නෙහි නම් ඒ කුමක් මම වෙමියි කියන්නෙහිද?

**17.** "රූපය මම වෙමියි කියන්නෙහිද? රූපය හැර අනිකක් මම වෙමියි කියන්නෙහිද? වේදනාව මමවෙමියි කියන්නෙහිද? වේදනාව හැර අනිකක් මම වෙමියි කියන්නෙහිද? සංඥාව මම වෙමියි කියන්නෙහිද? සංඥාව හැර අනිකක් මම වෙමියි කියන්නෙහිද? සංස්කාරයන් මම වෙමියි කියන්නෙහිද? සංස්කාරයන් හැර අනිකක් මම වෙමියි කියන්නෙහිද? විඤ්ඤාණය මම වෙමියි කියන්නෙහිද? විඤ්ඤාණය හැර අනිකක් මම වෙමියි කියන්නෙහිද? ඇවැත් බෙමක, මේ යමක් මම වෙමියි කියන්නෙහිද? මේ කුමක් මම වෙමියි කියන්නෙහිද?" කියායි.

"ඇවැත්නි, මම රූපය මම වෙමියි නොකියමි. රූපය හැර අනිකක් මම වෙමියි නොකියමි. වේදනාව මම වෙමියි නොකියමි. වේදනාව හැර අනිකක් මම වෙමියි නොකියමි. සංඥාව මම වෙමියි නොකියමි. සංඥාව හැර අනිකක් මම වෙමියි නොකියමි. සංස්කාර මම වෙමියි නොකියමි සංස්කාර හැර අනිකක් මම වෙමියි නොකියමි. විඤ්ඤාණය මම වෙමියි නොකියමි. විඤ්ඤාණය හැර අනිකක් මම වෙමියි නොකියමි. මා විසින් පඤ්චොපාදානස්කන්ධයන්හි මම වෙමියි ගැනීම දැනගන්නා ලදී. මේ දෙය මම වෙමියි නොදක්නෙමියි" (කීයේය.)

"ඇවැත්නි, යම්සේ වනාහි උපුල් මලක හෝ රත් පියුම් මලක හෝ හෙළපියුම් මලක හෝ යම් සුවඳක් වන්නේද, යමෙක් වනාහි එය පත්‍රයාගේ සුවඳයයි හෝ වර්ණයාගේ සුවඳයයි හෝ රේණුවල සුවඳයයි හෝ මෙසේ කියන්නේද, (එසේ) කියන්නාවූ හෙතෙම මනාව කියන්නේද?" - "ඇවැත්නි, ඒ මනාව කීමක් නොවේ.

"ඇවැත්නි, මනාකොට ප්‍රකාශ කරන්නෙක් ඒ කෙසේ කියන්නේද?- "ඇවැත්නි, මනාකොට ප්‍රකාශ කරන්නෙක් මලේ සුවඳයයිම කියන්නේය."

**18.** "ඇවැත්නි, එපරිද්දෙන්ම රූපය මම වෙමියි නොකියමි. රූපය හැර අනිකක් මම වෙමියි නොකියමි. වේදනාව මම වෙමියි නොකියමි. වේදනාව හැර අනිකක් මම වෙමියි

නොකියමි. සංඥාව මම වෙමියි නොකියමි. සංඥාව හැර අනිකක් මම වෙමියි නොකියමි. සංස්කාර මම වෙමියි නොකියමි. සංස්කාර හැර අනිකක් මම වෙමියි නොකියමි. විඥ්ඥාණය මම වෙමියි නොකියමි. විඥ්ඥාණය හැර අනිකක් මම වෙමියි නොකියමි. එහෙත් මා විසින් පඤ්චොපාදානස්කන්ධයන්හි මම වෙමියි ගැනීම දැන ගන්නා ලදී. මෙනම් දෙය මම වෙමියි නොදකිමි.

"ඇවැත්නි, හුදෙක් ආර්ය ශ්‍රාවකයාහට ඔරංභාගීය සංයොජන පස ප්‍රහීණවූවාහු වෙති. එසේද වුවත් ඔහුගේ පඤ්චොපාදානස්කන්ධයන්හි සියුම්වූ මම වෙමි යන මානයද මම වෙමි යන ආලයද මම වෙමි යන අනුසයද නොනැසුණේ වෙයි.

**19.** "හෙතෙම පසු කාලයෙහි රූපය මේය, රූපයගේ හේතුව මේය, රූපයගේ නැවැත්ම මේය, වේදනාව මේය, වේදනාවගේ හේතුව මේය, වේදනාවගේ නැවැත්ම මේය, සංඥාව මේය, සංඥාවගේ හේතුව මේය, සංඥාවගේ නැවැත්ම මේය, සංස්කාරයෝ මේය, සංස්කාරයන්ගේ හේතුව මේය, සංස්කාරයන් හෝ නැවැත්ම මේය, විඥ්ඥාණය මේය, විඥ්ඥාණයාගේ හේතුව මේය, විඥ්ඥාණය නැවැත්ම මේයයි පඤ්චොපාදානස්කන්ධයන්හි ඉපදීම හා විනාසය බලමින් වාසය කරයි. මේ පඤ්චොපාදානස්කන්ධයන්හි ඉපදීම හා විනාශය බලමින් වසන්නාවූ ඔහුගේ පඤ්චොපාදානස්කන්ධයන්හි නොනැසුණු යම් සියුම්වූ මම වෙමි යන මානයෙන් වේද, මම වෙමි යන ආලයෙක් වේද, මම වෙමි යන අනුසයෙක් වේද, ඔහුගේ ඒ ක්ලෙශයද සහමුලින් නැතිවීමට යෙයි.

**20.** "ඇවැත්නි, යම්සේ වනාහි කිලිටිවූ කුණු බැඳුණු වස්ත්‍රයක්වේද, ඒ වස්ත්‍රය හිමියෝ දන්නාහුය. රෙදි සෝදන්නාහට ඔහු ඒ වස්ත්‍රය අලු මැටි ගොම යනාදියකින් තෙමා මැඩ පිරිසිදු ජලයෙහි දමා සෝදයි. එයින් ඒ වස්ත්‍රය පිරිසිදු වුවද එසේ ඒ වස්ත්‍රයාගේ නොනැසුණාවූ සියුම්වූ අලු ගඳ හෝ කර මැටි ගඳ හෝ ගොමගඳ හෝ ඇත්තේය. ඒ

වස්ත්‍රය රෙදි සෝදන්නා හිමියන්ට දෙයි. හිමියෝ වස්ත්‍රය සුවඳ කැවූ කරඬුවෙහි දමන්නාහුය. ඒ වස්ත්‍රයාගේ සියුම්වූ යම් අලු ගඳක් හෝ කර මැටි ගඳක් හෝ ගොම ගඳක් හෝ නොනැසුණේද ඒ සියුම්වූ ගඳද එයින් සහමුලින් නැසීමට යෙයි.

"ඇවැත්නි, එපරිද්දෙන්ම ආර්යශ්‍රාවකයාගේ ඔරම්භාගිය සංයොජන පස නැතිවූයේ වී නමුත් පඤ්චොපාදානස්කන්ධයන්හි සියුම්වූ මම වෙමි යන මානයද මම වෙමි යන ආලයද, මම වෙමි යන අනුසයද සහමුලින් නොනැසුනේ වෙයි.

**21.** "හෙතෙම පසු කාලයෙහි "රූපය මේය, රූපයගේ හේතුව මේය, රූපයගේ විනාශය මේය, වේදනාව මේය වේදනාවගේ හේතුව මේය, වේදනාවගේ විනාශය මේය, සංඥාව මේය, සංඥාවගේ හේතුව මේය, සංඥාවගේ විනාශය මේය, සංස්කාරයෝ මේය, සංස්කාරයන්ගේ හේතුව මේය, සංස්කාරයන්ගේ විනාශය මේය, විඤ්ඤාණය මේය, විඤ්ඤාණයාගේ හේතුව මේය, විඤ්ඤාණයාගේ විනාශය මේයයි" පඤ්චොපාදානස්කන්ධයන්හි ඉපදීම හා විනාශය නැවත නැවත බලමින් වාසය කෙරෙයි. මේ පඤ්චොපාදානස්කන්ධයන්හි ඉපදීම හා විනාශය නැවත නැවත බලමින් වාසය කරන්නාවූ ඔහුගේ පඤ්චොපාදානස්කන්ධය නොනසන ලද්දාවූ ඉතා සියුම්වූ මම වෙමි යන යම් මානයෙක් වේද, මම වෙමි යන යම් ඡන්දයෙක් වේද, මම වෙමි යන යම් අනුසයයෙක් වේද, ඒ ක්ලෙශයද නැසීමට යෙයි" (කීයේය.)

**22.** මෙසේ කී කල්හි ස්ථවිර භික්ෂූහු ආයුෂ්මත් ඛෙමක භික්ෂුවට මෙය කීහ. "අපි වනාහි ආයුෂ්මත් ඛෙමකයන් වෙහෙසනු කැමැත්තෙන් නො ඇසුවෙමු. එහෙත් ආයුෂ්මත් ඛෙමකතෙම ඒ භාග්‍යවතුන් වහන්සේගේ අනුශාසනය විස්තර වශයෙන් කියන්නට ප්‍රකාශ කරන්නට දන්වන්නට පෙන්වන්නට විවෘත කරන්නට මනාව බෙදන්නට ප්‍රකට කරන්නට සමර්ථවේ. ආයුෂ්මත් ඛෙමකයන් විසින් ඒ භාග්‍යවතුන් වහන්සේගේ ඒ මේ ශාසනය කියන ලද්දේය, ප්‍රකාශ කරන ලද්දේය, පෙන්වන

ලද්දේය, පිහිටුවන ලද්දේය, විවෘත කරන ලද්දේය. මනාව බෙදන ලද්දේය, ප්‍රකට කරන ලද්දේය.”

මේ සූත්‍රය ආයුෂ්මත් ඛෙමක භික්ෂුතෙම කීයේය. සතුටු සිතැති ස්ථවිර භික්ෂූහු ආයුෂ්මත් ඛෙමක භික්ෂුවගේ වචනයට සතුටුවූහ.

මේ සූත්‍රය කියන කල්හි සැටක් පමණ ස්ථවිර භික්ෂූන්ගේද, ආයුෂ්මත් ඛෙමක භික්ෂුවගේද සිත් උපාදානයන් විසින් අල්වා නොගෙන ආශ්‍රවයන් කෙරෙන් මිදුණහුය.

**(සත්වන ඛෙමක සූත්‍රය නිමි.)**

---

## 8. ඡන්න සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි බොහෝ ස්ථවිර භික්ෂූහු බරණැස් නුවර සමීපයෙහි මිගදාය නම් ඉසිපතනයෙහි වෙසෙති. එකල්හි ආයුෂ්මත් ඡන්න ස්ථවිරතෙම සවස් වේලෙහි විවේකයෙන් නැගීසිටියේ යතුරගෙන විහාරයෙන් විහාරයට යමින් ස්ථවිර භික්ෂූන්ට යම් ප්‍රකාරයකින්, මම ධර්මය දක්නෙම්ද එපරිද්දෙන් මට ආයුෂ්මත් ස්ථවිරවරු අවවාද කෙරෙත්වා, ආයුෂ්මත් ස්ථවිරවරු මට අනුශාසනය කෙරෙත්වා, ආයුෂ්මත් ස්ථවිරවරු මට ධර්ම කථා කෙරෙත්වා’යි කීයේය.

2. මෙසේ කී කල්හි ආයුෂ්මත් ඡන්නයන්ට ස්ථවිර භික්ෂූහු මෙසේ කීහ:-

“ඇවැත් ඡන්නයෙනි, රූපය අනිත්‍යය, වේදනාව අනිත්‍යය, සංඥාව අනිත්‍යය, සංස්කාරයෝ අනිත්‍යයහ, විඥානය අනිත්‍යය, රූපය අනාත්මය, වේදනාව අනාත්මය, සංඥාව අනාත්මය, සංස්කාරයෝ අනාත්මයහ. විඥානය අනාත්මය, සියලු සංස්කාරයෝ අනිත්‍යයහ, සියලු ධර්මයෝ අනාත්මයහ” (යනුයි.)

3. ඉක්බිති ආයුෂ්මත් ඡන්න ස්ථවිරයන්ට මෙබඳු සිතෙක් විය:- ‘මටද මේ කාරණය මෙසේම වේ. රූපය අනිත්‍යය, වේදනාව අනිත්‍යය, සංඥාව අනිත්‍යය, සංස්කාරයෝ අනිත්‍යයහ.

විඤ්ඤාණය අනිත්‍යය, රූපය අනාත්මය, වේදනාව අනාත්මය, සංඥාව අනාත්මය, සංස්කාරයෝ අනාත්මයහ, විඥානය අනාත්මය, සියලු සංස්කාරයෝ අනිත්‍යයහ, සියලු ධර්මයෝ අනාත්මයහ' (යනුයි.)

'එහෙත් සියලු සංස්කාරයන්ගේ සංසිඳීමවූ සියලු උපධීන්ගේ දුරලීමවූ තෘෂ්ණාවගේ ක්ෂය කිරීමවූ නොඇලීමවූ නිරෝධයවූ නිවණෙහි මාගේ සිත බැස නොගනී, නොපහදී. මනාව නොපිහිටයි, නොමිදෙයි. තැතිගැන්ම හා දෘෂ්ටි වශයෙන් ගැනීමද උපදී. එසේ නම් කුමක් මම වෙම්දැයි සිත ආපසු හැරෙයි.

"ධර්මය දක්නාහට එසේ නොවේමය. මම යම් ප්‍රකාරයකින් ධර්මය දක්නෙම්ද? එපරිද්දෙන් කවරෙක් මට ධර්මය දෙසන්නේදැයි' සිතීය.

ඉක්බිති ආයුෂ්මත් ඡන්න ස්ථවිරයනට මෙබඳු අදහසෙක් පහළවීයඃ- 'මේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ කොසඹෑ නුවර සමීපයෙහිවූ ඝෝසිතාරාමයෙහි වෙසෙති. ශාස්තෲන්වහන්සේ විසින්ද මනාව වර්ණනා කරන ලද්දේය. නුවණැති සබ්‍රහ්මචාරීන් විසිනුදු ගරු කරන ලද්දේය. මම යම් පරිද්දකින් ධර්මය දක්නෙම්ද, එපරිද්දෙන් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම මට ධර්මය දෙසන්නට සමර්ථ වේමය. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් කෙරෙහි මාගේ එපමණ විශ්වාසයෙක් ඇත්තේමය. එහෙයින් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණෙම් නම් ඉතා යෙහෙක' (කියායි.)

**4.** ඉක්බිති ආයුෂ්මත් ඡන්න ස්ථවිරතෙම සෙනසුන් තැන්පත් කොට තබා පාත්‍ර සිවුරු ගෙන කොසඹෑ නුවර යම් තැනෙකද, ඝොසිතාරාමය යම් තැනෙක්හිද, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම යම් තැනෙකද, එතැනට ගියේය. ගොස් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් සමග සතුටුවිය. සතුටු වියයුතු සිහිකටයුතු කථාව කොට නිමවා එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ ආයුෂ්මත් ඡන්න ස්ථවිරතෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට මෙසේ කීය.

**5.** "ඇවැත් ආනන්ද ස්ථවිරයෙනි, මම එක් කලෙක්හි බරණැස සමීපයෙහි මිගදාය නම් වූ ඉසිපතනාරාමයෙහි වසමි. ඇවැත්නි, එකල්හි වනාහි මම සවස් කාලයෙහි විවේකයෙන් නැගී සිටියෙමි. යතුර ගෙන වෙහෙරෙන් වෙහෙරට ගොස් ස්ථවිර භික්ෂූන්ට මෙසේ කීයෙමිඃ- 'ආයුෂ්මත් ස්ථවිරවරු මට අවවාද කරත්වා, ආයුෂ්මත් ස්ථවිරවරු මට අනුශාසනා කෙරෙත්වා, යම් අයුරකින් මම ධර්මය දක්නෙම්ද, ඒ අයුරෙන් මට ආයුෂ්මත් ස්ථවිරවරු ධර්ම කතා කෙරෙත්වා' ඇවැත්නි, මෙසේ කීකල්හි මට ස්ථවිරවරු මෙසේ කීහ.

'ඇවැත් ඡන්නයෙනි, රූපය අනිත්‍යය, වේදනාව අනිත්‍යය, සංඥාව අනිත්‍යය, සංස්කාරයෝ අනිත්‍යයහ. විඤ්ඤාණය අනිත්‍යය, රූපය අනාත්මය, වේදනාව අනාත්මය, සංඥාව අනාත්මය, සංස්කාරයෝ අනාත්මයහ, විඤ්ඤාණය අනාත්මය, සියලු සංස්කාරයෝ අනිත්‍යයහ, සියලු ධර්මයෝ අනාත්මයහ, යි' (දෙසූහ.)

**6.** "ඇවැත්නි, ඒ මට මෙබඳු අදහසෙක් වීයඃ- 'මට වූකලි මේ කාරණය මෙසේ වෙයිඃ- රූපය අනිත්‍යය, වේදනාව අනිත්‍යය, සංඥාව අනිත්‍යය, සංස්කාරයෝ අනිත්‍යයහ. විඤ්ඤාණය අනිත්‍යය, රූපය අනාත්මය, වේදනාව අනාත්මය, සංඥාව අනාත්මය, සංස්කාරයෝ අනාත්මය, විඤ්ඤාණය අනාත්මය, සියලු සංස්කාරයෝ අනිත්‍යයහ. සියලු ධර්මයෝ අනාත්මයහ කියායි. එහෙත් සියලු සංස්කාරයන්ගේ සංසිඳීමට නිමිතිවූ සියලු උපධීන් දුරලීමට නිමිතිවූ තෘෂ්ණාවගේ ක්ෂය කිරීමට නිමිතිවූ රාගයාගෙන් පහවීමට නිමිතිවූ තෘෂ්ණාවෙන් නික්මීමට නිමිතිවූ නිර්වාණයෙහි මාගේ සිත වැද නොගනී, නොපහදී, මනාව නොසිටී, නොමිදේ, තැතිගැන්මද දෘෂ්ටි වශයෙන් ගැනීමද උපදී. එසේ නම් කුමක් මම වෙම්දැයි සිත ආපසු හැරෙයි.

'යම්සේ ධර්මය දක්නාහට එසේ නොවෙයි. යම්සේ මම ධර්මය දක්නෙම්ද, කවරෙක් වනාහි මට එසේ ධර්මය දෙසන්නේද' (කියායි.)

"ඇවැත්නි, ඒ මට මෙබඳු අදහසෙක් විය:- 'මේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම වනාහි කොසඹෑ නුවර සමීපයෙහිවූ ඝොසිතාරාමයෙහි වාසය කෙරේ. ශාස්තෘන්වහන්සේ විසින්ද මොනවට වර්ණනා කරන ලද්දේය. නුවණැති සබ්‍රහ්මචාරීන් විසිනුදු ගරු කරන ලද්දේය. මම යම්සේ ධර්මය දකිම්ද, එසේ මට ධර්මය දෙසන්නට සමර්ථද වේ. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් කෙරෙහි මාගේ එපමණ විශ්වාසයෙක්ද ඇත. මම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් යම් තැනෙක්හිද, එතැනට පැමිණෙම් නම් ඉතා මැනව' කියායි.

7. "යම්සේ මම ධර්මය දකිම්ද, එසේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම මට අවවාද කෙරේවා, ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම මට අනුශාසනය කෙරේවා, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම මට ධර්ම කථාව කෙරේවායි" කීය. මෙපමණකින්ම අපි ආයුෂ්මත් ඡන්න ස්ථවිරයනට සතුටු සිතැත්තමෝ වම්හ, ප්‍රීතිසිත් ඇත්තමෝ වම්හ. ආයුෂ්මත් ඡන්න ස්ථවිරතෙම ඒ සන්තෝෂය ප්‍රකට කෙළේය. මානය නමැති හුල බිඳ දැම්මේය.

"ඇවත, ඡන්න ස්ථවිරයෙනි, කණ යොමුකළ මැනවි. ධර්මය අවබෝධ කිරීමට සුදුස්සෙහිය." ඉක්බිති ආයුෂ්මත් ඡන්න ස්ථවිරයන්ට එකෙණෙහිම ධර්මය අවබෝධ කිරීමට සුදුස්සෙක් වේයයි මහත් සතුටක් උපන.

8. "ඇවැත් ඡන්න ස්ථවිරයෙනි, කච්චාන ගෝත්‍රයෙහිවූ භික්ෂුවට (කච්චාන ස්ථවිරයන්ට) අවවාද කරන්නාවූ භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙන් මේ ධර්මය අසන ලදී, භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියේ පිළිගන්නා ලදී. (කෙසේදයත්?) "කච්චානය, බෙහෙවින් මේ ලෝවැසිතෙම ආත්මය ඇති බවද, ආත්මය සිඳෙන බවද (යන) දෙක ඇසුරු කෙළේය. කච්චානය, ලෝක හේතුව තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් බලන්නාහට ලෝකයෙහි ආත්මය සිඳේය යන යම් දෘෂ්ටියක් වේනම් එය නොවෙයි. කච්චානය, ලෝක නිරෝධය වනාහි තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දක්නාහට ආත්මයක් ඇත යන යම් දෘෂ්ටියක් වේද, එය නොවෙයි.

**9.** "කච්චානය, මේ ලෝවැසිතෙම බොහෝ සෙයින් තෘෂ්ණා උපාය, දෘෂ්ටි උපාය යන උපාය දෙදෙනාගේ හා කාමූපාදානාදී සතර උපාදානයන්ගේ ගැනීමවූ බන්ධනයෙන් බැඳුනේය. හෙතෙමේ බොහෝ සෙයින් මගේ ආත්මයයි ඒ උපාය උපාදානයන් සිතේ පිහිටීම ගැනීම අනුසය කොට ඇති බවට නොපැමිණෙයි. උපදින්නේද දුකමය, නිරුද්ධ වන්නේද දුකමය යන කාරණයෙහි සැක නොකරයි. අවිශ්වාසය නොකරයි. ඔහුට මෙහිදී අන් අයුරකින් නොලැබිය හැකි ඥානයම වෙයි. කච්චානය, මෙපමණකින් සම්‍යක් දෘෂ්ටිය වේ.

"කච්චානය, ආත්මයක් ඇත යන මෙය එක් කෙළවරෙක, ආත්මය සිඳේය යන මෙය දෙවන කෙළවර වෙයි. කච්චානය, ඒ මේ අන්ත දෙකට නොපැමිණ තථාගතයන් වහන්සේ ඒ දෙකට මැදින් දහම් දෙසනසේක.

**10.** "අවිද්‍යාව හෙතුකොටගෙන සංස්කාරයෝ වෙති. සංස්කාරයන් හේතුකොටගෙන විඥ්ඥාණයවේ. විඥ්ඥාණය හේතු කොටගෙන නාමරූපය වෙයි. නාමරූපය හේතුකොටගෙන ෂඩායතනය වෙයි. ෂඩායතනය හේතුකොටගෙන ස්පර්ශය වෙයි. ස්පර්ශය හේතුකොටගෙන වේදනාව වෙයි. වේදනාව හේතුකොටගෙන තෘෂ්ණාව වෙයි. තෘෂ්ණාව හේතුකොට ගෙන උපාදානය වේ. උපාදානය හේතුකොටගෙන කර්මභවය වෙයි. කර්මභවය හේතුකොටගෙන ජාතිය වෙයි. ජාතිය හේතුකොටගෙන ජරා මරණයද, ශොකය, වැලපීමය, කායික දුකය, චෛතසික දුකය යන මොහුද වෙත්. මෙසේ සැපයෙන් අමිශ්‍රවූ දුඃඛ රාසියගේ උත්පත්තිය වේ.

"අවිද්‍යාවගේම නිරවශෙෂයෙන් නිරුද්ධකිරීම හේතුකොට ගෙන සංස්කාරයන්ගේ නිරොධය වේ. සංස්කාරයන්ගේ නිරොධයෙන් විඥ්ඥාණයාගේ නිරොධය වේ. විඥ්ඥාණයාගේ නිරොධයෙන් නාමරූපයන්ගේ නිරොධය වේ. නාමරූපයන්ගේ නිරොධයෙන් ෂඩායතනයන්ගේ නිරොධය වේ. ෂඩායතනයන්ගේ නිරොධයෙන් ස්පර්ශයාගේ නිරොධය වේ. ස්පර්ශයාගේ නිරොධයෙන් වේදනාවගේ නිරොධය වේ.

වේදනාවන්ගේ නිරොධයෙන් තෘෂ්ණාවගේ නිරොධය වේ. තෘෂ්ණාවගේ නිරොධයෙන් උපාදානයන්ගේ නිරොධය වේ. උපාදානයන්ගේ නිරොධයෙන් භවයාගේ නිරොධය වේ. භවයාගේ නිරොධයෙන් ජාතියගේ නිරොධය වේ. ජාති නිරොධයෙන් ජරා මරණයද, ශොකය, වැලපීමය, දුකය, දොම්නසය යන මොහුද නිරුද්ධ වෙති. මෙසේ සියලු වෘත්ත දුඃඛ රාසියගේ නිරොධය වන්නේය." (යනු දේශනාවයි.)

"ඇවත් ආනන්ද ස්ථවිරයෙනි, අනුකම්පා කරන්නාවූ, වැඩ කැමතිවූ, අවවාද කරන්නාවූ, අනුශාසනය කරන්නාවූ, මෙබඳු සබ්‍රහ්මචාරීහු යම් ආයුෂ්මත් කෙනෙකුන්ට වෙත්ද, ඒ ආයුෂ්මත්වරුන්ට මෙසේ වන්නේය. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ගේ මේ ධර්මදේශනාව අසා මා විසින් ධර්මය අවබොධ කරන ලද්දේය."

**(අටවැනි ඡන්න සූත්‍රය නිමි.)**

---

## 9. රාහුල සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි වනාහි ආයුෂ්මත් රාහුල භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ ආයුෂ්මත් රාහුල භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේය.

2. "ස්වාමීනි, කෙසේ දන්නාහට, කෙසේ දක්නාහට, විඥ්ඥාණය සහිතවූ මේ කයෙහිද, පිටත්හි සියලු ආරම්මණයන්හිද, අනුසය වශයෙන් පවත්නාවූ, තෘෂ්ණා, දෘෂ්ටි, මානයෝ නොවෙත්ද?

3. "රාහුලය, අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද,

උතුම්වූද, දුරවූද, ළඟවූද, යම්කිසි රූපයක්වේද, ඒ සියලු රූපය 'මෙය මාගේ නොවෙයි. එය මම නොවෙමි. එය මගේ ආත්මය නොවේයයි' තත්වූ පරිද්දෙන්, මනා නුවණින් දකියිද,

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද, ළඟවූද, යම්කිසි වේදනාවක් වේද, ඒ සියලු වේදනාව 'මෙය මාගේ නොවෙයි. එය මම නොවෙමි. එය මගේ ආත්මය නොවේයි' මෙසේ තත්වූ පරිද්දෙන්, මනා නුවණින් දකියිද,

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද, ළඟවූද, යම්කිසි සංඥාවක් වේද, ඒ සියලු සංඥාව 'මෙය මගේ නොවෙයි. එය මම නොවෙමි. එය මගේ ආත්මය නොවේයයි' මෙසේ තත්වූ පරිද්දෙන්, මනා නුවණින් දකියිද,

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද, ළඟවූද, යම්කිසි සංස්කාරයක් වේද, ඒ සියලු සංස්කාරයෝ 'මෙය මාගේ නොවෙයි. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේයයි' මෙසේ තත්වූ පරිද්දෙන්, මනා නුවණින් දකියිද,

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද, ළඟවූද, යම්කිසි විඤ්ඤාණයක් වෙයිද, ඒ සියලු විඤ්ඤාණය 'මෙය මාගේ නොවෙයි. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේයයි' තත්වූ පරිද්දෙන්, මනා නුවණින් දකියිද,

4. "රාහුලය, මෙසේම දන්නාහට, මෙසේ දක්නාහට, විඤ්ඤාණය සහිත මේ කයෙහිද, බාහිරවූ සියලු ආරම්මණයන්හිද අහංකාර මමංකාර මානානුසයෝ නොවෙත්යයි" (වදාළසේක.)

**(නවවෙනි රාහුල සූත්‍රය නිමි.)**

## 10 රාහුල සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඩු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි වනාහි ආයුෂ්මත් රාහුල භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පැත්තක හුන්නේය. එක්පැත්තෙක හුන්නාවූ ආයුෂ්මත් රාහුල භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙය කීයඃ

2. "ස්වාමීනි, කෙසේ දන්නහුට, කෙසේ දක්නහුට විඤ්ඤාණය සහිත මේ කයෙහිද, පිටත සියලු ආරම්මණයන්හිද, පහවූ අහංකාර මමංකාර මානානුසය ඇති මානය ඉක්මවූ සංසිඳුනාවූ, මනාකොට මිදුණාවූ සිත වෙයිද?"

3. "රාහුලය, අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද, ලඟවූද, යම්කිසි රූපයක් වේද, ඒ සියලු රූපය 'මෙය මාගේ නොවෙයි. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේයයි' මෙය මෙසේ තත්වූ පරිද්දෙන් මනා නුවණින් දැක (උපාදාන වශයෙන්) දැඩිව අල්වානොගෙන (කෙලෙසුන් කෙරෙන්) මනාව මිදුනේවේද,

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද, ලඟවූද යම්කිසි වේදනාවක් වේද, ඒ සියලු වේදනාව 'මෙය මගේ නොවෙයි. එය මම නොවෙමි. එය මගේ ආත්මය නොවේයයි මෙය මෙසේ තත්වූ පරිද්දෙන් මනා නුවණින් දැක දැඩිව අල්වානොගෙන (කෙලෙසුන්ගෙන්) මනාව මිදුනේවේද,

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද, ලඟවූද යම්කිසි සංඥාවක් වේද, ඒ සියලු සංඥාව 'මෙය මගේ නොවෙයි. එය මම නොවෙමි. එය මගේ ආත්මය නොවේයයි'

මෙය මෙසේ තත්වූ පරිද්දෙන් මනා නුවණින් දැක දැඩිව අල්වා නොගෙන (කෙලෙසුන්ගෙන්) මනාව මිදුනේවේද,

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද, ලඟවූද, යම්කිසි සංස්කාරයක් වේද, ඒ සියලු සංස්කාරයෝ 'මෙය මගේ නොවෙයි. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේයයි' මෙය මෙසේ තත්වූ පරිද්දෙන් මනා නුවණින් දැක දැඩිව අල්වා නොගෙන (කෙලෙසුන්ගෙන්) මනාව මිදුණේවේද,

"අතීතවූද අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද ගොරෝසුවූද, සියුම්වූද, හීනවූද, උතුම්වූද, දුරවූද, ලඟවූද යම්කිසි විඤ්ඤාණයක් වේද, ඒ සියලු විඤ්ඤාණය 'මෙය මගේ නොවෙයි. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේයයි' මෙය මෙසේ තත්වූ පරිද්දෙන් මනා නුවණින් දැක (තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) දැඩිව අල්වා නොගෙන කෙලෙසුන්ගෙන්) මනාව මිදුණේවේද,

4. "රාහුලය, මෙසේම දන්නාහට, දක්නාහට මේ විඤ්ඤාණය සහිත ශරීරයෙහිද, බාහිර සියලු ආරම්මණයන්හිද, පහවූ අහංකාර මමංකාර මානානුසයන් ඇති, මානය දුරුවූ, සංසිඳුනාවූ, මනාකොට මිදුණාවූ, සිත ඇතිවන්නේයයි (වදාළ සේක.)

**(දසවෙනි රාහුල සූත්‍රය නිමි.)**

---

**(ආනන්ද සූත්‍රය, තිස්ස සූත්‍රය, යමක සූත්‍රය, අනුරාධ සූත්‍රය, වක්කලි සූත්‍රය, අස්සජි සූත්‍රය, ඛෙමක සූත්‍රය, ඡන්න සූත්‍රය සහ අන්‍යවූ රාහුල සූත්‍ර දෙකදැයි මේ වර්ගයෙහි සූත්‍ර දසයෙකි.)**

**සතරවෙනි ථෙරවර්ගය නිමි.**

---

# 10. පුප්ඵ වර්ගය.

## 1. නදී සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, යම්සේ වනාහි පර්වතයෙක ගලාබස්නාවූ ගෙනයන්නාවූ, දුර යන්නාවූ, වහා බස්නා සැඩපහර ඇති ගංගාවක් වේද, ඒ ගඟේ දෙතෙර හටගත්තාවූ වැලුක්තණද වෙත්. ඒ වැලුක් ඒ ගඟට (නැමී) වැඩියක් මත්තෙහි එල්බෙත්. හටගත්තාවූ කුසතණද වෙත්. ඒ කුසතණද ඒ ගඟට එල්බී පවතිත්. හටගත්තාවූ බබුස්තණද වෙත්. ඒ බබුස්තණද ඒ ගඟට එල්බෙති. (එහි) හටගත් බෙරුතණද වෙත්. ඒ බෙරුතණද ඒ ගඟට (නැමී) එල්බෙන්නාහුය. හටගත් ගස්ද වෙත්. ඒ ගස්ද ඒ ගඟට (නැමී) එල්බෙන්නාහුය.

3. "ඒ ගඟේ සැඩපහරින් පුරුෂයෙක් ගෙනයනු ලබන්නේ වැලුක්තණද අල්ලා ගන්නේය. ඒ වැලුක්තණද සහමුලින් මැටි සමග හිසෙහි වැටෙන්නාහුය. හෙතෙම ඒ හෙතුකොට ගෙන මහා විනාශයට පැමිණෙන්නේය. කුසතණද අල්වා ගන්නේය. ඒ කුසතණයෝද සහමුලින් මැටි සමග ඉගිල වැටෙන්නාහුය. හෙතෙම ඒ හෙතුකොටගෙන මහාවිනාශයට පැමිණෙන්නේය. බබුස්තණද අල්වාගන්නේය. ඒ බබුස්තණ පඳුරුද ඉදිරී වැටෙන්නාහුය. හෙතෙම ඒ හෙතුකොටගෙන මහාවිනාශයට පැමිණෙන්නේය. බෙරුතණද අල්ලා ගන්නේය. ඒ බෙරුතණ පඳුරු ද ඉදිරී වැටෙන්නාහුය. හෙතෙම ඒ හෙතුකොට ගෙන මහාවිනාශයට පැමිණෙන්නේය. ගස්ද අල්වාගන්නේය. ඒ ගස්ද සහමුලින් මැටි සමග ඉගිලී වැටෙන්නාහුය. හෙතෙම ඒ හෙතුකොටගෙන මහාවිනාශයට පැමිණෙන්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4\. "මහණෙනි; එපරිද්දෙන්ම ආර්යයන් නොදක්නාවූ ආර්යධර්මයෙහි දක්ෂ නොවූ ආර්යධර්මයෙහි නොහික්මුණාවූ සත්පුරුෂයන් නොදක්නාවූ සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂවූ සත්පුරුෂයන්ගේ ධර්මයෙහි නොහික්මුණාවූ ඇසූ පිරූ තැන් නැත්තාවූ පෘථග්ජනතෙම රූපය ආත්මය වශයෙන් හෝ දක්නේය. තමා රූපය ඇත්තෙකුකොට හෝ දක්නේය. තමා කෙරෙහි හෝ රූපය දක්නේය. රූපයෙහි හෝ තමා දක්නේය. ඔහුගේ ඒ රූපය වැනසෙයි. හෙතෙම ඒ හෙතුකොට ගෙන මහාවිනාශයට පැමිණෙන්නේය.

"වේදනාව ආත්ම වශයෙන් හෝ දක්නේය. තමා වේදනාව ඇත්තෙකුකොට හෝ දක්නේය. තමා කෙරෙහි හෝ වේදනාව දක්නේය. වේදනාවෙහි හෝ තමා දක්නේය. ඔහුගේ ඒ වේදනාව වැනසෙයි. හෙතෙම ඒ හේතුකොට ගෙන මහා විනාශයට පැමිණෙන්නේය.

"සංඥාව ආත්මය වශයෙන් හෝ දක්නේය. තමා සංඥාව ඇත්තෙකුකොට හෝ දක්නේය. තමා කෙරෙහි හෝ සංඥාව දක්නේය. සංඥාවෙහි හෝ තමා දක්නේය. ඔහුගේ ඒ සංඥා තොමෝ වැනසෙයි. හෙතෙම ඒ හෙතුකොට ගෙන මහා විනාශයට පැමිණෙන්නේය.

සංස්කාරයන් ආත්මය වශයෙන් හෝ දක්නේය. තමා සංස්කාරයන් ඇත්තෙකු කොට හෝ දක්නේය. තමා කෙරෙහි හෝ සංස්කාරයන් දක්නේය. සංස්කාරයන්හි හෝ තමා දක්නේය. ඔහුගේ ඒ සංස්කාරයෝ වැනසෙත්. හෙතෙම ඒ හේතුකොටගෙන මහා විනාශයට පැමිණෙන්නේය.

"විඤ්ඤාණය ආත්මය වශයෙන් හෝ දක්නේය. තමා විඤ්ඤාණය ඇත්තෙකුකොට හෝ දක්නේය. තමා කෙරෙහි හෝ විඤ්ඤාණය දක්නේය. විඤ්ඤාණයෙහි හෝ තමා දක්නේය. ඔහුගේ ඒ විඥානය වැනසෙන්නේය. හෙතෙම ඒ හෙතුකොටගෙන මහා විනාශයට පැමිණෙන්නේය.

5\. "මහණෙනි, ඒ කුමැයි සිතන්නෙහිද?

"රූපය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යවේද එය දුක් හෝ සැප හෝ වේද?" - "ස්වාමීනි, දුකෙකි."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවයෙන් යුක්තද? 'මේ රූපය මාගේය. මේ මම වෙමි. මේ මගේ ආත්මයයි' ඒ රූපය දක්නට සුදුසුද?- "ස්වාමීනි, මෙය සුදුසු නොවේමය."

"වේදනාව නිත්‍යද? අනිත්‍යද?" - 'ස්වාමීනි අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය වේද, එය දුක් හෝ සැප හෝ වේද?" - "ස්වාමීනි, දුකෙකි."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවයෙන් යුක්තද? 'මේ වේදනාව මගේය. මේ මම වෙමි. මේ මගේ ආත්මයයි' ඒ වේදනාව දක්නට සුදුසුද?" - "ස්වාමීනි, මෙය සුදුසු නොවේමය."

"සංඥාව නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය වේද, එය දුක් හෝ සැප හෝ වේද?" - "ස්වාමීනි, දුකෙකි."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවයෙන් යුක්තද? 'මේ සංඥාව මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි' ඒ සංඥාව දක්නට සුදුසුද?" - "ස්වාමීනි, මෙය සුදුසු නොවේමය."

"සංස්කාරය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය වේද, එය දුක් හෝ සැප හෝ වේද?" - "ස්වාමීනි, දුකෙකි."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවයෙන් යුක්තද? 'මේ සංස්කාරය මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි' ඒ සංස්කාරය දක්නට සුදුසුද?" - "ස්වාමීනි, මෙය සුදුසු නොවේමය."

"විඤ්ඤාණය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"යමක් වනාහි අනිත්‍ය වේද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුකෙකි."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවයෙන් යුක්තද? 'මේ විඤ්ඤාණය මගේය. මේ මම වෙමි. මේ මගේ ආත්මයයි' දක්නට සුදුසුද?" - "ස්වාමීනි, මෙය සුදුසු නොවේමය."

**6.** "එහෙයින් මහණෙනි, තමා පිළිබඳවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ අතීතවූද, වර්තමානවූද, යම්කිසි රූපයෙක් වේද, දුරෙහි හෝ සමීපයෙහි හෝ යම් රූපයෙක් වේද, 'මේ රූපය මාගේ නොවේ. මේ මම නොවෙමි. මේ මාගේ ආත්මය නොවේ' යයි මෙසේ මේ රූපය තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුයි.

"අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද යම්කිසි වේදනාවක් වේද, දුරෙහි හෝ සමීපයෙහි හෝ යම් වේදනාවක් වේද, 'මේ වේදනාව මාගේ නොවේ, මේ මම නොවෙමි, මේ මාගේ ආත්මය නොවේ'යයි මෙසේ මේ වේදනාව තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය.

"තමා පිළිබඳවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ අතීතවූ ද, අනාගතවූද, වර්තමානවූද, යම්කිසි සංඥාවක් වේද, දුරෙහි හෝ සමීපයෙහි හෝ යම් සංඥාවක් වේද, 'මේ සංඥාව මාගේ නොවේ, මේ මම නොවෙමි, මේ මාගේ ආත්මය නොවේයයි මෙසේ මේ සංඥාව තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාව දතයුතුය.

"තමා පිළිබඳවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද යම්කිසි සංස්කාරයෝ වෙද්ද, දුරෙහි හෝ සමීපයෙහි හෝ යම් සංස්කාරයෝ වෙත්ද 'මේ සංස්කාරය මාගේ නොවේ. මේ මම නොවෙමි. මේ මාගේ ආත්මය නොවේ'යයි මෙසේ මේ සංස්කාරය තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දතයුතුය.

"තමා පිළිබඳවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද යම්කිසි විඥානයක් වේද, දුරෙහි හෝ සමීපයෙහි හෝ යම් විඥානයක් වේද, 'මේ විඥානය මාගේ නොවේ මේ මම නොවෙමි. මේ මාගේ ආත්මය නොවේ'යයි මෙසේ මේ විඥානය තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය."

11. "මහණෙනි, මෙසේ දක්නාවූ, ඇසූ පිරූ තැන් ඇත්තාවූ, ආර්යශ්‍රාවක තෙමේ රූපයෙහිද කලකිරේ. වේදනාවෙහිද කලකිරේ. සංඥාවෙහිද කලකිරේ. සංස්කාරයන්හිද කලකිරේ. විඥානයෙහිද කලකිරේ. කලකිරුණේ නොඇලේ. නොඇලීමෙන් (කෙලෙසුන්ගෙන්) මිදේ. මිදුණු කල්හි මිදුණේයයි දැනීම වේ. ජාති තොමෝ ක්ෂයවූවාය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවන ලද්දේය. සතර මාර්ගයෙන් කටයුතු කොට නිමවන ලද්දේය. මේ රහත් බව පිණිස කළයුතු අනිකක් නැතැයි විශෙෂයෙන් දැනගනී."

**(පළමුවෙනි නදී සූත්‍රය නිමි.)**

---

## 2. පුප්ඵ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, මම ලොකයා සමග විවාද නොකරමි. මහණෙනි, ලෝවැස්සාද මා සමග විරුද්ධවාද කෙරෙයි. මහණෙනි, දහම් කියන්නෙක් තෙම ලොකයෙහි කිසිවකු සමග විවාද නොකෙරෙයි. මහණෙනි, ලොකයෙහි පණ්ඩිතයන් විසින් 'යමක් නැතැ'යි මනාව දන්නා ලද්දේද, මමත් 'එය නැතැ'යි

කියමි. මහණෙනි, ලොකයෙහි පණ්ඩිතයන් විසින් 'යමක් ඇතැ'යි මනාව දන්නා ලද්දේද, මමත් 'එය ඇතැ'යි කියමි.

3. "මහණෙනි, ලෝකයෙහි පණ්ඩිතයන් විසින් කුමක් නැතැ'යි මනාව දන්නා ලද්දේද? මම යමක් නැතැයි කියම්ද, මහණෙනි, නිත්‍යවූ ස්ථිරවූ සදාකාලිකවූ නොපෙරළෙන ස්වභාව ඇත්තාවූ රූපයෙක් ලොකයෙහි පණ්ඩිතයන් විසින් 'නැතැ'යි මනාව දන්නා ලද්දේය. මමද එය 'නැතැ'යි කියමි.

"නිත්‍යවූ ස්ථිරවූ සියලු කල්හි පවත්නාවූ නොපෙරළෙන ස්වභාව ඇත්තාවූ වේදනාවක් ලොකයෙහි පණ්ඩිතයන් විසින් 'නැතැ'යි මනාව දන්නා ලදහ. මමද එය 'නැතැ'යි කියමි.

"නිත්‍යවූ, ස්ථිරවූ, හැමකල්හි පවත්නාවූ, නොපෙරළෙන ස්වභාව ඇත්තාවූ, සංඥාවක් ලොකයෙහි පණ්ඩිතයන් විසින් 'නැතැයි මනාව දන්නා ලද්දේය. මමද එය 'නැතැ'යි කියමි.

"නිත්‍යවූ, ස්ථිරවූ, හැම කල්හි පවත්නාවූ, නොපෙරළෙන ස්වභාවය ඇත්තාවූ, සංස්කාරයෝ ලෝකයෙහි පණ්ඩිතයන් විසින් 'නැතැ'යි මනාව දන්නාලද්දාහ. මම ද එය 'නැතැ'යි කියමි.

"නිත්‍යවූ, ස්ථිරවූ, සියලුකල්හි පවත්නාවූ, නොපෙරළෙන ස්වභාව ඇත්තාවූ, විඤ්ඤාණයෙක් ලෝකයෙහි පණ්ඩිතයන් විසින් 'නැතැ'යි මනාව දන්නා ලද්දේය. මමද එය 'නැතැ'යි කියමි.

මහණෙනි, 'මම යමක් නැතැ'යි කියම්ද, මේ වනාහි ලෝකයෙහි පණ්ඩිතයන් විසින් 'නැතැ'යි සම්මත කරන ලද්දේය.

4. "මහණෙනි, මම යමක් ඇතැයි කියම්ද, ලොකයෙහි පණ්ඩිතයන් විසින් (ඒ) කුමක් 'ඇතැ'යි සම්මත කරන ලද්දේද? මහණෙනි, අනිත්‍යවූ, දුක්වූ, පෙරළෙන ස්වභාව ඇත්තාවූ රූපය ලොකයෙහි පණ්ඩිතයන් විසින් ඇතැයි සම්මත කරන ලද්දේය. මමද එය 'ඇතැ'යි කියමි.

"ලොකයෙහි පණ්ඩිතයන් විසින් අනිත්‍යවූ, දුක්වූ, පෙරළෙන ස්වභාවය ඇත්තාවූ, වේදනා තොමෝ 'ඇතැයි සම්මත කරන ලද්දේය. මමද එය 'ඇතැ'යි කියමි.

"ලොකයෙහි පණ්ඩිතයන් විසින් අනිත්‍යවූ, දුක්වූ පෙරළෙන ස්වභාව ඇත්තාවූ සංඥාතොමෝ 'ඇතැ'යි සම්මත කරන ලද්දේය. මමද එය 'ඇතැ'යි කියමි.

"ලොකයෙහි පණ්ඩිතයන් විසින් අනිත්‍යවූ, දුක්වූ පෙරළෙන ස්වභාවය ඇත්තාවූ සංස්කාරයෝ 'ඇතැ'යි සම්මත කරන ලද්දාහුය. මමද එය 'ඇතැ'යි කියමි.

"ලොකයෙහි පණ්ඩිතයන් විසින් අනිත්‍යවූ, දුක්වූ, පෙරළෙන ස්වභාවය ඇත්තාවූ විඤ්ඤාණය 'ඇතැ'යි සම්මත කරන ලද්දේය. මමද එය 'ඇතැ'යි කියමි.

**5.** "මහණෙනි, තථාගතයන් වහන්සේ යම් ලෝ දහමක් මනාව අවබොධ කෙරෙද්ද, මනාව දැනගනිද්ද, මනාව අවබොධකොට මනාව දැන කියද්ද, ප්‍රකාශ කෙරෙද්ද, දන්වද්ද, පිහිටුවද්ද, විවෘත කෙරෙද්ද, මනාව බෙදද්ද, ප්‍රකට කෙරෙද්ද, ලෝකයෙහි (ඒ) ස්කන්ධ පඤ්චකයයි කියන ලද ලෝකධර්මයක් ඇත.

"මහණෙනි, තථාගතයන් වහන්සේ යම් ලෝ දහමක් මනාව අවබෝධ කෙරෙද්ද, මනාව දැනගනිද්ද, මනාව අවබොධකොට මනාව දැන කියද්ද, දෙසද්ද, දන්වද්ද, පිහිටුවද්ද, විවරණය කෙරෙද්ද, ප්‍රකට කෙරෙද්ද, ලෝකයෙහි (ඒ) ලොකධර්මය කවරේද?

"මහණෙනි, රූපය ලොකයෙහි ලොකධර්මයෙකි, තථාගතයන් වහන්සේ ඒ ලෝදහම මනාව අවබෝධ කෙරෙති. මනාව දැනගනිති. මනාව අවබෝධකොට මනාව දැන කියත්, ප්‍රකාශ කෙරෙත්, දන්වත්, පිහිටුවත්, විවරණය කෙරෙත්, ප්‍රකට කෙරෙත්.

**6.** "මහණෙනි, යමෙක් තථාගතයන් වහන්සේ විසින් මෙසේ කියනු ලබන කල්හි, දෙසනු ලබන කල්හි, දන්වනු ලබන කල්හි, පිහිටුවනු ලබන කල්හි, විවෘත කරනු ලබන කල්හි, ප්‍රකට කරනු ලබන කල්හි නොදනීද, නොදකීද, මහණෙනි, මම බාලවූ, නුවණ ඇස් නැත්තාවූද, නොදන්නාවූ, නොදක්නාවූ, ඒ අන්ධ පෘථග්ජනයා (ගැන) කෙසේ නම් කෙරෙම්ද?

"මහණෙනි, වේදනා තොමෝ ලොකයෙහි ලොකධර්මයෙක, තථාගතයන් වහන්සේ ඒ ලෝදහම මනාව අවබෝධ කෙරෙත්. මනාව දැනගනිත්. මනාව අවබෝධකොට මනාව දැන කියත්, දෙසත්, දන්වත්, පිහිටුවත්, විවෘත කෙරෙත්, ප්‍රකට කෙරෙත්. මහණෙනි, යමෙක් තථාගතයන් වහන්සේ විසින් මෙසේ කියනු ලබන කල්හි, දෙසනු ලබන කල්හි, දන්වනු ලබන කල්හි, පිහිටුවනු ලබන කල්හි, විවෘත කරනු ලබන කල්හි, ප්‍රකට කරනු ලබන කල්හි, නොදනීද, නොදකීද, මහණෙනි, මම අඥානවූ, නුවණැස් නැත්තාවූ, නොදන්නාවූ, නොදක්නාවූ, බොහෝ කෙලෙස් රැස්කරන්නාවූ ඒ අන්ධයා (ගැන) කෙසේ කෙරෙම්ද?

"මහණෙනි, සංඥාතොමෝ ලෝකයෙහි ලෝ දහමෙක, භාග්‍යවතුන් වහන්සේ ඒ ලෝ දහම අවබෝධ කෙරෙති. මනාව දැනගනිති. අවබෝධකොට මනාව දැන කියත්, ප්‍රකාශ කෙරෙත්, දන්වත්, පිහිටුවත්, විවෘත කෙරෙත්, ප්‍රකට කෙරෙත්. මහණෙනි, යමෙක් තථාගතයන් විසින් මෙසේ කියනු ලබන කල්හි, දෙසනු ලබන කල්හි, දන්වනු ලබන කල්හි, පිහිටුවනු ලබන කල්හි, විවෘත කරනු ලබන කල්හි, ප්‍රකට කරනු ලබන කල්හි නොදනීද, නොදකීද, මහණෙනි, මම නුවණැස් නැත්තාවූ, නොදන්නාවූ, නොදක්නාවූ, බොහෝ කෙලෙස් රැස්කරන්නාවූ ඒ අන්ධයා (ගැන) කෙසේ කෙරෙම්ද?

"මහණෙනි, සංස්කාරයෝ ලෝකයෙහි ලෝ දහමෙක, භාග්‍යවතුන් වහන්සේ ඒ ලෝදහම අවබෝධ කෙරෙති, මනාව දැනගනිති, අවබෝධකොට මනාව දැනගෙන කියත්, ප්‍රකාශ කෙරෙත්, දන්වත්, පිහිටුවත්, විවෘත කෙරෙත්, ප්‍රකට කෙරෙත්, මහණෙනි, යමෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ කියනු ලබන කල්හි, ප්‍රකාශ කරනු ලබන කල්හි, දන්වනු ලබන කල්හි, පිහිටුවනු ලබන කල්හි, විවෘත කරනු ලබන කල්හි, ප්‍රකට කරනු ලබන කල්හි නොදනීද, නොදකීද, මහණෙනි, මම නුවණැස් නැත්තාවූ, නොදන්නාවූ නොදක්නාවූ, බොහෝ කෙලෙස් රැස්කරන්නාවූ, අඥානවූ ඒ අන්ධ පෘථග්ජනයා (ගැන) කෙසේ කෙරෙම්ද?

"මහණෙනි විඤ්ඤාණය ලෝකයෙහි ලෝ දහමෙක, තථාගතයන් වහන්සේ ඒ ලෝදහම අවබෝධ කෙරෙත්. මනාව දැනගනිත්. අවබෝධකොට මනාව දැන කියත්, ප්‍රකාශ කෙරෙත්, දන්වත්, පිහිටුවත්, විවෘත කෙරෙත්, ප්‍රකට කෙරෙත්. මහණෙනි, යමෙක් තථාගතයන් වහන්සේ විසින් මෙසේ කියනු ලබන කල්හි, ප්‍රකාශකරනු ලබන කල්හි, දන්වනු ලබන කල්හි, පිහිටුවනු ලබන කල්හි, විවෘත කරනු ලබන කල්හි, ප්‍රකට කරනු ලබන කල්හි නොදනීද, නොදකීද, මහණෙනි, මම නුවණැස් නැත්තාවූ, නොදන්නාවූ, නොදක්නාවූ, බොහෝ කෙලෙස් රැස් කරන්නාවූ, ඒ අන්ධයා (ගැන) කෙසේ කෙරෙම්ද?

7. "මහණෙනි, යම්සේ වනාහි දියේ හටගත්තාවූ, දියේ වැඩුනාවූ, උපුලක් හෝ රත් පියුමක් හෝ සුදු පියුමක් හෝ දිය හා නොතැවරුණේ දියෙන් උඩට නැගී සිටීද, මහණෙනි, එපරිද්දෙන්ම ලොකයෙහි උපන්නාවූ, ලොකයෙහි මනාව වැඩුණාවූ, තථාගතයන් වහන්සේ ලෝකයා හා නොතැවරුණාහු, ලොකයා මැඩ වාසය කෙරෙතියි" වදාළසේක.

**(දෙවෙනි පුප්ඵ සූත්‍රය නිමි.)**

## 3. ඵේණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ අයොධ්‍යපුර සමීපයෙහි ගංගානම් නදීතෙර වැඩ වසනසේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, කියා භික්ෂූන් ඇමතුසේක. ඒ භික්ෂූහු 'පින්වතුන් වහන්සැ'යි කියා භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළසේක.

2. "මහණෙනි. යම්සේ වනාහි මේ ගංගානදී තොමෝ මහත් පෙණපිඩු ගෙන එන්නේද, ඇස් ඇති පුරුෂයෙක් තෙම ඒ පෙණපිඩු දකින්නේය, බලන්නේය, නුවණින් නැවත නැවත පරීක්ෂා කරන්නේය. ඒ පෙණපිඩු දක්නාවූ බලන්නාවූ, නුවණින්

නැවත නැවත පරීක්‍ෂා කරන්නාවූ ඔහුට හිස්වූවක්ම වැටහෙන්නේය, ශූන්‍යවූවක්ම වැටහෙන්නේය, හර නැත්තක්වම වැටහෙන්නේය.

"මහණෙනි, පෙණපිඩ පිළිබඳව කිනම් හරයක් වන්නේද?

"මහණෙනි, එපරිද්දෙන්ම තමා පිළිබඳවූ හෝ පිටත්හිවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උසස්වූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද යම් රූපයක් වේද, දුරෙහි හෝ සමීපයෙහි හෝ යම් රූපයක් වේද, මහණතෙම ඒ රූපය දකියි, බලයි. නුවණින් නැවත නැවත පරීක්‍ෂා කර බලයි. ඒ රූපය බලන්නාවූ, සිතන්නාවූ, නුවණින් නැවත නැවත පරීක්‍ෂා කරන්නාවූ ඔහුට හිස්වූවක්වම වැටහෙන්නේය, ශූන්‍යවූවක්ම වැටහෙන්නේය, හරනැති වූවක්ම වැටහෙන්නේය.

"මහණෙනි, රූපයෙහි කිනම් හරයක් වන්නේද?

3. "මහණෙනි, යම්සේ වනාහි සරත් කාලයෙහි මහවැසි පොද ඇති වැසි වසින කල්හි දිය බුබුලු උපදීද, නැතිවේද, ඇස් ඇති පුරුෂයෙක් තෙම ඒ දිය බුබුලු දක්නේද, බලන්නේද, නුවණින් නැවත නැවත පරීක්ෂා කරන්නේද, ඒ දිය බුබුල දක්නාවූ බලන්නාවූ නුවණින් නැවත නැවත පරීක්ෂා කරන්නාවූ ඒ පුරුෂයාහට ඒ දිය බුබුල හිස්වූවකැයිම වැටහෙන්නේය, ශූන්‍යවූවකැයිම වැටහෙන්නේය, හර නැත්තකැයිම වැටහෙන්නේය.

"මහණෙනි, පෙණපිඬේ කිනම් හරෙක් වන්නේද?

"මහණෙනි, එසේම වනාහි තමා පිළිබඳවූ හෝ පිටත්හිවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ අතීත අනාගත-වර්තමානවූ යම් වේදනාවක් වේද, දුරවූ හෝ ලඟවූ හෝ යම් වේදනාවක් වේද, මහණතෙම ඒ වේදනාව දකියි. බලයි. නුවණින් නැවත නැවත පරීක්ෂාකර බලයි. ඒ වේදනාව දකින්නාවූ, සිතන්නාවූ, නුවණින් නැවත නැවත පරීක්ෂා කොට බලන්නාවූ, ඔහුට හිස්වූවක්ම වැටහෙන්නේය, ශූන්‍ය වූවක්වම වැටහෙන්නේය, නිස්සාරවූවක්වම වැටහෙන්නේය.

"මහණෙනි, වේදනාවේ කිනම් හරයක් වන්නේද?

**4.** "මහණෙනි, යම්සේ වනාහි ග්‍රීෂ්ම මාසයන්ගේ අන්තිම මාසයෙහි ඉරුමුදුනෙහි සිටි කල්හි මිරිඟුව සැලේද, ඇස් ඇති පුරුෂයෙක් ඒ මිරිඟුව දක්නේය, බලන්නේය, නුවණින් නැවත නැවත පරීක්ෂා කරන්නේය. දක්නාවූ බලන්නාවූ නුවණින් නැවත නැවත පරීක්ෂා කරන්නාවූ ඒ පුරුෂයාහට ඒ මිරිඟුව හිස්වූවකැයිම වැටහෙන්නේද, ශූන්‍යවූවකැයිම වැටහෙන්නේද, හර නැත්තකැයිම වැටහෙන්නේය.

"මහණෙනි, මිරිඟුවෙහි කිනම් හරයක් වන්නේද?

"මහණෙනි, එපරිද්දෙන්ම තමා පිළිබඳවූ හෝ පිටතවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ අතීත අනාගත-වර්තමානවූ යම්කිසි සංඥාවක් වේද, දුරවූ හෝ ලඟවූ හෝ යම් සංඥාවක් වේද, මහණතෙම ඒ සංඥාව දකියි, බලයි, නුවණින් නැවත නැවත පරීක්ෂා කෙරෙයි. ඒ සංඥාව දක්නාවූ බලන්නාවූ නුවණින් නැවත නැවත පරීක්ෂා කරන්නාවූ ඒ මහණහට (ඒ සංඥාව) හිස්වූවකැයිම වැටහෙන්නේය, ශූන්‍ය වූවකැයිම වැටහෙන්නේය, හර නැත්තකැයිම වැටහෙන්නේය.

මහණෙනි, සංඥාවගේ කිනම් හරෙක් වන්නේද?

**5.** "මහණෙනි, යම්සේ වනාහි අරටුවෙන් ප්‍රයෝජන ඇත්තාවූ අරටුව සොයන්නාවූ අරටුව සෙවීමෙහි ඇවිදින්නාවූ පුරුෂයෙක් තෙම කෙටේරියක් රැගෙන වනයකට පිවිසෙන්නේද, හෙතෙම එහි කෙළින්වූ නොපීදුණු මහ නාඹුල්කෙසෙල් ගසක් දක්නේද, හෙතෙම ඒ කෙලෙස් ගස මුලින් කපන්නේය, මුල කපා පිති කපන්නේය, පිති කපා පතුරු ගළවන්නේය, හෙතෙම ඒ කෙසෙල් ගසෙහි පතුරු ගළවනුයේ එළයද නොලබන්නේය, අරටුවක් කොයින් ලබන්නේද? ඇස් ඇති පුරුෂයෙක් ඒ කෙසෙල් පතුරු දක්නේය, බලන්නේය, නුවණින් නැවත නැවත පරීක්ෂා කරන්නේය. දක්නාවූ බලන්නාවූ නුවණින් නැවත නැවත පරීක්ෂා කරන්නාවූ ඒ පුරුෂයාහට ඒ කෙසෙල් පතුරු හිස්වූවකැයිම ශූන්‍ය වූවකැයිම හර නැත්තෙකැයිම වැටහෙන්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

"මහණෙනි, කෙසෙල් කඳේ කිනම් හරයෙක් වන්නේද?

"මහණෙනි, එපරිද්දෙන්ම තමා පිළිබඳවූ හෝ අනුන් පිළිබඳවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ අතීත - අනාගත - වර්තමානවූ යම්කිසි සංස්කාරයෝ වෙද්ද, දුරවූ හෝ ලඟවූ හෝ යම් සංස්කාරයෝ වෙද්ද, මහණ තෙම එය දකියි, බලයි. නුවණින් නැවත නැවත පරීක්ෂා කරයි. ඒ සංස්කාර ස්කන්ධය දක්නාවූ බලන්නාවූ නැවත නැවත පරීක්ෂා කරන්නාවූ ඔහුට එය හිස්වූවකැයිම ශූන්‍ය වූවකැයිම හර නැත්තෙකැයිම වැටහෙන්නේය.

"මහණෙනි, සංස්කාරයන්හි කිනම් හරයෙක් වන්නේද?

**6.** "මහණෙනි, යම්සේ වනාහි මායාකාරයෙක් හෝ මායාකාරයෙකුගේ අතවැස්සෙක් හෝ සතරමංසන්ධියෙක ඇස් බැන්දුම දක්වන්නේද, ඇස් ඇති පුරුෂයෙක් ඒ ඇස් බැන්දුම දක්නේය, බලන්නේය. නුවණින් සලකන්නේය. ඒ මායාව දක්නාවූ බලන්නාවූ නුවණින් නැවත නැවත පරීක්ෂා කරන්නාවූ ඔහුට හිස්වූවකැයිම වැටහෙන්නේය, ශූන්‍යවූවකැයිම වැටහෙන්නේය, හර නැත්තෙකැයිම වැටහෙන්නේය.

"මහණෙනි, මායාවෙහි කිනම් හරයෙක් වන්නේද?

එපරිද්දෙන්ම මහණෙනි, තමා පිළිබඳවූ හෝ පිටත්හිවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ අතීත අනාගත - වර්තමානවූ හෝ යම්කිසි විඤ්ඤාණයෙක් වේද, දුරවූ හෝ ලඟවූ හෝ යම් විඤ්ඤාණයෙක් වේද, මහණතෙම ඒ විඤ්ඤාණය දකියි, බලයි, නුවණින් විමසයි. ඒ විඤ්ඤාණය දක්නාවූ බලන්නාවූ නුවණින් විමසන්නාවූ ඒ මහණහට හිස් වූවක්ම වැටහෙන්නේය, ශූන්‍යවූවක්ම වැටහෙන්නේය, හරනැත්තෙක්ම වැටහෙන්නේය.

"මහණෙනි, විඤ්ඤාණයෙහි කිනම් හරයෙක් වන්නේද?

"මහණෙනි, මෙසේ දක්නාවූ ඇසූ පිරූ තැන් ඇත්තාවූ ආර්යශ්‍රාවක තෙම රූපයෙහිද කලකිරෙයි, වේදනාවෙහිද

කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි, සංස්කාරයන්හිද කලකිරෙයි, විඥානයෙහිද කලකිරෙයි, කලකිරුණේ නොඇලෙයි, නො ඇලීමෙන් (කෙලෙසුන්ගෙන්) මිදේ. මිදුණු කල්හි "මිදුණේයයි දැනීම වෙයි, ජාතිතොමෝ ක්ෂයවූවාය, බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමකරන ලද්දේය, කළයුත්ත කරන ලද්දේය, මේ ආත්මභාවය සඳහා කළයුතු අනිකක් නැතැ"යි දැනගනී. මේ සූත්‍රය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. ශාස්තෘවූ සුගතයන් වහන්සේ මෙය වදාරා අනතුරුව මේ ගාථා වදාළසේක.

1. "රූපය පෙණපිඩක් බඳුය, වේදනාව දියබුබුලක් බඳුය, සංඥාව මිරිඟුවක් බඳුය, සංස්කාරයෝ කෙසෙල් ගසක් බඳුවූහ, විඥානය මායාවක් බඳුයයි සූර්යවංශිකයනට නෑවූ භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලදහ.

2. "යමෙක් ඒ පස්කඳ නුවණින් බලාද යම් යම් අයුරකින් සිතාද, නුවණින් නැවත නැවත විමසාද, (ඔහුට එය) හිස්ව වැටහෙයි, ශූන්‍යව වැටහෙයි.

3. "යමෙක් (ජීවිතෙන්ද්‍රිය, කර්මයෙන් උපන් තෙජොධාතුව, සිත යන) ධර්මයන් තිදෙන පහකළාවූ (එහෙයින්ම නෑයන් විසින් බැහැර) දමන ලද රූපය දක්නේද, (හෙතෙම) සියුම් ප්‍රඥාව ඇත්තාවූද, මහත් පැතුරුණු ප්‍රඥාව ඇත්තාවූද, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ කය ගැරහිය යුතු කොට දෙසන ලදැයි දක්නේය.

4. "යම් කලෙක්හි ජීවිතෙන්ද්‍රියයද කර්මයෙන් උපන් තේජොධාතුවද, සිතද මේ කය හරිද්ද, එකල්හි සිතිවිලි නැත්තක්ව (නානාවිධ පණු ආදීන්ට) ගොදුරුව (ඥාතීන් විසින්) ඉවත දමන ලද්දේ (පොළොව මත) හෝනේය.

5. "යම් මේ විඤ්ඤාණස්කන්ධයක් වේද, (එය) අඥාන මහජනයා කතාකරවන මායාවක් නම්වෙයි, 'එබඳු ප්‍රවේණිය වෙයි, මේ පඤ්චස්කන්ධය වධකයෙක් යයි වදාරණ ලදී.

**6.** පටන් ගන්නා ලද වීර්යය ඇත්තාවූ, සම්‍යක් ප්‍රඥාව ඇත්තාවූ, එළඹ සිටි සිහි ඇත්තාවූ, මහණතෙමේ ඉදින් දවල් හෝ රෑ හෝ ස්කන්ධයන් මෙසේ දක්නේද, (ඒ මහණතෙමේ) සියලු (දස) සංයෝජනය පහකරන්නේය. තමහට පිහිට ඇති කරන්නේය, නිර්වාණය පතමින් හිස ගිනිගත්තෙකුසේ හැසිරෙන්නේය.”

**(තුන්වෙනි ඵේණ සූත්‍රය නිමි.)**

---

## 4. ගොමය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. ඉක්බිති භික්ෂුවක් තෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පැත්තෙක හුන්නේය. එක් පැත්තෙක හුන්නාවූ, ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ කීයේය.

“ස්වාමීනි, නිත්‍යවූ, ස්ථිරවූ, සියලු කල්හි පවතින්නාවූ, නොපෙරලෙන ස්වභාව ඇත්තාවූ, සදාකාලිකයන් හා සමානව එසේම සිටින්නාවූ යම්කිසි රූපයෙක් ඇත්තේද?”

“ස්වාමීනි, නිත්‍යවූ, ස්ථිරවූ, සියලු කල්හි පවත්නාවූ නොපෙරලෙන ස්වභාව ඇත්තාවූ සදාකාලිකයන් මෙන් එසේම සිටින්නාවූ යම්කිසි වේදනාවක් ඇත්තේද?

“ස්වාමීනි, නිත්‍යවූ ස්ථිරවූ, හැමදා පවතින්නාවූ නොපෙරෙලෙන ස්වභාවය ඇත්තාවූ සදාකාලික වස්තුවක්සේ එසේම සිටින්නාවූ යම්කිසි සංඥාවක් ඇත්තේද?

“ස්වාමීනි, නිත්‍යවන්නාවූ ස්ථිරවන්නාවූ, හැම කල්හි පවත්නාවූ, නොපෙරෙලෙන ස්වභාවය ඇත්තාවූ සදාකාලික වස්තුවක් මෙන් එසේම සිටින්නාවූ යම්කිසි සංස්කාරයෝ ඇත්තාහුද?

"ස්වාමීනි නිත්‍යවූ ස්ථිරවූ, හැමකල්හි පවතින්නාවූ නොපෙරෙලෙන ස්වභාවය ඇත්තාවූ හැමකල්හි පවත්නාවූ දෙයක් මෙන් එසේම තිබෙන්නාවූ යම් කිසි විඥානයෙක් ඇත්තේද?"

"මහණ, නිත්‍යවූ, ස්ථිරවූ, හැම කල්හි පවත්නාවූ නොපෙරෙලෙන ස්වභාවය ඇත්තාවූ සදාකාලික වස්තුවක් සේ එසේම සිටින්නාවූ කිසි රූපයෙක් නැත්තේමය.

"මහණ, නිත්‍යවූ, ස්ථිරවූ, හැමදා පවතින්නාවූ නොපෙරෙලෙන ස්වභාවය ඇත්තාවූ, සදාකාලික වස්තුවක් මෙන් එසේම සිටින්නාවූ කිසි වේදනාවක් තොමෝ නැත්තේමය.

"මහණ, නිත්‍යවූ, ස්ථිරවූ, හැම කල්හි පවතින්නාවූ නොපෙරෙලෙන ස්වභාවය ඇත්තාවූ සදාකාලික වස්තුවක් මෙන් එපරිද්දෙන්ම සිටින්නාවූ කිසි සංඥාවක් නැත්තේමය.

"මහණ, නිත්‍යවූ ස්ථිරවූ හැමකල්හි පවත්නාවූ නොපෙරෙලෙන ස්වභාවය ඇත්තාවූ, සදාකාලික වස්තුවක් මෙන් එකාකාරව සිටින්නාවූ කිසි සංස්කාර කෙනෙක් නැත්තාහුමය.

මහණ නිත්‍යවූ, ස්ථිරවූ, හැමදා පවතින්නාවූ නොපෙරෙලෙන ස්වභාවය ඇත්තාවූ, සදාකාලික දෙයක් මෙන් එසේම සිටින්නාවූ කිසි විඥානයෙක් නැත්තේමය."

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ස්වල්පවූ ගොම පිඩක් අතින් ගෙන ඒ මහණහට මෙය වදාළසේක.

"මහණ, නිත්‍යවූ ස්ථිරවූ හැමකල්හි පවත්නාවූ නොපෙරෙලෙන ස්වභාවය ඇත්තාවූ මෙපමණවූද ඉපදීම ලැබූ ආත්මභාවයක් නැත.

"මහණ, නිත්‍යවූ, ස්ථිරවූ, හැම කල්හි පවත්නාවූ, නොපෙරෙලෙන ස්වභාවය ඇත්තාවූ, මෙපමණවූද ආත්මභාවය ලැබීමක් ඉදින් වන්නේ නම් මනාව දුක් ක්ෂය කරනු පිණිස මේ මාර්ගබ්‍රහ්මචර්යාව විසීම නම් නොපණවන්නේය.

"මහණ, යම්හෙයකින් නිත්‍යවූ, ස්ථිරවූ, හැමකල්හි පවත්නාවූ, නොපෙරෙලෙන ස්වභාවය ඇත්තාවූද, මේ (ගොම පිඩ)

පමණවූද, ආත්මභාව ප්‍රතිලාභයෙක් නැද්ද, එහෙයින් මනා කොට දුක් ක්ෂය කරනු පිණිස මාර්ගබ්‍රහ්මචර්යාව විසීම පණවන්නේය.

"මහණ, මම පෙර හිසෙහි ඔටුනු පළඳවන ලද්දාවූ ක්ෂත්‍රිය රජෙක් වීමි.

"මහණ, හිසෙහි ඔටුනු පළඳවන ලද්දාවූ ක්ෂත්‍රිය රජවූම ඒ මට කුසාවතී රාජධානිය ප්‍රධානකොට ඇති අසූහාර දහසක් නුවරවල් වූහ.

"මහණ, හිසෙහි ඔටුනු පළඳවන ලද්දාවූ ක්ෂත්‍රිය රජවූම ඒ මට ධර්මප්‍රාසාදය ප්‍රධාන කොට ඇති අසූහාරදහසක් ප්‍රාසාදයෝ වූහ. මහණ, හිසෙහි ඔටුනු පළඳවන ලද්දාවූ ක්ෂත්‍රිය රජවූම ඒ මට 'මහාබ්‍යුහ' නම් කුළුගෙය ප්‍රධානකොට ඇති අසූ හතර දහසක් කුළුගෙවල් වූහ.

"මහණ, හිසෙහි ඔටුනු පළඳවන ලද්දාවූ ක්‍ෂත්‍රිය රජවූම ඒ මට (ඇත්) දතින් කරන ලද්දාවූද, රත්හඳුන් අරටුවෙන් කරන ලද්දාවූද, රනින් කරන ලද්දාවූද, රිදියෙන් කරන ලද්දාවූද, අඟල් හතරකට වැඩි ලොම් ඇති කළුකොඳු පලස් අතුරණ ලද්දාවූද, දෙපැත්තෙහි සුදු එළු ලොම් මුවා කම්බිලි අතුරණ ලද්දාවූද, ගණවූ මල් ඇති සුදු එළු ලොම් මුවා ඇතිරිලි අතුරණ ලද්දාවූද, කෙසෙල් මුවන්ගේ සමින් කරන ලද උතුම් පසතුරුණු අතුරණ ලද්දාවූද, මත්තෙහි බඳින ලද රතුවියන් සහිතවූ දෙපැත්තෙහි තබන ලද රතු කොට්ට ඇත්තාවූ අසූහාරදහසක් පුටුවූහ.

"මහණ, හිසෙහි ඔටුණු පළඳන ලද්දාවූ ක්ෂත්‍රිය රජවූම ඒ මට ස්වර්ණාභරණ ඇති, රනින් කරන ලද කොඩි ඇති රන්දැලින් වසන ලද්දාවූ, උපෝසථ හස්තිරාජයා ප්‍රධාන කොට ඇති සුවාසූ දහසක් ඇත්තුවූහ.

"මහණ, හිසෙහි ඔටුණු පළඳන ලද්දාවූ, ක්ෂත්‍රිය රජවූම ඒ මට ස්වර්ණාලංකාර ඇත්තාවූ, රන් දද ඇත්තාවූ, රන් දැලින් වසන ලද්දාවූ, වලාහක අශ්වරාජයා ප්‍රධානකොට ඇති අසූහතර දහසක් අශ්වයෝ වූහ.

"මහණ, හිසෙහි ඔටුණු පළඳන ලද්දාවූ, ක්ෂත්‍රිය රජවූම ඒමට ස්වර්ණාලංකාර ඇති රනින් කරන ලද කොඩි ඇති රන් දැලින් වසන ලද්දාවූ, වෛජයන්ත රථය ප්‍රධානකොට ඇති අසූහාරදහසක් රථ වූහ.

"මහණ, හිසෙහි ඔටුණු පළඳවන ලද්දාවූ, ක්ෂත්‍රිය රජවූම ඒ මට අසූහාරදහසක් මැණික් වූහ.

"මහණ, හිසෙහි ඔටුණු පළඳන ලද්දාවූ, ක්ෂත්‍රිය රජවූම ඒ මට ශුභද්‍රාදේවිය ප්‍රධානකොට ඇති අසූහාරදහසක් ස්ත්‍රීහු වූහ.

"මහණ, හිසෙහි ඔටුණු පළඳන ලද්දාවූ ක්ෂත්‍රිය රජවූම ඒ මට අනුකූලවූ පුත්‍ර රත්නය ප්‍රධාන කොට ඇති අසූහාර දහසක් ක්ෂත්‍රියයෝ වූහ.

"මහණ, හිසෙහි ඔටුණු පළඳන ලද්දාවූ, ක්ෂත්‍රිය රජවූම ඒ මට රෙදි අතුරන ලද්දාවූ, රිදීයෙන් කරන ලද කිරිදෝනා බඳුන් ඇති සුවාසූ දහසක් දෙන්නු වූහ.

"මහණ, හිසෙහි ඔටුණු පළඳවන ලද්දාවූ, ක්ෂත්‍රිය රජවූම ඒ මට කොමු පිළියෙන් සියුම්වූද, කෝසෙයය වස්ත්‍රයෙන් සියුම්වූද, පලස්වලින් සියුම්වූද, කපු පිළියෙන් සියුම්වූද අසූ හතර දහසක් රෙදි මිටිවූහ.

"මහණ, හිසෙහි ඔටුණු පළඳවන ලද්දාවූ ක්ෂත්‍රිය රජවූම ඒ මට අසූහතර දහසක් බත් හැළි වූහ. සවසද උදෑසනද දිය යුතු ඒ බත දෙන ලදී.

"මහණ, මම එකල්හි යම් නුවරෙක වෙසෙම්ද, ඒ සුවාසූ දහසක් නගරයන් අතුරෙන් කුසාවතී රාජධානියවූ ඒ එකම නුවර වෙයි.

"මහණ ඒ අසූහතර දහසක් ප්‍රාසාදයන් අතුරෙන් යම් පහයෙක මම එකල්හිවසම්ද, ධර්මප්‍රාසාදයවූ ඒ එකම ප්‍රාසාදය වෙයි.

"මහණ, මම එකල්හි යම් කුළුගෙයක වසම්ද, ඒ සුවාසූ දහසක් කුළුගෙවල් අතුරෙන් "මහාබ්‍යුහ" කුළුගෙයවූ ඒ එකම කුළුගෙය වෙයි.

"මහණ, මම එසමයෙහි යම් පුටුවක් පරිභොගකරම්ද, ඒ අසූහතර දහසක් පුටු අතුරෙන් ඇත් දතින් කරන ලද්දාවූ හෝ රත්හඳුන් හරින් කරන ලද්දාවූ හෝ රනින් කරන ලද්දාවූ හෝ රිදීයෙන් කරන ලද්දාවූ හෝ ඒ එකම පුටුවක් වෙයි.

"මහණ, මම ඒ කාලයෙහි යම් ඇත් රජෙකු පිට නගිම්ද, ඒ සුවාසූ දහසක් ඇතුන් අතුරෙන් උපොසිත හස්තිරාජයාවූ ඒ එකම ඇතෙක් වෙයි.

"මහණ, මම ඒ කාලයෙහි යම් අසෙකු පිට නගිම්ද, ඒ අසූහතර දහසක් අසුන් අතුරෙන් වලාහක අශ්වරාජයාවූ ඒ එකම අශ්වයෙක් වෙයි.

"මහණ මම ඒ කාලයෙහි යම් රියකට නගිම්ද, ඒ අසූ හතර දහසක් රථයන් අතුරෙන් විජයොත් රිය නම් වූ ඒ එකම රථය වෙයි.

"මහණ, මම එසමයෙහි ක්ෂත්‍රිය ස්ත්‍රියක හෝ ක්ෂත්‍රියයාට දාව බැමිණිය කුස උපන්නාවූද, බමුණාට දාව ක්ෂත්‍රිය ස්ත්‍රිය කුස උපන්නාවූද ස්ත්‍රියක් උපස්ථාන කෙරේද, ඒ සුවාසු දහසක් ස්ත්‍රීන් අතුරෙන් ඈ එකම ස්ත්‍රී (රත්නය) වෙයි.

"මහණ එසමයෙහි යම් පිළි සඟළක් හඳිම්ද, ඒ අසූහතර දහසක් වස්ත්‍ර මිටි අතුරෙන් කොමු පිළියෙන් සියුම්වූද, කොසෙය්‍ය වස්ත්‍රයෙන් සියුම්වූද කම්බිලියෙන් සියුම්වූද, කපුපිළියෙන් සියුම්වූද, ඒ එකම පිළිසඟළෙක් වෙයි.

"මහණ, මම එසමයෙහි යම් සහල් නැළියක පමණ බත් ද ඊට සුදුසු සූප ව්‍යඤ්ජනද අනුභව කරම්ද, ඒ අසූහතරදහසක් පිසූ බත් සැළි අතුරෙන් ඒ එකම සැළියක පිසූ බත වෙයි.

"මහණ, මෙසේ වනාහි ඉක්මගියාවූ ඒ හැම සංස්කාරයෝ නිරුද්ධවූහ, පෙරළුණාහුය. මහණ, මෙසේ සංස්කාරයෝ අනිත්‍ය වන්නාහුමය. මහණ, මෙසේ සංස්කාරයෝ ස්ථිර නොවන්නාහුමය. මහණ, මෙසේ සංස්කාරයෝ සැනසිලි නැත්තාහුමය. මහණ, සියලු සංස්කාරයන්හි අතිශයින්

කලකිරෙන්නට සුදුසුමය, නො ඇලෙන්නට සුදුසුමය. මිදෙන්නට සුදුසුමය.”

(හතරවෙනි ගොමය සූත්‍රය නිමි.)

---

## 5. නඛ සිඛ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක්හි හුන්නේය. එක්පසෙක්හි හුන්නාවූ ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ කීයේය.

2. “ස්වාමීනි, නිත්‍යවූ, ස්ථිරවූ, සදාකාලිකවූ, නොපෙරළෙන ස්වභාවය ඇත්තාවූ, සදාකාලික දැයක් සමානව එපරිද්දෙන් සිටින්නාවූ, කිසිරූපයෙක් ඇත්තේද? ස්වාමීනි, නිත්‍යවූ, ස්ථිරවූ, සැමදා පවතින්නාවූ, නොපෙරළෙන ස්වභාවය ඇත්තාවූ, සදාකාලික වස්තුවක් සේ එපරිද්දෙන්ම සිටින්නාවූ කිසි වේදනාවක් තොමෝ ඇත්තීද? ස්වාමීනි, නිත්‍යවූ, ස්ථිරවූ, සැම කල්හි පවතින්නාවූ, නොපෙරළෙන ස්වභාවය ඇත්තාවූ සදාකාලික වස්තුවක් මෙන් එපරිද්දෙන්ම සිටින්නාවූ කිසි සංඥාවක් තොමෝ ඇත්තීද? ස්වාමීනි, නිත්‍යවූ, ස්ථිරවූ හැමකල්හි පවත්නාවූ, සදාකාලික වස්තුවක් සමානව එයාකාරයෙන්ම සිටින්නාවූ, කිසි සංස්කාර කෙනෙක් ඇත්තාහුද? ස්වාමීනි, නිත්‍යවූ, ස්ථිරවූ, හැම කල්හි පවතින්නාවූ, නොපෙරළෙන ස්වභාවය ඇත්තාවූ, සදාකාලික දැයක් සේ එපරිද්දෙන්ම සිටින්නාවූ, කිසි විඥානයෙක් ඇත්තේද?”

3. “මහණ, නිත්‍යවූ, ස්ථිරවූ, හැම කල්හි පවතින්නාවූ, නොපෙරළෙන ස්වභාවය ඇත්තාවූ, සදාකාලික වස්තුවක් මෙන් එපරිද්දෙන්ම සිටින්නාවූ, කිසි රූපයෙක් නැත්තේමය. මහණ,

නිත්‍යවූ, ස්ථිරවූ, හැම කල්හි පවතින්නාවූ, නොපෙරළෙන ස්වභාවය ඇත්තාවූ, සදාකාලික දැයක් සේ එපරිද්දෙන්ම සිටින්නාවූ, කිසි වේදනාවක් තොමෝ නැත්තීමය, මහණ, නිත්‍යවූ, ස්ථිරවූ, සැමදා පවතින්නාවූ, නොපෙරළෙන ස්වභාවය ඇත්තාවූ, සදාකාලික වස්තුවක් සේ එසේම සිටින්නාවූ, කිසි සංඥාවක් තොමෝ නැත්තීමය. මහණ, නිත්‍යවූ ස්ථිරවූ හැම කල්හි පවතින්නාවූ, නොපෙරළෙන ස්වභාවය ඇත්තාවූ, සදාකාලික වස්තුවක් සේ එසේම සිටින්නාවූ කිසි සංස්කාර කෙනෙක් නැත්තාහුමය. මහණ, නිත්‍යවූ, ස්ථිරවූ, හැම කල්හි පවතින්නාවූ, නොපෙරළෙන ස්වභාවය ඇත්තාවූ, සදාකාලික වස්තුවක් සමානව එසේම සිටින්නාවූ, කිසි විඥානයෙක් නැත්තේමය.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පස්ටිකක් නියපිටෙහි තබාගෙන ඒ මහණහට මෙය වදාළසේක: "මහණ සදාකාලික ද්‍රව්‍යයක් සමව එසේම සිටින්නාවූ නිත්‍යවූ ස්ථිරවූ හැමකල්හි පවතින්නාවූ නොපෙරළෙන ස්වභාවය ඇත්තාවූ මෙපමණවූද රූපයෙක් නැත්තේමය. මහණ, ඉදින් නිත්‍යවූ ස්ථිරවූ සියලු කල්හි පවත්නාවූ නොපෙරළෙන ස්වභාවය ඇත්තාවූ මෙපමණවූද රූපයෙක් වීනම් මනාකොට දුක් ක්ෂය කිරීම පිණිස මාර්ගබ්‍රහ්මචර්යා වාසය නොපණවන්නේය. මහණ, යම් හේතුවකින් වනාහි නිත්‍යවූ ස්ථිරවූ හැමකල්හි පවත්නාවූ නොපෙරළෙන ස්වභාවය ඇත්තාවූ මෙතෙකුදු රූපයෙක් නැත්තේද, එහෙයින් මනාකොට දුක් ක්ෂය කරනු වස් මාර්ග බ්‍රහ්මචර්යය විසීම පණවන්නේය.

5. "මහණ, සදාකාලික වස්තුවක් වැනිව එසේම සිටින්නාවූ, නිත්‍යවූ, ස්ථිරවූ, හැම කල්හි පවතින්නාවූ, නොපෙරළෙන ස්වභාවය ඇත්තාවූද, මෙපමණවූද වේදනාවක් තොමෝ නැත්තීමය. මහණ, නිත්‍යවූ, ස්ථිරවූ, හැම කල්හි පවත්නාවූ, නොපෙරළෙන ස්වභාවය ඇත්තාවූ මෙපමණවූද වේදනාවක් තොමෝ වී නම් මනාකොට දුක් ක්ෂයකිරීම පිණිස මාර්ග බ්‍රහ්මචර්යාවෙහි විසීම නොපණවන්නේය. මහණ, යම් හෙයකින්

නිත්‍යවූ, ස්ථිරවූ, හැමකල්හි පවත්නාවූ, නොපෙරළෙන ස්වභාවය ඇත්තාවූ මෙපමණවූද, වේදනාවක් තොමෝ නැත්තීද, එහෙයින් මනාකොට දුක ක්ෂය කරනු පිණිස මාර්ගබ්‍රහ්මචරියාවෙහි විසීම පණවන්නේය.

**6.** "මහණ, සදාකාලික වස්තුවක් බඳුව, එපරිද්දෙන්ම සිටින්නාවූ, නිත්‍යවූ, ස්ථිරවූ, හැමදා පවත්නාවූ, නොපෙරළෙන ස්වභාවය ඇත්තාවූ, මෙපමණවූද සංඥාවක් තොමෝ නැත්තීමය. මහණ, නිත්‍යවූ, ස්ථිරවූ, හැමකල්හි පවත්නාවූ නොපෙරළෙන ස්වභාවය ඇත්තාවූ, මෙපමණවූද සංඥාවක් වීනම් මනාකොට දුක ක්ෂයකිරීමට මාර්ගබ්‍රහ්මචරියාවෙහි විසීම නොපණවන්නේය. මහණ, යම් හෙයකින් නිත්‍යවූ, ස්ථිරවූ, හැම කල්හි පවත්නාවූ, නොපෙරළෙන ස්වභාවය ඇත්තාවූ, මෙපමණවූද සංඥාවක් තොමෝ නැත්තීද, එහෙයින් මනා කොට දුක ක්ෂයකිරීමට මාර්ග බ්‍රහ්මචරියාවෙහි විසීම පණවන්නේය.

**7.** "මහණ, සදාකාලික දෙයක් සමව ඒ අයුරෙන්ම සිටින්නාවූ, නිත්‍යවූ, ස්ථිරවූ, හැම කල්හි පවත්නාවූ, නොපෙරළෙන ස්වභාවය ඇත්තාවූ, මෙපමණවූද සංස්කාර කෙනෙක් නැත්තාහුමය මහණ, නිත්‍යවූ ස්ථිරවූ හැම කල්හි පවත්නාවූ, නොපෙරළෙන ස්වභාවය ඇත්තාවූ, මෙපමණවූද සංස්කාරයෝවූ නම්, මනාකොට දුක ක්ෂයකිරීමට මාර්ගබ්‍රහ්මචරියාවෙහි විසීම නොපණවන්නේය. මහණ, යම් හෙයකින් නිත්‍යවූ, ස්ථිරවූ, හැමකල්හි පවත්නාවූ, නොපෙරළෙන ස්වභාවය ඇත්තාවූ, මෙපමණවූද සංස්කාර කෙනෙක් නැත්තාහුද, එහෙයින් මනාකොට දුක ක්ෂයකිරීමට මාර්ග බ්‍රහ්මචරියාවෙහි විසීම පණවන්නේය.

**8.** "මහණ, සදාකාලික වස්තුවක් සමානව එසේම සිටින්නාවූ, නිත්‍යවූ, ස්ථිරවූ, හැමකල්හි පවත්නාවූ, නොපෙරළෙන ස්වභාවය ඇත්තාවූද, මෙපමණවූද විඥානයෙක් නැත්තේමය. මහණ, නිත්‍යවූ, ස්ථිරවූ, හැමකල්හි පවත්නාවූ, නොපෙරළෙන ස්වභාවය ඇත්තාවූ, මෙපමණවූද විඥානයෙක් වීනම් මනාකොට දුක ක්ෂයකිරීමට මාර්ග බ්‍රහ්මචරියාවෙහි විසීම නොපණවන්නේය.

මහණෙනි, යම් හෙයකින් නිත්‍යවූ, ස්ථිරවූ, හැමකල්හි පවත්නාවූ, නොපෙරළෙන ස්වභාවය ඇත්තාවූ, මෙපමණවූද විඥානයෙක් නැත්තේද, එහෙයින් මනාකොට දුක ක්ෂය කිරීමට මාර්ග බ්‍රහ්මචරියාවෙහි විසීම පණවන්නේය.

**9.** "මහණෙනි, ඒ කුමැයි සිතන්නෙහිද? "රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම්, එය දුක් හෝ සැප හෝ වේද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යය වේද, දුක් වේද, පෙරළෙන ස්වභාවය ඇත්තේ වේද, 'මේ රූපය මාගේය, මේ මම වෙමි. මේ මාගේ ආත්ම'යයි ඒ රූපය (දෘෂ්ටි වශයෙන්) දක්නට සුදුසු වේද?" - "ස්වාමීනි, මෙය නුසුදුසුමය."

"වේදනා තොමෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යම් වේදනාවක් තොමෝ අනිත්‍ය වේද, ඕතොමෝ දුක් හෝ සැප හෝ වේද?" - "ස්වාමීනි, දුකය."

"යම් වේදනාවක් තොමෝ අනිත්‍ය වන්නීද, දුක් වන්නීද, පෙරළෙන ස්වභාවය ඇත්තීද, 'මේ වේදනාව මාගේය, මේ මම වෙමි. මේ මාගේ ආත්ම'යයි ඒ වේදනාව (දෘෂ්ටි වශයෙන්) දක්නට සුදුසුද?" - "ස්වාමීනි, මෙය නුසුදුසුමය."

"සංඥා තොමෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද" - "ස්වාමීනි, අනිත්‍යය."

"යම් සංඥාවක් තොමෝ අනිත්‍ය වේද, ඕ දුක් හෝ සැප හෝ වේද?" - "ස්වාමීනි, දුකය."

"යම් සංඥාවක් තොමෝ අනිත්‍ය වේද, දුක් වේද, පෙරළෙන ස්වභාවය ඇත්තීද, 'මේ සංඥාව මාගේය මේ මම වෙමි. මේ මාගේ ආත්ම'යයි ඒ සංඥාව (දෘෂ්ටි වශයෙන්) දක්නට සුදුසුද?" - "ස්වාමීනි, මේ සුදුසු නොවේමය."

"සංස්කාරයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යම් සංස්කාර කෙනෙක් අනිත්‍ය වෙද්ද, ඒ සංස්කාරයෝ දුක් හෝ සැප හෝ වෙද්ද?" - "ස්වාමීනි, දුක්ය"

"යම් සංස්කාර කෙනෙක් අනිත්‍ය වෙද්ද, දුක් වෙද්ද, පෙරළෙන ස්වභාවය ඇත්තාහු වෙද්ද, 'මේ සංස්කාරස්කන්ධය මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්ම'යයි (දෘෂ්ටි වශයෙන්) දක්නට සුදුසුද?" - "ස්වාමීනි, මෙය සුදුසු නොවේමය."

"විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යම් විඥානයෙක් අනිත්‍ය වේද, ඒ විඥානය දුක් හෝ සැප හෝ වේද?" - "ස්වාමීනි, දුකය."

"යම් විඥානයෙක් අනිත්‍ය වේද, දුක් වේද, පෙරළෙන ස්වභාවය ඇත්තේ වේද, මේ විඥානය මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්ම'යයි ඒ විඥානය (දෘෂ්ටි වශයෙන්) දක්නට සුදුසුද" - "ස්වාමීනි මෙය සුදුසු නොවේමය."

**10.** "මහණ, එහෙයින් තමා පිළිබඳවූ හෝ පිටත්හිවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උසස්වූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, යම්කිසි රූපයෙක් වේද, දුරවූ හෝ ළඟවූ හෝ යම්කිසි රූපයෙක් වේද, 'මේ රූපය මාගේ නොවේ. මේ මම නොවෙමි. මේ මාගේ ආත්මය නොවේ' යයි මෙසේ මේ සියලු රූපය තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය.

"තමා පිළිබඳවූ හෝ අනුන් පිළිබඳවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උසස්වූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, යම්කිසි වේදනාවක් වේද, දුරවූ හෝ ළඟවූ හෝ යම් වේදනාවක් වේද, 'මේ වේදනාව මාගේ නොවේ. මේ මම නොවෙමි. මේ මාගේ ආත්මය නොවේ'යයි මෙසේ මේ හැම වේදනාව තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය.

"තමා පිළිබඳවූ හෝ පිටත්හිවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උසස්වූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, යම්කිසි සංඥාවක් වේද, දුරවූ හෝ ළඟවූ හෝ යම් සංඥාවක් වේද, 'මේ සංඥාව මාගේ නොවේ. මේ මම නොවෙමි, මේ මාගේ ආත්මය නොවේ'යයි මෙසේ මේ හැම සංඥාව තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය.

"තමා පිළිබඳවූ හෝ පිටත්හිවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ ලාමකවූ හෝ උතුම්වූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද යම්කිසි සංස්කාර කෙනෙක් වෙද්ද, දුරවූ හෝ ළඟවූ හෝ යම් සංස්කාරයෝ වෙද්ද, 'මේ සංස්කාර ස්කන්ධය මාගේ නොවේ. මේ මම නොවෙමි මේ මාගේ ආත්මය නොවේ'යයි මෙසේ මේ හැම සංස්කාරය තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය.

"තමා පිළිබඳවූ හෝ අනුන් පිළිබඳවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, යම්කිසි විඥානයෙක් වේද, දුරෙහි හෝ සමීපයෙහි හෝ යම් විඥානයෙක් වේද, 'මේ විඥානය මාගේ නොවේ. මේ මම නොවෙමි, මේ මාගේ ආත්මය නොවේ'යයි මෙසේ මේ සියලු විඥානය තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දතයුතුය.

11. "මහණෙ, මෙසේ දක්නාවූ බොහෝ ඇසූ පිරූ තැන් ඇති, ආර්යශ්‍රාවකතෙම රූපයෙහිද කලකිරෙයි, වේදනාවෙහිද කලකිරෙයි, සංඥාවෙහිද කලකිරෙයි, සංස්කාරයන්හිද කලකිරෙයි, විඥානයෙහිද කලකිරෙයි. කලකිරුණේ නොඇලෙයි, නොඇලීමෙන් (කෙලෙසුන් කෙරෙන්) මිදෙයි. මිදුණු කල්හි 'මිදුණේ'යයි දැනීම වෙයි. ඉපදීම ක්ෂය වූවාය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවන ලද්දේය. සතර මාර්ගයෙන් කටයුතු කොට නිමවන ලද්දේය. මේ රහත් බව පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගනීයයි" වදාළසේක.

**(පස්වෙනි නඛසිඛ සූත්‍රය නිමි.)**

---

## 6. සාමුද්දක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. ඉක්බිති මහණෙක් තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පැත්තෙක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ ඒ මහණතෙම භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ කීයේය.

2. "ස්වාමීනි, යම් රූපයෙක් නිත්‍යවේද, ස්ථිරවේද, හැම කල්හි තිබේද, නොපෙරෙලෙන ස්වභාවය ඇත්තේ වේද, සදාකාලික දෙයක් මෙන් එසේම සිටින්නේද, (එබඳු) කිසි රූපයෙක් ඇත්තේද?

"ස්වාමීනි, යම් වේදනාවක් තොමෝ නිත්‍යවේද, ස්ථිරවේද, හැමකල්හි තිබේද, නොපෙරෙලෙන ස්වභාවය ඇත්තීවේද, සදාකාලික වස්තුවක් වැනිව එසේම සිටින්නීද, (එබඳු) කිසි වේදනාවක් තොමෝ ඇත්තීද?

"ස්වාමීනි, යම් සංඥාවක් තොමෝ නිත්‍යවේද, ස්ථිරවේද, සැම කල්හි තිබේද, නොපෙරෙලෙන ස්වභාවය ඇත්තීවේද, සදාකාලික වස්තුවක්සේ එපරිද්දෙන්ම සිටින්නීද? (එබඳු) කිසි සංඥාවක් තොමෝ ඇත්තීද?

"ස්වාමීනි! යම් සංස්කාර කෙනෙක් නිත්‍යවෙද්ද, ස්ථිර වෙද්ද, හැමදා තිබෙද්ද, නොපෙරෙලෙන ස්වභාවය ඇත්තාහු වෙද්ද, සදාකාලික වස්තුවක් සමානව එපරිද්දෙන්ම සිටිද්ද, (එබඳු) කිසි සංස්කාර කෙනෙක් ඇත්තාහුද?

"ස්වාමීනි, යම් විඥානයෙක් නිත්‍යවේද, ස්ථිරවේද, හැම කල්හි තිබේද, නොපෙරෙලෙන ස්වභාවය ඇත්තේවේද, සදාකාලික ද්‍රව්‍යයක් මෙන් එපරිද්දෙන්ම සිටින්නේද (එබඳු) කිසි විඥානයෙක් ඇත්තේද?

3. "මහණ, යම් රූපයෙක් නිත්‍යවේද, ස්ථිරවේද, නොපෙරෙලෙන ස්වභාවය ඇත්තේ වේද, සදාකාලික වස්තුවක්

බඳුව එපරිද්දෙන්ම සිටින්නේද, (එබඳු) කිසි රූපයෙක් නැත්තේමය.

"මහණ, යම් වේදනාවක් තොමෝ නිත්‍යවන්නීද, ස්ථිර වන්නීද, හැමකල්හි තිබේද, නොපෙරෙලෙන ස්වභාවය ඇත්තීවේද, සදාකාලික දෙයක් මෙන් එසේම සිටින්නීද, (එබඳු) කිසි වේදනාවක් තොමෝ නැත්තීමය.

"මහණ, යම් සංඥාවක් තොමෝ නිත්‍යවන්නීද, ස්ථිර වන්නීද, හැම කල්හි තිබෙන්නීද, නොපෙරෙලෙන ස්වභාවය ඇත්තීවේද, සදාකාලික වස්තුවක්සේ එපරිද්දෙන්ම සිටින්නීද, (එබඳු) කිසි සංඥාවක් තොමෝ නැත්තීමය.

"මහණ, යම් සංස්කාර කෙනෙක් නිත්‍යවෙද්ද, ස්ථිර වෙද්ද, හැමකල්හි තිබෙන්නීද, නොපෙරෙලෙන ස්වභාවය ඇත්තාහු වෙද්ද, සදාකාලික ද්‍රව්‍යයක් සමානව එසේම සිටින්නාහුද, (එබඳු) කිසි සංස්කාර කෙනෙක් නැත්තාහුමය.

"මහණ, යම් විඥානයෙක් නිත්‍යවේද, ස්ථිරවේද, හැම කල්හි තිබේද, නොපෙරෙලෙන ස්වභාවය ඇත්තේ වේද, සදාකාලික වස්තුවක් බඳුව එසේම සිටින්නේද, (එබඳු) කිසි විඥානයෙක් නැත්තේමයයි" (වදාළසේක.)

**(හයවෙනි සාමුද්දක සූත්‍රය නිමි.)**

---

## 7. හද්දුලා සූත්‍රය - 1

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතුසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, අවිජ්ජාවෙන් වැසී ගියාවූ තණ්හාවෙන් බැඳුනාවූ නැවත නැවත ඇවිදින්නාවූ නැවත නැවත

සැරිසරන්නාවූ සත්ත්වයන්ගේ මේ සසර නොදන්නා ලද කෙළවර ඇත්තේය, මුල් කොණ නොපෙනෙයි.

"මහණෙනි, යම්හෙයකින් මහමුහුද සිඳෙන්නේද, විශෙෂයෙන් වියලෙන්නේද, විද්‍යමාන නොවේද, එබඳු කලක් වන්නේමය. මහණෙනි, අවිජ්ජාවෙන් වැසී ගියාවූ තණ්හාවෙන් බැඳුනාවූ නැවත නැවත දිවන්නාවූ නැවත නැවත සැරිසරන්නාවූ සත්ත්වයන්ගේ දුක් කෙළවර කිරීම මම නොකියමි.

"මහණෙනි, යම් කලෙක්හි මේ මහාමේරු පර්වතරාජයා දැවේද, වැනසේද, අවිද්‍යමාන වේද, ඒ කාලය වන්නේමය. මහණෙනි, අවිජ්ජාවෙන් වැසුණු තණ්හාවෙන් බැඳුණු නැවත නැවත දිවන්නාවූ නැවත නැවත සැරිසරන්නාවූ සත්ත්වයන්ගේ දුක් කෙළවර කිරීම මම නොකියමි.

"මහණෙනි, යම්කලෙක මේ මහපොළොව දැවේද, වැනසේද, විද්‍යමාන නොවේද, ඒ කාලය වන්නේමය. මහණෙනි, අවිජ්ජාවෙන් වැසුණු තණ්හාවෙන් බැඳුණු ඇවිදින්නාවූ, නැවත නැවත සැරිසරන්නාවූ, සත්ත්වයන්ගේ දුක් කෙළවර කිරීම මම නොම කියමි.

3. "මහණෙනි, යම්සේ වනාහි බලුදමෙන් බඳනාලද සුනඛ තෙම තදවූ මහ උලෙක හෝ කණුවක හෝ බඳනාලද්දේ එම උල හෝ කණුව හෝ වටේ නැවත නැවත දිවේද, අවට කරකැවේද, මහණෙනි, එපරිද්දෙන්ම ආර්යයන් නොදක්නාවූ ආර්ය ධර්මයෙහි අදක්ෂවූ ආර්ය ධර්මයෙහි නොහික්මුණාවූ සත්පුරුෂයන් නොදක්නාවූ සත්පුරුෂ ධර්මයෙහි දක්ෂ නුවූ සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුණු ඇසූ පිරූ තැන් නැත්තාවූ පෘථග්ජනතෙම රූපය ආත්ම වශයෙන් දක්නේය, තමා රූපය ඇත්තක් කොට හෝ තමා කෙරෙහි රූපය හෝ රූපයෙහි තමා හෝ දක්නේය. වේදනාව ආත්ම වශයෙන් හෝ තමා වේදනාව ඇත්තක් කොට හෝ තමා කෙරෙහි වේදනාව හෝ වේදනාවෙහි තමා හෝ දක්නේය. සංඥාව ආත්ම වශයෙන් හෝ තමා සංඥාවක් ඇත්තක් කොට හෝ තමා කෙරෙහි සංඥාව හෝ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සංඥාවෙහිලා තමා හෝ දක්නේය. සංස්කාරයන් ආත්ම වශයෙන් හෝ තමා සංස්කාරයන් ඇත්තක් කොට හෝ තමා කෙරෙහි සංස්කාරයන් හෝ සංස්කාරයන්හි තමා හෝ දක්නේය. විඥානය ආත්ම වශයෙන් හෝ තමා විඥානය ඇත්තක් කොට හෝ තමා කෙරෙහි විඥානය හෝ විඥානයෙහි තමා හෝ දක්නේය.

4. "හෙතෙම රූපයෙහිම බැඳී දුවයි. නැවත නැවත පෙරලෙයි, වේදනාවෙහිම බැඳී දිවෙයි. නැවත නැවත පෙරලෙමින් පවතී. සංඥාවෙහිම බැඳී දුවයි, නැවත නැවත පෙරෙලෙමින් පවතී. සංස්කාරයන්හි බැඳී දුවයි, නැවත නැවත පෙරලෙමින් පවතී. විඥානයෙහිම බැඳී දුවයි, නැවත නැවත පෙරලෙමින් පවතී.

"හෙතෙම රූපය අනුව දුවන්නේ, පෙරලෙන්නේ, වේදනාව අනුව දුවන්නේ, පෙරලෙන්නේ, සංඥාව අනුව දුවන්නේ, පෙරලෙන්නේ, සංස්කාරයන් අනුව දුවන්නේ, පෙරලෙන්නේය, විඥානය අනුව දුවන්නේ, පෙරලෙන්නේ, රූපයෙන් නොමිදේ, වේදනාවෙන් නොමිදේ, සංඥාවෙන් නොමිදේ, සංස්කාරයන්ගෙන් නොමිදේ, විඥානයෙන් නොමිදේ, ඉපදීමෙන්ද ජරාවෙන්ද මරණයෙන්ද සෝකයෙන්ද, හැඬීමෙන්ද කායික දුකින්ද දොම්නසින්ද වැලපීමෙන්ද නොමිදේ, දුකින් නොමිදේ යයි මම කියමි.

"මහණෙනි, ආර්යයන් දක්නාවූ ආර්යයන්ගේ ධර්මයෙහි දක්ෂවූ ආර්යධර්මයෙහි හික්මුණාවූ සත්පුරුෂයන් දක්නාවූ සත්පුරුෂයන්ගේ ධර්මයෙහි දක්ෂවූ සත්පුරුෂ ධර්මයෙහි හික්මුණාවූ බොහෝ ඇසූ පිරූතැන් ඇති ආර්ය ශ්‍රාවකතෙම රූපය තමා යයි හෝ නොදක්නේය. තමා රූපය ඇත්තෙකැයි හෝ නොදක්නේය. තමා කෙරෙහි රූපය හෝ නොදක්නේය. රූපයෙහි තමා හෝ නොදක්නේය.

"වේදනාව ආත්මයයි හෝ නොදක්නේය, තමා වේදනාව ඇත්තෙකැයි නොදක්නේය, තමා කෙරෙහි වේදනාව හෝ නොදක්නේය, වේදනාවෙහි තමා හෝ නොදක්නේය.

"සංඥාව තමා යයි හෝ නොදක්නේය, තමා සංඥාව ඇත්තෙකැයි හෝ නොදක්නේය, තමා කෙරෙහි සංඥාව හෝ නොදක්නේය, සංඥාවෙහි තමා හෝ නොදක්නේය.

"සංස්කාරයන් තමා යයි හෝ නොදක්නේය, තමා සංස්කාරයන් ඇත්තක් කොට හෝ නොදක්නේය, තමා කෙරෙහි සංස්කාරයන් හෝ නොදක්නේය, සංස්කාරයන්හි තමා හෝ නොදක්නේය.

විඥානය තමා යයි හෝ නොදක්නේය, තමා විඥානය ඇත්තෙක් කොට හෝ නොදක්නේය. තමා කෙරෙහි විඥානය හෝ නොදක්නේය, විඥානයෙහි තමා හෝ නොදක්නේය.

**5.** "හෙතෙම රූපයෙහි බැඳී නොදුවයි, නැවත නැවත නොපෙරලෙයි. වේදනාවෙහි බැඳී නොදුවයි, නැවත නැවත නොපෙරලෙයි. සංඥාවෙහි බැඳී නොදුවයි, නැවත නැවත නොපෙරලෙයි. සංස්කාරයෙහි බැඳී නොදුවයි, නැවත නැවත නොපෙරලෙයි. විඥානයෙහි බැඳී නොදුවයි, නැවත නැවත නොපෙරලෙයි.

"හෙතෙම රූපයෙහි බැඳී නොදුවන්නේ, නැවත නැවත නොපෙරලෙන්නේ. වේදනාවෙහි බැඳී නොදුවන්නේ, නැවත නැවත නොපෙරලෙන්නේ, සංඥාවෙහි බැඳී නොදුවන්නේ, නැවත නැවත නොපෙරලෙන්නේ, සංස්කාරයන්හි බැඳී නොදුවන්නේ, නැවත නැවත නොපෙරලෙන්නේ, විඥානයෙහි බැඳී නොදුවන්නේ, නැවත නැවත නොපෙරලෙන්නේ. රූපයෙන් මිදේ, වේදනාවෙන් මිදේ, සංඥාවෙන් මිදේ, සංස්කාරයන්ගෙන් මිදේ, විඥානයෙන් මිදේ, ඉපදීමෙන්ද ජරාවෙන් හා මරණයෙන්ද සෝකයෙන්ද හැඬීමෙන්ද දුකින්ද වැලපීමෙන්ද මිදේ, දුකින් මිදේයයි කියමි"යි වදාළසේක.

**(හත්වෙනි ගද්දුලා සූත්‍රය නිමි-1)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

# 8. ගද්දුලා සූත්‍රය.(2)

1. මා විසින් මෙසේ අසන ලදී. එක කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවත්නුවර සමීපයෙහි වූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතුසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "අවිජ්ජාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳුණු, (සසර) නැවත නැවත දුවන්නා වූ, සැරිසරන්නා වූ, සත්ත්වයන්ගේ මේ සසර නොදන්නාලද කොන් ඇත්තේය. පූර්ව කෙළවර නොපෙණෙයි. මහණෙනි, යම්සේ වනාහි බලුදමින් බඳනාලද සුනඛතෙම තද හුලෙක වේවයි මහ කණුවක වේවයි බඳනා ලද්දේ වේද, ඉදින් ඒ බල්ලා නම් එම හුලේ හෝ කණුවේ හෝ සමීපයට යයි, ඉදින් සිටී නම් එම හුලේ හෝ කණුවේ හෝ ළඟම සිටී, ඉදින් හිඳී නම් එම හුලේ හෝ කණුවේ ළඟ හිඳී, ඉදින් ලගී නම් එම හුලේ හෝ කණුවේ හෝ ළඟ ලගී.

3. 'මහණෙනි, එපරිද්දෙන්ම ඇසූ පිරූ තැන් නැති පෘථජ්ජනතෙම ' මේ රූපය මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්ම'යයි රූපය ආත්මයයි දෘෂ්ටි වශයෙන් දක්නේය. 'මේ වේදනාව මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්ම'යයි වේදනාව ආත්මයයි දක්නේය. 'මේ සංඥාව මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්ම'යයි සංඥාව ආත්මයයි දක්නේය. මේ සංස්කාරක මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්ම'යයි සංස්කාරයන් ආත්මයයි දක්නේය. 'මේ විඥානය මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්ම'යි විඥානය ආත්මයයි දක්නේය.

4. "ඉදින් ඒ පෘථග්ජනතෙම යයි නම් මේ පඤ්චඋපාදානස්කන්ධයන් කරාම යෙයි. ඉදින් සිටී නම් මේ පඤ්චඋපාදානස්කන්ධයන් කරාම සිටී. ඉදින් හොවී නම් මේ පඤ්චඋපාදානස්කන්ධයන් කරාම හොවී. ඉදින් හිඳී නම් මේ පඤ්චඋපාදානස්කන්ධයන් කරාම හිඳී එහෙයින් මහණෙනි,

'දීර්ඝ කාලයක් මුලුල්ලෙහි මේ සිත රාගයෙන්ද, ද්වේෂයෙන්ද, මෝහයෙන්ද, අතිශයින් කිලිටියයි නිරතුරුව තමාගේ සිත ගැන නුවණින් සලකා බැලිය යුතුය.

**5.** "මහණෙනි, සත්ත්වයෝ සිත කිලිටුවීමෙන් කිලුටු වන්නාහුය. සත්ත්වයෝ සිත පිරිසිදුවීමෙන් විශෙෂයෙන් පිරිසිදු වෙත්. මහණෙනි, තොප විසින් 'හැසිරෙන' සිතියමක් නම් දක්නා ලද්දේද?" - "ස්වාමීනි, එසේය"

"මහණෙනි, ඒ හැසිරෙන සිතියමද සිතින්ම සිතන ලද්දේය. මහණෙනි, ඒ හැසිරෙන සිතියමටද වඩා සිතම ඉතා විසිතුරුය.

"මහණෙනි, එහෙයින් 'බොහෝ කලක් මුලුල්ලේ රාගයෙන්ද, ද්වේෂයෙන්ද, මොහයෙන්ද, මේ සිත අතිශයින් කෙලෙසුණේ" යයි නිතර ස්වකීය වූ සිත ගැන(නුවණින්) සලකා බැලිය යුතුය.

"මහණෙනි, සත්ත්වයෝ සිත කෙලෙසීමෙන් කෙළෙසෙන්නාහුය. සිත පිරිසිදුවීමෙන් විශෙෂයෙන් පිරිසිදු වන්නාහුය.

"මහණෙනි, මේ සිත යම්සේද, මම එබඳුවූ අන් එක නිකායකුදු (සමාන වර්ගයක්) නොමදකිමි.

"මහණෙනි, මේ තිරිසන්ගත සත්ත්වයෝ වෙද්ද, මහණෙනි, ඒ තිරිසන්ගත සත්ත්වයෝද කර්ම සිතින්ම විසිතුරු වූහ.

"මහණෙනි, එහෙයින් 'බොහෝ කලක් මුලුල්ලෙහි රාගයෙන්ද, ද්වේෂයෙන්ද, මොහයෙන්ද මේ සිත අතිශයින් කෙළෙසුණේ'යයි නිතර ස්වකීය වූ සිත ගැන (නුවණින්) සලකා බැලිය යුතුය.

**6.** "මහණෙනි, යම්සේ වනාහි (රදවෙක්) රෙදිපාට කරන්නෙක් හෝ සිත්තරෙක් හෝ විද්‍යමාන වූ සායමකින් හෝ ලාකඩින් හෝ කහයෙන් හෝ නිලින් හෝ මදටියෙන් හෝ අතිශයින් මට්ටම්වූ පුවරුවෙක හෝ බිත්තියෙක හෝ රෙදිපටෙක හෝ සියලු අඟපසඟින් යුත් ස්ත්‍රී රූපයක් හෝ පුරුෂ රූපයක් හෝ මනාකොට මවන්නේ ද, මහණෙනි, එපරිද්දෙන්ම ඇසූ පිරූ

තැන් නැත්තාවූ පෘථග්ජන තෙම උපදවන්නේ රූපයම උපදවයි. උපදවන්නේ වේදනාවම උපදවයි. උපදවන්නේ සංඥාවම උපදවයි. උපදවන්නේ සංස්කාරයන්ම උපදවයි. උපදවන්නේ විඥානයම උපදවයි.

7. "මහණෙනි, ඒ කුමැයි සිතන්නෙහිද? රූපය නිත්‍ය හෝ වේද, අනිත්‍ය හෝ වේද?... 'ස්වාමීනි, අනිත්‍යය.'

"යමක් වනාහි අනිත්‍ය වේද, එය දුක් හෝ සැප හෝ වේද?... ස්වාමීනි, දුකය

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, පෙරලෙන ස්වාභාවය ඇත්තේද, එය 'මේ රූපය මාගේය, මේ මම වෙමි. මේ මාගේ ආත්ම'යයි ඒ රූපය (දෘෂ්ටි වශයෙන්) දක්නට සුදුසුද?..." "ස්වාමීනි, මේ සුදුසු නොවේමය"

"මහණෙනි, වේදනා තොමෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?..." "ස්වාමීනි, අනිත්‍යය"

"යම් වේදනාවක් තොමෝ අනිත්‍ය වේද, ඒ දුක් හෝ සැප හෝ වේද?" "ස්වාමීනි දුක් වෙයි."

"යමක් වනාහි අනිත්‍ය වේද, දුක් වේද, පෙරලෙන ස්වාභාවය ඇත්තේ වේද, 'මේ වේදනාව මාගේය. මේ මම වෙමි. මේ මගේ ආත්මය'යයි ඒ වේදනාව දක්නට සුදුසුද?"... " ස්වාමීනි, මේ සුදුසු නොවේමය.

"මහණෙනි සංඥා තොමෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"..."ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම් එය දුක් හෝ සැප හෝ වේද?"... "ස්වාමීනි, දුක් වේ."

"යමක් වනාහි අනිත්‍ය වේද, දුක් වේද, පෙරලෙන ස්වාභාවය ඇත්තේ වේද, 'මේ සංඥාව මාගේය, මේ මම වෙමි, මේ මාගේ ආත්මය'යි ඒ සංඥාව දක්නට සුදුසු වේද?..."ස්වාමීනි, මෙය සුදුසු නොවේමය."

"මහණෙනි සංස්කාරයෝ නිත්‍ය හෝ අනිත්‍ය වේද?"... "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම් ඒ දුක් හෝ සැප වේද?"... "ස්වාමීනි, දුක් වේ."

"යමක් වනාහි අනිත්‍ය වේද, දුක් වේද, පෙරලෙන ස්වාභාවය ඇත්තේ වේද, 'මේ සංස්කාරයන් මාගේය, මේ මම වෙමි, මේ මාගේ ආත්මය'යි ඒ සංස්කාරයන් දක්නට සුදුසු වේද?..."ස්වාමීනි, මෙය සුදුසු නොවේමය."

"මහණෙනි විඥානය නිත්‍ය හෝ අනිත්‍ය වේද?"..."ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම් ඒ දුක් හෝ සැප වේද?"... "ස්වාමීනි, දුක් වේ."

"යමක් වනාහි අනිත්‍ය වේද, දුක් වේද,පෙරලෙන ස්වාභාවය ඇත්තේ වේද,'මේ විඥානය මාගේය, මේ මම වෙමි, මේ මාගේ ආත්මය"යි ඒ විඥානය දක්නට සුදුසු වේද?"..."ස්වාමීනි, සුදුසු නොවේමය.

8. "එහෙයින් මහණෙනි, තමා පිළිබඳවූ හෝ අනුන් පිළිබඳවූ හෝ මහත් සියුම්වූ හෝ හීනවූ හෝ උස්වූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, යම්කිසි රූපයෙක් වේද, දුරවූ හෝ ළඟවූ හෝ යම් රූපයෙක් වේද, 'මේ රූපය මාගේ නොවේ, මේ මම නොවෙමි, මේ මාගේ ආත්මය නොවේ'යයි ඒ මේ සියලු රූපය මෙසේ තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දතයුතුය.

"තමා පිළිබඳවූ හෝ අනුන් පිළිබඳවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උසස්වූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද යම්කිසි වේදනාවක් වේද, දුරවූ හෝ ළඟවූ හෝ යම්කිසි වේදනාවක් වේද, 'මේ වේදනා තොමෝ මාගේ නොවේ, මේ මම නොවෙමි, මේ මාගේ ආත්මය නොවේ'යයි ඒ මේ හැම වේදනාව මෙසේ තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය.

"තමා පිළිබඳවූ හෝ අනුන් පිළිබඳවූ හෝ මහත් වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උසස්වූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, යම්කිසි සංඥාවක් වේද, දුරවූ හෝ ළඟවූ හෝ යම් සංඥාවක් වේද, 'මේ සංඥා තොමෝ මාගේ නොවේ, මේ මම නොවෙමි. මේ මාගේ ආත්මය නොවේ'යයි ඒ මේ සියලු සංඥාව මෙසේ තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දතයුතුය.

"තමා පිළිබඳවූ හෝ අනුන් පිළිබඳ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උසස්වූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, යම් සංස්කාරයෝ වෙද්ද, දුරවූ හෝ ළඟවූ හෝ යම් සංස්කාරයෝ වෙද්ද, මේ 'සංස්කාර ස්කන්ධය මාගේ නොවේ, මේ මම නොවෙමි, මේ මාගේ ආත්මය නොවේ'යයි මෙසේ ඒ සියලු සංස්කාර ස්කන්ධය තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දතයුතුය.

"තමා පිළිබඳවූ හෝ අනුන් පිළිබඳවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උසස්වූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද යම්කිසි විඥානයෙක් වේද, දුරවූ හෝ ළඟවූ හෝ යම් විඥානයක් වේද, 'මේ විඥානය මාගේ නොවේ, මේ මම නොවෙමි, මේ මාගේ ආත්මය නොවේ'යයි මෙසේ ඒ මේ හැම විඥානය තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දතයුතුය.

**9.** "මහණෙනි, මෙසේ දක්නාවූ ආර්යශ්‍රාවකතෙම රූපයෙහිද කලකිරෙයි, වේදනාවෙහිද කලකිරෙයි, සංඥාවෙහිද කලකිරෙයි, සංස්කාරයන්හිද කලකිරෙයි, විඥානයෙහිද කලකිරෙයි. කලකිරුණේ නොඇලෙයි, නොඇලීමෙන් (කෙලෙසුන්ගෙන්) මිදෙයි, මිදුනුකල්හි 'මිදුණේ' යයි දැනීම වෙයි. ඉපදීම ක්ෂය විය. මාර්ගබ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවන ලද්දේය. කළයුතු දේ කොට නිමවන ලද්දේය. මේ ආත්මභාවයෙහි කළයුතු අනිකක් නැතැයි විශෙෂයෙන් දැනගනී."

**(අටවෙනි ගද්දුල සූත්‍රය 2. නිමි.)**

---

## 9. නාවා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, මම දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීම කියමි. නොදන්නහුගේ නොදක්නහුගේ නොකියමි. මහණෙනි, කුමක් දන්නහුගේ කුමක් දක්නහුගේ ආශ්‍රවයන් ක්ෂය වේද, රූපය මෙසේය, රූපයගේ ඉපදීම මෙසේය, රූපයගේ විනාශය මෙසේය, වේදනාව මෙසේය, වේදනාවගේ ඉපදීම මෙසේය, වේදනාවගේ විනාශය මෙසේය, සංඥාව මෙසේය, සංඥාවගේ ඉපදීම මෙසේය, සංඥාවගේ විනාශය මෙසේය, සංස්කාරයෝ මෙසේය, සංස්කාරයන්ගේ ඉපදීම මෙසේය, සංස්කාරයන්ගේ විනාශය මෙසේය. විඥානය මෙසේය, විඥානයාගේ ඉපදීම මෙසේය, විඥානයාගේ විනාශය මෙසේය. මහණෙනි, මෙසේ දන්නහුගේ මෙසේ දක්නහුගේ ආශ්‍රවයන්ගේ ක්ෂය වෙයි.

3. "මහණෙනි, භාවනා කිරීමෙහි නැවත නැවත යෙදී වසන මහණහට ඒකාන්තයෙන් මෙබඳු කැමැත්තක් උපදින්නේය. "මාගේ සිත දැඩිකොට අල්වා නොගෙන ආශ්‍රවයන්ගෙන් මිදෙන්නේ නම් ඉතා යෙහෙක (කියායි.)

"එතකුදුවුවත් ඔහුගේ සිත දැඩිකොට අල්වා නොගෙන ආශ්‍රවයන් කෙරෙන් නොමිදේ, ඊට හේතු කවරේද? ඔහුගේ (සිත) නොවැඩූ බැවිනැයි කිය යුතුය. කුමක් නොවඩනා ලද බැවින්ද, සතර සතිපට්ඨානයන් නොවඩනා ලද බැවින්ද, සතර සම්‍යක් ප්‍රධාන වීර්යයන් නොවඩනා ලද බැවින්ද, සතර ඍද්ධිපාදයන් නොවඩනාලද බැවින්ද, පඤ්චෙන්ද්‍රියයන් නොවඩනා ලද බැවින්ද පඤ්චබලයන් නොවඩනා ලද බැවින්ද,

සප්ත බොධ්‍යංගයන් නොවඩන ලද බැවින්ද, ආර්ය අෂ්ටාංගික මාර්ගය නොවඩනාලද බැවින්ද (වෙයි.)

4. "මහණෙනි, යම්සේ වනාහි කිකිළියගේ බිජු අටක් හෝ දසයක් හෝ දොළසක් හෝ වේද්ද, ඒ බිජු කිකිළිය විසින් මනාකොට සයනය නොකරන ලද්දාහු වෙද්ද, මනාකොට හාත්පස උණුසුම් නොකරන ලද්දාහු වෙද්ද, හාත්පස මනා කොට කුකුල් ගඳ නොගන්වන ලද්දාහු වෙද්ද, (එවිට) කිසිසේත් ඒ කිකිළියට 'මාගේ කුකුළු පැටව් පා නිය අගින් හෝ මුවතුඩින් හෝ බිත්තර කටුව පළාගෙන සුවසේ පිටවන්නාහු නම් ඉතා මැනව'යි මෙබඳු කැමැත්තක් නූපදින්නේය. එතකුදුවුවත් ඒ කුකුළු පැටව් පා අගින් හෝ මුව තුඩින් හෝ බිත්තර කටුව පළාගෙන සුවසේ පිටවන්නට නුසුදුස්සෝම වෙති. ඊට හේතු කවරේද?

5. "මහණෙනි, ඒ කියන ලද ප්‍රකාරවූම කිකිළියගේ බිජු අටක් හෝ දසයක් හෝ දොළසක් හෝ වෙද්ද, ඒ බිජු කිකිළිය විසින් මත්තෙහි මනාකොට සයනය නොකරන ලද්දාහු වෙත්. මනාකොට හාත්පස උණුසුම් නොගන්වන ලද්දාහු වෙත්. මනාකොට කුකුළු ගඳ නොගන්වන ලද්දාහුවෙත්. (එහෙයිනි,)

"මහණෙනි, එපරිද්දෙන්ම භාවනා කිරීමෙහි නැවත නැවත නොයෙදී වසන මහණහට 'මාගේ සිත (උපාදානයන් විසින්) අල්වා නොගෙන ආශ්‍රවයන් කෙරෙන් මිදෙන්නේ නම් ඉතා යෙහෙකැ'යි කිසිසේත් මෙබඳු සිතෙක් උපදින්නේද, එතකුදුවුවත් ඒ මහණහුගේ සිත දැඩිව අල්වා නොගෙන ආශ්‍රවයන්ගෙන් නොමිදේ. ඊට හේතු කවරේද? ඔහු විසින් නොවඩනා ලද බැවිනැයි කිය යුතුය. කුමක්හු නොවඩනා ලද බැවින්ද? සතර සතිපට්ඨානයන් නොවඩනා ලද බැවිනුදු, සතර සම්‍යක් ප්‍රධාන වීර්යයන් නොවඩනා ලද බැවිනුදු, සතර ඍද්ධිපාදයන් නොවඩනා ලද බැවිනුද, පඤ්චෙන්ද්‍රියන් නොවඩනා ලද බැවිනුදු, පඤ්චබලයන් නොවඩනා ලද බැවිනුදු, සප්තබොධ්‍යංගයන් නොවඩනාලද බැවිනුදු, ආර්ය අෂ්ටාංගික මාර්ගය නොවඩනාලද බැවිනුදු (වෙයි.)

**6.** "මහණෙනි, භාවනා කිරීමෙහි නැවත නැවත යෙදී වසන මහණහට "(උපාදානයන් විසින්) තදින් අල්ලා නොගෙන මාගේ සිත ආශ්‍රවයන්ගෙන් මිදෙන්නේ නම් ඉතා යෙහෙකැ"යි කිසිසේත් මෙබඳු සිතෙක් උපදින්නේද, ඉක්බිති දැඩිකොට අල්ලා නොගෙන ආශ්‍රවයන්ගෙන් ඔහුගේ සිත මිදේ. ඊට හේතු කවරේද? ඔහු විසින් වඩනලද බැවිනැයි කිය යුතුය. කුමක් වඩනලද බැවින්ද? සතරසතිපට්ඨානයන් වඩනලද බැවිනුදු, සතර සම්‍යක් ප්‍රධානයන් වඩනලද බැවිනුදු, සතර ඍද්ධිපාදයන් වඩනලද බැවිනුදු, පඤ්චෙන්ද්‍රියයන් වඩන ලද බැවිනුදු, පඤ්ච බලයන් වඩනලද බැවිනුදු, සප්තබොධ්‍යංගයන් වඩනලද බැවිනුදු, ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩනලද බැවිනුදු (වෙයි.)

**7.** "මහණෙනි, යම්සේ වනාහි කිකිළියගේ බිජු අටක් හෝ දසයක් හෝ දොළසක් හෝ වෙද්ද, ඒ බිජු කිකිළිය විසින් මනාකොට මත්තෙහි සයනය කරන ලද්දාහු වෙද්ද, මනාකොට හාත්පස උණුසුම් ගන්වන ලද්දාහු වෙද්ද, මනාකොට කුකුළුගඳ ගන්වන ලද්දාහු වෙද්ද, කිසිසේත් ඒ කිකිළියට 'මාගේ කුකුළු පැටව් පා අගින් හෝ මුවතුඩින් හෝ බිජුවට පළාගෙන සුවසේ පිටතට නික්මෙන්නාහු නම් ඉතා යෙහෙකැ'යි මෙබඳු කැමැත්තක් නො උපදින්නේද, එතකුදු වුවත් ඒ කුකුළු පැටව් පා නිය අගින් හෝ මුවතුඩින් හෝ බිජුවට පළාගෙන සුවසේ පිටතට නික්මෙන්නට සුදුස්සෝම වෙති. ඊට හේතු කවරේද?

**8.** "මහණෙනි, ඒ ප්‍රකාරවූම කිකිළියගේ බිජු අටක් හෝ දසයක් හෝ දොළසක් හෝ වෙද්ද? ඒ බිජු කිකිළිය විසින් මනාව මත්තෙහි හෝනා ලද්දාහු වෙති. මනාව හාත්පස උණුසුම් ගන්වන ලද්දාහු වෙති. මනාව හාත්පස කුකුළු ගඳ ගන්වන ලද්දාහු වෙති.

"මහණෙනි, එපරිද්දෙන්ම භාවනා කිරීමෙහි නැවත නැවත යෙදී වාසය කරන්නාවූ මහණහට කිසිසේත් (උපාදාන වශයෙන්) තදින් අල්ලා නොගෙන ආශ්‍රවයන්ගෙන් මාගේ සිත මිදෙන්නේ නම් ඉතා යෙහෙකැ'යි මෙබඳු කැමැත්තක් නො උපදින්නේද,

එතකුදුවුවත් (උපාදාන වශයෙන්) නොගෙන ආශ්‍රවයන්ගෙන් ඔහුගේ සිත මිදෙයි. ඊට හේතු කවරේද? වැඩුණු බැවිනැයි කියයුතු වන්නේය. කුමක් වඩන ලද බැවින්ද? සතර සතිපට්ඨානයන් වඩනලද බැවින්ද, සතර සම්‍යක් ප්‍රධාන වීර්යයන් වඩන ලද බැවින්ද, සතර ඍද්ධිපාදයන් වඩනලද බැවින්ද, පඤ්චෙන්ද්‍රියයන් වඩනලද බැවින්ද, පඤ්චබලයන් වඩනලද බැවින්ද, සප්තබොධ්‍යංගයන් වඩන ලද බැවින්ද, ආර්‍ය අෂ්ටාංගික මාර්ගය වඩනලද බැවින්ද වේ.

**9.** "මහණෙනි, යම්සේ වනාහි වඩුවාගේ හෝ වඩු අතවැස්සාගේ හෝ වෑමිටෙහි ඇඟිලි පාරවල් දක්නා ලැබෙද්ද, මහපට ඇඟිලි පාරවල් හෝ දකිනු ලැබෙද්ද, 'මාගේ වෑමිට අද මෙපමණ ගෙවුණේය ඊයේ මෙපමණ ගෙවුණේය. පෙරේදා මෙපමණ ගෙවුණේ'යයි ඔහුගේ මෙසේ දැනීමෙක් නොවේමය. එතකුදුවුවත් නැතිවූ කල්හි නැතිවූයේය යන දැනීම ඇතිවෙයි.

**10.** "මහණෙනි, එපරිද්දෙන්ම භාවනා කිරීමෙහි නැවත නැවත යෙදී වසන මහණහට 'අද මාගේ ආශ්‍රවයන් අතුරෙන් මෙපමණ ක්ෂයවීයයි හෝ ඊයේ මෙපමණ ක්ෂයවීයයි හෝ පෙරේදා මෙපමණ ක්ෂයවීයයි හෝ' කිසිසේත් මෙසේ දැනීම ඇති නොවේද, එතකුදුවුවත් ක්ෂයවූ කල්හි ක්ෂයවීමයයි දැනීම වෙයි.

**11.** "මහණෙනි, යම්සේ වනාහි සමසක් මුළුල්ලෙහි දියෙහි දමා හේමන්ත කාලයෙහි ගොඩට ගන්නා ලද්දාවූ වේවැල් බැඳුමෙන් බඳින ලද්දාවූ මූදේ යන නැවකගේ බැම් අව් සුළඟින් වියලුනාහු වෙද්ද, ඒ බැම් වැසිකල වසින වැස්සෙන් තෙමෙන ලද්දාහු ලෙහෙසියෙන්ම දුබල වෙද්ද, දිරායද්ද, මහණෙනි, එපරිද්දෙන්ම භාවනා කිරීමෙහි නැවත නැවත යෙදී වසන මහණහුගේ සංයෝජනයෝ ලෙහෙසියෙන්ම යටපත් වෙත්. කුණුවෙත්"

**(නවවෙනි නාවා සූත්‍රය නිමි.)**

## 10. සඤ්ඤා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, වඩන ලද, පුරුදු කරනලද අනිත්‍ය සංඥාව සියලු කාමරාගය ක්ෂය කරයි. සියලු රූපරාගය ක්ෂය කරයි. සියලු භවරාගය ක්ෂය කරයි. සියලු අවිද්‍යාව ක්ෂය කරයි. සියලු අස්මිමානය ක්ෂය කරයි. සහමුලින්ම විනාස කෙරෙයි.

"මහණෙනි, යම්සේ වනාහි සරත් කාලයෙහි ගොවියෙක් මහ නඟුලෙන් සීසාන්නේ ඇද තුබූ මුල් මනාව කඩමින් සීසාද, එපරිද්දෙන්ම මහණෙනි, වඩනලද, පුරුදුකරනලද අනිත්‍ය සංඥාව සියලු කාමරාගය ක්ෂය කෙරෙයි, සියලු රූපරාගය ක්ෂය කෙරෙයි, සියලු භවරාගය ක්ෂය කෙරෙයි, සියලු අවිද්‍යාව ක්ෂය කෙරෙයි. සියලු අස්මිමානය ක්ෂය කෙරෙයි, සහමුලින්ම විනාස කෙරෙයි.

3. "මහණෙනි, යම්සේ වනාහි බබුස් තණ කපන්නා බබුස් තණ කපා අග අල්වාගෙන සලාද, පොළාද, ගසාදමාද, මහණෙනි, එපරිද්දෙන්ම වඩනලද, පුරුදු කරනලද අනිත්‍ය සංඥාව සියලු කාමරාගය ක්ෂය කෙරෙයි, සියලු රූපරාගය ක්ෂය කෙරෙයි, සියලු භවරාගය ක්ෂය කෙරෙයි, සියලු අවිද්‍යාව ක්ෂය කෙරෙයි, සියලු අස්මිමානය ක්ෂය කෙරෙයි, සහමුලින්ම විනාස කෙරෙයි.

4. "මහණෙනි, යම්සේ වනාහි අඹවල්ලෙහි නැට්ට සිඳිනලද කල්හි එහි නැට්ටෙහි බැඳුණු යම් අඹ ගෙඩි වෙද්ද, ඒ සියලු ගෙඩි ඒ අඹ කැනැත්තට අනුගත වෙද්ද, එපරිද්දෙන්ම මහණෙනි, වඩනලද පුරුදු කරනලද අනිත්‍ය සංඥාව සියලු කාමරාගය ක්ෂය කෙරෙයි, සියලු රූපරාගය ක්ෂය කෙරෙයි, සියලු භව

රාගය ක්ෂය කෙරෙයි, සියලු අවිද්‍යාව ක්ෂය කෙරෙයි, සියලු අස්මිමානය ක්ෂය කෙරෙයි, සහමුලින්ම විනාස කෙරෙයි.

**5.** "මහණෙනි, යම්සේ වනාහි මුදුන් ගෙයක යම්කිසි පරාල වෙද්ද, ඒ සියලු පරාල මුදුනකරා යෙද්ද, මුදුනට වදින බැවින් එයට නැඹුරු වෙද්ද, මුදුනට මනාව රැස්ව සිටිද්ද, මුදුන ඒ ගොණැසි අතුරෙන් අග්‍රයයි කියනු ලැබේ. මහණෙනි, එපරිද්දෙන්ම වඩනාලද, පුරුදු කරනලද අනිත්‍ය සංඥාව සියලු කාමරාගය ක්ෂය කෙරෙයි, සියලු රූපරාගය ක්ෂය කෙරෙයි, සියලු භවරාගය ක්ෂය කෙරෙයි, සියලු අවිද්‍යාව ක්ෂය කෙරෙයි. සියලු අස්මිමානය ක්ෂය කෙරෙයි, සහමුලින් විනාස කෙරෙයි.

**6.** "මහණෙනි, යම්සේ වනාහි යම්කිසි හර සුවඳ වෙද්ද, ඔවුන් අතුරෙන් රත්සඳුන් අග්‍රයයි කියනු ලැබේද, මහණෙනි, එපරිද්දෙන්ම වඩනාලද, පුරුදු කරනලද අනිත්‍ය සංඥාව සියලු කාමරාගය ක්ෂය කෙරෙයි, සියලු රූපරාගය ක්ෂය කෙරෙයි, සියලු භවරාගය ක්ෂය කෙරෙයි, සියලු අවිද්‍යාව ක්ෂය කෙරෙයි. සියලු අස්මිමානය ක්ෂය කෙරෙයි, සහමුලින් විනාස කෙරෙයි.

**7.** "මහණෙනි, යම්සේ වනාහි යම්කිසි මල් සුවඳ වෙද්ද, ඔවුන් අතුරෙන් සමන්මල් (සුවඳ) අග්‍රයයි කියනු ලැබේද, මහණෙනි, එපරිද්දෙන්ම වඩනලද, පුරුදු කරනලද අනිත්‍ය සංඥාව සියලු කාමරාගය ක්ෂය කෙරෙයි, සියලු රූපරාගය ක්ෂය කෙරෙයි, සියලු භවරාගය ක්ෂය කෙරෙයි, සියලු අවිද්‍යාව ක්ෂය කෙරෙයි, සියලු අස්මිමානය ක්ෂය කෙරෙයි, සහමුලින් විනාස කෙරෙයි.

**8.** "මහණෙනි, යම්සේ වනාහි යම්කිසි කුඩා රජවරු වෙද්ද, ඒ සියල්ලෝ සක්විති රජහට අනුකූල වූවාහු වෙද්ද, ඔවුන් අතුරෙන් සක්විති රජතෙම අග්‍රයයි කියනු ලැබේද, මහණෙනි, එපරිද්දෙන්ම වඩනලද, පුරුදු කරනලද අනිත්‍ය සංඥාව සියලු කාමරාගය ක්ෂය කෙරෙයි, සියලු රූපරාගය ක්ෂය කෙරෙයි, සියලු භවරාගය ක්ෂය කෙරෙයි, සියලු අවිද්‍යාව ක්ෂය කෙරෙයි, සියලු අස්මිමානය ක්ෂය කෙරෙයි, සහමුලින් විනාස කෙරෙයි.'

**9.** "මහණෙනි, යම්සේ වනාහි තරුවල යම්කිසි එළියක්වේද, ඒ සියලු එළි සඳඑළියේ සොළොස්වන කොටසකටද නොඅගිත්, ඔවුන් අතුරෙන් සඳඑළිය අග්‍රයයි කියනු ලැබේද, මහණෙනි, එපරිද්දෙන්ම වඩනාලද, පුරුදු කරනලද අනිත්‍ය සංඥාව සියලු කාමරාගය ක්ෂය කෙරෙයි, සියලු රූපරාගය ක්ෂය කෙරෙයි, සියලු භවරාගය ක්ෂය කෙරෙයි, සියලු අවිද්‍යාව ක්ෂය කෙරෙයි, සියලු අස්මිමානය ක්ෂය කෙරෙයි, සහමුලින් විනාස කෙරෙයි.

**10.** "මහණෙනි, යම්සේ වනාහි සරත් සමය වැඩුණු කල්හි පහවගිය වළාකුල්ද, වැසිද ඇතිකල්හි සූර්යතෙම අහසට නැංගේ ආකාසගතවූ සියලු අඳුරු නසා එළිය කෙරේද, බබලාද, විශෙෂයෙන් දීප්තිමත් වේද."

මහණෙනි, එපරිද්දෙන්ම වඩනලද, පුරුදු කරනලද අනිත්‍ය සංඥාව සියලු කාමරාගය ක්ෂය කෙරෙයි, සියලු රූප රාගය ක්ෂය කෙරෙයි, සියලු භවරාගය ක්ෂය කෙරෙයි, සියලු අවිද්‍යාව ක්ෂය කෙරෙයි, සියලු අස්මිමානය ක්ෂය කෙරෙයි. සහමුලින් විනාශ කෙරෙයි.

**11.** "මහණෙනි, කෙසේ වඩනා ලද්දාවූ කෙසේ පුරුදුකරන ලද්දාවූ අනිත්‍ය සංඥාව තොමෝ සියලු කාමරාගය ක්ෂයකෙරේද, සියලු රූපරාගය ක්ෂය කෙරේද, සියලු භවරාගය ක්ෂය කෙරේද, සියලු අවිද්‍යාව ක්ෂය කෙරේද, සියලු අස්මිමානය ක්ෂය කෙරේද, සහමුලින්ම විනාශ කෙරේද, රූපය මෙසේය, රූපයාගේ ඉපදීම මෙසේය, රූපයාගේ විනාශය මෙසේය. වේදනාව මෙසේය, වේදනාවේ ඉපදීම මෙසේය, වේදනාවේ විනාශය මෙසේය, සංඥාව මෙසේය, සංඥාවේ ඉපදීම මෙසේය, සංඥාවේ විනාශය මෙසේය, සංස්කාරයන් මෙසේය, සංස්කාරයන්ගේ ඉපදීම මෙසේය, සංස්කාරයන්ගේ විනාශය මෙසේය, විඥානය මෙසේය, විඥානයාගේ ඉපදීම මෙසේය, විඥානයාගේ විනාශය මෙසේයයි මෙසේ වඩන ලද්දාවූ මෙසේ පුරුදු කරන ලද්දාවූ අනිත්‍ය සංඥාතොමෝ සියලු කාමරාගය ක්ෂය කෙරෙයි සියලු රූපරාගය ක්ෂය කෙරෙයි, සියලු භවරාගය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.

ක්ෂය කෙරෙයි, සියලු අවිද්‍යාව ක්ෂය කෙරෙයි, සියලු අස්මිමානය සහමුලින්ම විනාශ කෙරේයයි" (වදාළසේක.)

**(දහවෙනි සංඥා සූත්‍රය නිමි.)**

---

(නදී සූත්‍රය, පුප්ඵ සූත්‍රය, ඵේණ සූත්‍රය, ගොමය සූත්‍රය, නඛසිඛ සූත්‍රය, සාමුද්දක සූත්‍රය, ගද්දුල සූත්‍ර දෙකය, නාවා සූත්‍රය සහ සංඥා සූත්‍රය දැයි මේ වර්ගයේ සූත්‍ර දසයකි.)

**දසවෙනි පුප්ඵ වර්ගයයි.**

**(මජ්ඣිම පණ්ණාසකය නිමි.)**

---

(උපාය වර්ගය, අරහන්ත වර්ගය, ඛජ්ජනීය වර්ගය, ථෙර වර්ගය සහ පුප්ඵ වර්ගයයි කියා මේ පණ්ණාසකයෙහි වර්ග පසෙකි.)

## 11. අන්ත වර්ගය.

### 1. අන්ත සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය.

2. "මහණෙනි, අන්ත (කොටස්) සතරකි. කවර සතරක්ද යත්? තමා යන කොටසය. තමා ඇතිවීමේ හේතුව යන කොටසය. තමා නැති කිරීම යන කොටසය. තමා නැතිකිරීමේ මාර්ගය යන කොටසය යන මොහුයි.

3. "මහණෙනි, තමා යන කොටස කවරේද? ඊට උපාදානස්කන්ධ පසයයි කිය යුතුය. කවර පසක්ද? එනම්

රූපඋපාදානස්කන්ධය, වේදනා උපාදානස්කන්ධය, සඤ්ඤා උපාදානස්කන්ධය, සංස්කාර උපාදානස්කන්ධය, විඤ්ඤාණ උපාදානස්කන්ධය යනුයි. මහණෙනි, මේ තමා යන කොටසයි.

**4.** "මහණෙනි, තමා ඇතිවීමේ හේතුව යන කොටස කවරේද? නැවත නැවත ඉපදීම ගෙන දෙන්නාවූ ඇලීමෙන් යුක්තවූ, අරමුණෙහි ඇලෙන්නාවූ යම්සේ තෘෂ්ණාවක් වේද, එනම් කාම තෘෂ්ණාවය, භව තෘෂ්ණාවය, විභව තෘෂ්ණාවය යනුයි. මහණෙනි, මේ තමා ඇති කිරීමේ හේතුවය යන කොටසයි.

**5.** "මහණෙනි, තමා නැති කිරීම යන කොටස කවරේද? ඒ තෘෂ්ණාවගේ යම් මුළුමනින් දුරු කිරීමක්, නැති කිරීමක්, අත්හැරීමක්, දුරලීමක්, මිදීමක්, නො ඇල්මක් වේද, මහණෙනි, මේ තමා නැති කිරීම යන කොටසයි.

**6.** "මහණෙනි, මේ තමා නැතිකිරීමේ මාර්ගය යන කොටස කවරේද? මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයමැයි. ඒ කෙසේද යත්, සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාවය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මොහුයි. මහණෙනි, මේ තමා නැති කිරීමේ මාර්ගය යන කොටසයි. මහණෙනි, මේ කොටස් සතරය."

**(පළමුවෙනි අන්ත සූත්‍රය නිමි.)**

---

## 2. දුක්ඛ සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

**2.** "මහණෙනි, තොපට දුකද, දුකට හේතුවද, දුකනැති කිරීමද, දුක නැති කිරීමේ මාර්ගයද දෙශනා කරන්නෙමි. එය අසව්!

"මහණෙනි, දුක කවරේද? ඊට උපාදානස්කන්ධ පසයයි කිය යුතුය. කවර පසක්ද? එනම් රූප උපාදානස්කන්ධය, වේදනා උපාදානස්කන්ධය, සඤ්ඤා උපාදානස්කන්ධය, සංස්කාර උපාදානස්කන්ධය, විඤ්ඤාණ උපාදානස්කන්ධය යනුයි. මහණෙනි, මේ දුකයයි කියනු ලැබේ.

3. "මහණෙනි, දුකට හේතුව කවරේද? 'නැවත නැවත ඉපදීම ගෙනදෙන ඇලීමෙන් යුක්තවූ, ඒ ඒ අරමුණෙහි ඇලෙන්නාවූ යම් තෘෂ්ණාවක් වේද, එනම් කාම තෘෂ්ණාවය, භව තෘෂ්ණාවය, විභව තෘෂ්ණාවය, යනුයි. මහණෙනි, මේ දුකට හේතුවයයි කියනු ලැබේ.

4. "මහණෙනි, දුක නැති කිරීම කවරේද?" "ඒ තෘෂ්ණාවගේ යම් මුළුමනින් දුරලීමක්, නැති කිරීමක්, අත් හැරීමක් මිදීමක්; නො ඇල්මක් වේද? මහණෙනි, මේ දුක නැති කිරීම යයි කියනු ලැබේ."

5. "මහණෙනි, දුක නැති කිරීමේ ප්‍රතිපදාව කවරේද?" "මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය මැයි. එනම් සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාවය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මොව්හුයි." මහණෙනි, මේ දුක නැති කිරීමේ මාර්ගයයි කියනු ලැබේ."

**(දෙවෙනි දුක්ඛ සූත්‍රය නිමි.)**

---

## 3. සක්කාය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි වූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ, 'මහණෙනි'යි කියා භික්ෂූන්ට කථා කළ සේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, තමාද තමා ඇතිවීමේ හේතුවද, තමා නැති කිරීමද, තමා නැති කිරීමේ මාර්ගයද, දෙශනා කරන්නෙමි. එය අසව්.

"මහණෙනි, තමා කවරේද?" "පංච උපාදානස්කන්ධයයි කියයුතුය." "කවර පසක්ද?" "එනම් රූප උපාදානස්කන්ධය, වේදනා උපාදානස්කන්ධය, සඤ්ඤා උපාදානස්කන්ධය, සංස්කාර උපාදානස්කන්ධය, විඤ්ඤාණ උපාදානස්කන්ධය, යනුයි මහණෙනි, මේ තමායයි කියනු ලැබේ."

3. "මහණෙනි, තමා ඇතිවීමේ හේතුව කවරේද?" "නැවත නැවත ඉපදීම ඇති කරන්නාවූ ඇලීමෙන් යුක්තවූ ඒ ඒ අරමුණෙහි ඇලෙන්නාවූ යම් ඒ තෘෂ්ණාවක් වේද, එනම් කාම තෘෂ්ණාවය, භව තෘෂ්ණාවය, විභව තෘෂ්ණාවය යනුයි." මහණෙනි, මේ තමා ඇතිවීමේ හේතුවයයි කියනු ලැබේ.

4. "මහණෙනි, තමා නැති කිරීම කවරේද?" - "ඒ තෘෂ්ණාවගේ යම් මුළුමනින් නැති කිරීමක්, අතහැරීමක්, දුරලීමක්, මිදීමක් නො ඇල්මක් වේද, මහණෙනි, මේ තමා නැති කිරීමයයි කියනු ලැබේ."

5. "මහණෙනි, තමා නැති කිරීමේ මාර්ගය කවරේද?"-"මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය මැයි." "ඒ කවරේද?" සම්‍යක්දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාවය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යනුයි." මහණෙනි, මේ තමා නැති කිරීමේ මාර්ගයයි කියනු ලැබේ.

## 4. පරිඤ්ඤෙය්‍ය සූත්‍රය. (2)

1. මා විසින් මෙසේ අසන ලදී එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක.

'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. මහණෙනි, දැනගත යුතුවූ (දුරුකළ යුතුවූ) ධර්මයෝද, පිරිසිඳ දැනගැනීමද පිරිසිඳ දැනගත් පුද්ගලයාද දේශනා කරන්නෙමි. එය අසව්.

"මහණෙනි, පිරිසිඳ දැනගතයුතු ධර්ම කවරේද?" - "මහණෙනි, රූපය පිරිසිඳ දැනගත යුතු ධර්මයකි. වේදනාව පිරිසිඳ දැනගතයුතු ධර්මයකි. සඤ්ඤාව පිරිසිඳ දැන ගතයුතු ධර්මයකි. සංස්කාර පිරිසිඳ දැනගතයුතු ධර්මයකි. විඤ්ඤාණය පිරිසිඳ දැනගත යුතු ධර්මයකි." මහණෙනි, මේ පිරිසිඳ දැනගත යුතු ධර්මයෝයයි කියනු ලැබේ.

3. "මහණෙනි, පිරිසිඳ දැනගැනීම කවරේද?" - "මහණෙනි, රාගයාගේ යම් ක්ෂයවීමක් වේද, දෝසයාගේ යම් ක්ෂයවීමක් වේද, මෝහයාගේ යම් ක්ෂයවීමක්වේද, මේ පිරිසිඳ දැනගැනීම යයි කියනු ලැබේ."

4. "මහණෙනි, පිරිසිඳ දැනගත් පුද්ගලයා කවරෙක්ද?" - "ඔහුට අර්හත් පුද්ගලයා යයි කිය යුතුය. යම්කිසි ආයුෂ්මත් කෙනෙක් මෙවැනි නම් ඇත්තේ මෙවැනි ගෝත්‍ර ඇත්තේ වේද, මහණෙනි, මේ තෙම පිරිසිඳ දැනගත් පුද්ගලයායයි කියනු ලැබේ."

**(හතරවෙනි පරිඤ්ඤෙය්‍ය සූත්‍රය (2) නිමි.)**

---

## 5. සමණ සූත්‍රය (1)

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' යි කියා භික්ෂූන් ඇමතු සේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. 'මහණෙනි, උපාදානස්කන්ධ පසකි. කවර පසක්ද? එනම් රූප උපාදානස්කන්ධය, වේදනා උපාදානස්කන්ධය, සඤ්ඤා උපාදානස්කන්ධය, සංස්කාර උපාදානස්කන්ධය, විඤ්ඤාණ උපාදානස්කන්ධය යන මොව්හුය.

3. "මහණෙනි, යම්කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් මේ පස් උපාදානස්කන්ධයන්ගේ ආශ්වාදයද ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිදි නොදකිත්ද, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ මාගේ ශ්‍රමණයන් අතරෙහි ශ්‍රමණයයි සම්මත නොවූවාහුය. බ්‍රාහ්මණයන් අතරෙහි බ්‍රාහ්මණයයි සම්මත නොවූවාහුය. ඒ ආයුෂ්මත්හු ශ්‍රමණ ඵලය හෝ බ්‍රාහ්මණ ඵලය හෝ මෙලොවදීම තෙමේම විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂව දැන ඊට පැමිණ වාසය නොකරත්.

4. "මහණෙනි, යම්කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මේ පස් උපාදානස්කන්ධයන්ගේ ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිදි දකිත්ද, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ මාගේ ශ්‍රමණයන් අතරෙහි ශ්‍රමණයයි සම්මත වූවාහුය. මාගේ බ්‍රාහ්මණයන් අතරෙහි බ්‍රාහ්මණයයි සම්මතවූවාහුය. ඒ ආයුෂ්මත්හු ශ්‍රමණ අර්ථය හෝ බ්‍රාහ්මණ අර්ථය හෝ මෙලොවදීම දනිත්ද තෙමේම විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂව ඊට පැමිණ වාසය කරත්.

**(පස්වෙනි, සමණ සූත්‍රය (1) නිමි.)**

---

## 6. සමණ සූත්‍රය (2)

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. 'මහණෙනි, උපාදානස්කන්ධ පසකි. කවර පසක්ද? එනම් රූප උපාදානස්කන්ධය, වේදනා උපාදානස්කන්ධය, සඤ්ඤා උපාදානස්කන්ධය, සංස්කාර උපාදානස්කන්ධය, විඤ්ඤාණ උපාදානස්කන්ධය යනුයි.

3. "මහණෙනි, යම්කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මේ පස් උපාදානස්කන්ධයන්ගේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිදි නොදනිත්ද ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ මාගේ ශ්‍රමණයන් අතරෙහි ශ්‍රමණයයි සම්මත නොවූවාහුය. බ්‍රාහ්මණයන් අතරෙහි හෝ බ්‍රාහ්මණයයි සම්මත නොවූවාහුය. ඒ ආයුෂ්මත්හු ශ්‍රමණ ඵලය හෝ බ්‍රාහ්මණ ඵලය හෝ මෙලොවදී තෙමේම විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂව දැන ඊට පැමිණ වාසය නොකෙරෙත්. මහණෙනි, යම්කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මේ පස් උපාදානස්කන්ධයන්ගේ ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද, තත්වූ පරිදි දකිත්ද, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ මාගේ ශ්‍රමණයන් අතරෙහි ශ්‍රමණයයි සම්මතවූවාහුය. මාගේ බ්‍රාහ්මණයන් අතරෙහි බ්‍රාහ්මණයයි සම්මතවූවාහුය. ඒ ආයුෂ්මත්හු ශ්‍රමණ අර්ථය හෝ බ්‍රාහ්මණ අර්ථය හෝ මෙලොවදීම දනිත්ද, තෙමේ විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂව දැන ඊට පැමිණ වාසය කරත්.

**(හයවෙනි සමණ සූත්‍රය (2) නිමි.)**

---

## 7. සොතාපන්න සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. මහණෙනි, උපාදානස්කන්ධ පසකි. කවර පසක්ද? රූප උපාදානස්කන්ධය, වේදනා උපාදානස්කන්ධය, සංඥා උපාදානස්කන්ධය, සංස්කාර උපාදානස්කන්ධය, විඤ්ඤාණ උපාදානස්කන්ධය යනුයි. මහණෙනි, යම් හෙයකින් ආර්ය ශ්‍රාවකතෙමේ මේ පස් වැදෑරුම් උපාදානස්කන්ධයන්ගේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, නිශ්ශරණයද, තත්වූ පරිදි දනීද, මහණෙනි, ඒ ආර්ය ශ්‍රාවකතෙමේ අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ, නියතවූ, අර්හත් බොධිය පිහිටකොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයායයි කියනු ලැබේ.

**(හත්වෙනි සොතාපන්න සූත්‍රය නිමි.)**

---

## 8. අරහ සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූ සේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, උපාදානස්කන්ධ පසකි. කවර පසක්ද? එනම්ඃ රූප උපාදානස්කන්ධය, වේදනා උපාදානස්කන්ධය, සංඥා උපාදානස්කන්ධය, සංස්කාර උපාදානස්කන්ධය, විඤ්ඤාණ උපාදානස්කන්ධය යනුයි. මහණෙනි, යම් හෙයකින් මහණ තෙමේ මේ පස් වැදෑරුම් උපාදානස්කන්ධයන්ගේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, නිශ්ශරණයද තත්වූ පරිදි දැන උපාදානයන් කෙරෙන් මිදුණේ වෙයිද, මහණෙනි, මේ භික්ෂුව ආශ්‍රවයන් ක්ෂය කළාවූ, වැස නිමවනලද බ්‍රහ්මචර්යාව ඇත්තාවූ, කටයුතු කරන ලද්දාවූ, බහා තබනලද බර ඇත්තාවූ, තමාගේ අර්ථයට පැමිණියාවූ, ක්ෂය කළ භවසංයොජන

ඇත්තාවූ, මනාව දැන මිදුණාවූ අර්හත් පුද්ගලයායයි කියනු ලැබේ.

(අටවෙනි අරහ සූත්‍රය නිමි.)

---

## 9. ඡන්ද රාග සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

**2.** "මහණෙනි, රූපය කෙරෙහි යම් (ඡන්දරාගයක්) ඇල්මක් ඇද්ද යම් නන්දිරාගයක් ඇද්ද, යම් තෘෂ්ණාවක් ඇද්ද, එය දුරු කරව්. මෙසේ ඒ රූපය ප්‍රහීනකරන ලද්දේ, සිඳිනලද මුල් ඇත්තේ, සිඳිනලද තල්ගසක් මෙන් කරන ලද්දේ, නැතිකරන ලද්දේ, නැවත නොඉපදීම ස්වභාවකොට ඇත්තේ වන්නේය.

**3.** "වේදනාවෙහි යම් ඡන්දරාගයක් ඇද්ද, ඇල්මක් ඇද්ද, යම් නන්දිරාගයක් ඇද්ද, යම් තෘෂ්ණාවක් ඇද්ද, එය දුරු කරව්. මෙසේ ඒ වේදනාව ප්‍රහීන කරන ලද්දේ, සිඳින ලද මුල් ඇත්තේ, සිඳිනලද තල්ගසක් මෙන් කරන ලද්දේ, නැති කරන ලද්දේ, නැවත නොඉපදීම ස්වභාවකොට ඇත්තේ වන්නේය.

**4.** "සංඥාවෙහි යම් ඡන්දරාගයක් ඇද්ද, ඇල්මක් ඇද්ද, යම් නන්දිරාගයක් ඇද්ද, යම් තෘෂ්ණාවක් ඇද්ද, එය දුරු කරව්. මෙසේ ඒ සංඥාව ප්‍රහීන කරන ලද්දේ, සිඳින ලද මුල් ඇත්තේ, සිඳිනලද තල්ගසක් මෙන් කරන ලද්දේ, නැති කරන ලද්දේ, නැවත නොඉපදීම ස්වභාවකොට ඇත්තේ වන්නේය.

**5.** "සංස්කාරයෙහි යම් ඡන්දරාගයක් ඇද්ද, ඇල්මක් ඇද්ද, යම් නන්දිරාගයක් ඇද්ද, යම් තෘෂ්ණාවක් ඇද්ද, එය දුරු කරව්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මෙසේ ඒ සංස්කාරය ප්‍රහීන කරන ලද්දේ, සිඳිනලද මුල් ඇත්තේ, සිඳිනලද තල්ගසක් මෙන් කරන ලද්දේ, නැති කරන ලද්දේ, නැවත නොඉපදීම ස්වභාවකොට ඇත්තේ වන්නේය.

**6.** "විඤ්ඤාණයෙහි යම් ඡන්දරාගයක් ඇද්ද, ඇල්මක් ඇද්ද, යම් නන්දිරාගයක් ඇද්ද, යම් තෘෂ්ණාවක් ඇද්ද, එය දුරු කරව්. මෙසේ ඒ විඤ්ඤාණය ප්‍රහීන කරන ලද්දේ, සිඳිනලද මුල් ඇත්තේ, සිඳිනලද තල්ගසක් මෙන් කරන ලද්දේ, නැති කරන ලද්දේ, නැවත නොඉපදීම ස්වභාවකොට ඇත්තේ වන්නේය.

**(නවවෙනි ඡන්දරාග සූත්‍රය (1) නිමි.)**

---

## 10. ඡන්ද රාග සූත්‍රය (2)

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

**2.** "මහණෙනි, රූපයෙහි යම් ඇල්මක්, යම් රාගයක්, යම් ආශාවක්, යම් තෘෂ්ණාවක්, යම් තෘෂ්ණා දෘෂ්ටි මානයන්ගේ වශයෙන් ගැනීමක්, සිත පිහිටීමක්, වැළඳගැනීමක්, අනුසයයක් වේද, ඔවුන් පහකරව්. මෙසේ ඒ රූපය පහකරන ලද්දේ වන්නේය. මුල් සිඳින ලද්දේ වන්නේය. සිඳිනලද තල්ගසක් මෙන් කරන ලද්දේ, විනාශ කරන ලද්දේ, නැවත නූපදින ස්වභාවයට පමුණුවන ලද්දේ වන්නේය.

**3.** වේදනායෙහි යම් ඇල්මක්, යම් රාගයක්, යම් ආශාවක් යම් තෘෂ්ණාවක්, යම් තෘෂ්ණා දෘෂ්ටි මානයන්ගේ වශයෙන් ගැනීමක් සිත පිහිටීමක්, වැළඳගැනීමක්, අනුසයක් වේද, ඔවුන් පහකරව්. මෙසේ ඒ වේදනාව පහකරන ලද්දේ, වන්නේය. මුල් සිඳින ලද්දේ වන්නේය. සිඳිනලද තල්ගසක් මෙන් කරන ලද්දේ,

විනාශ කරන ලද්දේ, නැවත නූපදින ස්වභාවයට පමුණුවන ලද්දේ වන්නේය.

**4.** "සංඥායෙහි යම් ඇල්මක්, යම් රාගයක්, යම් ආශාවක්, යම් තෘෂ්ණාවක්, යම් තෘෂ්ණා දෘෂ්ටි මානයන්ගේ වශයෙන් ගැනීමක්, සිත පිහිටීමක්, වැළඳගැනීමක්, අනුසයයක් වේද, ඔවුන් පහකරව් මෙසේ ඒ සංඥාව පහකරන ලද්දේ, වන්නේය. මුල් සිඳිනලද්දේ වන්නේය. සිඳිනලද තල්ගසක් මෙන් කරන ලද්දේ, විනාශකරන ලද්දේ, නැවත නූපදින ස්වභාවයට පමුණුවන ලද්දේ වන්නේය.

**5.** "සංස්කාරයෙහි යම් ඇල්මක්, යම් රාගයක්, යම් ආශාවක්, යම් තෘෂ්ණාවක්, යම් තෘෂ්ණා දෘෂ්ටි මානයන්ගේ වශයෙන් ගැනීමක්, සිත පිහිටීමක්, වැළඳගැනීමක්, අනුසයයක් වේද, ඔවුන් පහකරව්. මෙසේ ඒ සංස්කාරය පහකරන ලද්දේ වන්නේය. මුල් සිඳින ලද්දේ වන්නේය. සිඳිනලද තල් ගසක් මෙන් කරන ලද්දේ, විනාශ කරන ලද්දේ, නැවත නූපදින ස්වභාවයට පමුණුවන ලද්දේ වන්නේය.

**6.** "විඤ්ඤාණයෙහි යම් ඇල්මක්, යම් රාගයක්, යම් ආශාවක් යම් තෘෂ්ණාවක්, යම් තෘෂ්ණා දෘෂ්ටි මානයන්ගේ වශයෙන් ගැනීමක්, සිත පිහිටීමක්, වැළඳගැනීමක්, අනුසයයක් වේද, ඔවුන් පහකරව්. මෙසේ ඒ විඤ්ඤාණය පහකරන ලද්දේ, වන්නේය. මුල් සිඳිනලද්දේ වන්නේය. සිඳිනලද තල්ගසක් මෙන් කරන ලද්දේ, විනාශකරන ලද්දේ, නැවත නූපදින ස්වභාවයට පමුණුවන ලද්දේ වන්නේය."

**(දසවෙනි ඡන්ද රාග සූත්‍රය (2) නිමි.)**

---

**(අන්ත සූත්‍රය, දුක්ඛ සූත්‍රය, සක්කාය සූත්‍රය, පරිඤ්ඤෙය්‍යය සූත්‍රය, ශ්‍රමණ සූත්‍ර දෙක, සොතාපන්න සූත්‍රය, අරහා සූත්‍රය සහ ඡන්ද රාග සූත්‍ර දෙකදැයි මේ වර්ගයෙහි සූත්‍ර දසයක් වෙති.)**

**(අන්ත වර්ගය නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# 12. ධර්මකථික වර්ගය.

## 1. භික්ෂු සූත්‍රය (1)

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන් ඒ මහණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීය.

2. "ස්වාමීනි, අවිද්‍යාව අවිද්‍යාවයයි කියනු ලැබේ. ස්වාමීනි, අවිද්‍යාව නම් කුමක්ද? කෙතෙක් කරුණකින් අවිද්‍යාවෙන් යුක්තවූයේයයි කියනු ලැබේද?

"මහණ, මේ ලොකයෙහි අශ්‍රුතවත් පෘථග්ජන තෙමේ රූපය නොදනියිද, රූපයට හෙතුව නොදනියිද, රූපය නැති කිරීම නොදනියිද, රූපය නැතිකිරීමේ මාර්ගය නොදනියිද, වේදනාව නොදනියිද, වේදනාවට හෙතුව නොදනියිද, වේදනාව නැතිකිරීම නොදනියිද, වේදනාව නැතිකිරීමේ මාර්ගය නොදනියිද, සංඥාව නොදනියිද, සංඥාවට හේතුව නොදනියිද, සංඥාව නැතිකිරීම නොදනියිද, සංඥාව නැතිකිරීමේ මාර්ගය නොදනියිද, සංස්කාරය නොදනියිද, සංස්කාරයට හේතුව නොදනියිද, සංස්කාරය නැතිකිරීම නොදනියිද, සංස්කාරය නැතිකිරීමේ මාර්ගය නොදනියිද, විඤ්ඤාණය නොදනියිද, විඤ්ඤාණයට හෙතුව නොදනියිද, විඤ්ඤාණය නැතිකිරීම නොදනියිද, විඤ්ඤාණය නැතිකිරීමේ මාර්ගය නොදනියිද, මහණ, මේ අවිද්‍යාවයි. මේ අවිද්‍යාවෙන් යුක්ත නම් හෙතෙම අවිද්‍යා සහිත පුද්ගලයායයි කියනු ලැබේ."

**(පළමුවෙනි භික්ෂු සූත්‍රය (1) නිමි.)**

## 2. භික්ෂු සූත්‍රය (2)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන් ඒ මහණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීය.

2. "ස්වාමීනි, විද්‍යාව විද්‍යාවයයි කියනු ලැබේ. ස්වාමීනි, විද්‍යාව නම් කවරේද? කෙතෙක් කරුණකින් විද්‍යාවෙන් යුක්ත යයි කියනු ලැබේද?

3. "මහණ, මේ ශාසනයෙහි බොහෝ ඇසූ පිරූ තැන් ඇති ආර්ය ශ්‍රාවකතෙමේ රූපය දනීද, රූපයට හේතුව දනීද, රූපය නැතිකිරීම දනීද, රූපය නැතිකිරීමේ මාර්ගය දනීද, වේදනාව දනීද, වේදනාවට හේතුව දනීද, වේදනාව නැති කිරීම දනීද, වේදනාව නැතිකිරීමේ මාර්ගය දනීද, සංඥාව දනීද, සංඥාවට හේතුව දනීද, සංඥාව නැතිකිරීම දනීද, සංඥාව නැතිකිරීමේ මාර්ගය දනීද, සංස්කාරයන් දනීද, සංස්කාරයන්ට හේතුව දනීද, සංස්කාරයන් නැතිකිරීම දනීද, සංස්කාරයන් නැතිකිරීමේ මාර්ගය දනීද, විඤ්ඤාණය දනීද, විඤ්ඤාණයට හේතුව දනීද, විඤ්ඤාණය නැතිකිරීම දනීද, විඤ්ඤාණය නැතිකිරීමේ මාර්ගය දනීද, මහණ, මේ විද්‍යාවය මේ විද්‍යාවෙන් යුක්තවූයේ නම් හෙතෙම විද්‍යාසහගතයයි කියනු ලැබේ."

**(දෙවෙනි භික්ෂු සූත්‍රය (2) නිමි.)**

---

## 3. ධර්මකථික සූත්‍රය (1)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක්හි හුන්නේය.

2. එකත් පසෙක හුන් ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ. "ස්වාමීනි, ධර්මකථික, ධර්මකථිකයයි කියනු ලැබේ. 'ස්වාමීනි, කෙතෙක් කරුණකින් ධර්මකථිකයෙක් වේදැයි" කියායි.

"ඉදින් මහණතෙම රූපයාගේ කළකිරීම පිණිස නො ඇලීම පිණිස, විනාශය පිණිස ධර්මය දේශනා කරයි නම් හෙතෙම ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණ තෙම රූපයාගේ කළකිරීම පිණිස නොඇලීම පිණිස විනාශය පිණිස පිළිපන්නේ නම් ධර්මානු ධර්ම ප්‍රතිපදාවෙහි පිළිපන් භික්ෂුවයයි කීමට සුදුසුය.

"ඉදින් මහණතෙම රූපයාගේ කළකිරීමෙන් නොඇලීමෙන් විනාශයෙන් උපාදාන වශයෙන් නොගෙන මනාකොට මිදුනේ නම් හෙතෙම මෙලොවදීම නිර්වාණයට පැමිණි භික්ෂුව යයි කීමට සුදුසුය.

4. "වේදනාවගේ කළකිරීම පිණිස නොඇලීම පිණිස විනාශය පිණිස ධර්මය දේශනා කරයි නම්, හෙතෙම ධර්මකථික භික්ෂුව යයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම වේදනාවගේ කළකිරීම පිණිස නොඇලීම පිණිස, විනාශය පිණිස, පිළිපන්නේ නම් ධර්මානුධර්ම ප්‍රතිපදාවෙහි පිළිපන් භික්ෂුවයයි කීමට සුදුසුය.

"ඉදින් මහණතෙම වේදනාවගේ කළකිරීමෙන් නොඇලීමෙන් විනාශයෙන් උපාදාන වශයෙන් නොගෙන මනාකොට මිදුනේ වෙයි නම් හෙතෙම මෙලොවදීම නිර්වාණයට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

5. "සඤ්ඤාවගේ කළකිරීම පිණිස නොඇලීම පිණිස විනාශය පිණිස ධර්මය දේශනා කරයි නම්, හෙතෙම ධර්මකථික භික්ෂුව යයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම සඤ්ඤාවගේ කළකිරීම

පිණිස නොඇලීම පිණිස විනාශය පිණිස, පිළිපන්නේ නම් ධර්මානුධර්ම ප්‍රතිපදාවෙහි පිළිපන් භික්ෂුවයයි කීමට සුදුසුය.

"ඉදින් මහණතෙම සඤ්ඤාවගේ කළකිරීමෙන් නොඇලීමෙන් විනාශයෙන් උපාදාන වශයෙන් නොගෙන මනාකොට මිදුනේවෙයි නම් හෙතෙම මෙලොවදීම නිර්වාණයට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

**6.** "සංස්කාරයන්ගේ කළකිරීම පිණිස නොඇලීම පිණිස විනාශය පිණිස ධර්මය දෙශනා කරයි නම්, හෙතෙම ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම සංස්කාරයන්ගේ කළකිරීම පිණිස නොඇලීම පිණිස, විනාශය පිණිස පිළිපන්නේ නම් ධර්මානුධර්ම ප්‍රතිපදාවෙහි පිළිපන් භික්ෂුවයයි කීමට සුදුසුය.

"ඉදින් මහණතෙම සංස්කාරයන්ගේ කළකිරීමෙන් නොඇලීමෙන් විනාශයෙන් උපාදාන වශයෙන් නොගෙන මනා කොට මිදුනේවෙයි නම් හෙතෙම මෙලොවදීම නිර්වාණයට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

**7.** "විඤ්ඤාණයේ කළකිරීම පිණිස නොඇලීම පිණිස විනාශය පිණිස ධර්මය දේශනා කරයි නම් ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම විඤ්ඤාණයාගේ කළකිරීම පිණිස නොඇලීම පිණිස විනාශය පිණිස පිළිපන්නේ නම් ධර්මානුධර්ම ප්‍රතිපදාවෙහි පිළිපන් භික්ෂුවයයි කීමට සුදුසුය.

"ඉදින් මහණතෙම විඤ්ඤාණයාගේ කළකිරීමෙන් නොඇලීමෙන් විනාශයෙන් උපාදාන වශයෙන් නොගෙන මනා කොට මිදුනේ වෙයි නම් හෙතෙම මෙලොවදීම නිර්වාණයට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

**(තුන්වෙනි ධර්මකථික සූත්‍රය (1) නිමි.)**

---

## 4. ධර්මකථික සූත්‍රය (2)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක හුන්නේය. එක් පසෙක හුන් ඒ මහණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීය.

2. "ස්වාමීනි, ධර්මකථිකය ධර්මකථිකයයි කියනු ලැබේ. ස්වාමීනි, කෙතෙක් කරුණකින් ධර්මකථිකයෙක් වේද, කෙතෙක් කරුණකින් ධර්මානුධර්ම ප්‍රතිපදාවෙහි පිළිපන්නේ වෙයිද? කෙතෙක් කරුණකින් මෙලොවදීම නිර්වාණයට පැමිණියෙක් වේදැයි" කියායි. "ඉදින් මහණතෙම රූපයාගේ කළකිරීම පිණිස නොඇලීම පිණිස විනාශය පිණිස ධර්මය දෙශනා කරයිද, හෙතෙම ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම රූපයාගේ කළකිරීම පිණිස නොඇලීම පිණිස විනාශය පිණිස පිළිපන්නේ වෙයිද, හෙතෙම ධර්මානුධර්ම ප්‍රතිපදාවෙහි පිළිපන් භික්ෂුවයයි කීමට සුදුසුය. මහණතෙම රූපයාගේ කළකිරීමෙන් නොඇලීමෙන් විනාශයෙන් දැඩිකොට අල්වා ගැනීමෙන් මිදුනේ වෙයිද, හෙතෙම මෙලොවදීම නිර්වාණයට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

3. "මහණෙනි, වේදනාවගේ කලකිරීම පිණිස, නොඇලීම පිණිස, විනාශය පිණිස ධර්මය දෙශනා කරයිද, හෙතෙම ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම වේදනාවගේ කලකිරීම පිණිස, නොඇලීම පිණිස, විනාශය පිණිස පිළිපන්නේ වෙයිද, හෙතෙම ධර්මානුධර්ම ප්‍රතිපදාවෙහි පිළිපන් භික්ෂුවයයි කීමට සුදුසුය.

"මහණතෙම වේදනාවගේ කළකිරීමෙන් නොඇලීමෙන් විනාශයෙන් දැඩිකොට අල්වා ගැනීමෙන් මිදුනේ වෙයිද හෙතෙම මෙලොවදීම නිර්වාණයට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

**4.** "මහණෙනි, සංඥාවගේ කලකිරීම පිණිස, නොඇලීම පිණිස, විනාශය පිණිස, ධර්මය දෙශනා කරයිද, හෙතෙම ධර්ම කථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම සංඥාවගේ කලකිරීම පිණිස, නොඇලීම පිණිස, විනාශය පිණිස පිළිපන්නේ වෙයිද, හෙතෙම ධර්මානුධර්ම ප්‍රතිපදාවෙහි පිළිපන් භික්ෂුවයයි කීමට සුදුසුය.

"මහණතෙම සඤ්ඤාවගේ කළකිරීමෙන් නොඇලීමෙන්, විනාශයෙන් දැඩිකොට අල්වා ගැනීමෙන් මිදුනේ වෙයිද, හෙතෙම මෙලොවදීම නිර්වාණයට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

**5.** "මහණෙනි, සංස්කාරයන්ගේ කලකිරීම පිණිස නොඇලීම පිණිස, විනාශය පිණිස, ධර්මය දෙශනා කරයිද, හෙතෙම ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම සංස්කාරයන්ගේ කලකිරීම පිණිස, නොඇලීම පිණිස, විනාශය පිණිස පිළිපන්නේ වෙයිද, හෙතෙම ධර්මානුධර්ම ප්‍රතිපදාවෙහි පිළිපන් භික්ෂුවයයි කීමට සුදුසුය.

"මහණතෙම සංස්කාරයන්ගේ කළකිරීමෙන් නොඇලීමෙන් විනාශයෙන් දැඩිකොට අල්වාගැනීමෙන් මිදුනේ වෙයිද, හෙතෙම මෙලොවදීම නිර්වාණයට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

**6.** "මහණෙනි, විඤ්ඤාණයේ කළකිරීම පිණිස, නොඇලීම පිණිස, විනාශය පිණිස ධර්මය දෙශනා කරයිද, හෙතෙම ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය.

"ඉදින් මහණතෙම විඤ්ඤාණයේ කලකිරීම පිණිස, නොඇලීම පිණිස, විනාශය පිණිස, පිළිපන්නේ වෙයිද, හෙතෙම ධර්මානුධර්ම ප්‍රතිපදාවෙහි පිළිපන් භික්ෂුවයයි කීමට සුදුසුය.

"ඉදින් මහණතෙම විඤ්ඤාණයේ කළකිරීමෙන් නොඇලීමෙන් විනාශයෙන් දැඩිකොට අල්වා ගැනීමෙන් මිදුනේ වෙයිද, හෙතෙම මෙලොවදීම නිර්වාණයට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

**හතරවෙනි ධර්මකථික සූත්‍රය නිමි**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 5. බන්ධන සූත්‍රය (1)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි ආර්යයන් නොදක්නාවූ ආර්ය ධර්මයෙහි දක්ෂනොවූ ආර්ය ධර්මයෙහි නොහික්මුනාවූ සත්පුරුෂයන් නොදක්නාවූ සත්පුරුෂ ධර්මයෙහි දක්ෂ නොවූ සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුනාවූ අශ්‍රැතවත් පෘථග්ජනතෙමේ රූපය ආත්මය වශයෙන් දකියිද ආත්මය රූපවත්යයි හෝ දකියිද රූපය ආත්මය කෙරෙහි හෝ ඇතැයි දකියිද ආත්මය රූපය කෙරෙහි පිහිටියේයයි දකියිද, මහණෙනි, මේ අශ්‍රැතවත් පෘථග්ජනතෙමේ රූපබන්ධනයෙන් බැඳුණාවූ ඇතුළත පිටත බන්ධනයෙන් බැඳුණාවූ එතෙර නොදක්නාවූ පරතෙර නොදක්නාවූ පුද්ගලයායයි කියනු ලැබේ. ක්ලෙශයන්ගෙන් බැඳුණෙක්ව උපදියි. බැඳුණෙක්ව මැරෙයි. බැඳුණෙක්ව මෙලොවින් පරලොව යයි.

3. "වේදනාව ආත්මය වශයෙන් දකියිද ආත්මය වේදනාවත්යයි හෝ දකියිද, වේදනාව ආත්මය කෙරෙහි ඇතැයි දකියිද, ආත්මය වේදනාව කෙරෙහි පිහිටියේයයි දකියිද, මහණෙනි, මේ අශ්‍රැතවත් පෘථග්ජනතෙමේ වේදනා බන්ධනයෙන් බැඳුණාවූ ඇතුළත පිටත බැඳීමෙන් බැඳුණාවූ එතෙර නොදක්නාවූ පරතෙර නොදක්නාවූ පුද්ගලයායයි කියනු ලැබේ. කෙලෙසුන්ගෙන් බැඳුනෙක්ව උපදියි. බැඳුනෙක්ව මියයයි. බැඳුනෙක්ව මෙලොවින් පරලොවට යයි.

4. "සඤ්ඤාව ආත්මය වශයෙන් දකියිද ආත්මය සංඥාවත්යයි හෝ දකියිද, සංඥාව ආත්මය කෙරෙහි ඇතැයි දකියිද ආත්මය සංඥාව කෙරෙහි පිහිටියේයයි දකියිද, මහණෙනි, මේ අශ්‍රැතවත්

පෘථග්ජනතෙමේ සංඥා බන්ධනයෙන් බැඳුණාවූ ඇතුළත පිටත බැඳීමෙන් බැඳුනාවූ එතෙර නොදක්නාවූ පරතෙර නොදක්නාවූ පුද්ගලයායයි කියනු ලැබේ. කෙලෙසුන්ගෙන් බැඳුනෙක්ව උපදියි. බැඳුනෙක්ව මියයයි. බැඳුනෙක්ව මෙලොවින් පරලොවට යයි.

**5.** "සංස්කාරයන් ආත්මය වශයෙන් දකියිද, ආත්මය සංස්කාරවත්යයි හෝ දකියිද, සංස්කාර ආත්මය කෙරෙහි ඇතැයි දකියිද, ආත්මය සංස්කාර කෙරෙහි පිහිටියේයයි දකියිද, මහණෙනි, මේ අශ්‍රැතවත් පෘථග්ජනතෙමේ සංස්කාර බන්ධනයෙන් බැඳුනාවූ ඇතුළත පිටත බැඳීමෙන් බැඳුනාවූ එතෙර නොදක්නාවූ පරතෙර නොදක්නාවූ පුද්ගලයායයි කියනු ලැබේ. කෙලෙසුන්ගෙන් බැඳුනෙක්ව උපදියි. බැඳුනෙක්ව මියයයි. බැඳුනෙක්ව මෙලොවින් පරලොවට යයි.

**6.** "විඤ්ඤාණය ආත්ම වශයෙන් දකියිද, ආත්මය විඤ්ඤාණවත්යයි හෝ දකියිද, විඤ්ඤාණය ආත්මය කෙරෙහි හෝ ඇතැයි දකියිද, ආත්මය විඤ්ඤාණය කෙරෙහි හෝ පිහිටියේයයි දකියිද, මහණෙනි, මේ අශ්‍රැතවත් පෘථග්ජන තෙමේ විඤ්ඤාණ බන්ධනයෙන් බැඳුනාවූ ඇතුළත පිටත බැඳීමෙන් බැඳුනාවූ එතෙර නොදක්නාවූ පරතෙර නොදක්නාවූ පුද්ගලයායයි කියනු ලැබේ. කෙලෙසුන්ගෙන් බැඳුනක්ව උපදියි. බැඳුනක්ව මියයයි. බැඳුනක්ව මේ ලොවින් පරලොවට යයි.

**7.** "මහණෙනි, ආර්යයන් දක්නාවූ ආර්ය ධර්මයෙහි දක්ෂවූ ආර්ය ධර්මයෙහි හික්මුනාවූ සත්පුරුෂයන් දක්නාවූ සත්පුරුෂ ධර්මයෙහි දක්ෂවූ සත්පුරුෂ ධර්මයෙහි හික්මුනාවූ ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවක තෙමේ රූපය ආත්මය වශයෙන් නොදකියිද, ආත්මය රූපවත්යයි හෝ නොදකියිද, රූපය ආත්මය කෙරෙහි හෝ ඇතැයි නොදකියිද, ආත්මය රූපය කෙරෙහි හෝ පිහිටියේයයි නොදකියිද, මහණෙනි, මේ ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකතෙමේ රූප බන්ධනයෙන් නොබැඳුනාවූ ඇතුළත පිටත බන්ධනයෙන් නොබැඳුනාවූ පුද්ගලයායයි කියනු ලැබේ. එතෙර දක්නේ පරතෙර දක්නේ දුකින් මනාකොට මිදුනේයයි කියමි.

8. "වේදනාව ආත්ම වශයෙන් නොදකියිද, ආත්මය වේදනාවත්යයි හෝ නොදකියිද, වේදනාව ආත්මය කෙරෙහි හෝ ඇතැයි නොදකියිද, ආත්මය වේදනාව කෙරෙහි හෝ පිහිටියේයයි නොදකියිද, මහණෙනි, බොහෝ ඇසූ පිරූ තැන් ඇති මේ ආර්යශ්‍රාවකතෙමේ වේදනා බන්ධනයෙන් නොබැඳුනාවූ ඇතුළත පිටත බන්ධනයෙන් නොබැඳුනාවූ පුද්ගලයායයි කියනු ලැබේ. එතෙර දක්නාවූ පරතෙර දක්නාවූ දුකින් මනාකොට මිදුනාවූ පුද්ගලයායයි කියයි.

9. "සඤ්ඤාව ආත්ම වශයෙන් නොදකියිද, ආත්මය සංඥාවත්යයි හෝ නොදකියිද, සංඥාව ආත්මය කෙරෙහි හෝ ඇතැයි නොදකියිද, ආත්මය සංඥාව කෙරෙහි හෝ පිහිටියේ යයි නොදකියිද, මහණෙනි, බොහෝ ඇසූපිරූතැන් ඇති මේ ආර්ය ශ්‍රාවකතෙමේ සංඥා බන්ධනයෙන් නොබැඳුනාවූ ඇතුළත පිටත බන්ධනයෙන් නොබැඳුනාවූ පුද්ගලයායයි කියනු ලැබේ. එතෙර දක්නාවූ පරතෙර දක්නාවූ දුකින් මනාකොට මිදුනාවූ පුද්ගලයායි කියයි.

10. "සංස්කාරය ආත්ම වශයෙන් නොදකියිද, ආත්මය සංස්කාරවත්යයි හෝ නොදකියිද සංස්කාර ආත්මය කෙරෙහි හෝ ඇතැයි නොදකියිද, ආත්මය සංස්කාර කෙරෙහි හෝ පිහිටියේයයි නොදකියිද, මහණෙනි, බොහෝ ඇසූ පිරූ තැන් ඇති මේ ආර්ය ශ්‍රාවකතෙමේ සංස්කාර බන්ධනයෙන් නොබැඳුනාවූ ඇතුළත පිටත බන්ධනයෙන් නොබැඳුනාවූ පුද්ගලයායයි කියනු ලැබේ. එතෙර දක්නාවූ පරතෙර දක්නාවූ දුකින් මනාකොට මිදුනාවූ පුද්ගලයායයි කියයි.

11. "විඤ්ඤාණය ආත්ම වශයෙන් නොදකියිද, ආත්මය විඤ්ඤාණවත්යයි හෝ නොදකියිද, විඤ්ඤාණය ආත්මය කෙරෙහි හෝ ඇතැයි නොදකියිද, ආත්මය විඤ්ඤාණය කෙරෙහි හෝ පිහිටියේයයි නොදකියිද, මහණෙනි, බොහෝ ඇසූ පිරූ තැන් ඇති මේ ආර්යශ්‍රාවක තෙමේ විඤ්ඤාණ බන්ධනයෙන් නොබැඳුනාවූ ඇතුළත පිටත බන්ධනයෙන්

නොබැඳුනාවූ පුද්ගලයායයි කියනු ලැබේ. එතෙර දක්නාවූ පරතෙර දක්නාවූ දුකින් මනාකොට මිදුනේයයි කියයි."

**(පස්වෙනි බන්ධන සූත්‍රය නිමි.)**

---

## 6 වැනි පරිමුච්චිත සූත්‍රය (1)

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, කුමක් සිතන්නහුද? රූපය මෙය මාගේය ඒ මම වෙමි. ඒ මාගේ ආත්මය වේයයි දක්නාහුද?" "ස්වාමීනි, එසේ නොවේය," මහණෙනි, යහපති, මහණෙනි, රූපය මෙය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි මෙය මෙසේ තත්වාකාරයෙන් යහපත් නුවණින් දතයුතුයි.

**3.** "මහණෙනි, කුමක් සිතන්නහුද? වේදනාව මෙය මාගේය. ඒ මම වෙමි. ඒ මාගේ ආත්මය වේයයි දක්නහුද?" "ස්වාමීනි, එසේ නොවේය." "මහණෙනි, යහපති මහණෙනි, වේදනාව මෙය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි මෙය මෙසේ තත්වාකාරයෙන් යහපත් නුවණින් දතයුතුයි.

**4.** "මහණෙනි, කුමක් සිතන්නහුද? සඤ්ඤාව මෙය මාගේය ඒ මම වෙමි. ඒ මාගේ ආත්මය වේයයි දක්නහුද?" "ස්වාමීනි, එසේ නොවේය." "මහණෙනි, යහපති මහණෙනි, සඤ්ඤාව මෙය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි මෙය මෙසේ තත්වාකාරයෙන් යහපත් නුවණින් දතයුතුයි.

**5.** "මහණෙනි, කුමක් සිතන්නහුද? සංස්කාරයන් මෙය මාගේය. ඒ මම වෙමි. ඒ මාගේ ආත්මය වේයයි දක්නහුද?" "ස්වාමීනි, එසේ නොවේය." "මහණෙනි, යහපති, මහණෙනි, සංස්කාරයන් මෙය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි මෙය මෙසේ තත්වාකාරයෙන් යහපත් නුවණින් දතයුතුයි.

**6.** "මහණෙනි, කුමක් සිතන්නහුද? විඤ්ඤාණය මෙය මාගේය. ඒ මම වෙමි. ඒ මාගේ ආත්මය වේයයි දක්නහුද?" "ස්වාමීනි, එය එසේ නොවේය." "මහණෙනි, යහපති. විඤ්ඤාණය මෙය මාගේ නොවෙයි ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි, මෙය මෙසේ තත්ත්වාකාරයෙන් යහපත් නුවණින් දතයුතුයි.

**7.** "මහණෙනි, මෙසේ දකින්නාවූ බොහෝ ඇසූ පිරූ තැන් ඇති ආර්යශ්‍රාවක තෙමේ රූපයෙහිද කළකිරෙයි. වේදනාවෙහිද කළකිරෙයි, සඤ්ඤාවෙහිද කලකිරෙයි, සංස්කාරයන්හිද කලකිරෙයි, විඤ්ඤාණයෙහිද කළකිරෙයි. කළකිරුනේ නොඇලෙයි. නොඇලුණේ මිදෙයි. මිදුණු කල්හි මිදුණේය යන ඥානය උපදියි. ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචර්යාව වැස නිමවනලදී. කළයුත්ත කරන ලදී. මෙයින් පසු මාර්ගඵල පිණිස කළයුත්තක් නැතැයි දැනගනී.

**හයවෙනි පරිමුච්චිත සූත්‍රය නිමි.**

---

## 7 වැනි පරිමුච්චිත සූත්‍රය (2)

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමිනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, කුමක් සිතන්නහුද? මහණෙනි, රූපය මෙය මාගේ නොවේය මේ මම නොවෙමි. මේ මාගේ ආත්මය නොවේයයි දක්නහුද?" "ස්වාමීනි, එසේය." "මහණෙනි, යහපති, මහණෙනි, රූපය මෙය මාගේ නොවේය. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි මෙය තත්ත්වාකාරයෙන් යහපත් නුවණින් දතයුතුය.

3. "මහණෙනි, කුමක් සිතන්නහුද? මහණෙනි, වේදනාව මෙය මාගේ නොවෙයි. මේ මම නොවෙමි. මේ මාගේ ආත්මය නොවේයයි දක්නහුද?" "ස්වාමීනි, එසේය." "මහණෙනි යහපති, මහණෙනි, වේදනාව මෙය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි මෙය තත්ත්වාකාරයෙන් යහපත් නුවණින් දතයුතුය.

4. "මහණෙනි, කුමක් සිතන්නහුද? මහණෙනි, සඤ්ඤාව මෙය මාගේ නොවෙයි. මේ මම නොවෙමි. මේ මාගේ ආත්මය නොවේයයි දක්නහුද?" "ස්වාමීනි, එසේය." "මහණෙනි, යහපති මහණෙනි, සඤ්ඤාව මෙය මාගේ නොවේය ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි මෙය තත්ත්වාකාරයෙන් යහපත් නුවණින් දතයුතුයි.

5. "මහණෙනි, කුමක් සිතන්නහුද? මහණෙනි, සංස්කාරයන් මෙය මාගේ නොවෙයි. මේ මම නොවෙමි. මේ මාගේ ආත්මය නොවේයයි දක්නහුද?" "ස්වාමීනි එසේය." "මහණෙනි, යහපති මහණෙනි, සංස්කාරයෝ මෙය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි මෙය තත්ත්වාකාරයෙන් යහපත් නුවණින් දතයුතුයි.

6. "මහණෙනි, කුමක් සිතන්නහුද? මහණෙනි, විඤ්ඤාණය මෙය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි දක්නහුද?" "ස්වාමීනි, එසේය." "මහණෙනි, යහපති, විඤ්ඤාණය මෙය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි මෙය තත්වූ පරිදි යහපත් නුවණින් දතයුතුයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

7. "මහණෙනි, මෙසේ දකින්නාවූ බොහෝ ඇසූපිරූ තැන් ඇති ආර්ය ශ්‍රාවක තෙමේ රූපයෙහිද කළකිරෙයි, වේදනාවෙහිද කළකිරෙයි, සඤ්ඤාවෙහිද කළකිරෙයි, සංස්කාරයන්හිද කළකිරෙයි, විඥානයෙහිද කළකිරෙයි. කළකිරුණේ නොඇලෙයි, නොඇලුනේ මිදෙයි. මිදුනු කල්හි මිදුනේය යන ඥාණය උපදියි, ජාතිය ක්ෂයවිය, බ්‍රහ්මචර්යාව වැස නිමවන ලදී. කළයුත්ත කරණ ලදී. මත්තෙහි මාර්ගඵල සඳහා කළ යුත්තක් නැතැයි දැනගනියි."

**හත්වෙනි පරිමුච්චිත සූත්‍රය නිමි.**

---

## 8. සඤ්ඤොජන සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, සංයෝජනයන්ට හිතවූ ධර්මත් සංයොජන ධර්මත් දෙශනා කරන්නෙමි. එය අසව්, මහණෙනි, සංයොජනයන්ට හිතවූ ධර්ම කවරහුද? සංයොජන කවරේද? මහණෙනි, රූපය සංයෝජනයන්ට හිතවූ ධර්මයකි. එහි යම් ඡන්දරාගයක් වෙයිද, එය එහි සංයොජන නම් වේ. වේදනාව සංයොජනයන්ට හිතවූ ධර්මයකි. එහි යම් ඡන්දරාගයක් වෙයිද, එය එහි සංයොජන නම් වේ. සඤ්ඤාව සංයොජනයන්ට හිතවූ ධර්මයකි. එහි යම් ඡන්දරාගයක් වෙයිද, එය එහි සංයොජන නම් වේ. සංස්කාර සංයොජනයන්ට හිතවූ ධර්මයකි. එහි යම් ඡන්දරාගයක් වෙයිද, එය එහි සංයොජන නම් වේ. විඤ්ඤාණය සංයොජනයන්ට හිතවූ ධර්මයකි. එහි යම් ඡන්දරාගයක් වෙයිද එය එහි සංයොජන නම් වේ. මහණෙනි, මොව්හු

සංයොජනයන්ට හිතවූ ධර්මයෝයයි ද සඤ්ඤොජන ධර්මයයිද කියනු ලැබෙත්.”

අටවෙනි සඤ්ඤොජන සූත්‍රය නිමි.

---

## 9. උපාදාන සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූසේක. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. “මහණෙනි, උපාදානයන්ට හිතවූ ධර්මයන්ද උපාදානයද දෙශනා කරන්නෙමි. එය අසව් මහණෙනි, උපාදානයන්ට හිතවූ ධර්මයෝ කවරහුද? උපාදානය කවරේද? මහණෙනි, රූපය උපාදානයන්ට හිතවූ ධර්මයෙකි. එහි යම් ඡන්දරාගයක් වෙයිද එය එහි උපාදානයයි. වේදනාව උපාදානයන්ට හිතවූ ධර්මයකි. එහි යම් ඡන්දරාගයක් වෙයිද එය එහි උපාදානයයි. සඤ්ඤාව උපාදානයන්ට හිතවූ ධර්මයකි. එහි යම් ඡන්දරාගයක් වේද එය එහි උපාදානයයි. සංස්කාරය උපාදානයන්ට හිතවූ ධර්මයකි. එහි යම් ඡන්දරාගයක් වෙයිද එය එහි උපාදානයයි. විඤ්ඤාණය උපාදානයන්ට හිතවූ ධර්මයකි. එහි යම් ඡන්ද රාගයක් වෙයිද එය එහි උපාදානයයි.”

නවවෙනි උපාදාන සූත්‍රය නිමි.

---

## 10. සීල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ හා ආයුෂ්මත් මහා කොට්ඨිත

ස්ථවිරයන් වහන්සේද මිගදාය නම්වූ ඉසිපතනයෙහි වාසය කරත්. එකල්හි ආයුෂ්මත් මහාකොට්ඨිත ස්ථවිරයන් වහන්සේ සවස් කාලයෙහි විවේකයෙන් නැගී සිටියේ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියහ. පැමිණ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සමග සතුට එළවන කථා කළසේක. සතුටු විය යුතු සිහිකටයුතු කථා අවසන්කොට එකත්පසක හිඳගත්හ. එකත්පසක හිඳගත් ආයුෂ්මත් මහාකොට්ඨිත ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙය කීහ.

2. "ආයුෂ්මත් ශාරිපුත්‍රයෙනි, සිල්වත් භික්ෂුව විසින් කවර ධර්මයන් නුවණින් මෙනෙහි කළ යුතුද?" "අයුෂ්මත් කොට්ඨිත, සිල්වත් භික්ෂුව විසින් පංච උපාදානස්කන්ධයන් අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් රෝග වශයෙන් ගඩක් වශයෙන් හුලක් වශයෙන් විපතක් වශයෙන් ආබාධ වශයෙන් තමා නොවන්නක් වශයෙන් බිඳෙන්නක් වශයෙන් ශූන්‍ය වශයෙන් අනාත්ම වශයෙන් නුවණින් මෙනෙහි කළ යුතුය.

3. "ඒ කවර පසක්ද? එනම්:- රූප උපාදානස්කන්ධය, වේදනා උපාදානස්කන්ධය, සඤ්ඤා උපාදානස්කන්ධය, සංස්කාර උපාදානස්කන්ධය, විඤ්ඤාණ උපාදානස්කන්ධය යන මොහුයි. ආයුෂ්මත් කොට්ඨිතයෙනි, සිල්වත් භික්ෂුව විසින් මේ පස් උපාදානස්කන්ධයන් අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් රෝග වශයෙන් ගඩක් වශයෙන් හුලක් වශයෙන් විපතක් වශයෙන් ආබාධ වශයෙන් තමා නොවන්නක් වශයෙන් බිඳෙන්නක් වශයෙන් ශූන්‍ය වශයෙන් අනාත්ම වශයෙන් නුවණින් මෙනෙහි කළ යුතුය. යම් සිල්වත් භික්ෂුවක් මේ පඤ්චඋපාදානස්කන්ධයන් අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් රෝග වශයෙන් ගඩක් වශයෙන් හුලක් වශයෙන් විපතක් වශයෙන් ආබාධ වශයෙන් තමා නොවන්නක් වශයෙන් බිඳෙන්නක් වශයෙන් ශූන්‍ය වශයෙන් අනාත්ම වශයෙන් නුවණින් මෙනෙහි කරන්නේ සොතාපත්තිඵලය ප්‍රත්‍යක්ෂ කරන්නේය යන යමක් වේ නම් ඊට හේතු ඇත්තේය."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. "ආයුෂ්මත් ශාරිපුත්‍රයෙනි, සොතාපන්න භික්ෂුව විසින් කවර ධර්මයන් නුවණින් මෙනෙහි කටයුතුද?" "ආයුෂ්මත් කොට්ඨිතයෙනි, සොතාපන්න භික්ෂුව විසින්ද මේ පඤ්චඋපාදානස්කන්ධයන් අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් රෝග වශයෙන් ගඩක් වශයෙන් හුලක් වශයෙන් විපතක් වශයෙන් ආබාධ වශයෙන් තමා නොවන්නක් වශයෙන් බිඳෙන්නක් වශයෙන් සූන්‍ය වශයෙන් අනාත්ම වශයෙන් නුවණින් මෙනෙහි කළ යුතුය. සොතාපන්න මහණතෙමේ මේ පඤ්චඋපාදානස්කන්ධයන් අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් රෝග වශයෙන් ගඩක් වශයෙන් හුලක් වශයෙන් විපතක් වශයෙන් ආබාධ වශයෙන් තමා නොවන්නක් වශයෙන් බිඳෙන්නක් වශයෙන් සූන්‍ය වශයෙන් අනාත්ම වශයෙන් නුවණින් මෙනෙහි කරන්නේ සකෘදාගාමිඵලය ප්‍රත්‍යක්ෂ කරන්නේය යන යමක් වේ නම් ඊට හේතු ඇත්තේය.

5. "ආයුෂ්මත් ශාරිපුත්‍රයෙනි, සකෘදාගාමි භික්ෂුව විසින් කවර ධර්මයන් නුවණින් මෙනෙහි කටයුතුද?" "ආයුෂ්මත් කොට්ඨිතයෙනි, සකෘදාගාමි භික්ෂුව විසින්ද මේ පඤ්ච උපාදානස්කන්ධයන් අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් රෝග වශයෙන් ගඩක් වශයෙන් හුලක් වශයෙන් විපතක් වශයෙන් ආබාධ වශයෙන් තමා නොවන්නක් වශයෙන් බිඳෙන්නක් වශයෙන් සූන්‍ය වශයෙන් අනාත්ම වශයෙන් නුවණින් මෙනෙහි කටයුතුයි.

"යම් සකෘදාගාමි භික්ෂුවක් මේ පඤ්ච උපාදානස්කන්ධයන් අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, රෝග වශයෙන්, ගඩක් වශයෙන්, හුලක් වශයෙන්, විපතක් වශයෙන්, ආබාධ වශයෙන් තමා නොවන්නක් වශයෙන්, බිඳෙන්නක් වශයෙන්, සූන්‍ය වශයෙන්, අනාත්ම වශයෙන් නුවණින් මෙනෙහි කරන්නේ අනාගාමි ඵලය ප්‍රත්‍යක්ෂ කරන්නේය යන යමක් වේ නම් ඊට හේතු ඇත්තේය.

6. "ආයුෂ්මත් ශාරිපුත්‍රයෙනි, අනාගාමි මහණ විසින් කවර ධර්මයන් නුවණින් මෙනෙහි කටයුතුද?

"ආයුෂ්මත් කොට්ඨිතයෙනි, අනාගාමි භික්ෂුව විසින් ද මේ පඤ්ච උපාදානස්කන්ධයන් අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, රෝග වශයෙන් ගඩක් වශයෙන්, හුලක් වශයෙන්, විපතක් වශයෙන්, ආබාධ වශයෙන්, තමා නොවන්නක් වශයෙන්, බිඳෙන්නක් වශයෙන්, සූන්‍ය වශයෙන්, අනාත්ම වශයෙන් නුවණින් මෙනෙහි කටයුතුය. යම් අනාගාමි භික්ෂුවක් මේ පඤ්ච උපාදානස්කන්ධයන් අනිත්‍ය වශයෙන් දුක් වශයෙන්, රෝග වශයෙන්, ගඩක් වශයෙන්, හුලක් වශයෙන්, විපතක් වශයෙන්, ආබාධ වශයෙන්, තමා නොවන්නක් වශයෙන්, බිඳෙන්නක් වශයෙන්, සූන්‍ය වශයෙන් අනාත්ම වශයෙන් නුවණින් මෙනෙහි කරන්නේ අර්හත් ඵලය ප්‍රත්‍යක්ෂ කරන්නේය යන යමක් වේ නම් ඊට හේතු ඇත්තේය.

7. "ආයුෂ්මත් ශාරිපුත්‍රයෙනි, රහත්වූ භික්ෂුව විසින් කවර අධර්මයන් මෙනෙහි කටයුතුද?

"ආයුෂ්මත් කොට්ඨිතයෙනි, රහත් භික්ෂුව විසිනුදු පඤ්ච උපාදානස්කන්ධයන් අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, රෝග වශයෙන්, ගඩක් වශයෙන්, හුලක් වශයෙන්, විපතක් වශයෙන්, ආබාධ වශයෙන්, තමා නොවන්නක් වශයෙන්, බිඳෙන්නක් වශයෙන්, සූන්‍ය වශයෙන්, අනාත්ම වශයෙන් නුවණින් මෙනෙහි කටයුතුයි.

"ආයුෂ්මතුනි, රහතන් වහන්සේ විසින් මත්තෙහි කළ යුත්තක් හෝ කරණ ලද දෙයෙහි නැවත කිරීමක් නැත. එහෙත් භාවිතා කරණ ලද්දාවූ පුරුදු කරණ ලද්දාවූ මේ ධර්මයෝ මේ ආත්මයෙහි සැප විඳීම පිණිසද සිහිනුවණ පිණිසද පවතිත්.

**දහවෙනි සීල සූත්‍රය නිමි.**

## 11. සුතවා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ හා ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරයන් වහන්සේද මිගදාය නම්වූ ඉසිපතනයෙහි වාසය කරත්. එකල්හි ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරයන් වහන්සේ සවස් කාලයෙහි විවේකයෙන් නැගී සිටියේ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියහ. පැමිණ, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සමග සතුටු එළවන කථා කළසේක. සතුටුවිය යුතු සිහිකටයුතු කථා අවසන්කොට එකත්පසෙක හිඳගත්හ. එකත්පසක හුන් ආයුෂ්මත් මහාකොට්ඨිත ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙසේ කීහ.

2. "ඇවත් ශාරිපුත්‍රයෙනි, ශ්‍රැතවත්වූ භික්ෂුව විසින් කවර ධර්මයෝ නුවණින් මෙනෙහි කටයුත්තාහුද?"

"ආයුෂ්මත් කොට්ඨිතයෙනි, ශ්‍රැතවත්වූ භික්ෂුව විසින් පංච උපාදානස්කන්ධයෝ අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් රෝග වශයෙන් ගඩක් වශයෙන් හුලක් වශයෙන් පීඩාවක් වශයෙන් ආබාධ වශයෙන් අනුන් අයත් වූවක් වශයෙන් බිඳෙන්නක් වශයෙන් සූන්‍ය වශයෙන් අනාත්ම වශයෙන් නුවණින් මෙනෙහි කටයුත්තාහ. කවර පසක්ද එනම්, රූප උපාදානස්කන්ධය, වේදනා උපාදානස්කන්ධය, සංඥා උපාදානස්කන්ධය, සංස්කාර උපාදානස්කන්ධය, විඤ්ඤාණ උපාදානස්කන්ධය යනුයි. ඇවැත් කොට්ඨිතයෙනි, ශ්‍රැතවත්වූ භික්ෂුව විසින් මේ පස් උපාදානස්කන්ධයන් අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් රෝග වශයෙන් ගඩක් වශයෙන් හුලක් වශයෙන් පීඩාවක් වශයෙන් ආබාධ වශයෙන් අනුන් අයත්වූවක් වශයෙන් බිඳෙන්නක් වශයෙන් සූන්‍ය වශයෙන් අනාත්ම වශයෙන් නුවණින් මෙනෙහි කළ යුතුයි. මේ පංච උපාදානස්කන්ධයන් අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් රෝග වශයෙන් ගඩක් වශයෙන් හුලක් වශයෙන් පීඩාවක් වශයෙන් ආබාධ වශයෙන් අනුන් අයත් වූවක් වශයෙන් බිඳෙන්නක් වශයෙන් සූන්‍ය වශයෙන් අනාත්ම වශයෙන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නුවණින් මෙනෙහි කරන්නාවූ ශ්‍රැතවත් භික්ෂුව සොතාපත්ති ඵලය ප්‍රත්‍යක්ෂකරන්නේය. සකෘදාගාමි ඵලය ප්‍රත්‍යක්ෂකරන්නේය. අනාගාමි ඵලය ප්‍රත්‍යක්ෂකරන්නේය. අර්හත් ඵලය ප්‍රත්‍යක්ෂ කරන්නේය යන යමක් වේද, ඊට හෙතු ඇත්තේය.

3. "ඇවැත් ශාරිපුත්‍රයෙනි, රහත්වූවාහු විසින් කවර ධර්මයෝ නුවණින් මෙනෙහි කටයුත්තාහුද? රහත්වූවහු විසින්ද මේ පස් උපාදානස්කන්ධයෝ අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් රෝග වශයෙන් ගඩක් වශයෙන් හුලක් වශයෙන් පීඩාවක් වශයෙන් ආබාධ වශයෙන් අනුන් අයත් වූවක් වශයෙන් බිඳෙන්නක් වශයෙන් සූන්‍ය වශයෙන් අනාත්ම වශයෙන් නුවණින් මෙනෙහි කටයුත්තාහ. ඇවැත්නි, රහත්හු විසින් මත්තෙහි කළ යුත්තක් හෝ කරණ ලද දැයෙහි නැවත කිරීමක් හෝ නැති. එහෙත් භාවිතා කරණ ලද්දාවූ පුරුදු කරණ ලද්දාවූ මේ ධර්මයෝ මේ ආත්මයෙහි සැපවිහරණය පිණිසද සිහිය හා නුවණ පිණිසද පවතිත්.

**(එකොලොස්වෙනි සුතවා සූත්‍රය නිමි.)**

---

## 12. වැනි කප්ප සූත්‍රය 1

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් කප්ප ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසක හිඳගත්තේය. එකත් පසක හිඳගත් ආයුෂ්මත් කප්ප ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීය.

2. "ස්වාමීනි, කෙසේ දන්නාවූ කෙසේ දක්නාවූ භික්ෂුවට විඤ්ඤාණය සහිතවූ මේ කයෙහිද බාහිරවූ සියලු ආරම්මණයන්හිද මමය මාගේයයි ගන්නාවූ දෘෂ්ටි මානානුසයෝ නොවන්නාහුද?" කියායි.

"කප්පය, අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි රූපයක් වේද ඒ සියලු රූපය එය මගේ නොවේ, මම නොවෙමි, මගේ ආත්මය නොවේයයි යහපත් නුවණින් දකියිද, අතීතවූද අනාගතවූද දැන් පවතින්නාවූද අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි වේදනාවක් වෙයිද, ඒ සියලු වේදනාව එය මගේ නොවේ, මම නොවෙමි, මගේ ආත්මය නොවේයයි යහපත් නුවණින් දකියිද,

3. "අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි සංඥාවක් වෙයිද, ඒ සියලු සංඥාව එය මගේ නොවේ. මම නොවෙමි. මගේ ආත්මය නොවේයයි යහපත් නුවණින් දකියිද,

4. "අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි සංස්කාරයක් වෙයිද, ඒ සියලු සංස්කාරය එය මගේ නොවේ. මම නොවෙමි. මගේ ආත්මය නොවේයයි යහපත් නුවණින් දකියිද,

5. "අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි විඥානයක් වේද, ඒ සියලු විඤ්ඤාණය එය මගේ නොවේ. මම නොවෙමි. මගේ ආත්මය නොවේයයි යහපත් නුවණින් දකියිද, කප්පය, මෙසේ දන්නාවූ, මෙසේ දක්නාවූ, මහණහට විඤ්ඤාණය සහිතවූ මේ කයෙහිද පිටත් සියලු ආරම්මණයන්හිද, අහංකාරය, මමත්වය (මාගේයයි සිතීම) සහ මානය යන කෙලෙස් ඇති නොවෙත්යයි වදාළේය.

**(දොළොස්වෙනි කප්ප සූත්‍රය (1) නිමි.)**

---

## 13. කප්ප සූත්‍රය. (2)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් කප්ප ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හුන්නේය. එකත් පසෙක සිටි ආයුෂ්මත් කප්ප ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ.

2. "ස්වාමීනි, කෙසේ දන්නාවූ, කෙසේ දක්නාවූ භික්ෂුවට මේ විඤ්ඤාණය සහිතවූ කයෙහිද, බාහිරවූ සියලු ආරම්මණයන්හිද, මමය, මගේය යන දෘෂ්ටියද, මානයද දුරුවූ මාන කොටස් ඉක්ම ගියාවූ, ශාන්තවූ, කෙලෙසුන් කෙරෙන් හොඳින් මිදුණාවූ, සිතක් වෙයිද,

3. "කප්පය, අතීතවූද, අනාගතවූද, වර්තමානවූද අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි රූපයක් වේද, ඒ සියලු රූපය 'මෙය මාගේ නොවේ. මම නොවෙමි. මගේ ආත්මය නොවේයයි' මෙසේ තත්ත්වාකාරයෙන් යහපත් නුවණින් දැක, තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් අල්වානොගෙන කෙලෙසුන් කෙරෙන් මිදුණේ වෙයිද,

4. "අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ කිසියම් වේදනාවක් වේද, ඒ සියලු වේදනාව 'මෙය මගේ නොවේය. මම නොවෙමි. මගේ ආත්මය නොවේයයි' මෙසේ තත්වාකාරයෙන් යහපත් නුවණින් දැක, තෘෂ්ණා, දෘෂ්ටීන්ගේ වශයෙන් අල්වානොගෙන කෙලෙසුන් කෙරෙන් මිදුණේ වෙයිද,

5. "අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ

හෝ දුරවූ හෝ සමීපවූ හෝ කිසියම් සංඥාවක් වේද, ඒ සියලු සංඥාව 'මෙය මගේ නොවේය, මම නොවෙමි, මගේ ආත්මය නොවේයයි' මෙසේ තත්වාකාරයෙන් යහපත් නුවණින් දැක තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් අල්වා නොගෙන කෙලෙසුන් කෙරෙන් මිදුණේ වෙයිද,

**6.** "අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ කිසියම් සංස්කාරයක්වේද, ඒ සියලු සංස්කාරය 'මෙය මාගේ නොවේය, මම නොවෙමි, මගේ ආත්මය නොවේයයි' මෙසේ තත්වාකාරයෙන් යහපත් නුවණින් දැක, තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් අල්වානොගෙන කෙලෙසුන් කෙරෙන් මිදුණේ වෙයිද,

**7.** "අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ කිසියම් විඥානයක් වේද ඒ සියලු විඥානය 'මෙය මගේය, මම නොවේ. මගේ ආත්මය නොවේ' යයි තත්වාකාරයෙන් යහපත් ප්‍රඥාවෙන් දැක, තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් නොගෙන කෙලෙසුන් කෙරෙන් මිදුණේ වෙයිද, කප්පය මෙසේ දන්නාවූ, මෙසේ දක්නාවූ, භික්ෂුවට විඤ්ඤාණය සහිතවූ මේ කයෙහිද, බාහිර සියලු ආරම්මණයන්හිද අහංකාරය, මමත්වය (මාගේ යයි සිතීම) සහ මානය යන කෙලෙසුන් කෙරෙන් දුරුවූ මානය ඉක්ම ගියාවූ, ශාන්තවූ, කෙලෙසුන් කෙරෙන් හොඳින් මිදුනාවූ වේයයි වදාළේය.

**(දහතුන්වෙනි කප්ප සූත්‍රය (2) නිමි.)**

---

**(භික්ෂු සූත්‍ර දෙකද, කථික සූත්‍ර දෙකද, බන්ධන සූත්‍රයද, පරිමුච්චිත සූත්‍ර දෙකද, සඤ්ඤොජන සූත්‍රයද, උපාදාන සූත්‍රයද, සීල සූත්‍රයද, සුතවා සූත්‍රයද, කප්ප සූත්‍ර දෙකදැයි මේ වර්ගයට සූත්‍ර දහතුනක් වේ.)**

**(ධර්ම කථික වර්ගය නිමි)**

---

# 13. අවිජ්ජා වර්ගය.

## 1. සමුදය ධම්ම සූත්‍රය (1)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පැත්තක හුන්නේය. එක්පැත්තක හුන්නාවූ, ඒ මහණතෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීයේය.

2. "ස්වාමීනි, අවිද්‍යාව අවිද්‍යාවයයි කියනු ලැබේ. ස්වාමීනි, අවිද්‍යාව යනු කවරේද? කොපමණකින් අවිද්‍යාවට පැමිණියේ වේද? යනුයි.

"මහණ, මේ සාසනයෙහි ඇසූ පිරූ තැන් නැති පෘථග්ජනතෙමේ හටගැනීම ස්වභාවකොට ඇති, රූපය හටගැනීම ස්වභාවකොට ඇති, රූපයයි තත්වූ පරිදි නොදනියිද, නැතිවීම ස්වභාවකොට ඇති රූපය නැතිවීම ස්වභාවකොට ඇති රූපයයි තත්වූ පරිදි නොදනියිද, හටගැනීම හා විනාශවීම ස්වභාවකොට ඇති රූපය, හටගැනීම හා විනාශවීම ස්වභාවකොට ඇති රූපයයි තත්වූ පරිදි නොදනියිද,

"හටගැනීම ස්වභාවකොට ඇති වේදනාව හටගැනීම ස්වභාවකොට ඇති වේදනාවයයි තත්වූ පරිදි නොදනියිද, නැතිවීම ස්වභාවකොට ඇති වේදනාව නැතිවීම ස්වභාවකොට ඇති වේදනාවයයි තත්වූ පරිදි නොදනියිද හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති වේදනාව හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති වේදනාවයයි තත්වූ පරිදි නොදනියිද,

"හටගැනීම ස්වභාවකොට ඇති සංඥාව හටගැනීම ස්වභාවකොට ඇති සංඥාවයයි තත්වූ පරිදි නොදනියිද, නැතිවීම ස්වභාවකොට ඇති සංඥාව නැතිවීම ස්වභාවකොට ඇති

සංඥාවයයි තත්වූ පරිදි නොදනියිද, හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති සංඥාව හටගැනීම හා නැතිවීම ස්වභාව කොට ඇති සංඥාවයයි තත්වූ පරිදි නොදනියිද,

"හටගැනීම ස්වභාවකොට ඇති සංස්කාරයන් හටගැනීම ස්වභාවකොට ඇති සංස්කාරයන් යයි තත්වූ පරිදි නොදනියිද, නැතිවීම ස්වභාවකොට ඇති සංස්කාරයන් නැතිවීම ස්වභාව කොට ඇති සංස්කාරයන්යයි තත්වූ පරිදි නොදනියිද, හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති සංස්කාරයන් හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති සංස්කාරයන්යයි තත්වූ පරිදි නොදනියිද,

"හටගැනීම ස්වභාවකොට ඇති විඥානය හටගැනීම ස්වභාවකොට ඇති විඥානයයි තත්වූ පරිදි නොදනියිද, නැතිවීම ස්වභාවකොට ඇති විඥානය නැතිවීම ස්වභාවකොට ඇති විඥානයයි තත්වූ පරිදි නොදනියිද, හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති විඥානය හටගැනීම හා නැතිවීම ස්වභාව කොට ඇති විඥානයයි තත්වූ පරිදි නොදනියිද, මහණ මේ අවිද්‍යාවයයි කියනු ලැබේ. මෙපමණකින්ම අවිද්‍යාවට පැමිණියේ වේයයිද කියනු ලැබේ.

3. "මෙසේ වදාළ කල්හි ඒ භික්ෂුතෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය වදාළසේක. 'ස්වාමීනි, විද්‍යාව විද්‍යාවයයි කියනු ලැබේ. ස්වාමීනි විද්‍යාව යනු කවරේද? කොපමණකින් විද්‍යාවට පැමිණියේ වේද?" යනුයි.

"මහණ, මේ ශාසනයෙහි ඇසූ පිරූ තැන් ඇති ආර්ය ශ්‍රාවකතෙමේ හටගැනීම ස්වභාවකොට ඇති රූපය හටගැනීම ස්වභාවකොට ඇති රූපයයි තත්වූ පරිදි දනියිද, නැතිවීම ස්වභාවකොට ඇති රූපය නැතිවීම ස්වභාවකොට ඇති රූපයයි තත්වූ පරිදි දනියිද, හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති රූපය හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති රූපයයි තත්වූ පරිදි දනියිද,

"හටගැනීම ස්වභාවකොට ඇති වේදනාව හටගැනීම ස්වභාවකොට ඇති වේදනාවයයි තත්වූ පරිදි දනියිද, නැතිවීම

ස්වභාවකොට ඇති වේදනාව නැතිවීම ස්වභාවකොට ඇති වේදනාවයයි තත්වූ පරිදි දනියිද, හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති වේදනාව හටගැනීම හා නැතිවීම ස්වභාව කොට ඇති වේදනාවයයි තත්වූ පරිදි දනියිද,

'හටගැනීම ස්වභාවකොට ඇති සංඥාව හටගැනීම ස්වභාවකොට ඇති සංඥාවයයි තත්වූ පරිදි දනියිද, නැතිවීම ස්වභාවකොට ඇති සංඥාව නැතිවීම ස්වභාවකොට ඇති සංඥාවයයි තත්වූ පරිදි දනියිද, හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති සංඥාව හටගැනීම හා නැතිවීම ස්වභාව කොට ඇති සංඥාවයයි තත්වූ පරිදි දනියිද,

"හටගැනීම ස්වභාවකොට ඇති සංස්කාරයන් හටගැනීම ස්වභාවකොට ඇති සංස්කාරයන්යයි තත්වූ පරිදි දනියිද නැතිවීම ස්වභාවකොට ඇති සංස්කාරයන් නැතිවීම ස්වභාව කොට ඇති සංස්කාරයන්යයි තත්වූ පරිදි දනියිද, හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති සංස්කාරයන් හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති සංස්කාරයන්යයි තත්වූ පරිදි දනියිද,

"හටගැනීම ස්වභාවකොට ඇති විඥානය හටගැනීම ස්වභාවකොට ඇති විඥානයයි ඇතිසැටි දනියිද, නැතිවීම ස්වභාවකොට ඇති විඥානය නැතිවීම ස්වභාවකොට ඇති විඥානයයි ඇති සැටි දනියිද, ඇතිවීම සහ නැතිවීම ස්වභාව කොට ඇති විඤ්ඤාණය ඇතිවීම සහ නැතිවීම ස්වභාවකොට ඇති විඤ්ඤාණයයි ඇති සැටි දනියිද, මහණ, මේ විද්‍යාවයයි කියනු ලැබේ. මෙපමණකින්ම විද්‍යාවට පැමිණියේද වෙයි.

**(පළමුවෙනි සමුදය ධම්ම සූත්‍රය (1) නිමි.**

---

## 2 සමුදය ධම්ම සූත්‍රය (2)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයක ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝද, ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝද බරණැස මිගදාය නම් ලත් ඉසිපතනාරාමයෙහි වාසය කෙරෙත්.

එකල්හි වනාහි ආයුෂ්මත් මහාකොට්ඨිත ස්ථවිරයන් වහන්සේ සවස් කාලයෙහි විවේක සැපයෙන් නැගී සිටියේ ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ යම් තැනකද, එතැන්හි පැමිණියහ. පැමිණ, ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් හා සමග සතුටු විය. සතුටු විය යුතුවූත් සිහි කටයුතු වූත් කථාවකොට නිමවා එක්පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ ආයුෂ්මත් මහාකොට්ඨිත ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට මේ කාරණය කීහ.

**2.** "ඇවැත් ශාරිපුත්‍රයෙනි, අවිද්‍යාවය අවිද්‍යාවයයි කියනු ලැබේ. ඇවැත්නි, අවිද්‍යාව කවරේද? කොපමණකින් අවිද්‍යාවට පැමිණියේ වේද?" යනුයි.

"ඇවැත්නි, මේ සස්නෙහි ඇසූපිරූ තැන් නැති පෘථග්ජනතෙමේ හටගැනීම ස්වභාවකොට ඇති රූපය හටගැනීම ස්වභාවකොට ඇති රූපයයි ඇතිසැටි නොදනියි, නැතිවීම ස්වභාවකොට ඇති රූපය නැතිවීම ස්වභාවකොට ඇති රූපයයි ඇතිසැටි නොදනියි, හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති රූපය හටගැනීම හා නැතිවීම ස්වභාව කොට ඇති රූපයයි ඇතිසැටි නොදනියි.

"හටගැනීම ස්වභාවකොට ඇති වේදනාව හටගැනීම ස්වභාවකොට ඇති වේදනාවයයි ඇතිසැටි නොදනියි, නැති වීම ස්වභාවකොට ඇති වේදනාව නැතිවීම ස්වභාව කොට ඇති වේදනාවයයි ඇතිසැටි නොදනියි, හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති වේදනාව හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති වේදනාවයයි ඇතිසැටි නොදනියි.

"හටගැනීම ස්වභාවකොට ඇති සංඥාව හටගැනීම ස්වභාවකොට ඇති සංඥාවයයි ඇතිසැටි නොදනියි, නැතිවීම ස්වභාවකොට ඇති සංඥාව නැතිවීම ස්වභාවකොට ඇති සංඥාවයයි ඇතිසැටි නොදනියි, හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති සංඥාව හටගැනීම හා නැතිවීම ස්වභාව කොට ඇති සංඥාවයයි ඇති සැටි නොදනියි.

"හටගැනීම ස්වභාවකොට ඇති සංස්කාරයන් හටගැනීම ස්වභාවකොට ඇති සංස්කාරයන්යයි ඇතිසැටි නොදනියි, නැතිවීම ස්වභාවකොට ඇති සංස්කාරයන් නැතිවීම ස්වභාව කොට ඇති සංස්කාරයන්යයි ඇතිසැටි නොදනියි, හටගැනීම හා නැතිවීම ස්වභාව කොට ඇති සංස්කාරයන් හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති සංස්කාරයන්යයි ඇතිසැටි නොදනියි.

"හටගැනීම ස්වභාවකොට ඇති විඥානය හටගැනීම ස්වභාවකොට ඇති විඥානයයි ඇතිසැටි නොදනියි, නැතිවීම ස්වභාවකොට ඇති විඥානය නැතිවීම ස්වභාවකොට ඇති විඤ්ඤාණයයි ඇතිසැටි නොදනියි, හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති විඤ්ඤාණය හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති විඤ්ඤාණයයි ඇතිසැටි නොදනියි, ඇවැත්නි මේ අවිද්‍යාවයයි කියනු ලැබේ. මෙපමණකින්ම අවිද්‍යාවට පැමිණියේ වෙයි.

**(දෙවෙනි සමුදය ධර්ම සූත්‍රය (2) නිමි.)**

---

## 3. සමුදය ධම්ම සූත්‍රය (3)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයක ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝද, ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝද බරණැස මිගදාය නම් ලත් ඉසිපතනාරාමයෙහි වාසය කෙරෙත්. එකල්හි වනාහි ආයුෂ්මත් මහාකොට්ඨිත ස්ථවිරයන් වහන්සේ සවස් කාලයෙහි විවේක සැපයෙන් නැඟී සිටියේ ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ යම් තැනෙකද, එතැන්හි පැමිණියහ. පැමිණ, ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් හා සමග සතුටු විය. සතුටු විය යුතුවූත් සිහි කටයුතු වූත් කථාවකොට නිමවා එක්පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ ආයුෂ්මත් මහාකොට්ඨිත ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට මේ කාරණය කීහ.

**2.** "ඇවැත් සැරියුත් තෙරණුවනි, විද්‍යාවය විද්‍යාවයයි කියනු ලැබේ. ඇවැත්නි, විද්‍යාව කවරේද? කොපමණකින් විද්‍යාවට පැමිණියේ වේද?"යනුයි.

"ඇවැත්නි, මේ සාසනයෙහි (බොහෝ ඇසූ පිරූ තැන් ඇති) ශ්‍රැතවත් ආර්යශ්‍රාවක තෙමේ හටගැනීම ස්වභාවකොට ඇති රූපය හටගැනීම ස්වභාවකොට ඇති රූපයයයි ඇති සැටි දනියිද, නැතිවීම ස්වභාවකොට ඇති රූපය නැතිවීම ස්වභාවකොට ඇති රූපයයි ඇතිසැටි දනියිද, හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති රූපය හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති රූපයයි ඇතිසැටි දනියිද,

"හටගැනීම ස්වභාවකොට ඇති වේදනාව හටගැනීම ස්වභාවකොට ඇති වේදනාවයයි ඇතිසැටි දනියිද, නැතිවීම ස්වභාවකොට ඇති වේදනාව නැතිවීම ස්වභාවකොට ඇති වේදනාවයයි ඇතිසැටි දනියිද, හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති වේදනාව හටගැනීම හා නැතිවීම ස්වභාව කොට ඇති වේදනාවයයි ඇතිසැටි දනියිද,

"හටගැනීම ස්වභාවකොට ඇති සංඥාව හටගැනීම ස්වභාවකොට ඇති සංඥාවයයි ඇතිසැටි දනියිද, නැතිවීම ස්වභාවකොට ඇති සංඥාව නැතිවීම ස්වභාවකොට ඇති සංඥාවයයි ඇතිසැටි දනියිද, හටගැනීම හා නැතිවීම ස්වභාව කොට ඇති සංඥාව හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති සංඥාවයයි ඇතිසැටි දනියිද,

"හටගැනීම ස්වභාවකොට ඇති සංස්කාරයන් හටගැනීම ස්වභාවකොට ඇති සංස්කාරයන්යයි ඇතිසැටි දනියිද, නැති වීම ස්වභාවකොට ඇති සංස්කාරයන් නැතිවීම ස්වභාවකොට ඇති සංස්කාරයන්යයි ඇතිසැටි දනියිද, හටගැනීම හා නැති වීම ස්වභාවකොට ඇති සංස්කාරයන් හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති සංස්කාරයන්යයි ඇතිසැටි දනියිද,

'හටගැනීම ස්වභාවකොට ඇති විඤ්ඤාණය හටගැනීම ස්වභාවකොට ඇති විඤ්ඤාණයයි ඇතිසැටි දනියිද, නැතිවීම

ස්වභාවකොට ඇති විඤ්ඤාණය නැතිවීම ස්වභාවකොට ඇති විඤ්ඤාණයයි ඇතිසැටි දනියිද, හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති විඤ්ඤාණය හටගැනීම හා නැතිවීම ස්වභාවකොට ඇති විඤ්ඤාණයයි ඇතිසැටි දනියිද, ඇවැත්නි, මේ විද්‍යාවයයි කියනු ලැබේ. මෙපමණකින් විද්‍යාවට පැමිණියේද වෙයි.

**(තුන්වෙනි සමුදය ධම්ම සූත්‍රය (3) නිමි.)**

---

## 4. අස්සාද සූත්‍රය (1)

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයක ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝද, ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝද, බරණැස මිගදාය නම් ලත් ඉසිපතනාරාමයෙහි වාසය කෙරෙත්. එකල්හි වනාහි ආයුෂ්මත් මහාකොට්ඨිත ස්ථවිරයන් වහන්සේ සවස් කාලයෙහි විවේක සැපයෙන් නැගී සිටියේ ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ යම් තැනෙකද, එතැන්හි පැමිණියහ. පැමිණ, ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් හා සමග සතුටු විය. සතුටු විය යුතුවූත් සිහි කටයුතු වූත් කථාවකොට නිමවා එක්පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ ආයුෂ්මත් මහාකොට්ඨිත ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට මේ කාරණය කීහ.

**2.** "ඇවැත් සැරියුත් තෙරණුවනි, අවිද්‍යාව අවිද්‍යාවයයි කියනු ලැබේ. ඇවැත්නි, අවිද්‍යාව කවරේද? කොපමණකින් අවිද්‍යාවට පැමිණියේ වේද?"යනුයි.

"ඇවැත්නි, මේ සස්නෙහි ඇසූ පිරූ තැන් නැති, පෘථග්ජනතෙමේ රූපයාගේ ඇතිවීමද, නැතිවීමද, (ආශ්වාදයද) රසවිඳීමද, දොස්ද, නික්මීමද, ඇතිසැටි නොදනියිද 'වේදනාවගේ ඇතිවීමද, නැතිවීමද, (ආශ්වාදයද) රසවිඳීමද, දොස්ද, නික්මීමද ඇතිසැටි නොදනියිද,' 'සංඥාවගේ ඇතිවීමද, නැතිවීමද, (ආශ්වාදයද) රසවිඳීමද, දොස්ද, නික්මීමද ඇති සැටි නොදනියිද,'

'සංස්කාරයන්ගේ ඇතිවීමද, නැතිවීමද, (ආශ්වාදයද) රසවිඳීමද, දොස්ද, නික්මීමද ඇතිසැටි නොදනියිද,' 'විඤ්ඤාණයාගේ ඇතිවීමද, නැතිවීමද, (ආශ්වාදයද) රසවිඳීමද, දොස්ද, නික්මීමද ඇතිසැටි නොදනියිද, මහණෙනි, මේ අවිද්‍යාවයයි කියනු ලැබේ. මෙපමණකින්ම අවිද්‍යාවට පැමිණියේයයි කියනු ලැබේ."

(හතරවෙනි අස්සාද සූත්‍රය (1) නිමි.)

## 5. අස්සාද සූත්‍රය (2)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයක ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝද, ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝද බරණැස මිගදාය නම් ලත් ඉසිපතනාරාමයෙහි වාසය කෙරෙත්. එකල්හි වනාහි ආයුෂ්මත් මහාකොට්ඨිත ස්ථවිරයන් වහන්සේ සවස් කාලයෙහි විවේක සැපයෙන් නැගී සිටියේ ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ යම් තැනෙකද, එතැන්හි පැමිණියහ. පැමිණ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් හා සමග සතුටු විය. සතුටු වියයුතුවූත් සිහි කටයුතු වූත් කථාවකොට නිමවා එක්පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ ආයුෂ්මත් මහාකොට්ඨිත ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට මේ කාරණය කීහ.

2. 'ඇවැත් සැරියුත් තෙරණුවනි, විද්‍යාව විද්‍යාවයයි කියනු ලැබේ. ඇවැත්නි, විද්‍යාව කවරේද? කොපමණකින් විද්‍යාවට පැමිණියේ වේද?" යනුයි.

"ඇවැත්නි, මේ ශාසනයෙහි ශ්‍රැතවත් ආර්යශ්‍රාවක තෙමේ රූපයාගේ ඇතිවීමද, නැතිවීමද, රසවිඳීමද, දොස්ද, නික්මීමද ඇතිසැටි දනියිද,' 'වේදනාවගේ ඇතිවීමද, නැති වීමද, රසවිඳීමද, දොස්ද, නික්මීමද ඇතිසැටි දනියිද, 'සංඥාවගේ ඇතිවීමද, නැතිවීමද, රසවිඳීමද, දොස්ද, නික්මීමද ඇතිසැටි දනියිද,' 'සංස්කාරයන්ගේ ඇතිවීමද, නැතිවීමද රසවිඳීමද, දොස්ද, නික්මීමද, ඇතිසැටි දනියිද,' 'විඤ්ඤාණයාගේ ඇතිවීමද,

නැතිවීමද, රසවිඳීමද, දොස්ද, නික්මීමද, ඇතිසැටි දැනගනියිද ඇවැත්නි, මේ විද්‍යාවයයි කියනු ලැබේ. මෙපමණකින් විද්‍යාවට පැමිණියේද වෙයි,' යනුයි.

(පස්වෙනි අස්සාද සූත්‍රය (2) නිමි.)

---

## 6. සමුදය සූත්‍රය (1)

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයෙක ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝද, ආයුෂ්මත් මහා කොට්ඨිත තෙරණුවෝද බරණැස මිගදාය නම් ලත් ඉසිපතනාරාමයෙහි වාසය කෙරෙත්. එකල්හි වනාහි ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරයන් වහන්සේ සවස් කාලයෙහි විවේක සැපයෙන් නැගී සිටියේ ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ යම්තැනකද එතැන්හි පැමිණියහ. පැමිණ, ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් හා සමග සතුටුවිය. සතුටුවිය යුතුවූත් සිහිකටයුතු වූත් කථාව කොට නිමවා එක්පැත්තක හුන්නේය.

**2.** එක්පැත්තක හුන්නාවූ ආයුෂ්මත් මහා කොට්ඨිත තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට මේ කාරණය කීහ. ආයුෂ්මත් ශාරිපුත්‍රය, අවිද්‍යාවය, අවිද්‍යාවයයි කියනු ලැබේ.

"ඇවැත්නි, අවිද්‍යාව කවරේද? කොපමණකින් අවිද්‍යාවට පැමිණියේ වේද?"යනුයි.

"ඇවැත්නි, මේ සස්නෙහි අශ්‍රැතවත් පෘථග්ජනතෙමේ රූපයාගේ හටගැනීමද, දුරු කිරීමද, රසවිඳීමද, දොස්ද, නික්මීමද ඇති සැටි නොදනියි, වේදනාවගේ හටගැනීමද, දුරු කිරීමද, රස විඳීමද, දොස්ද, නික්මීමද, ඇති සැටි නොදනියි. සංඥාවගේ හට ගැනීමද, දුරු කිරීමද, රස විඳීමද, දොස්ද, නික්මීමද ඇති සැටි නොදනියි. සංස්කාරයන්ගේ හටගැනීමද, දුරු කිරීමද, රස විඳීමද, දොස්ද, නික්මීමද ඇතිසැටි නොදනියි. විඥානයාගේ හට ගැනීමද, දුරු කිරීමද, රස විඳීමද, දොස්ද, නික්මීමද, ඇති සැටි නොදනියි.

"ඇවැත්නි, මේ අවිද්‍යාවයයි කියනු ලැබේ. මෙපමණකින් අවිද්‍යාවට පැමිණියේද වෙයි."

**(හයවෙනි සමුදය සූත්‍රය. (1) නිමි.)**

---

## 7. සමුදය සූත්‍රය. (2)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයක ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝද, ආයුෂ්මත් මහා කොට්ඨිත තෙරණුවෝද බරණැස මිගදාය නම් ලත් ඉසිපතනාරාමයෙහි වාසය කෙරෙත්. එකල්හි වනාහි ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරයන් වහන්සේ සවස් කාලයෙහි විවේක සැපයෙන් නැගී සිටියේ ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ යම් තැනෙකද, එතැන්හි පැමිණියහ. පැමිණ, ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් හා සමග සතුටුවිය. සතුටුවිය යුතුවූත් සිහිකටයුතුවූත් කථාව කොට නිමවා එක් පැත්තක හුන්නේය.

2. එක්පැත්තක හුන්නාවූ ආයුෂ්මත් මහා කොට්ඨිත තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට මේ කාරණය කීහ. "ඇවැත් ශාරිපුත්‍රය, විද්‍යාව විද්‍යාවයයි කියනු ලැබේ. ඇවැත්නි, විද්‍යාව කවරේද? කොපමණකින් විද්‍යාවට පැමිණියේ වේද?" යනුයි.

"ඇවැත්නි, ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකතෙමේ රූපයාගේ හටගැනීමද, දුරලීමද, ආශ්වාදයද, ආදීනවයද, නික්මීමද ඇති සැටි දනියි. වේදනාවගේ හටගැනීමද, දුරලීමද, ආශ්වාදයද, ආදීනවයද, නික්මීමද ඇති සැටි දනියි. සංඥාවගේ හටගැනීමද, දුරලීමද, ආශ්වාදයද, ආදීනවයද, නික්මීමද ඇති සැටි දනියි. සංස්කාරයන්ගේ හටගැනීමද, දුරලීමද, ආශ්වාදයද, ආදීනවයද, නික්මීමද ඇති සැටි දනියි. විඥානයාගේ හටගැනීමද, දුරලීමද, රස විඳගැනීමද (ආශ්වාදයද) ආදීනවයද (දොස්ද), නික්මීමද, ඇතිසැටි දනියි.

'ඇවැත්නි, මේ විද්‍යාවයයි කියනු ලැබේ. මෙපමණකින්ම විද්‍යාවට පැමිණියේද වෙයි."

(හත්වෙනි සමුදය සූත්‍රය (2) නිමි.)

---

## 8. කොට්ඨිත සූත්‍රය. (1)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයක ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝද, ආයුෂ්මත් මහා කොට්ඨිත තෙරණුවෝද බරණැස මිගදාය නම් ලත් ඉසිපතනාරාමයෙහි වාසය කෙරෙත්. එකල්හි වනාහි ආයුෂ්මත් කොට්ඨිත ස්ථවිරයන් වහන්සේ සවස් කාලයෙහි විවේක සැපයෙන් නැගී සිටියේ ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ යම්තැනකද එතැන්හි පැමිණියහ. පැමිණ, ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් හා සමග සතුටුවිය. සතුටුවිය යුතුවූත් සිහිකටයුතුවූත් කථාවකොට නිමවා එක් පැත්තක හුන්නේය.

2. එක්පැත්තක හුන්නාවූ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරුන්ට මේ කාරණය කීහ. ආයුෂ්මත් කොට්ඨිත අවිද්‍යාවය, අවිද්‍යාවයයි කියනු ලැබේ. "ඇවැත්නි, අවිද්‍යාව කවරේද? කොපමණකින් අවිද්‍යාවට පැමිණියේ වේද?"යනුයි.

"ඇවැත්නි, මේ සාසනයෙහි අශ්‍රැතවත් පෘථග්ජනතෙමේ රූපයාගේ ආශ්වාදයද, දොස්ද, නික්මීමද, ඇතිසැටි නොදනියි. වේදනාවේ ආශ්වාදයද, දොස්ද, නික්මීමද, ඇති සැටි නොදනියි. සංඥාවේ ආශ්වාදයද, දොස්ද, නික්මීමද ඇති සැටි නො දනියි. සංස්කාරයන්ගේ ආශ්වාදයද, දොස්ද, නික්මීමද ඇති සැටි නොදනියි. විඥානයාගේ ආශ්වාදයද, දොස්ද, නික්මීමද ඇති සැටි නොදනියි. ඇවැත්නි, මේ අවිද්‍යාවයයි කියනු ලැබේ. මෙපමණකින් අවිද්‍යාවට පැමිණියේද වෙයි"යනුයි.

3. මෙසේ කී කල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් මහා කොට්ඨිත තෙරුන්ට මේ කාරණය කීහ. "ඇවැත් කොට්ඨිතය, විද්‍යාවය, විද්‍යාවයයි කියනු ලැබේ. ඇවැත්නි,

විද්‍යාව කවරේද? කොපමණකින් විද්‍යාවට පැමිණියේ වේද?" යනුයි.

ඇවැත්නි, මේ සස්නෙහි ශ්‍රුතවත් ආර්යශ්‍රාවකතෙමේ රූපයාගේ ආශ්වාදයද, දොස්ද, නික්මීමද ඇති සැටි දනියි. වේදනාවගේ ආශ්වාදයද, දොස්ද, නික්මීමද ඇති සැටි දනියි. සංඥාවගේ ආශ්වාදයද, දොස්ද, නික්මීමද, ඇති සැටි දනියි. සංස්කාරයන්ගේ ආශ්වාදයද, දොස්ද, නික්මීමද ඇති සැටි දනියි. විඥානයාගේ ආශ්වාදයද, දොස්ද, නික්මීමද ඇති සැටි දනියි. ඇවැත්නි, මේ විද්‍යාවයයි කියනු ලැබේ. මෙපමණකින් අවිද්‍යාවට පැමිණියේද වෙයි."

**(අටවෙනි කොට්ඨිත සූත්‍රය (1) නිමි.)**

---

## 9. කොට්ඨිත සූත්‍රය (2)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයෙක ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝද, ආයුෂ්මත් මහා කොට්ඨිත තෙරණුවෝද බරණැස මිගදාය නම් ලත් ඉසිපතනාරාමයෙහි වාසය කෙරෙත්. එකල්හි වනාහි ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරයන් වහන්සේ සවස් කාලයෙහි විවේක සැපයෙන් නැගී සිටියේ ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ යම් තැනෙකද එතැන්හි පැමිණියහ. පැමිණ, ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් හා සමග සතුටුවිය. සතුටුවිය යුතුවූත් සිහිකටයුතුවූත් කථාවකොට නිමවා එක් පැත්තක හුන්නේය.

2. එක්පැත්තක හුන්නාවූ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරුන්ට මේ කාරණය කීහ. ආයුෂ්මත් කොට්ඨිතය, අවිද්‍යාවය, අවිද්‍යාවයයි කියනු ලැබේ. "ඇවැත්නි, අවිද්‍යාව කවරේද? කොපමණකින් අවිද්‍යාවට පැමිණියේ වේද?"යනුයි.

"ඇවැත්නි, මේ සස්නෙහි අශ්‍රැතවත් පෘථග්ජනතෙමේ රූපයාගේ හටගැනීමද, දුරලීමද, ආශ්වාදයද, දොස්ද, නික්මීමද, ඇතිසැටි නොදනියි. වේදනාවේ හටගැන්මද, දුරලීමද,

ආශ්වාදයද, දොස්ද, නික්මීමද, ඇති සැටි නො දනියි. සංඥාවේ හටගැනීමද, දුරලීමද, ආශ්වාදයද, දොස්ද, නික්මීමද, ඇතිසැටි නොදනියි. සංස්කාරයන්ගේ හටගැනීමද, දුරලීමද, ආශ්වාදයද, දොස්ද, නික්මීමද ඇති සැටි නොදනියි. විඥානයාගේ හටගැනීමද, දුරලීමද, ආශ්වාදයද, දොස්ද, නික්මීමද ඇති සැටි නොදනියි. ඇවැත්නි, මේ අවිද්‍යාවයයි කියනු ලැබේ. මෙපමණකින් අවිද්‍යාවට පැමිණියේද වෙයි."

3. මෙසේ කී කල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් මහා කොට්ඨිත තෙරුන්ට මේ කාරණය කීහ. "ඇවැත් කොට්ඨිතය, විද්‍යාවය, විද්‍යාවයයි කියනු ලැබේ. ඇවැත්නි, විද්‍යාව යනු කවරේද? කොපමණකින් විද්‍යාවට පැමිණියේ වේද?" යනුයි.

ඇවැත්නි, මේ සස්නෙහි ශ්‍රැතවත් ආර්යශ්‍රාවකතෙමේ රූපයාගේ හටගැනීමද, දුරලීමද, ආශ්වාදයද, දොස්ද, නික්මීමද ඇති සැටි දනියි. වේදනාවගේ හටගැනීමද, දුරලීමද, ආශ්වාදයද, දොස්ද, නික්මීමද ඇති සැටි දනියි. සංඥාවගේ හටගැනීමද, දුරලීමද, ආශ්වාදයද, දොස්ද, නික්මීමද, ඇති සැටි දනියි. සංස්කාරයන්ගේ හටගැනීමද, දුරලීමද, ආශ්වාදයද, දොස්ද, නික්මීමද ඇති සැටි දනියි. විඥානයාගේ හටගැනීමද, දුරලීමද, ආශ්වාදයද, දොස්ද, නික්මීමද ඇති සැටි දනියි.

"ඇවැත්නි, මේ විද්‍යාවයයි කියනු ලැබේ. මෙපමණකින් විද්‍යාවට පැමිණියේද වෙයි."

**(නවවෙනි කොට්ඨිත සූත්‍රය (2) නිමි.)**

---

## 10. කොට්ඨිත සූත්‍රය. (3)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයක ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝද, ආයුෂ්මත් මහා කොට්ඨිත තෙරණුවෝද බරණැස මිගදාය නම් ලත් ඉසිපතනාරාමයෙහි වාසය කෙරෙත්. එකල්හි ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරයන් වහන්සේ සවස්

කාලයෙහි විවේක සැපයෙන් නැගී සිටියේ ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ යම් තැනකද එතැන්හි පැමිණියහ. පැමිණ, ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් හා සමග සතුටුවිය. සතුටුවිය යුතුවූත් සිහිකටයුතුවූත් කථාවකොට නිමවා එක්පැත්තක හුන්නේය. එක්පැත්තක හුන්නාවූ ආයුෂ්මත් සාරිපුත්ත ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරයන්ට මේ කාරණය කීහ. "ඇවැත් කොට්ඨිතය, අවිද්‍යාවය, අවිද්‍යාවයයි කියනු ලැබේ. ඇවැත්නි, අවිද්‍යාව කවරේද? කොපමණකින් අවිද්‍යාවට පැමිණියේ වේද?" යනුයි.

2. ඇවැත්නි, මේ ශාසනයෙහි අශ්‍රැතවත් පෘථග්ජනතෙමේ රූපය නොදනියි. රූපයේ හටගැනීම නොදනියි, රූපය නැති කිරීම නොදනියි, රූපය නැති කිරීම පිණිස යායුතු මාර්ගය නොදනියි.

"වේදනාව නොදනියි. වේදනාවේ හට ගැනීම නොදනියි, වේදනාව නැති කිරීම නොදනියි, වේදනාව නැති කිරීම පිණිස යා යුතු මාර්ගය නොදනියි.

"සංඥාව නොදනියි, සංඥාවේ හටගැනීම නොදනියි, සංඥාව නැති කිරීම නොදනියි, සංඥාව නැති කිරීම පිණිස යා යුතු මාර්ගය නොදනියි.

"සංස්කාරයන් නොදනියි, සංස්කාරයන් හටගැනීම නොදනියි, සංස්කාරයන් නැති කිරීම නොදනියි, සංස්කාරයන් නැති කිරීම පිණිස යා යුතු මාර්ගය නොදනියි.

"විඥානය නොදනියි, විඥානයාගේ හට ගැනීම නොදනියි, විඥානය නැති කිරීම නොදනියි, විඥානය නැති කිරීම පිණිස යා යුතු මාර්ගය නොදනියි.

"ඇවැත්නි, මේ අවිද්‍යාවයයි කියනු ලැබේ. මෙපමණකින් අවිද්‍යාවට පැමිණියේද වෙයි." යනුයි.

3. මෙසේ කී කල්හි ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරතෙමේ ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරයන්ට මේ කාරණය කීහ.

"ඇවැත් කොට්ඨිතය, විද්‍යාවය, විද්‍යාවයයි කියනු ලැබේ. ඇවැත්නි, විද්‍යාව කවරේද? කොපමණකින් විද්‍යාවට පැමිණියේ වේද?"යනුයි.

"ඇවැත්නි, මේ ශාසනයෙහි ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවක තෙමේ රූපය දනියි. රූප සමුදය දනියි, රූපය නැතිකිරීම දනියි, රූපය නැති කිරීම පිණිස යා යුතු මාර්ගය දනියි. වේදනාව දනියි, වේදනා සමුදය දනියි. වේදනාව නැතිකිරීම දනියි, වේදනාව නැති කිරීම පිණිස යා යුතු මාර්ගය දනියි. සංඥාව දනියි, සංඥා සමුදය දනියි, සංඥාව නැති කිරීම දනියි. සංඥාව නැති කිරීම පිණිස යා යුතුමාර්ගය දනියි. සංස්කාරයන් දනියි, සංස්කාර සමුදය දනියි, සංස්කාරයන් නැතිකිරීම දනියි, සංස්කාරයන් නැති කිරීම පිණිස යා යුතු මාර්ගය දනියි. විඥානය දනියි, විඥානයාගේ හටගැනීම දනියි, විඥානය නැති කිරීම දනියි, විඥානය නැති කිරීම පිණිස යායුතු මාර්ගය දනියි.

"ඇවැත්නි, මේ විද්‍යාවයයි කියනු ලැබේ. මෙපමණකින් විද්‍යාවට පැමිණියේද වෙයි,

(දහවෙනි කොට්ඨිත සූත්‍රය (3) නිමි.)

---

(සමුදය ධර්ම වශයෙන් සූත්‍ර තුනක්ද, අස්සාද සූත්‍ර වශයෙන් අනික් සූත්‍ර දෙකක්ද, සමුදය වශයෙන් සූත්‍ර දෙකක්ද, කොට්ඨිත සූත්‍ර වශයෙන් තුනක් දැයි මේ වර්ගයෙහි සූත්‍ර දසයකි.)

අවිජ්ජා වර්ගය නිමි.

---

## 14. කුක්කුල වර්ගය.

### 1. කුක්කුල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින්

කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, රූපය උණු අළුමෙනි, වේදනාව උණු අළුමෙනි, සංඥාව උණු අළුමෙනි, සංස්කාර උණු අළුමෙනි, විඥානය උණු අළුමෙනි. මහණෙනි, මෙසේ බලන්නාවූ ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවකයා රූපයෙහිද කළකිරෙයි, වේදනාවෙහිද කළකිරෙයි, සංඥාවෙහිද කළකිරෙයි. සංස්කාරයන්හිද කළකිරෙයි, විඥානයෙහිද කළකිරෙයි, කළකිරුණේ නොඇලෙයි. නොඇලීමෙන් (කෙලෙසුන්ගෙන්) මිදේ. මිදුණු කල්හි මිදුණේයයි දැනීම වේ. ජාති තොමෝ ක්ෂයවූවාය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවන ලද්දේය. සතර මාර්ගයෙන් කටයුතු කොට නිමවන ලද්දේය. මේ රහත් බව පිණිස කළයුතු අනිකක් නැතැයි විශෙෂයෙන් දැනගනී."

**(පළමුවෙනි කුක්කුල සූත්‍රය නිමි.)**

---

## 2. අනිච්ච සූත්‍රය (1)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, යමක් වනාහි අනිත්‍යද, එහි තොපගේ කැමැත්ත දුරුකටයුතුයි. "මහණෙනි, අනිත්‍ය කුමක්ද?" මහණෙනි, රූපය අනිත්‍යය. එහි තොපගේ කැමැත්ත දුරුකටයුතුයි. වේදනාව අනිත්‍යය. එහි තොපගේ කැමැත්ත දුරුකටයුතුයි සඤ්ඤාව අනිත්‍යය. එහි තොපගේ කැමැත්ත

දුරුකටයුතුයි සංස්කාර අනිත්‍යය. එහි තොපගේ කැමැත්ත දුරුකටයුතුයි විඤ්ඤාණය අනිත්‍යය. එහි තොපගේ කැමැත්ත දුරුකටයුතුයි, මහණෙනි යමක් වනාහි අනිත්‍යයද? එහි තොපගේ කැමැත්ත දුරුකටයුතුයි.”

**(දෙවෙනි අනිච්ච සූත්‍රය (1) නිමි)**

---

## 3. අනිච්ච සූත්‍රය (2)

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූසේක. ‘ස්වාමීනියි’ කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, යමක් වනාහි අනිත්‍යද, එහි තොපගේ ඇල්ම දුරුකටයුතුයි. ‘මහණෙනි, අනිත්‍යය කුමක්ද?” මහණෙනි, රූපය අනිත්‍යය. එහි තොපගේ ඇල්ම දුරුකටයුතුයි. වේදනාව අනිත්‍යය, එහි තොපගේ ඇල්ම දුරුකටයුතුයි. සඤ්ඤාව අනිත්‍යය. එහි තොපගේ ඇල්ම දුරුකටයුතුයි. සංස්කාර අනිත්‍යය. එහි තොපගේ ඇල්ම දුරුකටයුතුයි. විඤ්ඤාණය අනිත්‍යය. එහි තොපගේ ඇල්ම දුරුකටයුතුයි. මහණෙනි, යමක් අනිත්‍යද, එහි තොපගේ ඇල්ම දුරුකට යුතුයි.

**(තුන්වෙනි අනිච්ච සූත්‍රය (2) නිමි.)**

---

## 4. අනිච්ච සූත්‍රය (3)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූසේක.

'ස්වාමිනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යමක් අනිත්‍යයද එහි තොපගේ කැමැත්ත හා ඇල්ම දුරුකටයුතුයි, මහණෙනි, අනිත්‍ය කුමක්ද? මහණෙනි රූපය අනිත්‍යය. එහි තොපගේ කැමැත්ත හා ඇල්ම දුරුකටයුතුයි. වේදනාව අනිත්‍යය. එහි තොපගේ කැමැත්ත හා ඇල්ම දුරුකටයුතුයි. සංඥාව අනිත්‍යය. එහි තොපගේ කැමැත්ත හා ඇල්ම දුරුකටයුතුයි. සංස්කාර අනිත්‍යය. එහි තොපගේ කැමැත්ත හා ඇල්ම දුරුකටයුතුයි. විඥානය අනිත්‍යය. එහි තොපගේ කැමැත්ත හා ඇල්ම දුරුකටයුතුයි. මහණෙනි, යමක් අනිත්‍යද එහි තොපගේ කැමැත්ත සහ ඇල්ම දුරුකටයුතුය.

**(හතරවෙනි අනිච්ච සූත්‍රය (3) නිමි.)**

## 5. දුක්ඛ සූත්‍රය. (1)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමිනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යමක් දුකද, එහි තොපගේ කැමැත්ත දුරුකළ යුතුයි. ඇල්ම දුරුකළ යුතුයි. කැමැත්ත සහ ඇල්ම දුරුකළ යුතුයි. මහණෙනි දුක කුමක්ද? මහණෙනි, රූපය දුකයි. එහි තොපගේ කැමැත්ත දුරුකට යුතුයි. ඇල්ම දුරුකට යුතුයි. කැමැත්ත හා ඇල්ම දුරුකට යුතුයි. වේදනාව දුකයි. එහි තොපගේ කැමැත්ත දුරුකට යුතුයි. ඇල්ම දුරුකට යුතුයි. කැමැත්ත හා ඇල්ම දුරුකට යුතුයි. සඤ්ඤාව දුකයි. එහි තොපගේ කැමැත්ත දුරුකට යුතුයි. ඇල්ම දුරුකට යුතුයි. එහි තොපගේ කැමැත්ත හා ඇල්ම දුරුකට යුතුයි. සංස්කාර දුකය.

එහි තොපගේ කැමැත්ත දුරුකට යුතුයි. ඇල්ම දුරුකට යුතුයි. කැමැත්ත හා ඇල්ම දුරුකට යුතුයි. විඤ්ඤාණය දුකය. එහි තොපගේ කැමැත්ත දුරුකට යුතුයි. ඇල්ම දුරුකට යුතුය. කැමැත්ත හා ඇල්ම දුරුකට යුතුය. මහණෙනි, යමක් දුකද එහි තොපගේ කැමැත්ත දුරුකට යුතුය. ඇල්ම දුරුකට යුතුය. කැමැත්ත හා ඇල්ම දුරුකට යුතුය."

**(පස්වෙනි දුක්ඛ සූත්‍රය (1) නිමි)**

---

## 6. අනත්ත සූත්‍රය (1)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යමක් අනාත්මද? එහි තොපගේ කැමැත්ත දුරුකට යුතුයි. මහණෙනි, අනාත්මය කවරේද?

"මහණෙනි, රූපය අනාත්මය. එහි තොපගේ කැමැත්ත දුරුකට යුතුය. වේදනාව අනාත්මය, එහි තොපගේ කැමැත්ත දුරුකට යුතුයි. සංඥාව අනාත්මය, එහි තොපගේ කැමැත්ත දුරුකට යුතුයි. සංස්කාර අනාත්මය එහි තොපගේ කැමැත්ත දුරුකට යුතුයි. විඥානය අනාත්මය. එහි තොපගේ කැමැත්ත දුරුකට යුතුයි.

"මහණෙනි, යමක් අනාත්මද, එහි තොපගේ කැමැත්ත දුරුකට යුතුයි."

**(හයවෙනි අනත්ත සූත්‍රය (1) නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 7. අනත්ත සූත්‍රය. (2)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යමක් අනාත්මද, එහි තොපගේ ඇල්ම දුරු කටයුතුයි. මහණෙනි, අනාත්මය කවරේද?

"මහණෙනි, රූපය අනාත්මය, එහි තොපගේ ඇල්ම දුරුකට යුතුයි. වේදනාව අනාත්මය, එහි තොපගේ ඇල්ම දුරුකට යුතුයි. සංඥාව අනාත්මය, එහි තොපගේ ඇල්ම දුරුකට යුතුයි. සංස්කාරයෝ අනාත්මය, එහි තොපගේ ඇල්ම දුරුකට යුතුයි. විඥානය අනාත්මය, එහි තොපගේ ඇල්ම දුරුකට යුතුයි.

"මහණෙනි, යමක් අනාත්මද, එහි තොපගේ ඇල්ම දුරුකට යුතුය යනුයි."

**(හත්වෙනි අනත්ත සූත්‍රය (2) නිමි.)**

---

## 8. අනත්ත සූත්‍රය. (3)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමිනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යමක් අනාත්මද, එහි තොපගේ (කැමැත්ත සහ ඇල්ම) ඡන්දරාගය දුරුකට යුතුය. මහණෙනි, අනාත්මය කවරේද?

"මහණෙනි, රූපය අනාත්මය. එහි තොපගේ (කැමැත්ත සහ ඇල්ම) ඡන්දරාගය දුරුකට යුතුය. වේදනාව අනාත්මය. එහි තොපගේ (කැමැත්ත සහ ඇල්ම) ඡන්දරාගය දුරුකට යුතුය. සංඥාව අනාත්මය. එහි තොපගේ (කැමැත්ත සහ ඇල්ම) ඡන්දරාගය දුරුකට යුතුය. සංස්කාරයෝ අනාත්මය. එහි තොපගේ (කැමැත්ත සහ ඇල්ම) ඡන්දරාගය දුරුකට යුතුය. විඥානය අනාත්මය. එහි තොපගේ (කැමැත්ත සහ ඇල්ම) ඡන්දරාගය දුරුකට යුතුය.

"මහණෙනි, යමක් අනාත්මද, එහි තොපගේ (කැමැත්ත සහ ඇල්ම) ඡන්දරාගය දුරුකට යුතුයි."

**(අටවෙනි අනත්ත සූත්‍රය (3) නිමි.)**

---

## 9. කුලපුත්ත සූත්‍රය (1)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ශ්‍රද්ධාවෙන් මහණවූ කුලපුත්‍රයාගේ ස්වභාවය මෙයවේ. යමෙක් රූපයෙහි කළකිරීම බහුලකොට වාසය කරන්නේද, වේදනාවෙහි කළකිරීම බහුලකොට වාසය කරන්නේද, සංඥාවෙහි කළකිරීම බහුලකොට වාසය කරන්නේද, සංස්කාරයන්හි කළකිරීම බහුලකොට වාසය කරන්නේද, විඥානයෙහි කළකිරීම බහුලකොට වාසය කරන්නේද?

"හෙතෙම රූපයෙහි කළකිරීම බහුලකොට වාසය කරන්නේ, වේදනාවෙහි කළකිරීම බහුලකොට වාසය කරන්නේ, සංඥාවෙහි කළකිරීම බහුලකොට වාසය කරන්නේ, සංස්කාරයන්හි කළකිරීම

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

බහුලකොට වාසය කරන්නේ, විඤ්ඤාණයෙහි කළකිරීම බහුලකොට වාසය කරන්නේ,

"රූපය විශෙෂයෙන් දැනගනියි. වේදනාව විශෙෂයෙන් දැනගනියි. සංඥාව විශෙෂයෙන් දැනගනියි. සංස්කාරයන් විශෙෂයෙන් දැනගනියි. විඤ්ඤාණය විශෙෂයෙන් දැනගනියි.

"හෙතෙම රූපය විශෙෂයෙන් දැනගන්නේ, වේදනාව විශෙෂයෙන් දැනගන්නේ, සංඥාව විශෙෂයෙන් දැනගන්නේ, සංස්කාරයන් විශෙෂයෙන් දැනගන්නේ, විඤ්ඤාණය විශෙෂයෙන් දැනගන්නේ,

"රූපයෙන් විශෙෂයෙන් මිදෙයි. වේදනාවෙන් විශෙෂයෙන් මිදෙයි. සංඥාවෙන් විශෙෂයෙන් මිදෙයි. සංස්කාරයන්ගෙන් විශෙෂයෙන් මිදෙයි. විඤ්ඤාණයෙන් විශෙෂයෙන් මිදෙයි. ඉපදීමෙන්, ජරාමරණයෙන්, සෝකයෙන්, හැඬීමෙන් දුක් දොම්නස් වලින්, වැලපීමෙන් විශෙෂයෙන් මිදෙයි. දුකින් විශෙෂයෙන් මිදේයයිද කියමි."

**(නවවෙනි කුලපුත්ත සූත්‍රය (1) නිමි.)**

---

## 10 කුලපුත්ත සූත්‍රය (2)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ශ්‍රද්ධාවෙන් මහණවූ කුලපුත්‍රයාගේ ස්වභාවය මෙයවේ. යමෙක් රූපයෙහි අනිත්‍යය අනුව, බලනසුලුව වාසය කෙරේද, වේදනාවෙහි අනිත්‍යය අනුව, බලනසුලුව වාසය කෙරේද, සංඥාවෙහි අනිත්‍යය අනුව, බලනසුලුව වාසය කෙරේද, සංස්කාරයන්හි අනිත්‍යය අනුව, බලනසුලුව වාසය

කෙරේද, විඤ්ඤාණයෙහි අනිත්‍යය අනුව, බලනසුළුව වාසය කෙරේද?

3. "හෙතෙම රූපයෙහි අනිත්‍යය අනුව බලනසුලුව වාසය කරන්නේ, වේදනාවෙහි අනිත්‍යය අනුව, බලනසුලුව වාසය කරන්නේ, සංඥාවෙහි අනිත්‍යය අනුව බලනසුලුව වාසය කරන්නේ, සංස්කාරයන්හි අනිත්‍යය අනුව බලනසුලුව වාසය කරන්නේ, විඤ්ඤාණයෙහි අනිත්‍යය අනුව බලන සුලුව වාසය කරන්නේ.

"රූපය විශෙෂයෙන් දැනගනියි. වේදනාව විශෙෂයෙන් දැනගනියි. සංඥාව විශෙෂයෙන් දැනගනියි. සංස්කාරයන් විශෙෂයෙන් දැනගනියි. විඤ්ඤාණය විශෙෂයෙන් දැනගනියි.

"හෙතෙම රූපය විශෙෂයෙන් දැනගන්නේ, වේදනාව විශෙෂයෙන් දැනගන්නේ, සංඥාව විශෙෂයෙන් දැනගන්නේ, සංස්කාරයන් විශෙෂයෙන් දැනගන්නේ, විඤ්ඤාණය විශෙෂයෙන් දැනගන්නේ,

"රූපයෙන් මිදෙයි, වේදනාවෙන් මිදෙයි. සංඥාවෙන් මිදෙයි. සංස්කාරයන්ගෙන් මිදෙයි. විඥානයෙන් මිදෙයි ඉපදීමෙන්, ජරාමරණයෙන්, සෝකයෙන්, හැඬීමෙන්, දුක් දොම්නස් වලින්, වැලපීමෙන් මිදෙයි දුකින් මිදේයයි ද කියමි."

**දහවෙනි කුලපුත්ත සූත්‍රය (2) නිමි.)**

---

## 11. කුලපුත්ත සූත්‍රය. (3)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

2. "මහණෙනි, ශ්‍රද්ධාවෙන් පැවිදිවූ කුලපුත්‍රයාගේ ස්වභාවය මෙයවේ. යමෙක් රූපයෙහි දුක අනුව බලමින් වාසය කරන්නේද, වේදනාවෙහි දුක අනුව බලමින් වාසය කරන්නේද, සංඥාවෙහි දුක අනුව බලමින් වාසයකරන්නේද, සංස්කාරයන්හි දුක අනුව බලමින් වාසය කරන්නේද, විඥානයෙහි දුක අනුව බලමින් වාසය කරන්නේද,

"හෙතෙම රූපයෙහි දුක අනුව බලමින් වාසය කරන්නේ, වේදනාවෙහි දුක අනුව බලමින් වාසය කරන්නේ, සංඥාවෙහි දුක අනුව බලමින් වාසය කරන්නේ, සංස්කාරයන්හි දුක අනුව බලමින් වාසය කරන්නේ, විඤ්ඤාණයෙහි දුක අනුව බලමින් වාසය කරන්නේ,

"රූපය දැනගනියි, වේදනාව දැනගනියි, සංඥාව දැනගනියි, සංස්කාරයන් දැනගනියි. විඤ්ඤාණය දැනගනියි.

"හෙතෙම රූපය දැනගන්නේ, වේදනාව දැනගන්නේ, සංඥාව දැනගන්නේ, සංස්කාරයන් දැනගන්නේ, විඤ්ඤාණය දැනගන්නේ.

"රූපයෙන් මිදෙයි, වේදනාවෙන් මිදෙයි, සංඥාවෙන් මිදෙයි, සංස්කාරයෙන් මිදෙයි විඤ්ඤාණයෙන් මිදෙයි. ඉපදීමෙන්, ජරාමරණයෙන්, සෝකයන්ගෙන්, හැඬීම් වලින් දුක්වලින්, දොම්නස් වලින්, වැලපීමෙන් මිදෙයි, දුකින් මිදේ යයිද" කියමි.

**(එකොළොස්වෙනි කුලපුත්ත සූත්‍රය (3) නිමි.)**

---

## 12. කුලපුත්ත සූත්‍රය. (4)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, ශ්‍රද්ධාවෙන් මහණවූ කුලපුත්‍රයාගේ ස්වභාවය මෙයවේ. යමෙක් රූපයෙහි අනාත්මය අනුව බලමින් වාසය කෙරේද, වේදනාවෙහි අනාත්මය අනුව බලමින් වාසය කෙරේද, සංඥාවෙහි අනාත්මය අනුව බලමින් වාසය කෙරේද, සංස්කාරයන්හි අනාත්මය අනුව බලමින් වාසය කෙරේද, විඤ්ඤාණයෙහි අනාත්මය අනුව බලමින් වාසය කෙරේද,

"හෙතෙම රූපයෙහි අනාත්මය අනුව බලමින් වාසය කරන්නේ, වේදනාවෙහි අනාත්මය අනුව බලමින් වාසය කරන්නේ, සංඥාවෙහි අනාත්මය අනුව බලමින් වාසය කරන්නේ, සංස්කාරයන්හි අනාත්මය අනුව බලමින් වාසය කරන්නේ, විඤ්ඤාණයෙහි අනාත්මය අනුව බලමින් වාසය කරන්නේ,

"රූපය දැනගනියි. වේදනාව දැනගනියි. සංඥාව දැනගනියි සංස්කාරයන් දැනගනියි. විඤ්ඤාණය දැනගනියි.

"හෙතෙම රූපය දැනගන්නේ, වේදනාව දැනගන්නේ, සංඥාව දැනගන්නේ, සංස්කාරයන් දැනගන්නේ, විඤ්ඤාණය දැනගන්නේ,

"රූපයෙන් මිදෙයි, වේදනාවෙන් මිදෙයි, සංඥාවෙන් මිදෙයි, සංස්කාරයන්ගෙන් මිදෙයි, විඤ්ඤාණයෙන් මිදෙයි" ඉපදීමෙන්, ජරාමරණයෙන්, සෝකයන්ගෙන්, හැඬීමෙන්, දුක්වලින්, දොම්නස්වලින්, වැලපීමෙන් මිදෙයි. දුකින් මිදේයයිද කියමි" යනුයි.

**(දොළොස්වෙනි කුලපුත්ත සූත්‍රය (4) නිමි.)**

---

**(කුක්කුල සූත්‍රය, අනිච්ච සූත්‍ර තුනය, දුක්ඛ සූත්‍රය, අනත්ත සූත්‍ර තුන සහ කුලපුත්ත සූත්‍ර සතරදැයි මේ වර්ගයෙහි සූත්‍ර දොළොසකි.)**

**(දසහතරවෙනි කුක්කුල වර්ගය නිමි.)**

---

# 15. දිට්ඨි වර්ගය.

## 1. අජ්ඣත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ, ‘මහණෙනි’යි කියා භික්ෂූන්ට කථාකළ සේක. ‘ස්වාමීනි’යි, කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, කුමක් ඇතිකල්හි කුමක් නිසා තමා පිළිබඳ සැප දුක් දෙක උපදියිද?

“ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය.

“මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා තමා පිළිබඳ සැප දුක උපදියි. වේදනාව ඇති කල්හි වේදනාව නිසා තමා පිළිබඳ සැප දුක උපදියි. සංඥාව ඇති කල්හි සංඥාව නිසා තමා පිළිබඳ සැප දුක උපදියි. සංස්කාරයන් ඇති කල්හි සංස්කාරයන් නිසා තමා පිළිබඳ සැප දුක උපදියි. විඤ්ඤාණය ඇති කල්හි විඤ්ඤාණය නිසා තමා පිළිබඳ සැප දුක උපදියි.

3. “මහණෙනි, ඒ කුමැයි සිතන්නහුද?

“රූපය නිත්‍යද? අනිත්‍යද?” - “ස්වාමීනි, අනිත්‍යය.”

“යමක් වනාහි අනිත්‍ය නම් එය දුකද? සැපද?” - “ස්වාමීනි, දුකය.”

“යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන ස්වභාව නම්, එය දැඩිකොට අල්ලා නොගැනීමෙන්, තමා පිළිබඳ සැප දුක් උපදින්නේද?” - “ස්වාමීනි, එය නොවේමය.”

"වේදනාව නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම්, එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම් පෙරලෙන ස්වභාව නම් එය දැඩිකොට අල්ලා නොගැනීමෙන් තමා පිළිබඳ සැප දුක් උපදනේද?" - "ස්වාමීනි, එය නොවේමය."

"සංඥාව නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරලෙන ස්වභාව නම්, එය දැඩිකොට අල්ලා නොගැනීමෙන් තමා පිළිබඳ සැප දුක් උපදනේද?" - "ස්වාමීනි, එය නොවේමය."

"සංස්කාරයෝ නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරලෙන ස්වභාව නම්, එය දැඩිකොට අල්ලා නොගැනීමෙන් තමා පිළිබඳ සැප දුක් උපදනේද?" - "ස්වාමීනි, එය නොවේමය."

"විඥාණය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරලෙන ස්වභාව නම්, එය දැඩිකොට අල්ලා නොගැනීමෙන් තමා පිළිබඳ සැප දුක් උපදනේද?" - "ස්වාමීනි, එය එසේ නොවේමය."

4. "මහණෙනි, මෙසේ බලන්නාවූ ආර්ය ශ්‍රාවකතෙමේ රූපයෙහිද කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයෙහිද කලකිරෙයි. විඤ්ඤාණයෙහිද කළකිරෙයි. කළකිරුණේ නොඇලෙයි නොඇලීමෙන්

(කෙලෙසුන්ගෙන්) මිදේ. මිදුණුකල්හි මිදුණේයයි දැනීම වේ. ජාති තොමෝ ක්ෂයවූවාය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවන ලද්දේය. සතර මාර්ගයෙන් කටයුතුකොට නිමවන ලද්දේය. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගන්නාලදී.

**(පළමුවෙනි අජ්ඣත්ත සූත්‍රය නිමි.)**

---

## 2. එතං මම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතුසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, කුමක් ඇතිකල්හි කුමක් නිසා කුමකට පිවිස 'මෙය මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි' දකීද?

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය.

"මහණෙනි, රූපය ඇතිකල්හි, රූපය නිසා, රූපයට පිවිස, 'මේ මගේය මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි' දකීද, වේදනාව ඇතිකල්හි, වේදනාව නිසා, වේදනාවට පිවිස 'මේ මගේය. මේ මම වෙමි. මේ මගේ ආත්මයයි' දකීද, සංඥාව ඇතිකල්හි, සංඥාව නිසා, සංඥාවට පිවිස, 'මේ මගේය. මේ මම වෙමි. මේ මගේ ආත්මයයි' දකීද, සංස්කාරයන් ඇතිකල්හි, සංස්කාරයන් නිසා, සංස්කාරයන්ට පිවිස, 'මේ මගේය. මේ මම වෙමි. මේ මගේ ආත්මයයි' දකීද, විඤ්ඤාණය ඇතිකල්හි

විඤ්ඤාණය නිසා, විඤ්ඤාණයට පිවිස, මේ මගේය. මේ මම වෙමි. මේ මගේ ආත්මයයි දකීද,

3. "මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද?

"රූපය නිත්‍යද අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යයි."

"යමක් වනාහි අනිත්‍ය නම්, එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන ස්වභාව නම්, එය තදින් අල්ලා නොගැනීමෙන් මෙය මගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි' දක්නේද?" - "ස්වාමීනි, එය නොවේමය."

"වේදනාව නිත්‍යයද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම්, එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍ය නම් දුක නම්, පෙරළෙන ස්වභාව නම්, එය තදින් අල්ලා නොගැනීමෙන් 'මෙය මගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්ම'යයි දක්නේද?" - "ස්වාමීනි, එය නොවේමය."

"සංඥාව නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම්, එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන ස්වභාව නම්, එය තදින් අල්ලා නොගැනීමෙන් 'මෙය මගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි' දක්නේද?" - "ස්වාමීනි, එය එසේ නොවේමය."

"සංස්කාරය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම්, එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන ස්වභාව නම්, එය තදින් අල්ලා නොගැනීමෙන් 'මෙය මගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි' දක්නේද?" - "ස්වාමීනි, එය එසේ නොවේමය."

"විඤ්ඤාණය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම්, එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන ස්වභාව නම්, එය තදින් අල්ලා නොගැනීමෙන් 'මෙය මගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි' දක්නේද?" - "ස්වාමීනි, එය එසේ නොවේමය."

"මෙසේ දක්නේ, ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකතෙමේ රූපයෙහිද කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයෙහිද කලකිරෙයි. විඤ්ඤාණයෙහිද කලකිරෙයි කලකිරීමෙන් (මාර්ගයට පැමිණීමෙන්) නොඇලෙයි. (ඵලයට පැමිණීමෙන්) මිදෙයි. මිදුනුකල්හි මිදුනේයයි නුවණ (පහල) වෙයි. ජාතිය කෙළවර විය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවනලදී. කළයුත්ත කරනලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැත්තේයයි දැනගනියි" යනුයි.

**(දෙවෙනි ඵතං මම සූත්‍රය නිමි.)**

---

## 3. සො අත්තා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි! කුමක් ඇතිකල්හි කුමක් නිසා කුමකට පිවිස මෙසේ දෘෂ්ටිය උපදීද? "ඒ මම ආත්මයය. ඒ මම ලොකයය. ඒ මම පරලොව වන්නෙමි. නිත්‍යය. ස්ථිරය. සදාකාලිකය. නොපෙරලෙන ස්වභාවය කියායි.

"ස්වාමීනි! අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නාකොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියාදෙතොත් ඉතා හොඳය."

මහණෙනි, රූපය ඇතිකල්හි රූපය නිසා රූපයට ඇතුළත්ව මෙසේ දෘෂ්ටිය උපදියි. 'ඒ මම ආත්මයය. ඒ මම ලොකයය. ඒ මම පරලොව වන්නෙමි. නිත්‍යය, ස්ථිරය, සදාකාලිකය, නොපෙරළෙන ස්වභාවය.

3. "මහණෙනි, වේදනාව ඇතිකල්හි වේදනාව නිසා වේදනාවට ඇතුළත්ව මෙසේ දෘෂ්ටිය උපදියි. 'ඒ මම ආත්මයය. ඒ මම ලොකයය. ඒ මම පරලොව වන්නෙමි. නිත්‍යය, ස්ථිරය, සදාකාලිකය, නොපෙරළෙන ස්වභාවය.

"මහණෙනි, සඤ්ඤාව ඇති කල්හි සඤ්ඤාව නිසා සඤ්ඤාවට ඇතුළත්ව මෙසේ දෘෂ්ටිය උපදියි. 'ඒ මම ආත්මයය. ඒ මම ලොකයය. ඒ මම පරලොව වන්නෙමි. නිත්‍යය, ස්ථිරය, සදාකාලිකය, නොපෙරළෙන ස්වභාවය.

"මහණෙනි, සංස්කාරයන් ඇතිකල්හි සංස්කාරය නිසා සංස්කාරයට ඇතුළත්ව මෙසේ දෘෂ්ටිය උපදියි. 'ඒ මම ආත්මයය. ඒ මම ලොකයය. ඒ මම පරලොව වන්නෙමි. නිත්‍යය, ස්ථිරය, සදාකාලිකය, නොපෙරළෙන ස්වභාවය.

"මහණෙනි, විඤ්ඤාණය ඇතිකල්හි විඤ්ඤාණය නිසා විඤ්ඤාණයට ඇතුළත්ව මෙසේ දෘෂ්ටිය උපදියි. 'ඒ මම ආත්මයය. ඒ මම ලොකයය. ඒ මම පරලොව වන්නෙමි. නිත්‍යය, ස්ථිරය, සදාකාලිකය, නොපෙරළෙන ස්වභාවය.

4. "මහණෙනි, ඒ කුමකැයි හඟනාහුද? රූපය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි! දුකය."

යමක් වනාහි අනිත්‍ය නම් දුකනම් පෙරළෙන ස්වභාව නම් එය දැඩිකොට නොගැනීමෙන් 'ඒ මම ආත්මයය. ඒ මම ලෝකයය. ඒ මම පරලොව වන්නෙමි. නිත්‍යය, ස්ථිරය, සදාකාලිකය, නොපෙරළෙන ස්වභාවයයි' මෙසේ දෘෂ්ටිය උපදනේද?" - "ස්වාමීනි! මෙය නොවේමය."

වේදනාව නිත්‍යද? අනිත්‍යද - "ස්වාමීනි! අනිත්‍යය."

යමක් අනිත්‍ය නම් එය දුකද? සැපද? - "ස්වාමීනි! දුකය."

"යමක් වනාහි අනිත්‍යනම් දුකනම් පෙරළෙන ස්වභාව නම් එය දැඩිකොට නොගැනීමෙන් 'ඒ මම ආත්මයය. ඒ මම ලෝකයය. ඒ මම පරලොව වන්නෙමි. නිත්‍යය. ස්ථිරය, සදාකාලිකය, නොපෙරළෙන ස්වභාවයයි" මෙසේ දෘෂ්ටිය උපදනේද? - "ස්වාමීනි! මෙය නොවේමය."

"සඤ්ඤාව නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි දුකය."

"යමක් වනාහි අනිත්‍ය නම් දුකනම් පෙරළෙන ස්වභාව නම් එය දැඩිකොට නොගැනීමෙන් 'ඒ මම ආත්මයය. ඒ මම ලෝකයය. ඒ මම පරලොව වන්නෙමි. නිත්‍යය, ස්ථිරය, සදාකාලිකය, නොපෙරළෙන ස්වභාවයයි" මෙසේ දෘෂ්ටිය උපන්නේද?" - "ස්වාමීනි! මෙය නොවේමය."

"සංස්කාරයෝ නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි! අනිත්‍යය."

"යමක් අනිත්‍යනම් එය දුකද, සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යනම්, දුකනම්, පෙරළෙන ස්වභාව නම්, එය දැඩිකොට නොගැනීමෙන් 'ඒ මම ආත්මයය. ඒ මම ලෝකයය. ඒ මම පරලොව වන්නෙමි. නිත්‍යය, ස්ථිරය,

සදාකාලිකය නොපෙරලෙන ස්වභාවය'යි මෙසේ දෘෂ්ටිය උපන්නේද?" - "ස්වාමීනි එසේ නොවේමය."

"විඥානය නිත්‍යද, අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යනම්, එය දුකද, සැපද?"- ස්වාමීනි, දුකයි"

"යමක් වනාහි අනිත්‍යනම්, දුක්නම්, පෙරළෙන ස්වභාව නම් එය දැඩිකොට නොගැනීමෙන් ඒ මම ආත්මයය. ඒ මම ලෝකයය. ඒ මම පරලොව වන්නෙමි. නිත්‍යය ස්ථිරය. සදාකාලිකය. නොපෙරළෙන සුළුයයි මෙසේ දෘෂ්ටිය උපදනේද?" - "ස්වාමීනි, එය නොවේමය."

"මෙසේ දක්නාවූ, ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකතෙමේ රූපයෙහිද කලකිරෙයි, වේදනාවෙහිද කලකිරෙයි, සංඥාවෙහිද කලකිරෙයි, සංස්කාරයන්හිද කලකිරෙයි. විඥානයෙහිද කලකිරෙයි. කලකිරීමෙන් (මාර්ගයට පැමිණීමෙන්) නොඇලෙයි. (ඵලයට පැමිණීමෙන්) මිදෙයි. මිදුනු කල්හි මිදුනේ යයි නුවණ (පහළ) වෙයි. ජාතිය කෙළවර විය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවන ලදී. මතු ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැත්තේයයි දැනගනියි.

**(තුන්වෙනි සො අත්තා සූත්‍රය නිමි.)**

---

## 4. නොච මෙ සියා සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි කුමක් ඇති කල්හි කුමක් නිසා කුමකට පිවිස 'මම නොවෙමි, මාගේ නොවේය. මම නොවන්නෙමි, මාගේ නොවන්නේයයි' මෙසේ දෘෂ්ටිය උපදියිද?" - "ස්වාමීනි, අපගේ

ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නාකොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය.”

3. මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපයට පිවිස ‘මම නොවෙමි, මාගේ නොවේ, මම නොවන්නෙමි’ මාගේ නොවන්නේය යනුයි’ වේදනාව ඇති කල්හි වේදනාව නිසා වේදනාවට පිවිස ‘මම නොවෙමි, මාගේ නොවේ, මම නොවන්නෙමි, මාගේ නොවන්නේය යනුයි.’ ‘සඤ්ඤාව ඇති කල්හි, සඤ්ඤාව නිසා සඤ්ඤාවට පිවිස ‘මම නොවෙමි, මාගේ නොවේ, මම නොවන්නෙමි, මාගේ නොවන්නේය යනුයි’ සංස්කාරයන් ඇති කල්හි සංස්කාරයන් නිසා සංස්කාරයට පිවිස ‘මම නොවෙමි, මාගේ නොවේ, මම නොවන්නෙමි, මාගේ නොවන්නේය යනුයි’ විඤ්ඤාණය ඇති කල්හි විඤ්ඤාණයන් නිසා විඤ්ඤාණයට පිවිස මම නොවෙමි, මාගේ නොවේ, මම නොවන්නෙමි. මාගේ නොවන්නේයයි මෙසේ දෘෂ්ටිය උපදියි.

4. “මහණෙනි, ඒ කුමකැයි හඟනාහුද? රූපය නිත්‍යද අනිත්‍යද?” - “ස්වාමීනි, අනිත්‍යයි”

“යමක් අනිත්‍යනම් එය දුකද සැපද?” - “ස්වාමීනි, දුකයි”

“යමක් අනිත්‍ය නම් දුක නම් පෙරළෙන ස්වභාව නම් එය තදින් අල්ලා නොගැනීමෙන් මම නොවෙමි, මගේ නොවේ. මම නොවන්නෙමි, මගේ නොවන්නේයයි මෙසේ දෘෂ්ටිය උපදනේද?” - “ස්වාමීනි, එය නොවේමය.”

“වේදනාව නිත්‍යද, අනිත්‍යද?” - “ස්වාමීනි අනිත්‍යයි.”

“යමක් අනිත්‍ය නම් එය දුකද සැපද?” - “ස්වාමීනි, දුකයි.”

“යමක් අනිත්‍ය නම් දුක නම් පෙරළෙන ස්වභාව නම් එය තදින් අල්ලා නොගැනීමෙන් මම නොවෙමි මගේ නොවේ, මම නොවන්නෙමි, මගේ නොවන්නේයයි මෙසේ දෘෂ්ටිය උපදනේද?” - “ස්වාමීනි, එය නොවේමය.”

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"සඤ්ඤාව නිත්‍යද, අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යයි"

"යමක් අනිත්‍ය නම් එය දුකද සැපද යනුයි." - "ස්වාමීනි, දුකයි."

"යමක් අනිත්‍ය නම් දුක නම් පෙරළෙන ස්වභාව නම් එය තදින් අල්ලා නොගැනීමෙන් මම නොවෙමි, මගේ නොවේ, මම නොවන්නෙමි, මගේ නොවන්නේයයි මෙසේ දෘෂ්ටිය උපදනේද?" - "ස්වාමීනි, එය නොවේමය."

"සංස්කාරය නිත්‍යද, අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යයි"

"යමක් අනිත්‍ය නම් එය දුකද සැපද?" - "ස්වාමීනි, දුකයි."

"යමක් අනිත්‍ය නම් දුක නම් පෙරළෙන ස්වභාව නම් එය තදින් අල්ලා නොගැනීමෙන් මම නොවෙමි, මගේ නොවේ, මම නොවන්නෙමි, මගේ නොවන්නේයයි මෙසේ දෘෂ්ටිය උපදනේද?" - "ස්වාමීනි, එය නොවේමය."

"විඤ්ඤාණය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යයි."

"යමක් අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් අනිත්‍ය නම් දුක නම් පෙරළෙන ස්වභාව නම් එය තදින් අල්ලා නොගැනීමෙන් මම නොවෙමි, මාගේ නොවේ, මම නොවන්නෙමි. මාගේ නොවන්නේයයි මෙසේ දෘෂ්ටිය උපදනේද?" - "ස්වාමීනි, එය නොවේමය."-

මෙසේ දක්නේ රූපයෙහිද කළකිරෙයි. වේදනාවෙහිද කළකිරෙයි. සඤ්ඤාවෙහිද කළකිරෙයි. සංස්කාරයෙහිද කළකිරෙයි. විඤ්ඤාණයෙහිද කළකිරෙයි. කළකිරීමෙන් නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේයයි නුවණ පහළවෙයි. ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවනලදී. කළයුත්ත කරණ ලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැත්තේයයි දැනගනියි.

**(හතරවෙනි නොච මේ සියා සූත්‍රය නිමි.)**

---

## 5. මිච්ඡාදිට්ඨි සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් නිසා කුමකට පිවිසි මිථ්‍යාදෘෂ්ටිය උපදීද?" - "ස්වාමීනි, ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පමුණු වන්නාකොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින් කියාදෙතොත් ඉතා හොඳය.

"මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපයට පිවිස මිථ්‍යාදෘෂ්ටිය උපදියි."

"වේදනාව ඇති කල්හි වේදනාව නිසා වේදනාවට පිවිස මිථ්‍යාදෘෂ්ටිය උපදියි."

"සඤ්ඤාව ඇති කල්හි සඤ්ඤාව නිසා සඤ්ඤාවට පිවිස මිථ්‍යාදෘෂ්ටිය උපදියි."

"සංස්කාරයන් ඇති කල්හි සංස්කාරය නිසා සංස්කාරයට පිවිස මිථ්‍යාදෘෂ්ටිය උපදියි."

"විඤ්ඤාණය ඇති කල්හි විඤ්ඤාණය නිසා විඤ්ඤාණයට පිවිස මිථ්‍යාදෘෂ්ටිය උපදියි."

4. "මහණෙනි, ඒ කුමක්කැයි සිතන්නාහුද? රූපය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය." "යමක් අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකයි." "යමක් අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය තදින් අල්ලා නොගැනීමෙන් මිථ්‍යාදෘෂ්ටිය උපදනේද?" - "ස්වාමීනි, එය නොවේමය."

"වේදනාව නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය." "යමක් අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකයි." "යමක් අනිත්‍යද? දුකද, පෙරළෙන ස්වභාවද, එය තදින් අල්ලා නොගැනීමෙන් මිථ්‍යාදෘෂ්ටිය උපදනේද" - "ස්වාමීනි, එය නොවේමය."

"සංඥාව නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය." "යමක් අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකයි." "යමක් අනිත්‍යද? දුකද, පෙරළෙන ස්වභාවද, එය තදින් අල්ලා නොගැනීමෙන් මිථ්‍යාදෘෂ්ටිය උපදනේද?" - "ස්වාමීනි, එය නොවේමය."

සංස්කාරය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය." "යමක් අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකයි." "යමක් අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය තදින් අල්ලා නොගැනීමෙන් මිථ්‍යාදෘෂ්ටිය උපදනේද?" - "ස්වාමීනි, එය නොවේමය."

"විඤ්ඤාණය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය." "යමක් අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය." "යමක් අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද එය තදින් අල්ලා නොගැනීමෙන් මිථ්‍යාදෘෂ්ටිය උපදනේද?" - "ස්වාමීනි, එය නොවේමය."

**5.** මෙසේ දක්නේ රූපයෙහිද කළකිරෙයි. වේදනාවෙහිද කළකිරෙයි. සඤ්ඤාවෙහිද කළකිරෙයි. සංස්කාරයෙහිද කළකිරෙයි. විඤ්ඤාණයෙහිද කළකිරෙයි. කළකිරීමෙන් නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේයයි නුවණ පහළවෙයි. ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවන ලදී. කළයුත්ත කරණ ලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැත්තේ යයි දැනගනියි.

**(පස්වෙනි මිච්ඡාදිට්ඨි සූත්‍රය නිමි.)**

## 6. සක්කාය දිට්ඨි සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූ සේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, කුමක් ඇතිකල්හි කුමක් නිසා කුමකට පිවිස සක්කාය දෘෂ්ටිය උපදීද? - "ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නාකොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය."

3. "මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපයට පිවිස සක්කාය දෘෂ්ටිය උපදී. වේදනාව ඇති කල්හි වේදනාව නිසා වේදනාවට පිවිස සක්කාය දෘෂ්ටිය උපදී. සංඥාව ඇති කල්හි සංඥාව නිසා සංඥාවට පිවිස සක්කාය දෘෂ්ටිය උපදී. සංස්කාරයන් ඇතිකල්හි සංස්කාරයන් නිසා සංස්කාරයන්ට පිවිස සක්කාය දෘෂ්ටිය උපදී. විඤ්ඤාණය ඇති කල්හි විඤ්ඤාණය නිසා විඤ්ඤාණයට පිවිස සක්කාය දෘෂ්ටිය උපදී."

4. "මහණෙනි, ඒ කුමකැයි සිතන්නාහුද? රූපය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම් එය දුකද, සැපද?" - "ස්වාමීනි, දුකයි."

"යමක් අනිත්‍ය නම්, දුකනම්, පෙරළෙන ස්වභාවනම්, එය තදින් අල්ලා නොගැනීමෙන් සක්කාය දෘෂ්ටිය උපදනේද?" - "ස්වාමීනි, එය නොවේමය."

"වේදනාව නිත්‍යද? අනිත්‍යද" - "ස්වාමීනි, අනිත්‍යය"

"යමක් අනිත්‍ය නම් එය දුකද, සැපද?" - "ස්වාමීනි, දුකයි."

"යමක් අනිත්‍යනම්, දුකනම්, පෙරළෙන ස්වභාවයනම් එය තදින් අල්ලා නොගැනීමෙන් සක්කාය දෘෂ්ටිය උපදනේද?" - "ස්වාමීනි, එය නොවේමය."

"සංඥාව නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍යනම්, එය දුකද, සැපද?" - "ස්වාමීනි දුකයි."

"යමක් අනිත්‍යනම්, දුකනම්, පෙරළෙන ස්වභාවයනම්, එය තදින් අල්ලා නොගැනීමෙන් සක්කාය දෘෂ්ටිය උපදනේද?" - "ස්වාමීනි එය එසේ නොවේමය."

"සංස්කාර නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍යනම්, එය දුකද, සැපද?" - "ස්වාමීනි දුකයි."

"යමක් අනිත්‍යනම්, දුකනම්, පෙරළෙන ස්වභාවයනම් එය තදින් අල්ලා නොගැනීමෙන් සක්කාය දෘෂ්ටිය උපදනේද?" - ස්වාමීනි, එය නොවේමය."

"විඤ්ඤාණය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය." "යමක් අනිත්‍ය නම්, එය දුකද, සැපද?" - "ස්වාමීනි, දුකයි."

"යමක් අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය තදින් අල්ලා නොගැනීමෙන් සක්කාය දෘෂ්ටිය උපදනේද?" - "ස්වාමීනි, එය නොවේමය."

"මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්යශ්‍රාවකතෙම රූපයෙහිද කලකිරෙයි, වේදනාවෙහිද කලකිරෙයි, සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයන්හිද කලකිරෙයි, විඥානයෙහිද කලකිරෙයි. කලකිරීමෙන් (මාර්ගයට පැමිණීමෙන්) නොඇලෙයි. (ඵලයට පැමිණීමෙන්) මිදෙයි. මිදුනු කල්හි මිදුනේයයි නුවණ (පහළ) වෙයි. ජාතිය කෙළවර විය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවන ලදී. කළයුත්ත කරන ලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැත්තේයයි දනියි."

**(හයවෙනි සක්කාදිට්ඨි සූත්‍රය නිමි.)**

## 7. අත්තානු දිට්ඨි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූ සේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, කුමක් ඇති කල්හි, කුමක් නිසා කුමකට පිවිස ආත්මානු දෘෂ්ටිය උපදීද?" - "ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නාකොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය."

3. "මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපයට පිවිස ආත්මානු දෘෂ්ටිය උපදී. වේදනාව ඇති කල්හි වේදනාව නිසා වේදනාවට පිවිස ආත්මානු දෘෂ්ටිය උපදී. සංඥාව ඇති කල්හි සංඥාව නිසා සංඥාවට පිවිස ආත්මානු දෘෂ්ටිය උපදී. සංස්කාරයන් ඇති කල්හි සංස්කාරයන් නිසා සංස්කාරයන්ට පිවිස ආත්මානු දෘෂ්ටිය උපදී. විඤ්ඤාණය ඇති කල්හි විඤ්ඤාණය නිසා විඤ්ඤාණයට පිවිස ආත්මානු දෘෂ්ටිය උපදී."

"මහණෙනි, ඒ කුමකැයි සිතන්නාහුද? රූපය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍යනම්, එය දුකද, සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය තදින් අල්ලා නොගැනීමෙන් ආත්මානු දෘෂ්ටිය උපදනේද?" - "ස්වාමීනි, මෙය නොවේමය."

"වේදනාව නිත්‍යද, අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම් එය දුකද; සැපද?" - "ස්වාමීනි, දුකය.'

"යමක් අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද එය තදින් අල්ලා නොගැනීමෙන් ආත්මානු දෘෂ්ටිය උපදනේද?" - "ස්වාමීනි, මෙය නොවේමය."

"සංඥාව නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍යනම් එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය තදින් අල්ලා නොගැනීමෙන් ආත්මානු දෘෂ්ටිය උපදනේද?" - "ස්වාමීනි මෙය නොවේමය."

"සංස්කාරයන් නිත්‍යද, අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම් එය දුකද, සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය තදින් අල්ලා නොගැනීමෙන් ආත්මානු දෘෂ්ටිය උපදනේද?" - "ස්වාමීනි, මෙය නොවේමය."

"විඥාණය නිත්‍යද, අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍යනම්, එය දුකද, සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය තදින් අල්ලා නොගැනීමෙන් ආත්මානු දෘෂ්ටිය උපදනේද?" - "ස්වාමීනි මෙය නොවේමය.

**4.** මෙසේ දක්නාවූ, අශ්‍රැතවත් ආර්යශ්‍රාවකතෙමේ රූපයෙහිද කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයෙහිද කලකිරෙයි. විඤ්ඤාණයෙහිද කලකිරෙයි. කලකිරීමෙන් (මාර්ගයට පැමිණීමෙන්) නො ඇලෙයි (ඵලයට පැමිණීමෙන්) නොඇලීමෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේ යයි නුවණ (පහළ) වෙයි. ජාතිය කෙළවර විය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවන ලදී. කළයුත්ත කරන ලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැත්තේ යයි දනියි." යනුයි.

**(හත්වෙනි අත්තානු දිට්ඨි සූත්‍රය නිමි.)**

---

## 8. විනිවේස සූත්‍රය (1)

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, කුමක් ඇතිකල්හි, කුමක් නිසා, කුමකට පිවිස, සංයොජනයන්හි වෙලීම සහ බැඳීම ඇතිවෙත්ද?

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නාකොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියාදෙතොත් ඉතා හොඳය."

3. "මහණෙනි, රූපය ඇතිකල්හි, රූපය නිසා, රූපයට පිවිස, සංයොජනයන්හි වෙලීම සහ බැඳීම උපදිත්. වේදනාව ඇති කල්හි, වේදනාව නිසා, වේදනාවට පිවිස, සංයොජනයන්හි වෙලීම සහ බැඳීම උපදිත්. සංඥාව ඇති කල්හි, සංඥාව නිසා, සංඥාවට පිවිස, සංයොජනයන්හි වෙලීම සහ බැඳීම ඇතිවෙත්. සංස්කාරයන් ඇති කල්හි, සංස්කාරයන් නිසා, සංස්කාරයන්ට පිවිස, සංයොජනයන්හි වෙලීම සහ බැඳීම උපදිත්. විඤ්ඤාණය ඇති කල්හි, විඤ්ඤාණය නිසා, විඤ්ඤාණයට පිවිස, සංයොජනයන්හි වෙලීම සහ බැඳීම උපදිත්.

4. "මහණෙනි, ඒ කුමකැයි සිතන්නාහුද? රූපය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යයි."

"යමක් අනිත්‍යනම් එය දුකද සැපද?" - ස්වාමීනි, දුකයි."

"යමක් අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය තදින් අල්ලා නොගැනීමෙන් සංයෝජනයන්හි වෙලීම සහ බැඳීම උපදින්නාහුද?" - "ස්වාමීනි, එය නොවේමය."

"වේදනාව නිත්‍යද, අනිත්‍යද?" - "ස්වාමීනි අනිත්‍යයි."

"යමක් අනිත්‍ය නම් එය දුකද සැපද" - "ස්වාමීනි, දුකයි."

"යමක් අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය තදින් අල්ලා නොගැනීමෙන් සංයෝජනයන්හි වෙළීම සහ බැඳීම උපදින්නාහුද?" - "ස්වාමීනි එය නොවේමය."

"සඤ්ඤාව නිත්‍යද, අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යයි."

"යමක් අනිත්‍ය නම් එය දුකද සැපද යනුයි."- "ස්වාමීනි, දුකයි."

"යමක් අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය තදින් අල්ලා නොගැනීමෙන් සංයෝජනයන්හි වෙළීම සහ බැඳීම උපදින්නාහුද?" - "ස්වාමීනි, එය නොවේමය."

"සංස්කාරය නිත්‍යද, අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යයි"

"යමක් අනිත්‍ය නම් එය දුකද සැපද?" - "ස්වාමීනි, දුකයි."

"යමක් අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය තදින් අල්ලා නොගැනීමෙන් සංයෝජනයන්හි වෙළීම සහ බැඳීම උපදින්නාහුද?" - "ස්වාමීනි, එය නොවේමය."

"විඤ්ඤාණය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යයි."

"යමක් අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය තදින් අල්ලා නොගැනීමෙන් සංයෝජනයන්හි වෙළීම සහ බැඳීම උපදින්නාහුද?" - "ස්වාමීනි, එය නොවේමය."

5. "මෙසේ දක්නේ රූපයෙහිද කළකිරෙයි. වේදනාවෙහිද කළකිරෙයි. සඤ්ඤාවෙහිද කළකිරෙයි. සංස්කාරයෙහිද කළකිරෙයි. විඤ්ඤාණයෙහිද කළකිරෙයි. කළකිරීමෙන් නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේයයි නුවණ පහළවෙයි. ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවනලදී. කළයුත්ත කරණ ලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැත්තේයයි දැනගනියි." යනුයි.

(අටවෙනි විනිවේස සූත්‍රය (1) නිමි.)

---

## 9. විනිවේස සූත්‍රය (2)

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, කුමක් ඇති කල්හි, කුමක් නිසා, කුමකට පිවිස, සංයොජනයන්හි වෙලී, බැඳී, ඇලී උපදිත්ද?

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නාකොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය.

3. "මහණෙනි, රූපය ඇතිකල්හි, රූපය නිසා, රූපයට පිවිස. සංයොජනයන්හි වෙලී බැඳී, ඇලී උපදිත් වේදනාව ඇතිකල්හි වේදනාව නිසා, වේදනාවට පිවිස, සංයොජනයන්හි වෙලී, බැඳී, ඇලී, උපදිත්. සංඥාව ඇතිකල්හි, සංඥාව නිසා සංඥාවට පිවිස, සංයොජනයන්හි වෙලී බැඳී ඇලී උපදිත්. සංස්කාරයන් ඇතිකල්හි, සංස්කාරයන් නිසා, සංස්කාරයන්ට පිවිස සංයොජනයන්හි වෙලී, බැඳී, ඇලී උපදිත් විඤ්ඤාණය ඇතිකල්හි, විඤ්ඤාණය නිසා, විඤ්ඤාණයට පිවිස, සංයොජනයන්හි වෙලී, බැඳී, ඇලී උපදිත්.

4. "මහණෙනි, ඒ කුමකැයි සිතන්නාහුද? රූපය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකයි."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය තදින් අල්ලා නොගැනීමෙන් සංයොජනයන්හි වෙලී, බැඳී, ඇලී උපදින්නාහුද?" - "ස්වාමීනි, මෙය නොවේමය."

වේදනාව නිත්‍යද? අනිත්‍යද - "ස්වාමීනි, අනිත්‍යය."

යමක් අනිත්‍ය නම් එය දුකද? සැපද? - "ස්වාමීනි! දුකය."

'යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය තදින්අල්ලා නොගැනීමෙන් සංයෝජනයන්හි වෙලී, බැඳී ඇලී උපදින්නාහුද?" - "ස්වාමීනි, මෙයනොවේමය."

"සඤ්ඤාව නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද දුකද, පෙරළෙන ස්වභාවද, එය තදින් අල්ලා නොගැනීමෙන් සංයෝජනයන්හි වෙලී, බැඳී, ඇලී උපදින්නාහුද?" - "ස්වාමීනි, මෙය නොවේමය."

"සංස්කාරයෝ නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍යනම් එය දුකද, සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය තදින් අල්ලා නොගැනීමෙන් සංයෝජනයන්හි වෙලී, බැඳී, ඇලී උපදින්නාහුද?" - "ස්වාමීනි, එසේ නොවේමය."

"විඥානය නිත්‍යද, අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යනම්, එය දුකද, සැපද?" - ස්වාමීනි දුකයි."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය තදින් අල්ලා නොගැනීමෙන් සංයෝජනයන්හි වෙලී, බැඳී, ඇලී උපදින්නාහුද?" - "ස්වාමීනි, එයනොවේමය."

"මෙසේ දක්නාවූ, ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකතෙමේ රූපයෙහිද කලකිරෙයි, වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි, සංස්කාරයන්හිද කලකිරෙයි. විඥානයෙහිද කලකිරෙයි. කලකිරීමෙන් (මාර්ගයට පැමිණීමෙන්) නොඇලෙයි. (ඵලයට පැමිණීමෙන්) මිදෙයි. මිදුනු කල්හි මිදුනේ යයි නුවණින් (පහළ) වෙයි. ජාතිය කෙළවර විය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවන

ලදී. මතු ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැත්තේයයි දැනගනියි.”

**(නවවෙනි විනිවේස සූත්‍රය (2) නිමි)**

---

## 10. ආනන්ද සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින්කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි වනාහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පැත්තක හුන්නේය. එක්පැත්තක සිටියාවූ ආනන්ද ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැළකළහ.

2. “ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගේ යම්ධර්මයක් අසා හුදකලාව, විවේකීව, අප්‍රමාදව, කෙළෙස් තවන වීර්ය ඇතිව වාසය කෙරෙම්ද, (එබඳුවූ) ධර්මයක් භාග්‍යවතුන් වහන්සේ මට කොටින් දෙශනා කරන්නාහු නම් මැනවි” යනුයි.

3. “ආනන්දය, ඒ කුමකැයි හඟනාහුද?

“රූපය නිත්‍යද අනිත්‍යද?” - “ස්වාමීනි, අනිත්‍යයි.”

“යමක් වනාහි අනිත්‍ය නම්, එය දුකද? සැපද?” - “ස්වාමීනි, දුකය.”

“යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය තදින් අල්ලා නොගැනීමෙන් මෙය මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි’ දැකීමට සුදුසුද?” - “ස්වාමීනි, එය නොවේමය.”

“වේදනාව නිත්‍යයද? අනිත්‍යද?” - “ස්වාමීනි, අනිත්‍යය.”

“යමක් වනාහි අනිත්‍ය නම්, එය දුකද? සැපද?” - “ස්වාමීනි දුකය.”

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, පෙරළෙන ස්වභාවද, එය තදින් අල්ලා නොගැනීමෙන් මෙය මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි' දැකීමට සුදුසුද?" - "ස්වාමීනි, එය නොවේමය."

"සංඥාව නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම්, එය දුකද? සැපද?" - "ස්වාමීනි දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, පෙරළෙන ස්වභාවද, එය තදින් අල්ලා නොගැනීමෙන් 'මෙය මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි' දැකීමට සුදුසුද?" - "ස්වාමීනි, එය එසේ නොවේමය."

"සංස්කාරය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම්, එය දුකද? සැපද?" - "ස්වාමීනි දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, පෙරළෙන ස්වභාවද, එය තදින් අල්ලා නොගැනීමෙන් 'මෙය මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි' දැකීමට සුදුසුද?" - "ස්වාමීනි, එය එසේ නොවේමය."

"විඤ්ඤාණය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම්, එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය.

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය තදින් අල්ලා නොගැනීමෙන් මෙය මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි' දැකීමට සුදුසුද?" - "ස්වාමීනි, එය එසේ නොවේමය."

4. "එබැවින් ආනන්දය, අතීතවූද, අනාගතවූද, වර්තමාන වූද, තමා පිළිබඳවූ හෝ අනුන් පිළිබඳවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උසස්වූ හෝ යම්කිසි රූපයක් වේද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දුරෙහි හෝ සමීපයෙහි හෝ යම් රූපයක් වේද, 'ඒ සියලු රූපය මාගේ නොවේය. මේ මම නොවෙමි. මේ මාගේ ආත්මය නොවේයයි' මෙය මෙසේ ඇති පරිදි මනා නුවණින් දතයුතුය.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, තමා පිළිබඳවූ හෝ අනුන් පිළිබඳවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උසස්වූ හෝ යම්කිසි වේදනාවක් වේද, දුරෙහි හෝ සමීපයෙහි හෝ යම්කිසි වේදනාවක් වේද, ඒ සියලු වේදනාව 'මාගේ නොවේය. මේ මම නොවෙමි. මේ මාගේ ආත්මය නොවේ'යයි මෙසේ ඇති පරිදි මනා නුවණින් දත යුතුය.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, තමා පිළිබඳවූ හෝ අනුන් පිළිබඳවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ යම්කිසි සංඥාවක් වේද, දුරෙහි හෝ සමීපයෙහි හෝ යම්කිසි සංඥාවක් වේද, ඒ සියලු සංඥාව 'මාගේ නොවේය. මේ මම නොවෙමි. මේ මාගේ ආත්මය නොවේ'යයි මෙසේ ඇති පරිදි මනා නුවණින් දත යුතුය.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, තමා පිළිබඳවූ හෝ අනුන් පිළිබඳවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ යම්කිසි සංස්කාරයෝ වෙද්ද, දුරෙහි හෝ සමීපයෙහි හෝ යම්කිසි සංස්කාරයෝ වෙද්ද, 'මේ සියලු සංස්කාරයෝ මාගේ නොවේය. මේ මම නොවෙමි. මේ මාගේ ආත්මය නොවේ'යයි මෙසේ ඇති පරිදි මනා නුවණින් දත යුතුය.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, තමා පිළිබඳවූ හෝ අනුන් පිළිබඳවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ යම්කිසි විඥානයක් වේද, දුරෙහි හෝ සමීපයෙහි හෝ යම්කිසි විඥානයක් වේද, 'මේ සියලු විඥානය 'මාගේ නොවේය. මේ මම නොවෙමි. මේ මාගේ ආත්මය නොවේ'යයි මෙසේ ඇති පරිදි මනා නුවණින් දත යුතුය.

"ආනන්දය, මෙසේ දක්නේ බොහෝ ඇසූ පිරූ තැන් ඇති (ශ්‍රැතවත්) ආර්ය ශ්‍රාවකතෙමේ රූපයෙහිද කළකිරෙයි. වේදනාවෙහිද කළකිරෙයි. සංඥාවෙහිද කළකිරෙයි.

සංස්කාරයන්හිද කළකිරෙයි. විඤ්ඤාණයෙහිද කළකිරෙයි කළකිරුණේ නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේය යන නුවණ ඇතිවෙයි. ඉපදීම නැතිකරන ලද්දේය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමකරනලදී. කළයුතු දෙය කරනලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැත්තේයයි දැනගනියි.

**(දසවෙනි ආනන්ද සූත්‍රය නිමි.)**

---

**පස්වෙනි දිට්ඨිවර්ගය නිමි.**

---

(අජ්ඣත්ත සූත්‍රය, එතං මම සූත්‍රය, සෝ අත්තා සූත්‍රය, නෝචමේසියා සූත්‍රය, මිච්ඡාදිට්ඨි සූත්‍රය, සක්කාය දිට්ඨි සූත්‍රය, අත්තානු දිට්ඨි සූත්‍රය, විනිවේස සූත්‍ර දෙක සහ ආනන්ද සූත්‍රයදැයි මේ වර්ගයෙහි සූත්‍ර දසයකි.

**(චූලපණ්ණාසකය නිමි.)**

---

(අන්තවර්ගය, ධම්මකථික වර්ගය, විජ්ජාවර්ගය, කුක්කල වර්ගය සහ දිට්ඨි වර්ගයයි කියා මේ තුන්වෙනි පඤ්ඤාසකයෙහි වර්ග පසක් කියන ලදී.)

(පණ්ණාසක තුන නිමි)

---

**ඛන්ධ සංයුත්තය නිමි.**

---

# 2. රාධ සංයුත්තය.

## 1 වෙනි වර්ගය.

### මාර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හිඳගත්තේය. එකත්පසෙක හිඳගත් ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. "ස්වාමීනි, මාරයා මාරයායයි කියනු ලැබේ. ස්වාමීනි, කෙතෙක් කරුණකින් මාරයායි කියනු ලැබේද?"

"රාධය, රූපය වනාහි ඇතිකල්හි මරණය හෝ වන්නේද, මැරිය යුතු හෝ වන්නේද? යමෙක් වනාහි මිය යයිද රාධය, එබැවින් ඔබ රූපය මරණයයි බලව, මැරිය යුතුයයි බලව. මැරේයයි බලව, රෝගයයි බලව, ගඩයයි බලව, හුලයයි බලව, දුකයයි බලව, දුක වූයේ යයි බලව. යම් කෙනෙක් ඒ රූපය මෙසේ බලත්ද ඔවුහු මනාකොට දකිත්.

"රාධය, වේදනාව ඇතිකල්හි මරණය හෝ වන්නේද, මැරිය යුතු හෝ වන්නේද, යමෙක් වනාහි මිය යයිද රාධය, එබැවින් ඔබ වේදනාව මරණයයි බලව, මැරිය යුතුයයි බලව, මැරේයයි බලව, රෝගයයි බලව, ගඩයයි බලව, හුලයයි බලව, දුකයයි බලව, මෙසේ බලත්ද, දුක්වූයේයයි බලව. යමෙක් ඒ වේදනාව මෙසේ බලත්ද, ඔව්හු මනාකොට දකිත්.

"රාධය සඤ්ඤාව ඇති කල්හි මරණය හෝ වන්නේද, මැරිය යුතු හෝ වන්නේද, යමෙක් වනාහි මිය යයිද, රාධය, එබැවින් ඔබ සඤ්ඤාව මරණයයි බලව, මැරිය යුතුයයි බලව, මැරේයයි

බලව, රෝගය යයි බලව, ගඩයයි බලව, හුලයයි බලව, දුකයයි බලව, දුක්වූයේ යයි බලව. යමෙක් ඒ සඤ්ඤාව මෙසේ බලත්ද, ඔව්හු මනාකොට දකිත්.

"රාධය සංස්කාරයෝ ඇතිකල්හි මරණය හෝ වන්නේද, මැරිය යුතු හෝ වන්නේද, යමෙක් වනාහි මිය යයිද, රාධය, එබැවින් ඔබ සංස්කාරයෝ මරණයයි බලව, මැරිය යුතුයයි බලව, මැරේයයි බලව, රෝගය යයි බලව, ගඩයයි බලව, හුලයයි බලව, දුකයයි බලව, දුක්වූයේ යයි බලව. යමෙක් ඒ සංස්කාරයන් මෙසේ බලත්ද, ඔව්හු මනාකොට දකිත්.

"රාධය විඤ්ඤාණය ඇතිකල්හි මරණය හෝ වන්නේද, මැරිය යුතු හෝ වන්නේද, යමෙක් වනාහි මිය යයිද, රාධය, එබැවින් ඔබ විඤ්ඤාණය මරණයයි බලව, මැරිය යුතුයයි බලව, මැරේයයි බලව, රෝගය යයි බලව, ගඩයයි බලව, හුලයයි බලව, දුකයයි බලව, දුක්වූයේ යයි බලව. යමෙක් ඒ විඤ්ඤාණය මෙසේ බලත්ද, ඔව්හු මනාකොට දක්නාහුය යනුයි.

3. "ස්වාමීනි, මනාකොට දැක්ම කුමක් පිණිසද?" - "රාධය, මනාකොට දැක්ම කළකිරීම පිණිසය"

"ස්වාමීනි, කළකිරීම කිනම් අර්ථයක් පිණිසද?" - "රාධය, කළකිරීම විරාගය (අර්හත් මාර්ගය) පිණිසය."

"ස්වාමීනි, විරාගය කිනම් අර්ථයක් පිණිසද?" - "රාධය, විරාගය (අර්හත් මාර්ගය) මිදීම පිණිසය."

"ස්වාමීනි, මිදීම (අර්හත් ඵලය) කිනම් අර්ථයක් පිණිසද?" - "රාධය, මිදීම නිවණ පිණිසය."

"ස්වාමීනි, නිවණ කිනම් අර්ථයක් පිණිසද?" - "රාධය, ප්‍රශ්න සීමාව ඉක්මවූයෙහිය. ප්‍රශ්නයාගේ කෙළවරක් ගැනීමට නොහැකියි. රාධය, මේ මාර්ග බ්‍රහ්මචර්යාව නිවණ ඇතුලත් කොට නිවණ පිහිට කොට, නිවණ අවසන් කොට ඇත්තේයයි" වදාළේය.

**(පළමුවෙනි මාර සූත්‍රය නිමි.)**

---

## 2. සත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හිඳගත්තේය. එකත්පසෙක හිඳගත් ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙය කීය.

2. "ස්වාමීනි, සත්ත්වයා සත්ත්වයායයි කියනු ලැබේ. ස්වාමීනි, කෙතෙක් කරුණකින් සත්ත්වයායයි කියනු ලැබේද?"

"රාධය, රූපයෙහි යම් කැමැත්තක් යම් ඇල්මක් යම් සතුටක් යම් තෘෂ්ණාවක් වෙයිද එහි ඇළුනේ, විශෙෂයෙන් ඇළුනේ වෙයිද එහෙයින් සත්ත්වයායයි කියනු ලැබේ.

"වේදනාවෙහි යම් කැමැත්තක් යම් ඇල්මක් යම් සතුටක් යම් තෘෂ්ණාවක් වෙයිද එහි ඇළුනේ විශෙෂයෙන් ඇළුනේ වෙයිද, එහෙයින් සත්ත්වයායයි කියනු ලැබේ.

"සඤ්ඤාවෙහි යම් කැමැත්තක් යම් ඇල්මක් යම් සතුටක් යම් තෘෂ්ණාවක් වෙයිද එහි ඇළුනේ, විශෙෂයෙන් ඇළුනේ වෙයිද එහෙයින් සත්ත්වයායයි කියනු ලැබේ.

"සංස්කාරයන්හි යම් කැමැත්තක් යම් ඇල්මක් යම් සතුටක් යම් තෘෂ්ණාවක් වෙයිද එහි ඇළුනේ, විශෙෂයෙන් ඇළුනේ වෙයිද එහෙයින් සත්ත්වයායයි කියනු ලැබේ.

"විඤ්ඤාණයෙහි යම් කැමැත්තක්, යම් ඇල්මක්, යම් සතුටක්, යම් තෘෂ්ණාවක් වෙයිද, එහෙයින් සත්වයායයි කියනු ලැබේ.

3. "රාධය; යම්සේ මැටිවලින් කුඩා ගෙවල් සාදාගෙන සෙල්ලම් කරන කුඩා දරුවෝ හෝ දැරියෝ හෝ යම්තාක් ඒ මැටි ගෙවල්වලට පහනොවූ ආශාව ඇත්තෝ වෙත්ද, පහනොවූ කැමැත්ත ඇත්තාහු වෙත්ද, පහනොවූ ප්‍රේමය ඇත්තාහු වෙත්ද, පහනොවූ තෘෂ්ණා පිපාසය ඇත්තාහු වෙත්ද, පහනොවූ තෘෂ්ණා

දාහය ඇත්තාහු වෙත්ද, පහනොවූ තෘෂ්ණා ඇත්තාහු වෙත්ද, ඒ තාක් ඒ මැටි ගෙවල් කෙරෙහි ඇලෙත්, ක්‍රීඩා කරත්, ධනයක් යයි සිතත්, මගේ මගේ යයි සිතත්.

"රාධය, යම් හෙයකින් ඒ දරුවෝ හෝ දැරියෝ හෝ මැටි ගෙවල්හි පහවූ රාග ඇත්තාහු වෙත්ද, පහවූ කැමැත්ත ඇත්තාහු වෙත්ද පහවූ ප්‍රේමය ඇත්තාහු වෙත්ද, පහවූ තෘෂ්ණා පිපාසය ඇත්තාහු වෙත්ද, පහවූ දාහය ඇත්තාහු වෙත්ද, පහවූ තෘෂ්ණා ඇත්තාහු වෙත්ද, එකල්හි ඒ මැටි ගෙවල් අත්වලින්ද, පාවලින්ද විසුරුවා දමත්. විනාශ කරත්, කඩා බිඳ දමත්. ක්‍රීඩාවට නුසුදුසුවූවක් කරත්.

4. "රාධය, එසේම තොපිද රූපය විසුරුවව්, විනාශ කරව්, කඩා බිඳ දමව්, ක්‍රීඩාවට නුසුදුසු වූවක් කරව්, තෘෂ්ණාවගේ විනාශය පිණිස පිළිපදිව්.

"වේදනාව විසුරුවව්, විනාශ කරව්, කඩා බිඳ දමව්, ක්‍රීඩාවට නුසුදුසුවූවක් කරව්, තෘෂ්ණාවගේ විනාශය පිණිස පිළිපදිව්.

"සඤ්ඤාව විසුරුවව්, විනාශ කරව්, කඩා බිඳ දමව්, ක්‍රීඩාවට නුසුදුසුවූවක් කරව්, තෘෂ්ණාවගේ විනාශය පිණිස පිළිපදිව්.

"සංස්කාරයන් විසුරුවව්, විනාශ කරව්, කඩා බිඳ දමව්, ක්‍රීඩාවට නුසුදුසුවූවක් කරව්, තෘෂ්ණාවගේ විනාශය පිණිස පිළිපදිව්.

"විඤ්ඤාණය විසුරුවව්, විනාශ කරව්, කඩා බිඳ දමව්, ක්‍රීඩාවට නුසුදුසුවූවක් කරව්, තෘෂ්ණාවගේ විනාශය පිණිස පිළිපදිව්." රාධය, තෘෂ්ණාවගේ විනාශය නිර්වාණයයි වදාළේය.

**(දෙවෙනි සත්ත සූත්‍රය නිමි.)**

---

## 3. භවනෙත්ති සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින්

කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හිඳගත්තේය. එකත්පසෙක හිඳගත් ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙය කීය.

**2.** "ස්වාමීනි, භව රැහැන භව රැහැනයයි කියනු ලැබේ. ස්වාමීනි, භව රැහැන නම් කවරේද? භව රැහැන නැතිවීම නම් කවරේද?

"රාධය, රූපයෙහි වනාහි යම් කැමැත්තක් යම් ඇල්මක් යම් සතුටක් යම් තෘෂ්ණාවක් යම් පඤ්චස්කන්ධය පිළිබඳ දැඩි ගැන්මක් හෝ යම් දෙවැදෑරුම් උපාය සතර වැදෑරුම් උපාදාන අකුසල චිත්තයාගේ අධිෂ්ඨාන ඇලීම් අනුසයයෝ (රාග ද්වේෂ සිත්) වෙත්ද, මේ වනාහි භව රැහැන් යයි කියනු ලැබේ. ඔවුන්ගේ නිරුද්ධවීම භව රැහැන් නිරුද්ධවීම නම් වේ.

"වේදනාවෙහි යම් කැමැත්තක් යම් ඇල්මක් යම් සතුටක් යම් තෘෂ්ණාවක් යම් පඤ්චස්කන්ධය පිළිබඳ දැඩි ගැන්මක් හෝ යම් දෙවැදෑරුම් උපාය සතර වැදෑරුම් උපාදාන අකුසල චිත්තයාගේ අධිෂ්ඨාන ඇලීම් අනුසයයෝ වෙත්ද, මේ වනාහි භවරැහැන්යයි කියනු ලැබේ. ඔවුන්ගේ නිරුද්ධවීම භව රැහැන් නිරුද්ධවීම නම් වේ.

"සඤ්ඤාවෙහි යම් කැමැත්තක් යම් ඇල්මක් යම් සතුටක් යම් තෘෂ්ණාවක් යම් පඤ්චස්කන්ධය පිළිබඳ දැඩි ගැන්මක් හෝ යම් දෙවැදෑරුම් උපාය සතර වැදෑරුම් උපාදාන අකුසල චිත්තයාගේ අධිෂ්ඨාන ඇලීම් අනුසයයෝ වෙත්ද, මේ වනාහි භව රැහැන්යයි කියනු ලැබේ. ඔවුන්ගේ නිරුද්ධවීම භව රැහැන් නිරුද්ධවීම නම් වේ.

"සංස්කාරයන්හි යම් කැමැත්තක් යම් ඇල්මක් යම් සතුටක් යම් තෘෂ්ණාවක් යම් පඤ්චස්කන්ධය පිළිබඳ දැඩි ගැන්මක් හෝ යම් දෙවැදෑරුම් උපාය සතර වැදෑරුම් උපාදාන අකුසල චිත්තයාගේ අධිෂ්ඨාන ඇලීම් අනුසයයෝ වෙත්ද, මේ වනාහි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

භවරැහැන්යයි කියනු ලැබේ. ඔවුන්ගේ නිරුද්ධවීම භව රැහැන් නිරුද්ධවීම නම් වේ.

"විඤ්ඤාණයෙහි යම් කැමැත්තක්, යම් ඇල්මක්, යම් සතුටක්, යම් තෘෂ්ණාවක්, යම් පඤ්චස්කන්ධය පිළිබඳ දැඩි ගැන්මක් හෝ යම් දෙවැදෑරුම් උපාය සතර වැදෑරුම් උපාදාන අකුසල චිත්තයාගේ අධිෂ්ඨාන ඇලීම් අනුසයයෝ වෙත්ද, මේ වනාහි භවරැහැන්යයි කියනු ලැබේ. ඔවුන්ගේ නිරුද්ධවීම භව රැහැන් නිරුද්ධවීම නම් වේ.

**(තුන්වෙනි භවනෙත්ති සූත්‍රය නිමි.)**

## 4. පරිඤ්ඤෙය්‍ය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හිඳගත්තේය. එකත්පසෙක හුන් රාධ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේට මෙසේ වදාළසේක.

2. "රාධය, පිරිසිඳ දැනගත යුතුවූ පිරිසිඳ දැන ගැනීමද, පිරිසිඳ දැනගත් පුද්ගලයාද දේශනා කරන්නෙමි. "මහණෙනි, එසේ නම් අසව්, මනාකොට මෙනෙහි කරව්, කියන්නෙමැයි කීය. ස්වාමීනි, එසේයයි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක;

"රාධය, පිරිසිඳ දැනගත යුතුවූ ධර්මයෝ කවරහුද? රාධය රූපය පිරිසිඳ දැනගත යුතුවූ ධර්මයෙකි. වේදනාව පිරිසිඳ දැනගත යුතුවූ ධර්මයකි. සඤ්ඤාව පිරිසිඳ දැනගත යුතුවූ ධර්මයකි. සංස්කාරයෝ පිරිසිඳ දැනගත යුතුවූ ධර්මයකි. විඤ්ඤාණය පිරිසිඳ දැනගත යුතුවූ ධර්මයකි. රාධය, මේ පිරිසිඳ දැනගත යුතුවූ ධර්මයෝ යයි කියනු ලැබෙත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

3. "රාධය, පිරිසිඳ දැනගැනීම කවරේද? රාධය, යම් රාගය ක්ෂය කිරීමක් යම් ද්වේෂය ක්ෂය කිරීමක් යම් මොහය ක්ෂය කිරීමක් වෙයිද රාධය, මේ පිරිසිඳ දැනගැනීම යයි කියනු ලැබේ.

4. "පිරිසිඳ දැනගත් පුද්ගලයා කවරේද? ඔහුට අර්හත් පුද්ගලයායයි කියයුතු වන්නේය. යම් ආයුෂ්මතෙක් මෙවැනි නම් ඇත්තේ මෙවැනි ගෝත්‍ර ඇත්තේ වේද, රාධය, මේ තෙම පිරිසිඳ දැනගත් පුද්ගලයායයි කියනු ලැබේ."

**(හතරවෙනි පරිඤ්ඤෙය්‍ය සූත්‍රය නිමි.)**

---

## 5. සමණ සූත්‍රය (1)

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හිඳගත්තේය. එකත්පසෙක හිඳගත් රාධ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2. "රාධය, උපාදානස්කන්ධයෝ පස්දෙනෙක් වෙති. ඒ පස කවරේද? එනම්, රූප උපාදානස්කන්ධය, වේදනා උපාදානස්කන්ධය, සංඥා උපාදානස්කන්ධය සංස්කාර උපාදානස්කන්ධය, විඤ්ඤාණ උපාදානස්කන්ධය යනුයි.

"රාධය, යම්කිසි ශ්‍රමණකෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මේ පංච උපාදානස්කන්ධයන්ගේ ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිදි නොදනිත්ද, රාධය, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ මාගේ ශ්‍රමණයන් අතරෙහි හෝ ශ්‍රමණයයි සම්මත නොවූවාහුය. බ්‍රාහ්මණයන් අතරෙහි හෝ බ්‍රාහ්මණ යයි සම්මත නොවූවාහුය.

"ඒ ආයුෂ්මත්හු ශ්‍රමණ භාවයේ අර්ථය හෝ බ්‍රාහ්මණභාවයේ අර්ථය හෝ මෙලොවදීම තෙමේ විශෙෂ නුවණින් ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය නොකරත්.

3. "රාධය, යම් ශ්‍රමණකෙනෙක් හෝ බ්‍රාහ්මණකෙනෙක් හෝ මේ පංච උපාදානස්කන්ධයන්ගේ ආශ්වාදයද, ආදීනවයද නිස්සරණයද තත්වූ පරිදි දනිත්ද, රාධය, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ මාගේ ශ්‍රමණයන් අතුරෙහි හෝ ශ්‍රමණයයි සම්මත වූවාහුය. බ්‍රාහ්මණයන් අතුරෙහි හෝ බ්‍රාහ්මණයයි සම්මත වූවාහුය.

"ඒ ආයුෂ්මත්හු ශ්‍රමණ භාවයේ අර්ථය හෝ බ්‍රාහ්මණභාවයේ අර්ථය හෝ මෙලොවදීම තෙමේ විශේෂ නුවණින් ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කරත්යයි" වදාළේය.

**(පස්වෙනි සමණ සූත්‍රය (1) නිමි.)**

---

## 6. සමණ සූත්‍රය. (2)

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හිඳගත්තේය. එකත්පසෙක හුන් රාධ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2. "රාධය, උපාදානස්කන්ධයෝ පස්දෙනෙක් වෙති. ඒ පස කවරේද? එනම්, රූප උපාදානස්කන්ධය, වේදනා උපාදානස්කන්ධය, සංඥා උපාදානස්කන්ධය සංස්කාර උපාදානස්කන්ධය, විඤ්ඤාණ උපාදානස්කන්ධය," යනුයි."

"රාධය, යම් ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මේ පංච උපාදානස්කන්ධයන්ගේ හටගැනීමද, විනාශවීමද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිදි නො දනිත්ද, රාධය, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ මාගේ ශ්‍රමණයන් අතුරෙහි හෝ ශ්‍රමණයයි සම්මත නොවූවාහුය. බ්‍රාහ්මණයන් අතුරෙහි හෝ බ්‍රාහ්මණයයි සම්මත නොවූවාහුය.

"ඒ ආයුෂ්මත්හු ශ්‍රමණ භාවයේ අර්ථය හෝ බ්‍රාහ්මණභාවයේ අර්ථය හෝ හෙතෙම යහපත් නුවණින් දැන ප්‍රත්‍යක්ෂකොට වාසය නොකරත්යයි" වදාළේය.

**(හයවෙනි සමණ සූත්‍රය (2) නිමි.)**

---

## 7. සොතාපන්න සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හිඳගත්තේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2. "රාධය, උපාදානස්කන්ධයෝ පස් දෙනෙක් වෙති. ඒ කවරේද? එනම්, රූප උපාදානස්කන්ධය, වේදනා උපාදානස්කන්ධය, සංඥා උපාදානස්කන්ධය, සංස්කාර උපාදානස්කන්ධය, විඤ්ඤාණ උපාදානස්කන්ධය යනුයි.

"රාධය, යම් හෙයකින් ආර්ය ශ්‍රාවකතෙමේ මේ පංච උපාදානස්කන්ධයන්ගේ හටගැනීමද, විනාශවීමද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද, තත්වූ පරිදි දනීද, රාධය, මේ ආර්ය ශ්‍රාවකතෙමේ සෝවාන්වූයේ දුගතියට නොපැමිණීම ස්වාභාව කොට ඇති අර්හත් ඵලයට නියතවූ අර්හත් ඵලය පිහිට කොට ඇති පුද්ගලයායි කියනු ලැබේ."

**(හත්වෙනි සොතාපන්න සූත්‍රය නිමි.)**

---

## 8. අරහ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින්

කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක හිඳ ගත්තේය. එකත්පසෙක හුන් රාධ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

2. "රාධය, උපාදානස්කන්ධයෝ පස්දෙනෙක් වෙත්. ඒ කවරේද? එනම්, රූප උපාදානස්කන්ධය, වේදනා උපාදානස්කන්ධය, සංඥා උපාදානස්කන්ධය, සංස්කාර උපාදානස්කන්ධය, විඤ්ඤාණ උපාදානස්කන්ධය යනුයි.

"රාධය, යම් හෙයකින් මහණතෙමේ මේ පංච උපාදානස්කන්ධයන්ගේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිදි දැන උපාදානයන් කෙරෙන් මනාකොට මිදුනේ වෙයිද, රාධය, මේ මහණතෙමේද අර්හත්වූ, ආශ්‍රවයන් ක්ෂයකළාවූ වැස නිමවනලද බ්‍රහ්මචර්යාව ඇත්තාවූ, කරන ලද කටයුතු ඇත්තාවූ, බහා තබනලද බර ඇත්තාවූ, තමාගේ අර්ථයට පැමිණියාවූ විනාශ කළ භව බැඳුම් ඇත්තාවූ, මනාව දැන මිදුනාවූ පුද්ගලයායයි කියනු ලැබේයයි වදාළේය.

**(අටවෙනි අරහ සූත්‍රය නිමි.)**

---

## 9. ඡන්දරාග සූත්‍රය (1)

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසක හිඳ ගත්තේය. එකත්පසක හුන් රාධ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2. "රාධය, රූපයෙහි වනාහි යම් කැමැත්තක් යම් ඇල්මක්, යම් සතුටක්, යම් තෘෂ්ණාවක් වෙයිද එය දුරු කරව්. මෙසේ ඒ

රූපය ප්‍රහීනවූයේ සිඳින ලද මුල් ඇත්තේ, සිඳිනලද තල් ගසක් මෙන් කරන ලද්දේ, නැතිකරන ලද්දේ, නැවත නොඉපදීම ස්වභාවකොට ඇත්තේ වන්නේය.

"වේදනාවෙහි වනාහි යම් කැමැත්තක්, යම් ඇල්මක් යම් සතුටක්, යම් තෘෂ්ණාවක් වෙයිද, එය දුරු කරව්. මෙසේ ඒ වේදනාව ප්‍රහීනවූයේ සිඳිනලද මුල් ඇත්තේ, සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලද්දේ, නැති කරණ ලද්දේ, නැවත නොඉපදීම ස්වභාව කොට ඇත්තේ වන්නේය.

"සංඥාවෙහි යම් කැමැත්තක් යම් ඇල්මක් යම් සතුටක් යම් තෘෂ්ණාවක් වෙයිද, එය දුරු කරව් මෙසේ ඒ සංඥාව ප්‍රහීනවූයේ සිඳින ලද මුල් ඇත්තේ, සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලද්දේ, නැති කරණ ලද්දේ, නැවත නොඉපදීම ස්වභාව කොට ඇත්තේ වන්නේය.

"සංස්කාරයන්හි වනාහි යම් කැමැත්තක්, යම් ඇල්මක් යම් සතුටක්, යම් තෘෂ්ණාවක් වෙයිද, එය දුරුකරව්. මෙසේ ඒ සංස්කාරයන් ප්‍රහීනවූයේ සිඳින ලද මුල් ඇත්තේ, සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලද්දේ, නැති කරණ ලද්දේ, නැවත නොඉපදීම ස්වභාවකොට ඇත්තේ වන්නේය.

"විඥ්ඥාණයෙහි යම් කැමැත්තක්, ඇල්මක්, සතුටක්, යම් තෘෂ්ණාවක් වෙයිද, එය දුරු කරව්. මෙසේ ඒ විඥ්ඥාණය ප්‍රහීන වූයේ සිඳින ලද මුල් ඇත්තේ, සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලද්දේ, නැති කරණ ලද්දේ නැවත නොඉපදීම ස්වභාවකොට ඇත්තේ වන්නේයයි" වදාළේය.

**(නවවෙනි ඡන්දරාග සූත්‍රය (1) නිමි.)**

---

## 10. ඡන්දරාග සූත්‍රය. (2)

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි

ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන් ඒ රාධ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය.

**2.** "රාධය, රූපයෙහි වනාහි යම් කැමැත්තක්, ඇල්මක්, සතුටක්, යම් තෘෂ්ණාවක්, යම් උපාය උපාදාන කෙනෙක් අකුසල චිත්තයාගේ අධිෂ්ඨාන අභිනිවෙස අනුසය කෙනෙක් වෙත්ද, ඔවුන් දුරු කරව්. මෙසේ ඒ රූපය ප්‍රහීනවූයේ සිඳින ලද මුල් ඇත්තේ, සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලද්දේ, නැති කරණ ලද්දේ නැවත නොඉපදීම ස්වභාව කොට ඇත්තේ වන්නේය.

"වේදනාවෙහි යම් කැමැත්තක්, යම් ඇල්මක්, යම් සතුටක් යම් තෘෂ්ණාවක්, යම් උපාය උපාදාන කෙනෙක් අකුසල චිත්තයාගේ අධිෂ්ඨාන අභිනිවෙස අනුසය කෙනෙක් වෙත්ද, ඔවුන් දුරු කරව්. මෙසේ ඒ වේදනාව ප්‍රහීනවූයේ සිඳින ලද මුල් ඇත්තේ, සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලද්දේ නැති කරණ ලද්දේ නැවත නොඉපදීම ස්වභාවකොට ඇත්තේ වන්නේය.

"සංඥාවෙහි යම් කැමැත්තක්, යම් ඇල්මක්, යම් සතුටක්, යම් තෘෂ්ණාවක්, යම් උපාය උපාදාන කෙනෙක්, අකුසල චිත්තයාගේ අධිෂ්ඨාන අභිනිවෙස අනුසය කෙනෙක් වෙත්ද, ඔවුන් දුරු කරව්, මෙසේ ඒ සංඥාව ප්‍රහීනවූයේ, සිඳින ලද මුල් ඇත්තේ, සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලද්දේ නැති කරන ලද්දේ, නැවත නොඉපදීම ස්වභාව කොට ඇත්තේ වන්නේය.

"සංස්කාරයන්හි යම් ඇල්මක්, යම් සතුටක්, යම් තෘෂ්ණාවක්, යම් උපාය උපාදාන කෙනෙක් අකුසල චිත්තයාගේ අධිෂ්ඨාන අභිනිවෙස අනුසය කෙනෙක් වෙත්ද, ඔවුන් දුරු කරව්. මෙසේ ඒ සංස්කාර ප්‍රහීනවූයේ, සිඳින ලද මුල් ඇත්තේ, සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලද්දේ, නැති කරන ලද්දේ, නැවත නොඉපදීම ස්වභාවය කොට ඇත්තේ වන්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"විඤ්ඤාණයෙහි යම් ඇල්මක්, යම් සතුටක්, යම් තෘෂ්ණාවක්, යම් උපාය උපාදාන කෙනෙක් අකුසල චිත්තයාගේ අධිෂ්ඨාන අභිනිවෙස අනුසය කෙනෙක් වෙත්ද, ඔවුන් දුරු කරව්. මෙසේ ඒ විඤ්ඤාණය ප්‍රහීනවූයේ සිඳිනලද මුල් ඇත්තේ සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලද්දේ, නැවත නොඉපදීම ස්වභාවකොට ඇත්තේ වන්නේයයි" වදාළේය.

**(දහවෙනි ඡන්දරාග සූත්‍රය (2) නිමි.)**

---

**(මාර සූත්‍රය, සත්ව සූත්‍රය, භවනෙත්ති සූත්‍රය, පරිඤ්ඤෙය්‍ය සූත්‍රය, ශ්‍රමණ සූත්‍ර දෙක, සොතාපන්න සූත්‍රය, අරහ සූත්‍රය සහ ඡන්ද රාග සූත්‍ර දෙකදැයි මේ වර්ගයෙහි සූත්‍ර දසයකි.)**

**(රාධ සංයුත්තයේ පළමුවෙනි වර්ගය නිමි.)**

---

# දෙවෙනි වර්ගය.

## 1. මාර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. "ස්වාමීනි 'මාරයා, මාරයායයි' කියනු ලැබේ. ස්වාමීනි, මාරයා නම් කවරෙක්ද?"

"රාධය, රූපය මාර නම්වේ. වේදනාව මාර නම්වේ. සඤ්ඤාව මාර නම්වේ. සංස්කාරයෝ මාර නම්වේ. විඤ්ඤාණය මාර නම්වේ. රාධය, මෙසේ දකින්නාවූ බොහෝ ඇසූ පිරූ

තැන් ඇති ආර්යශ්‍රාවක තෙමේ රූපයෙහිද කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයෙහිද කලකිරෙයි. විඤ්ඤාණයෙහිද කලකිරෙයි. කලකිරීමෙන් (මාර්ගයට පැමිණීමෙන්) නොඇලෙයි. (ඵලයට පැමිණීමෙන්) මිදෙයි. මිදුනු කල්හි මිදුනේයයි නුවණ (පහල) වෙයි. ජාතිය කෙළවර විය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවනලදී. කළයුත්ත කරනලදී. මේ භවය පිණිස මත්තෙහි කළයුත්තක් නැතැයි දැනගනී" යනුයි.

**(පළමුවෙනි මාර සූත්‍රය නිමි.)**

---

## 2. මාර ධර්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. "ස්වාමීනි, 'මාරධර්මය, මාරධර්මයයි' කියනු ලැබේ. ස්වාමීනි, මාරධර්මය නම් කවරේද?

"රාධය, රූපය මාරධර්මය නම්වේ. වේදනාව මාරධර්මය නම්වේ. සංඥාව මාරධර්මය නම්වේ. සංස්කාරයෝ මාරධර්ම නම්වේ. විඤ්ඤාණය මාරධර්ම නම්වේ. රාධය, මෙසේ දක්නාවූ බොහෝ ඇසූ පිරූ තැන් ඇති ආර්ය ශ්‍රාවක තෙමේ රූපයෙහිද කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයෙහිද කලකිරෙයි. විඤ්ඤාණයෙහිද කලකිරෙයි. කලකිරීමෙන් (මාර්ගයට පැමිණීමෙන්) නොඇලෙයි. (ඵලයට පැමිණීමෙන්) මිදෙයි මිදුනු කල්හි මිදුනේයයි නුවණ (පහල) වෙයි. ජාතිය කෙළවර විය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවනලදී.

කළයුත්ත කරනලදී. මේ භවය පිණිස මත්තෙහි කළයුත්තක් නැතැයි දැනගනී" යනුයි.

(දෙවෙනි මාරධර්ම සූත්‍රය නිමි.)

---

## 3. අනිත්‍ය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක හුන් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. "ස්වාමීනි, 'අනිත්‍ය අනිත්‍යයයි' කියනු ලැබේ. ස්වාමීනි, අනිත්‍ය නම් කවරේද?"

"රාධය, රූපය අනිත්‍ය නම්වේ. වේදනාව අනිත්‍ය නම්වේ. සංඥාව අනිත්‍ය නම්වේ. සංස්කාරයෝ අනිත්‍ය නම්වේ. විඤ්ඤාණය අනිත්‍ය නම්වේ. රාධය, මෙසේ දකින්නාවූ බොහෝ ඇසූ පිරූ තැන් ඇති ආර්ය ශ්‍රාවකතෙමේ රූපයෙහිද කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයෙහිද කලකිරෙයි. විඤ්ඤාණයෙහිද කලකිරෙයි. කලකිරීමෙන් (මාර්ගයට පැමිණීමෙන්) නොඇලෙයි. (ඵලයට පැමිණීමෙන්) මිදෙයි. මිදුනු කල්හි මිදුණේයයි නුවණ (පහළ) වෙයි. ජාතිය කෙළවර විය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවනලදී. කළයුත්ත කරනලදී. මේ භවය පිණිස මත්තෙහි කළයුත්තක් නැතැයි" දනියි.

(තුන්වෙනි අනිත්‍ය සූත්‍රය නිමි.)

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 4. අනිත්‍ය ධර්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. "ස්වාමීනි, 'අනිත්‍ය ධර්මය, අනිත්‍ය ධර්මයයි' කියනු ලැබේ. ස්වාමීනි, අනිත්‍ය ධර්මය කවරේද?"

"රාධය, රූපය අනිත්‍ය ධර්ම නම්වේ. වේදනාව අනිත්‍ය ධර්ම නම්වේ. සංඥාව අනිත්‍යධර්ම නම්වේ. සංස්කාර අනිත්‍ය ධර්ම නම්වේ. විඤ්ඤාණය අනිත්‍ය ධර්ම නම්වේ. රාධය, මෙසේ දක්නාවූ බොහෝ ඇසූපිරූ තැන් ඇති ආර්ය ශ්‍රාවකතෙමේ රූපයෙහිද කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයෙහිද කලකිරෙයි. විඤ්ඤාණයෙහිද කලකිරෙයි. කලකිරීමෙන් (මාර්ගයට පැමිණීමෙන්) මිදෙයි. මිදුනු කල්හි මිදුණේයයි නුවණ (පහල) වෙයි. ජාතිය කෙළවර විය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවනලදී. කළයුත්ත කරනලදී. මේ භවය පිණිස මත්තෙහි කළයුත්තක් නැතැයි දනියි.

(හතරවෙනි අනිත්‍ය ධර්ම සූත්‍රය නිමි.)

---

## 6. දුක්ඛ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ,

එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

**2.** "ස්වාමීනි, 'දුක, දුකයයි' කියනු ලැබේ. ස්වාමීනි, දුක නම් කවරේද?"

"රාධය, රූපය දුක නම්වේ. වේදනාව දුක නම්වේ. සංඥාව දුක නම්වේ. සංස්කාරයෝ දුක නම්වේ. විඤ්ඤාණය දුක නම්වේ. රාධය, මෙසේ දක්නාවූ බොහෝ ඇසූ පිරූ තැන් ඇති ආර්ය ශ්‍රාවකතෙමේ රූපයෙහිද කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයෙහිද කලකිරෙයි. විඤ්ඤාණයෙහිද කලකිරෙයි. කලකිරීමෙන් (මාර්ගයට පැමිණීමෙන්) නොඇලෙයි. (ඵලයට පැමිණීමෙන්) මිදෙයි, මිදුනු කල්හි මිදුනේයයි නුවණ (පහල) වෙයි. ජාතිය කෙළවර විය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවනලදී. කළයුත්ත කරනලදී. මේ භවය පිණිස මත්තෙහි කළයුත්තක් නැතැයි දනියි." යනුයි.

**(පස්වෙනි දුක්ඛ සූත්‍රය නිමි.)**

---

## 6. දුක්ඛ ධර්ම සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

**2.** "ස්වාමීනි, 'දුක්ඛ ධර්මය, දුක්ඛ ධර්මයයි' කියයි. ස්වාමීනි, දුක්ඛ ධර්මය නම් කවරේද?"

"රාධය, රූපය දුක්ඛධර්ම නම්වේ. වේදනාව දුක්ඛ ධර්ම නම්වේ. සංඥාව දුක්ඛ ධර්ම නම්වේ. සංස්කාර දුක්ඛ ධර්ම

නම්වේ. විඤ්ඤාණය දුක්ඛ ධර්ම නම්වේ. රාධය, මෙසේ දක්නාවූ බොහෝ ඇසූ පිරූ තැන් ඇති ආර්ය ශ්‍රාවකතෙමේ රූපයෙහිද කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයෙහිද කලකිරෙයි. විඤ්ඤාණයෙහිද කලකිරෙයි. කලකිරීමෙන් (මාර්ගයට පැමිණීමෙන්) නොඇලෙයි. (ඵලයට පැමිණීමෙන්) මිදෙයි. මිදුනු කල්හි මිදුනේයයි නුවණ (පහල) වෙයි. ජාතිය කෙළවර විය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවන ලදී. කළයුත්ත කරනලදී. මේ භවය පිණිස මත්තෙහි කළයුත්තක් නැතැයි දනියි.

**(හයවෙනි දුක්ඛධර්ම සූත්‍රය නිමි.)**

---

## 7. අනත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ.

2. "ස්වාමීනි, 'අනාත්මය, අනාත්මයයි' කියනු ලැබේ. ස්වාමීනි අනාත්මය කවරේද?"

"රාධය, රූපය අනාත්මය නම්වේ. වේදනාව අනාත්මය නම්වේ. සංඥාව අනාත්මය නම්වේ. සංස්කාර අනාත්ම නම්වේ. විඤ්ඤාණය අනාත්ම නම්වේ. රාධය මෙසේ දක්නාවූ බොහෝ ඇසූ පිරූ තැන් ඇති ආර්ය ශ්‍රාවකතෙමේ රූපයෙහිද කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයෙහිද කලකිරෙයි. විඤ්ඤාණයෙහිද කලකිරෙයි. කලකිරීමෙන් (මාර්ගයට පැමිණීමෙන්) නොඇලෙයි. (ඵලයට පැමිණීමෙන්) මිදෙයි. මිදුනු කල්හි මිදුනේයයි නුවණ (පහල)

වෙයි. ජාතිය කෙළවර විය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවනලදී. කළයුත්ත කරනලදී. මේ භවය පිණිස මත්තෙහි කළයුත්තක් නැතැයි දනියි.”

(හත්වෙනි අනත්ත සූත්‍රය නිමි.)

---

## 8. අනත්තධම්ම සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. “ස්වාමීනි, ‘අනාත්ම ධර්මය, අනාත්ම ධර්මයයි’ කියනු ලැබේ. ස්වාමීනි, අනාත්ම ධර්මය කවරේද?”

“රාධය, රූපය අනාත්ම ධර්ම නම්වේ. වේදනාව අනාත්ම ධර්ම නම්වේ සංඥාව අනාත්ම ධර්ම නම්වේ. සංස්කාරයන් අනාත්ම ධර්ම නම්වේ. විඤ්ඤාණය අනාත්ම ධර්ම නම්වේ. රාධය, මෙසේ දක්නාවූ බොහෝ ඇසූ පිරූ තැන් ඇති ආර්ය ශ්‍රාවකතෙමේ රූපයෙහිද, කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයෙහිද කලකිරෙයි. විඤ්ඤාණයෙහිද කලකිරෙයි. කලකිරීමෙන් (මාර්ගයට පැමිණීමෙන්) නොඇලෙයි. (ඵලයට පැමිණීමෙන්) මිදෙයි. මිදුනු කල්හි මිදුනේයයි නුවණ (පහල) වෙයි. ජාතිය කෙළවර විය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවනලදී. කළයුත්ත කරනලදී. මේ භවය පිණිස මත්තෙහි කළයුත්තක් නැතැයි දනියි” යනුයි.

(අටවෙනි අනත්ත ධම්ම සූත්‍රය නිමි.)

---

## 9. ඛය ධම්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. "ස්වාමීනි, 'ක්ෂය ධර්මය, ක්ෂය ධර්මයයි' කියනු ලැබේ. ස්වාමීනි, ක්ෂය ධර්මය නම් කවරේද?"

"රාධය, රූපය ක්ෂයධර්ම නම්වේ. වේදනාව ක්ෂයධර්ම නම්වේ. සංඥාව ක්ෂයධර්ම නම්වේ. සංස්කාර ක්ෂයධර්ම නම්වේ. විඥ්ඥාණය ක්ෂයධර්ම නම්වේ. රාධය, මෙසේ දක්නාවූ බොහෝ ඇසූ පිරූ තැන් ඇති ආර්ය ශ්‍රාවකතෙමේ රූපයෙහිද කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයෙහිද කලකිරෙයි. විඥ්ඥාණයෙහිද කලකිරෙයි. කලකිරීමෙන් (මාර්ගයට පැමිණීමෙන්) නොඇලෙයි. (ඵලයට පැමිණීමෙන්) මිදෙයි. මිදුනු කල්හි මිදුණේයයි නුවණ (පහල) වෙයි. ජාතිය කෙළවර විය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවන ලදී. මේ භවය පිණිස මත්තෙහි කළයුත්තක් නැතැයි දනියි" යනුයි.

(නවවෙනි ඛයධම්ම සූත්‍රය නිමි.)

---

## 10. වයධම්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ.

එකත්පසෙක හුන්නේය. එකත්පසක සිටි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ.

**2.** "ස්වාමීනි, 'ව්‍යයධර්ම, ව්‍යයධර්මයයි' කියනු ලැබේ. ස්වාමීනි, ව්‍යයධර්ම කවරේද?"

"රාධය, රූපය ව්‍යයධර්ම නම්වේ. වේදනාව ව්‍යයධර්ම නම්වේ. සංඥාව ව්‍යයධර්ම නම්වේ. සංස්කාර ව්‍යයධර්ම නම්වේ. විඤ්ඤාණය ව්‍යයධර්ම නම්වේ. රාධය, මෙසේ දක්නාවූ බොහෝ ඇසූ පිරූ තැන් ඇති ආර්ය ශ්‍රාවකතෙමේ රූපයෙහිද කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයෙහිද කලකිරෙයි. විඤ්ඤාණයෙහිද කලකිරෙයි කලකිරීමෙන් (මාර්ගයට පැමිණීමෙන්) නොඇලෙයි. (ඵලයට පැමිණීමෙන්) මිදෙයි. මිදුනු කල්හි මිදුනේයයි නුවණ (පහල) වෙයි. ජාතිය කෙළවර විය. බ්‍රහ්මචරියාවෙහි හැසිර නිමවන ලදී. කළයුත්ත කරනලදී. මේ භවය පිණිස මත්තෙහි කළ යුත්තක් නැතැයි දනියි."

**(දසවෙනි වයධම්ම සූත්‍රය නිමි.)**

---

## 11. සමුදය ධම්ම සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක සිටි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

**2.** "ස්වාමීනි, 'සමුදය ධර්මය, සමුදය ධර්මයයි' කියනු ලැබේ. ස්වාමීනි, සමුදය ධර්මය කවරේද?"

"රාධය, රූපය සමුදය ධර්ම නම්වේ. වේදනාව සමුදය ධර්ම නම්වේ. සංඥාව සමුදය ධර්ම නම්වේ. සංස්කාර සමුදය ධර්ම

නම්වේ. විඤ්ඤාණය සමුදය ධර්ම නම්වේ. රාධය, මෙසේ දකින්නාවූ බොහෝ ඇසූ පිරූ තැන් ඇති ආර්ය ශ්‍රාවකතෙමේ රූපයෙහිද කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයෙහිද කලකිරෙයි. විඤ්ඤාණයෙහිද කලකිරෙයි. කලකිරීමෙන් (මාර්ගයට පැමිණීමෙන්) නොඇලෙයි. (ඵලයට පැමිණීමෙන්) මිදෙයි. මිදුනු කල්හි මිදුණේයයි නුවණ (පහළ) වෙයි. ජාතිය කෙළවර විය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවන ලදී. කළයුත්ත කරනලදී. මේ භවය පිණිස මත්තෙහි කළයුත්තක් නැතැයි දනියි" යනුයි.

**එකොළොස්වෙනි සමුදය ධම්ම සූත්‍රය නිමි.)**

---

## 12. නිරොධ ධම්ම සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

**2.** "ස්වාමීනි, 'නිරොධ ධර්මය, නිරොධ ධර්මයයි' කියනු ලැබේ. ස්වාමීනි, නිරොධ ධර්ම නම් කවරේද?"

"රාධය, රූපය නිරොධ ධර්ම නම්වේ. වේදනාව නිරොධ ධර්ම නම්වේ. සංඥාව නිරොධ ධර්ම නම්වේ. සංස්කාර නිරොධ ධර්ම නම්වේ. විඤ්ඤාණය නිරොධ ධර්ම නම්වේ. රාධය මෙසේ දක්නාවූ බොහෝ ඇසූ පිරූ තැන් ඇති ආර්ය ශ්‍රාවකතෙමේ රූපයෙහිද කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයෙහිද කලකිරෙයි. විඤ්ඤාණයෙහිද කලකිරෙයි. කලකිරීමෙන් (මාර්ගයට පැමිණීමෙන්) නොඇලෙයි. (ඵලයට පැමිණීමෙන්) මිදෙයි. මිදුනු කල්හි මිදුනේයයි නුවණ

(පහල) වෙයි. ජාතිය කෙළවර විය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවනලදී. කළයුත්ත කරනලදී. මේ භවය පිණිස මත්තෙහි කළයුත්තක් නැතැයි දනියි" යනුයි.

**(දොළොස්වෙනි නිරොධ ධම්ම සූත්‍රය නිමි.)**

---

**(මාර සූත්‍රය, මාර ධම්ම සූත්‍රය, අනිත්‍ය සූත්‍රය, අනිත්‍ය ධම්ම සූත්‍රය, දුක්ඛ සූත්‍රය, දුක්ඛ ධම්ම සූත්‍රය, අනාත්ම සූත්‍රය, අනාත්ම ධම්ම සූත්‍රය, ඛය ධම්ම සූත්‍රය, වය ධම්ම සූත්‍රය, සමුදය ධම්ම සූත්‍රය සහ නිරොධ ධම්ම සූත්‍රයයි.**

**මේ වර්ගයෙහි සූත්‍ර දොළොසකි.**

**(දෙවෙනි වර්ගය නිමි.)**

---

## 3. ආයාචන වර්ගය.

### 1. මාර සූත්‍රය (1)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හිඳගත්තේය. එකත්පසෙක හුන් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මට කෙටියෙන් ධර්මයක් දේශනා කරණසේක්වා. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා තනිව ජනයාගෙන් වෙන්ව අප්‍රමාදව කෙලෙස් තවන වීර්යයෙන් යෙදී ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නෙමි" යනුයි.

3. "රාධය, යම් ඒ මාරයෙක් වෙයිද, එහි ඔබගේ ඡන්දය (කැමැත්ත) දුරු කටයුතුයි. රාධය, මාරයා නම් කවරේද?

"රාධය රූපය මාරයෙකි. එහි ඔබගේ කැමැත්ත දුරු කළ යුතුය. වේදනාව මාරයෙකි. එහි ඔබගේ කැමැත්ත දුරු කළ යුතුය. සංඥාව මාරයෙකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. සංස්කාරයෝ මාරයෙකි. එහි ඔබගේ කැමැත්ත දුරු කළ යුතුයි. විඤ්ඤාණය මාරයෙකි. එහි ඔබගේ කැමැත්ත දුරු කළ යුතුයි. රාධය, යම් ඒ මාරයෙක් වෙයිද, එහි ඔබගේ කැමැත්ත දුරු කළ යුතුයයි" වදාළේය.

**(පළමුවෙනි මාර සූත්‍රය (1) නිමි.)**

---

## 1. මාර සූත්‍රය. (2)

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හිඳගත්තේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මට කෙටියෙන් ධර්මයක් දේශනා කරණ සේක්වා. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා තනිව ජනයාගෙන් වෙන්ව අප්‍රමාදව කෙළෙස් තවන වීර්යයෙන් යෙදී ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නෙමි" යනුයි.

3. "රාධය, යම් ඒ මාරයෙක් වෙයිද, එහි ඔබගේ රාගය (ඇල්ම) දුරුකළ යුතුය. රාධය, මාරයා නම් කවරේද?

"රාධය රූපය මාරයෙකි. එහි ඔබගේ ඇල්ම දුරුකළ යුතුයි. වේදනාව මාරයෙකි. එහි ඔබගේ ඇල්ම දුරුකළ යුතුයි. සංඥාව මාරයෙකි. එහි ඔබගේ ඇල්ම දුරුකළ යුතුයි. සංස්කාරයෝ මාරයෙකි. එහි ඔබගේ ඇල්ම දුරුකළයුතුයි. විඥානය මාරයෙකි.

එහි ඔබගේ ඇල්ම දුරු කළ යුතුයි. රාධය, යම් ඒ මාරයෙක් වෙයිද, එහි ඔබගේ ඇල්ම දුරු කළ යුතුයයි” වදාළේය.

**(පළමුවෙනි මාර සූත්‍රය (2) නිමි.)**

---

## 1. මාර සූත්‍රය. (3)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හිඳගත්තේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. “ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මට කෙටියෙන් ධර්මයක් දේශනා කරණ සේක්වා. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා තනිව, ජනයාගෙන් වෙන්ව, අප්‍රමාදව කෙලෙස් තවන වීර්යයෙන් යෙදී, ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නෙමි” යනුයි.

3. “රාධය, යම් ඒ මාරයෙක් වෙයිද, එහි ඔබගේ ඡන්ද රාගය (බලවත් ඇල්ම) දුරු කළ යුතුයි.

“රාධය, මාරයා නම් කවරේද?”

“රාධය, රූපය මාරයෙකි. එහි ඔබගේ බලවත් ඇල්ම දුරු කළයුතුය. වේදනාව මාරයෙකි. එහි ඔබගේ බලවත් ඇල්ම දුරුකළ යුතුය. සංඥාව මාරයෙකි. එහි ඔගේ බලවත් ඇල්ම දුරු කළ යුතුය. සංස්කාර මාරයෙකි. එහි ඔබගේ බලවත් ඇල්ම දුරුකළ යුතුය. විඤ්ඤාණය මාරයෙකි. එහි ඔබගේ බලවත් ඇල්ම දුරුකළ යුතුය. රාධය, යම් ඒ මාරයෙක් වෙයිද, එහි ඔබගේ බලවත් ඇල්ම දුරුකළ යුතුයයි වදාළේය.

**(පළමුවෙනි මාර සූත්‍රය (3) නිමි.)**

---

## 2. මාර ධර්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මට කෙටියෙන් ධර්මයක් දේශනා කරන සේක්වා. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා, තනිව වෙන්ව, අප්‍රමාදව, කෙලෙස් තවන වීර්යයෙන් යෙදී, ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නෙමි" යනුයි.

3. "රාධය, යම් ඒ මාර ධර්මයක් වේද? එහි ඔබගේ කැමැත්ත පහකළයුතුයි. එහි ඔබගේ ඇල්ම දුරුකළයුතුයි. එහි ඔබගේ බලවත් ඇල්ම දුරුකළ යුතුයි.

"රාධය, මාර ධර්මය නම් කවරේද?"

"රූපය මාර ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත පහකළ යුතුය. ඇල්ම පහකළ යුතුය. බලවත් ඇල්ම පහකළ යුතුය. වේදනාව මාර ධර්මයකි, එහි ඔබගේ කැමැත්ත පහකළ යුතුය. ඇල්ම පහකළ යුතුය. බලවත් ඇල්ම පහකළ යුතුය. සංඥාව මාර ධර්මයකි, එහි ඔබගේ කැමැත්ත පහකළ යුතුය. ඇල්ම පහකළ යුතුය. බලවත් ඇල්ම පහකළ යුතුය. සංස්කාර මාර ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත පහකළ යුතුය. ඇල්ම පහකළ යුතුය. බලවත් ඇල්ම පහකළ යුතුය. විඤ්ඤාණය මාර ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත පහකළ යුතුය. ඇල්ම පහකළ යුතුයි. බලවත් ඇල්ම පහකළ යුතුයයි වදාළේය.

**(දෙවෙනි මාර ධර්ම සූත්‍රය නිමි.)**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 3. අනිත්‍ය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කාලයක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මට කෙටියෙන් ධර්මයක් දේශනා කරන සේක්වා. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා තනිව, ජනයාගෙන් වෙන්ව, අප්‍රමාදව, කෙලෙස් තවන වීර්යයෙන් යෙදී, ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නෙමි"යනුයි,

3. රාධය, යමක් අනිත්‍යද එහි ඔබගේ කැමැත්ත දුරු කළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය.

"රාධය, අනිත්‍යය නම් කුමක්ද?

"රාධය, රූපය අනිත්‍යය, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුයි, ඇල්ම දුරුකළ යුතුයි. බලවත් ඇල්ම දුරුකළ යුතුයි. වේදනාව අනිත්‍යය, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුයි. ඇල්ම දුරුකළ යුතුයි, බලවත් ඇල්ම දුරුකළ යුතුයි. සංඥාව අනිත්‍යය, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුයි. ඇල්ම දුරු කළ යුතුයි. බලවත්ඇල්ම දුරුකළ යුතුයි. සංස්කාර අනිත්‍යය, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුයි. ඇල්ම දුරුකළ යුතුයි. බලවත් ඇල්ම දුරුකළ යුතුයි. විඥ්ඥාණය අනිත්‍යය, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුයි. ඇල්ම දුරුකළ යුතුයි. බලවත් ඇල්ම දුරුකළ යුතුයි. රාධය, යම් ඒ අනිත්‍යයක් වේද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුයි. ඇල්ම දුරු කළ යුතුයි. බලවත් ඇල්ම දුරුකළ යුතුයි" වදාළේය.

**(තුන්වෙනි අනිත්‍ය සූත්‍රය නිමි.)**

---

# 4. අනිත්‍ය ධර්ම සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හුන්නේය.

2. "එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මට කෙටියෙන් ධර්මයක් දෙශනා කරණ සේක්වා. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා තනිව ජනයාගෙන් වෙන්ව අප්‍රමාදව කෙලෙස් තවන වීර්යයෙන් යෙදී ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නෙමි"යනුයි.

"රාධය, යම් ඒ අනිත්‍ය ධර්මයක්වේද, එහි ඔබගේ කැමැත්ත දුරුකළයුතුයි. ඇල්ම දුරුකළ යුතුයි. බලවත් ඇල්ම දුරුකළ යුතුයි.

3. "රාධය, අනිත්‍ය ධර්මය නම් කවරේද?

"රාධය, රූපය අනිත්‍ය ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුයි. ඇල්ම දුරුකළ යුතුයි. බලවත් ඇල්ම දුරු කළ යුතුයි. වේදනාව අනිත්‍ය ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුයි. ඇල්ම දුරුකළ යුතුයි. බලවත් ඇල්ම දුරුකළ යුතුයි. සංඥාව අනිත්‍ය ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුයි. ඇල්ම දුරුකළ යුතුයි. බලවත් ඇල්ම දුරුකළ යුතුයි. සංස්කාරය අනිත්‍ය ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුයි. ඇල්ම දුරුකළ යුතුයි. බලවත් ඇල්ම දුරුකළ යුතුයි. විඤ්ඤාණය අනිත්‍ය ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුයි. ඇල්ම දුරුකළ යුතුයි. බලවත් ඇල්ම දුරු කළ යුතුයි."

**(හතරවෙනි අනිත්‍ය ධර්ම සූත්‍රය නිමි.)**

---

# 5. දුක්ඛ සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මට කෙටියෙන් ධර්මයක් දෙශනා කරන සේක්වා. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා තනිව, ජනයාගෙන් වෙන්ව, අප්‍රමාදව, කෙලෙස් තවන වීර්යයෙන් යෙදී, ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නෙමි"යනුයි.

"රාධය, යම් ඒ දුකක් වෙයිද, එහි ඔබගේ කැමැත්ත දුරු කළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය.

3. "රාධය, දුක නම් කවරේද?"

"රාධය, රූපය දුකකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. වේදනාව දුකකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සඤ්ඤාව දුකකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සංස්කාරය දුකකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. විඤ්ඤාණය දුකකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. රාධය, යම් ඒ දුක්ඛ ධර්මයක් වේද, එහි ඔබගේ ඡන්ද රාගය දුරුකළ යුතුය.

**පස්වෙනි දුක්ඛ සූත්‍රය නිමි.**

## 6. දුක්ඛ ධර්ම සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මට කෙටියෙන් ධර්මයක් දෙශනා කරණ සේක්වා. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා, තනිව, ජනයාගෙන් වෙන්ව අප්‍රමාදව, කෙලෙස් තවන වීර්යයෙන් යෙදී, ආත්මපරිත්‍යාගයෙන් යුක්තව වාසය කරමි"යනුයි.

"රාධය, යම් ඒ දුක්ඛ ධර්මයක් වෙයිද, එහි ඔබගේ කැමැත්ත දුරුකළයුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය.

3. "රාධය, දුක්ඛ ධර්මය නම් කවරේද?

"රාධය රූපය දුක්ඛ ධර්මයකි එහි ඔබගේ කැමැත්ත දුරු කළයුතුය. ඇල්ම දුරුකළයුතුය. බලවත් ඇල්ම දුරුකළයුතුය. වේදනාව දුක්ඛ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සඤ්ඤාව දුක්ඛ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සංස්කාරය දුක්ඛ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. විඤ්ඤාණය දුක්ඛ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. රාධය, යම් ඒ දුක්ඛ ධර්මයක් වේද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය."

**(හයවෙනි දුක්ඛ ධර්ම සූත්‍රය නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 7. අනාත්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මට කෙටියෙන් ධර්මයක් දෙශනා කරණ සේක්වා. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා, තනිව, ජනයාගෙන් වෙන්ව, අප්‍රමාදව, කෙලෙස් තවන වීර්යයෙන් යෙදී, ආත්මපරිත්‍යාගයෙන් යුක්තව වාසය කරමි" යනුයි.

"රාධය, යම් ඒ අනාත්මයක් වේද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය.

3. "රාධය, අනාත්මය නම් කවරේද?"

"රාධය රූපය අනාත්මය. එහි ඔබගේ කැමැත්ත දුරුකළයුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. වේදනාව අනාත්මය, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සඤ්ඤාව අනාත්මය. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සංස්කාරය අනාත්මය එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. විඤ්ඤාණය අනාත්මය එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. රාධය, යම් ඒ අනාත්මයක් වේද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය."

**(හත්වෙනි අනාත්ම සූත්‍රය නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

## 8. අනාත්ම ධර්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මට කෙටියෙන් ධර්මයක් දෙශනා කරන සේක්වා. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා, තනිව, ජනයාගෙන් වෙන්ව අප්‍රමාදව, කෙලෙස් තවන වීර්යයෙන් යෙදී, ආත්මපරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නෙමි"යනුයි.

"රාධය, යම් ඒ අනාත්ම ධර්මයක් වෙයිද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය.

3. "රාධය, අනාත්ම ධර්මය නම් කවරේද?

"රාධය රූපය අනාත්ම ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළයුතුය. ඇල්ම දුරුකළයුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. වේදනාව අනාත්ම ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සඤ්ඤාව අනාත්ම ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සංස්කාරය අනාත්ම ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. විඤ්ඤාණය අනාත්ම ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. රාධය, යම් ඒ අනාත්ම ධර්මයක් වේද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය."

(අටවෙනි අනාත්ම ධර්ම සූත්‍රය නිමි.)

## 9. බය ධම්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මට කෙටියෙන් ධර්මයක් දෙශනා කරණ සේක්වා. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා, තනිව, ජනයාගෙන් වෙන්ව, අප්‍රමාදව, කෙලෙස් තවන වීර්යයෙන් යෙදී, ආත්මපරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නෙමි" යනුයි.

"රාධය, යම් ඒ විනාශවෙන ස්වභාවය ඇත්තක් වේද? එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය.

3. "රාධය, විනාශවන ස්වභාවය නම් කුමක්ද?"

"රාධය රූපය විනාශ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරු කළයුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. වේදනාව විනාශ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සඤ්ඤාව විනාශ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සංස්කාරය විනාශ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. විඤ්ඤාණය විනාශ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. රාධය, යම් ඒ විනාශ ධර්මයක් වේද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය."

**(නවවෙනි බය ධම්ම සූත්‍රය නිමි.)**

---

## 10. වයධම්ම සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මට කෙටියෙන් ධර්මයක් දෙශනා කරණසේක්වා. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා, තනිව, ජනයාගෙන් වෙන්ව, අප්‍රමාදව, කෙලෙස් තවන වීර්යයෙන් යෙදී, ආත්මපරිත්‍යාගයෙන් යුක්තව වාසය කරමි" යනුයි.

"රාධය, යම් ඒ නැතිවන ධර්මයක් වේද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය.

3. "රාධය, නැතිවන ධර්ම කවරේද?"

"රාධය රූපය නැතිවන ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරු කළයුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. වේදනාව නැතිවන ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සඤ්ඤාව නැතිවන ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සංස්කාරය නැතිවන ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. විඤ්ඤාණය නැතිවන ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. රාධය, යම් ඒ නැතිවන ධර්මයක් වේද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය."

(දහවෙනි වයධම්ම සූත්‍රය නිමි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 11. සමුදය ධර්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මට කෙටියෙන් ධර්මයක් දෙශනා කරණ සේක්වා. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා, තනිව, ජනයාගෙන් වෙන්ව, අප්‍රමාදව, කෙළෙස් තවන වීර්යයෙන් යෙදී, ආත්මපරිත්‍යාගයෙන් යුක්තව වාසය කරමි" යනුයි.

"රාධය, යම් ඒ හෙතුවෙන් හටගන්නා ස්වභාවය ඇති ධර්මයක් වේද? එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය.

3. "රාධය, හෙතුවෙන් හටගන්නා ස්වභාවය ඇති ධර්මය කවරේද?"

"රාධය රූපය හෙතුවෙන් හටගන්නා ස්වභාවය ඇති ධර්මයකි එහි ඔබගේ කැමැත්ත දුරු කළයුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. වේදනාව හෙතුවෙන් හටගන්නා ස්වභාවය ඇති ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සඤ්ඤාව හෙතුවෙන් හටගන්නා ස්වභාවය ඇති ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සංස්කාරය හෙතුවෙන් හටගන්නා ස්වභාවය ඇති ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. විඤ්ඤාණය හෙතුවෙන් හටගන්නා ස්වභාවය ඇති ධර්මයකි එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම

දුරුකළ යුතුය. රාධය, යම් ඒ හෙතුවෙන් හටගන්නා ස්වභාවය ඇති ධර්මයක් වේද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය.”

(එකොළොස්වෙනි සමුදය ධර්ම සූත්‍රය නිමි.)

---

## 12. නිරොධ ධර්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. “ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මට කෙටියෙන් ධර්මයක් දෙශනා කරණ සේක්වා. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා, තනිව, ජනයාගෙන් වෙන්ව, අප්‍රමාදව, කෙළෙස් තවන වීර්යයෙන් යෙදී, ආත්මපරිත්‍යාගයෙන් යුක්තව වාසය කරමි” යනුයි.

“රාධය, යම් නිරුද්ධවන ස්වභාවය ඇති ධර්මයක් වේද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය.

3. “රාධය, නිරුද්ධවන ස්වභාවය ඇති ධර්මය නම් කවරේද?”

“රාධය රූපය නිරොධ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරු කළයුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. වේදනාව නිරොධ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සඤ්ඤාව නිරොධ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය.

සංස්කාරය නිරොධ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. විඤ්ඤාණය නිරොධ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. රාධය, යම් ඒ නිරුද්ධ ධර්මයක් වේද? එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය යනුයි.

(දොළොස්වෙනි නිරොධ ධර්ම සූත්‍රය නිමි.)

---

**මාර සූත්‍රය, මාර ධර්ම සූත්‍රය, අනිත්‍ය සූත්‍ර දෙක, දුක්ඛ සූත්‍ර දෙක, අනාත්ම සූත්‍ර දෙක, ඛයධම්ම සූත්‍රය, වයධම්ම සූත්‍රය, සමුදයධම්ම සූත්‍රය සහ නිරොධධම්ම සූත්‍රයදැයි මේ වර්ගයෙහි සූත්‍ර දොළසකි.**

**තුන්වෙනි ආයාචන වර්ගයයි.**

# 4. උපනිසින්න වර්ගය.

## 1. මාර සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2. "රාධය, යම් ඒ මාරයෙක් වේද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුයි. රාධය, මාරයා නම් කවරේද?

"රාධය, රූපය මාරයෙකි. එහි ඔබගේ කැමැත්ත දුරු කළ යුතුය. වේදනාව මාරයෙකි. එහි ඔබගේ කැමැත්ත දුරු කළ

යුතුය. සංඥාව මාරයෙකි. එහි ඔබගේ කැමැත්ත දුරු කළ යුතුය. සංස්කාර මාරයෙකි. එහි ඔබගේ කැමැත්ත දුරු කළ යුතුය. විඤ්ඤාණය මාරයෙකි. එහි ඔබගේ කැමැත්ත දුරු කළ යුතුයි” යනුයි.

3. “එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

“රාධය, යම් ඒ මාරයෙක් වේද? එහි ඔබගේ ඇල්ම දුරුකළ යුතුය. රාධය, මාරයා නම් කවරේද?

“රාධය, රූපය මාරයෙකි එහි ඔබගේ ඇල්ම දුරුකළ යුතුය. වේදනාව මාරයෙකි. එහි ඔබගේ ඇල්ම දුරුකළ යුතුය. සංඥාව මාරයෙකි එහි ඔබගේ ඇල්ම දුරුකළ යුතුය. සංස්කාර මාරයෙකි. එහි ඔබගේ ඇල්ම දුරුකළ යුතුය. විඤ්ඤාණය මාරයෙකි. එහි ඔබගේ ඇල්ම දුරුකළ යුතුයි” යනුයි.

4. “එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

“රාධය යම් ඒ මාරයෙක් වෙයිද? එහි ඔබගේ බලවත් ඇල්ම දුරුකළ යුතුයි. රාධය, මාරයා නම් කවරේද?

රාධය, රූපය මාරයෙකි. එහි ඔබගේ බලවත් ඇල්ම දුරු කළ යුතුයි. වේදනාව මාරයෙකි. එහි ඔබගේ බලවත් ඇල්ම දුරුකළ යුතුයි. සංඥාව මාරයෙකි. එහි ඔබගේ බලවත් ඇල්ම දුරුකළ යුතුයි. සංස්කාර මාරයෙකි. එහි ඔබගේ බලවත් ඇල්ම දුරුකළ යුතුයි. විඤ්ඤාණය මාරයෙකි. එහි ඔබගේ බලවත් ඇල්ම දුරුකළ යුතුයි” යනුයි.

**(පළමුවෙනි මාර සූත්‍රය නිමි.)**

---

## 2. මාර ධම්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින්

කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ මෙසේ කීය.

"රාධය, යම් ඒ මාර ධර්මයෙක් වෙයිද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරු කළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. රාධය, මාර ධර්මය නම් කවරේද?

3. "රාධය, රූපය මාරධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරු කළ යුතුය. ඇල්ම දුරු කළ යුතුය. බලවත් ඇල්ම දුරු කළ යුතුය. වේදනාව මාර ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරු කළ යුතුය. බලවත් ඇල්ම දුරු කළ යුතුය. සංඥාව මාරධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරු කළ යුතුය. බලවත් ඇල්ම දුරු කළ යුතුය. සංස්කාර මාරධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. විඤ්ඤාණය මාරධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරු කළ යුතුය. ඇල්ම දුරු කළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය" යනුයි.

**(දෙවෙනි මාරධම්ම සූත්‍රය නිමි.)**

---

## 3. අනිච්ච සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක හිඳගත්තේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

2. "රාධය, යමක් අනිත්‍යද? එහි ඔබගේ කැමැත්ත දුරු කළයුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරු කළ යුතුය. රාධය, අනිත්‍ය නම් කවරේද?

"රාධය, රූපය අනිත්‍යය. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරු කළ යුතුය. වේදනාව අනිත්‍යය. එහි ඔබගේ කැමැත්ත දුරු කළ යුතුය. ඇල්ම දුරු කළ යුතුය. බලවත් ඇල්ම දුරු කළ යුතුය. සංඥාව අනිත්‍යය. එහි ඔබගේ කැමැත්ත දුරු කළ යුතුය. ඇල්ම දුරු කළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සංස්කාර අනිත්‍යය. එහි ඔබගේ කැමැත්ත දුරු කළ යුතුය. ඇල්ම දුරු කළ යුතුය. බලවත් ඇල්ම දුරු කළ යුතුය. විඤ්ඤාණය අනිත්‍යය. එහි ඔබගේ කැමැත්ත දුරු කළ යුතුය. ඇල්ම දුරු කළ යුතුය. බලවත් ඇල්ම දුරු කළ යුතුය" යනුයි.

**(තුන්වෙනි අනිච්ච සූත්‍රය නිමි.)**

---

## 4. අනිච්ච ධම්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක හිඳගත්තේය. එක්පසෙක හිඳගත් රාධ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

"රාධය, යම් ඒ අනිත්‍ය ධර්මයක් වේද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුයි. ඇල්ම දුරු කළ යුතුයි. බලවත් ඇල්ම දුරුකළ යුතුයි. රාධය, අනිත්‍ය ධර්මය නම් කවරේද?

"රාධය, රූපය අනිත්‍ය ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරු කළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරු කළ යුතුය. වේදනාව අනිත්‍ය ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

කළ යුතුය. ඇල්ම දුරු කළ යුතුය. බලවත් ඇල්ම දුරු කළ යුතුය. සංඥාව අනිත්‍ය ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරු කළ යුතුය. ඇල්ම දුරු කළ යුතුය. බලවත් ඇල්ම දුරු කළ යුතුය. සංස්කාර අනිත්‍ය ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. විඤ්ඤාණය අනිත්‍ය ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරු කළ යුතුය. ඇල්ම දුරු කළ යුතුය. බලවත් ඇල්ම දුරු කළ යුතුය" යනුයි.

**(හතරවෙනි අනිච්ච ධම්ම සූත්‍රය නිමි.)**

---

## 5. දුක්ඛ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

2. "රාධය, යම් ඒ දුකක් වෙයිද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරු කළ යුතුය.

3. "රාධය, දුක නම් කවරේද?"

"රාධය, රූපය දුකකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. වේදනාව දුකකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සඤ්ඤාව දුකකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සංස්කාරය දුකකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. විඤ්ඤාණය දුකකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. රාධය, යම්

ඒ දුක්ඛ ධර්මයක් වේද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය, ඇල්ම දුරුකළ යුතුය, බලවත් ඇල්ම දුරුකළ යුතුය.

**(පස්වෙනි දුක්ඛ සූත්‍රය නිමි.)**

---

## 6. දුක්ඛ ධර්ම සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් රාධ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

**2.** "රාධය, යම් ඒ දුක්ඛ ධර්මයක් වෙයිද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය.

**3.** "රාධය, දුක්ඛ ධර්මය නම් කවරේද?"

"රාධය, රූපය දුක්ඛ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළයුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. වේදනාව දුක්ඛ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සඤ්ඤාව දුක්ඛ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සංස්කාරය දුක්ඛ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. විඤ්ඤාණය දුක්ඛ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. රාධය, යම් ඒ දුක්ඛ ධර්මයක් වේද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය."

**(හයවෙනි දුක්ඛ ධර්ම සූත්‍රය නිමි.)**

---

## 7. අනාත්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

2. "රාධය, යම් ඒ අනාත්මයක් වෙයිද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය.

3. "රාධය, අනාත්මය නම් කවරේද?"

"රාධය, රූපය අනාත්මය. එහි ඔබගේ කැමැත්ත දුරු කළයුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. වේදනාව අනාත්මය, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සඤ්ඤාව අනාත්මය එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සංස්කාරය අනාත්මය එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. විඤ්ඤාණය අනාත්මය. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. රාධය, යම් ඒ අනාත්මයක් වේද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය."

**(හත්වෙනි අනාත්ම සූත්‍රය නිමි.)**

---

## 8. අනාත්ම ධර්ම සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින්

කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

**2.** "රාධය, යම් ඒ අනාත්ම ධර්මයක් වේද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය.

3. "රාධය, අනාත්ම ධර්මය නම් කවරේද?"

"රාධය, රූපය අනාත්ම ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරු කළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. වේදනාව අනාත්ම ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සඤ්ඤාව අනාත්ම ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සංස්කාරය අනාත්ම ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. විඤ්ඤාණය අනාත්ම ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. රාධය, යම් ඒ අනාත්ම ධර්මයක් වේද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය."

**(අටවෙනි අනාත්ම ධර්ම සූත්‍රය නිමි.)**

---

## 9. බය ධම්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

2. "රාධය, යම් ඒ විනාශවන ස්වභාවය ඇත්තක් වේද? එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය.

3. "රාධය, විනාශවන ස්වභාවය නම් කවරේද?"

"රාධය, රූපය විනාශ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරු කළයුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. වේදනාව විනාශ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සඤ්ඤාව විනාශ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සංස්කාරය විනාශ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. විඤ්ඤාණය විනාශ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. රාධය, යම් ඒ විනාශ ධර්මයක් වේද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය."

**(නවවෙනි ඛය ධම්ම සූත්‍රය නිමි.)**

---

## 10. වය ධම්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

2. "රාධය, යම් ඒ නැතිවන ධර්මයක් වේද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය.

3. "රාධය, නැතිවන ධර්ම කවරේද?"

"රාධය, රූපය නැතිවන ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරු කළයුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. වේදනාව නැතිවන ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සඤ්ඤාව නැතිවන ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සංස්කාරය නැතිවන ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. විඤ්ඤාණය නැතිවන ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. රාධය, යම් ඒ නැතිවන ධර්මයක් වේද? එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය."

**(දහවෙනි වය ධම්ම සූත්‍රය නිමි.)**

---

## 11. සමුදය ධර්ම සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

2. "රාධය, යම් ඒ හෙතුවෙන් හටගන්නා ස්වභාවය ඇති ධර්මයක් වේද? එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය.

3. "රාධය, හෙතුවෙන් හටගන්නා ස්වභාවය ඇති ධර්මය කවරේද?"

"රාධය, රූපය හෙතුවෙන් හටගන්නා ස්වභාවය ඇති ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරු කළයුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. වේදනාව හෙතුවෙන් හටගන්නා ස්වභාවය ඇති ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සඤ්ඤාව හෙතුවෙන් හටගන්නා ස්වභාවය ඇති ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සංස්කාරය හෙතුවෙන් හටගන්නා ස්වභාවය ඇති ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. විඤ්ඤාණය හෙතුවෙන් හටගන්නා ස්වභාවය ඇති ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. රාධය, යම් ඒ හෙතුවෙන් හටගන්නා ස්වභාවය ඇති ධර්මයක් වේද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය."

**(එකොළොස්වෙනි සමුදය ධර්ම සූත්‍රය නිමි.)**

---

## 12. නිරොධ ධර්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් රාධ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

2. "රාධය, යම් ඒ නිරුද්ධවන ස්වභාවය ඇති ධර්මයක් වේද, එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය.

3. "රාධය, නිරුද්ධවන ස්වභාවය ඇති ධර්මය නම් කවරේද?"

"රාධය, රූපය නිරොධ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරු කළයුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. වේදනාව නිරොධ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සඤ්ඤාව නිරොධ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. සංස්කාරය නිරොධ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. විඤ්ඤාණය නිරොධ ධර්මයකි. එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය. රාධය, යම් ඒ නිරොධ ධර්මයක් වේද? එහි ඔබගේ කැමැත්ත දුරුකළ යුතුය. ඇල්ම දුරුකළ යුතුය. බලවත් ඇල්ම දුරුකළ යුතුය."

**(දොළොස්වෙනි නිරොධ ධර්ම සූත්‍රය නිමි.)**

---

**මාර සූත්‍රය, මාර ධම්ම සූත්‍රය, අනිච්ච සූත්‍ර දෙක, දුක්ඛ සූත්‍ර දෙක, අනත්ත සූත්‍ර දෙක, ඛය ධම්ම සූත්‍රය, වය ධම්ම සූත්‍රය, සමුදයධම්ම සූත්‍රය සහ නිරොධ ධම්ම සූත්‍රයදැයි මේ වර්ගයෙහි සූත්‍ර දොළසකි.**

**හතරවෙනි උපනිසින්න වර්ගයයි.**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# දිට්ඨි සංයුත්තය.

## සොයෙව පෙය්‍යාල වර්ගය

### 1. වාත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, වාතයෝ නොහමත්. ගංගාවෝ ගලා නොබසිත්, ගර්භනීහු නොවදත්. චන්ද්‍ර සූර්යයෝ උදානොවෙත්. නොබසිත්. ඉන්ද්‍ර බීලයක් මෙන් නිශ්චලව සිටිත් යන මෙබඳු දෘෂ්ටිය කුමක් ඇති කල්හි කුමක් නිසා කුමක් වැද්දගෙන උපදීද?

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ ප්‍රභවකොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිහිටකොට ඇත්තාහ. ස්වාමීනි මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ සේක් නම් මැනවි භාග්‍යවතුන් වහන්සේගෙන් අසා ඒ අර්ථය භික්ෂූහු දැනගන්නාහුය.

3. "මහණෙනි, එසේ නම් අසව්. මනාකොට මෙනෙහි කරව් කියන්නෙ මැයි" කීය.

"ස්වාමීනි, එසේයයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය, "මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපයට පිවිස වාතයෝ නොහමත්. ගංගාවෝ ගලා නොබසිත්. ගර්භනීහු නොවදත්. චන්ද්‍ර සූර්යයෝ

උදානොවෙත්. නොබසිත්. ඉන්ද්‍රඛීලය මෙන් නිසලව සිටිත් යන මෙබඳු දෘෂ්ටිය උපදිත්. වේදනාව ඇති කල්හි වේදනාව නිසා වේදනාවට පිවිස වාතයෝ නොහමත්, ගංගාවෝ ගලා නොබසිත්, ගර්භනීහු නොවදත්, චන්ද්‍ර සූර්යයෝ උදානොවෙත්, නොබසිත්, ඉන්ද්‍රඛීලය මෙන් නිසලව සිටිත් යන මෙබඳු දෘෂ්ටිය උපදයි. සංඥාව ඇතිකල්හි සංඥාව නිසා සංඥාවට පිවිස වාතය නොහමත්, ගංගාවෝ ගලා නොබසිත්, ගර්භනීහු නොවදත්, චන්ද්‍ර සූර්යයෝ උදානොවෙත්. නොබසිත්. ඉන්ද්‍රඛීලය මෙන් නිසලව සිටිත් යන මෙබඳු දෘෂ්ටිය උපදියි. සංස්කාරයන් ඇති කල්හි සංස්කාරයන් නිසා සංස්කාරයන්ට පිවිස වාතයෝ නොහමත්. ගංගාවෝ ගලා නොබසිත්. ගර්භනීහු නොවදත්. චන්ද්‍ර සූර්යයෝ උදානොවෙත්. නොබසිත්. ඉන්ද්‍රඛීලය මෙන් නිසලව සිටිත් යන මෙබඳු දෘෂ්ටිය උපදියි. විඥානය ඇති කල්හි විඥානය නිසා විඥානයට පිවිස වාතය නොහමත්, ගංගාවෝ ගලා නොබසිත්, ගර්භනීහු නොවදත්, චන්ද්‍ර සූර්යයෝ උදානොවෙත්. නොබසිත්. ඉන්ද්‍රඛීලය මෙන් නිසලව සිටිත් යන දෘෂ්ටිය උපදියි.

"මහණෙනි, ඒ කුමකැයි හඟිව්ද? රූපය නිත්‍ය හෝ වේද? අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකයි."

4. "යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද? ඒ රූපය නොගෙන වාතයෝ නොහමත්, ගංගාවෝ ගලා නොබසිත්. ගර්භනීහු නොවදත්, චන්ද්‍ර සූර්යයෝ උදානොවෙත්. නොබසිත්. ඉන්ද්‍රඛීලය මෙන් නිශ්චලව සිටිත් යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"වේදනාව නිත්‍ය හෝ වේද? අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද? එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද වෙනස්වන ස්වභාවද? ඒ වේදනාව නොගෙන වාතයෝ නොහමත්, ගංගාවෝ ගලා නොබසිත්, ගර්භනීහු නොවදත්. චන්ද්‍ර සූර්යයෝ උදා නොවෙත්, නොබසිත්, ඉන්ද්‍රඛීලය මෙන් නිශ්චලව සිටිත් යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"සංඥාව නිත්‍ය හෝ වේද? අනිත්‍යය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද? ඒ සංඥාව නොගෙන වාතයෝ නොහමත්, ගංගාවෝ ගලා නොබසිත්. ගර්භනීහු නොවදත්, චන්ද්‍ර සූර්යයෝ උදා නොවෙත්, නොබසිත්. ඉන්ද්‍රඛීලය මෙන් නිශ්චලව සිටිත් යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"සංස්කාර නිත්‍ය හෝ වේද? අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන සුලුද, ඒ සංස්කාරයෝ නොගෙන වාතයෝ නොහමත්, ගංගාවෝ ගලානොබසිත්, ගර්භනීහු නොවදත්, චන්ද්‍ර සූර්යයෝ උදා නොවෙත්. නොබසිත්. ඉන්ද්‍රඛීලය මෙන් නිශ්චලව සිටිත් යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"විඥානය නිත්‍යය හෝ වෙයිද, අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද? එය දුක් හෝ වෙයිද? සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් අනිත්‍යයද, දුක්ද, වෙනස්වන ස්වභාවද? එය විඥානය අල්වා නොගෙන වාතයෝ නොහමත්. ගංගාවෝ ගලා

නොබසිත්. ගර්භනීහු නොවදත්. චන්ද්‍ර සූර්යයෝ උදා නොවෙත්. නොබසිත්. ඉන්ද්‍රඛීලය මෙන් නිශ්චලව සිටිත් යන මෙබඳු දෘෂ්ටියක් උපදන්නේද?" - "ස්වාමීනි, එය නූපදින්නේමය."

**5.** ඇසින් දක්නා ලද කණින් අසන ලද නාසය දිව කය තුනෙන් දැන ගන්නාලද, සිතින් දක්නා ලද, පැමිණෙන ලද, සොයන ලද, සිතින් විමසන ලද යම් ඒ දෙයක් වේද, එයද නිත්‍යය හෝ වෙයිද, අනිත්‍යය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක් හෝ වෙයිද, සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුක්ද, වෙනස්වන සුලුද, එය අල්වා නොගෙන වාතයෝ නොහමත්. ගංගාවෝ ගලා නොබසිත්. ගර්භනීහු නොවදත්. චන්ද්‍රසූර්යයෝ උදානොවෙත්. නොබසිත්. ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චලව සිටිත් යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, නූපදින්නේමය.

**6.** මහණෙනි, යම් තැනක පටන් ආර්ය ශ්‍රාවකයාහට මේ කරුණු සයෙහි සැක දුරුවූයේ වෙයිද, දුක්ඛයෙහිද, ඔහුගේ සැක දුරුවූයේ වෙයිද, දුක්ඛසමුදයෙහිද ඔහුගේ සැක දුරුවූයේ වෙයි. දුක්ඛනිරෝධයෙහිද ඔහුගේ සැක දුරුවූයේ වෙයි. දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදාවෙහිද ඔහුගේ සැක දුරුවූයේ වෙයි.

මහණෙනි, මේ ආර්ය ශ්‍රාවකතෙමේ සෝවාන් මාර්ගඵලයට පැමිණියෙකැයිද සතර අපායෙහි නොවැටීම ස්වභාවකොට ඇත්තෙකැයිද නියතවූ ගති ඇත්තෙකැයිද, අර්හත් ඵලය පිහිට කොට ඇත්තෙකැයිද කියනු ලැබේ.

**(පළමුවෙනි වාත සූත්‍රය නිමි.)**

---

## 2. ඒතං මම සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින්

කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, කුමක් ඇතිකල්හි කුමක් නිසා කුමකට පැමිණ 'මෙය මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්මයය, යන දෘෂ්ටිය උපදීද?" - "ස්වාමීනි අපගේ දහම් භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ ප්‍රභව කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිහිටකොට ඇත්තාහ. මේ කීමේ අදහස කුමක්ද? භාග්‍යවතුන් වහන්සේ වදාරන සේක්නම් මැනවි. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා අර්ථය භික්ෂූහු දැනගත්තාහුය."

"මහණෙනි, එසේනම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමැයි" කීය.

"ස්වාමීනි, එසේයයි," ඒ භික්ෂූහු, භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. "මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපයට පැමිණ 'මෙය මගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි, යන දෘෂ්ටිය උපදියි. වේදනාව ඇතිකල්හි, වේදනාව නිසා, වේදනාවට පැමිණ 'මෙය මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි' යන මේ දෘෂ්ටිය උපදියි. සංඥාව ඇතිකල්හි සංඥාව නිසා, සංඥාවට පැමිණ 'මෙය මගේය මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි' යන මේ දෘෂ්ටිය උපදියි. සංස්කාරයන් ඇතිකල්හි, සංස්කාරයන් නිසා. සංස්කාරයන්ට පැමිණ මෙය මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි' යන දෘෂ්ටිය උපදියි. විඤ්ඤාණය ඇතිකල්හි විඤ්ඤාණය නිසා, විඤ්ඤාණයට පැමිණ මෙය මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි යන දෘෂ්ටිය උපදියි.

4. "මහණෙනි, ඒ කුමකැයි හඟින්නහුද? රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකයි."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද? එය අල්වා නොගෙන 'මෙය මගේය. මෙය මම වෙමි, මේ මාගේ ආත්මයයි' යන දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එසේ නොවන්නේමය."

"වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද දුකද, වෙනස්වන ස්වභාවද, එය, අල්වා නොගෙන 'මෙය මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි' යන දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එසේ නොවන්නේමය."

"සංඥාව නිත්‍ය හෝ අනිත්‍යය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වෙයිද? - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද දුකද එය වෙනස්වන ස්වභාවද, එය අල්වානොගෙන 'මෙය මාගේය. මේ මම වෙමි මේ මාගේ ආත්මයයි' යන දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එසේ නොවන්නේමය."

"සංස්කාරයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද දුකද, වෙනස්වන ස්වභාවද, එය අල්වා නොගෙන 'මෙය මාගේය. මෙය මම වෙමි. මේ මාගේ ආත්මයයි' යන දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එසේ නොවන්නේමය."

"විඥාණය නිත්‍යය හෝ අනිත්‍යය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද වෙනස්වන ස්වභාවද, එය අල්වා නොගෙන 'මෙය මාගේය. මෙය මම වෙමි. මෙය මාගේ ආත්මයයි' යන දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එසේ නොවන්නේමය."

**5.** "ඇසින් දක්නාලද කණින් අසනලද නාසය දිව කය යන තුනෙන් දන්නාලද සිතින් පැමිණෙන ලද, සොයන ලද විමසන ලද යම් ඒ දෙයක්වේද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි අනිත්‍යය."

"යමක් අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද වෙනස්වෙන ස්වභාවද, එය අල්වා නොගෙන 'මෙය මාගේය, මෙය මම වෙමි. මෙය මාගේ ආත්මයය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එසේ නොවන්නේමය,"

**6.** "මහණෙනි, යම්තැනක පටන් ආර්යශ්‍රාවකයාහට මේ කරුණු සයෙහි සැක දුරුවූයේ වෙයිද, ඔහුට දුක්ඛයෙහිද සැකදුරුවූයේ වෙයි, දුක්ඛ සමුදයෙහිද සැක දුරුවූයේ වෙයි. දුක්ඛ නිරෝධයෙහිද සැක දුරුවූයේ වෙයි. දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදාවෙහිද සැක දුරුවූයේ වෙයි.

"මහණෙනි, මේ ආර්යශ්‍රාවක තෙමේ සෝවාන් මගපලට පැමිණියෙකැයිද, සතර අපායෙහි නොවැටීම ස්වභාවකොට ඇත්තෙකැයිද නියත ගති ඇත්තෙකැයිද අර්හත් ඵලය පිහිටකොට ඇත්තෙකැයිද කියනු ලැබේ."

**(දෙවෙනි එතං මම සූත්‍රය නිමි.)**

---

## 3. සො අත්තා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, කුමක් ඇතිකල්හි වනාහි කුමක් නිසා කුමකට පැමිණ මෙසේ 'ඒ මම ආත්මය වෙමි. ඒ මම ලොකය වෙමි. ඒ මම පරලොව්හි නිත්‍ය වූයේද, ස්ථිර වූයේද, සදාකාලික වූයේද, වෙනස්නොවන ස්වභාව' ඇත්තේද වන්නෙමි' යන මේ දෘෂ්ටිය උපදීද?

"ස්වාමීනි. අපගේ දහම් භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ ප්‍රභවකොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිහිටකොට ඇත්තාහ. මේ කීමේ අදහස කුමක්ද, භාග්‍යවතුන් වහන්සේ වදාරන සේක්නම් මැනවි. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා ඒ අර්ථය භික්ෂූහු දැනගන්නාහුය."

"මහණෙනි, එසේනම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමැයි" කීය.

"ස්වාමීනි, එසේයයි," ඒ භික්ෂූහු, භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. "මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපයට පැමිණ ඒ මම ආත්මය වෙමි. ඒ මම ලෝකය වෙමි. ඒ මම පරලෙව්හි නිත්‍යයද ඒකාන්තද සදාකාලිකද වෙනස් නොවීම ස්වභාවකොට ඇත්තේද, වන්නෙමි' යන මේ දෘෂ්ටිය උපදියි.

"වේදනාව ඇති කල්හි වේදනාව නිසා වේදනාවට පැමිණ 'ඒ මම ආත්මය වෙමි. ඒ මම ලෝකය වෙමි. ඒ මම පරලෙව්හි නිත්‍යද ඒකාන්තද සදාකාලිකද වෙනස් නොවීම ස්වභාවකොට ඇත්තේද වන්නෙමි, යන මේ දෘෂ්ටිය උපදියි.

"සඤ්ඤාව ඇති කල්හි සඤ්ඤාව නිසා සඤ්ඤාවට පැමිණ 'ඒ මම ආත්මය වෙමි. ඒ මම ලෝකය වෙමි. ඒ මම පරලෙව්හි නිත්‍යයද ඒකාන්තද සදාකාලිකද වෙනස් නොවීම ස්වභාව කොට ඇත්තේද වන්නෙමි' යන මේ දෘෂ්ටිය උපදියි."

"සංස්කාරයන් ඇති කල්හි සංස්කාරය නිසා සංස්කාරයට පැමිණ ඒ මම ආත්මය වෙමි. ඒ මම ලෝකය වෙමි. ඒ මම පරලෙව්හි නිත්‍යයද ඒකාන්තද සදාකාලිකද වෙනස් නොවීම ස්වභාව කොට ඇත්තේද වන්නෙමි යන මේ දෘෂ්ටිය උපදියි."

"විඤ්ඤාණය ඇතිකල්හි විඤ්ඤාණය නිසා විඤ්ඤාණයට පැමිණ 'ඒ මම ආත්මය වෙමි. ඒ මම ලොකය වෙමි. ඒ මම පරලෙව්හි නිත්‍යද ඒකාන්තද සදාකාලිකද වෙනස් නොවීම ස්වභාවකොට ඇත්තේද වන්නෙමි' යන මේ දෘෂ්ටිය උපදියි.

7. "මහණෙනි, ඒ කුමකැයි හඟිව්ද? රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ වෙයිද, සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකයි."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වීම ස්වභාවකොට ඇත්තේද එය අල්වා නොගෙන ඒ මම ආත්මය වෙමි. ඒ මම ලෝකය වෙමි. 'ඒ මම පරලෙව්හි නිත්‍යයද ස්ථිරද සදාකාලිකද නොවෙනස්වීම ස්වභාව කොට ඇත්තේද වන්නෙමි' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, නූපදින්නේමය."

"වේදනාව නිත්‍යය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වීම ස්වභාවකොට ඇත්තේද, එය අල්වා නොගෙන ඒ මම වෙමි. ඒ මම ලෝකය වෙමි. ඒ මම පරලෙව්හි නිත්‍යයද, ස්ථිරද, සදාකාලිකද

නොවෙනස්වීම ස්වභාවකොට ඇත්තේද වන්නෙමි' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, නූපදින්නේමය."

"සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ වෙයිද? සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද දුකද වෙනස්වීම ස්වභාවකොට ඇත්තේද? එය අල්වා නොගෙන 'ඒ මම ආත්මය වෙමි, ඒ මම ලෝකය වෙමි. ඒ මම පරලෙව්හි නිත්‍යයද ස්ථිරද සදාකාලිකද නොවෙනස්වීම ස්වභාවකොට ඇත්තේද වන්නෙමි' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, නූපදින්නේමය."

"සංස්කාරය නිත්‍යය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද? - "ස්වාමීනි, දුකයි."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වීම ස්වභාවකොට ඇත්තේද එය අල්වා නොගෙන 'ඒ මම ආත්මය වෙමි. ඒ මම ලෝකය වෙමි. ඒ මම පරලෙව්හි නිත්‍යයද ස්ථිරද සදාකාලිකද නොවෙනස්වීම ස්වභාව කොට ඇත්තේද වන්නෙමි' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, නූපදින්නේමය."

"විඤ්ඤාණය නිත්‍යය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද වෙනස්වීම ස්වභාවකොට ඇත්තේද එය අල්වා නොගෙන 'ඒ මම ආත්මය වෙමි. ඒ මම ලෝකය වෙමි. ඒ මම පරලෙව්හි නිත්‍යයද ඒකාන්තද සදාකාලිකද වෙනස්වීම ස්වභාව කොට ඇත්තේද වන්නෙමි' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, නූපදින්නේමය."

5. "ඇසින් දක්නාලද කණින් අසනලද නාසය දිව කය යන තුනෙන් දැනගන්නාලද සිතින් දක්නා ලද පැමිණෙනලද සොයන ලද විසෙන ලද යම් ඒ දෙයක් වේද, එයද නිත්‍යය හෝ අනිත්‍යය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍යයද, එය දුක් හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි දුකය."

"යමක් අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද එය අල්වා නොගෙන ඒ මම ආත්මය වෙමි. 'ඒ මම ලෝකය වෙමි. ඒ මම පරලෙව්හි නිත්‍යයද ඒකාන්තද සදාකාලිකද, වෙනස්නොවීම ස්වභාව කොට ඇත්තේද, වන්නෙමියි යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, නූපදින්නේමය."

"මහණෙනි, යම් තැනක පටන් ආර්යශ්‍රාවකයාහට මේ කරුණු සයෙහි සැක දුරුවූයේ වෙයිද, ඔහුට දුක්ඛයෙහිද සැකදුරුවූයේ වෙයිද, දුක්ඛ සමුදයෙහි සැක දුරුවූයේ වෙයිද, දුක්ඛ නිරෝධයෙහි සැක දුරුවූයේ වෙයිද, දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදාවෙහි සැක දුරුවූයේ වෙයි.

"මහණෙනි, මේ ආර්යශ්‍රාවකතෙමේ ශ්‍රොතාපත්ති මාර්ග ඵලයට පැමිණියෙකැයිද සතර අපායෙහි වැටීම ස්වභාවකොට ඇත්තෙකැයිද නියත ගති ඇත්තෙකැයිද, අර්හත් ඵලය පිහිටකොට ඇත්තෙකැයිද කියනු ලැබේ."

**(තුන්වෙනි සො අත්තා සූත්‍රය නිමි.)**

---

## 4. නො ච මෙසියා සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, කුමක් ඇතිකල්හි කුමක් නිසා කුමකට පැමිණ අතීතයෙහි නොවූයෙම් නම් මෙහි නොවෙමි. මෙහි නොවන්නෙම් නම් මතු නොවන්නෙමි යන දෘෂ්ටිය උපදීද?" - "ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ ප්‍රභව කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිහිටකොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ වදාරන සේක් නම් මැනවි. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා ඒ අර්ථය භික්ෂූහු දැනගන්නාහුය."

3. "මහණෙනි, එසේ නම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමැයි" කීය.

"ස්වාමීනි, එසේයයි," ඒ භික්ෂූහු, භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

"මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපයට පැමිණ අතීතයෙහි නුවූයේනම් මෙහි නොවෙමි. මෙහි නොවන්නෙම් නම් මතු නොවන්නෙමි යන මේ දෘෂ්ටිය උපදියි. වේදනාව ඇති කල්හි වේදනාව නිසා වේදනාවට පැමිණ අතීතයෙහි නුවූයේ නම් මෙහි නොවෙමි. මෙහි නොවන්නේ නම් මතු නොවන්නෙම් යන මේ දෘෂ්ටිය උපදියි. සංඥාව ඇති කල්හි සංඥාව නිසා සංඥාවට පැමිණ අතීතයෙහි නුවූයේ නම් මෙහි නොවෙමි. මෙහි නොවන්නෙම් නම් මතු නොවන්නෙමි යන මේ දෘෂ්ටිය උපදියි. සංස්කාරයන් ඇතිකල්හි සංස්කාරයන් නිසා සංස්කාරයන්ට පැමිණ අතීතයෙහි නුවූයේ නම් මෙහි නොවෙමි. මෙහි නොවන්නෙම් නම් මතු නොවන්නෙමි යන මේ දෘෂ්ටිය උපදියි. විඥානය ඇතිකල්හි විඥානය නිසා විඥානයට පැමිණ අතීතයෙහි නොවූයේ නම් මෙහි නොවෙමි. මෙහි නොවන්නෙම් නම් මතු නොවන්නෙමි යන මේ දෘෂ්ටිය උපදියි.

4. "මහණෙනි, ඒ කුමකැයි සිතන්නාහුද? රූපය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යයි."

"යමක් අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකයි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

"යමක් වනාහි අනිත්‍යයද, දුක්ද, වෙනස්වන ස්වභාවද එය අල්වා නොගෙන අතීතයෙහි නුවූයෙම් නම් දැන් නොවෙමි. දැන් නොවන්නෙමි නම් මතු නොවන්නෙමියි යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"වේදනාව නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි අනිත්‍යයි."

"යමක් අනිත්‍ය නම් එය දුකද සැපද" - "ස්වාමීනි, දුකයි."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය අල්වානොගෙන අතීතයෙහි නුවූයෙම්නම් දැන් නොවෙමි. දැන් නොවන්නෙම් නම් මතු නොවන්නෙමියි යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"සඤ්ඤාව නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යයි"

'යමක් අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකයි."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය අල්වානොගෙන අතීතයෙහි නුවූයෙම්නම් දැන් නොවෙමි. දැන් නොවන්නෙම් නම් මතු නොවන්නෙමියි යන මේ දෘෂ්ටිය උපදින්නාහුද?" - "ස්වාමීනි, එය නොවේමය."

"සංස්කාරය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යයි"

"යමක් අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකයි."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය අල්වා නොගෙන අතීතයෙහි නුවූයෙම්නම් දැන් නොවෙමි, දැන් නොවන්නෙම් නම් මතු නොවන්නෙමියි යන දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"විඤ්ඤාණය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යයි."

"යමක් අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය අල්වා නොගෙන අතීතයෙහි නුවූයෙම්නම් දැන් නොවෙමි, දැන් නොවන්නෙම් නම් මතු නොවන්නෙමියි යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

ඇසින් දක්නාලද කණින් අසන ලද නාසය දිව කය යන තුනෙන් දන්නා ලද සිතින් දන්නාලද සොයන ලද විමසනලද යම් දෙයක් වේද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, එය අල්වා නොගෙන අතීතයෙහි නුවූයෙම් නම් දැන් නොවෙමි, දැන් නොවන්නෙම් නම් මතු නොවන්නෙමියි යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේය."

"මහණෙනි, යම්තැනක පටන් ආර්යශ්‍රාවකයාහට මේ කරුණු සයෙහි සැක දුරුවූයේ වෙයිද, ඔහුට දුක්ඛයෙහිද සැක දුරුවූයේ වෙයි. ඔහුට දුක්ඛ සමුදයෙහි සැක දුරුවූයේ වෙයි. දුක්ඛ නිරෝධයෙහි සැක දුරුවූයේ වෙයි, ඔහුට දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදාආර්ය සත්‍යයෙහිද සැක දුරුවූයේ වෙයි.

"මහණෙනි, මේ ආර්ය ශ්‍රාවකතෙමේ සොතාපන්නයෙකැයිද, සතර අපායෙහි නොවැටීම ස්වභාවකොට ඇත්තෙකැයිද, නියත ගති ඇත්තෙකැයිද අර්හත් ඵලය පිහිටකොට ඇත්තෙකැයිද කියනු ලැබේ."

**(හතරවෙනි නො ච මෙසියා සූත්‍රය නිමි.)**

---

## 5. නත්ථි කරොථ සූත්‍රය (1)

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතුසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

**2.** "මහණෙනි; කුමක් ඇති කල්හි කුමක් නිසා කුමකට පැමිණ 'දානයෙහි විපාක නැත. කම්පල අදහා කරණ මහා යාගයන්හි විපාක නැත. පුදන ලද්දෙහි විපාක නැත. කුසලාකුසලයන්ගේ ඵල විපාක නැත. පරලොවක් නැත. මෙලොවක් නැත. මවක් නැත. පියෙක් නැත. ඕපපාතික සත්ත්වයෝ නැත. යමෙක් මෙලොවත් පරලොවත් යහපත් නුවණින් ප්‍රත්‍යක්ෂකොට දැනගනිත්ද, එබඳු යහපත් පැවතුම් ඇති, යහපත් ගති ඇති, මහණ බමුණෝ ලෙව්හි නැත. සතරමහාභූතයන්ගෙන් ඇතිවූ මේ පුරුෂතෙමේ යම්කලෙක කලුරිය කරයිද, එකල පඨවි ධාතුව, පඨවි ධාතුව අනුවයයි. ආපෝ ධාතුව, අපෝ ධාතුව අනුව යයි. තේජෝ ධාතුව, තේජෝ ධාතුව අනුව යයි. වායෝ ධාතුව, වායෝ ධාතුව අනුව යයි. සිත සවැනිකොට ඇති ඉන්ද්‍රියයෝ අහසට ගමන් කරත්. ඇඳ පස්වැනිකොට ඇති මළසිරුර පුරිසයන් සතර දෙනෙක් ගෙනයත්. ගුණාගුණ පදයෝ සොහොන්බිම තෙක් ප්‍රකට වෙත්. ඇට පරෙයිපත් පාට ඇති වෙත්. දෙනලද දානාදීන්ගේ ඵලය අලු කෙළවරකොට ඇත්තේ වෙයි. මේ දානය නම් බාලයන් විසින් පනවනලද ඔවුන්ගේ හිස්වූ සත්‍යයෙන් තොරවූ විලාපයකි. යමෙක් දුන් දෙයෙහි ඵල ඇතැයි කියත්ද, ඒ බාලයෝද, පණ්ඩිතයෝද, ශරීරයාගේ බිඳීමෙන් සිඳීමට යෙත් විනාශයට යෙත්. මරණින් මතු නූපදිත්' යන මේ දෘෂ්ටි උපදීද?"

"ස්වාමීනි, අපගේ දහම් භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නාකොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහ. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය. භික්ෂූහු ඒ අර්ථය භාග්‍යවතුන් වහන්සේගෙන් අසා දැනගත්තාහුය.

3. "මහණෙනි, එසේනම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමැයි" කීය.

"ස්වාමීනි, එසේයයි," ඒ භික්ෂූහු, භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

"මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපයට පැමිණ 'දෙනලද දෙයෙහි විපාක නැත. පුදනලද මහාදාන සංඛ්‍යාත මහායාගයන්ගේ විපාක නැත. පුදන ලද්දෙහි විපාක නැත. කුසලාකුසලයන්ගේ ඵල විපාක නැත. පරලොවක් නැත. මෙලොවක් නැත. මවෙක් නැත. පියෙක් නැත. ඕපපාතික සත්වයෝ නැත. යමෙක් මෙලොවත් පරලොවත් යහපත් නුවණින් ප්‍රත්‍යක්ෂකොට දැනගනිත්ද, එබඳු යහපත් පැවතුම් ඇති, යහපත් ගති ඇති, මහණ බමුණෝ ලෙව්හි නැත. සතරමහාභූතයන්ගෙන් ඇතිවූ මේ පුරිෂතෙමේ යම් කලෙක කලුරිය කරයිද, එකල පඨවි ධාතුව, පඨවි ධාතුව අනුව යයි. ආපෝ ධාතුව, ආපෝ ධාතුව අනුව යයි. තේජෝ ධාතුව, තේජෝ ධාතුව අනුව යයි. වායෝ ධාතුව, වායෝ ධාතුව අනුව යයි. සිත සවැනිකොට ඇති ඉන්ද්‍රියයෝ අහසට ගමන් කරත්. ඇඳ පස්වැනිකොට ඇති මළසිරුර පුරිසයන් සතර දෙනෙක් ගෙනයත්. ගුණාගුණ පදයෝ සොහොන්බිම තෙක් ප්‍රකට වෙත්. ඇට පරෙයිපත් පාට ඇති වෙත්. දෙන ලද දානාදීන්ගේ ඵලය අලු කෙළවරකොට ඇත්තේ වෙයි. මේ දානය නම් බාලයන් විසින් පනවනලද ඔවුන්ගේ හිස්වූ සත්‍යයෙන් තොරවූ විලාපයකි. යමෙක් දුන් දෙයෙහි ඵල ඇතැයි කියත්ද, ඒ බාලයෝද, පණ්ඩිතයෝද, ශරීරයාගේ බිඳීමෙන් සිඳෙත්, විනාශවෙත්, මරණින් මතු නොවෙත් හෙවත් නූපදිත් යන මේ දෘෂ්ටි උපදියි.

4. "වේදනාව ඇතිකල්හි වේදනාව නිසා වේදනාවට පැමිණ දෙනලද දෙයෙහි විපාක නැත. පුදනලද මහාදානසංඛ්‍යාත මහායාගයන්ගේ විපාක නැත. පුදන ලද්දෙහි විපාක නැත. කුසලාකුසලයන්ගේ ඵල විපාක නැත. පරලොවක් නැත. මෙලොවක් නැත. මවක් නැත. පියෙක් නැත, ඕපපාතික සත්ත්වයෝ නැත. යමෙක් මෙලොවත් පරලොවත් යහපත් නුවණින් ප්‍රත්‍යක්ෂකොට දැනගනිත්ද, එබඳු යහපත් පැවතුම් ඇති, යහපත් ගති ඇති, මහණ බමුණෝ ලෙව්හි නැත. සතරමහාභූතයන්ගෙන් ඇතිවූ මේ පුරිෂතෙමේ යම් කලෙක කලුරිය කරයිද, එකල පඨවි ධාතුව, පඨවි ධාතුව අනුව යයි

ආපෝ ධාතුව, ආපෝ ධාතුව අනුව යයි. තේජෝ ධාතුව තේජෝ ධාතුව අනුව යයි. වායෝ ධාතුව, වායෝ ධාතුව අනුව යයි. සිත සවැනිකොට ඇති ඉන්ද්‍රියයෝ අහසට ගමන් කරත්. ඇඳ පස්වැනිකොට ඇති මළසිරුර පුරිසයන් සතර දෙනෙක් ගෙනයත්. ගුණාගුණ පදයෝ සොහොන්බිම තෙක් ප්‍රකට වෙත්. ඇට පරෙයිපත් පාට ඇති වෙත්. දෙනලද දානාදීන්ගේ ඵලය අලු කෙළවරකොට ඇත්තේ වෙයි. මේ දානය නම් බාලයන් විසින් පනවනලද ඔවුන්ගේ හිස්වූ සත්‍යයෙන් තොරවූ විලාපයකි. යමෙක් දුන් දෙයෙහි ඵල ඇතැයි කියත්ද, ඒ බාලයෝද, පණ්ඩිතයෝද ශරීරයාගේ බිඳීමෙන් සිඳෙත්, විනාශ වෙත්, මරණින් මතු නොවෙත් හෙවත් නූපදිත්' යන මේ දෘෂ්ටි උපදියි.

5. "සංඥාව ඇති කල්හි සංඥාව නිසා සංඥාවට පැමිණ 'දෙන ලද දෙයෙහි විපාක නැත. පුදනලද මහාදාන සංඛ්‍යාත මහා යාගයන්ගේ විපාක නැත. පුදන ලද්දෙහි විපාක නැත. කුසලාකුසලයන්ගේ ඵල විපාක නැත. පරලොවක් නැත මෙලොවක් නැත. මවෙක් නැත. පියෙක් නැත. ඕපපාතික සත්ත්වයෝ නැත. යමෙක් මෙලොවත් පරලොවත් යහපත් නුවණින් ප්‍රත්‍යක්ෂකොට දැනගනිත්ද, එබඳු යහපත් පැවතුම් ඇති, යහපත් ගති ඇති, මහණ බමුණෝ ලෙව්හි නැත. සතරමහාභූතයන්ගෙන් ඇතිවූ මේ පුරිෂතෙමේ යම්කලෙක කලුරිය කරයිද, එකල පඨවි ධාතුව, පඨවි ධාතුව අනුව යයි ආපෝ ධාතුව, ආපෝ ධාතුව අනුව යයි. තේජෝ ධාතුව තේජෝ ධාතුව අනුව යයි. වායෝ ධාතුව, වායෝ ධාතුව අනුව යයි. සිත සවැනිකොට ඇති ඉන්ද්‍රියයෝ අහසට ගමන් කරත්. ඇඳ පස්වැනිකොට ඇති මළසිරුර පුරිසයන් සතර දෙනෙක් ගෙනයත්. ගුණාගුණ පදයෝ සොහොන්බිම තෙක් ප්‍රකට වෙත්. ඇට පරෙයිපත් පාට ඇති වෙත්. දෙනලද දානාදීන්ගේ ඵලය අලු කෙළවරකොට ඇත්තේ වෙයි. මේ දානය නම් බාලයන් විසින් පනවනලද ඔවුන්ගේ හිස්වූ සත්‍යයෙන් තොරවූ විලාපයකි. යමෙක් දුන් දෙයෙහි ඵල ඇතැයි කියත්ද, ඒ බාලයෝද, පණ්ඩිතයෝද, ශරීරයාගේ බිඳීමෙන් සිඳෙත්, විනාශවෙත්. මරණින් මතු නොවෙත් හෙවත් නූපදිත්' යන මේ දෘෂ්ටි උපදියි.

**6.** "සංස්කාරය ඇතිකල්හි සංස්කාරය නිසා සංස්කාරයට පැමිණ 'දෙනලද දෙයෙහි විපාක නැත. පුදනලද මහාදාන සංඛ්‍යාත මහායාගයන්ගේ විපාක නැත. පුදන ලද්දෙහි විපාක නැත. කුසලාකුසලයන්ගේ ඵල විපාක නැත. පරලොවක් නැත. මෙලොවක් නැත. මවෙක් නැත. පියෙක් නැත. ඕපපාතික සත්ත්වයෝ නැත. යමෙක් මෙලොවත් පරලොවත් යහපත් නුවණින් ප්‍රත්‍යක්ෂකොට දැනගනිත්ද, එබඳු යහපත් පැවතුම් ඇති, යහපත් ගති ඇති, මහණ බමුණෝ ලෙව්හි නැත. සතරමහාභූතයන්ගෙන් ඇතිවූ මේ පුරුෂතෙම යම් කලෙක කලුරිය කරයිද, එකල පඨවි ධාතුව, පඨවි ධාතුව අනුව යයි. ආපෝ ධාතුව, ආපෝ ධාතුව අනුව යයි. තේජෝ ධාතුව තේජෝ ධාතුව අනුව යයි. වායෝ ධාතුව, වායෝ ධාතුව අනුව යයි. සිත සවැනිකොට ඇති ඉන්ද්‍රියයෝ අහසට ගමන් කරත්. ඇඳ පස්වැනිකොට ඇති මළසිරුර පුරිසයන් සතර දෙනෙක් ගෙනයත්. ගුණාගුණ පදයෝ සොහොන් බිම තෙක් ප්‍රකට වෙත්. ඇට පරෙයි පත් පාට ඇතිවෙත්. දෙන ලද දානාදීන්ගේ ඵලය අලු කෙළවරකොට ඇත්තේ වෙයි. මේ දානය නම් බාලයන් විසින් පනවනලද ඔවුන්ගේ හිස්වූ සත්‍යයෙන් තොරවූ විලාපයකි. යමෙක් දුන් දෙයෙහි ඵල ඇතැයි කියත්ද, ඒ බාලයෝද, පණ්ඩිතයෝද, ශරීරයාගේ බිඳීමෙන් සිඳෙත්, විනාශවෙත්. මරණින් මතු නූපදිත් යන මේ දෘෂ්ටිය උපදියි."

**7.** "විඥානය ඇති කල්හි විඥානය නිසා විඥානයට පැමිණ දෙනලද දානයාගේ විපාක නැත. පුදනලද මහාදාන සංඛ්‍යාත යාගයාගේ විපාක නැත. පුදන ලද්දෙහි විපාක නැත. කුසලාකුසලයන්ගේ ඵල විපාක නැත. පරලොවක් නැත. මෙලොවක් නැත. මවෙක් නැත. පියෙක් නැත. ඕපපාතික සත්වයෝ නැත. යමෙක් මෙලොවත් පරලොවත් යහපත් නුවණින් ප්‍රත්‍යක්ෂකොට දැනගනිත්ද, එබඳු යහපත් පැවතුම් ඇති යහපත් ගති ඇති මහණ බමුණෝ ලෙව්හි නැත සතර මහාභූතයන්ගෙන් ඇතිවූ මේ පුරුෂතෙමේ යම් කලෙක කලුරිය කරයිද, එකල පඨවි ධාතුව, පඨවි ධාතුව අනුවයයි. ආපෝ ධාතුව, ආපෝ ධාතුව අනුවයයි. තේජෝ ධාතුව, තේජෝ ධාතුව

අනුවයයි. වායෝ ධාතුව, වායෝ ධාතුව අනුවයයි. සිත සවැනිකොට ඇති ඉන්ද්‍රියයෝ අහසට ගමන් කරත්. ඇඳ පස්වැනිකොට ඇති මළසිරුර පුරුෂයන් සතර දෙනෙක් ගෙනයත්. ගුණාගුණ පදයෝ සොහොන් බිම තෙක් ප්‍රකට වෙත්. ඇට පරෙයිපත් පාට ඇති වෙත්. දෙන ලද දානාදීන්ගේ ඵලය අලු කෙළවර කොට ඇත්තේ වෙයි. මේ දානය නම් බාලයන් විසින් පණවන ලද ඔවුන්ගේ හිස්වූ සත්‍යයෙන් තොරවූ විලාපයෙකි. යමෙක් දුන් දෙයෙහි ඵල ඇතැයි කියත්ද, ඒ බාලයෝද, පණ්ඩිතයෝද, ශරීරයාගේ බිඳීමෙන් සිඳෙත්. විනාශ වෙත්. මරණින් මතු නූපදිත්' යන මේ දෘෂ්ටිය උපදියි.

8. "මහණෙනි, ඒ කුමකැයි සිතව්ද? රූපය නිත්‍යය හෝ අනිත්‍යය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම්, එය දුකද? සැපද?" - 'ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද වෙනස්වන ස්වභාවද, එය දැඩි ලෙස නොගෙන 'දෙනලද දානයෙහි විපාක නැත. දෙන ලද යාග සංඛ්‍යාත මහාදානයෙහි විපාක නැත. පුදන ලද්දෙහි විපාක නැත. කුසලාකුසලයන්ගේ ඵල විපාක නැත. පරලොවක් නැත. මෙලොවක් නැත. මවෙක් නැත. පියෙක් නැත. ඕපපාතික සත්ත්වයෝ නැත. යමෙක් මෙලොවත් පරලොවත් යහපත් නුවණින් ප්‍රත්‍යක්ෂකොට දැනගනිත්ද, එබඳු යහපත් පැවතුම් ඇති, යහපත් ගති ඇති, මහණ බමුණෝ ලෙව්හි නැත. සතර මහා භූතයන්ගෙන් ඇතිවූ මේ පුරුෂතෙමේ යම් කලෙක කලුරිය කරයිද, එකල පඨවි ධාතුව, පඨවි ධාතුව අනුවයයි. ආපෝ ධාතුව, ආපෝ ධාතුව අනුවයි. තේජෝ ධාතුව, තේජෝධාතුව අනුවයයි. වායෝ ධාතුව, වායෝ ධාතුව අනුවයයි. සිත සවෙනිකොට ඇති ඉන්ද්‍රියයෝ අහසට ගමන් කරත්. ඇඳ පස්වෙනිකොට ඇති මළසිරුර පුරුෂයන් සතර දෙනෙක් ගෙනයත්. ගුණාගුණ පදයෝ සොහොන් බිමතෙක් ප්‍රකට වෙත්. ඇට පරෙයිපත් පාට ඇතිවෙත්. දෙන ලද දානාදීන්ගේ ඵලය අලු කෙළවරකොට ඇත්තේවෙයි. මේ දානය නම් බාලයන්

විසින් පනවන ලද ඔවුන්ගේ හිස්වූ සත්‍යයෙන් තොරවූ විලාපයකි. යමෙක් දුන් දෙයෙහි ඵල ඇතැයි කියත්ද, ඒ බාලයෝද, පණ්ඩිතයෝද, ශරීරයාගේ බිඳීමෙන් සිඳෙත්. විනාශ වෙත්, මරණින් මතු නූපදිත් යන මේ දෘෂ්ටි උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

**9.** "වේදනාව නිත්‍යය හෝ අනිත්‍යය හෝ වෙයිද?" - "ස්වාමීනි දුකය."

"යමක් වනාහි අනිත්‍ය නම්, එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩි ලෙස නොගෙන 'දෙනලද දානයෙහි විපාක නැත. දෙන ලද යාග සංඛ්‍යාත මහාදානයෙහි විපාක නැත. පුදන ලද්දෙහි විපාක නැත. කුසලාකුසලයන්ගේ ඵල විපාක නැත. පරලොවක් නැත. මෙලොවක් නැත. මවෙක් නැත. පියෙක් නැත. ඕපපාතික සත්ත්වයෝ නැත. යමෙක් මෙලොවත් පරලොවත් යහපත් නුවණින් ප්‍රත්‍යක්ෂකොට දැනගනිත්ද, එබඳු යහපත් පැවතුම් ඇති, යහපත් ගති ඇති, මහණ බමුණෝ ලෙව්හි නැත. සතර මහාභූතයන්ගෙන් ඇතිවූ මේ පුරුෂතෙමේ යම් කලෙක කලුරිය කරයිද, එකල පඨවි ධාතුව, පඨවිධාතුව අනුව යයි. ආපෝ ධාතුව, ආපෝ ධාතුව අනුව යයි. තේජෝ ධාතුව තේජෝ ධාතුව අනුව යයි. වායෝ ධාතුව, වායෝ ධාතුව අනුව යයි. සිත සවැනිකොට ඇති ඉන්ද්‍රියයෝ අහසට ගමන් කරත්. ඇඳ පස්වැනිකොට ඇති මළසිරුර සතර දෙනෙක් ගෙනයත්. ගුණාගුණ පදයෝ සොහොන් බිම තෙක් ප්‍රකට වෙත්. ඇට පරෙයිපත් පාට ඇති වෙත්. දෙනලද දානාදීන්ගේ ඵලය අලු කෙළවරකොට ඇත්තේ වෙයි. මේ දානය නම් බාලයන් විසින් පනවනලද ඔවුන්ගේ හිස්වූ සත්‍යයෙන් තොරවූ විලාපයකි. යමෙක් දුන් දෙයෙහි ඵල ඇතැයි කියත්ද ඒ බාලයෝද, පණ්ඩිතයෝද ශරීරයාගේ බිඳීමෙන් සිඳීමට යෙත්, විනාශයට යෙත්. මරණින් මතු නූපදිත්' යන මේ දෘෂ්ටි උපදින්නේද?" - "ස්වාමීනි. එය නොවන්නේමය."

**10.** "සංඥාව නිත්‍යය හෝ අනිත්‍යය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය,"

"යමක් වනාහි අනිත්‍ය නම්. එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, එයදැඩිලෙස නොගෙන දෙනලද දානයෙහි විපාක නැත. දෙන ලද යාග සංඛ්‍යාත මහාදානයෙහි විපාක නැත. පුදන ලද්දෙහි විපාක නැත. කුසලාකුසලයන්ගේ ඵල විපාක නැත. පරලොවක් නැත. මෙලොවක් නැත. මවෙක් නැත. පියෙක් නැත ඕපපාතික සත්වයෝ නැත. යමෙක් මෙලොවත් පරලොවත් යහපත් නුවණින් ප්‍රත්‍යක්ෂකොට දැනගනිත්ද, එබඳු යහපත් පැවතුම් ඇති යහපත් ගති ඇති, මහණ බමුණෝ ලෙව්හි නැත. සතර මහා භූතයන්ගෙන් ඇතිවූ මේ පුරුෂ තෙමේ යම්කලෙක කලුරිය කරයිද, එකල පඨවි ධාතුව, පඨවි ධාතුව අනුවයයි. ආපෝ ධාතුව, ආපෝ ධාතුව අනුවයයි. තේජෝ ධාතුව, තේජෝ ධාතුව අනුවයි. වායෝ ධාතුව, වායෝ ධාතුව අනුවයයි. සිත සවැනිකොට ඇති ඉන්ද්‍රියයෝ අහසට ගමන් කරත්. ඇඳ පස්වැනි කොට ඇති මළසිරුර පුරුෂයන් සතර දෙනෙක් ගෙනයත්. ගුණාගුණ පදයෝ සොහොන් බිම තෙක් ප්‍රකට වෙත්. ඇට පරෙයිපත් පාට ඇති වෙත්. දෙනලද දානාදීන්ගේ ඵලය අලු කෙළවරකොට ඇත්තේ වෙයි. මේ දානය නම් බාලයන් විසින් පනවනලද ඔවුන්ගේ හිස්වූ සත්‍යයෙන් තොරවූ විලාපයකි. යමෙක් දුන් දෙයෙහි ඵල ඇතැයි කියත්ද, ඒ බාලයෝද, පණ්ඩිතයෝද, ශරීරයාගේ බිඳීමෙන් සිඳීමට යෙත්. විනාශයට යෙත්. මරණින් මතු නූපදිත් යන මේ දෘෂ්ටි උපදීද?" "ස්වාමීනි, එය නොවන්නේමය."

**11.** "සංස්කාරය නිත්‍යය හෝ අනිත්‍යය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍යනම්, එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩි ලෙස නොගෙන, දෙනලද දානයෙහි විපාක නැත. දෙනලද

යාග සංඛ්‍යාත මහාදානයෙහි විපාක නැත. පුදන ලද්දෙහි විපාක නැත. කුසලාකුසලයන්ගේ ඵල විපාක නැත. පරලොවක් නැත. මෙලොවක් නැත. මවෙක් නැත. පියෙක් නැත. ඕපපාතික සත්ත්වයෝ නැත. යමෙක් මෙලොවත් පරලොවත් යහපත් නුවණින් ප්‍රත්‍යක්ෂකොට දැනගනිත්ද, එබඳු යහපත් පැවතුම් ඇති, යහපත් ගති ඇති, මහණ බමුණෝ ලෙව්හි නැත. සතර මහාභූතයන්ගෙන් ඇතිවූ මේ පුරුෂතෙමේ යම්කලෙක කලුරිය කරයිද, එකල පඨවි ධාතුව, පඨවි ධාතුව අනුවයයි ආපෝ ධාතුව, ආපෝ ධාතුව අනුවයයි. තේජෝ ධාතුව තේජෝ ධාතුව අනුවයයි. වායෝ ධාතුව, වායෝ ධාතුව අනුවයයි. සිත සවැනිකොට ඇති ඉන්ද්‍රියයෝ අහසට ගමන් කරත්. ඇඳ පස්වැනිකොට ඇති මළසිරුර පුරුෂයන් සතරදෙනෙක් ගෙනයත්. ගුණාගුණ පදයෝ සොහොන් බිම තෙක් ප්‍රකට වෙත්. ඇට පරෙයිපත් පාට ඇතිවෙත්. දෙනලද දානාදීන්ගේ ඵලය අලු කෙළවර කොට ඇත්තේ වෙයි. මේ දානය නම් බාලයන් විසින් පනවනලද ඔවුන්ගේ හිස්වූ සත්‍යයෙන් තොරවූ විලාපයකි. යමෙක් දුන් දෙයෙහි ඵල ඇතැයි කියත්ද, ඒ බාලයෝද, පණ්ඩිතයෝද, ශරීරයාගේ බිඳීමෙන් සිඳීමට යෙත්. විනාශයට යෙත් මරණින් මතු නූපදිත්' යන මේ දෘෂ්ටි උපදීද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

12. "විඥානය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍යනම්, එය දුකද, සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස් වන ස්වභාවද, එය දැඩි වශයෙන් නොගෙන 'දෙන ලද දානයෙහි විපාක නැත. කරණලද දානසංඛ්‍යාත යාගයෙහි විපාක නැත පුදන ලද්දෙහි විපාක නැත. කුසලාකුසලයන්ගේ ඵල විපාක නැත. පරලොවක් නැත. මෙලොවක් නැත. මවෙක් නැත. පියෙක් නැත. ඕපපාතික සත්ත්වයෝ නැත. යමෙක් මෙලොවත් පරලොවත් යහපත් නුවණින් ප්‍රත්‍යක්ෂ කොට දැනගනිත්ද, එබඳු යහපත් පැවතුම් ඇති, යහපත් ගති ඇති, මහණ බමුණෝ ලෙව්හි නැත. සතර

මහාභූතයන්ගෙන් ඇතිවූ මේ පුරිෂතෙමේ යම් කලෙක කලුරිය කරයිද, එකල පඨවි ධාතුව, පඨවි ධාතුව අනුවයයි, ආපෝධාතුව, ආපෝධාතුව අනුව යයි. තේජෝ ධාතුව, තේජෝ ධාතුව අනුව යයි. වායෝ ධාතුව, වායෝධාතුව අනුව යයි සිත සවැනි කොට ඇති ඉන්ද්‍රියයෝ අහසට ගමන් කරත්. ඇඳ පස්වැනි කොට ඇති මළසිරුර පුරුෂයන් සතර දෙනෙක් ගෙනයත්. ගුණාගුණ පදයෝ සොහොන්බිම තෙක් ප්‍රකට වෙත්. ඇට පරෙයිපත් පාට ඇති වෙත්. දෙනලද දානාදීන්ගේ ඵලය අලු කෙළවරකොට ඇත්තේ වෙයි. මේ දානය නම් බාලයන් විසින් පනවනලද ඔවුන්ගේ හිස්වූ සත්‍යයෙන් තොරවූ විලාපයකි. යමෙක් දුන් දෙයෙහි ඵල ඇතැයි කියත්ද, ඒ බාලයෝද, පණ්ඩිතයෝද, කායයාගේ බිඳී මෙන් සිඳෙත්. විනාස වෙත්. මරණින් මතු නොම උපදිත්' යන මේ දෘෂ්ටි උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

13. "ඇසින් දකිනලද කණින් අසනලද නාසය දිව කය යන තුනෙන් දන්නා ලද සිතින් දන්නා ලද පැමිණෙනලද සොයන ලද විමසන ලද යම් මේ දෙයක් වේද, එයද නිත්‍යය හෝ අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍යනම් එය දුකද, සැපද?" - "ස්වාමීනි දුකය."

"යමක් අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩි ලෙස නොගෙන 'දෙන ලද දානයෙහි විපාක නැත. යාග සංඛ්‍යාත මහාදානයෙහි විපාක නැත, කරණලද පූජාසත්කාරයන්ගේ විපාක නැත. කරණලද කුසලාකුසල කර්මයන්ගේ ඵලයක් විපාකයක් නැත. පරලොවක් නැත මෙලොවක් නැත. මවෙක් නැත. පියෙක් නැත. ඕපපාතික සත්ත්වයෝ නැත. යමෙක් තුමූ මෙලොවත් පරලොවත් තෙමේ විශිෂ්ට නුවණින් ප්‍රත්‍යක්ෂ කොට දනිත්ද, මනාකොට පිළිපන් යහපත් ගති ඇති එබඳු මහණ බමුණෝ ලෝකයෙහි නැත, සතර මහා භූතයින් නිසා උපන් මේ පුරිෂතෙමේ යම් දිනෙක

කළුරිය කෙරේද, පෘථිවි ධාතුතොමෝ පෘථිවි ධාතුව අනුව යයි. ආපෝ ධාතුව ආපෝ ධාතුව අනුවයයි. තේජෝ ධාතුව තේජෝ ධාතුව අනුව යයි වායෝ ධාතුව වායෝ ධාතුව අනුව යයි. මනස සයවෙනි කොට ඇති ඉන්ද්‍රියයෝ අහසට යත්. ඇඳ පස්වැනි කොට ඇති පුරුෂයන් සතර දෙනෙක් මෘත ශරීරය ගෙනයත්, සොහොන දක්වා ගුණාගුණපදයෝ ප්‍රකට වෙත්. ඇට පරෙයි පියාපත් පාට වෙත්, දාන විපාකයෝ අළු කෙළවරකොට පවතිත්, බාලයන් විසින් පනවන ලද මෙම දානය නම් ඔවුන්ගේ හිස්වූ අසත්‍යවූ ප්‍රලාපයකි. යම් කිසිවෙක් විපාක ඇත යන වාදය කියත්ද, ඒ බාලයෝ පණ්ඩිතයෝද කායයාගේ බිඳීමෙන් සිඳෙත්. විනාස වෙත්. මරණින් මතු නොවෙත් යන මේ දෘෂ්ඨිය උපදින්නේද?" - "ස්වාමීනි, මෙය නොවන්නේමය."

"මහණෙනි, යම් තැනක පටන් ආර්ය ශ්‍රාවකයාහට මේ කරුණු සයෙහි සැකදුරු වූයේ වෙයිද, ඔහුට දුකෙහිද සැක දුරු වූයේ වෙයි. දුඃඛයෙහිද සැක දුරුවූයේ වෙයි. දුඃඛ සමුදයෙහිද සැක දුරුවූයේ වෙයි. දුඃඛ නිරෝධයෙහිද සැක දුරුවූයේ වෙයි. දුඃඛ නිරෝධ ගාමිනි ප්‍රතිපදායෙහිද සැක දුරු වූයේ වෙයි, මහණෙනි, මේ ආර්ය ශ්‍රාවක තෙමේ සෝවාන් වූවෙකැයිද සතර අපායෙහි නොවැටීම ස්වභාව කොට ඇත්තෙකැයිද නියත ගති ඇත්තෙකැයිද අර්හත් ඵලය පිහිට කොට ඇත්තෙකැයිද කියනු ලැබේ."

**(පස්වෙනි නත්ථි කරොථ සූත්‍රය (1) නිමි.)**

---

## 6. නත්ථි කරොථ සූත්‍රය. (2)

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

“මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් නිසා කුමකට බැසගෙන (පව්කම්) කරන්නාහටද කරවන්නාහටද අත් පාද ආදිය සිඳින්නාහටද සින්දවන්නාහටද පීඩාකරන්නා හටද පීඩා කරවන්නාහටද ශෝක ඇතිකරන්නාහටද අනුන් ලවා සෝක කරවන්නාහටද ක්ලාන්ත කරන්නාහටද ක්ලාන්ත කරවන්නාහටද බඳින්නාහටද බන්දවන්නාහටද ප්‍රාණඝාත කරන්නාහටද සොරකම් කරන්නාහටද ගෙවල් බිඳින්නාහටද ගම්පහරන්නාහටද ගේ වට කර බඩු පැහැර ගන්නාහටද මගරැක සිට අන්සතු දෙය පැහැර ගන්නා හටද පරඹුවන් කරා යන්නාහටද බොරුකියන්නාහටද පව් කරන්නාහටද පාපයක් නැත. කඩු හාත්පස ඇති චක්‍රයකින් යමෙක් පෘථිවියෙහි වූ සියලු ප්‍රාණීන් එකම මස් රැසක් එකම මස් ගොඩක් කරන්නේද ඒ නිසා වන පවක් නැත. පාපයාගේ පැමිණීමක්ද නැත. නසමින් ඝාතනය කරමින් සිඳිමින් සින්දවමින් පීඩාකරමින් පීඩා කරවමින් ගංගානදියෙහි දකුණු ඉවුර තෙක් යන්නේද, ඒ හේතුකොට ගෙන වන පවක් නැත. පාපයාගේ පැමිණීමක්ද නැත, දන්දෙමින් දෙවමින් මහාදාන සංඛ්‍යාත යාගකරමින් යාග කරවමින් ගංගා නදියෙහි උතුරු ඉවුරු දක්වා ඉදින් යන්නේද ඒ හේතුකොටගෙන වන පිනක් නැත. පුණ්‍යයාගේ පැමිණීමක්ද නැත. දීම කරණකොට ගෙනද ඉන්ද්‍රිය දමනය කරණ කොට ගෙනද සීල සංයමය කරණකොට ගෙනද සත්‍ය වචනය කරණ කොට ගෙනද වන්නාවූ පිණක් නැත, පුණ්‍යයාගේ පැමිණීමක්ද නැත,’ යන මේ දෘෂ්ටි උපදීද?

**2.** “ස්වාමීනි, අපගේ දහම් භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නාකොට ඇත්තාහුය භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය.”

“මහණෙනි, එසේනම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමැයි” කීය.

"ස්වාමීනි, එසේයයි," ඒ භික්ෂූහු, භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. "මහණෙනි, රූපය ඇති කල්හි කුමක් නිසා රූපයට බැසගෙන 'කරන්නාහටද කරවන්නාහටද අත් පාද ආදිය සිඳින්නාහටද සින්දවන්නාහටද පීඩා කරන්නාහටද පීඩා කරවන්නාහටද ශෝක ඇතිකරන්නාහටද අනුන් ලවා ශෝකකරවන්නාහටද ක්ලාන්ත කරන්නාහටද ක්ලාන්ත කරවන්නාහටද බඳින්නාහටද බන්දවන්නාහටද ප්‍රාණඝාත කරන්නාහටද සොරකම් කරන්නාහටද ගෙවල් බිඳින්නා හටද ගම් පහරන්නාහටද ගේ වටකර බඩු පැහැර ගන්නාහටද මගරැක සිට අන් සතු දෙය පැහැර ගන්නාහටද පරඹුවන්කරා යන්නාහටද බොරු කියන්නා හටද පව් කරන්නාහටද පාපයක් නැත. කඩු හාත්පස ඇති චක්‍රයකින් යමෙක් පෘථිවියෙහි වූ සියලු ප්‍රාණීන් එකම මස් රැසක් එකම මස් ගොඩක් කරන්නේද, ඒ නිසා වන පවක් නැත, පාපයාගේ පැමිණීමක්ද නැත. නසමින් ඝාතනය කරමින් සිඳිමින් සින්දවමින් පීඩාකරමින් පීඩා කරවමින් ගංගානදියෙහි දකුණු ඉවුර තෙක් යන්නේද, ඒ හේතුකොට ගෙන වන පවක් නැත, පාපයාගේ පැමිණීමක්ද නැත, දන්දෙමින් දෙවමින් මහාදාන සංඛ්‍යාත යාග කරමින් යාග කරවමින් ගංගා නදියෙහි උතුරු ඉවුරු දක්වා ඉදින් යන්නේද, ඒ හේතුකොට ගෙන වන පිනක් නැත. පුණ්‍යයාගේ පැමිණීමක්ද නැත, දීම කරණකොට ගෙනද දානයෙන් ඉන්ද්‍රිය දමනයෙන් සීල සංයමයෙන් සත්‍ය වචනයෙන් පින් නැත, පුණ්‍යයාගේ පැමිණීමක් නැත", යන මේ දෘෂ්ටි උපදියි.

4. "වේදනාව ඇති කල්හි වේදනාව නිසා වේදනාවට බැසගෙන 'කරන්නාහටද කරවන්නාහටද අත් පාද ආදිය සිඳින්නාහටද සින්දවන්නාහටද පීඩා කරන්නාහටද පීඩාකරවන්නාහටද ශෝක ඇතිකරන්නාහටද අනුන් ලවා ශෝක කරවන්නාහටද ක්ලාන්ත කරන්නාහටද ක්ලාන්ත කරවන්නාහටද බඳින්නාහටද බන්දවන්නාහටද ප්‍රාණඝාත කරන්නාහටද සොරකම් කරන්නාහටද ගෙවල් බිඳින්නාහටද

ගම් පහරන්නාහටද ගේ වටකර බඩු පැහැර ගන්නාහටද මග රැක සිට අන්සතු දෙය පැහැරගන්නාහටද පරඹුවන් කරා යන්නාහටද බොරු කියන්නාහටද පව් කරන්නාහටද පාපයක් නැත. කඩු හාත්පස ඇති චක්‍රයකින් යමෙක් පෘථිවියෙහි වූ සියලු ප්‍රාණීන් එකම මස් රැසක් එකම මස් ගොඩක් කරන්නේද, ඒ නිසා වන පවක් නැත, පාපයාගේ පැමිණීමක්ද නැත, නසමින් ඝාතනය කරමින් සිඳිමින් සින්දවමින් පීඩා කරමින් පීඩා කරවමින් ගංගා නදියෙහි දකුණු ඉවුර තෙක් යන්නේද, ඒ හේතුකොට ගෙන වන පවක් නැත, පාපයාගේ පැමිණීමක්ද නැත, දන්දෙමින් දෙවමින් මහාදාන සංඛ්‍යාත යාගකරමින් යාග කරවමින් ගංගා නදියෙහි උතුරු ඉවුරු දක්වා ඉදින් යන්නේද, ඒ හේතුකොටගෙන වන පිනක් නැත. පුණ්‍යයාගේ පැමිණීමක්ද නැත, දීම කරණකොට ගෙනද, දානයෙන් ඉන්ද්‍රිය දමනයෙන් සීල සංයමයෙන් සත්‍ය වචනයෙන් වන්නාවූපින්නැත. පුණ්‍යයාගේ පැමිණීමක් නැත' යන මේ දෘෂ්ටිය උපදියි.

**5.** "සංඥාව ඇති කල්හි සංඥාව නිසා සංඥාවට බැසගෙන කරන්නාහටද, කරවන්නාහටද, අත් පාද ආදිය සිඳින්නාහටද සින්දවන්නාහටද පීඩා කරන්නාහටද පීඩා කරවන්නාහටද ශෝක ඇතිකරන්නාහටද අනුන් ලවා ශෝක කරවන්නාහටද ක්ලාන්ත කරන්නාහටද ක්ලාන්ත කරවන්නාහටද බඳින්නාහටද බන්දවන්නාහටද ප්‍රාණඝාත කරන්නාහටද සොරකම් කරන්නාහටද ගෙවල් බිඳින්නාහටද ගම් පහරන්නාහටද ගේ වටකර බඩු පැහැරගන්නාහටද මගරැක සිට අන් සතු දෙය පැහැරගන්නාහටද පරඹුවන් කරා යන්නාහටද බොරු කියන්නාහටද පව් කරන්නාහටද පාපයක් නැත. කඩු හාත්පස ඇති චක්‍රයකින් යමෙක් පෘථිවියෙහිවූ සියලු ප්‍රාණීන් එකම මස් රැසක් එකම මස් ගොඩක් කරන්නේද ඒ නිසා වන පවක් නැත, පාපයාගේ පැමිණීමක්ද නැත, නසමින් ඝාතනය කරමින් සිඳිමින් සින්දවමින් පීඩා කරමින් පීඩා කරවමින් ගංගානදියෙහි දකුණු ඉවුර තෙක් යන්නේද, ඒ හේතුකොට ගෙන වන පවක් නැත, පාපයාගේ පැමිණීමක්ද නැත, දන් දෙමින් දන් දෙවමින් මහාදාන

සංඛ්‍යාත යාග කරමින් යාග කරවමින් ගංගා නදියෙහි උතුරු ඉවුරු දක්වා ඉදින් යන්නේද, ඒ හේතුකොටගෙන වන පිණක් නැත. පුණ්‍යයාගේ පැමිණීමක්ද නැත, දීම කරණකොට ගෙණද, දානයෙන් ඉන්ද්‍රිය දමනයයෙන් සීල සංයමයෙන් සත්‍ය වචනයෙන් පින් නැත. පුණ්‍යයාගේ පැමිණීමක් නැත' යන මේ දෘෂ්ටිය උපදියි.

**6.** "සංස්කාරයන් ඇති කල්හි සංස්කාරයන් නිසා සංස්කාරයන්ට බැසගෙන 'කරන්නාහටද, කරවන්නාහටද, අත් පාද ආදිය සිඳින්නාහටද සින්දවන්නාහටද පීඩා කරන්නාහටද පීඩා කරවන්නාහටද ශෝක ඇතිකරන්නාහටද අනුන් ලවා ශෝක කරවන්නාහටද ක්ලාන්ත කරන්නාහටද ක්ලාන්ත කරවන්නාහටද බඳින්නාහටද බන්දවන්නාහටද ප්‍රාණඝාත කරන්නාහටද සොරකම් කරන්නාහටද ගෙවල් බිඳින්නා හටද ගම් පහරන්නාහටද ගේ වටකර බඩු පැහැර ගන්නාහටද මගරැක සිට අන්සතු දෙය පැහැරගන්නාහටද පරඹුවන් කරායන්නාහටද බොරු කියන්නාහටද පව් කරන්නාහටද පාපයක් නැත. කඩු හාත්පස ඇති චක්‍රයකින් යමෙක් පෘථිවියෙහිවූ සියලු ප්‍රාණීන් එකම මස් රැසක් එකම මස් ගොඩක් කරන්නේද, ඒ නිසා වන පවක් නැත, පාපයාගේ පැමිණීමක්ද නැත, නසමින් ඝාතනය කරමින් සිඳිමින් සින්දවමින් පීඩා කරමින් පීඩාකරවමින් ගංගා නදියෙහි දකුණු ඉවුර තෙක් යන්නේද, ඒ හේතුකොට ගෙන වන පවක් නැත, පාපයාගේ පැමිණීමක්ද නැත, දන්දෙමින් දෙවමින් මහාදාන සංඛ්‍යාත යාග කරමින් යාගකරවමින් ගංගා නදියෙහි උතුරු ඉවුරු දක්වා ඉදින් යන්නේද, ඒ හේතුකොටගෙන වන පිනක් නැත. පුණ්‍යයාගේ පැමිණීමක්ද නැත, දීම කරණකොට ගෙනද, දානයෙන් ඉන්ද්‍රිය දමනයෙන් සීල සංයමයෙන් සත්‍ය වචනයෙන් වචනයෙන් පින් නැත.' පුණ්‍යයාගේ පැමිණීමක් නැත. යන මේ දෘෂ්ටිය උපදියි.

**7.** "විඥානය ඇති කල්හි විඥානය නිසා බැස ගෙන 'කරන්නාහටද කරවන්නාහටද අත්පා ආදිය සිඳින්නාහටද සින්දවන්නාහටද පීඩා කරන්නාහටද පීඩා කරවන්නාහටද සෝක

ඇතිකරන්නාහටද අනුන් ලවා ශෝක කරවන්නාහටද ක්ලාන්ත කරන්නාහටද ක්ලාන්ත කරවන්නාහටද බඳින්නාහටද බන්දවන්නාහටද ප්‍රාණඝාත කරන්නාහටද සොරකම් කරන්නාහටද ගෙවල් බිඳින්නාහටද ගම් පහරන්නාහටද ගේ වටකර බඩු පැහැරගන්නාහටද මගරැක සිට අන්සතු දෙය පැහැරගන්නාහටද, පරඹුවන් කරා යන්නාහටද, බොරු කියන්නාහටද පව් කරන්නාහටද පාපයක් නැත. කඩු හාත්පස ඇති චක්‍රයකින් යමෙක් පෘථිවියෙහිවූ සියලු ප්‍රාණීන් එකම මස් රැසක් එකම මස්ගොඩක් කරන්නේද, ඒ නිසා වන පවක් නැත. පාපයාගේ පැමිණීමක්ද නැත. නසමින් ඝාතනය කරමින් සිඳිමින් සින්දවමින් පීඩාකරමින් පීඩාකරවමින් ගංගානදියෙහි දකුණු ඉවුරතෙක් යන්නේද ඒ හේතුකොටගෙන වන පවක් නැත. පාපයාගේ පැමිණීමක්ද නැත, දන් දෙමින් දෙවමින් මහාදාන සංඛ්‍යාත යාග කරමින් යාගකරවමින් ගංගානදියෙහි උතුරු ඉවුර දක්වා ඉදින් යන්නේද, ඒ හේතුකොට ගෙන වන පිනක් නැත පුණ්‍යයාගේ පැමිණීමක්ද නැත, දීම කරණකොටගෙනද ඉන්ද්‍රිය දමනය කරණකොටගෙනද සීල සංයමය කරණකොට ගෙනද සත්‍යවචනයෙන්ද වන්නාවූ පිනක් නැත, පුණ්‍යයාගේ පැමිණීමක්ද නැත' යන මේ දෘෂ්ටි උපදියි.

8. "මහණෙනි, ඒ කුමකැයි සිතව්ද? "රූපය නිත්‍ය ද අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යයි."

"යමක් වනාහි අනිත්‍ය නම්, එය දුකද? සැපද?" - 'ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්න ස්වභාවද, එය දැඩි කොට නොගෙන 'කරන්නාහටද, කරවන්නාහටද, අත්පා ආදිය සිඳින්නාහටද, සින්දවන්නාහටද, පීඩාකරන්නාහටද, පීඩාකරවන්නා හටද, සෝක ඇති කරන්නාහටද, අනුන් ලවා සෝක කරවන්නාහටද, ක්ලාන්ත කරන්නාහටද, ක්ලාන්ත කරවන්නාහටද, බඳින්නාහටද, බන්දවන්නාහටද, ප්‍රාණඝාත කරන්නාහටද, සොරකම් කරන්නාහටද, ගෙවල් බිඳින්නා හටද ගම් පහරන්නාහටද, ගේ වටකර බඩු පැහැරගන්නා හටද, මග

රැක සිට අන් සතු දෙය පැහැරගන්නාහටද, පරඹුවන් කරා යන්නාහටද බොරු කියන්නාහටද, පව් කරන්නාහටද, පාපයක් නැත. කඩු හාත්පස ඇති චක්‍රයකින් යමෙක් පෘථිවියෙහිවූ සියලු ප්‍රාණීන් එකම මස් රැසක් එකම මස් ගොඩක් කරන්නේද, ඒ නිසා වන පාපයක් නැත. පාපයාගේ පැමිණීමක්ද නැත. නසමින්, ඝාතනය කරමින්, සිඳිමින්, සින්දවමින්, පීඩාකරමින්, පීඩාකරවමින්, ගංගා නදියෙහි දකුණු ඉවුරතෙක් යන්නේද, ඒ හේතුකොට ගෙන වන පවක් නැත. පාපයාගේ පැමිණීමක්ද නැත. දන් දෙමින් දෙවමින් මහාදාන සංඛ්‍යාත යාග කරමින් යාගකරවමින්, ගංගානදියෙහි උතුරු ඉවුර දක්වා ඉදින් යන්නේද, ඒ හේතු කොටගෙන වන පිනක් නැත. පුණ්‍යයාගේ පැමිණීමක්ද නැත. දීම කරණකොටගෙනද, ඉන්ද්‍රිය දමනය කරණකොට ගෙනද, සීල සංයම කරණකොටගෙනද, සත්‍යවචනය කරණකොටගෙනද වන්නාවූ පිණක් නැත. පුණ්‍යයාගේ පැමිණීමක්ද නැත' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, නොවන්නේමය."

**9.** "වේදනාව නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම්, එය දුකද? සැපද?" - "ස්වාමීනි. දුකය."

"යමක්වනාහි අනිත්‍යයද දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන 'කරන්නාහටද, කරවන්නාහටද අත්පා ආදිය සිඳින්නාහටද, සින්දවන්නාහටද පීඩාකරන්නාහටද, පීඩාකරවන්නාහටද, සෝක ඇති කරන්නාහටද, අනුන් ලවා සෝක කරවන්නාහටද, ක්ලාන්ත කරන්නාහටද, ක්ලාන්ත කරවන්නාහටද, බඳින්නාහටද, බන්දවන්නාහටද, ප්‍රාණඝාත කරන්නාහටද, සොරකම් කරන්නාහටද, ගෙවල් බිඳින්නාහටද, ගම් පහරන්නාහටද, ගේ වටකර බඩු පැහැර ගන්නාහටද, මග රැක සිට අන්සතු දෙය පැහැරගන්නාහටද, පරඹුවන් කරා යන්නාහටද, බොරු කියන්නාහටද, පව්කරන්නාහටද, පාපයක් නැත. කඩු හාත්පස ඇති චක්‍රයකින් යමෙක් පෘථිවියෙහිවූ සියලු ප්‍රාණීන් එකම මස් රැසක් එකම මස් ගොඩක් කරන්නේද, ඒ

නිසා වන පාපයක් නැත. පාපයාගේ පැමිණීමක්ද නැත, නසමින්, ඝාතනය කරමින්, සිඳිමින්, සින්දවමින්, පීඩාකරමින්, පීඩා කරවමින්, ගංගා නදියෙහි දකුණු ඉවුර තෙක් යන්නේද, ඒ හේතුකොට ගෙන වන පවක් නැත. පාපයාගේ පැමිණීමක්ද නැත. දන්දෙමින් දෙවමින් මහාදාන සංඛ්‍යාත යාග කරමින්, යාග කරවමින්, ගංගා නදියෙහි උතුරු ඉවුර දක්වා ඉදින් යන්නේද, ඒ හේතු කොට ගෙන වන පින් නැත. පුණ්‍යයාගේ පැමිණීමක්ද නැත. දීම කරණකොට ගෙනද, ඉන්ද්‍රිය දමනය කරණකොට ගෙනද, සීල සංයමය කරණකොටගෙනද, සත්‍යවචනය කරණකොට ගෙනද, වන්නාවූ පිනක් නැත. පුණ්‍යයාගේ පැමිණීමක්ද නැත' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, නොවන්නේමය."

**10.** "සංඥාව නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍යනම්, එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකයි."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන 'කරන්නාහටද, කරවන්නාහටද, අත් පා ආදිය සිඳින්නාහටද, සින්දවන්නාහටද, පීඩාකරන්නාහටද, සෝක ඇති කරන්නාහටද, අනුන් ලවා සෝක කරවන්නාහටද, ක්ලාන්ත කරන්නාහටද, ක්ලාන්ත කරවන්නාහටද, බඳින්නාහටද, බන්දවන්නාහටද, ප්‍රාණඝාත කරන්නාහටද, සොරකම් කරන්නාහටද, ගෙවල් බිඳින්නා හටද ගම් පහරන්නාහටද, ගේ වටකර බඩු පැහැරගන්නා හටද මග රැක සිට අන්සතු දෙය පැහැරගන්නාහටද, පරඹුවන් කරා යන්නාහටද, බොරු කියන්නාහටද, පව්කරන්නාහටද, පාපයක් නැත කඩු හාත්පස ඇති චක්‍රයකින් යමෙක් පෘථිවියෙහිවූ සියලු ප්‍රාණීන් එකම මස් රැසක් එකම මස් ගොඩක් කරන්නේද, ඒ නිසා වන පාපයක් නැත. පාපයාගේ පැමිණීමක්ද නැත. නසමින් ඝාතනය කරමින්, සිඳිමින්, සින්දවමින්, පීඩා කරමින්, පීඩා කරවමින්, ගංගා නදියෙහි දකුණු ඉවුර තෙක් යන්නේද, ඒ හේතුකොට ගෙන වන පවක් නැත. පාපයාගේ පැමිණීමක් නැත. දන්දෙමින් දෙවමින් මහාදාන සංඛ්‍යාත යාග කරමින්,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

යාග කරවමින් ගංගා නදියෙහි උතුරු ඉවුර දක්වා ඉදින් යන්නේද, ඒ හේතු කොට ගෙන පින් නැත. පුණ්‍යයාගේ පැමිණීමක්ද නැත දීම කරණකොටගෙනද, ඉන්ද්‍රිය දමනය කරණකොටගෙනද, සීල සංයමය කරණකොටගෙනද, සත්‍යවචනය කරණකොට ගෙනද, වන්නාවූ පිනක් නැත පුණ්‍යයාගේ පැමිණීමක්ද නැත' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, නොවන්නේමය."

11. "සංස්කාර නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍යනම්. එය දුකද, සැපද?" - "ස්වාමීනි, දුකයි."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද වෙනස්වන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන 'කරන්නාහටද, කරවන්නාහටද, අත්පා ආදිය සිඳින්නාහටද සින්දවන්නාහටද පීඩාකරන්නා හටද, සෝක ඇති කරන්නාහටද, අනුන් ලවා සෝක කරවන්නාහටද, ක්ලාන්ත කරන්නාහටද, ක්ලාන්ත කරවන්නා හටද, බඳින්නාහටද, බන්දවන්නාහටද, ප්‍රාණඝාත කරන්නා හටද, සොරකම් කරන්නාහටද, ගෙවල් බිඳින්නාහටද, ගම් පහරන්නාහටද, ගේ වටකර බඩු පැහැරගන්නාහටද, මග රැක සිට අන් සතු දෙය පැහැරගන්නාහටද, පරඹුවන් කරා යන්නාහටද, බොරු කියන්නාහටද, පව්කරන්නාහටද, පාපයක් නැත. කඩු හාත්පස ඇති චක්‍රයකින් යමෙක් පෘථිවියෙහිවූ සියලු ප්‍රාණීන් එකම මස් රැසක් එකම මස් ගොඩක් කරන්නේද, ඒ නිසා වන පාපයක් නැත. පාපයාගේ පැමිණීමක්ද නැත. නමින්, ඝාතනය කරමින්, සිඳිමින්, සින්දවමින්, පීඩාකරමින්, පීඩාකරවමින්, ගංගා නදියෙහි දකුණු ඉවුර තෙක් යන්නේද, ඒ හේතුකොට ගෙන වන පවක් නැත. පාපයාගේ පැමිණීමක් නැත. දන්දෙමින්, දෙවමින්, මහාදාන සංඛ්‍යාත යාග කරමින් යාග කරවමින්, ගංගානදියෙහි උතුරු ඉවුර දක්වා ඉදින් යන්නේද, ඒ හේතු කොටගෙන පින්නැත. පුණ්‍යයාගේ පැමිණීමක්ද නැත. දීම කරණකොටගෙනද, ඉන්ද්‍රිය දමනය කරණකොටගෙනද, සීල සංයමය කරණකොටගෙනද, සත්‍යවචනය කරණකොට

ගෙනද, වන්නාවූ පිනක් නැත. පුණ්‍යයාගේ පැමිණීමක්ද නැත යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, නොවන්නේමය."

12. "විඥානය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකයි."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන කරන්නාහටද, කරවන්නාහටද, අත්පා ආදිය සිඳින්නාහටද, සින්දවන්නාහටද, පීඩාකරන්නා හටද, පීඩාකරවන්නාහටද, සෝක ඇතිකරන්නාහටද, අනුන් ලවා සෝක කරවන්නාහටද, ක්ලාන්ත කරන්නාහටද ක්ලාන්තකරවන්නාහටද, බඳින්නාහටද, බන්දවන්නාහටද, ප්‍රාණඝාත කරන්නාහටද, සොරකම් කරන්නාහටද, ගෙවල් බිඳින්නා හටද, ගම් පහරන්නාහටද, ගේ වටකර බඩු පැහැරගන්නාහටද, මග රැක සිට අන් සතු දෙය පැහැරගන්නාහටද, පරඹුවන් කරා යන්නාහටද, බොරු කියන්නාහටද, පව්කරන්නාහටද, පාපයක් නැත. කඩු හාත්පස ඇති චක්‍රයකින් යමෙක් පෘථිවියෙහිවූ සියලු ප්‍රාණීන් එකම මස් රැසක් එකම මස් ගොඩක් කරන්නේද, ඒ නිසා වන පාපයක් නැත. පාපයාගේ පැමිණීමක්ද නැත. නසමින්, ඝාතනය කරමින්, සිඳිමින්, සින්දවමින් පීඩාකරමින්, පීඩාකරවමින්, ගංගා නදියෙහි දකුණු ඉවුර තෙක් යන්නේද, ඒ හේතුකොටගෙන වන පවක් නැත පාපයාගේ පැමිණීමක් නැත. දන්දෙමින්, දෙවමින්, මහාදාන සංඛ්‍යාත යාග කරමින්, යාග කරවමින්, ගංගා නදියෙහි උතුරු ඉවුර දක්වා ඉදින් යන්නේද, ඒ හේතුකොටගෙන පින් නැත. පුණ්‍යයාගේ පැමිණීමක්ද නැත. දීම කරණකොට ගෙනද, ඉන්ද්‍රිය දමනය කරණකොටගෙනද, සීල සංයමය කරණකොටගෙනද, සත්‍ය වචනය කරණකොටගෙනද, වන්නාවූ පිනක් නැත. පුණ්‍යයාගේ පැමිණීමක්ද නැත' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, නොවන්නේමය."

13. "ඇසින් දකින ලද කණින් අසන ලද, නාසය දිව කය යන තුනෙන් දන්නා ලද, සිතින් දැනගන්නා ලද, පැමිණෙන

ලද, සොයන ලද, විමසන ලද, යම් මේ දෙයක් වෙයිද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය හෝ දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්න ස්වභාවද, එය දැඩිකොට නොගෙන 'කරන්නාටද, කරවන්නාටද, අත්පාආදිය සිඳින්නාහටද, සින්දවන්නාටද, පීඩාකරන්නාටද, පීඩාකරවන්නාටද ශෝක ඇති කරන්නාටද, ශෝක ඇති කරවන්නාටද, ක්ලාන්ත කරන්නාටද, ක්ලාන්ත කරවන්නාටද, බඳින්නාටද, බන්දවන්නාටද, ප්‍රාණඝාත කරන්නාටද, සොරකම් කරන්නාටද, ගෙවල් බිඳින්නාටද, ගම් පහරන්නාටද ගේ වටකර බඩු පැහැරගන්නාහටද, මංපහරන්නාටද, පරඹුවන් කරා යන්නාටද, බොරු කියන්නාටද, පව් කරන්නාටද, පව් නැතැයිද, ඉදින් යමෙක් තෙමේ කඩු හාත්පස ඇති චක්‍රයකින් මේ පොළෝ තෙලෙහි සත්ත්වයන් එකම මස් රැසක් කරන්නේද එකම මස් ගොඩක් කරන්නේද, ඒ නිසා වන පාපයක් නැත. පාපයාගේ පැමිණීමක් නැතැයිද, නසමින්, ඝාතනය කරමින්, සිඳිමින්, සින්දවමින්, පීඩාකරමින්, පීඩාකරවමින්, ගංගානදියේ දකුණු ඉවුර දක්වා ඉදින් යන්නේද, ඒ හේතුකොට ගෙන සිදුවන පාපයක් නැත. පාපයාගේ පැමිණීමක් නැතැයිද, දන්දෙමින්, දෙවමින්, මහාදාන සංඛ්‍යාත යාග කරමින්, කරවමින්, ගංගා නදියේ උතුරු ඉවුර දක්වා ඉදින් යන්නේද, ඒ හේතුකොට වන්නාවූ පිනක් නැත. පුණ්‍යයාගේ පැමිණීමක්, නැතැයිද, දානයෙන්ද, ඉන්ද්‍රිය දමනයෙන්ද, සීල සංගමයෙන්ද සත්‍ය වචනයෙන්ද, සිදුවන පිනක් නැත. පුණ්‍යයාගේ පැමිණීමක් නැතැයිද යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

**14.** "මහණෙනි, යම් තැනක පටන් ආර්යශ්‍රාවකයාගේ මේ කරුණු සයෙහි සැක දුරුවූයේවෙයිද, ඔහුට දුක පිළිබඳවද සැක දුරුවූයේ වෙයි. ඔහුට දුක්ඛ සමුදය පිළිබඳවද සැක දුරුවූයේ වෙයි. ඔහුට දුක්ඛ නිරෝධය පිළිබඳවද සැක දුරු වූයේ වෙයි.

ඔහුට දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදාව පිළිබඳවද සැක දුරුවූයේ වෙයි.

"මහණෙනි, මේ ආර්ය ශ්‍රාවකතෙමේ සොතාපන්නයයිද, සතර අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තෙකැයිද, නියත ගති ඇත්තෙකැයිද, අර්හත් ඵලය පිහිටකොට ඇත්තෙකැයිද කියනු ලැබේ."

**(හයවෙනි නත්ථි කරොථ සූත්‍රය (2) නිමි.)**

---

## 7. නත්ථි හේතු සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූ සේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, කුමක් ඇතිකල්හි කුමක් නිසා කුමකට බැසගෙන 'සත්ත්වයන්ගේ කෙලෙසීම පිණිස හේතුවක් නැත්තේය. ප්‍රත්‍යයක් නැත්තේය. හේතු රහිතව ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ කෙලෙසෙත්. සත්ත්වයන්ගේ විසුද්ධිය පිණිස හේතුවක් නැත්තේය. ප්‍රත්‍යයක් නැත්තේය. හේතු රහිතව ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ පිරිසිදු වෙත්. (දිව්‍ය ලොකාදියෙහි ඉපදීමට හේතුවන) බලයක් නැත. වීර්යයක් නැත. පුරුෂ ශක්තියක් නැත. පුරුෂ පරාක්‍රමයක් නැත. සියලු සත්ත්වයෝ, සියලු ප්‍රාණීහු, සියලු භූතයෝ ශාලියවාදී සියලු ජීවීහු තමාවසඟයෙහි නොපවත්නාහු, බලරහිත වූවාහු, වීර්ය නැත්තාහු, නියම වශයෙන්ද, ඒ ඒ ජාතීන්හි ගමන්කිරීම වශයෙන්ද, ස්වභාව වශයෙන්ද, නොයෙක් ආකාරයට පැමිණියාහු තණ්හාභිජාති ආදී සවැදෑරුම් ශ්‍රේෂ්ඨ ජාතිවල සැප දුක් නැවත නැවත විඳිත්' යන මෙබඳු දෘෂ්ටි උපදීද?

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය."

"මහණෙනි, එසේනම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමැයි" කීය.

"ස්වාමීනි එසේයයි," ඒ භික්ෂූහු, භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. "මහණෙනි, රූපය ඇතිකල්හි රූපය නිසා, රූපයට බැසගෙන, "සත්ත්වයන්ගේ කෙලෙසීම පිණිස, හේතුවක් නැත ප්‍රත්‍යයක් නැත. හේතු රහිතව ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ කෙලෙසෙත්. සත්ත්වයන්ගේ විසුද්ධිය පිණිස හේතුවක් නැත්තේය. ප්‍රත්‍යයක් නැත්තේය. හේතු රහිතව ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ පිරිසුදු වෙත්. (දිව්‍යලෝකාදියෙහි ඉපදීමට හේතු වන) බලයක් නැත. වීර්යයක් නැත. පුරුෂ ශක්තියක් නැත. පුරුෂ පරාක්‍රමයක් නැත. සියලු සත්ත්වයෝ, සියලු ප්‍රාණීහු, සියලු භූතයෝ ශාලියවාදී සියලු ජීවීහු තමා වසඟයෙහි නොපවත්නාහු, බලරහිත වූවාහු, වීර්ය නැත්තාහු, නියම වශයෙන්ද, ඒ ඒ ජාතීන්හි ගමන්කිරීම් වශයෙන්ද, ස්වභාව වශයෙන්ද නොයෙක් ආකාරයට පැමිණියාහු තණ්හාභිජාති ආදි සවැදෑරුම් ශ්‍රෙෂ්ඨ ජාතිවල සුවදුක් නැවත නැවත විඳිත්' යන මෙබඳු දෘෂ්ටි උපදියි.

4. "වේදනාව ඇතිකල්හි, වේදනාව නිසා. වේදනාවට බැසගෙන, 'සත්වයන්ගේ කෙලෙසීම පිණිස, හේතුවක් නැත. ප්‍රත්‍යයක් නැත. හේතු රහිතව, ප්‍රත්‍ය රහිතව, සත්ත්වයෝ කෙලෙසෙත්. සත්ත්වයන්ගේ විසුද්ධිය පිණිස හේතුවක් නැත්තේය. ප්‍රත්‍යයක් නැත්තේය. හේතු රහිතව, ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ පිරිසුදු වෙත්. (දිව්‍යලෝකාදියෙහි ඉපදීමට හේතු වන) බලයක් නැත. වීර්යයක් නැත. පුරුෂ ශක්තියක් නැත. පුරුෂ පරාක්‍රමයක් නැත. සියලු සත්ත්වයෝ, සියලු ප්‍රාණීහු, සියලු

භූතයෝ ශාලියවාදී සියලු ජීවීහු, තමාවසඟයෙහි නොපවත්නාහු, බලරහිත වූවාහු, වීර්යනැත්තාහු, නියම වශයෙන්ද, ඒ ඒ ජාතීන්හි ගමන් කිරීම් වශයෙන්ද, ස්වභාව වශයෙන්ද, නොයෙක් ආකාරයට පැමිණියාහු තණ්හාභිජාති ආදි සවැදෑරුම් ශ්‍රෙෂ්ඨ ජාතිවල සුවදුක් නැවත නැවතවිඳිත්' යන මෙබඳු දෘෂ්ටි උපදියි.

**5.** "සංඥාව ඇතිකල්හි, සංඥාව නිසා, සංඥාවට බැසගෙන 'සත්ත්වයන්ගේ කෙලෙසීම පිණිස හේතුවක් නැත. ප්‍රත්‍යයක් නැත. හේතු රහිතව, ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ කෙලෙසෙත්. සත්ත්වයන්ගේ විසුද්ධිය පිණිස හේතුවක් නැත්තේය. ප්‍රත්‍යයක් නැත්තේය. හේතු රහිතව, ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ පිරිසුදු වෙත්. (දිව්‍යලෝකාදියෙහි ඉපදීමට හේතුවන) බලයක් නැත. වීර්යයක් නැත. පුරුෂ ශක්තියක් නැත. පුරුෂ පරාක්‍රමයක් නැත. සියලු සත්ත්වයෝ, සියලු ප්‍රාණීහු, සියලු භූතයෝ ශාලියවාදී සියලු ජීවීහු, තමා වසඟයෙහි නොපවත්නාහු, බල රහිත වූවාහු, වීර්යනැත්තාහු, නියම වශයෙන්ද, ඒ ඒ ජාතීන්හි ගමන්කිරීම් වශයෙන්ද, ස්වභාව වශයෙන්ද, නොයෙක් ආකාරයට පැමිණියාහු තණ්හාභිජාති ආදි සවැදෑරුම් ශ්‍රෙෂ්ඨ ජාතිවල සුවදුක් නැවත නැවත විඳිත්' යන මෙබඳු දෘෂ්ටි උපදියි.

**6.** "සංස්කාර ඇතිකල්හි, සංස්කාර නිසා, සංස්කාරයන්ට බැසගෙන 'සත්ත්වයන්ගේ කෙලෙසීම පිණිස හේතුවක් නැත. ප්‍රත්‍යයක් නැත. හේතු රහිතව, ප්‍රත්‍යය රහිතව, සත්ත්වයෝ කෙලෙසෙත්. සත්ත්වයන්ගේ විසුද්ධිය පිණිස හේතුවක් නැත්තේය. ප්‍රත්‍යයක් නැත්තේය. හේතු රහිතව, ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ පිරිසුදු වෙත්. (දිව්‍යලෝකාදියෙහි ඉපදීමට හේතුවන) බලයක් නැත. වීර්යයක් නැත. පුරුෂ ශක්තියක් නැත. පුරුෂ පරාක්‍රමයක් නැත. සියලු සත්ත්වයෝ, සියලු ප්‍රාණීහු, සියලු භූතයෝ ශාලියවාදී සියලු ජීවීහු, තමාවසඟයෙහි නොපවත්නාහු, බල රහිතවූවාහු, වීර්යනැත්තාහු, නියම වශයෙන්ද, ඒ ඒ ජාතීන්හි ගමන්කිරීම් වශයෙන්ද, ස්වභාව වශයෙන්ද, නොයෙක් ආකාරයට පැමිණියාහු තණ්හාභිජාති ආදි සවැදෑරුම් ශ්‍රෙෂ්ඨ ජාතිවල සුවදුක් නැවත නැවත විඳිත්' යන මෙබඳු දෘෂ්ටි උපදියි.

7. "විඤ්ඤාණය ඇතිකල්හි, විඤ්ඤාණය නිසා, විඤ්ඤාණයයට බැසගෙන 'සත්ත්වයන්ගේ කෙලෙසීම පිණිස හේතුවක් නැත. ප්‍රත්‍යයක් නැත. හේතු රහිතව, ප්‍රත්‍යය රහිතව, සත්ත්වයෝ කෙලෙසෙත්. සත්ත්වයන්ගේ විසුද්ධිය පිණිස හේතුවක් නැත්තේය. ප්‍රත්‍යයක් නැත්තේය. හේතු රහිතව, ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ පිරිසුදු වෙත්. (දිව්‍යලෝකාදියෙහි ඉපදීමට හේතුවන) බලයක් නැත. වීර්යයක් නැත. පුරුෂ ශක්තියක් නැත. පුරුෂ පරාක්‍රමයක් නැත. සියලු සත්ත්වයෝ, සියලු ප්‍රාණීහු, සියලු භූතයෝ ශාලියවාදී සියලු ජීවීහු, තමාවසඟයෙහි නොපවත්නාහු, බල රහිතවූවාහු, වීර්ය නැත්තාහු, නියම වශයෙන්ද, ඒ ඒ ජාතීන්හි ගමන්කිරීම් වශයෙන්ද, ස්වභාව වශයෙන්ද, නොයෙක් ආකාරයට පැමිණියාහු තණ්හාභිජාති ආදි සවැදෑරුම් ශ්‍රෙෂ්ඨ ජාතිවල නැවත නැවත සුවදුක් විඳිත්' යන මෙබඳු දෘෂ්ටි උපදියි.

8. "මහණෙනි, ඒ කුමකැයි සිතව්ද?

"රූපය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි දුකයි."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිලෙස නොගෙන සත්ත්වයන්ගේ කෙළෙසීමට හේතු නැත. ප්‍රත්‍යයක් නැත. හේතු රහිතව, ප්‍රත්‍යය රහිතව, සත්ත්වයෝ කෙලෙසෙත්. සත්ත්වයන්ගේ විසුද්ධිය පිණිස හේතුවක් නැත්තේය. ප්‍රත්‍යයක් නැත්තේය. හේතු රහිතව, ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ පිරිසුදු වෙත්. (දිව්‍ය ලෝකාදියෙහි ඉපදීමට හේතුවන) බලයක් නැත. වීර්යයක් නැත. පුරුෂ ශක්තියක් නැත. පුරුෂ පරාක්‍රමයක් නැත. සියලු සත්ත්වයෝ, සියලු ප්‍රාණීහු, සියලු භූතයෝ ශාලියවාදී සියලු ජීවීහු තමාවසඟයෙහි නොපවත්නාහු, බල රහිත වූවාහු, වීර්ය නැත්තාහු, නියම වශයෙන්ද, ඒ ඒ ජාතීන්හි ගමන්කිරීම් වශයෙන්ද, ස්වභාව වශයෙන්ද, නොයෙක් ආකාරයට පැමිණියාහු තණ්හාභිජාති ආදි සවැදෑරුම් ශ්‍රෙෂ්ඨ ජාතිවල සුවදුක් නැවත නැවත විඳිත්' යන මෙබඳු දෘෂ්ටි උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය.

**9.** "වේදනාව නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම් එය දුකද; සැපද?" - "ස්වාමීනි, දුකයි."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වනස්වභාවද, එය දැඩිලෙස නොගෙන 'සත්ත්වයන්ගේ කෙළෙසීමට හේතු නැත. ප්‍රත්‍යයක් නැත. හේතු රහිතව, ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ කෙලෙසෙත්. සත්ත්වයන්ගේ විසුද්ධිය පිණිස හේතුවක් නැත්තේය. ප්‍රත්‍යයක් නැත්තේය. හේතු රහිතව, ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ පිරිසුදු වෙත්. (දිව්‍යලෝකාදියෙහි ඉපදීමට හේතු වන) බලයක් නැත. වීර්යයක් නැත. පුරුෂ ශක්තියක් නැත. පුරුෂ පරාක්‍රමයක් නැත. සියලු සත්ත්වයෝ, සියලු ප්‍රාණීහු, සියලු භූතයෝ ශාලියවාදී සියලු ජීවීහු තමාවසඟයෙහි නොපවත්නාහු, බල රහිතවූවාහු, වීර්ය නැත්තාහු, නියම වශයෙන්ද, ඒ ඒ ජාතීන්හි ගමන් කිරීම් වශයෙන්ද, ස්වභාව වශයෙන්ද, නොයෙක් ආකාරයට පැමිණියාහු තණ්හාභිජාති ආදි සවැදෑරුම් ශ්‍රෙෂ්ඨ ජාතිවල සුවදුක් නැවත නැවත විඳිත්' යන මෙබඳු දෘෂ්ටි උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය.

10. "සංඥාව නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමිනි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකයි."

"යමක් වනාහි අනිත්‍යද? දුකද, පෙරළෙනස්වභාවද, එය දැඩිලෙස නොගෙන 'සත්ත්වයන්ගේ කෙළෙසීමට හේතුවක් නැත ප්‍රත්‍යයක් නැත. හේතු රහිතව, ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ කෙළෙසෙත්. සත්ත්වයන්ගේ විසුද්ධිය පිණිස හේතුවක් නැත්තේය. ප්‍රත්‍යයක් නැත්තේය. හේතු රහිතව, ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ පිරිසිදු වෙත්. (දිව්‍යලෝකාදියෙහි ඉපදීමට හේතු වන) බලයක් නැත. වීර්යයක් නැත. පුරුෂ ශක්තියක් නැත. පුරුෂ පරාක්‍රමයක් නැත. සියලු සත්ත්වයෝ, සියලු ප්‍රාණීහු, සියලු භූතයෝ, ශාලියවාදී සියලු ජීවීහු, තමාවසඟයෙහි නොපවත්නාහු, නියම වශයෙන්ද, ඒ ඒ ජාතීන්හි ගමන් කිරීම් වශයෙන්ද, ස්වභාව වශයෙන්ද, නොයෙක් ආකාරයට පැමිණියාහු තණ්හාභිජාති ආදී සවැදෑරුම් ශ්‍රෙෂ්ඨ ජාතිවල සුවදුක් නැවත නැවත විඳිත්' යන මේ දෘෂ්ටි උපදින්නේද?" - ස්වාමීනි, එය නොවන්නේමය."

11. "සංස්කාරයෝ නිත්‍ය හෝ අනිත්‍යය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිලෙස නොගෙන 'සත්ත්වයන්ගේ කෙළෙසීමට හේතුවක් නැත. ප්‍රත්‍යයක් නැත. හේතු රහිතව, ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ කෙළෙසෙත්. සත්ත්වයන්ගේ විසුද්ධිය පිණිස හේතුවක් නැත්තේය. ප්‍රත්‍යයක් නැත්තේය. හේතු රහිතව, ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ පිරිසුදු වෙත්. (දිව්‍යලෝකාදියෙහි ඉපදීමට හේතුවන) බලයක් නැත. වීර්යයක් නැත. පුරුෂ ශක්තියක් නැත. පුරුෂ පරාක්‍රමයක් නැත. සියලු සත්ත්වයෝ, සියලු ප්‍රාණීහු, සියලු භූතයෝ, ශාලියවාදී සියලු ජීවීහු තමාවසඟයෙහි නොපවත්නාහු, බල රහිත වූවාහු, වීර්ය නැත්තාහු, නියම වශයෙන්ද, ඒ ඒ ජාතීන්හි ගමන් කිරීම් වශයෙන්ද, ස්වභාව වශයෙන්ද, නොයෙක් ආකාරයට පැමිණියාහු, තණ්හාභිජාති ආදි සවැදෑරුම් ශ්‍රේෂ්ඨ ජාතිවල සුවදුක් නැත නැවත විඳිත් යන මේ දෘෂ්ටි උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

12. "විඤ්ඤාණය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම්, එය දුකද, සැපද?" - "ස්වාමීනි, දුකයි."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද එය දැඩිලෙස නොගෙන 'සත්ත්වයන්ගේ කෙළෙසීමට හේතුවක්නැත. ප්‍රත්‍යයක් නැත. හේතු රහිතව, ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ කෙලෙසෙත්. සත්ත්වයන්ගේ විසුද්ධිය පිණිස හේතුවක් නැත්තේය. ප්‍රත්‍යයක් නැත්තේය. හේතු රහිතව, ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ පිරිසුදු වෙත්. (දිව්‍ය ලෝකාදියෙහි ඉපදීමට හේතුවන) බලයක් නැත. වීර්යයක් නැත. පුරුෂ ශක්තියක් නැත. පුරුෂ පරාක්‍රමයක් නැත. සියලු සත්ත්වයෝ, සියලු ප්‍රාණීහු, සියලු භූතයෝ ශාලියවාදී සියලු ජීවීහු, තමාවසඟයෙහි නොපවත්නාහු, බල රහිතවූවාහු, වීර්ය නැත්තාහු, නියම වශයෙන්ද, ඒ ඒ ජාතීන්හි

ගමන්කිරීම් වශයෙන්ද, ස්වභාව වශයෙන්ද, නොයෙක් ආකාරයට පැමිණියාහු තණ්හාභිජාති ආදි සවැදෑරුම් ශ්‍රෙෂ්ඨ ජාතිවල සුවදුක් නැවත නැවත විඳිත්' යන මේ දෘෂ්ටි උපදින්නේද?"- "ස්වාමීනි, එය නොවන්නේමය."

13. "ඇසින් දකින ලද කණින් අසන ලද, නාසය දිව කය යන තුනෙන් දන්නා ලද, සිතින් දැනගන්නා ලද, පැමිණෙන ලද, සොයන ලද, විමසන ලද, යම් මේ දෙයක් වෙයිද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය හෝ දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද? දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිකොට නොගෙන 'සත්ත්වයන්ගේ කෙළෙසීමට හේතුවක් නැත ප්‍රත්‍යයක් නැත. හේතු රහිතව, ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ කෙළෙසෙත්. සත්ත්වයන්ගේ විසුද්ධිය පිණිස හේතුවක් නැත්තේය. ප්‍රත්‍යයක් නැත්තේය. හේතු රහිතව, ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ පිරිසිදු වෙත්. (දිව්‍යලෝකාදියෙහි ඉපදීමට හේතු වන) බලයක් නැත. වීර්යයක් නැත. පුරුෂ ශක්තියක් නැත. පුරුෂ පරාක්‍රමයක් නැත. සියලු සත්ත්වයෝ, සියලු ප්‍රාණීහු, සියලු භූතයෝ, ශාලියවාදී සියලු ජීවීහු, තමාවසඟයෙහි නොපවත්නාහු, නියම වශයෙන්ද, ඒ ඒ ජාතීන්හි ගමන් කිරීම් වශයෙන්ද, ස්වභාව වශයෙන්ද, නොයෙක් ආකාරයට පැමිණියාහු තණ්හාභිජාති ආදී සවැදෑරුම් ශ්‍රෙෂ්ඨ ජාතිවල සුවදුක් නැවත නැවත විඳිත්' යන මේ දෘෂ්ටි උපදින්නේද?" - ස්වාමීනි, එය නොවන්නේමය."

14. "මහණෙනි, යම්තැනක පටන් මේ ආර්යශ්‍රාවකයාට මේ සවැදෑරුම් කරුණෙහි සැක දුරුවූයේ වෙයිද, ඔහුට දුක පිළිබඳවද සැක දුරුවූයේ වෙයි. දුක්ඛසමුදයෙහිද සැක දුරු වූයේ වෙයි. දුක්ඛ නිරොධයෙහිද සැක දුරුවූයේ වෙයි. දුක්ඛ නිරොධ ගාමිණී ප්‍රතිපදාවෙහිද සැක දුරුවූයේ වෙයි.

"මහණෙනි, මේ ආර්ය ශ්‍රාවකතෙමේ ශ්‍රොතාපන්නයයිද, සතර අපායෙහි නොවැටීම ස්වභාවකොට ඇත්තෙකැයිද නියමගති

ඇත්තෙකැයිද, අර්හත්ඵලය පිහිටකොට ඇත්තෙකැයිද කියනු ලැබේ.”

**(හත්වෙනි නත්ථි හේතු සූත්‍රය නිමි.)**

---

## 8. මහාදිට්ඨි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූසේක. ‘ස්වාමීනියි’ කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. “මහණෙනි, කුමක් ඇතිකල්හි කුමක් නිසා කුමකට බැසගෙන ‘කිසිවෙකු විසින් නොකරණලද කිසිවෙකුගේ විධානය නොකරණ ලද කිසිවෙකු විසින් නිර්මානය නොකරනලද නිර්මානය නොකරවනලද පර්වත කූටයක් මෙන් නිශ්ඵලවූ ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චලවූ ධර්ම සමූහ හතක් වෙත්. ඔව්හු නො සැලෙත්, ප්‍රකෘතිය නොහරිත්, ඔවුනොවුන්ට බාධා නොකරත්. ඔවුනොවුන්ට සැප පිණිස හෝ දුක් පිණිස හෝ සැප දුක් පිණිස හෝ නොසමත් වෙත්. ඒ සත්ධර්ම සමූහයෝ කවරහුද?

“පෘථුවිධාතු සමූහය, අපෝධාතු සමූහය, තේජෝ ධාතු සමූහය, වායෝධාතු සමූහය, සුඛධාතු සමූහය, දුක්ඛධාතු සමූහය, ජීවධාතු සමූහය යන මේ ධාතු සමූහයා (කිසිවෙකු විසින්) නොකරණලදහ. කිසි විධානයක් නොකරණලදහ. කිසිවෙකු විසින් නොමවනලදහ. කිසිවෙකු විසින් මැවීම නොකරවනලදහ. (ඵල රහිත හෙයින්) වඳයහ. පර්වතකූටයක් මෙන් නිශ්චලව සිටියහ. ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චලව සිටියාහ. ඔව්හු නොසැලෙත්, ප්‍රකෘතිය නොහරිත්, ඔවුනොවුන් නොගැටෙත්, සුව පිණිස හෝ දුක් පිණිස හෝ සුවදුක් පිණිස හෝ නොසමත්

වෙත්. යමෙක් තියුණු ආයුධයකින් හිස සිඳීද, (එයින්) කිසිවෙක් කිසිවෙක් ජීවිතයෙන් තොර නොකරයිද, සත්වැදෑරුම්වූ ශරීරයන්ගේ අතරෙන්ම ආයුධය ඇතුල්වෙයි, ගමන් කරයි.

'මේ වනාහි ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී උත්තමයෝනීන් සම්බන්ධ තුදුස් ලක්ෂ හයදහස් හයසියයක්ද, කර්ම පන්සියයක්ද කර්ම පසක්ද, කර්ම තුනක්ද, කායවාක්කර්ම දෙකක්ද, මනෝකර්ම නම්වූ අර්ධ කර්මයද, දෙසැටක් ප්‍රතිපදාවෝද, දෙසැටක් අන්තර කල්පයෝද, කෘෂ්ණාදී ශ්‍රෙෂ්ඨ ජාති සයක්ද, මන්දාදී පුරිෂ භූමි අටද, ආජීවකවෘත්ති එක්සිය නවසාළිසක්ද, පරිව්‍රාජක ප්‍රව්‍රජ්‍යා එකසිය සතළිස් නවයක්ද, නාග මණ්ඩල එකසිය හතළිස් නවයක්ද, ඉන්ද්‍රියය එකසිය විස්සක්ද, නිරය එකසිය තිහක්ද, අත් පා පිටු ආදී රාජොධාතු තිස් හයක්ද, ඔටු ගවාදී සංඥී ගර්භ සතක්ද, සාලියවාදී අසංඥී ගර්භ සතක්ද, උක් ආදී නිර්ඝණ්ඨී ගර්භ සතක්ද, දෙවයෝනි සතක්ද නොහොත් බොහෝ දෙවියෝද, මනුෂ්‍ය යෝනි සතක්ද නොහොත් බොහෝ මනුෂ්‍යයෝද, පිසාචයෝනි සතක්ද, මහාවිල් සතක්ද, ගැට සතක්ද, මහා ප්‍රපාත සතක්ද, කුඩා ප්‍රපාත එකසිය සතක්ද, මහා ස්වප්න සතක්ද, කුඩා ස්වප්න එකසිය හතක්ද චූලාසීති මහා කල්ප ලක්ෂයක්ද ගෙවා බාලයෝද, පණ්ඩිතයෝද, භවයෙන් භවය ගමන් කොට (සසර) සැරිසරා දුක් කෙළවර කරන්නාහ.

එහි මම මේ අචේලක සීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්යාවෙන් හෝ මුහුකිරීමට නොපැමිණි කර්මය හෝ මුහුකුරුවන්නෙමි. මුහුකිරීමට ගියාවූ කර්මය හෝ ස්පර්ශ කරමින් ගෙවීම කරන්නෙමැයි කියාද, මෙසේ නැත්තේය. නැලියෙන් මැණ ප්‍රමාණ කරණලද්ද මෙන් සසර සුවදුක් කියනලද කාල ප්‍රමාණයෙන් කෙළවර කළ කල්හි (සසර) අඩුවීමක් හෝ වැඩිවීමක් නැත්තේය. උසස් බවක් හෝ පහත් බවක් නැත්තේය. වෙලනලද නූල් බෝලයක් (පර්වතයක හෝ ගසක් අඩ සිට) විසිකරණලද්දේ යම්සේ ලිහෙමින්ම යයිද, (නූල අවසන්වූ කල්හි එහිම නතර වෙයිද) එපරිදිම බාලයෝද, පණ්ඩිතයෝද, භවයෙන් භවයට ගමන් කරමින් සුවදුක් කෙළවර කරති,' යන මේ දෘෂ්ටි උපදීද?"

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇත්තාහ. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය."

"මහණෙනි, එසේ නම් අසව්. මනාකොට මෙනෙහි කරව් කියන්නෙ මැයි" කීය.

"ස්වාමීනි, එසේයයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. "මහණෙනි, රූපය ඇතිකල්හි රූපය නිසා රූපය දැඩි වශයෙන් ගෙන රූපයට බැසගෙන 'මේ සත්වැදෑරුම් කායයෝ කිසිවෙකු විසින් නොකරණ ලදහ. කිසිවෙකුගේ විධානයෙන්ද නොකරණ ලදහ. කිසිවෙකු විසින් නිර්මානය නොකරන ලද, නිර්මානය නොකරවනලද, පර්වතකූටයක් මෙන් නිශ්චලවූ ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චලවූ ධර්ම සමූහ හතක් වෙත්. ඔව්හු නොසැලෙත්, ප්‍රකෘතිය නොහරිත්, ඔවුනොවුන්ට බාධා නොකරත්. ඔවුනොවුන්ට සැප පිණිස හෝ දුක් පිණිස හෝ සැප දුක් පිණිස හෝ නොසමත් වෙත්. ඒ සත් ධර්ම සමූහයෝ කවරහුද?

'පෘථිවිධාතු සමූහය, අපෝධාතු සමූහය, තේජෝධාතු සමූහය, වායෝධාතු සමූහය, සුඛධාතු සමූහය, දුක්ඛධාතු සමූහය, ජීවධාතු සමූහය, යන මේ ධාතු සමූහයා (කිසිවෙකු විසින්) නොකරණලදහ. කිසි විධානයක් නොකරණලදහ. කිසිවෙකු විසින් නොමවනලදහ. කිසිවෙකු විසින් මැවීම නොකරවන ලදහ. (ඵල රහිත හෙයින්) වඳයහ. පර්වතකූටයක් මෙන් නිශ්චලව සිටියහ. ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චලව සිටියාහ. ඔව්හු නොසැලෙත්, ප්‍රකෘතිය නොහරිත්, ඔවුනොවුන් නොගැටෙත්, සුව පිණිස හෝ දුක් පිණිස හෝ සුවදුක් පිණිස හෝ නොසමත් වෙත්. යමෙක් තියුණු ආයුධයකින් හිස සිඳීද, (එයින්) කිසිවෙක් කිසිවෙක් ජීවිතයෙන් තොර නොකරයිද සත්වැදෑරුම්වූ ශරීරයන්ගේ අතරෙන්ම ආයුධය ඇතුල් වෙයි, ගමන් කරයි.

'මේ වනාහි ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී උත්තම යෝනීන් සම්බන්ධ තුදුස්ලක්ෂ හයදහස් හයසියයක්ද, කර්ම පන්සියයක්ද, කර්ම පසක්ද, කර්ම තුනක්ද, කායවාග්කර්ම දෙකක්ද, මනෝකර්ම නම්වූ අර්ධකර්මයද, දෙසැටක් ප්‍රතිපදාවෝද, දෙසැටක් අන්තර කල්පයෝද, කෘෂ්ණාදී ශ්‍රෙෂ්ඨ ජාති සයක්ද, මන්දාදී පුරිෂ භූමි අටද, ආජීවකවෘත්ති එක්සිය නවසාළිසක්ද, පරිව්‍රාජක ප්‍රව්‍රජ්‍යා එකසිය සතළිස් නවයක්ද, නාග මණ්ඩල එකසිය හතළිස් නවයක්ද, ඉන්ද්‍රියය එකසිය විස්සක්ද, නිරය එකසිය තිහක්ද, අත් පා පිටු ආදී රාජොධාතු තිස්හයක්ද, ඔටු ගවාදී සංඥී ගර්භ සතක්ද, සාලියවාදී අසංඥී ගර්භ සතක්ද, උක් ආදී නිර්ඝණ්ඨී ගර්භ සතක්ද, දෙවයෝනි සතක්ද නොහොත් බොහෝ දෙවියෝද, මනුෂ්‍ය යෝනි සතක්ද නොහොත් බොහෝ මනුෂ්‍යයෝද, පිසාචයෝනි සතක්ද, මහාවිල්සතක්ද, ගැට සතක්ද, මහා ප්‍රපාත සතක්ද, කුඩා ප්‍රපාත එකසිය සතක්ද, මහා ස්වප්න සතක්ද, කුඩා ස්වප්න එකසිය හතක්ද, චූලාසීති මහා කල්ප ලක්ෂයක්ද ගෙවා බාලයෝද, පණ්ඩිතයෝද භවයෙන් භවය ගමන් කොට (සසර) සැරිසරා දුක් කෙළවර කරන්නාහ.

'එහි මම මේ අචේලක සීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්යාවෙන් හෝ මුහුකිරීමට නොපැමිණි කර්මය හෝ මුහුකුරුවන්නෙමි මුහුකිරීමට ගියාවූ කර්මය හෝ ස්පර්ශ කරමින් ගෙවීම කරන්නෙමැයි කියාද මෙසේ නැත්තේය. නැලියෙන් මැණ ප්‍රමාණ කරණලද්ද මෙන් සසර සුව දුක් කියනලද කාල ප්‍රමාණයෙන් කෙළවර කළ කල්හි (සසර) අඩුවීමක් හෝ වැඩිවීමක් නැත්තේය. උසස් බවක් හෝ පහත් බවක් නැත්තේය. වෙලනලද නූල් බෝලයක් (පර්වතයක හෝ ගසක් උඩ සිට) විසිකරණලද්දේ යම්සේ ලිහෙමින්ම යයිද, (නූල අවසන්වූ කල්හි එහිම නතර වෙයිද) එපරිදිම බාලයෝද පණ්ඩිතයෝද භවයෙන් භවයට ගමන් කරමින් සුවදුක් කෙළවර කරත්' යන මේ දෘෂ්ටි උපදියි.

**4.** "වේදනාව ඇති කල්හි වේදනාව නිසා වේදනාව දැඩි වශයෙන් ගෙන වේදනාවට බැසගෙන 'මේ සත්වැදෑරුම්

කායයෝ කිසිවෙකු විසින් නොකරණ ලද, කිසිවෙකුගේ විධානයෙන්ද නොකරණ ලද, කිසිවෙකු විසින් නිර්මානය නොකරනලද නිර්මානය නොකරවනලද පර්වත කූටයක් මෙන් නිශ්චලවූ ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චලවූ ධර්ම සමූහ හතක්වෙත්. ඔව්හු නොසැලෙත්, ප්‍රකෘතිය නොහරිත්, ඔවුනොවුන්ට බාධා නොකරත්. ඔවුනොවුන්ට සැප පිණිස හෝ දුක් පිණිස හෝ සැප දුක් පිණිස හෝ නොසමත් වෙත්. ඒ සත්ධර්ම සමූහයෝ කවරහුද?

"පෘථිවිධාතු සමූහය, ආපෝධාතු සමූහය, තේජෝ ධාතු සමූහය, වායෝධාතු සමූහය, සුඛධාතු සමූහය, දුක්ඛධාතු සමූහය, ජීවධාතු සමූහය යන මේ ධාතු සමූහයා (කිසිවෙකු විසින්) නොකරණලදහ. කිසි විධානයක් නොකරණලදහ. කිසිවෙකු විසින් නොමවනලදහ. කිසිවෙකු විසින් මැවීම නොකරවනලදහ. (ඵල රහිත හෙයින්) වඳයහ. පර්වතකූටයක් මෙන් නිශ්චලව සිටියහ. ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චලව සිටියාහ. ඔව්හු නොසැලෙත්, ප්‍රකෘතිය නොහරිත්, ඔවුනොවුන් නොගැටෙත්, සුව පිණිස හෝ දුක් පිණිස හෝ සුවදුක් පිණිස හෝ නොසමත් වෙත්. යමෙක් තියුණු ආයුධයකින් හිස සිඳීද (එයින්) කිසිවෙක් කිසිවෙක් ජීවිතයෙන් තොර නොකරයිද සත්වැදෑරුම්වූ ශරීරයන්ගේ අතරෙන්ම ආයුධය ඇතුල්වෙයි, ගමන් කරයි.

'මේ වනාහි ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී උත්තම යෝනීන් සම්බන්ධ තුදුස්ලක්ෂ හයදහස් හයසියයක්ද, කර්ම පන්සියයක්ද, කර්ම පසක්ද, කර්ම තුනක්ද, කායවාක්කර්ම දෙකක්ද, මනෝකර්ම නම්වූ අර්ධකර්මයද, දෙසැටක් ප්‍රතිපදාවෝද, දෙසැටක් අන්තර කල්පයෝද, කෘෂ්ණාදී ශ්‍රෙෂ්ඨ ජාති සයක්ද, මන්දාදී පුරිෂ භූමි අටද, ආජීවකවෘත්ති එක්සිය නවසාළිසක්ද, පරිව්‍රාජක ප්‍රව්‍රජ්‍යා එකසිය සතළිස් නවයක්ද, නාග මණ්ඩල එකසිය හතළිස් නවයක්ද, ඉන්ද්‍රියය එකසිය විස්සක්ද, නිරය එකසිය තිහක්ද, අත් පා පිටු ආදී රාජොධාතු තිස් හයක්ද, ඔටු ගවාදී සංඥී ගර්භ සතක්ද, සාලියවාදී අසංඥී ගර්භ සතක්ද, උක් ආදී නිර්ඝණ්ඨී ගර්භ සතක්ද, දෙවයෝනි සතක්ද නොහොත් බොහෝ

දෙවියෝද, මනුෂ්‍ය යෝනි සතක්ද නොහොත් බොහෝ මනුෂ්‍යයෝද, පිසාචයෝනි සතක්ද, මහාවිල් සතක්ද, ගැට සතක්ද, මහා ප්‍රපාත සතක්ද, කුඩා ප්‍රපාත එකසිය සතක්ද, මහා ස්වප්න සතක්ද, කුඩා ස්වප්න එකසිය හතක්ද, චූලාසීනි මහා කල්ප ලක්ෂයක්ද ගෙවා බාලයෝද, පණ්ඩිතයෝද භවයෙන් භවය ගමන් කොට (සසර) සැරිසරා දුක් කෙළවර කරන්නාහ.

"එහි මම මේ අචේලක සීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්යාවෙන් හෝ මුහුකිරීමට නොපැමිණි කර්මය හෝ මුහුකුරුවන්නෙමි. මුහුකිරීමට ගියාවූ කර්මය හෝ ස්පර්ශ කරමින් ගෙවීම කරන්නෙමැයි කියාද මෙසේ නැත්තේය. නැලියෙන් මැණ ප්‍රමාණ කරණලද්ද මෙන් සසර සුව දුක් කියනලද කාල ප්‍රමාණයෙන් කෙළවර කළ කල්හි (සසර) අඩුවීමක් හෝ වැඩිවීමක් නැත්තේය. උස් බවක් හෝ පහත් බවක් නැත්තේය. වෙලනලද නූල් බෝලයක් (පර්වතයක හෝ ගසක් උඩ සිට) විසිකරණ ලද්දේ යම්සේ ලිහෙමින්ම යයිද, (නූල අවසන්වූ කල්හි එහිම නතර වෙයිද) එපරිදිම බාලයෝද පණ්ඩිතයෝද භවයෙන් භවයට ගමන් කරමින් සුවදුක් කෙළවර කරත්, යන දෘෂ්ටිය උපදියි.

**5.** "සංඥාව ඇති කල්හි සංඥාව නිසා සංඥාව දැඩි වශයෙන් ගෙන සංඥාවට බැසගෙන 'මේ සත්වැදෑරුම් කායයෝ කිසිවෙකු විසින් නොකරණ ලද, කිසිවෙකුගේ විධානයෙන්ද නොකරණ ලද, කිසිවෙකු විසින් නිර්මාණය නොකරන ලද නිර්මානය නොකරවන ලද, පර්වත කූටයක් මෙන් නිශ්චලවූ ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චලවූ ධර්ම සමූහ හතක් වෙත්. ඔව්හු නොසැලෙත්. ප්‍රකෘතිය නොහරිත්. ඔවුනොවුන්ට බාධා නොකරත්. ඔවුනොවුන්ට සැප පිණිස හෝ දුක් පිණිස හෝ සැප දුක් පිණිස හෝ නොසමත් වෙත්. ඒ සත්ධර්ම සමූහයෝ කවරහුද?

'පෘථිවිධාතු සමූහය, ආපෝධාතු සමූහය තෙජෝ ධාතු සමූහය, වායෝධාතු සමූහය, සුඛධාතු සමූහය, දුක්ඛධාතු සමූහය, ජීවධාතු සමූහය යන මේ ධාතු සමූහයා (කිසිවෙකු විසින්) නොකරණ ලදහ. කිසි විධානයක් නොකරණ ලදහ. කිසිවෙකු විසින්

නොමවන ලදහ. කිසිවෙකු විසින් මැවීම නොකරවන ලදහ. (ඵල රහිත හෙයින්) වඳයහ. පර්වතකූටයක් මෙන් නිශ්චලව සිටියහ. ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චලව සිටියාහ. ඔව්හු නොසැලෙත්, ප්‍රකෘතිය නොහරිත්, ඔවුනොවුන් නොගැටෙත්, සුව පිණිස හෝ දුක් පිණිස හෝ සුව දුක් පිණිස හෝ නොසමත් වෙත්. යමෙක් තියුණු ආයුධයකින් හිස සිඳීද (එයින්) කිසිවෙක් ජීවිතයෙන් තොර නොකරයිද, සත්වැදෑරුම්වූ ශරීරයන්ගේ අතරෙන්ම ආයුධය ඇතුල්වෙයි. ගමන් කරයි.

'මේ වනාහි ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී උත්තම යෝනීන් සම්බන්ධ තුදුස් ලක්ෂ හයදහස් හයසියයක්ද, කර්මපන්සියයක්ද කර්ම පසක්ද, කර්ම තුනක්ද, කායවාග් කර්ම දෙකක්ද, මනෝ කර්ම නම්වූ අර්ධකර්මයද, දෙසැටක් ප්‍රතිපදාවෝද, දෙසැටක් අන්තර කල්පයෝද, කෘෂ්ණාදී ශ්‍රෙෂ්ඨ ජාති සයක්ද, මන්දාදී, පුරිෂභූමි අටද, ආජීවක වෘත්ති එකසිය නවසාළිසක්ද පරිව්‍රාජක ප්‍රව්‍රජ්‍යා එකසිය හතළිස් නවයක්ද, නාග මණ්ඩල එකසිය හතළිස් නවයක්ද, ඉන්ද්‍රියය එකසිය විස්සක්ද, නිරය එකසිය තිහක්ද, අත් පා පිටු ආදී රජෝධාතු තිස් හයක්ද, ඔටු ගවාදී සංඥි ගර්භ සතක්ද, සාලියවාදී අසංඥි ගර්භ සතක්ද, උක් ආදී නිර්ඝණ්ඨික ගර්භ සතක්ද, දේවයෝනි සතක්ද නොහොත් බොහෝ දෙවියෝද, මනුෂ්‍ය යෝනි සතක්ද නොහොත් බොහෝ මනුෂ්‍යයෝද, පිසාච යෝනි සතක්ද, මහාවිල් සතක්ද, ගැට සතක්ද, මහා ප්‍රපාත සතක්ද, කුඩා ප්‍රපාත එකසියසතක්ද, මහා ස්වප්න සතක්ද, කුඩා ස්වප්න එකසියසතක්ද, චූලාසීති මහාකල්ප ලක්ෂයක්ද ගෙවා බාලයෝද, පණ්ඩිතයෝද භවයෙන් භවය ගමන්කොට (සසර) සැරිසරා දුක් කෙළවර කරන්නාහ.

'එහි මම මේ අචේලක සීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්යාවෙන් හෝ මුහුකිරීමට නොපැමිණි කර්මය හෝ මුහුකුරුවන්නෙමි. මුහුකිරීමට ගියාවූ කර්මය හෝ ස්පර්ශ කරමින් ගෙවීම කරන්නෙමැයි කියාද මෙසේ නැත්තේය. නැලියෙන් මැන ප්‍රමාණ කරන ලද්ද මෙන් සසර සුව දුක් කියන ලද කාල ප්‍රමාණයෙන් කෙළවර කළ කල්හි (සසර) අඩුවීමක් හෝ

වැඩිවීමක් නැත්තේය. උසස් බවක් හෝ පහත් බවක් නැත්තේය. වෙලනලද නූල් බෝලයක් (පර්වතයක හෝ ගසක් උඩ සිට) විසිකරණ ලද්දේ යම්සේ ලිහෙමින්ම යයිද, (නූල අවසන්වූ කල්හි එහිම නතර වෙයිද) එපරිදිම බාලයෝද, පණ්ඩිතයෝද භවයෙන් භවයට ගමන්කරමින් සුව දුක් කෙළවර කරති' යන මේ දෘෂ්ටිය උපදියි.

**6.** "සංස්කාර ඇති කල්හි සංස්කාර නිසා සංස්කාර දැඩි වශයෙන්ගෙන සංස්කාරයන්ට බැසගෙන 'මේ සත්වැදෑරුම් කායයෝ කිසිවෙකු විසින් නොකරණ ලද, කිසිවෙකුගේ විධානයෙන්ද නොකරණ ලද, කිසිවෙකු විසින් නිර්මානය නොකරණ ලද නිර්මානය නොකරවන ලද පර්වත කූටයක් මෙන් නිශ්චලවූ ඉන්ද්‍රඛීලයක්මෙන් නිශ්චලවූ ධර්ම සමූහ හතක්වෙත්. ඔවුහු නොසැලෙත්, ප්‍රකෘතිය නොහරිත්, ඔවුනොවුන්ට බාධා නොකරත්, ඔවුනොවුන්ට සැප පිණිස හෝ දුක් පිණිස හෝ සැප දුක් පිණිස හෝ නොසමත් වෙත්. ඒ සත්ධර්ම සමූහයෝ කවරහුද?

'පෘථිවිධාතු සමූහය, ආපෝධාතු සමූහය, තේජෝධාතු සමූහය, වායෝධාතු සමූහය, සුඛධාතු සමූහය, දුක්ඛධාතු සමූහය ජීවධාතු සමූහය යන මේ ධාතු සමූහ සත (කිසිවෙකු විසින්) නොකරණ ලදහ. කිසිවිධානයක් නොකරණ ලදහ. කිසිවෙකු විසින් නොමවන ලදහ. කිසිවෙකු විසින් මැවීම නොකරවන ලදහ. (ඵල රහිත හෙයින්) වඳයහ. පර්වතකූටක් මෙන් නිශ්චලව සිටියහ. ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චලව සිටියාහ. ඔව්හු නොසැලෙත්, ප්‍රකෘතිය නොහරිත්, ඔවුනොවුන් නොගැටෙත්, සුව පිණිස හෝ දුක් පිණිස හෝ සුවදුක් පිණිස හෝ නොසමත් වෙත්. යමෙක් තියුණු ආයුධයකින් හිස සිඳීද (එයින්) කිසිවෙක්, කිසිවෙක් ජීවිතයෙන් තොර නොකරයිද, සත් වැදෑරුම්වූ ශරීරයන්ගේ අතරෙන්ම ආයුධය ඇතුල්වෙයි, ගමන් කරයි.

'මේ වනාහි ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී උත්තම යෝනීන් සම්බන්ධ තුදුස්ලක්ෂ හයදහස්හයසියයක්ද, කර්ම පන්සියයක්ද, කර්ම පසක්ද කර්ම තුනක්ද, කාය වාග්කර්ම දෙකක්ද, මනෝකර්ම

නම්වූ අර්ධ කර්මයද, දෙසැටක් ප්‍රතිපදාවෝද, දෙසැටක් අන්තර කල්පයෝද කෘෂ්ණාදී ශ්‍රෙෂ්ඨ ජාති සයක්ද, මන්දාදී පුරිෂ භූමි අටද, ආජීවකවෘත්ති එක්සිය නවසාළිසක්ද, පරිව්‍රාජක ප්‍රව්‍රජ්‍යා එකසිය හතලිස් නවයක්ද, නාග මණ්ඩල එකසිය හතළිස් නවයක්ද, ඉන්ද්‍රියය එකසිය විස්සක්ද, නිරය එකසිය තිහක්ද, අත් පා පිටු ආදී රාජොධාතු තිස් හයක්ද, ඔටු ගවාදී සංඥි ගර්භ සතක්ද, සාලියවාදී අසංඥි ගර්භ සතක්ද, උක් ආදී නිර්සණ්ඨි ගර්භ සතක්ද, දේවයෝනි සතක්ද නොහොත් බොහෝ දෙවියෝද, මනුෂ්‍යයෝනි සතක්ද නොහොත් බොහෝ මනුෂ්‍යයෝද, පිසාච යෝනි සතක්ද මහාවිල් සතක්ද, ගැට සතක්ද, මහා ප්‍රපාත සතක්ද, කුඩා ප්‍රපාත එකසිය සතක්ද, මහා ස්වප්න සතක්ද, කුඩා ස්වප්න එකසියසතක්ද, චූලාසීති මහා කල්ප ලක්ෂයක්ද, ගෙවා බාලයෝද, පණ්ඩිතයෝද භවයෙන් භවය ගමන්කොට (සසර) සැරිසරා දුක් කෙළවර කරන්නාහ.

'එහි මම මේ අචේලක සීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්යාවෙන් හෝ මුහුකිරීමට නොපැමිණි කර්මය හෝ මුහුකුරුවන්නෙමි. මුහුකිරීමට ගියාවූ කර්මය හෝ ස්පර්ශ කරමින් ගෙවීම කරන්නෙමැයි කියාද මෙසේ නැත්තේය. නැලියෙන් මැණ ප්‍රමාණකරන ලද්ද මෙන් සසර සුව දුක් කියන ලද කාල ප්‍රමාණයෙන් කෙළවර කළ කල්හි (සසර) අඩුවීමක් හෝ වැඩිවීමක් නැත්තේය. උස් බවක් හෝ පහත් බවක් නැත්තේය. වෙලන ලද නූල් බෝලයක් (පර්වතයක හෝ ගසක් උඩ සිට) විසිකරණ ලද්දේ යම්සේ ලිහෙමින්ම යයිද, (නූල අවසන්වූ කල්හි එහිම නතර වෙයිද) එපරිද්දෙන්ම බාලයෝද, පණ්ඩිතයෝද භවයෙන් භවයට ගමන් කරමින් සුවදුක් කෙළවර කරත්' යන මේ දෘෂ්ටිය උපදියි.

7. "විඤ්ඤාණය ඇතිකල්හි, විඤ්ඤාණය නිසා විඤ්ඤාණය දැඩිවශයෙන් ගෙන, විඤ්ඤාණයට බැසගෙන 'මේ සත්වැදෑරුම් කායයෝ කිසිවෙකු විසින් නොකරණ ලද කිසිවෙකුගේ විධානයෙන්ද නොකරණ ලද, කිසිවෙකු විසින් නිර්මාණය නොකරනලද, නිර්මානය නොකරවනලද පර්වත කූටයක් මෙන්

නිශ්චලවූ, ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චලවූ, ධර්ම සමූහ හතක් වෙත්. ඔව්හු නොසැලෙත්, ප්‍රකෘතිය නොහරිත්, ඔවුනොවුන්ට බාධා නොකරත්. ඔවුනොවුන්ට සැප පිණිස හෝ දුක් පිණිස හෝ සැප දුක් පිණිස හෝ නොසමත් වෙත්. ඒ සත්ධර්ම සමූහයෝ කවරහුද?

'පෘථිවිධාතු සමූහය, ආපෝධාතු සමූහය, තේජෝධාතු සමූහය, වායෝධාතු සමූහය, සුඛධාතු සමූහය, දුක්ඛධාතු සමූහය, ජීවධාතු සමූහය යන මේ ධාතු සමූහයා (කිසිවෙකු විසින්) නොකරණ ලදහ. කිසි විධානයක් නොකරණ ලදහ. කිසිවෙකු විසින් නොමවනලදහ. කිසිවෙකු විසින් මැවීම නොකරවන ලදහ. (ඵල රහිත හෙයින්) වඳයහ. පර්වතකූටයක් මෙන් නිශ්චලව සිටියහ. ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චලව සිටියාහ. ඔව්හු නොසැලෙත්, ප්‍රකෘතිය නොහරිත්, ඔවුනොවුන් නොගැටෙත්. සුව පිණිස හෝ දුක් පිණිස හෝ සුව දුක් පිණිස හෝ නොසමත් වෙත්. යමෙක් තියුණු ආයුධයකින් හිස සිඳීද, (එයින්) කිසිවෙක්, කිසිවෙක් ජීවිතයෙන් තොර නොකරයිද සත්වැදෑරුම්වූ ශරීරයන්ගේ අතරෙන්ම ආයුධය ඇතුල්වෙයි, ගමන් කරයි.

'මේ වනාහි ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී උත්තම යෝනීන් සම්බන්ධ තුදුස්ලක්ෂ හයදහස් හයසියයක්ද, කර්ම පන්සියයක්ද, කර්ම පසක්ද, කර්ම තුනක්ද, කාය වාග් කර්ම දෙකක්ද, මනෝ කර්ම නම්වූ අර්ධකර්මයද, දෙසැටක් ප්‍රතිපදාවෝද, දෙසැටක් අන්තර කල්පයෝද, කෘෂ්ණාදි ශ්‍රේෂ්ඨ ජාති සයක්ද, මන්දාදී පුරිෂභූමි අටද, ආජීවක වෘත්ති එක්සිය නවසාළිසක්ද, පරිව්‍රාජික ප්‍රව්‍රජ්‍යා එකසිය සතළිස් නවයක්ද, නාගමණ්ඩල එකසිය හතළිස් නවයක්ද, ඉන්ද්‍රියය එකසිය විස්සක්ද, නිරය එකසිය තිහක්ද, අත් පා පිටු ආදී රාජොධාතු තිස් හයක්ද, ඔටු ගවාදී සංඥි ගර්භ සතක්ද, සාලියවාදී අසංඥි ගර්භ සතක්ද, උක් ආදී නිර්ඝණ්ඨි ගර්භ සතක්ද, දෙවයෝනි සතක්ද නොහොත් බොහෝ දෙවියෝද, මනුෂ්‍ය යෝනි සතක්ද නොහොත් බොහෝ මනුෂ්‍යයෝද, පිසාච යෝනි සතක්ද, මහා විල් සතක්ද, ගැට සතක්ද, මහා ප්‍රපාත සතක්ද, කුඩා ප්‍රපාත එකසිය සතක්ද,

මහා ස්වප්න සතක්ද, කුඩා ස්වප්න එකසිය සතක්ද, චූලාසීති මහා කල්ප ලක්ෂයක්ද ගෙවා බාලයෝද, පණ්ඩිතයෝද, භවයෙන් භවය ගමන්කොට (සසර) සැරිසරා දුක් කෙළවර කරන්නාහ.

'එහි මම මේ අචේලක සීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්යාවෙන් හෝ මුහුකිරීමට නොපැමිණි කර්මය හෝ මුහුකුරු වන්නෙමි. මුහුකිරීමට ගියාවූ කර්මය හෝ ස්පර්ශ කරමින් ගෙවීම කරන්නෙමැයි කියාද, මෙසේ නැත්තේය. නැලියෙන් මැණ ප්‍රමාණ කරණ ලද්ද මෙන් සසර සුව දුක් කියනලද කාල ප්‍රමාණයෙන් කෙළවර කළ කල්හි (සසර) අඩුවීමක් හෝ වැඩිවීමක් නැත්තේය. උසස් බවක් හෝ පහත් බවක් නැත්තේය. වෙලනලද නූල් බෝලයක් (පර්වතයක හෝ ගසක් උඩ සිට) විසිකරණ ලද්දේ යම්සේ ලිහෙමින්ම යයිද, (නූල අවසන්වූ කල්හි එහිම නතර වෙයිද) එපරිදිම බාලයෝද, පණ්ඩිතයෝද භවයෙන් භවයට ගමන් කරමින් සුව දුක් කෙළවර කරත්' යන දෘෂ්ටිය උපදියි.

8. "මහණෙනි, ඒ කුමැයි සිතව්ද? රූපය නිත්‍යය හෝ අනිත්‍ය හෝ වෙයිද? - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද දුකද වෙනස්වන ස්වභාවද එය දැඩි වශයෙන් නොගෙන 'මේ සත්වැදෑරුම් කායයෝ කිසිවෙකු විසින් නොකරණ ලදහ. කිසිවෙකුගේ විධානය නොකරණ ලදහ. නොමවන ලදහ, මැවීම නොකරවන ලදහ. කිසිවෙකු නූපදවන හෙයින් වඳයහ. පර්වත කූටයක් මෙන් නිශ්චලව සිටියහ. ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චලව සිටියහ. ඔවුහු කම්පා නොවෙත්. විකෘතියකට නොපැමිණෙත්. ඔවුනොවුන් නොගැටෙත්. ඔවුනොවුන්ට සැප පිණිස හෝ දුක් පිණිස හෝ සැප දුක් පිණිස හෝ නොසමත් වෙත්. ඒ සත කවරහුද යත්?

'පෘථිවි සමූහය, ආපෝ සමූහය, තේජෝ සමූහය, වායෝ සමූහය, සුඛය, දුකය ජීවය යන මේ සමූහ සත කිසිවෙකු විසින් නොකරණ ලදහ. විධානය නොකරණ ලදහ. කිසිවෙකු විසින්

නිර්මිතද නොකරණ ලදහ. නිර්මිත නොකරවන ලදහ. වඳයහ. පර්වතයක් මෙන් නිශ්චලව සිටියහ. ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චලව සිටියහ. ඔවුහු කම්පා නොවෙත්. වෙනසකටද නොපැමිණෙත්. ඔවුනොවුන්ට බාධා නොකෙරෙත්. ඔවුනොවුන්ට සුව පිණිසද දුක් පිණිසද සුවදුක් පිණිසද නොසමත් වෙත්. යමෙකුන් තියුණු ආයුධයකින් හිස සිඳිත්ද, කිසිවෙක් කිසිවෙකුත් ජීවිතය තොර නොකරත්ද සත් වැදෑරුම් ධාතුන්ගේ සිදුරු අතරෙන්ම ආයුධය ගමන් කරයි.

'ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී ප්‍රධාන යෝනීන් සම්බන්ධ දසසතර ලක්ෂ දහදහස් හය සියයක්ද, කර්ම පන්සියයක්ද, කර්ම පසක්ද කර්ම තුනක්ද, කාය වාග් කර්ම දෙකක්ද, මනෝකර්ම නම් අර්ධ කර්මයද, දෙසැටක් ප්‍රතිපදාවෝද, දෙසැටක් අන්තර්කල්පයෝද, කෘෂ්ණාදී ජාති සයක්ද, පුරිෂ භූමි අටක්ද, එක්සිය නවසාළිස් ආජීවකාවන්ද, එක්සිය නවසාළිස් පරිව්‍රාජක ප්‍රව්‍රජ්‍යාවෝද, එක්සිය නවසාළිස් නාග මණ්ඩලයෝද, එක්සිය විසි ඉන්ද්‍රියයෝද, එකසියතිස් නිරයෝද, අත් පා පිටු ආදී සතිස් රාජෝධාතුහුද ඔටු ගවාදී සංඥී ගැබ් සතක්ද, සාලියවාදී අසංඥී ගැබ්සතක්ද, උක් ආදී නිර්ඝණ්ඨික ගැබ්සතක්ද දිව්‍ය නිකාය සතක්ද, මනුෂ්‍ය යෝනි සතක්ද, පිසාච යෝනි සතක්ද, මහා විල්සතක්ද, ගැට සතක්ද, මහා ප්‍රපාත සතක්ද, කුඩා ප්‍රපාත එකසිය සතක්ද, මහා ස්වප්න සතක්ද, කුඩා ස්වප්න එකසිය සතක්ද, වෙත්. චුල්ලාසීති මහා කල්පලක්ෂයක් බාලයෝද, පණ්ඩිතයෝද, භවයෙන් භවයට ගමන්කොට සැරිසරා දුක් කෙළවර කරන්නාහ.

'එහි මම මේ අචේලක සීලයත් නිසා හෝ මේ ව්‍රතය නිසා හෝ මේ තපස නිසා හෝ බ්‍රහ්මචර්යාව නිසා හෝ නුමුහු කිරීමට ගියාවූ කර්මය හෝ මුහුකරවන්නෙමි. මුහු කිරීමට ගියාවූ කර්මය හෝ ස්පර්ශකරමින් ගෙවන්නෙමියි කියා මෙසේ නැත්තේය. නැළියෙන් මැණ ප්‍රමාණකරණ ලද්දක් මෙන් සුවදුක් (කියනලද කාල ප්‍රමාණයෙන්) කෙළවර කල කල්හි සසරෙහි, අඩුවීමක් හෝ වැඩිවීමක් හෝ නැත්තේය. උසස් බවක් හෝ

පහත් බවක් නැත්තේය. පර්වතයක හෝ ගසක් උඩ හෝ සිට විසි කරණ ලද නූල් බෝලයක් යම්සේ නොපැකිලීම යයිද (නූල අවසන්වූ කල්හි එහිම සිටීද) එපරිද්දෙන්ම බාලයෝද පණ්ඩිතයෝද කාලයාගේ වශයෙන් නොපැකිලෙන්නාහු සුව දුක් කෙළවර කරත්' යන මේ දෘෂ්ටි උපදනේද?" - "ස්වාමීනි, මෙය නොවන්නේමය."

**9.** "වේදනාව නිත්‍යය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකයි."

"යමක්වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩි වශයෙන් නොගෙන 'මේ සත්වැදෑරුම් කායයෝ කිසිවෙකු විසින් නොකරණ ලදහ. කිසිවෙකුගේ විධානය නොකරණ ලදහ. නොමවන ලදහ. මැවීම නොකරවන ලදහ. කිසිවෙකු නූපදවන හෙයින් වඳයහ. පර්වත කූටයක් මෙන් නිශ්චලව සිටියහ. ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චලව සිටියහ. ඔවුහු කම්පා නොවෙත්. විකෘතියකට නොපැමිණෙත්. ඔවුනොවුන් නොගැටෙත්. ඔවුනොවුන්ට සැප පිණිස හෝ දුක් පිණිස හෝ සැපදුක් පිණිස හෝ නොසමත් වෙත්. ඒ සත කවරහුද යත්?

'පෘථිවි සමූහය, ආපෝ සමූහය, තේජෝ සමූහය, වායෝ සමූහය, සුඛය දුකය ජීවය යන මේ සමූහ සත කිසිවෙකු විසින් නොකරණ ලදහ. විධානය නොකරණ ලදහ. කිසිවෙකු විසින් නිර්මිතද නොකරණ ලදහ. නිර්මිත නොකරවන ලදහ. වඳයහ. පර්වතයක් මෙන් නිශ්චලව සිටියහ. ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චලව සිටියහ. ඔවුහු කම්පා නොවෙත් වෙනසකටද නොපැමිණෙත්. ඔවුනොවුන්ට බාධා නොකෙරෙත්. ඔවුනොවුන්ට සුව පිණිසද දුක් පිණිද සුවදුක් පිණිසද නොසමත් වෙත්. යමෙකුන් තියුණු ආයුධයකින් හිස සිඳිත්ද, කිසිවෙක් කිසිවෙකුත් ජීවිතය තොර නොකරත්ද, සත් වැදෑරුම් ධාතූන්ගේ සිදුරු අතරෙන්ම ආයුධය ගමන් කරයි.

'ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී ප්‍රධාන යෝනීන් සම්බන්ධ දසසතර ලක්ෂ හයදහස් හයසියයක්ද, කර්ම පන්සියයක්ද, කර්ම පසක්ද,

කර්ම තුනක්ද, කාය වාග්කර්ම දෙකක්ද, මනෝ කර්ම නම් අර්ධ කර්මයද, දෙසැටක් ප්‍රතිපදාවෝද, දෙසැටක් අන්තර් කල්පයෝද, කෘෂ්ණාදි ජාති සයක්ද, පුරිෂ භූමි අටක්ද, එක්සිය නවසාළිස් ආජීවකාවන්ද, එක්සිය නවසාළිස් පරිව්‍රාජක ප්‍රව්‍රජ්‍යාවෝද, එක්සිය නවසාළිස් නාගමණ්ඩලයෝද, එක්සිය විසි ඉන්ද්‍රියයෝද, එකසියතිස් නිරයෝද සතිස් රාජෝධාතූහුද, ඔටු ගවාදී සංඥී ගැබ් සතක්ද, සාලියවාදී අසංඥී ගැබ් සතක්ද, උක් ආදී නිර්සණ්ඨික ගැබ් සතක්ද, දිව්‍ය නිකාය සතක්ද, මනුෂ්‍යයෝනි සතක්ද, පිසාචයෝනි සතක්ද, මහාවිල් සතක්ද, ගැට සතක්ද, මහා ප්‍රපාත සතක්ද, කුඩා ප්‍රපාත එකසිය සතක්ද, මහා ස්වප්න සතක්ද, කුඩා ස්වප්න එකසිය සතක්ද, වෙත්. චුල්ලාසීති මහා කල්ප ලක්ෂයක් බාලයෝද, පණ්ඩිතයෝද, භවයෙන් භවයට ගමන් කොට සැරිසරා දුක් කෙළවර කරන්නාහ.

'එහි මම, මේ අචේලක සීලයන් නිසා හෝ මේ ව්‍රතය නිසා හෝ මේ තපස නිසා හෝ බ්‍රහ්මචර්යාව නිසා හෝ නුමුහු කිරීමට ගියා වූ කර්මය හෝ මුහුකරවන්නෙමි. මුහුකිරීමට ගියාවූ කර්මය හෝ ස්පර්ශ කරමින් ගෙවන්නෙමියි කියා මෙසේ නැත්තේය. නැළියෙන් මැණ ප්‍රමාණ කරණ ලද්දක් මෙන් සසර සුවදුක් (කියනලද කාල ප්‍රමාණයෙන්) කෙළවර කළ කල්හි සසරෙහි, අඩුවීමක් හෝ වැඩිවීමක් හෝ නැත්තේය. උසස් බවක් හෝ පහත් බවක් නැත්තේය. පර්වතයක හෝ ගසක් උඩ හෝ සිට වීසිකරණ ලද නූල් බෝලයක් යම්සේ නොපැකිලීම යයිද (නූල අවසන්වූ කල්හි එහිම සිටීද) එපරිද්දෙන්ම බාලයෝද පණ්ඩිතයෝද කාලයාගේ වශයෙන් නොපැකිලෙන්නාහු සුවදුක් කෙළවර කරත්.' යන මේ දෘෂ්ටි උපදනේද?" - "ස්වාමීනි, මෙය නොවන්නේමය."

**10.** "සංඥාව නිත්‍යය හෝ අනිත්‍යය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි දුකයි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"යමක්වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩි වශයෙන් නොගෙන 'මේ සත්වැදෑරුම් කායයෝ කිසිවෙකු විසින් නොකරන ලදහ. කිසිවෙකුගේ විධානය නොකරණ ලදහ. නොමවන ලදහ. මැවීම නොකරවන ලදහ. කිසිවෙකු නූපදවන ලද හෙයින් වඳයහ. පර්වත කූටයක් මෙන් නිශ්චලව සිටියහ. ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චලව සිටියහ. ඔවුහු කම්පා නොවෙත්. විකෘතියකට නොපැමිණෙත්. ඔවුනොවුන් නොගැටෙත්. ඔවුනොවුන්ට සැප පිණිස හෝ දුක පිණිස හෝ සැපදුක් පිණිස හෝ නොසමත් වෙත්. ඒ සත කවරහුද යත්?

'පෘථිවි සමූහය, ආපෝ සමූහය, තේජෝ සමූහය, වායෝ සමූහය, සුඛය, දුකය ජීවය යන මේ සමූහ සත කිසිවෙකු විසින් නොකරණ ලදහ. විධානය නොකරණ ලදහ. කිසිවෙකු විසින් නිර්මිතද නොකරණ ලදහ. නිර්මිත නොකරවන ලදහ. වඳයහ. පර්වතයක් මෙන් නිශ්චලව සිටියහ. ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චලව සිටියහ. ඔවුහු කම්පා නොවෙත්. වෙනසකටද නොපැමිණෙත් ඔවුනොවුන්ට බාධා නොකෙරෙත්, ඔවුනොවුන්ට සුව පිණිසද දුක් පිණිසද සුවදුක් පිණිසද නොසමත් වෙත්. යමෙකුන් තියුණු ආයුධයකින් හිස සිඳිත්ද, කිසිවෙක් කිසිවෙකුන් ජීවිතය තොර නොකරත්ද සත් වැදෑරුම් ධාතුන්ගේ සිදුරු අතරෙන්ම ආයුධය ගමන් කරයි.

"ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී ප්‍රධාන යෝනීන් සම්බන්ධ දසසතර ලක්ෂ හයදහස් හයසියයක්ද, කර්ම පන්සියයක්ද, කර්ම පසක්ද, කර්ම තුනක්ද, කායවාග් කර්ම දෙකක්ද, මනෝ කර්ම නම් අර්ධ කර්මයද දෙසැටක් ප්‍රතිපදාවෝද දෙසැටක් අන්තර් කල්පයෝද, කෘෂ්ණාදී ජාති සයක්ද, පුරිෂ භූමි අටක්ද, එක්සිය නවසාළිස් ආජීවකාවන්ද, එක්සිය නවසාළිස් පරිව්‍රාජක ප්‍රව්‍රජ්‍යාවෝද, එක්සිය නවසාළිස් නාගමණ්ඩලයෝද, එක්සිය විසි ඉන්ද්‍රියයෝද එකසිය තිස් නිරයෝද සතිස් රාජෝධාතූහුද, ඔටු ගව ආදී සංඥී ගැබ් සතක්ද, සාලියවාදී අසංඥී ගැබ් සතක්ද, උක් ආදී නිර්ඝණ්ඨී ගැබ් සතක්ද, දිව්‍ය නිකාය සතක්ද, මනුෂ්‍යයෝනි සතක්ද, පිසාච යෝනි සතක්ද, මහා විල් සතක්ද,

ගැට සතක්ද, මහා ප්‍රපාත සතක්ද, කුඩා ප්‍රපාත එකසිය සතක්ද, මහාස්වප්න සතක්ද, කුඩා ස්වප්න එක්සිය සතක්ද වෙත්. චුල්ලාසීති මහා කල්පලක්ෂයක් බාලයෝද, පණ්ඩිතයෝද, භවයෙන් භවයට ගමන් කොට සැරිසරා දුක් කෙළවරකරන්නාහ.

"එහි මම මේ අචේලක සීලයෙන් නිසා හෝ මේ ව්‍රතය නිසා හෝ මේ තපස නිසා හෝ බ්‍රහ්මචර්යාව නිසා හෝ නුමුහු කිරීමට ගියාවූ කර්මය හෝ මුහුකරවන්නෙමි. මුහු කිරීමට ගියාවූ කර්මය හෝ ස්පර්ශ කරමින් ගෙවන්නෙමියි කියා මෙසේ නැත්තේය. නැළියෙන් මැන ප්‍රමාණ කරණ ලද්දක් මෙන් සසර සුවදුක් (කියනලද කාල ප්‍රමාණයෙන්) කෙළවර කළ කල්හි සසරෙහි, අඩුවීමක් හෝ වැඩිවීමක් හෝ නැත්තේය. උසස් බවක් හෝ පහත් බවක් නැත්තේය. පර්වතයක හෝ ගසක් උඩ හෝ සිට වීසි කරණ ලද නූල් බෝලයක් යම්සේ නොපැකිලීම යයිද? (නූල අවසන්වූ කල්හි එහිම සිටීද) එපරිද්දෙන්ම බාලයෝද පණ්ඩිතයෝද කාලයාගේ වශයෙන් නොපැකිලෙන්නාහු සුව දුක් කෙළවර කරත් යන මේ දෘෂ්ටි උපදනේද?" - "ස්වාමීනි, මෙය නොවන්නේමය."

"සංස්කාරයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද? "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍යනම් එය දුකද, සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස් වන ස්වභාවද එය දැඩි වශයෙන් නොගෙන 'මේ සත් වැදෑරුම් කායයෝ කිසිවෙකු විසින් නොකරණ ලදහ. කිසිවෙකුගේ විධානය නොකරණ ලදහ. නොමවන ලදහ. මැවීම නොකරවන ලදහ. කිසිවෙකු නූපදවන හෙයින් වඳයහ. පර්වත කූටයක් මෙන් නිශ්චලව සිටියහ. ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චලව සිටියහ. ඔවුහු කම්පා නොවෙත්. විකෘතියකට නොපැමිණෙත්. ඔවුනොවුන් නොගැටෙත්. ඔවුනොවුන්ට සැප පිණිස හෝ දුක පිණිස හෝ සැප දුක් පිණිස හෝ නොසමත් වෙත්. ඒ සත කවරහුද යත්?

පෘථිවි සමූහය, ආපෝ සමූහය, තෙජෝ සමූහය, වායෝ සමූහය, සුඛය, දුකය ජීවය යන මේ සමූහ සත කිසිවෙකු විසින්

නොකරණලදහ. විධානය නොකරණ ලදහ. කිසිවෙකු විසින් නිර්මිතද නොකරණලදහ. නිර්මිත නොකරවන ලදහ. වඳයහ. පර්වතයක් මෙන් නිශ්චලව සිටියහ. ඉන්ද්‍ර ඛීලයක් මෙන් නිශ්චලව සිටියහ. ඔවුහු කම්පා නොවෙත්. වෙනසකටද නොපැමිණෙත්. ඔවුනොවුන්ට බාධා නොකෙරෙත්. ඔවුනොවුන්ට සුව පිණිසද දුක් පිණිසද සුවදුක් පිණිසද නොසමත් වෙත්, යමෙකුන් තියුණු ආයුධයකින් හිස සිඳිත්ද, කිසිවෙක් කිසිවෙකුත් ජීවිතය තොරනොකරත්ද, සත්වැදෑරුම් ධාතුන්ගේ සිදුරු අතරෙන්ම ආයුධය ගමන් කරයි.

"ක්ෂත්‍රිය බ්‍රහ්මණාදී ප්‍රධාන යෝනීන් සම්බන්ධ දස සතර ලක්ෂ හයදහස් හයසියයක්ද කර්ම පන්සියයක්ද කර්ම පසක්ද කර්ම තුනක්ද කායවාග් කර්ම දෙකක්ද මනෝකර්ම නම් අර්ධ කර්මයද දෙසැටක් ප්‍රතිපදාවෝද දෙසැටක් අන්තර් කල්පයෝද, කෘෂ්ණාදි ජාති සයක්ද, පුරිෂභූමි අටක්ද, එක්සිය නවසාළිස් ආජීවකාවන්ද, එක්සිය නවසාළිස් පරිව්‍රාජක ප්‍රව්‍රජ්‍යාවෝද එක්සිය නවසාළිස් නාගමණ්ඩලයෝද, එක්සිය විසි ඉන්ද්‍රියයෝද, එක්සියතිස් නිරයෝද, සතිස් රාජොධාතූහුද, ඔටු ගවාදී සංඥී ගැබ් සතක්ද, සාලියවාදී අසංඥී ගැබ් සතක්ද, උක් ආදී නිර්ඝණ්ඨි ගැබ් සතක්ද, දිව්‍ය නිකාය සතක්ද, මනුෂ්‍යයෝනි සතක්ද, පිසාච යෝනි සතක්ද, මහා විල්සතක්ද, ගැට සතක්ද, මහාප්‍රපාත සතක්ද, කුඩා ප්‍රපාත එකසිය සතක්ද මහා ස්වප්න සතක්ද, කුඩා ස්වප්න එකසියසතක්ද, වෙත්. චුල්ලාසීති මහා කල්ප ලක්ෂයක් බාලයෝද, පණ්ඩිතයෝද භවයෙන් භවයට ගමන් කොට සැරිසරා දුක් කෙළවර කරන්නාහ.

'එහි මම මේ සීලයන් නිසා හෝ මේ ව්‍රතය නිසා හෝ මේ තපස නිසා හෝ තපවරණය නිසා හෝ බ්‍රහ්මචර්යාව නිසා හෝ නුමුහු කිරීමට ගියාවූ කර්ය හෝ මුහුකරවන්නෙමි. මුහුකිරීමට ගියාවූ කර්මය හෝ ස්පර්ශ කරමින් ගෙවන්නෙමියි කියා මෙසේ නැත්තේය. නැළියෙන් මැණ ප්‍රමාණ කරණ ලද්දක් මෙන් සුවදුක් (කියනලද කාල ප්‍රමාණයෙන්) කෙළවර කළ කල්හි සසරෙහි, අඩුවීමක් හෝ වැඩිවීමක් හෝ නැත්තේය. උසස් බවක්

හෝ පහත් බවක් නැත්තේය. පර්වතයක හෝ ගසක් උඩ හෝ සිට විසිකරණ ලද නූල් බෝලයක් යම්සේ නොපැකිලීම යයිද (නූල අවසන්වූ කල්හි එහිම සිටීද) එපරිද්දෙන්ම බාලයෝද පණ්ඩිතයෝද, කාලයාගේ වශයෙන් නොපැකිලෙන්නාහු සුවදුක් කෙළවර කරත්.' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, මෙය නොවන්නේමය."

12. "විඥානය, නිත්‍යය හෝ අනිත්‍යය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍යනම් එය දුකද, සැපද," - "ස්වාමීනි දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩි වශයෙන් නොගෙන මේ සත් වැදෑරුම් කායයෝ කිසිවෙකු විසින් නොකරණලදහ. කිසිවෙකුගේ විධානය නොකරණ ලදහ. නොමවන ලදහ. මැවීම නොකරවන ලදහ. කිසිවෙකු නූපදවන හෙයින් වඳයහ. පර්වත කූටයක් මෙන් නිශ්චලව සිටියහ. ඉන්ද්‍ර ඛීලයක් මෙන් නිශ්චලව සිටියහ. ඔවුහු කම්පා නොවෙත්. විකෘතියකට නොපැමිණෙත්. ඔවුනොවුන් නොගැටෙත්. ඔවුනොවුන්ට සැප පිණිස හෝ දුක් පිණිස හෝ සැපදුක් පිණිස හෝ නොසමත් වෙත්. ඒ සත කවරහුද යත්?"

'පෘථිවි සමූහය, ආපෝ සමූහය, තේජෝ සමූහය, වායෝ සමූහය, සුඛය, දුකය, ජීවය යන සමූහ සත කිසිවෙකු විසින් නොකරණලදහ. විධානය නොකරණ ලදහ. කිසිවෙකු විසින් නිර්මිතද නොකරණ ලදහ. නිර්මිත නොකරවන ලදහ. වඳයහ. පර්වතයක් මෙන් නිශ්චලව සිටියහ. ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චලව සිටියහ. ඔවුහු කම්පා නොවෙත්. වෙනසකටද නොපැමිණෙත්. ඔවුනොවුන්ට බාධා නොකෙරෙත්. ඔවුනොවුන්ට සුව පිණිසද, නොසමත් වෙත්. යමෙකුන් තියුණු ආයුධයකින් හිස සිඳිත්ද, කිසිවෙකුන් ජීවිතය තොර නොකරත්ද, සත් වැදෑරුම් ධාතූන්ගේ සිදුරු අතරෙන්ම ආයුධය ගමන් කරයි. ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී ප්‍රධාන යෝනීන් සම්බන්ධ දසසතර ලක්ෂ හයදහස් හයසියයක්ද, කර්ම පන්සියයක්ද, කර්මපසක්ද, කර්ම

තුනක්ද, කාය වාග් කර්ම දෙකක්ද, මනෝ කර්ම නම් අර්ධ කර්මයද, දෙසැටක් ප්‍රතිපදාවෝද, දෙසැටක් අන්තර කල්පයෝද, කෘෂ්ණාදී ජාති සයක්ද, පුරිෂභූමි අටක්ද, එක්සිය නවසාළිස් ආජීවකාවන්ද එක්සියනවසාළිස් පරිව්‍රාජක ප්‍රව්‍රජ්‍යාවෝද, එක්සිය නවසාළිස් නාගමණ්ඩලයෝද, එක්සිය විසි ඉන්ද්‍රියයෝද, එක්සියතිස් නිරයෝද, සතිස් රාජොධාතුහුද ඔටු ගවාදී සංඥී ගැබ් සතක්ද, සාලිසවාදී අසංඥී ගැබ්සතක්ද, උක් ආදී නිර්සණ්ඨික ගැබ්සතක්ද, දිව්‍ය යෝනී සතක්ද, මනුෂ්‍යයෝනි සතක්ද, පිසාච යෝනි සතක්ද, මහා විල් සතක්ද, ගැට සතක්ද, මහා ප්‍රපාත සතක්ද, කුඩා ප්‍රපාත එකසිය සතක්ද, මහා ස්වප්න සතක්ද කුඩා ස්වප්න එකසිය සතක්ද වෙත්. චුල්ලාසීති මහා කල්ප ලක්ෂයක් බාලයෝද, පණ්ඩිතයෝද, භවයෙන් භවයට ගමන්කොට සැරිසරා දුක් කෙළවර කරන්නාහ.

'එහි මම මේ අචේලක සීලයන් නිසා හෝ මේ ව්‍රතය නිසා හෝ මේ තපස නිසා හෝ බ්‍රහ්මචර්යාව නිසා හෝ නුමුහු කිරීමට ගියාවූ කර්මය හෝ මුහුකරවන්නෙමි. මුහු කිරීමට ගියාවූ කර්මය හෝ ස්පර්ශ කරමින් ගෙවන්නෙමියි කියා මෙසේ නැත්තේය. නැළියෙන් මැණ ප්‍රමාණ කරණ ලද්දක් මෙන් සුවදුක් (කියන ලද කාල ප්‍රමාණයෙන්) කෙළවර කළ කල්හි සසරෙහි අඩුවීමක් හෝ වැඩිවීමක් හෝ නැත්තේය. උසස් බවක් හෝ පහත් බවක් නැත්තේය. පර්වතයක හෝ ගසක් උඩ හෝ සිට විසිකරණ ලද නූල් බෝලයක් යම්සේ නොපැකිලීම යයිද, (නූල අවසන්වූ කල්හි එහිම සිටීද) එපරිද්දෙන්ම බාලයෝද, පණ්ඩිතයෝද, කාලයාගේ වශයෙන් නොපැකිලෙන්නාහු සුවදුක් කෙළවර කරත්. යන මේ දෘෂ්ටි උපදින්නේද?" - "ස්වාමීනි, මෙය නොවන්නේමය."

13. "මෙසේ දක්නාලද, අසනලද, නාසය, දිව, කය යන තුනෙන් දැන ගන්නාලද, සිතින් දන්නා ලද, පැමිණෙන ලද, සොයන ලද සිතින් විමසන ලද යම් ඒ දෙයක් වේද, එයද නිත්‍යය හෝ වෙයිද, අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද? එය දුක් හෝ වෙයිද? සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිවශයෙන් නොගැනීම නිසා 'මේ සත්වැදෑරුම් කායයෝ කිසිවෙකු විසින් නොකරණ ලද්දාවූද, කිසිවෙකු විසින් විධාන නොකරණ ලද්දාවූද, කිසිවෙකු විසින් නොමවන ලද්දාවූද, කිසිවකු ලවා මැවීම නොකරවන ලද්දාවූ කිසිවෙකු නූපදවන හෙයින් වඳවූ, පර්වතයක් මෙන් නිශ්චලව සිටින්නාවූ ඉන්දඛීලයක් මෙන් නොසෙල්වී සිටින්නාවූ ධර්ම සමූහ සතක්වෙත්. ඔව්හු කම්පා නොවෙත්. වෙනසකටද නොපැමිණෙත්. ඔවුනොවුන්ට පීඩාද නොකරත්. ඔවුනොවුන්ගේ සැප පිණිස හෝ දුක් පිණිස හෝ සුව දුක් පිණිස හෝ නොසමත් වෙත්. ඒ සත කවරහුද යත්?

'පෘථිවි ධාතු සමූහය, ආපෝධාතු සමූහය, තේජෝධාතු සමූහය, වායෝධාතු සමූහය, සුඛය, දුක්ඛය, ජීවය යන මොහුයි. මේ සමූහ සත කිසිවෙකු විසින් නොකරණ ලදහ. කිසිවෙකු විසින් විධානය නොකරණ ලදහ. කිසිවෙකු විසින් නොමවන ලදහ. කිසිවෙකු ලවා මැවීම නොකරවන ලදහ. කිසිවෙකු නූපදවන හෙයින් වඳයහ. පර්වතයක් මෙන් නිශ්චලව සිටින්නාහ. ඉන්ද්‍රඛීලයක් මෙන් නොසෙල්වී සිටින්නාහ. ඔව්හු කම්පා නොවෙත්. වෙනසකටද නොපැමිණෙත්. ඔවුනොවුන්ට පීඩාද නොකරත්. ඔවුනොවුන්ගේ සැප පිණිස හෝ දුක පිණිස හෝ සැප දුක් පිණිස හෝ නොසමත් වෙත්. යමෙක් යමෙකුගේ තියුණුවූ ආයුධයකින් හිස සිඳීද, කිසිවෙක් කිසිවෙකුගේ ජීවිතය තොර නොකරද්ද, සත්වැදෑරුම් ධාතුන්ගේ අතරෙන්ම ආයුධය ගමන් කෙරේ.

'ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී මේ තුදුස් ලක්ෂහයදහස් හයසියයක්, උත්තම යෝනීහුද කර්ම පන්සියයක්ද, කර්ම පසක්ද, කර්ම තුනක්ද, කාය වාග් කර්ම දෙකක්ද, මනෝකර්ම නම්වූ අර්ධකර්මයද, දෙසැටක් ප්‍රතිපදාවෝද දෙසැටක් අන්තර් කල්පයෝද, කෘෂ්ණාදී ශ්‍රෙෂ්ඨ ජාති සයක්ද, පුරිෂ භූමි අටක්ද,

ආජීවක වෘත්ති එක්සිය සතළිස් නවයක්ද, පරිව්‍රාජ ප්‍රව්‍රජ්ජා එකසිය සතළිස් නවයක්ද, නාග මණ්ඩල එකසිය හතළිස් නවයක්ද, ඉන්ද්‍රියය එකසිය විස්සක්ද, නිරය එකසිය තිහක්ද, අත්පා පිටු ආදී රාජෝධාතු තිස්හයක්ද, ඔටු ගවාදී සංඥී ගර්භ සතක්ද, සාලියවාදී අසංඥී ගර්භ සතක්ද, උක් හුණ ආදී නිර්සණ්ඨික ගර්භ සතක්ද, දේවයෝනි සතක්ද, නොහොත් බොහෝ දෙවියෝද, මනුෂ්‍ය යෝනි සතක්ද, නොහොත් බොහෝ මනුෂ්‍යයෝද, පිසාච යෝනි සතක්ද, විල් සතක්ද, ගැට සතක්ද, මහා ප්‍රපාත සතක්ද, කුඩා ප්‍රපාත එකසිය සතක්ද, මහා සීන සතක්ද, කුඩා සීන එකසිය සතක්ද, චූලාසීති මහාකල්ප ලක්ෂයක්ද, බාලයෝද, පණ්ඩිතයෝද භවයෙන් භවය ගමන්කොට සසර සැරිසරා දුක් කෙළවර කරන්නාහ.

'එහි මම මේ සීලයෙන් හෝ වෘත්තයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්යාවෙන් හෝ මුහුකිරීමට නොගියාවූ කර්මයා හෝ මුහුකුරුවන්නෙමි, මුහු කිරීමට ගියාවූ හෝ කර්මය ස්පර්ශ කරමින් ගෙවීම කරන්නෙමියි කියාද, මෙසේ නැත්තේය. නැලියෙන් මැන ප්‍රමාණ කරණ ලද්දාක්මෙන් සුව දුක් (කියන ලද කාල ප්‍රමාණයෙන්) කෙළවර කළ කල්හි සසරෙහි අඩුවීමක් හෝ වැඩිවීමක් නැත්තේය. උසස් බවක් හෝ පහත් බවක් නැත්තේය. පර්වතයක් උඩ හෝ ගසක් උඩ සිට වීසි කරණලද නූල් බෝලයක් නොපැකිල යම්සේ යයිද (නූල අවසන්වූ කල්හි එහිම නවතීද) එපරිද්දෙන්ම බාලයෝද, පණ්ඩිතයෝද (කාලයාගේ වශයෙන්) නොපැකිල යන්නාහු සුව දුක් කෙළවර කරන්නේය' යන මේ දෘෂ්ටි උපදින්නේද?" - "ස්වාමීනි. එය නොවන්නේමය."

"මහණෙනි, යම්තැනක පටන් ආර්යශ්‍රාවකයාහට මේ සයවැදෑරුම් කරුණෙහි සැක දුරුවූයේ වෙයිද, ඔහුට දුක පිළිබඳවද සැක දුරුවූයේ වෙයි. ඔහුට දුක්ඛ සමුදය පිළිබඳවද සැක දුරුවූයේ වෙයි. දුක්ඛනිරෝධයෙහිද සැකදුරුවූයේ වෙයි. ඔහුට දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදාව පිළිබඳවද සැක දුරුවූයේ වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණෙනි, මේ ආර්ය ශ්‍රාවකතෙමේ සොතාපන්න යෙකැයිද, සතර අපායෙහි නොවැටීම ස්වභාවකොට ඇත්තෙකැයිද, අර්හත් ඵලය පිහිටකොට ඇත්තෙකැයිද කියනු ලැබේ."

**(අටවෙනි මහාදිට්ඨි සූත්‍රය නිමි.)**

---

## 9. සස්සත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, කුමක් ඇතිකල්හි කුමක් නිසා කුමකට පැමිණ "ලෝකය සදාකාලිකය යන මේ දෘෂ්ටිය උපදීද?"

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ ප්‍රභවකොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිහිටකොට ඇත්තාහ. ස්වාමීනි මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම වදාරණ සේක්නම් මැනවි."

"මහණෙනි, එසේනම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමැයි" කීය.

"ස්වාමීනි, එසේයයි," ඒ භික්ෂූහු, භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. "මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපයට පැමිණ 'ලෝකය සදාකාලිකය යන' මේ දෘෂ්ටි උපදියි. වේදනාව ඇතිකල්හි වේදනාව නිසා වේදනාවට පැමිණ 'ලෝකය සදාකාලිකය' යන මේ දෘෂ්ටි උපදියි. සංඥාව ඇතිකල්හි සංඥාව

නිසා සංඥාවට පැමිණ 'ලෝකය සදාකාලිකය' යන මේ දෘෂ්ටි උපදියි. සංස්කාර ඇති කල්හි සංස්කාර නිසා සංස්කාරයට පැමිණ 'ලෝකය සදාකාලිකය' යන මේ දෘෂ්ටිය උපදියි. විඥානය ඇති කල්හි විඥානය නිසා විඥානයට පැමිණ 'ලෝකය සදාකාලිකය' යන මේ දෘෂ්ටි උපදියි.

4. "මහණෙනි, ඒ කුමකැයි සිතව්ද? රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය"

"යමක් වනාහි අනිත්‍යද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වෙන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන 'ලෝකය සදාකාලිකය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය"

"වේදනාව නිත්‍යය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද එය දැඩිකොට අල්වා නොගෙන "ලෝකය සදාකාලිකය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, නූපදින්නේමය."

"සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ වෙයිද? සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද? එය දැඩිකොට නොගෙන 'ලෝකය සදාකාලිකය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එසේ නොවන්නේමය."

"සංස්කාරයෝ නිත්‍ය හෝ වේද? අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද එය දැඩිකොට අල්වා නොගෙන 'ලෝකය සදාකාලිකය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි. එය නොවන්නේමය."

"විඥාණය නිත්‍යය හෝ අනිත්‍යය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන 'ලෝකය සදාකාලිකය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එසේ නොවන්නේමය."

**5.** "ඇසින් දකිනලද, කණින් අසනලද, නාසය දිව කය යන තුනෙන් දැනගන්නා ලද සිතින් දන්නා ලද පැමිණෙන ලද සොයනලද විමසනලද යම් ඒ දෙයක්වේද, එයද නිත්‍යය හෝ අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යනම් එය දුකද, සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩි වශයෙන් නොගෙන 'ලෝකය සදාකාලිකය' යන මේ දෘෂ්ටි උපදින්නේද?" - "ස්වාමීනි. එය නොවන්නේමය."

**6.** "මහණෙනි, යම්තැනක පටන් ආර්යශ්‍රාවකයාහට මේ කරුණු සයෙහි පැවති සැක දුරුවූයේ වෙයිද, ඔහුට දුක පිළිබඳවද සැකදුරුවූයේ වෙයි, දුක්ඛ සමුදය පිළිබඳවද සැක දුරුවූයේ වෙයි. දුක්ඛ නිරෝධයෙහිද සැක දුරුවූයේ වෙයි. දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදාව පිළිබඳවද සැක දුරුවූයේ වෙයි.

"මහණෙනි, මේ ආර්යශ්‍රාවකතෙමේ සෝවාන් මඟපලට පැමිණියෙකැයිද, සතර අපායෙහි නොවැටීම ස්වභාවකොට

ඇත්තෙකැයිද, නියත ගති ඇත්තෙකැයිද අර්හත් ඵලය පිහිටකොට ඇත්තෙකැයිද කියනු ලැබේ.”

**(නවවෙනි සස්සත සූත්‍රය (1) නිමි.)**

---

## 10. අසස්සත සූත්‍රය (2)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ, ‘මහණෙනි’යි කියා භික්ෂූන්ට කථාකළ සේක. ‘ස්වාමීනි’යි, කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, කුමක් ඇතිකල්හි, කුමක් නිසා, කුමකට පැමිණ ‘ලෝකය සදාකාලික නොවේ’ යන මේ දෘෂ්ටිය උපදීද?”

“ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ ප්‍රභව කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිහිටකොට ඇත්තාහ. මේ කීමේ අදහස කුමක්ද? භාග්‍යවතුන් වහන්සේ වදාරන සේක්නම් මැනවි.”

“මහණෙනි, එසේ නම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමැයි” කීය.

“ස්වාමීනි, එසේයයි,” ඒ භික්ෂූහු, භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. “මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපයට පැමිණ ‘ලෝකය සදාකාලික නොවේ’ යන මේ දෘෂ්ටිය උපදියි. වේදනාව ඇති කල්හි වේදනාව නිසා වේදනාවට පැමිණ ‘ලෝකය සදාකාලිකය නොවේ’ යන මේ දෘෂ්ටිය උපදියි. සංඥාව ඇති කල්හි සංඥාව නිසා සංඥාවට පැමිණ ලෝකය සදාකාලික නොවේ යන මේ දෘෂ්ටිය උපදියි. සංස්කාර ඇති කල්හි සංස්කාර නිසා සංස්කාරයට පැමිණ ලෝකය සදාකාලික නොවේ යන

මේ දෘෂ්ටිය උපදියි. විඥානය ඇති කල්හි විඥානය නිසා විඥානයට පැමිණ ලෝකය අසදාකාලික හෙවත් අසාස්වතය කියා මෙසේ දෘෂ්ටිය උපදියි.

4. "මහණෙනි, ඒ කුමකැයි සිතව්ද? රූපය නිත්‍ය හෝ වේද? අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකයි."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද? එය දැඩිලෙස අල්වා නොගෙන 'ලෝකය සදාකාලික නොවේ යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"වේදනාව නිත්‍ය හෝ වේද? අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද? එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද වෙනස්වන ස්වභාවද? ඒ දැඩිකොට අල්වා නොගෙන 'ලෝකය සදාකාලික නොවේ' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"සංඥාව නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම් එය දුකද, සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන 'ලෝකය සදාකාලික නොවේ' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"සංස්කාරයෝ නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම්. එය දුකද, සැපද?" - "ස්වාමීනි. දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන 'ලෝකය සදාකාලික නොවේ' යන මේ දෘෂ්ටිය උපදින්නේද?"-"ස්වාමීනි, එය නොවන්නේමය."

"විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද එය දැඩිකොට අල්වා නොගෙන 'ලෝකය සදාකාලික නොවේ' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

**5.** "දක්නාලද අසනලද නාසය දිව කය යන තුනෙන් දන්නාලද දැනගන්නාලද සිතින් පැමිණෙන ලද, සොයන ලද විමසන ලද යම් ඒ දෙයක්වේද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන 'ලෝකය සදාකාලික නොවේය' යන මේ දෘෂ්ටි උපදින්නේද?" - "ස්වාමීනි. එය නොවන්නේමය."

**6.** "මහණෙනි, යම් තැනක පටන් ආර්‍ය ශ්‍රාවකයාහට මේ සයවැදෑරුම් කරුණෙහි සැක දුරුවූයේ වෙයිද, ඔහුට දුක පිළිබඳවද සැක දුරුවූයේ වෙයි. දුක්ඛ සමුදය පිළිබඳවද සැක දුරුවූයේ වෙයි. දුක්ඛ නිරෝධය පිළිබඳවද සැකදුරු වූයේ වෙයි. දුක්ඛනිරෝධ ගාමිනී ප්‍රතිපදාව පිළිබඳවද සැක දුරු වූයේ වෙයි. මහණෙනි, මේ ආර්‍ය ශ්‍රාවකතෙමේ සෝවාන් වූවෙකැයිද, සතර අපායෙහි නොවැටීම ස්වභාව කොට ඇත්තෙකැයිද, අර්හත් ඵලය පිහිට කොට ඇත්තෙකැයිද කියනු ලැබේ."

**(දහවෙනි අසස්සත සූත්‍රය (2) නිමි.)**

---

## 11. අන්තවා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, කුමක් ඇතිකල්හි කුමක් නිසා කුමකට පැමිණ "ලෝකය අන්තවත්ය (කෙළවරක් ඇත්තේය) යන මේ දෘෂ්ටිය උපදීද?"

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ ප්‍රභව කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිහිටකොට ඇත්තාහ. මේ කීමේ අදහස කුමක් දැයි, භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන සේක් නම් මැනවි."

"මහණෙනි, එසේනම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමැයි" කීය.

"ස්වාමීනි, එසේයයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. "මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපයට පැමිණ 'ලෝකය කෙළවරක් ඇත්තේය' යන මේ දෘෂ්ටිය උපදියි. වේදනාව ඇති කල්හි වේදනාව නිසා වේදනාවට පැමිණ 'ලෝකය කෙළවරක් ඇත්තේය' යන මේ දෘෂ්ටිය උපදියි. සංඥාව ඇති කල්හි සංඥාව නිසා සංඥාවට පැමිණ 'ලෝකය කෙළවර ඇත්තේය' යන මේ දෘෂ්ටිය උපදියි. සංස්කාරයන් ඇති කල්හි සංස්කාරයන් නිසා සංස්කාරයන්ට පැමිණ 'ලෝකය කෙළවරක් ඇත්තේය' යන මේ දෘෂ්ටිය උපදියි. විඥානය ඇති කල්හි විඥානය නිසා විඥානයට පැමිණ 'ලෝකය කෙළවරක් ඇත්තේය' යන මේ දෘෂ්ටිය උපදියි.

4. "මහණෙනි. ඒ කුමකැයි සිතව්ද? රූපය නිත්‍යය හෝ අනිත්‍යය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම්, එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන ඉදින් 'ලෝකය කෙළවරක් ඇත්තේය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"වේදනාව නිත්‍යය හෝ අනිත්‍යය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම්, එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන 'ලෝකය කෙළවරක් ඇත්තේය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි එය නොවන්නේමය."

"සංඥාව නිත්‍යය හෝ අනිත්‍යය හෝ වෙයිද?" - "ස්වාමීනි. අනිත්‍යය,"

"යමක් වනාහි අනිත්‍යනම් එය දුකද, සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන 'ලෝකය කෙළවරක් ඇත්තේය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"සංස්කාරයන් නිත්‍යද, අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යය නම් එය දුකද, සැපද?"-"ස්වාමීනි, දුකය."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිකොට අල්වානොගෙන 'ලෝකය කෙළවරක් ඇත්තේය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි. එය නොවන්නේමය."

"විඥානය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුකද, සැපද?" - "ස්වාමීනි, දුකයි."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන ලෝකය කෙළවරක් ඇත්තේය යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

**5.** "ඇසින් දකින ලද, කණින් අසන ලද, නාසය දිව කය යන තුනෙන් දන්නා ලද, සිතින් දැනගන්නා ලද, පැමිණෙන ලද, සොයන ලද, විමසන ලද, යම් මේ දෙයක් වෙයිද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යනම් එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

**6.** "යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන "ලෝකය කෙළවරක් ඇත්තේය" යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"මහණෙනි, යම් තැනක පටන් ආර්යශ්‍රාවකයාගේ මේ කරුණෙහි සැක දුරුවූයේ වෙයිද, ඔහුට දුක පිළිබඳවද සැක දුරුවූයේ වෙයි. ඔහුට දුක්ඛ සමුදය පිළිබඳවද සැක දුරුවූයේ වෙයි. ඔහුට දුක්ඛ නිරෝධය පිළිබඳවද සැක දුරු වූයේ වෙයි. ඔහුට දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදාව පිළිබඳවද සැක දුරුවූයේ වෙයි.

"මහණෙනි. මේ ආර්ය ශ්‍රාවකතෙමේ සොතාපන්නයයිද, සතර අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තෙකැයිද, නියත

ගති ඇත්තෙකැයිද, අර්හත් ඵලය පිහිටකොට ඇත්තෙකැයිද කියනු ලැබේ.”

**(එකොළොස්වෙනි අන්තවා සූත්‍රය නිමි.)**

---

## 12. අනන්තවා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූසේක. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. “මහණෙනි, කුමක් ඇතිකල්හි වනාහි, කුමක් නිසා, කුමකට පැමිණ ලෝකය කෙළවරක් නැත්තේය, යන මේ දෘෂ්ටිය උපදීද?”

“ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ ප්‍රභවකොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිහිටකොට ඇත්තාහ. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම වදාරණසේක්නම් මැනවි.”

“මහණෙනි, එසේ නම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමැයි” කීය.

“ස්වාමීනි. එසේයයි” ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. “මහණෙනි, රූපය ඇතිකල්හි, රූපය නිසා. රූපයට බැසගෙන ලෝකය කෙළවරක් නැත්තේය යන මේ දෘෂ්ටිය උපදියි.

“වේදනාව ඇතිකල්හි, වේදනාව නිසා, වේදනාවට බැසගෙන ලෝකය කෙළවරක් නැත්තේය යන මේ දෘෂ්ටිය උපදියි.

“සංඥාව ඇතිකල්හි, සංඥාව නිසා, සංඥාවට බැසගෙන ලෝකය කෙළවරක් නැත්තේය යන මේ දෘෂ්ටිය උපදියි.

"සංස්කාරය ඇතිකල්හි, සංස්කාරය නිසා, සංස්කාරයට බැසගෙන ලෝකය කෙළවරක් නැත්තේය යන මේ දෘෂ්ටිය උපදියි.

"විඤ්ඤාණය ඇතිකල්හි, විඤ්ඤාණය නිසා, විඤ්ඤාණයට බැසගෙන ලෝකය කෙළවරක් නැත්තේය යන මේ දෘෂ්ටිය උපදියි.

4. "මහණෙනි, ඒ කුමකැයි හඟිව්ද? රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි. දුකයි."

"යමක් වනාහි අනිත්‍යයද දුකද, වෙනස්වන ස්වභාවද, එය, දැඩිලෙස නොගෙන 'ලෝකය කෙළවරක් නැත්තේය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිලෙස නොගෙන 'ලෝකය කෙළවරක් නැත්තේය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි. එය නොවන්නේමය."

"සංඥාව නිත්‍ය හෝ අනිත්‍යය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, එය වෙනස්වන ස්වභාවද, එය දැඩිලෙස නොගෙන 'ලෝකය කෙළවරක් නැත්තේය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"සංස්කාරයෝ නිත්‍ය හෝ අනිත්‍යය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිලෙස නොගෙන 'ලෝකය කෙළවරක් නැත්තේය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"විඥානය නිත්‍ය හෝ වෙයිද, අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකයි."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය දැඩිලෙස නොගෙන 'ලෝකය කෙළවරක් නැත්තේය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

**5.** "දක්නාලද අසනලද නාසය, දිව, කය යන තුනෙන් දැනගන්නාලද සිතින් දන්නාලද, පැමිණෙනලද, සොයන ලද, විමසනලද යම් ඒ දෙයක් වේද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"එය දැඩිලෙස නොගෙන 'ලෝකය කෙළවරක් නැත්තේය. යන දෘෂ්ටි උපදින්නේද?"

"ස්වාමීනි, එය නොවන්නේමය."

**6.** "මහණෙනි, යම් තැනක පටන් ආර්යශ්‍රාවකයාහට මේ කරුණු සයෙහි සැක දුරුවූයේ වෙයිද, ඔහුට දුක්ඛයෙහිද, සැක දුරුවූයේ වෙයි. දුක්ඛ සමුදයෙහිද, සැක දුරුවූයේ වෙයි. දුක්ඛ නිරොධයෙහිද, සැක දුරුවූයේ වෙයි. දුක්ඛ නිරොධ ගාමිනී ප්‍රතිපදාර්ය සත්‍යයෙහිද සැක දුරුවූයේ වෙයි.

"මහණෙනි. මේ ආර්ය ශ්‍රාවකතෙමේ සොතාපන්න යෙකැයිද, සතර අපායෙහි නොවැටීම ස්වභාවකොට ඇත්තෙකැයිද, නියත ගති ඇත්තෙකැයිද, අර්හත්ඵල පිහිටකොට ඇත්තෙකැයිද කියනු ලැබේ.

**(දොළොස්වෙනි අනන්තවා සූත්‍රය නිමි.)**

---

## 13. තංජීවං සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, කුමක් ඇතිකල්හි කුමක් නිසා කුමකට පැමිණ 'ජීවයත් එයමය, ශරීරයත් එයමය' යන දෘෂ්ටිය උපදීද?

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ ප්‍රභවකොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිහිටකොට ඇත්තාහ. මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම වදාරන සේක්නම් මැනවි."

"මහණෙනි, එසේනම් අසව් මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමැයි" කීය.

"ස්වාමීනි. එසේයයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. "මහණෙනි, රූපය ඇතිකල්හි, රූපය නිසා, රූපයට පැමිණ, ජීවයත් එයමය. ශරීරයත් එයමය යන මේ දෘෂ්ටිය උපදියි.

"වේදනාව ඇතිකල්හි, වේදනාව නිසා, වේදනාවට පැමිණ, ජීවයත් එයමය. ශරීරයත් එයමය යන මේ දෘෂ්ටිය උපදියි.

'සංඥාව ඇතිකල්හි, සංඥාව නිසා, සංඥාවට පැමිණ ජීවයත් එයමය. ශරීරයත් එයමය යන මේ දෘෂ්ටිය උපදියි.

"සංස්කාරයන් ඇතිකල්හි, සංස්කාරයන් නිසා, සංස්කාරයන්ට පැමිණ, ජීවයත් එයමය. ශරීරයත් එයමය යන මේ දෘෂ්ටිය උපදියි.

"විඤ්ඤාණය ඇතිකල්හි, විඤ්ඤාණය නිසා, විඤ්ඤාණයට පැමිණ, ජීවයත් එයමය. ශරීරයත් එයමය. යන මේ දෘෂ්ටිය උපදියි.

4. "මහණෙනි, ඒ කුමකැයි හඟිව්ද? රූපය නිත්‍යය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිලෙස නොගෙන ජීවයත් එයමය. ශරීරයත් එයමය යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි. එය නොවන්නේමය."

"වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි. අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිලෙස නොගෙන ජීවයත් එයමය. ශරීරයත් එයමය යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි. දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිලෙස නොගෙන ජීවයත් එයමය. ශරීරයත් එයමය යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"සංස්කාරයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමිනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි. දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිලෙස නොගෙන ජීවයත් එයමය. ශරීරයත් එයමය යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"විඥ්ඥාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිලෙස නොගෙන ජීවයත් එයමය. ශරීරයත් එයමය යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

**5.** "දක්නාලද, අසනලද, නාසය, දිව, කය යන තුනෙන් දන්නාලද, සිතින් දැනගන්නාලද, පැමිණෙන ලද, සොයන ලද, විමසනලද යම් ඒ දෙයක් වේද, එය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"

"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, ඉදින් එය දැඩිලෙස නොගෙන ජීවයත් එයමය ශරීරයත් එයමය යන දෘෂ්ටිය උපදින්නේද?"

"ස්වාමීනි, එය නොවන්නේමය."

**6.** "මහණෙනි, යම් තැනක පටන් ආර්ය ශ්‍රාවකයාහට මේ කරුණු සයෙහි සැක දුරුවූයේ වෙයිද, දුක්ඛයෙහිද, ඔහුගේ සැක දුරුවූයේ වෙයි. දුක්ඛසමුදයෙහිද, ඔහුගේ සැක දුරු වූයේ වෙයි. දුක්ඛනිරෝධයෙහිද, ඔහුගේ සැක දුරුවූයේ වෙයි. දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදාවෙහිද, ඔහුගේ සැක දුරුවූයේ වෙයි.

"මහණෙනි, මේ ආර්ය ශ්‍රාවකතෙමේ සෝවාන් මාර්ගඵලයට පැමිණියෙකැයිද සතර අපායෙහි නොවැටීම ස්වභාවකොට ඇත්තෙකැයිද නියතවූ ගති ඇත්තෙකැයිද, අර්හත් ඵලය පිහිට කොට ඇත්තෙකැයිද කියනු ලැබේ."

**(දහතුන්වෙනි තංජීවං සූත්‍රය නිමි.)**

## 14. අඤ්ඤං ජීවං සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් නිසා කුමකට පැමිණ 'ජීවය අනිකක ශරීරය අනිකක' යන මේ දෘෂ්ටිය උපදීද?

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම වදාරන සේක්නම් මැනවි."

"මහණෙනි, එසේනම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමැයි" කීය.

"ස්වාමීනි එසේයයි," ඒ භික්ෂූහු, භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. "රූපය ඇතිකල්හි රූපය නිසා රූපයට පැමිණ 'ජීවය අනිකක ශරීරය අනිකක' යන මේ දෘෂ්ටිය උපදී. වේදනාව ඇති කල්හි වේදනාව නිසා වේදනාවට පැමිණ 'ජීවය අනිකක ශරීරය අනිකක' යන මේ දෘෂ්ටිය උපදී. සංඥාව ඇති කල්හි සංඥාව නිසා සංඥාවට පැමිණ 'ජීවය අනිකක ශරීරය අනිකක යන මේ දෘෂ්ටිය උපදී. සංස්කාර ඇති කල්හි සංස්කාර නිසා සංස්කාරයට පැමිණ 'ජීවය අනිකක, ශරීරය අනිකක' යන මේ දෘෂ්ටිය උපදී. විඥානය ඇතිකල්හි විඥානය නිසා විඥානයට පැමිණ 'ජීවය අනිකක ශරීරය අනිකක' යන මේ දෘෂ්ටිය උපදී.

"මහණෙනි, ඒ කුමකැයි සිතව්ද?

"රූපය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය.

"යමක් වනාහි අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද එය දැඩිකොට අල්වා නොගෙන 'ජීවය අනිකක ශරීරය අනිකක' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේය."

"වේදනාව නිත්‍යද අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම්, එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන 'ජීවය අනිකක ශරීරය අනිකක යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"සංඥාව නිත්‍යද? අනිත්‍යද?" "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යනම්, එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකයි."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිකොට අල්වානොගෙන 'ජීවය අනිකක ශරීරය අනිකක' යන මේ දෘෂ්ටිය උපදින්නේද? - "ස්වාමීනි, එය නොවන්නේමය.

"සංස්කාරයෝ නිත්‍ය හෝ අනිත්‍යය හෝ වෙයිද?" - "ස්වාමීනි අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම් එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන ජීවය අනිකක ශරීරය අනිකක' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"විඥ්ඥාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකයි."

"යමක් වනාහි අනිත්‍යද දුකද වෙනස්වන ස්වභාවද එය දැඩිකොට අල්වා නොගෙන 'ජීවය අනිකක ශරීරය අනිකක, යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

**5.** "දක්නාලද, අසනලද, නාසය දිව කය යන තුනෙන් දන්නාලද, සිතින් දන්නාලද, සොයන ලද, විමසන ලද යම් දෙයක් වේද, එයද නිත්‍යය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම්, එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද එය දැඩි වශයෙන් නොගෙන 'ජීවය අනිකක ශරීරය අනිකක යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

**6.** "මහණෙනි, යම් තැනක පටන් ආර්යශ්‍රාවකයාහට මේ කරුණු සයෙහි සැක දුරුවූයේ වෙයි, ඔහුට දුක පිළිබඳවද සැකදුරුවූයේ වෙයි, දුක්ඛ සමුදය පිළිබඳවද සැක දුරුවූයේ වෙයි දුක්ඛ නිරෝධය පිළිබඳවද සැක දුරු වූයේ වෙයි, දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදාව පිළිබඳවද සැක දුරුවූයේ වෙයි."

"මහණෙනි, මේ ආර්යශ්‍රාවකතෙමේ ශ්‍රොතාපත්ති මාර්ග ඵලයට පැමිණියෙකැයිද සතර අපායෙහි වැටීම ස්වභාවකොට ඇත්තෙකැයිද නියත ගති ඇත්තෙකැයිද, අර්හත් ඵලය පිහිටකොට ඇත්තෙකැයිද කියනු ලැබේ."

**(දහහතරවෙනි අඤ්ඤං ජීවං සූත්‍රය නිමි.)**

---

## 15. තථාගත සූත්‍රය. (1)

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, කුමක් ඇතිකල්හි කුමක් නිසා කුමකට පැමිණ 'සත්ත්වතෙමේ මරණින් මතු වන්නේය' යන මේ දෘෂ්ටිය උපදීද?"

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ ප්‍රභවකොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිහිටකොට ඇත්තාහ. ස්වාමීනි මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම වදාරණ සේක් නම් මැනවි."

"මහණෙනි, එසේ නම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමැයි" කීය.

"ස්වාමීනි, එසේයයි," ඒ භික්ෂූහු, භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. "මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපයට පැමිණ 'සත්ත්වතෙමේ මරණින් මතු වන්නේය යන' මේ දෘෂ්ටිය උපදියි. වේදනාව ඇතිකල්හි වේදනාව නිසා වේදනාවට පැමිණ 'සත්වතෙමේ මරණින් මතු වන්නේය' යන මේ දෘෂ්ටි උපදියි. සංඥාව ඇතිකල්හි සංඥාව නිසා සංඥාවට පැමිණ 'සත්ත්වතෙමේ මරණින් මතු වන්නේය' යන මේ දෘෂ්ටි උපදියි. සංස්කාර ඇති කල්හි සංස්කාර නිසා සංස්කාරයට පැමිණ 'සත්ත්වතෙමේ මරණින් මතු වන්නේය' යන මේ දෘෂ්ටිය උපදියි. විඥානය ඇති කල්හි විඥානය නිසා විඥානයට පැමිණ 'සත්ත්ව තෙමේ මරණින් මතු වන්නේය' යන මේ දෘෂ්ටි උපදියි.

4. "මහණෙනි, ඒ කුමකැයි සිතව්ද? රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වෙන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන 'සත්ත්වතෙමේ මරණින් මතු වන්නේය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"වේදනාව නිත්‍යය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද එය දැඩිකොට අල්වා නොගෙන 'සත්ත්වතෙමේ මරණින් මතු වන්නේය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ වෙයිද? සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිකොට නොගෙන 'සත්වතෙමේ මරණින් මතු වන්නේය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එසේ නොවන්නේමය."

"සංස්කාරයෝ නිත්‍ය හෝ වේද? අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද එය දැඩිකොට අල්වා නොගෙන 'සත්වතෙමේ මරණින් මතු වන්නේය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"විඥාණය නිත්‍යය හෝ අනිත්‍යය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක්වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන 'සත්වතෙමේ මරණින් මතු වන්නේය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එසේ නොවන්නේමය."

**5.** "ඇසින් දකිනලද, කණින් අසනලද, නාසය දිව කය යන තුනෙන් දැනගන්නා ලද සිතින් දන්නා ලද පැමිණෙන ලද සොයනලද විමසනලද යම් ඒ දෙයක්වේද, එයද නිත්‍යය හෝ අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යනම් එය දුකද, සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද එය දැඩි වශයෙන් නොගෙන 'සත්වතෙමේ මරණින් මතු වන්නේය' යන මේ දෘෂ්ටි උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

**6.** "මහණෙනි, යම්තැනක පටන් ආර්යශ්‍රාවකයාහට මේ කරුණු සයෙහි පැවති සැක දුරුවූයේ වෙයිද, ඔහුට දුක පිළිබඳවද සැකදුරුවූයේ වෙයි, දුක්ඛ සමුදය පිළිබඳවද සැක දුරුවූයේ වෙයි දුක්ඛ නිරෝධයෙහිද සැක දුරුවූයේ වෙයි. දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදාව පිළිබඳවද සැක දුරුවූයේ වෙයි.

"මහණෙනි, මේ ආර්යශ්‍රාවකතෙමේ සෝවාන් මගපලට පැමිණියෙකැයිද, සතර අපායෙහි නොවැටීම ස්වභාවකොට ඇත්තෙකැයිද, නියත ගති ඇත්තෙකැයිද අර්හත් ඵලය පිහිටකොට ඇත්තෙකැයිද කියනු ලැබේ."

**(පසළොස්වෙනි තථාගත සූත්‍රය (1) නිමි.)**

## 16. තථාගත සූත්‍රය (2)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ, ‘මහණෙනි’යි කියා භික්ෂූන්ට කථාකළ සේක. ‘ස්වාමීනි’යි, කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, කුමක් ඇතිකල්හි, කුමක් නිසා, කුමකට පැමිණ ‘සත්වතෙමේ මරණින් මතු නොවන්නේය’ යන මේ දෘෂ්ටිය උපදීද?”

“ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ ප්‍රභව කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිහිටකොට ඇත්තාහ. මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම වදාරන සේක්නම් මැනවි.”

“මහණෙනි, එසේනම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමැයි” කීය.

“ස්වාමීනි, එසේයයි,” ඒ භික්ෂූහු, භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. “මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපයට පැමිණ ‘සත්ත්වතෙමේ මරණින් මතු නොවන්නේය’ යන මේ දෘෂ්ටිය උපදින්නේය. වේදනාව ඇති කල්හි වේදනාව නිසා වේදනාවට පැමිණ ‘සත්ත්වතෙමේ මරණින් මතු නොවන්නේය’ යන මේ දෘෂ්ටිය උපදියි. සංඥාව ඇතිකල්හි සංඥාව නිසා සංඥාවට පැමිණ ‘සත්ත්වතෙමේ මරණින් මතු නොවන්නේය’ යන මේ දෘෂ්ටිය උපදියි. සංස්කාර ඇතිකල්හි සංස්කාර නිසා සංස්කාරයට පැමිණ ‘සත්ත්වතෙමේ මරණින් මතු නොවන්නේය’ යන මේ දෘෂ්ටිය උපදියි. විඥානය ඇති කල්හි විඥානය නිසා විඥානයට පැමිණ ‘සත්ත්වතෙමේ මරණින් නොවන්නේය’ යන මේ දෘෂ්ටිය උපදියි.

4. "මහණෙනි, ඒ කුමකැයි සිතව්ද? රූපය නිත්‍ය හෝ වේද? අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකයි."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද? එය දැඩිලෙස අල්වා නොගෙන සත්ත්වතෙමේ මරණින් මතු නොවන්නේය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය,"

"වේදනාව නිත්‍ය හෝ වේද? අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද? එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද වෙනස්වන ස්වභාවද? ඒ දැඩිකොට අල්වා නොගෙන 'සත්ත්ව තෙමේ මරණින් මතු නොවන්නේය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"සංඥාව නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යනම් එය දුකද, සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය දැඩි කොට අල්වා නොගෙන 'සත්ත්ව තෙමේ මරණින් මතු නොවන්නේය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"සංස්කාරයෝ නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යනම්, එය දුකද, සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන 'සත්ත්ව තෙම මරණින් මතු

නොවන්නේය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද එය දැඩිකොට අල්වා නොගෙන 'සත්ත්ව තෙම මරණින් මතු නොවන්නේය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි. එය නොවන්නේමය."

**5.** "දක්නාලද අසනලද නාසය දිව කය යන තුනෙන් දන්නාලද දැනගන්නාලද සිතින් පැමිණෙන ලද, සොයන ලද විමසන ලද යම් ඒ දෙයක්වේද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන 'සත්ත්ව තෙම මරණින් මතු නොවන්නේය.' යන මේ දෘෂ්ටි උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

**6.** "මහණෙනි, යම් තැනක පටන් ආර්‍ය ශ්‍රාවකයාහට මේ සයවැදෑරුම් කරුණෙහි සැක දුරුවූයේ වෙයිද, ඔහුට දුක පිළිබඳවද සැක දුරුවූයේ වෙයි. දුක්ඛ සමුදය පිළිබඳවද සැක දුරුවූයේ වෙයි. දුක්ඛ නිරෝධය පිළිබඳවද සැකදුරු වූයේ වෙයි. දුක්ඛනිරෝධ ගාමිනී ප්‍රතිපදාව පිළිබඳවද සැක දුරු වූයේ වෙයි. මහණෙනි, මේ ආර්‍ය ශ්‍රාවකතෙමේ සෝවාන් වූවෙකැයිද, සතර අපායෙහි නොවැටීම ස්වභාව කොට ඇත්තෙකැයිද, අර්හත් ඵලය පිහිට කොට ඇත්තෙකැයිද කියනු ලැබේ."

**(දහසයවෙනි තථාගත සූත්‍රය (2) නිමි.)**

---

## 17. තථාගත සූත්‍රය. (3)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, කුමක් ඇතිකල්හි කුමක් නිසා කුමකට පැමිණ, 'සත්ත්ව තෙමේ මරණින් මතු වන්නේද වෙයි නොවන්නේද වෙයි' යන මේ දෘෂ්ටිය උපදීද?"

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ ප්‍රභව කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිහිටකොට ඇත්තාහ. මේ කීමේ අදහස, භාග්‍යවතුන් වහන්සේ විසින්ම වදාරන සේක්නම් මැනවි."

"මහණෙනි, එසේනම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමැයි" කීය.

"ස්වාමීනි, එසේයයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. "මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපයට පැමිණ, 'සත්ත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි. නොවන්නේද වෙයි' යන මේ දෘෂ්ටිය උපදියි. වේදනාව ඇති කල්හි වේදනාව නිසා වේදනාවට පැමිණ, 'සත්ත්ව තෙමේ මරණින් මතු වන්නේද වෙයි. නොවන්නේද වෙයි' යන මේ දෘෂ්ටිය උපදියි. සංඥාව ඇති කල්හි සංඥාව නිසා සංඥාවට පැමිණ 'සත්ත්ව තෙමේ මරණින් මතු වන්නේද වෙයි. නොවන්නේද වෙයි' යන මේ දෘෂ්ටිය උපදියි. සංස්කාරයන් ඇති කල්හි සංස්කාරයන් නිසා සංස්කාරයන්ට පැමිණ, 'සත්ත්ව තෙමේ මරණින් මතු වන්නේද වෙයි. නොවන්නේද වෙයි' යන මේ දෘෂ්ටිය උපදියි, විඥානය ඇති කල්හි විඥානය නිසා විඥානයට පැමිණ, 'සත්ත්ව තෙමේ

මරණින් මතු වන්නේද වෙයි. නොවන්නේද වෙයි' යන මේ දෘෂ්ටිය උපදියි.

4. "මහණෙනි, ඒ කුමකැයි සිතව්ද? රූපය නිත්‍යය හෝ අනිත්‍යය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම්, එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන ඉදින් 'සත්ත්ව තෙමේ මරණින් වන්නේද වෙයි. නොවන්නේද වෙයි' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"වේදනාව නිත්‍යය හෝ අනිත්‍යය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය,"

"යමක් වනාහි අනිත්‍ය නම්, එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිකෙට අල්වානොගෙන 'සත්ත්ව තෙමේ මරණින් මතු වන්නේද වෙයි. නොවන්නේද වෙයි' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"සංඥාව නිත්‍යය හෝ අනිත්‍යය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය,"

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන 'සත්ත්ව තෙමේ මරණින් මතු වන්නේද වෙයි. නොවන්නේද වෙයි' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"සංස්කාරයන් නිත්‍යද, අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යය නම් එය දුකද, සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන 'සත්ත්ව තෙමේ මරණින් මතු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වන්නේද වෙයි. නොවන්නේද වෙයි’ යන මේ දෘෂ්ටිය උපදින්නේද?” - “ස්වාමීනි, එය නොවන්නේමය.”

“විඥානය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?” - “ස්වාමීනි, අනිත්‍යය.”

“යමක් වනාහි අනිත්‍යයද එය දුකද, සැපද?” - “ස්වාමීනි, දුකයි.”

“යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන ‘සත්ව තෙමේ මරණින් මතු වන්නේද වෙයි. නොවන්නේද වෙයි’ යන මේ දෘෂ්ටිය උපදින්නේද?” - “ස්වාමීනි, එය නොවන්නේමය.”

**5.** “ඇසින් දකින ලද, කණින් අසන ලද, නාසය දිව කය යන තුනෙන් දන්නාලද, සිතින් දැනගන්නා ලද පැමිණෙන ලද, සොයන ලද, විමසන ලද, යම් මේ දෙයක් වෙයිද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?” - “ස්වාමීනි, අනිත්‍යය.”

“යමක් වනාහි අනිත්‍යනම් එය දුක හෝ සැප හෝ වෙයිද?” - “ස්වාමීනි, දුකය.”

“යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන ‘සත්ත්ව තෙමේ මරණින් මතු වන්නේද වෙයි. නොවන්නේද වෙයි. යන මේ දෘෂ්ටිය උපදින්නේද?” - “ස්වාමීනි, එය නොවන්නේමය.”

**6.** මහණෙනි, යම් තැනක පටන් ආර්යශ්‍රාවකයාගේ මේ කරුණෙහි සැක දුරුවූයේ වෙයිද, ඔහුට දුක පිළිබඳවද, සැක දුරුවූයේ වෙයි. ඔහුට දුක්ඛ සමුදය පිළිබඳවද සැක දුරුවූයේ වෙයි. ඔහුට දුක්ඛ නිරෝධය පිළිබඳවද සැක දුරුවූයේ වෙයි. ඔහුට දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදාව පිළිබඳවද සැක දුරුවූයේ වෙයි.

‘මහණෙනි, මේ ආර්ය ශ්‍රාවකතෙමේ සොතාපන්නයයිද, සතර අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තෙකැයිද නියත ගති ඇත්තෙකැයිද අර්හත් ඵලය පිහිටකොට ඇත්තෙකැයිද කියනු ලැබේ.”

## 18. තථාගත සූත්‍රය. (4)

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, කුමක් ඇතිකල්හි වනාහි, කුමක් නිසා කුමකට පැමිණ, 'සත්ත්වතෙමේ මරණින් මතු වන්නේද නොවෙයි නොවන්නේද නොවෙයි' යන මේ දෘෂ්ටිය උපදීද?"

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ ප්‍රභවකොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිහිටකොට ඇත්තාහ. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන්වහන්සේ විසින්ම වදාරණසේක්නම් මැනවි."

"මහණෙනි, එසේ නම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමැයි" කීය.

"ස්වාමීනි, එසේයයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. "මහණෙනි, රූපය ඇතිකල්හි රූපය නිසා රූපයට පැමිණ, 'සත්ත්වතෙම මරණින් මතු වන්නේත් නොවෙයි. නොවන්නේත් නොවෙයි' යන මේ දෘෂ්ටිය උපදියි.

"වේදනාව ඇතිකල්හි වේදනාව නිසා වේදනාවට පැමිණ, 'සත්ත්වතෙම මරණින් මතු වන්නේත් නොවෙයි. නොවන්නේත් නොවෙයි' යන මේ දෘෂ්ටිය උපදියි.

"සංඥාව ඇතිකල්හි සංඥාව නිසා, සංඥාවට පැමිණ සත්ත්වතෙම මරණින් මතු වන්නේත් නොවෙයි. නොවන්නේත් නොවෙයි' යන මේ දෘෂ්ටිය උපදියි.

සංස්කාරය ඇති කල්හි, සංස්කාරය නිසා, සංස්කාරයට පැමිණ, 'සත්ත්වතෙම මරණින් මතු වන්නේත් නොවෙයි. නොවන්නේත් නොවෙයි යන මේ දෘෂ්ටිය උපදියි.

"විඤ්ඤාණය ඇතිකල්හි විඤ්ඤාණය නිසා, විඤ්ඤාණයට පැමිණ, 'සත්ත්වතෙම මරණින් මතු වන්නේත් නොවෙයි. නොවන්නේත් නොවෙයි' යන මේ දෘෂ්ටිය උපදියි.

4. "මහණෙනි, ඒ කුමකැයි හඟිව්ද? රූපය නිත්‍යය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකයි."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිලෙස නොගෙන 'සත්ත්වතෙම මරණින් මතු වන්නේද නොවෙයි. නොවන්නේද නොවෙයි' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය,"

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිලෙස නොගෙන 'සත්ත්වතෙමේ මරණින් මතු වන්නේද නොවෙයි. නොවන්නේද නොවෙයි' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය,"

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වෙයිද? - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිලෙස නොගෙන 'සත්ත්වතෙමේ මරණින් මතු වන්නේද

නොවෙයි. නොවන්නේද නොවෙයි’ යන මේ දෘෂ්ටිය උපදින්නේද?” - “ස්වාමීනි, එය නොවන්නේමය.”

“සංස්කාරය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?” - “ස්වාමීනි අනිත්‍යය.”

“යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වෙයිද?” - “ස්වාමීනි, දුකයි.”

“යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිකොට නොගෙන ‘සත්ව තෙමේ මරණින් මතු වන්නේද නොවෙයි. නොවන්නේද නොවෙයි’ යන මේ දෘෂ්ටිය උපදින්නේද?” - “ස්වාමීනි, එය නොවන්නේමය.”

“විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?” - “ස්වාමීනි, අනිත්‍යය.”

“යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වෙයිද?” - “ස්වාමීනි, දුකය.”

“යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිලෙස නොගෙන ‘සත්ත්ව තෙමේ මරණින් මතු වන්නේද නොවෙයි. නොවන්නේද නොවෙයි’ යන මේ දෘෂ්ටිය උපදින්නේද?” - “ස්වාමීනි, එය නොවන්නේමය.”

**5.** “ඇසින් දකින ලද, කණින් අසන ලද, නාසය දිව කය යන තුනෙන් දන්නා ලද, සිතින් දැනගන්නා ලද පැමිණෙන ලද, සොයන ලද, විමසන ලද, යම් මේ දෙයක් වෙයිද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?” - “ස්වාමීනි, අනිත්‍යය.”

“යමක් වනාහි අනිත්‍යනම් එය දුක හෝ සැප හෝ වෙයිද?” - “ස්වාමීනි, දුකය.”

“යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, එය දැඩිකොට අල්වා නොගෙන ‘සත්ත්ව තෙමේ මරණින් මතු වන්නේද වෙයි. නොවන්නේද වෙයි’ යන මේ දෘෂ්ටිය උපදින්නේද?” - “ස්වාමීනි, එය නොවන්නේමය.”

**6.** මහණෙනි, යම්තැනක පටන් ආර්යශ්‍රාවකයාහට මේ සයවැදෑරුම් කරුණෙහි සැක දුරුවූයේ වෙයිද, ඔහුට දුක පිළිබඳවද සැක දුරුවූයේ වෙයි. ඔහුට දුක්ඛ සමුදය පිළිබඳවද සැක දුරුවූයේ වෙයි. දුක්ඛ නිරෝධයෙහිද සැකදුරුවූයේ වෙයි, ඔහුට දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදාව පිළිබඳවද සැක දුරුවූයේ වෙයි.

"මහණෙනි, මේ ආර්ය ශ්‍රාවකතෙමේ සොතාපන්නයෙකැයිද, සතර අපායෙහි නොවැටීම ස්වභාවකොට ඇත්තෙකැයිද, අර්හත් ඵලය පිහිටකොට ඇත්තෙකැයිද කියනු ලැබේ."

(දහඅටවෙනි තථාගත සූත්‍රය (4) නිමි.)

---

(ශ්‍රොතාපන්නය, ආර්යශ්‍රාවකය සහ භවයෝනිය ප්‍රකාශිත අටළොස් සූත්‍රාන්තය නිමියේය.)

(වාත, එතං මම, සොඅත්තා, නො ච මෙසියා, නත්ථි කරොථ දෙක, නත්ථිහෙතු, මහාදිට්ඨ, සස්සත, අසස්සත, අත්ත, අනන්ත, තංජීවං, අඤ්ඤංජීවං සහ තථාගත හතරදැයි මේ සොයේව පෙය්යාලයෙහි සූත්‍ර දහඅටකි.)

(පළමුවන සෝයෙව පෙය්යාලය නිමි.)

---

## 2. පෙයාල වර්ගය.

### 1. වාත සූත්‍රය.

(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1603 වෙනි පිටේ වාත සූත්‍රය මෙනි.)

5. "මහණෙනි, මෙසේ වනාහි දුක ඇතිකල්හි, දුක නිසා, දුකට පැමිණ 'වාතයෝ නොහමත්. ගංගාවෝ ගලා නොබසිත්. ගර්භනීහු නොවදත්. සඳ හිරු උදා නොවෙත්, නොබසිත්

ඉන්ද්‍රඛීලයක් මෙන් සිටියේය' යන මෙවැනි දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 2. එතං මම සූත්‍රය.

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1606 වෙනි පිටේ එතං මම සූත්‍රය මෙනි.)**

5. "මහණෙනි, මෙසේ වනාහි දුක ඇතිකල්හි, දුක නිසා දුකට පැමිණ, 'මෙය මගේය ඒ මම වෙමි. එය මාගේ ආත්මය වේය' යන මෙවැනි දෘෂ්ටියක් උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 3. සො අත්තා සූත්‍රය.

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1610 වෙනි පිටේ සො අත්තා සූත්‍රය මෙනි.)**

5. "මහණෙනි, මෙසේ වනාහි දුක ඇති කල්හි, දුකට පැමිණ, 'හේ ආත්මය වෙයි. හේ ලෝකය වෙයි. හේ පරලොව මම වන්නෙමි. හේ නිත්‍යය, ඒකාන්තය, සදාකාලිකය, නොපෙරලෙන ස්වභාව ඇත්තේය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 4. නෝචමේසියා සූත්‍රය.

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1613 වෙනි පිටේ නෝචමේසියා සූත්‍රය මෙනි.)**

5. "මහණෙනි, මෙසේ වනාහි දුක ඇති කල්හි දුකනිසා දුකට පැමිණ 'මම නොවෙම් නම් මාගේ නොවෙයි. මම නොවන්නෙම් නම් මාගේ නොවන්නේය, යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 5. නත්ථි කරොත සූත්‍රය.

**(මෙ සූත්‍රයේ 13 වෙනි ඡේදය හැර අනිත් කොටස 1616 වෙනි පිටේ නත්ථි කරොත සූත්‍රය (1) මෙනි.)**

13. මහණෙනි, මෙසේ වනාහි දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ 'දානයෙහි විපාක නැත. කම්පල අදහා කරණ මහා යාගයන්හි විපාක නැත. පුදන ලද්දෙහි විපාක නැත. කුසලාකුසලයන්ගේ ඵල විපාක නැත. පරලොවක් නැත. මෙලොවක් නැත. මවෙක් නැත. පියෙක් නැත. ඕපපාතික සත්ත්වයෝ නැත. යමෙක් මෙලොවත් පරලොවත් යහපත් නුවණින් ප්‍රත්‍යක්ෂකොට දැනගනිත්ද එබඳු යහපත් පැවතුම් ඇති යහපත් ගති ඇති, මහණ බමුණෝ ලෙව්හි නැත. සතරමහාභූතයන්ගෙන් ඇතිවූ මේ පුරිෂතෙමේ යම්කලෙක කලුරිය කරයිද, එකල පඨවි ධාතුව, පඨවි ධාතුව අනුවයයි. ආපෝ ධාතුව, ආපෝ ධාතුව අනුව යයි තේජෝ ධාතුව තේජෝ ධාතුව, අනුව යයි. වායෝ ධාතුව, වායෝ ධාතුව අනුව යයි. සිත සවැනි කොට ඇති ඉන්ද්‍රියයෝ අහසට ගමන් කරත්. ඇඳ පස්වැනි කොට ඇති මලසිරුර පුරිසයන් සතර දෙනෙක් ගෙනයත්. ගුණාගුණ පදයෝ සොහොන්බිම තෙක් ප්‍රකට වෙත්. ඇට පරෙයිපත් පාට ඇති වෙත්. දෙනලද දානාදීන්ගේ ඵලය අලු කෙළවර කොට ඇත්තේ වෙයි. මේ දානය නම් බාලයන් විසින් පනවනලද ඔවුන්ගේ හිස්වූ සත්‍යයෙන් තොරවූ විලාපයකි. යමෙක් දුන් දෙයෙහි ඵල ඇතැයි කියත්ද, ඒ බාලයෝද, පණ්ඩිතයෝද, ශරීරයාගේ බිඳීමෙන් සිඳීමට යෙත්. විනාශයට යෙත්. මරණින් මතු නූපදිත් යන මේ දෘෂ්ටි උපදීද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 6. නත්ථි කරොත සූත්‍රය. (2)

**(මේ සූත්‍රයේ 13 වෙනි ඡේදය හැර අනිත් කොටස 1626 වෙනි පිටේ නත්ථි කරොත සූත්‍රය (2) මෙනි.)**

13. "මහණෙනි, මෙසේ වනාහි දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ (පව්කම්) කරන්නා හටද, කරවන්නාහටද, අත්පා ආදිය සිඳින්නාහටද, සින්දවන්නාහටද, පීඩාකරන්නාහටද, පීඩාකරවන්නාහටද, සෝක ඇතිකරන්නාහටද, අනුන් ලවා ශෝක කරවන්නාහටද, ක්ලාන්ත කරන්නාහටද, ක්ලාන්ත කරවන්නාහටද, බඳින්නාහටද, බන්දවන්නාහටද, ප්‍රාණඝාත

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කරන්නාහටද, සොරකම් කරන්නාහටද, ගෙවල් බිඳින්නාහටද, ගම් පහරන්නාහටද, ගේ වටකර බඩු පැහැරගන්නාහටද, මග රැක සිට අන්සතු දෙය පැහැරගන්නාහටද පරඹුවන් කරා යන්නාහටද බොරු කියන්නාහටද පව් කරන්නාහටද පාපයක් නැත. කඩු හාත්පස ඇති චක්‍රයකින් යමෙක් පෘථුවියෙහි වූ සියලු ප්‍රාණීන් එකම මස් රැසක් එකම මස් ගොඩක් කරන්නේද, ඒ නිසා වන පවක් නැත, පාපයාගේ පැමිණීමක්ද නැත. නසමින් ඝාතනය කරමින් සිඳිමින් සින්දවමින් පීඩා කරමින් පීඩා කරවමින් ගංගා නදියෙහි දකුණු ඉවුර තෙක් යන්නේද, ඒ හේතුකොට ගෙන වන පවක් නැත පාපයාගේ පැමිණීමක්ද නැත, දන්දෙමින් දෙවමින් මහාදාන සංඛ්‍යාත යාගකරමින් යාග කරවමින් ගංගා නදියෙහි උතුරු ඉවුර දක්වා ඉදින් යන්නේද, ඒ හේතුකොටගෙන වන පිනක් නැත පුණ්‍යයාගේ පැමිණීමක්ද නැත, දීම කරණකොට ගෙනද, දානයෙන් ඉන්ද්‍රිය දමනයෙන් සීල සංයමයෙන් සත්‍ය වචනයෙන් වන්නාවූ පින් නැත. පුණ්‍යයාගේ පැමිණීමක් නැත' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 7. නත්ථි හේතු සූත්‍රය.

**(මේ සූත්‍රයේ 13 වෙනි ඡේදය හැර අනිත් කොටස 1637 වෙනි පිටේ නත්ථි හේතු සූත්‍රය මෙනි.)**

13. "මහණෙනි, මෙසේ වනාහි දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ 'සත්ත්වයින්ගේ කෙලෙසීම පිණිස හේතුවක් නැත්තේය. ප්‍රත්‍යයක් නැත්තේය හේතු රහිතව ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ කෙලෙසෙත්. සත්ත්වයන්ගේ විසුද්ධිය පිණිස හේතුවක් නැත්තේය. ප්‍රත්‍යයක් නැත්තේය. හේතු රහිතව ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ පිරිසිදු වෙත්. (දිව්‍ය ලොකාදියෙහි ඉපදීමට හේතුවන) බලයක් නැත. වීර්යයක් නැත. පුරිස ශක්තියක් නැත. පුරිස පරාක්‍රමයක් නැත. සියලු සත්ත්වයෝ, සියලු ප්‍රාණීහු, සියලු භූතයෝ ශාලියවාදී සියලු ජීවීහු තමාවසඟයෙහි නොපවත්නාහු, බලරහිත වූවාහු, වීර්ය නැත්තාහු, නියම වශයෙන්ද, ඒ ඒ ජාතීන්හි ගමන් කිරීම් වශයෙන්ද ස්වභාව වශයෙන්ද, නොයෙක්

ආකාරයට පැමිණියාහු තණ්හාභිජාති ආදී සවැදෑරුම් ශ්‍රේෂ්ඨ ජාතිවල සැප දුක් නැවත නැවත විඳිත්' යන මෙබඳු දෘෂ්ටි උපදීද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 8. මහාදිට්ඨ සූත්‍රය.

### (මේ සූත්‍රයේ 13 වෙනි ඡේදය හැර අනිත් කොටස 1644 වෙනි පිටෙ මහාදිට්ඨ සූත්‍රය මෙනි.)

13. "මහණෙනි, මෙසේ වනාහි දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ 'කිසිවෙකු විසින් නොකරණ ලද කිසිවෙකුගේ විධානය නොකරණ ලද කිසිවෙකු විසින් නිර්මාණය නොකරන ලද නිර්මාණය නොකරවන ලද පර්වත කූටයක් මෙන් නිශ්චලවූ ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චලවූ ධර්ම සමූහය හතක් වෙත්. ඔව්හු නො සැලෙත්, ප්‍රකෘතිය නොහරිත්, ඔවුනොවුන්ට බාධා නොකරත් ඔවුනොවුන්ට සැප පිණිස හෝ දුක් පිණිස හෝ සැප දුක් පිණිස හෝ නොසමත් වෙත්. ඒ සත්ධර්ම සමූහයෝ කවරහුද?

'පෘථිවිධාතු සමූහය, ආපෝධාතු සමූහය, තේජෝධාතු සමූහය, වායෝධාතු සමූහය, සුඛධාතු සමූහය, දුක්ඛධාතු සමූහය, ජීවධාතු සමූහය යන මේ ධාතු සමූහයා (කිසිවෙකු විසින්) නොකරණලදහ. කිසි විධානයක් නොකරණලදහ. කිසිවෙකු විසින් නොමවනලදහ. කිසිවෙකු විසින් මැවීම නොකරවනලදහ. (ඵල රහිත හෙයින්) වඳයහ. පර්වතකූටයක් මෙන් නිශ්චලව සිටියහ. ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චලව සිටියාහ. ඔව්හු නොසැලෙත්, ප්‍රකෘතිය නොහරිත්, ඔවුනොවුන් නොගැටෙත්, සුව පිණිස හෝ දුක් පිණිස හෝ සුවදුක් පිණිස හෝ නොසමත් වෙත්. යමෙක් තියුණු ආයුධයකින් හිස සිඳීද, (එයින්) කිසිවෙක් කිසිවෙකු ජීවිතයෙන් තොර නොකරයිද, සත්වැදෑරුම්වූ ශරීරයන්ගේ අතරෙන්ම ආයුධය ඇතුලට ගමන් කරයි.

"මේ වනාහි ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී උත්තමයෝනින් සම්බන්ධ තුදුස් ලක්ෂ හයදහස් හයසියයක්ද, කර්ම පන්සියයක්ද කර්ම

පසක්ද, කර්ම තුනක්ද, කාය වාක් කර්ම දෙකක්ද, මනෝකර්ම නම්වූ අර්ධ කර්මයද, දෙසැටක් ප්‍රතිපදාවෝද, දෙසැටක් අන්තර කල්පයෝද, කෘෂ්ණාදී ශ්‍රේෂ්ඨ ජාති සයක්ද මන්දාදී පුරිෂ භූමි අටද, ආජීවකවෘත්ති එක්සිය නවසාළිසක්ද, පරිව්‍රාජක ප්‍රව්‍රජ්‍යා එකසිය සතළිස් නවයක්ද, නාග මණ්ඩල එකසිය හතළිස් නවයක්ද, ඉන්ද්‍රියය එකසිය විස්සක්ද, නිරය එකසිය තිහක්ද, අත් පා පිටු ආදී රාජොධාතු තිස් හයක්ද, ඔටු ගවාදී සංඥී ගර්භ සතක්ද, සාලියවාදී අසංඥී ගර්භ සතක්ද, උක් ආදී නිර්ග්‍රන්ථි ගර්භ සතක්ද, දෙවයෝනි සතක්ද නොහොත් බොහෝ දෙවියෝද, මනුෂ්‍ය යෝනි සතක්ද නොහොත් බොහෝ මනුෂ්‍යයෝද, පිසාචයෝනි සතක්ද, මහාවිල් සතක්ද ගැට සතක්ද, මහා ප්‍රපාත සතක්ද, කුඩා ප්‍රපාත එකසිය සතක්ද, මහා ස්වප්න සතක්ද කුඩා ස්වප්න එකසිය හතක්ද, චූලාසීති මහා කල්ප ලක්ෂයක්ද ගෙවා බාලයෝද පණ්ඩිතයෝද, භවයෙන් භවය ගමන් කොට (සසර) සැරිසරා දුක් කෙළවර කරන්නාහ.

'එහි මම මේ අචේලක සීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචරියාවෙන් හෝ මුහුකිරීමට නොපැමිණි කර්මය හෝ මුහුකුරුවන්නෙමි. මුහුකිරීමට ගියාවූ කර්මය හෝ ස්පර්ශ කරමින් ගෙවීම කරන්නෙමැයි කියාද, මෙසේ නැත්තේය. නැලියෙන් මැන ප්‍රමාණ කරණලද්ද මෙන් සසර සුව දුක් කියනලද කාල ප්‍රමාණයෙන් කෙළවර කළ කල්හි (සසර) අඩුවීමක් හෝ වැඩිවීමක් නැත්තේය උසස් බවක් හෝ පහත් බවක් නැත්තේය. වෙලනලද නූල් බෝලයක් (පර්වතයක හෝ ගසක් උඩ සිට) විසිකරණ ලද්දේ යම්සේ ලිහෙමින්ම යයිද, (නූල අවසන්වූ කල්හි එහිම නතර වෙයිද) එපරිදිම බාලයෝද, පණ්ඩිතයෝද, භවයෙන් භවයට ගමන් කරමින් සුවදුක් කෙළවර කරති' යන මේ දෘෂ්ටි උපදීද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 9. සස්සත සූත්‍රය.

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1665 වෙනි පිටේ සස්සත සූත්‍රය මෙනි.)**

5. "මහණෙනි, මෙසේ වනාහි දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ 'ලෝකය සදාකාලිකය' යන මේදෘෂ්ටිය උපදීද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 10. අසස්සත සූත්‍රය.

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1668 වෙනි පිටේ අසස්සත සූත්‍රය මෙනි.)**

5. "මහණෙනි, මෙසේ වනාහි දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ 'ලෝකය සදාකාලික නොවේ. යන මේ දෘෂ්ටිය උපදීද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 11. අන්තවා සූත්‍රය.

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1671 වෙනි පිටේ අන්ත සූත්‍රය මෙනි.)**

5. "මහණෙනි, මෙසේ වනාහි දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ 'ලෝකය අන්තවත්ය (කෙළවරක් ඇත්තේය.) යන මේ දෘෂ්ටිය උපදීද?" - "ස්වාමීනි එය නොවන්නේමය."

## 12. අනන්ත සූත්‍රය

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1674 වෙනි පිටේ අනන්ත සූත්‍රය මෙනි.)**

5. "මහණෙනි, මෙසේ වනාහි දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ 'ලෝකය කෙළවරක් නැත්තේය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 13. තංජීවං සූත්‍රය.

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1677 වෙනි පිටේ තංජීවං සූත්‍රය මෙනි.)**

5. "මහණෙනි, මෙසේ වනාහි දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ 'එය ජීවිතය වෙයි, එය ශරීරය වෙයි' යන මේ දෘෂ්ටිය උපදීද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 14. අඤ්ඤංජීවං සූත්‍රය.

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1680 වෙනි පිටේ අඤ්ඤංජීවං සූත්‍රය මෙනි.)**

5. "මහණෙනි, මෙසේ වනාහි දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ 'ජීවය අනිකකි. ශරීරය අනිකකි, යන මේ දෘෂ්ටිය උපදීද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 15. තථාගත සූත්‍රය (1)

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1683 වෙනි පිටේ තථාගත සූත්‍රය මෙනි.)**

5. "මහණෙනි, මෙසේ වනාහි දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ "සත්ත්වතෙමේ මරණින් පසු ඇත්තේය, යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 16. තථාගත සූත්‍රය. (2)

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1686 වෙනි පිටේ තථාගත සූත්‍රය මෙනි.)**

5. "මහණෙනි, මෙසේ වනාහි දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ 'සත්ත්වතෙමේ මරණින් පසු නැත්තේය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 17. තථාගත සූත්‍රය (3)

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1689 වෙනි පිටේ තථාගත සූත්‍රය මෙනි.)**

5. "මහණෙනි, මෙසේ වනාහි දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ 'මරණින් පසු සත්ත්වයා ඇත්තේද වෙයි නැත්තේද වෙයි' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි එය නොවන්නේමය."

## 18. තථාගත සූත්‍රය (4)

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1692 වෙනි පිටේ තථාගත සූත්‍රය මෙනි.)**

5. "මහණෙනි, මෙසේ වනාහි දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ 'මරණයෙන් පසු සත්ත්වතෙමේ නොවේමය, නොවන්නේත් නොවේය' යන දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 19. අත්තා සූත්‍රය (1)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

"මහණෙනි, කුමක් ඇතිකල්හි කුමක් නිසා කුමකට පැමිණ මරණයෙන් මතු 'අරමුණ නිරෝගීවූ ආත්මයයයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නාකොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම වදාරන සේක් නම් මැනවි.

"මහණෙනි, එසේ නම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමැයි" කීය.

"ස්වාමීනි, එසේයයි" ඒ භික්ෂූහු, භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. "මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපයට පැමිණ මරණයෙන් මතු 'අරමුණ නිරෝගීවූ ආත්මය වෙයි යන මෙවැනි දෘෂ්ටියක් උපදියි."

වේදනාව ඇති කල්හි වේදනාව නිසා වේදනාවට පැමිණ මරණයෙන් මතු 'අරමුණ නිරෝගිවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

"සංඥාව ඇතිකල්හි, සංඥාව නිසා, සංඥාවට පැමිණ මරණයෙන් මතු 'අරමුණ නිරෝගිවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

"සංස්කාර ඇති කල්හි සංස්කාරය නිසා සංස්කාරයන්ට පැමිණ මරණයෙන් මතු 'අරමුණ නිරෝගීවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

"විඤ්ඤාණය ඇති කල්හි විඤ්ඤාණය නිසා විඤ්ඤාණයට පැමිණ මරණයෙන් මතු 'අරමුණ නිරෝගීවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

**4.** "මහණෙනි, කුමක් සිතන්නහුද? රූපය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, ඉදින් ඒ රූපය අල්වා නොගැනීමෙන් මරණයෙන් මතු 'අරමුණ නිරෝගීවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද" - "ස්වාමීනි, එසේ නොවේ."

"මහණෙනි, මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මරණයෙන් මතු 'අරමුණ නිරෝගීවූ ආත්මය වෙයි යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

"මහණෙනි, කුමක් සිතන්නහුද? වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, ඉදින් ඒ වේදනාව අල්වා නොගැනීමෙන් මරණයෙන් මතු 'අරමුණ නිරෝගීවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි, එසේ නොවේ."

"මහණෙනි, මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මරණයෙන් මතු අරමුණ නිරෝගීවූ ආත්මය වෙයි" යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

"මහණෙනි, කුමක් සිතන්නහුද? සංඥාව නිත්‍යයද, අනිත්‍යයද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද වෙනස්වන ස්වභාවයද ඉදින් ඒ සංඥාව අල්වා නොගැනීමෙන් මරණයෙන් මතු අරමුණ නිරෝගීවූ ආත්මය වෙයි යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි, එසේ නොවේ."

මහණෙනි, මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මරණයෙන් මතු 'අරමුණ නිරෝගීවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

'මහණෙනි, කුමක් සිතන්නහුද? සංස්කාර නිත්‍යද අනිත්‍යයද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද දුකද වෙනස්වන ස්වභාවද ඉදින් ඒ සංස්කාර අල්වා නොගැනීමෙන් මරණයෙන් මතු 'අරමුණ නිරෝගීවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි, එසේ නොවේ."

"මහණෙනි. මෙසේ දුක ඇතිකල්හි දුක නිසා දුකට පැමිණ මරණයෙන් මතු 'අරමුණ නිරෝගීවූ ආත්මය වෙයි' යන මෙවැනි, දෘෂ්ටියක් උපදියි."

'මහණෙනි, කුමක් සිතන්නහුද? විඤ්ඤාණය නිත්‍යය හෝ අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

'යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි දුකය."

'යමක් වනාහි අනිත්‍යයද දුකද වෙනස්වන ස්වභාවද, ඒ විඤ්ඤාණය දැඩිකොට අල්වා නොගෙන 'මරණයෙන් මතු අරමුණ නිරෝගීවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි. එසේ නොවේ."

"මහණෙනි. මෙසේ දුක ඇතිකල්හි දුක නිසා දුකට පැමිණ 'මරණයෙන් මතු අරමුණ නිරෝගීවූ ආත්මය වෙයි' යන දෘෂ්ටිය උපදියි.

**5.** "මහණෙනි, යම්තැනක පටන් ආර්ය ශ්‍රාවකයාහට මේ කරුණු සයෙහි, සැක දුරුවූයේ වෙයිද, ඔහුට දුක පිළිබඳවද සැක දුරුවූයේ වෙයි. ඔහුට දුක්ඛ සමුදය පිළිබඳවද සැකදුරු වූයේ වෙයි. ඔහුට දුක්ඛ නිරෝධය පිළිබඳවද සැක දුරුවූයේ වෙයි. ඔහුට දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදාව පිළිබඳව ද සැක දුරුවූයේ වෙයි.

"මහණෙනි, මේ ආර්ය ශ්‍රාවකතෙමේ ශ්‍රොතාපන්නයයිද, සතර අපායෙහි නොවැටීම ස්වභාවකොට ඇත්තෙකැයිද නියත ගති ඇත්තෙකැයිද, අර්හත්ඵලය පිහිටකොට ඇත්තෙකැයිද කියනු ලැබේ.

## 20. අත්තා සූත්‍රය (2)

**1. (මේ සූත්‍රයද මේ වර්ගයේ 19 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේසනාකරන ලද්දකි)**

**2.** "මහණෙනි, කුමක් ඇතිකල්හි, කුමක් නිසා, කුමකට පැමිණ, 'මරණින් පසු ධ්‍යානය (අරූපි බව) නිරෝගීවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින් කියා දෙතොත් හොඳය."

"මහණෙනි, එසේනම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමැයි" කීය.

"ස්වාමීනි, එසේයයි"ඒ භික්ෂූහු, භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. "මහණෙනි, රූපය ඇතිකල්හි, රූපය නිසා, රූපයට පැමිණ, 'මරණින් පසු ධ්‍යානය (අරූපි බව) නිරෝගීවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

"වේදනාව ඇති කල්හි වේදනාව නිසා, වේදනාවට පැමිණ, 'මරණින් පසු ධ්‍යානය (අරූපි බව) නිරෝගීවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

"සංඥාව ඇතිකල්හි, සංඥාව නිසා, සංඥාවට පැමිණ, 'මරණින් පසු ධ්‍යානය (අරූපි බව) නිරෝගීවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

"සංස්කාරයෝ ඇතිකල්හි, සංස්කාරයන් නිසා, සංස්කාරයන්ට පැමිණ, 'මරණින් පසු ධ්‍යානය (අරූපි බව) නිරෝගීවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

"විඥ්ඥාණය ඇතිකල්හි, විඥ්ඥාණය නිසා, විඥ්ඥාණයට පැමිණ, 'මරණින් පසු ධ්‍යානය (අරූපි බව) නිරෝගීවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

4. "මහණෙනි, කුමක් සිතන්නහුද? රූපය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, ඉදින් ඒ රූපය අල්වා නොගැනීමෙන් 'මරණින් පසු ධ්‍යානය (අරූපි බව) නිරෝගීවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි. එසේ නොවේය."

"මහණෙනි, මෙසේ දුක ඇතිකල්හි, දුක නිසා, දුකට පැමිණ, මෙවැනි දෘෂ්ටි උපදියි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණෙනි. කුමක් සිතන්නහුද? වේදනාව නිත්‍යය හෝ අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද ඉදින් ඒ වේදනාව අල්වා නොගැනීමෙන් 'මරණින් පසු ධ්‍යානය (අරූපි බව) නිරෝගීවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි, එසේ නොවේය."

"මහණෙනි, මෙසේ දුක ඇතිකල්හි, දුක නිසා, දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි.

"මහණෙනි, කුමක් සිතන්නහුද? සංඥාව නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, ඉදින් ඒ සංඥාව අල්වා නොගැනීමෙන් 'මරණින් පසු ධ්‍යානය (අරූපි බව) නිරෝගීවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි, එසේ නොවේය."

"මහණෙනි, මෙසේ දුක ඇතිකල්හි, දුක නිසා, දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි.

"මහණෙනි, කුමක් සිතන්නහුද? සංස්කාරයෝ නිත්‍යද? අනිත්‍යයද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, ඉදින් ඒ සංස්කාර අල්වා නොගැනීමෙන් 'මරණින් පසු ධ්‍යානය (අරූපි බව) නිරෝගීවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි, එසේ නොවේය."

"මහණෙනි, මෙසේ දුක ඇතිකල්හි, දුක නිසා, දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි.

"මහණෙනි, කුමක් සිතන්නහුද? විඤ්ඤාණය නිත්‍යද? අනිත්‍යද? - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, ඉදින් ඒ විඤ්ඤාණය අල්වානොගැනීමෙන් 'මරණින් පසු ධ්‍යානය (අරූපි බව) නිරෝගීවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි. එසේ නොවේය."

"මහණෙනි, මෙසේ දුක ඇතිකල්හි, දුක නිසා. දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි.

## 21. අත්තා සූත්‍රය. (3)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ 19 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයෙහිදී දේශනා කරන ලද්දකි.)

2. "මහණෙනි, කුමක් ඇතිකල්හි කුමක් නිසා කුමකට පැමිණ මෙවැනි දෘෂ්ටිය උපදියිද?

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය."

"මහණෙනි, එසේනම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමැයි" කීය.

"ස්වාමීනි, එසේයයි," ඒ භික්ෂූහු, භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. "මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපයට පැමිණ 'අරමුණද, ධ්‍යානයද, මරණයෙන් මතු නිරෝගි ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

"වේදනාව ඇති කල්හි වේදනාව නිසා වේදනාවට පැමිණ 'අරමුණද, ධ්‍යානයද, මරණයෙන් මතු නිරෝගී ආත්මයවෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

"සඤ්ඤාව ඇති කල්හි සඤ්ඤාව නිසා සඤ්ඤාවට පැමිණ 'අරමුණද, ධ්‍යානයද, මරණයෙන් මතු නිරෝගි ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

"සංස්කාරයෝ ඇති කල්හි සංස්කාරයන් නිසා සංස්කාරයන්ට පැමිණ, 'අරමුණද, ධ්‍යානයද මරණයෙන් මතු නිරෝගී ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

"විඤ්ඤාණය ඇති කල්හි විඤ්ඤාණය නිසා විඤ්ඤාණයට පැමිණ 'අරමුණද, ධ්‍යානයද, මරණයෙන් මතු ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

4. "මහණෙනි, කුමක් සිතන්නහුද? "රූපය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යයි."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, ඉදින් ඒ රූපය අල්වා නොගැනීමෙන් 'අරමුණද, ධ්‍යානයද, මරණයෙන් මතු නිරෝගි ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි, එසේ නොවේය."

"මහණෙනි, මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි."

"මහණෙනි, කුමක් සිතන්නහුද? වේදනාව නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, ඉදින් ඒ වේදනාව අල්වා නොගැනීමෙන් 'අරමුණද, ධ්‍යානයද, මරණයෙන් මතු නිරෝගී ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි, එසේ නොවේය."

"මහණෙනි, මෙසේ දුක ඇතිකල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි.

"මහණෙනි, කුමක් සිතන්නහුද? සංඥාව නිත්‍යයද, අනිත්‍යයද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, ඉදින් ඒ සංඥාව අල්වා නොගැනීමෙන් 'අරමුණද, ධ්‍යානයද, මරණයෙන් මතු නිරෝගී ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි, එසේ නොවේය."

"මහණෙනි, මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි.

"මහණෙනි, කුමක් සිතන්නහුද? සංස්කාරයෝ නිත්‍යද? අනිත්‍යයද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, ඉදින් ඒ සංස්කාර අල්වා නොගැනීමෙන් 'අරමුණද, ධ්‍යානයද මරණින් මතු නිරෝගී ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි, එසේ නොවේය."

'මහණෙනි මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි.

"මහණෙනි, කුමක් සිතන්නහුද? විඤ්ඤාණය නිත්‍යය හෝ අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, ඒ විඤ්ඤාණය අල්වානොගෙන අරමුණද, ධ්‍යානයද මරණයෙන් මතු නිරෝගී ආත්මයවෙයි යන මේ දෘෂ්ටිය උපදියිද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"මහණෙනි, මෙසේ දුක ඇතිකල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි.

## 22. අත්තා සූත්‍රය. (4)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ 19 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයෙහිදී දේසනා කරන ලද්දකි.)

2. 'මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් නිසා කුමකට පැමිණ 'අරමුණද නොවන ධ්‍යානයද නොවන්නක් මරණින් පසු නිරෝගී ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටිය උපදියිද?"

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇත්තාහ. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය."

"මහණෙනි, එසේ නම් අසව්. මනාකොට මෙනෙහි කරව් කියන්නෙ මැයි" කීය.

"ස්වාමීනි, එසේයයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. "මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපයට පැමිණ 'අරමුණද නොවන ධ්‍යානයද නොවන්නක් මරණින් පසු නිරෝගි ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

"වේදනාව ඇති කල්හි වේදනාව නිසා වේදනාවට පැමිණ අරමුණද නොවන ධ්‍යානයද නොවන්නක් මරණින් පසු නිරෝගී ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

"සංඥාව ඇති කල්හි සංඥාව නිසා සංඥාවට පැමිණ 'අරමුණද නොවන ධ්‍යානයද නොවන්නක් මරණින් පසු නිරෝගී ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

"සංස්කාරයෝ ඇති කල්හි සංස්කාරයන් නිසා සංස්කාරයන්ට පැමිණ, 'අරමුණද, නොවන ධ්‍යානයද නොවන්නක් මරණින් පසු නිරෝගී ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

"විඥ්ඥාණය ඇතිකල්හි විඥ්ඥාණය නිසා විඥ්ඥාණයට පැමිණ 'අරමුණද, නොවන ධ්‍යානයද, නොවන්නක් මරණින් පසු නිරෝගී ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

4. "මහණෙනි, කුමක් සිතන්නහුද? "රූපය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, ඉදින් ඒ රූපය අල්වා නොගැනීමෙන් 'අරමුණද නොවන ධ්‍යානයද නොවන්නක් මරණින් පසු නිරෝගී ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි, එසේ නොවේය."

"මහණෙනි, මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි."

"මහණෙනි, කුමක් සිතන්නහුද? වේදනාව නිත්‍යය හෝ අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, ඉදින් ඒ වේදනාව අල්වා නොගැනීමෙන් 'අරමුණද, නොවන ධ්‍යානයද, නොවන්නක් මරණින් පසු නිරෝගී ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි, එසේ නොවේය."

"මහණෙනි, මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි.

"මහණෙනි, කුමක් සිතන්නහුද? සංඥාව නිත්‍යයද, අනිත්‍යයද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද? එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවයද ඉදින් ඒ සංඥාව අල්වා නොගැනීමෙන් 'අරමුණද නොවන ධ්‍යානයද, නොවන්නක් මරණින් පසු නිරෝගී ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි, එසේ නොවේය."

"මහණෙනි, මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි.

"මහණෙනි, කුමක් සිතන්නහුද? සංස්කාරයෝ නිත්‍යද? අනිත්‍යයද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, ඉදින් ඒ සංස්කාර අල්වා නොගැනීමෙන් 'අරමුණද, නොවන ධ්‍යානයද නොවන්නක් මරණින් පසු නිරෝගී ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි, එසේ නොවේය."

"මහණෙනි මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි."

"මහණෙනි, කුමක් සිතන්නහුද? විඥ්ඥාණය නිත්‍යය හෝ අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම්, එය දුකද? සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, ඒ විඥ්ඥාණය අල්වා නොගැනීමෙන් 'අරමුණද නොවන ධ්‍යානයද නොවන්නක් මරණයෙන් පසු නිරෝගී ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටිය උපදියිද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"මහණෙනි, මෙසේ දුක ඇතිකල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි.

## 23. අත්තා සූත්‍රය. (5)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ 19 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයෙහිදී දේශනාකරණ ලද්දකි.)

2. "මහණෙනි, කුමක් ඇතිකල්හි කුමක් නිසා කුමකට පැමිණ 'මරණින් පසු නිරෝගීවූ ඒකාන්තයෙන් සැපවූ ආත්මයක් වේය' යන මෙවැනි දෘෂ්ටිය උපදියිද?

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය."

"මහණෙනි, එසේනම් අසව්. මනාකොට මෙනෙහි කරව් කියන්නෙමැයි" කීය.

"ස්වාමීනි, එසේයයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. "මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපයට පැමිණ 'මරණින් පසු නිරෝගිවූ ඒකාන්තයෙන් සැපවූ ආත්මයක් වේය' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

"වේදනාව ඇති කල්හි වේදනාව නිසා වේදනාවට පැමිණ 'මරණින් පසු නිරෝගිවූ ඒකාන්තයෙන් සැපවූ ආත්මයක් වේය' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

"සඤ්ඤාව ඇති කල්හි සඤ්ඤාව නිසා සඤ්ඤාවට පැමිණ 'අරමුණින් පසු නිරෝගිවූ ඒකාන්තයෙන් සැපවූ ආත්මයක් වේය' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

"සංස්කාරයෝ ඇති කල්හි සංස්කාරයන් නිසා සංස්කාරයන්ට පැමිණ, 'මරණින් පසු නිරෝගිවූ එකාන්තයෙන් සැපවූ ආත්මයක් වේය' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

"විඤ්ඤාණය ඇතිකල්හි විඤ්ඤාණය නිසා විඤ්ඤාණයට පැමිණ 'මරණින් පසු නිරෝගිවූ ඒකාන්තයෙන් සැපවූ ආත්මයක් වේය' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

**4.** "මහණෙනි, කුමක් සිතන්නහුද? "රූපය නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, ඉදින් ඒ රූපය අල්වා නොගැනීමෙන් 'මරණින්පසු නිරෝගිවූ ඒකාන්තයෙන් සැපවූ ආත්මයක් වේය' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි එසේ නොවේය."

"මහණෙනි, මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි."

"මහණෙනි, කුමක් සිතන්නහුද? වේදනාව නිත්‍යය හෝ අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, ඉදින් ඒ වේදනාව අල්වා නොගැනීමෙන් 'මරණින් පසු නිරෝගිවූ ඒකාන්තයෙන් සැපවූ ආත්මයක් වේය' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි එසේ නොවේය.

"මහණෙනි, මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි.

"මහණෙනි, කුමක් සිතන්නහුද? සංඥාව නිත්‍යයද, අනිත්‍යයද?" - "ස්වාමීනි, අනිත්‍යය."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"යමක් වනාහි අනිත්‍යයද? එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද වෙනස්වන ස්වභාවද ඉදින් ඒ සංඥාව අල්වා නොගැනීමෙන් 'මරණින් පසු නිරෝගිවූ ඒකාන්තයෙන් සැපවූ ආත්මයක් වේය' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමිනි එසේ නොවේය."

"මහණෙනි, මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි.

"මහණෙනි, කුමක් සිතන්නහුද? සංස්කාරයෝ නිත්‍යද? අනිත්‍යයද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, ඉදින් ඒ සංස්කාර අල්වා නොගැනීමෙන් 'මරණින් පසු නිරෝගිවූ ඒකාන්තයෙන් සැපවූ ආත්මයක් වේය' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" -"ස්වාමීනි, එසේ නොවේය."

"මහණෙනි මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි."

"මහණෙනි, කුමක් සිතන්නහුද? විඤ්ඤාණය නිත්‍යය හෝ අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, ඒ විඤ්ඤාණය අල්වා නොගෙන 'මරණින් පසු නිරෝගිවූ ඒකාන්තයෙන් සැපවූ ආත්මයක් වේය' යන මේ දෘෂ්ටිය උපදියිද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"මහණෙනි, මෙසේ දුක ඇතිකල්හි, දුක නිසා, දුකට පැමිණ, මෙවැනි දෘෂ්ටිය උපදියි.

## 24. අත්තා සූත්‍රය. (6)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ 19 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලද්දකි.)

2. "මහණෙනි, කුමක් ඇතිකල්හි කුමක් නිසා කුමකට පැමිණ 'මරණින් පසු නිරෝගිවූ ඒකාන්තයෙන් දුක්වූ ආත්මයක් වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?"

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය."

"මහණෙනි, එසේ නම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමැයි" කීය.

"ස්වාමීනි, එසේයයි," ඒ භික්ෂූහු, භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. "මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපයට පැමිණ 'මරණින් පසු නිරෝගිවූ ඒකාන්තයෙන් දුක්වූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි."

"වේදනාව ඇති කල්හි වේදනාව නිසා වේදනාවට පැමිණ 'මරණින් පසු නිරෝගිවූ ඒකාන්තයෙන් දුක්වූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි."

"සඤ්ඤාව ඇති කල්හි සඤ්ඤාව නිසා සඤ්ඤාවට පැමිණ 'මරණින් පසු නිරෝගිවූ ඒකාන්තයෙන් දුක්වූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි."

"සංස්කාරයෝ ඇති කල්හි සංස්කාරයන් නිසා සංස්කාරයන්ට පැමිණ 'මරණින් පසු නිරෝගිවූ ඒකාන්තයෙන් දුක්වූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.'

"විඤ්ඤාණය ඇති කල්හි විඤ්ඤාණය නිසා විඤ්ඤාණයට පැමිණ 'මරණින් පසු නිරෝගිවූ ඒකාන්තයෙන් දුක්වූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. "මහණෙනි, කුමක් සිතන්නහුද? රූපය, නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද දුකද, වෙනස්වෙන ස්වභාවද, ඉදින් ඒ රූපය අල්වා නොගැනීමෙන් 'මරණින් පසු නිරෝගිවූ ඒකාන්තයෙන් දුක්වූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි. එසේ නොවේය."

"මහණෙනි, මෙසේ දුක ඇතිකල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි.

"මහණෙනි කුමක් සිතන්නහුද, වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?' - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද වෙනස්වන ස්වභාවද, ඉදින් ඒ වේදනාව අල්වා නොගැනීමෙන් 'මරණින් පසු නිරෝගිවූ ඒකාන්තයෙන් දුක්වූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි, එසේ නොවේය."

"මහණෙනි, මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි."

මහණෙනි, කුමක් සිතන්නහුද? සංඥාව නිත්‍යයද අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද ඉදින් ඒ සංඥාව අල්වා නොගැනීමෙන් 'මරණින් පසු නිරෝගිවූ ඒකාන්තයෙන් දුක්වූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි, එසේ නොවේය."

"මහණෙනි, මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි.

"මහණෙනි, කුමක් සිතන්නහුද? සංස්කාරයෝ නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද වෙනස්වන ස්වභාවද, ඉදින් ඒ සංස්කාර අල්වා නොගැනීමෙන් 'මරණින් පසු නිරෝගිවූ ඒකාන්තයෙන් දුක්වූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - ස්වාමීනි, එසේ නොවේය."

"මහණෙනි, මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි."

"මහණෙනි, කුමක් සිතන්නහුද? විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, ඒ විඤ්ඤාණය අල්වා නොගෙන මරණින් පසු නිරෝගිවූ ඒකාන්තයෙන් දුක්වූ ආත්මය වෙයි.' යන මේ දෘෂ්ටි උපදියිද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"මහණෙනි, මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි."

## 25. අත්තා සූත්‍රය. (7)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ 19 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනාකරන ලද්දකි.)

2. "මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් නිසා කුමකට පැමිණ 'මරණින් පසු නිරෝගිවූ සැපද වන දුකද වන ආත්මය වෙයි" යන මෙවැනි දෘෂ්ටියක් උපදීද?"

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට

ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය."

"මහණෙනි, එසේනම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමැයි" කීය.

"ස්වාමීනි, එසේයයි," ඒ භික්ෂූහු, භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. "මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපයට පැමිණ 'මරණින්පසු නිරෝගිවූ සැපද වන දුකද වන ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි."

"වේදනාව ඇති කල්හි වේදනාව නිසා වේදනාවට පැමිණ 'මරණින් පසු නිරෝගිවූ සැපද වන දුකද වන ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි."

"සඤ්ඤාව ඇති කල්හි සඤ්ඤාව නිසා සඤ්ඤාවට පැමිණ 'මරණින් පසු නිරෝගිවූ සැපද වන දුකද වන ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි."

"සංස්කාරයෝ ඇති කල්හි සංස්කාරයන් නිසා සංස්කාරයන්ට පැමිණ 'මරණින් පසු නිරෝගිවූ සැපද වන දුකද වන ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.'

"විඤ්ඤාණය ඇති කල්හි විඤ්ඤාණය නිසා විඤ්ඤාණයට පැමිණ 'මරණින් පසු නිරෝගිවූ සැපද වන දුකද වන ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි."

4. "මහණෙනි, කුමක් සිතන්නහුද? රූපය, නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වෙන ස්වභාවද, ඉදින් ඒ රූපය අල්වා නොගැනීමෙන් 'මරණින් පසු නිරෝගිවූ සැපද වන දුකද වන ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි. එසේ නොවේය."

"මහණෙනි, මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි.

"මහණෙනි කුමක් සිතන්නහුද, වේදනාව නිත්‍යය හෝ අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද වෙනස්වන ස්වභාවද, ඉදින් ඒ වේදනාව අල්වා නොගැනීමෙන් 'මරණින් පසු නිරෝගිවූ සැපද වන දුකද වන ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි, එසේ නොවේය."

"මහණෙනි, මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි."

මහණෙනි, කුමක් සිතන්නහුද? සංඥාව නිත්‍යයද අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, ඉදින් ඒ සංඥාව අල්වානොගැනීමෙන් 'මරණින් පසු නිරෝගිවූ සැපද වන දුකද වන ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි, එසේ නොවේය."

"මහණෙනි, මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි."

"මහණෙනි, කුමක් සිතන්නහුද? සංස්කාරයෝ නිත්‍යද? අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, ඉදින් ඒ සංස්කාර අල්වා නොගැනීමෙන් 'මරණින් පසු නිරෝගිවූ

සැපද වන දුකද වන ආත්මය වෙයි’ යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?” - ස්වාමීනි, එසේ නොවේය.”

“මහණෙනි, මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි.”

“මහණෙනි, කුමක් සිතන්නහුද? විඥ්ඥාණය නිත්‍යය හෝ අනිත්‍ය හෝ වෙයිද?” - “ස්වාමීනි, අනිත්‍යය.”

“යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද?” - “ස්වාමීනි, දුකය.”

“යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, ඒ විඥ්ඥාණය අල්වා නොගෙන ‘මරණින් පසු සැපද වන දුකද වන ආත්මය වෙයි.’ යන මේ දෘෂ්ටි උපදියිද?” - “ස්වාමීනි, එය නොවන්නේමය.”

“මහණෙනි, මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි.”

## 26. අත්තා සූත්‍රය. (8)

**1.** (මේ සූත්‍රයද මේ වර්ගයේ 19 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනාකරන ලදී.)

**2.** “මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් නිසා කුමකට පැමිණ ‘මරණින් පසු නිරෝගිවූ දුක නුවූ සැපද නුවූ ආත්මය වෙයි” යන මෙවැනි දෘෂ්ටියක් උපදීද?”

“ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය.”

“මහණෙනි, එසේනම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමැයි” කීය.

“ස්වාමීනි, එසේයයි,” ඒ භික්ෂූහු, භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. "මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපයට පැමිණ 'මරණින් පසු නිරෝගිවූ දුක නුවූ සැපද නුවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි."

"වේදනාව ඇති කල්හි වේදනාව නිසා වේදනාවට පැමිණ 'මරණින් පසු නිරෝගිවූ දුක නුවූ සැපද නුවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි."

"සඤ්ඤාව ඇති කල්හි සඤ්ඤාව නිසා සඤ්ඤාවට පැමිණ 'මරණින් පසු නිරෝගිවූ දුක නුවූ සැපද නුවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි."

"සංස්කාරයෝ ඇති කල්හි සංස්කාරයන් නිසා සංස්කාරයන්ට පැමිණ 'මරණින් පසු නිරෝගිවූ දුක නුවූ සැපද නුවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.'

"විඤ්ඤාණය ඇති කල්හි විඤ්ඤාණය නිසා විඤ්ඤාණයට පැමිණ 'මරණින් පසු නිරෝගිවූ දුක නුවූ සැපද නුවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි."

4. "මහණෙනි, ඒ කුමකැයි සිතව්ද? රූපය, නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස් වෙන ස්වභාවද, ඉදින් ඒ රූපය අල්වා නොගැනීමෙන් 'මරණින් පසු නිරෝගිවූ දුක නුවූ සැපද නුවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි. එසේ නොවේය."

"මහණෙනි, මෙසේ දුක ඇතිකල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි.

"වේදනාව නිත්‍යය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද වෙනස්වන ස්වභාවද ඉදින් ඒ වේදනාව අල්වා නොගැනීමෙන් 'මරණින් පසු නිරෝගීවූ දුක නුවූ සැපද නුවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි, එසේ නොවේය."

"මහණෙනි, මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි.

"සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ වෙයිද? සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, ඉදින් ඒ සංඥාව අල්වානොගැනීමෙන් 'මරණින්පසු නිරෝගීවූ දුක නුවූ සැපද නුවූ ආත්මය වෙයි' යන වෙැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි, එසේ නොවේය."

"සංස්කාරයෝ නිත්‍ය හෝ වේද? අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද ඉදින් ඒ සංස්කාර අල්වා නොගැනීමෙන් 'මරණින් පසු නිරෝගීවූ දුක නුවූ සැපද නුවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියිද?" - "ස්වාමීනි, එසේ නොවේය."

"මහණෙනි, මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි."

"මහණෙනි, කුමක් සිතන්නහුද? විඤ්ඤාණය නිත්‍යය හෝ අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාවද, ඒ විඤ්ඤාණය අල්වා නොගෙන 'මරණින් නිරෝගීවූ දුක නුවූ

සැපද නුවූ ආත්මයවෙයි.' යන මේ දෘෂ්ටිය උපදියිද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"මහණෙනි, මෙසේ දුක ඇති කල්හි දුක නිසා දුකට පැමිණ මෙවැනි දෘෂ්ටි උපදියි."

**(දෙවෙනි පෙයයාලය නිමි.)**

---

## 3. පෙයකාල වර්ගය.

### 1. වාත සූත්‍රය.

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1603 වෙනි පිටේ වාත සූත්‍රය මෙනි.)**

5. "මහණෙනි, යමක් අනිත්‍යද එය දුකකි. එය ඇති කල්හි එය නිසා 'වාතයෝ නොහමත්. ගංගාවෝ ගලා නොබසිත් ගර්භනීහු නොවදත් සඳ හිරු උදා නොවෙත්, නොබසිත්. ඉන්ද්‍රඛීලයක් මෙන් සිටියේය' යන මෙවැනි දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

### 2. එතං මම සූත්‍රය.

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1606 වෙනි පිටේ එතං මම සූත්‍රය මෙනි.)**

5. "මහණෙනි, යමක් අනිත්‍යද එය දුකකි. එය ඇති කල්හි එය නිසා, 'මෙය මගේය. ඒ මම වෙමි. එය මාගේ ආත්මය වේය' යන මෙවැනි දෘෂ්ටියක් උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

### 3. සො අත්තා සූත්‍රය.

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1610 වෙනි පිටේ සො අත්තා සූත්‍රය මෙනි.)**

5. "මහණෙනි, යමක් අනිත්‍යද එය දුකකි. එය ඇති කල්හි එය නිසා 'හේ ආත්මය වෙයි. හේ ලෝකය වෙයි. හේ පරලොව මම වන්නෙමි. හේ නිත්‍යය, ඒකාන්තය, සදාකාලිකය,

නොපෙරලෙන ස්වභාව ඇත්තේය’ යන මේ දෘෂ්ටිය උපදින්නේද?” - “ස්වාමීනි, එය නොවන්නේමය.”

## 4. නෝචමේසියා සූත්‍රය

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1613 වෙනි පිටේ නෝචමේසියා සූත්‍රය මෙනි.)**

5. “මහණෙනි, යමක් අනිත්‍යද එය දුකකි. එය ඇති කල්හි එය නිසා, ‘මම නොවෙම් නම් මාගේ නොවෙයි. මම නොවන්නෙම් නම් මාගේ නොවන්නේය, යන මේ දෘෂ්ටිය උපදින්නේද?” - “ස්වාමීනි, එය නොවන්නේමය.”

## 5. නත්ථි කරොථ සූත්‍රය (1)

**(මේ සූත්‍රයේ 13 වෙනි ඡේදය හැර අනිත් කොටස 1616 වෙනි පිටේ නත්ථි කරොථ සූත්‍රය (1) මෙනි.)**

13. “මහණෙනි, යමක් අනිත්‍යද එය දුකකි. එය ඇති කල්හි එය නිසා ‘දානයෙහි විපාක නැත. කම්පල අදහා කරණ මහා යාගයන්හි විපාක නැත. පුදන ලද්දෙහි විපාක නැත. කුසලාකුසලයන්ගේ ඵල විපාක නැත. පරලොවක් නැත. මෙලොවක් නැත. මවක් නැත. පියෙක් නැත. ඕපපාතික සත්ත්වයෝ නැත. යමෙක් මෙලොවත් පරලොවත් යහපත් නුවණින් ප්‍රත්‍යක්ෂකොට දැනගනිත්ද, එබඳු යහපත් පැවතුම් ඇති, යහපත් ගති ඇති, මහණ බමුණෝ ලෙව්හි නැත. සතර මහාභූතයන්ගෙන් ඇතිවූ මේ පුරුෂතෙමේ යම්කලෙක කලුරිය කරයිද, එකල පඨවි ධාතුව, පඨවි ධාතුව අනුවයයි. ආපෝ ධාතුව, අපෝ ධාතුව අනුව යයි. තේජෝ ධාතුව, තේජෝ ධාතුව අනුව යයි. වායෝ ධාතුව, වායෝ ධාතුව අනුව යයි. සිත සවැනි කොට ඇති ඉන්ද්‍රියයෝ අහසට ගමන් කරත්. ඇඳ පස්වැනිකොට ඇති මළසිරුර පුරුෂයන් සතර දෙනෙක් ගෙනයත් ගුණාගුණ පදයෝ සොහොන්බිම තෙක් ප්‍රකට වෙත්. ඇට පරෙයිපත් පාට ඇති වෙත්. දෙනලද දානාදීන්ගේ ඵලය අලු කෙළවරකොට ඇත්තේ වෙයි. මේ දානය නම් බාලයන් විසින් පනවනලද ඔවුන්ගේ හිස්වූ සත්‍යයෙන් තොරවූ විලාපයකි. යමෙක් දුන්

දෙයෙහි එල ඇතැයි කියත්ද, ඒ බාලයෝද, පණ්ඩිතයෝද, ශරීරයාගේ බිඳීමෙන් සිඳීමට යෙත්. විනාශයට යෙත්. මරණින් මතු නූපදිත්' යන මේ දෘෂ්ටි උපදීද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 6. නත්ථි කරොඨ සූත්‍රය. (2)

### (මේ සූත්‍රයේ 13 වෙනි ඡේදය හැර අනිත් කොටස 1626 වෙනි පිටේ නත්ථි කරොඨ සූත්‍රය (2) මෙනි.)

13. "මහණෙනි, යමක් අනිත්‍යද එය දුකකි. එය ඇති කල්හි එය නිසා, (පව්කම්) කරන්නාහටද, කරවන්නාහටද, අත්පා ආදිය සිඳින්නාහටද සින්දවන්නාහටද පීඩාකරන්නාහටද පීඩා කරවන්නාහටද ශෝක ඇතිකරන්නාහටද අනුන් ලවා ශෝක කරවන්නාහටද, ක්ලාන්ත කරන්නාහටද, ක්ලාන්ත කරවන්නාහටද, බඳින්නාහටද, බන්දවන්නාහටද, ප්‍රාණඝාත කරන්නාහටද, සොරකම් කරන්නාහටද, ගෙවල් බිඳින්නාහටද, ගම් පහරන්නාහටද, ගේ වටකර බඩු පැහැරගන්නාහටද, මග රැක සිට අන්සතු දෙය පැහැර ගන්නාහටද, පරඹුවන් කරා යන්නාහටද බොරු කියන්නාහටද, පව් කරන්නාහටද පාපයක් නැත. කඩු හාත්පස ඇති චක්‍රයකින් යමෙක් පෘථිවියෙහි වූ සියලු ප්‍රාණීන් එකම මස් රැසක් එකම මස් ගොඩක් කරන්නේද ඒ නිසා වන පවක් නැත, පාපයාගේ පැමිණීමක්ද නැත. නසමින් ඝාතනය කරමින් සිඳිමින් සින්දවමින් පීඩාකරමින් පීඩා කරවමින් ගංගා නදියෙහි දකුණු ඉවුර තෙක් යන්නේද, ඒ හේතුකොට ගෙන වන පවක් නැත. පාපයාගේ පැමිණීමක්ද නැත, දන්දෙමින් දෙවමින් මහාදාන සංඛ්‍යාත යාගකරමින් යාග කරවමින් ගංගා නදියෙහි උතුරු ඉවුරු දක්වා ඉඳින් යන්නේද, ඒ හේතුකොටගෙන වන පිනක් නැත. පුණ්‍යයාගේ පැමිණීමක්ද නැත. දීම කරණකොට ගෙනද, දානයෙන් ඉන්ද්‍රිය දමනයෙන් සීල සංයමයෙන් සත්‍ය වචනයෙන් වන්නාවූ පින්නැත. පුණ්‍යයාගේ පැමිණීමක් නැත,' යන මේ දෘෂ්ටි උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 7. නත්ථි හේතු සූත්‍රය

### (මේ සූත්‍රයේ 13 වෙනි ඡේදය හැර අනිත් කොටස 1637 වෙනි පිටේ නත්ථි හේතු සූත්‍රය මෙනි.)

13. "මහණෙනි, යමක් අනිත්‍යද එය දුකකි. එය ඇති කල්හි එය නිසා, 'සත්ත්වයින්ගේ කෙලෙසීම පිණිස හේතුවක් නැත්තේය. ප්‍රත්‍යයක් නැත්තේය. හේතු රහිතව ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ කෙලෙසෙත්. සත්ත්වයන්ගේ විසුද්ධිය පිණිස හේතුවක් නැත්තේය. ප්‍රත්‍යයක් නැත්තේය. හේතු රහිතව ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ පිරිසිදු වෙත්. (දිව්‍ය ලොකාදියෙහි ඉපදීමට හේතුවන) බලයක් නැත. වීර්යයක් නැත. පුරුෂ ශක්තියක් නැත. පුරිස පරාක්‍රමයක් නැත. සියලු සත්ත්වයෝ, සියලු ප්‍රාණීහු, සියලු භූතයෝ ශාලියවාදී සියලු ජීවීහු තමා වසඟයෙහි නොපවත්නාහු, බල රහිත වූවාහු, වීර්ය නැත්තාහු, නියම වශයෙන්ද, ඒ ඒ ජාතීන්හි ගමන්කිරීම් වශයෙන්ද ස්වභාව වශයෙන්ද, නොයෙක් ආකාරයට පැමිණියාහු තණ්හාභිජාති ආදී සවැදෑරුම් ශ්‍රෙෂ්ඨ ජාතිවල සැප දුක් නැවත නැවත විඳිත්' යන මෙබඳු දෘෂ්ටි උපදීද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 8. මහාදිට්ඨ සූත්‍රය.

### (මේ සූත්‍රයේ 13 වෙනි ඡේදය හැර අනිත් කොටස 1644 වෙනි පිටේ මහාදිට්ඨ සූත්‍රය මෙනි.)

13. "මහණෙනි, යමක් අනිත්‍යද එය දුකකි. එය ඇති කල්හි එය නිසා, 'කිසිවෙකු විසින් නොකරණලද කිසිවෙකුගේ විධානය නොකරණ ලද කිසිවෙකු විසින් නිර්මාණය නොකරන ලද නිර්මාණය නොකරවන ලද පර්වත කූටයක් මෙන් නිශ්චලවූ ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චලවූ ධර්ම සමූහ හතක් වෙත්. ඔව්හු නො සැලෙත්, ප්‍රකෘතිය නොහරිත්, ඔවුනොවුන්ට බාධා නොකරත්. ඔවුනොවුන්ට සැප පිණිස හෝ දුක් පිණිස හෝ සැප දුක් පිණිස හෝ නොසමත් වෙත්. ඒ සත්ධර්ම සමූහයෝ කවරහුද?

"පෘථිවිධාතු සමූහය, ආපෝධාතු සමූහය, තේජෝධාතු සමූහය, වායෝධාතු සමූහය, සුඛධාතු සමූහය, දුක්ඛධාතු සමූහය, ජීවධාතු සමූහය යන මේ ධාතු සමූහයා (කිසිවෙකු විසින්)

නොකරණලදහ. කිසි විධානයක් නොකරණලදහ. කිසිවෙකු විසින් නොමවනලදහ. කිසිවෙකු විසින් මැවීම නොකරවනලදහ. (ඵල රහිත හෙයින්) වඳයහ. පර්වතකූටයක් මෙන් නිශ්චලව සිටියහ. ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චලව සිටියාහ. ඔව්හු නොසැලෙත්, ප්‍රකෘතිය නොහරිත්, ඔවුනොවුන් නොගැටෙත්, සුව පිණිස හෝ දුක් පිණිස හෝ සුවදුක් පිණිස හෝ නොසමත් වෙත්. යමෙක් තියුණු ආයුධයකින් හිස සිඳීද, (එයින්) කිසිවෙක් කිසිවෙකු ජීවිතයෙන් තොර නොකරයිද, සත්වැදෑරුම්වූ ශරීරයන්ගේ අතරෙන්ම ආයුධය ඇතුලට ගමන් කරයි.

'මේ වනාහි ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී උත්තමයෝනීන් සම්බන්ධ තුදුස් ලක්ෂ හයදහස් හයසියයක්ද, කර්ම පන්සියයක්ද කර්ම පසක්ද, කර්ම තුනක්ද, කාය වාක් කර්ම දෙකක්ද, මනෝකර්ම නම්වූ අර්ධ කර්මයද, දෙසැටක් ප්‍රතිපදාවෝද, දෙසැටක් අන්තර කල්පයෝද, කෘෂ්ණාදී ශ්‍රෙෂ්ඨ ජාති සයක්ද, මන්දාදී පුරිෂ භූමි අටද, ආජීවිකවෘත්ති එක්සිය නවසාළිසක්ද, පරිව්‍රාජක ප්‍රව්‍රජ්‍යා එකසිය සතළිස් නවයක්ද, නාග මණ්ඩල එකසිය හතළිස් නවයක්ද, ඉන්ද්‍රියය එකසිය විස්සක්ද, නිරය එකසිය තිහක්ද, අත් පා පිටු ආදී රාජෝධාතු තිස් හයක්ද, ඔටු ගවාදී සංඥී ගර්භ සතක්ද, සාලියවාදී අසංඥී ගර්භ සතක්ද, උක් ආදී නිර්ඝණ්ඨි ගර්භ සතක්ද, දෙවයෝනි සතක්ද නොහොත් බොහෝ දෙවියෝද, මනුෂ්‍ය යෝනි සතක්ද නොහොත් බොහෝ මනුෂ්‍යයෝද, පිසාචයෝනි සතක්ද, මහාවිල් සතක්ද, ගැට සතක්ද, මහා ප්‍රපාත සතක්ද, කුඩා ප්‍රපාත එකසිය සතක්ද, මහා ස්වප්න සතක්ද, කුඩා ස්වප්න එකසිය හතක්ද චූලාසීති මහා කල්ප ලක්ෂයක්ද ගෙවා බාලයෝද, පණ්ඩිතයෝද, භවයෙන් භවය ගමන් කොට (සසර) සැරිසරා දුක් කෙළවර කරන්නාහ.

'එහි මම මේ අචේලක සීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්යාවෙන් හෝ මුහුකිරීමට නොපැමිණි කර්මය හෝ මුහුකුරුවන්නෙමි. මුහුකිරීමට ගියාවූ කර්මය හෝ ස්පර්ශ කරමින් ගෙවීම කරන්නෙමැයි කියාද, මෙසේ නැත්තේය. නැලියෙන් මැණ ප්‍රමාණ කරණලද්ද මෙන් සසර සුව දුක් කියනලද කාල ප්‍රමාණයෙන් කෙළවර කළ කල්හි (සසර) අඩුවීමක් හෝ

වැඩිවීමක් නැත්තේය. උසස් බවක් හෝ පහත් බවක් නැත්තේය. වෙලනලද නූල් බෝලයක් (පර්වතයක හෝ ගසක් උඩ සිට) විසිකරණ ලද්දේ යම්සේ ලිහෙමින්ම යයිද, (නූල අවසන්වූ කල්හි එහිම නතර වෙයිද) එපරිදිම බාලයෝද, පණ්ඩිතයෝද, භවයෙන් භවයට ගමන් කරමින් සුවදුක් කෙළවර කරති,' යන මේ දෘෂ්ටි උපදීද?" "ස්වාමීනි, එය නොවන්නේමය."

## 9. සස්සත සූත්‍රය

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1665 වෙනි පිටේ සස්සත සූත්‍රය මෙනි.)**

5. "මහණෙනි, යමක් අනිත්‍යයද එය දුකකි. එය ඇති කල්හි එය නිසා, 'ලෝකය සදාකාලිකය' යන මේ දෘෂ්ටිය උපදීද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 10. අසස්සත සූත්‍රය

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1668 වෙනි පිටේ අසස්සත සූත්‍රය මෙනි.)**

5. "මහණෙනි, යමක් අනිත්‍යද එය දුකකි. එය ඇති කල්හි එය නිසා, 'ලෝකය සදාකාලික නොවේ. යන මේ දෘෂ්ටිය උපදීද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 11. අන්ත සූත්‍රය.

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1671 වෙනි පිටේ අන්ත සූත්‍රය මෙනි.)**

5. "මහණෙනි, යමක් අනිත්‍යද එය දුකකි. එය ඇති කල්හි එය නිසා 'ලෝකය අන්තවත්ය (කෙළවරක් ඇත්තේය)' යන මේ දෘෂ්ටිය උපදීද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 12. අනන්ත සූත්‍රය.

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1674 වෙනි පිටේ අනන්ත සූත්‍රය මෙනි.)**

5. "මහණෙනි, යමක් අනිත්‍යද එය දුකකි. එය ඇති කල්හි එය නිසා, 'ලෝකය කෙළවරක් නැත්තේය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 13. තංජීවං සූත්‍රය.

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1677 වෙනි පිටේ තංජීවං සූත්‍රය මෙනි.)**

5. "මහණෙනි, යමක් අනිත්‍යද එය දුකකි. එය ඇති කල්හි එය නිසා, 'එය ජීවිතය වෙයි, එය ශරීරය වෙයි' යන මේ දෘෂ්ටිය උපදීද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 14. අඤ්ඤංජීවං සූත්‍රය

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1680 වෙනි පිටේ අඤ්ඤංජීවං සූත්‍රය මෙනි.)**

5. "මහණෙනි, යමක් අනිත්‍යද එය දුකකි. එය ඇති කල්හි එය නිසා, 'ජීවය අනිකකි. ශරීරය අනිකකි, යන මේ දෘෂ්ටිය උපදීද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 15. තථාගත සූත්‍රය. (1)

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1683 වෙනි පිටේ තථාගත සූත්‍රය මෙනි.)**

5. "මහණෙනි, යමක් අනිත්‍යද එය දුකකි. එය ඇති කල්හි එය නිසා, 'සත්ත්ව තෙමේ මරණින් පසු ඇත්තේය, එය මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 16. තථාගත සූත්‍රය. (2)

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1686 වෙනි පිටේ තථාගත සූත්‍රය මෙනි.)**

5. "මහණෙනි, යමක් අනිත්‍යද එය දුකකි. එය ඇති කල්හි එය නිසා, 'සත්ත්ව තෙමේ මරණින් පසු නැත්තේය' එය මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 17. තථාගත සූත්‍රය. (3)

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1689 වෙනි පිටේ තථාගත සූත්‍රය මෙනි.)**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

5. "මහණෙනි, යමක් අනිත්‍යද එය දුකකි. එය ඇති කල්හි එය නිසා, 'මරණින් පසු සත්ත්වයා ඇත්තේද වෙයි. නැත්තේද වෙයි' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 18. තථාගත සූත්‍රය. (4)

**(මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය හැර අනිත් කොටස 1692 වෙනි පිටේ තථාගත සූත්‍රය මෙනි.)**

5. "මහණෙනි, යමක් අනිත්‍යද එය දුකකි. එය ඇති කල්හි එය නිසා, 'මරණයෙන් පසු සත්ත්වතෙමේ නොවේමය, නොවන්නේත් නොවේය' යන මේ දෘෂ්ටිය උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

## 19. අත්තා සූත්‍රය. (1)

(මේ සූත්‍රයේ 4 වෙනි ඡේදය හැර අනිත් කොටස 1703 වෙනි පිටේ අත්තා සූත්‍රය මෙනි. 4 වෙනි ඡේදයේ "එසේ නොවේ" යන වචන ඇති තැන්වලට පසු මේ වචන යොදාගත යුතුයි.)

5. "මහණෙනි, යමක් අනිත්‍යද එය දුකකි. එය ඇති කල්හි එය නිසා, 'මරණයෙන් මතු අරමුණ නිරෝගීවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

## 20. අත්තා සූත්‍රය. (2)

(මේ සූත්‍රයේ 4 වෙනි ඡේදය හැර අනිත් කොටස 1706 වෙනි පිටේ අත්තා සූත්‍රය මෙනි. 4 වෙනි ඡේදයේ "එසේ නොවේ" යන වචන ඇති තැන්වලට පසු මේ වචන යොදාගත යුතුයි.)

5. "මහණෙනි, යමක් අනිත්‍යද එය දුකකි. එය ඇති කල්හි එය නිසා, 'මරණයෙන් පසු ධ්‍යානය (අරූපී බව) නිරෝගීවූ ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි."

## 21. අත්තා සූත්‍රය. (3)

(මේ සූත්‍රයේ 4 වෙනි ඡේදය හැර අනිත් කොටස 1709 වෙනි පිටේ අත්තා සූත්‍රය මෙනි. 4 වෙනි ඡේදයේ "එසේ

නොවේ" යන වචන ඇති තැන්වලට පසු මේ වචන යොදා ගත යුතුයි.)

5. "මහණෙනි, යමක් අනිත්‍යද එය දුකකි. එය ඇති කල්හි එය නිසා, 'අරමුණද, ධ්‍යානයද, මරණයෙන් මතු නිරෝගී ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි."

## 22. අත්තා සූත්‍රය. (4)

(මේ සූත්‍රයේ 4 වෙනි ඡේදය හැර අනිත් කොටස 1712 වෙනි පිටේ අත්තා සූත්‍රය මෙනි. 4 වෙනි ඡේදයේ "එසේ නොවේ" යන වචන ඇති තැන්වලට පසු මේ වචන යොදා ගත යුතුයි.)

5. "මහණෙනි, යමක් අනිත්‍යද එය දුකකි. එය ඇති කල්හි එය නිසා, 'අරමුණද නොවන, ධ්‍යානයද නොවන්නක් මරණින් පසු නිරෝගී ආත්මය වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි."

## 23. අත්තා සූත්‍රය. (5)

(මේ සූත්‍රයේ 4 වෙනි ඡේදය හැර අනිත් කොටස 1715 වෙනි පිටේ අත්තා සූත්‍රය මෙනි. 4 වෙනි ඡේදයේ "එසේ නොවේ" යන වචන ඇති තැන්වලට පසු මේ වචන යොදා ගත යුතුයි.)

5. "මහණෙනි, යමක් අනිත්‍යද එය දුකකි. එය ඇති කල්හි එය නිසා, 'මරණින් පසු නිරෝගීවූ ඒකාන්තයෙන් සැපවූ ආත්මයක් වේය' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි."

## 24. අත්තා සූත්‍රය. (6)

(මේ සූත්‍රයේ 4 වෙනි ඡේදය හැර අනිත් කොටස 1718 වෙනි පිටේ අත්තා සූත්‍රය මෙනි. 4 වෙනි ඡේදයේ "එසේ නොවේ" යන වචන ඇති තැන්වලට පසු මේ වචන යොදා ගත යුතුයි.)

5. "මහණෙනි, යමක් අනිත්‍යද එය දුකකි. එය ඇති කල්හි එය නිසා, 'මරණින් පසු නිරෝගීවූ ඒකාන්තයෙන් දුක්වූ ආත්මයක් වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි.

## 25. අත්තා සූත්‍රය. (7)

(මේ සූත්‍රයේ 4 වෙනි ඡේදය හැර අනිත් කොටස 1720 වෙනි පිටේ අත්තා සූත්‍රය මෙනි. 4 වෙනි ඡේදයේ "එසේ නොවේ" යන වචන ඇති තැන්වලට පසු මේ වචන යොදා ගත යුතුයි.)

5. "මහණෙනි, යමක් අනිත්‍යද එය දුකකි. එය ඇති කල්හි එය නිසා, 'මරණින් පසු නිරෝගීවූ සැපද වන දුකද වන ආත්මයක් වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි."

## 26. අත්තා සූත්‍රය. (8)

(මේ සූත්‍රයේ 4 වෙනි ඡේදය හැර අනිත් කොටස 1723 වෙනි පිටේ අත්තා සූත්‍රය මෙනි. 4 වෙනි ඡේදයේ "එසේ නොවේ" යන වචන ඇති තැන්වලට පසු මේ වචන යොදා ගත යුතුයි.)

5. "මහණෙනි, යමක් අනිත්‍යද එය දුකකි. එය ඇති කල්හි එය නිසා, 'මරණින් පසු නිරෝගීවූ දුක නුවූ සැපද නුවූ වෙයි' යන මෙවැනි දෘෂ්ටියක් උපදියි."

**(තුන්වෙනි පෙය්‍යාලය නිමි.)**

---

# 4. පෙය්‍යාල වර්ගය

## 1. වාත සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක.'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් නිසා කුමකට පැමිණ 'වාතයෝ නොහමත්. ගංගාවෝ ගලා නො බසිත්. ගර්භනීහු

නොවදත් චන්ද්‍ර සූර්යයෝ උදානොවෙත්. නොබසිත්, ඉන්ද්‍ර බීලයක් මෙන් නිශ්චලව සිටිත්.’ යන මෙබඳු දෘෂ්ටිය උපදීද?

“ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ ප්‍රභවකොට ඇත්තාහ භාග්‍යවතුන් වහන්සේ පිහිටකොට ඇත්තාහ. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම වදාරණසේක් නම් මැනවි.”

“මහණෙනි, එසේනම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමැයි” කීහ.

“ස්වාමීනි, එසේයයි,” ඒ භික්ෂූහු, භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. “මහණෙනි, රූපය ඇතිකල්හි, රූපය නිසා, රූපයට පැමිණ ‘ගංගාවෝ ගලා නොබසිත්. ගර්භනීහු නොවදත්. චන්ද්‍ර සූර්යයෝ උදානොවෙත්. නොබසිත්, ඉන්ද්‍රබීලයක් මෙන් නිශ්චලව සිටිත්’ මෙවැනි දෘෂ්ටියක් උපදියි.

“වේදනාව ඇතිකල්හි, වේදනාව නිසා, වේදනාවට පැමිණ ‘ගංගාවෝ ගලා නොබසිත්. ගර්භනීහු නොවදත්. චන්ද්‍ර සූර්යයෝ උදානොවෙත්, නොබසිත්, ඉන්ද්‍ර බීලයක්මෙන් නිශ්චලව සිටිත්’ යන මේ දෘෂ්ටිය උපදියි.

“සංඥාව ඇතිකල්හි, සංඥාව නිසා, සංඥාවට පැමිණ ‘ගංගාවෝ ගලා නොබසිත්, ගර්භනීහු නොවදත්, චන්ද්‍ර සූර්යයෝ උදානොවෙත්, නොබසිත්, ඉන්ද්‍රබීලයක් මෙන් නිශ්චලව සිටිත්’ යන මේ දෘෂ්ටිය උපදියි.

‘සංස්කාරය ඇතිකල්හි, සංස්කාරයන්, නිසා සංස්කාරයන්ට පැමිණ ‘ගංගාවෝ ගලානොබසිත්, ගර්භනීහු නොවදත්, චන්ද්‍ර සූර්යයෝ උදානොවෙත්, නොබසිත්, ඉන්ද්‍රබීලයක් මෙන් නිශ්චලව සිටිත්’ යන මේ දෘෂ්ටිය උපදියි.

“විඤ්ඤාණය ඇතිකල්හි විඤ්ඤාණය නිසා, විඤ්ඤාණයට පැමිණ ‘ගංගාවෝ ගලානොබසිත්, ගර්භනීහු නොවදත් චන්ද්‍ර සූර්යයෝ උදානොවෙත්, නොබසිත්, ඉන්ද්‍රබීලයක් මෙන් නිශ්චලව සිටිත්’ යන මේ දෘෂ්ටිය උපදියි.

4. "මහණෙනි, කුමක් සිතන්නහුද? රූපය නිත්‍යයද අනිත්‍යද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද වෙනස්වන ස්වභාවද, 'එය මාගේය, ඒ මම වෙමි. ඒ මාගේ ආත්මය'යි දැක්වීමට සුදුසුද" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"වේදනාව නිත්‍ය හෝ වේද? අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද දුකද, වෙනස්වන ස්වභාවද, 'එය මාගේය. ඒ මම වෙමි. ඒ මාගේ ආත්මයයි' දැකීමට සුදුසුද?" - "ස්වාමීනි එය නොවන්නේමය"

"සංඥාව නිත්‍ය හෝ වේද? අනිත්‍ය හෝ වෙයිද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, 'එය මාගේය. ඒ මම වෙමි. ඒ මාගේ ආත්මයයි' දැකීමට සුදුසුද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"සංස්කාරය නිත්‍ය හෝ වේද? අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක හෝ සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, 'එය මාගේය. ඒ මම වෙමි. ඒ මාගේ ආත්මයයි' දැකීමට සුදුසුද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

"විඤ්ඤාණය නිත්‍යය හෝ වේද, අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය.

"යමක්වනාහි අනිත්‍යයද, එය දුක හෝ වෙයිද? සැප හෝ වෙයිද?" - "ස්වාමීනි, දුකයි."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, එය වෙනස්වන ස්වභාවද, 'එය මාගේය. ඒ මම වෙමි. ඒ මාගේ ආත්මයයි' දැකීමට සුදුසුද?" - "ස්වාමීනි, එය නොවන්නේමය."

**5.** "මහණෙනි, අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි රූපයක් වේද, 'එය මාගේ නොවේය, එය මම නොවෙමි එය මාගේ ආත්මය නොවේය'යි මනා නුවණින් දැක්ක යුතුයි. අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි වේදනාවක් වේද එය මාගේ නොවේය. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේය'යි මනා නුවණින් දැක්ක යුතුයි. අතීතවූද අනාගතවූද වර්තමානවූද අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි සඤ්ඤාවක් වේද, 'එය මාගේ නොවේය. එය මම නොවෙමි' එය මාගේ ආත්මය නොවේය'යි මනා නුවණින් දැක්කයුතුයි අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි සංස්කාරයක්වේද, 'එය මාගේ නොවේය. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේය'යි මනා නුවණින් දැක්ක යුතුයි. අතීතවූද, අනාගතවූද, වර්තමාන වූද අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ උතුම්වූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි විඤ්ඤාණයක් වේද, එය මාගේ නොවේය. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේය'යි මනා නුවණින් දැක්ක යුතුයි.

**6.** "මහණෙනි, මෙසේ දක්නාවූ බොහෝ ඇසූපිරූ තැන් ඇති ආර්ය ශ්‍රාවක තෙමේ රූපයෙහිද කළකිරෙයි, වේදනාවෙහිද කළකිරෙයි, සඤ්ඤාවෙහිද කළකිරෙයි, සංස්කාරයන්හිද කළකිරෙයි, විඥානයෙහිද කළකිරෙයි. කළකිරුණේ නොඇලෙයි, නොඇලුනේ මිදෙයි. මිදුනු කල්හි මිදුනේය යන දැනීම

ඇතිවෙයි. ජාතිය ක්ෂයවිය, බ්‍රහ්මචර්යාව වැස නිමවන ලදී. කළයුත්ත කරණ ලදී. මින්මතු කළ යුතු දෙයක් නැතැයි දැනගනියි.”

## 2. එතං මම සූත්‍රය

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡෙද 1606 වෙනි පිටේ එතං මම සූත්‍රය මෙනි. සූත්‍රය සම්පූර්ණ කරගැනීමට 1735 වෙනි පිටේ වාත සූත්‍රයේ 3, 4, 5, 6 වෙනි ඡෙද යොදාගැනීමේදී 3 වෙනි ඡෙදයේ ‘පැමිණ’ යන වචනවලට පසු සූත්‍රයේ සඳහන් දෘෂ්ටිය යොදාගත යුතුයි.)

## 3. සො අත්තා සූත්‍රය.

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡෙද 1610 වෙනි පිටේ සො අත්තා සූත්‍රය මෙනි. සූත්‍රය සම්පූර්ණ කරගැනීමට 1735 වෙනි පිටේ වාත සූත්‍රයේ 3, 4, 5, 6. වෙනි ඡෙද යොදාගැනීමේදී 3 වෙනි ඡෙදයේ ‘පැමිණ’ යනවචනවලට පසු සූත්‍රයේ සඳහන් දෘෂ්ටිය යොදාගත යුතුයි.)

## 4. නො ච මේසියා සූත්‍රය.

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡෙද 1613 වෙනි පිටේ නොචමේසියා සූත්‍රය මෙනි. සූත්‍රය සම්පූර්ණ කරගැනීමට 1735 වෙනි පිටේ වාත සූත්‍රයේ 3, 4, 5, 6 වෙනි ඡේද යොදාගැනීමේදී 3 වෙනි ඡෙදයේ ‘පැමිණ’ යන වචනවලට පසු සූත්‍රයේ සඳහන් දෘෂ්ටිය යොදාගත යුතුයි.

## 5. නත්ථි කරොථ සූත්‍රය. (1)

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡෙද 1616 වෙනි පිටේ නත්ථි කරොත සූත්‍රය (1) මෙනි. සූත්‍රය සම්පූර්ණ කරගැනීමට 1735 වෙනි පිටේ වාත සූත්‍රයේ 3, 4, 5, 6 ඡෙද යොදාගැනීමේදී 3 වෙනි ඡෙදයේ ‘පැමිණ’ යන වචනවලට පසු සූත්‍රයේ සඳහන් දෘෂ්ටිය යොදාගත යුතුයි.

## 6. නත්ථි කරොථ සූත්‍රය (2)

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡෙද 1626 වෙනි පිටේ නත්ථි කරොත සූත්‍රය මෙනි. සූත්‍රය සම්පූර්ණ කරගැනීමට 1735 වෙනි

පිටේ වාත සූත්‍රයේ 3, 4, 5, 6, වෙනි ඡෙද යොදාගැනීමේදී 3 වෙනි ඡෙදයේ 'පැමිණ' යනවචනවලට පසු සූත්‍රයේ සඳහන් දෘෂ්ටිය යොදාගත යුතුයි.)

## 7. නත්ථි හේතු සූත්‍රය.

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡෙද 1637 වෙනි පිටේ නත්ථිහේතු සූත්‍රය මෙනි. සූත්‍රය සම්පූර්ණ කරගැනීමට 1735 වෙනි පිටේ වාත සූත්‍රයේ 3, 4, 5, 6 වෙනි ඡෙද යොදා ගැනීමේදී 3 වෙනි ඡෙදයේ 'පැමිණ' යන වචනවලට පසු සූත්‍රයේ සඳහන් දෘෂ්ටිය යොදාගත යුතුයි.)

## 8. මහාදිට්ඨි සූත්‍රය.

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡෙද 1644 වෙනි පිටේ මහාදිට්ඨි සූත්‍රය මෙනි. සූත්‍රය සම්පූර්ණ කරගැනීමට 1735 වෙනි පිටේ වාත සූත්‍රයේ 3, 4, 5, 6 වෙනි ඡෙද යොදා ගැනීමේදී 3 වෙනි ඡෙදයේ 'පැමිණ' යන වචනවලට පසු සූත්‍රයේ සඳහන් දෘෂ්ටිය යොදාගත යුතුයි.)

## 9. සස්සත සූත්‍රය.

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡෙද 1665 වෙනි පිටේ සස්සත සූත්‍රය මෙනි. සූත්‍රය සම්පූර්ණ කරගැනීමට 1735 වෙනි පිටේ වාත සූත්‍රයේ 3, 4, 5, 6 වෙනි ඡේද යොදා ගැනීමේදී 3 වෙනි ඡෙදයේ 'පැමිණ' යන වචනවලට පසු සූත්‍රයේ සඳහන් දෘෂ්ටිය යොදාගත යුතුයි.'

## 10. අසස්සත සූත්‍රය.

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡෙද 1668 වෙනි පිටේ අසස්සත සූත්‍රය මෙනි. සූත්‍රය සම්පූර්ණ කරගැනීමට 1735 වෙනි පිටේ වාත සූත්‍රයේ 3, 4, 5, 6 වෙනි ඡෙද යොදාගැනීමේදී 3 වෙනි ඡෙදයේ 'පැමිණ' යන වචනවලට පසු සූත්‍රයේ සඳහන් දෘෂ්ටිය යොදාගත යුතුයි.)

## 11. අන්තවා සූත්‍රය.

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡෙද 1671 වෙනි පිටේ අන්ත සූත්‍රය මෙනි. සූත්‍රය සම්පූර්ණ කරගැනීමට 1735 වෙනි පිටේ වාත

සූත්‍රයේ 3, 4, 5, 6 වෙනි ඡේද යොදාගැනීමේදී 3 වෙනි ඡේදයේ 'පැමිණ' යන වචනවලට පසු සූත්‍රයේ සඳහන් දෘෂ්ටිය යොදාගත යුතුයි.)

## 12. අනන්තවා සූත්‍රය

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡේද 1674 වෙනි පිටේ අනන්ත සූත්‍රය මෙනි. සූත්‍රය සම්පූර්ණ කරගැනීමට 1735 වෙනි පිටේ වාත සූත්‍රයේ 3, 4, 5, 6 වෙනි ඡේද යොදාගැනීමේදී 3 වෙනි ඡේදයේ 'පැමිණ' යන වචනවවලට පසු සූත්‍රයේ සඳහන් දෘෂ්ටිය යොදාගත යුතුයි.

## 13. තංජීවං සූත්‍රය.

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡේද 1677 වෙනි පිටේ තංජීවං සූත්‍රය මෙනි. සූත්‍රය සම්පූර්ණ කරගැනීමට 1735 වෙනි පිටේ වාත සූත්‍රයේ 3, 4, 5, 6 වෙනි ඡේද යොදාගැනීමේදී 3 වෙනි ඡේදයේ 'පැමිණ' යන වචනවලට පසු සූත්‍රයේ සඳහන් දෘෂ්ටිය යොදාගත යුතුයි.)

## 14. අඤ්ඤංජීවං සූත්‍රය.

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡේද 1680 වෙනි පිටේ අඤ්ඤං ජීවං සූත්‍රය මෙනි. සූත්‍රය සම්පූර්ණ කරගැනීමට 1735 වෙනි පිටේ වාත සූත්‍රයේ 3, 4, 5, 6 වෙනි ඡේද යොදාගැනීමේදී 3 වෙනි ඡේදයේ 'පැමිණ' යන වචනවලට පසු සූත්‍රයේ සඳහන් දෘෂ්ටිය යොදාගත යුතුයි.)

## 15. තථාගත සූත්‍රය. (1)

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡේද 1683 වෙනි පිටේ තථාගත සූත්‍රය මෙනි. සූත්‍රය සම්පූර්ණ කරගැනීමට 1735 වෙනි පිටේ වාත සූත්‍රයේ 3, 4, 5, 6 වෙනි ඡේද යොදාගැනීමේදී 3 වෙනි ඡේදයේ 'පැමිණ' යන වචනවලට පසු සූත්‍රයේ සඳහන් දෘෂ්ටිය යොදාගත යුතුයි.)

## 16. තථාගත සූත්‍රය. (2)

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡේද 1686 වෙනි පිටේ තථාගත සූත්‍රය මෙනි. සූත්‍රය සම්පූර්ණ කරගැනීමට 1735 වෙනි පිටේ

වාත සූත්‍රයේ 3, 4, 5, 6 වෙනි ඡේද යොදාගැනීමේදී 3 වෙනි ඡේදයේ 'පැමිණ' යන වචනවලට පසු සූත්‍රයේ සඳහන් දෘෂ්ටිය යොදාගත යුතුයි.)

### 17. තථාගත සූත්‍රය. (3)

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡේද 1689 වෙනි පිටේ තථාගත සූත්‍රය මෙනි. සූත්‍රය සම්පූර්ණ කරගැනීමට 1735 වෙනි පිටේ වාත සූත්‍රයේ 3, 4, 5, 6 වෙනි ඡේද යොදාගැනීමේදී 3 වෙනි ඡේදයේ 'පැමිණ' යන වචනවලට පසු සූත්‍රයේ සඳහන් දෘෂ්ටිය යොදාගත යුතුයි.)

### 18. තථාගත සූත්‍රය. (4)

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡේද 1692 වෙනි පිටේ තථාගත සූත්‍රය මෙනි. සූත්‍රය සම්පූර්ණ කරගැනීමට 1735 වෙනි පිටේ වාත සූත්‍රයේ 3, 4, 5, 6 වෙනි ඡේද යොදාගැනීමේදී 3 වෙනි ඡේදයේ 'පැමිණ' යන වචනවලට පසු සූත්‍රයේ සඳහන් දෘෂ්ටිය යොදාගත යුතුයි.

### 19. අත්තාසූත්‍රය. (1)

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡේද 1703 වෙනි පිටේ අත්තා සූත්‍රය මෙනි. සූත්‍රය සම්පූර්ණ කරගැනීමට 1735 වෙනි පිටේ වාත සූත්‍රයේ 3, 4, 5, 6 වෙනි ඡේද යොදාගැනීමේදී 3 වෙනි ඡේදයේ 'පැමිණ' යන වචනවලට පසු සූත්‍රයේ සඳහන් දෘෂ්ටිය යොදාගත යුතුයි.)

### 20. අත්තා සූත්‍රය (2)

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡේද 1706 වෙනි පිටේ අත්තා සූත්‍රය මෙනි. සූත්‍රය සම්පූර්ණ කරගැනීමට 1735 වෙනි පිටේ වාත සූත්‍රයේ 3, 4, 5, 6 වෙනි ඡේද යොදාගැනීමේදී 3 වෙනි ඡේදයේ 'පැමිණ' යන වචනවලට පසු සූත්‍රයේ සඳහන් දෘෂ්ටිය යොදාගත යුතුයි.)

### 21. අත්තා සූත්‍රය (3)

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡේද 1709 වෙනි පිටේ අත්තා සූත්‍රය මෙනි. සූත්‍රය සම්පූර්ණ කරගැනීමට 1735 වෙනි පිටේ වාත

සූත්‍රයේ 3, 4, 5, 6 වෙනි ඡේද යොදාගැනීමේදී 3 වෙනි ඡේදයේ ‘පැමිණ’ යන වචනවලට පසු සූත්‍රයේ සඳහන් දෘෂ්ටිය යොදාගත යුතුයි.)

## 22. අත්තා සූත්‍රය. (4)

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡේද 1712 වෙනි පිටේ අත්තා සූත්‍රය මෙනි. සූත්‍රය සම්පූර්ණ කරගැනීමට 1735 වෙනි පිටේ වාත සූත්‍රයේ 3, 4, 5, 6 වෙනි ඡේද යොදාගැනීමේදී 3 වෙනි ඡේදයේ ‘පැමිණ’ යන වචනවලට පසු සූත්‍රයේ සඳහන් දෘෂ්ටිය යොදාගත යුතුයි.)

## 23. අත්තා සූත්‍රය (5)

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡේද 1715 වෙනි පිටේ අත්තා සූත්‍රය මෙනි. සූත්‍රය සම්පූර්ණ කරගැනීමට 1735 වෙනි පිටේ වාත සූත්‍රයේ 3, 4, 5, 6 වෙනි ඡේද යොදාගැනීමේදී 3 වෙනි ඡේදයේ ‘පැමිණ’ යන වචනවලට පසු සූත්‍රයේ සඳහන් දෘෂ්ටිය යොදාගත යුතුයි.)

## 24. අත්තා සූත්‍රය (6)

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡේද 1718 වෙනි පිටේ අත්තා සූත්‍රය මෙනි. සූත්‍රය සම්පූර්ණ කරගැනීමට 1735 වෙනි පිටේ වාත සූත්‍රයේ 3, 4, 5, 6 වෙනි ඡේද යොදාගැනීමේදී 3 වෙනි ඡේදයේ ‘පැමිණ’ යන වචනවලට පසු සූත්‍රයේ සඳහන් දෘෂ්ටිය යොදාගත යුතුයි.)

## 25. අත්තා සූත්‍රය (7)

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡේද 1720 වෙනි පිටේ අත්තා සූත්‍රය මෙනි. සූත්‍රය සම්පූර්ණ කරගැනීමට 1735 වෙනි පිටේ වාත සූත්‍රයේ 3, 4, 5, 6 වෙනි ඡේද යොදාගැනීමේදී 3 වෙනි ඡේදයේ ‘පැමිණ’ යන වචනවලට පසු සූත්‍රයේ සඳහන් දෘෂ්ටිය යොදාගත යුතුයි.)

## 26. අත්තා සූත්‍රය (8)

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡේද 1723 වෙනි පිටේ අත්තා සූත්‍රය මෙනි. සූත්‍රය සම්පූර්ණ කරගැනීමට 1735 වෙනි පිටේ වාත

සූත්‍රයේ 3, 4, 5, 6 වෙනි ඡේද යොදාගැනීමේදී 3 වෙනි ඡේදයේ 'පැමිණ' යන වචනවලට පසු සූත්‍රයේ සඳහන් දෘෂ්ටිය යොදාගත යුතුයි.)

(හතරවෙනි පෙයයාලය නිමි.)

---

## 4. ඔක්කන්ත සංයුත්තකය.

### 1. චක්ඛු සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ, 'මහණෙනි'යි කියා භික්ෂූන්හට කථාකළ සේක. 'ස්වාමීනි'යි, කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ඇස අනිත්‍යය. පෙරලෙන ස්වභාවය වෙනස්වන ස්වභාවය. කණ අනිත්‍යය. පෙරලෙන ස්වභාවය වෙනස්වන ස්වභාවය. නාසය අනිත්‍යය. පෙරලෙන ස්වභාවය. වෙනස්වන ස්වභාවය. දිව අනිත්‍යය. පෙරලෙන ස්වභාවය. වෙනස් වන ස්වභාවය. ශරීරය අනිත්‍යය. පෙරලෙන ස්වභාවය. වෙනස්වන ස්වභාවය. සිත අනිත්‍යය. පෙරලෙන ස්වභාවය. වෙනස්වන ස්වභාවය.

3. "මහණෙනි, යමෙක් මේ ධර්මයන් මෙසේ අදහයිද, ශ්‍රද්ධාව කරණකොට මිදෙයිද, ආර්ය මාර්ගයට බැසගත්තාවූ, සත්පුරුෂ භූමියට බැසගත්තාවූ පෘථග්ජන භූමිය ඉක්මවූ සද්ධානුසාරි පුද්ගලයායයි කියනු ලැබේ. හෙතෙම යම් කර්මයක් කොට නිරයෙහි හෝ තිරිසන් යෝනියෙහි හෝ ප්‍රේත ලෝකයෙහි හෝ උපදින්නේද, ඒ කර්මය කිරීමට නුසුදුස්සෙක් වෙයි. යම්තාක් සෝවාන් මාර්ග ඵලයට නොපැමිණෙයිද, ඒතාක් කලුරිය කිරීමට නුසුදුස්සෙක් වෙයි. මහණෙනි, යමෙකුට වනාහි මේ ධර්මයෝ එසේ ප්‍රඥාව කරණකොට ප්‍රමාණ වශයෙන් අවබොධයට

පැමිණෙත්ද, මේ පුද්ගලතෙමේ ආර්ය මාර්ගයට බැසගත්තාවූ සත්පුරුෂ භූමියට බැසගත්තාවූ පෘථග්ජනභූමිය ඉක්මවූ ධම්මානුසාරි පුද්ගලයා යයි කියනු ලැබේ.

4. "හෙතෙමේ යම් කර්මයක් කොට නිරයෙහි හෝ තිරිසන් යෝනියෙහි හෝ ප්‍රේත ලෝකයෙහි හෝ උපදින්නේද, ඒ කර්මය කිරීමට නුසුදුසු වෙයි. යම්තාක් සෝවාන් මාර්ග ඵලයට නොපැමිණේද, ඒතාක් කළුරිය කිරීමට නුසුදුසු වෙයි. මහණෙනි, යමෙක් මේ ධර්මයන් මෙසේ දනියිද, මෙසේ දකියිද, මේ පුද්ගල තෙමේ අපායෙහි නොවැටීම ස්වභාව කොට ඇති නියතවූ අර්හත්වයට ඒකාන්තයෙන් පැමිණෙන සෝවාන් පුද්ගලයායයි කියනු ලැබේ."

## 2. රූප සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි. රූපය අනිත්‍යය. පෙරලෙන ස්වභාවය. වෙනස්වන ස්වභාවය. ශබ්දය අනිත්‍යය. පෙරලෙන ස්වභාවය. වෙනස්වන ස්වභාවය. ගඳ අනිත්‍යය. පෙරලෙන ස්වභාවය. වෙනස්වන ස්වභාවය. රසය අනිත්‍යය. පෙරලෙන ස්වභාවය. වෙනස්වන ස්වභාවය. ස්පර්ශ අනිත්‍යය, පෙරලෙන ස්වභාවය. වෙනස්වන ස්වභාවය. ධර්මය අනිත්‍යය. පෙරලෙන ස්වභාවය. වෙනස්වන ස්වභාවය.

3. "මහණෙනි, යමෙක් මේ ධර්මයෝ මෙසේ අදහයිද, ශ්‍රද්ධාව කරණකොට ගෙන මිදෙයිද, මේ පුද්ගල තෙමේ ආර්ය මාර්ගයට පැමිණියාවූ සත්පුරුෂ භූමියට පැමිණියාවූ පෘථග්ජන භූමිය ඉක්මවූ සද්ධානුසාරී පුද්ගලයායයි කියනු ලැබේ.

"හෙතෙම යම් කර්මයක් කොට නිරයෙහි හෝ තිරිසන් යෝනියෙහි හෝ ප්‍රේත ලෝකයෙහි හෝ උපදින්නේද, ඒ කර්මය කිරීමට නුසුදුසු වෙයි. යම්තාක් සෝවාන් මාර්ග ඵලයට නොපැමිණෙයිද, ඒතාක් කලුරිය කිරීමට නුසුදුසු වෙයි.

4. "මහණෙනි, යමෙකුට වනාහි මේ ධර්මයෝ එසේ ප්‍රඥාව කරණකොට ප්‍රමාණ වශයෙන් දැකීමට පැමිණෙද්ද, මේ පුද්ගල

තෙමේ ආර්ය මාර්ගයට පැමිණියාවූ සත්පුරුෂ භූමියට පැමිණියාවූ පෘථග්ජන භූමිය ඉක්මවූ ධම්මානුසාරී පුද්ගලයායයි කියනු ලැබේ. හෙතෙම යම් කර්මයක් කොට නිරයෙහි හෝ තිරිසන් යෝනියෙහි හෝ ප්‍රේතලෝකයෙහි හෝ උපදින්නේද, ඒ කර්මය කිරීමට නුසුදුසු වෙයි. යම්තාක් සෝවාන් මාර්ග ඵලයට නොපැමිණෙයිද ඒතාක් කළුරිය කිරීමට නුසුදුසු වෙයි."

**5.** "මහණෙනි, යමෙක් මේ ධර්මය මෙසේ දනියිද, දකියිද, හෙතෙමේ අපායෙහි නොවැටෙන ස්වභාවය ඇති නියතවූ අර්හත්වයට ඒකාන්තයෙන් පැමිණෙන්නාවූ සෝවාන් පුද්ගලයායයි කියනු ලැබේ."

## 6. චක්ඛු විඤ්ඤාණ සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

**2.** "මහණෙනි, චක්ඛු විඤ්ඤාණය අනිත්‍යය. පෙරලෙන ස්වභාවය. වෙනස්වන ස්වභාවය. සොත විඤ්ඤාණය අනිත්‍යය. පෙරලෙන ස්වභාවය. වෙනස්වන ස්වභාවය. ඝාන විඤ්ඤාණය අනිත්‍යය, පෙරලෙන ස්වභාවය, වෙනස්වන ස්වභාවය. ජිව්හා විඤ්ඤාණය අනිත්‍යය, පෙරලෙන ස්වභාවය, වෙනස්වන ස්වභාවය. කාය විඤ්ඤාණය අනිත්‍යය. පෙරලෙන ස්වභාවය, වෙනස්වන ස්වභාවය. මනොවිඤ්ඤාණය අනිත්‍යය, පෙරලෙන ස්වභාවය, වෙනස්වන ස්වභාවය.

**3.** "මහණෙනි, යමෙක් මේ ධර්මයන් මෙසේ අදහයිද, ශ්‍රද්ධාව කරණකොට ගෙන මිදෙයිද මේ පුද්ගලතෙමේ ආර්ය මාර්ගයට පැමිණියාවූ සත්පුරුෂ භූමියට පැමිණියාවූ පෘථග්ජන භූමිය ඉක්මවූ සද්ධානුසාරී පුද්ගලයායයි කියනු ලැබේ.

"හෙතෙම යම් කර්මයක් කොට නිරයෙහි හෝ තිරිසන් යෝනියෙහි හෝ ප්‍රේතලෝකයෙහි හෝ උපදින්නේද, ඒ කර්මය කිරීමට නුසුදුසු වෙයි. යම්තාක් සෝවාන් මාර්ග ඵලයට නොපැමිණෙයිද ඒතාක් කළුරිය කිරීමට නුසුදුසු වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. "මහණෙනි, යමෙකුට වනාහි මේ ධර්මයෝ එසේ ප්‍රඥාව කරණකොට ප්‍රමාණ වශයෙන් දැකීමට පැමිණෙද්ද, මේ පුද්ගල තෙමේ ආර්ය මාර්ගයට පැමිණියාවූ සත්පුරුෂ භූමියට පැමිණියාවූ පෘථග්ජන භූමිය ඉක්මවූ ධම්මානුසාරී පුද්ගලයා යයි කියනු ලැබේ. හෙතෙම යම් කර්මයක් කොට නිරයෙහි හෝ තිරිසන් යෝනියෙහි හෝ ප්‍රේතලෝකයෙහි හෝ උපදින්නේද, ඒ කර්මය කිරීමට නුසුදුසු වෙයි. යම්තාක් සෝවාන් මාර්ග ඵලයට නොපැමිණෙයිද ඒතාක් කළුරිය කිරීමට නුසුදුසු වෙයි.

5. "මහණෙනි, යමෙක් මේ ධර්මය මෙසේ දනියිද, දකියිද හෙතෙම අපායෙහි නොවැටෙන ස්වභාවය ඇති නියතවූ අර්හත්වයට ඒකාන්තයෙන් පැමිණෙන්නාවූ සෝවාන් පුද්ගලයායයි කියනු ලැබේ."

## 4. ඵස්ස සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරනලදී.)

2. "මහණෙනි, චක්ඛුසම්ඵස්සය අනිත්‍යය, පෙරලෙන ස්වභාවය, වෙනස්වන ස්වභාවය. සොතසම්ඵස්සය අනිත්‍යය, පෙරලෙන ස්වභාවය, වෙනස්වන ස්වභාවය. ඝානසම්ඵස්සය අනිත්‍යය, පෙරලෙන ස්වභාවය, වෙනස්වන ස්වභාවය. ජිව්හා සම්ඵස්සය අනිත්‍යය, පෙරලෙන ස්වභාවය, වෙනස්වන ස්වභාවය. කාය සම්ඵස්සය අනිත්‍යය පෙරලෙන ස්වභාවය, වෙනස්වන ස්වභාවය. මනො සම්ඵස්සය අනිත්‍යය, පෙරලෙන ස්වභාවය, වෙනස්වන ස්වභාවය.

3. "මහණෙනි. යමෙක් මේ ධර්මයන් මෙසේ අදහයිද, ශ්‍රද්ධාව කරණකොට ගෙන මිදෙයිද, මේ පුද්ගල තෙමේ ආර්ය මාර්ගයට පැමිණියාවූ සත්පුරුෂ භූමියට පැමිණියාවූ පෘථග්ජන භූමිය ඉක්මවූ සද්ධානුසාරී පුද්ගලයායයි කියනු ලැබේ.

හෙතෙම යම් කර්මයක් කොට නිරයෙහි හෝ තිරිසන් යෝනියෙහි හෝ ප්‍රේතලෝකයෙහි හෝ උපදින්නේද, ඒ කර්මය

කිරීමට නුසුදුසු වෙයි. යම්තාක් සෝවාන් මාර්ග ඵලයට නොපැමිණෙයිද, ඒතාක් කළුරිය කිරීමට නුසුදුසුවෙයි.

4. "මහණෙනි, යමෙකුට වනාහි මේ ධර්මයෝ එසේ ප්‍රඥාව කරණකොට ප්‍රමාණ වශයෙන් දැකීමට පැමිණෙද්ද මේ පුද්ගල තෙමේ ආර්ය මාර්ගයට පැමිණියාවූ සත්පුරුෂ භූමියට පැමිණියාවූ පෘථග්ජන භූමිය ඉක්මවූ ධම්මානුසාරී පුද්ගලයායයි කියනු ලැබේ. හෙතෙම යම් කර්මයක් කොට නිරයෙහි හෝ තිරිසන් යෝනියෙහි හෝ ප්‍රේත ලෝකයෙහි හෝ උපදින්නේද, ඒ කර්මය කිරීමට නුසුදුසු වෙයි. යම්තාක් සෝවාන් මාර්ගඵලයට නොපැමිණෙයිද, ඒතාක් කලුරිය කිරීමට නුසුදුසු වෙයි.

5. "මහණෙනි, යමෙක් මේ ධර්මය මෙසේ දනියිද දකියිද හෙතෙමේ අපායෙහි නොවැටෙන ස්වභාවය ඇති නියතවූ අර්හත්වයට ඒකාන්තයෙන් පැමිණෙන්නාවූ සෝවාන් පුද්ගලයායයි කියනු ලැබේ."

## 5. වේදනා සූත්‍රය

(මේ සූත්‍රයද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, චක්ඛුස්පර්ශයෙන් හටගත් වේදනාව අනිත්‍යය, පෙරලෙන ස්වභාවය වෙනස්වන ස්වභාවය. සොතස්පර්ශයෙන් හටගන්නා වේදනාව අනිත්‍යය, පෙරලෙන ස්වභාවය, වෙනස්වන ස්වභාවය, ඝාණස්පර්ශයෙන් හටගත් වේදනාව අනිත්‍යය, පෙරලෙන ස්වභාවය, වෙනස්වන ස්වභාවය. ජිව්හාස්පර්ශයෙන් හටගත් වේදනාව අනිත්‍යය, පෙරලෙන ස්වභාවය, වෙනස්වන ස්වභාවය. කායස්පර්ශයෙන් හටගත් වේදනාව අනිත්‍යය, පෙරලෙන ස්වභාවය වෙනස්වන ස්වභාවය. මනොස්පර්ශයෙන් හටගත් වේදනාව අනිත්‍යය, පෙරලෙන ස්වභාවය, වෙනස්වන ස්වභාවය.

3. "මහණෙනි, යමෙක් මේ ධර්මයන් මෙසේ අදහයිද, ශ්‍රද්ධාව කරණකොටගෙන මිදෙයිද, මේ පුද්ගල තෙමේ ආර්ය මාර්ගයට

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පැමිණියාවූ, සත්පුරුෂ භූමියට පැමිණියාවූ පෘථග්ජන භූමිය ඉක්මවූ සද්ධානුසාරී පුද්ගලයායයි කියනු ලැබේ.

හෙතෙම යම් කර්මයක් කොට නිරයෙහි හෝ තිරිසන් යෝනියෙහි හෝ ප්‍රේත ලෝකයෙහි හෝ උපදින්නේද, ඒ කර්මය කිරීමට නුසුදුසු වෙයි. යම්තාක් සෝවාන් මාර්ග ඵලයට නොපැමිණෙයිද, එතාක් කළුරිය කිරීමට නුසුදුසු වෙයි.

4. "මහණෙනි, යමෙකුට වනාහි මේ ධර්මයෝ එසේ ප්‍රඥාව කරණකොට ප්‍රමාණ වශයෙන් දැකීමට පැමිණෙද්ද මේ පුද්ගල තෙමේ ආර්ය මාර්ගයට පැමිණියාවූ සත්පුරුෂ භූමියට පැමිණියාවූ පෘථග්ජන භූමිය ඉක්මවූ ධර්මානුසාරී පුද්ගලයායි. හෙතෙම යම් කර්මයක් කොට නිරයෙහි හෝ තිරිසන් යෝනියෙහි හෝ ප්‍රේත ලෝකයෙහි හෝ උපදින්නේද, ඒ කර්මය කිරීමට නුසුදුසු වෙයි. යම්තාක් සෝවාන් ඵලයට නොපැමිණෙයිද ඒතාක් කළුරිය කිරීමට නුසුදුසු වෙයි.

5. "මහණෙනි, යමෙක් මේ ධර්මය මෙසේ දනියිද, දකියිද, හෙතෙමේ අපායෙහි නොවැටෙන ස්වභාවය ඇති නියතවූ අර්හත්වයට ඒකාන්තයෙන් පැමිණෙන්නාවූ සෝවාන් පුද්ගලයා යයි කියනු ලැබේ."

## 6. සඤ්ඤා සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. මහණෙනි, රූප සඤ්ඤාව අනිත්‍යය. පෙරලෙන ස්වභාවය වෙනස්වන ස්වභාවය. ශබ්ද සඤ්ඤාව අනිත්‍යය. පෙරලෙන ස්වභාවය වෙනස්වන ස්වභාවය. ගන්ධ සඤ්ඤාව අනිත්‍යය. පෙරලෙන ස්වභාවය. වෙනස්වන ස්වභාවය. රස සඤ්ඤාව අනිත්‍යය පෙරලෙන ස්වභාවය. වෙනස්වන ස්වභාවය. ධම්ම සඤ්ඤාව අනිත්‍යය. පෙරලෙන ස්වභාවය වෙනස් වන ස්වභාවය.

3. "මහණෙනි. යමෙක් මේ ධර්මයන් මෙසේ අදහයිද, ශ්‍රද්ධාව කරණකොට ගෙන මිදෙයිද, මේ පුද්ගලතෙමේ ආර්ය මාර්ගයට

පැමිණියාවූ සත්පුරුෂ භූමියට පැමිණියාවූ පෘථග්ජන භූමිය ඉක්මවූ සද්ධානුසාරී පුද්ගලයායයි කියනු ලැබේ.

"හෙතෙම යම් කර්මයක් කොට නිරයෙහි හෝ තිරිසන් යෝනියෙහි හෝ ප්‍රේත ලෝකයෙහි හෝ උපදින්නේද, ඒ කර්මය කිරීමට නුසුදුසු වෙයි. යම්තාක් සෝවාන්මාර්ග ඵලයට නොපැමිණෙයිද, ඒතාක් කළුරිය කිරීමට නුසුදුසු වෙයි.

4. "මහණෙනි, යමෙකුට වනාහි මේ ධර්මයන් එසේ ප්‍රඥාව කරණකොට ප්‍රමාණ වශයෙන් දැකීමට පැමිණෙද්ද මේ පුද්ගලතෙමේ ආර්ය මාර්ගයට පැමිණියාවූ සත්පුරුෂ භූමියට පැමිණියාවූ පෘථග්ජන භූමිය ඉක්මවූ ධම්මානුසාරී පුද්ගලයායි කියනු ලැබේ. හෙතෙම යම් කර්මයක් කොට නිරයෙහි හෝ තිරිසන් යෝනියෙහි හෝ ප්‍රේත ලෝකයෙහි හෝ උපදින්නේද ඒ කර්මය කිරීමට නුසුදුසු වෙයි. යම්තාක් සෝවාන්මාර්ග ඵලයට නොපැමිණෙයිද ඒතාක් කළුරිය කිරීමට නුසුදුසු වෙයි.

5. "මහණෙනි, යමෙක් මේ ධර්මය මෙසේ දනියිද දකියිද, හෙතෙමේ අපායෙහි නොවැටෙන ස්වභාවය ඇති නියතවූ අර්හත්වයට ඒකාන්තයෙන් පැමිණෙන්නාවූ සෝවාන් පුද්ගලයායයි කියනු ලැබේ."

## 7. චේතනා සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, රූප සංචේතනාව අනිත්‍යය. පෙරලෙන ස්වභාවය වෙනස්වන ස්වභාවය. සද්ද සංචේතනාව අනිත්‍යය. පෙරලෙන ස්වභාවය වෙනස්වන ස්වභාවය. ගන්ධ සංචේතනාව අනිත්‍යය. පෙරලෙන ස්වභාවය වෙනස්වන ස්වභාවය. රස සංචේතනාව අනිත්‍යය. පෙරලෙන ස්වභාවය වෙනස්වන ස්වභාවය ඵොට්ඨබ්බ සංචේතනාව අනිත්‍යය. පෙරලෙන ස්වභාවය වෙනස්වන ස්වභාවය. ධම්ම සංචේතනාව අනිත්‍යය. පෙරලෙන ස්වභාවය වෙනස්වන ස්වභාවයි.

3. "මහණෙනි, යමෙක් මේ ධර්මයන් මෙසේ අදහයිද, ශ්‍රද්ධාව කරණකොට ගෙන මිදෙයිද, මේ පුද්ගලතෙමේ ආර්ය මාර්ගයට පැමිණියාවූ සත්පුරුෂ භූමියට පැමිණියාවූ පෘථග්ජන භූමිය ඉක්මවූ සද්ධානුසාරී පුද්ගලයායයි කියනු ලැබේ.

හෙතෙම යම් කර්මයක් කොට නිරයෙහි හෝ තිරිසන් යෝනියෙහි හෝ ප්‍රේත ලෝකයෙහි හෝ උපදින්නේද, ඒ කර්මය කිරීමට නුසුදුසු වෙයි. යම්තාක් සෝවාන් මාර්ග ඵලයට නොපැමිණෙයිද, ඒතාක් කළුරිය කිරීමට නුසුදුසු වෙයි.

4. "මහණෙනි, යමෙකුට වනාහි මේ ධර්මයන් එසේ ප්‍රඥාව කරණකොට ප්‍රමාණ වශයෙන් දැකීමට පැමිණෙද්ද මේ පුද්ගලතෙමේ ආර්ය මාර්ගයට පැමිණියාවූ සත්පුරුෂ පුද්ගලයායයි කියනු ලැබේ. හෙතෙම යම් කර්මයක් කොට නරකයෙහි හෝ තිරිසන් යෝනියෙහි හෝ ප්‍රේත ලෝකයෙහි හෝ උපදින්නේද, ඒ කර්මය කිරීමට නුසුදුසු වෙයි. යම්තාක් සෝවාන් මාර්ග ඵලයට නොපැමිණෙයිද ඒතාක් කළුරිය කිරීමට නුසුදුසුවෙයි.

5. "මහණෙනි, යමෙක් මේ ධර්මය මෙසේ දනියිද, දකියිද හෙතෙම අපායෙහි නොවැටෙන ස්වභාවය ඇති නියතවූ අර්හත්වයට ඒකාන්තයෙන් පැමිණෙන්නාවූ සෝවාන් පුද්ගලයායයි කියනු ලැබේ."

## 8. තණ්හා සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. මහණෙනි, රූප තණ්හාව අනිත්‍යය. පෙරලෙන ස්වභාවය වෙනස්වන ස්වභාවය, ශබ්ද තණ්හාව අනිත්‍යය. පෙරලෙන ස්වභාවය වෙනස්වන ස්වභාවය, ගන්ධ තණ්හාව අනිත්‍යය, පෙරලෙන ස්වභාවය වෙනස්වන ස්වභාවය, රස තණ්හාව අනිත්‍යය, පෙරලෙන ස්වභාවය, වෙනස්වන ස්වභාවය, ස්පර්ශ තණ්හාව අනිත්‍යය, පෙරලෙන ස්වභාවය, වෙනස් වන ස්වභාවය.

ධම්ම තණ්හාව අනිත්‍යය, පෙරලෙන ස්වභාවය වෙනස්වන ස්වභාවය.

3. "මහණෙනි, යමෙක් මේ ධර්මයන් මෙසේ අදහයිද, ශ්‍රද්ධාව කරණකොට ගෙන මිදෙයිද, මේ පුද්ගලතෙමේ ආර්ය මාර්ගයට පැමිණියාවූ සත්පුරුෂ භූමියට පැමිණියාවූ පෘථග්ජන භූමිය ඉක්මවූ සද්ධානුසාරී පුද්ගලයායයි කියනු ලැබේ.

"හෙතෙම යම් කර්මයක් කොට නිරයෙහි හෝ තිරිසන් යෝනියෙහි හෝ ප්‍රේත ලෝකයෙහි හෝ උපදින්නේද, ඒ කර්මය කිරීමට නුසුදුසු වෙයි. යම්තාක් සෝවාන් මාර්ග ඵලයට නොපැමිණෙයිද, ඒතාක් කළුරිය කිරීමට නුසුදුසු වෙයි.

4. "මහණෙනි, යමෙකුට වනාහි මේ ධර්මයන් එසේ ප්‍රඥාව කරණකොට ප්‍රමාණ වශයෙන් දැකීමට පැමිණෙද්ද, මේ පුද්ගලතෙමේ ආර්ය මාර්ගයට පැමිණියාවූ සත්පුරුෂ භූමියට පැමිණියාවූ පෘථග්ජන භූමිය ඉක්මවූ ධම්මානුසාරී පුද්ගලයා යයි කියනු ලැබේ. හෙතෙම යම් කර්මයක් කොට නිරයෙහි හෝ තිරිසන් යෝනියෙහි හෝ ප්‍රේත ලෝකයෙහි හෝ උපදින්නේද ඒ කර්මය කිරීමට නුසුදුසු වෙයි. යම්තාක් සෝවාන්මාර්ග ඵලයට නොපැමිණෙයිද, ඒතාක් කළුරිය කිරීමට නුසුදුසු වෙයි.

5. "මහණෙනි, යමෙක් මේ ධර්මය මෙසේ දනියිද, දකියිද හෙතෙමේ අපායෙහි නොවැටෙන ස්වභාවය ඇති නියතවූ අර්හත්වයට ඒකාන්තයෙන් පැමිණෙන්නාවූ සෝවාන් පුද්ගලයායයි කියනු ලැබේ."

## 9. ධාතු සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, පඨවි ධාතුව අනිත්‍යය, පෙරලෙන ස්වභාවය වෙනස්වන ස්වභාවය. ආපොධාතුව අනිත්‍යය. පෙරලෙන ස්වභාවය වෙනස්වන ස්වභාවය, තේජෝ ධාතුව අනිත්‍යය, පෙරලෙන ස්වභාවය, වෙනස්වන ස්වභාවය. වායොධාතුව

අනිත්‍යය. පෙරලෙන ස්වභාවය, වෙනස්වන ස්වභාවය. ආකාශ ධාතුව අනිත්‍යය, පෙරලෙන ස්වභාවය, වෙනස්වන ස්වභාවය විඤ්ඤාණ ධාතුව අනිත්‍යය, පෙරලෙන ස්වභාවය වෙනස්වන ස්වභාවය.

3. "මහණෙනි, යමෙක් මේ ධර්මයන් මෙසේ අදහයිද ශ්‍රද්ධාව කරණකොට ගෙන මිදෙයිද, මේ පුද්ගලතෙමේ ආර්ය මාර්ගයට පැමිණියාවූ සත්පුරුෂ භූමියට පැමිණියාවූ පෘථග්ජන භූමිය ඉක්මවූ සද්ධානුසාරී පුද්ගලයායයි කියනු ලැබේ.

"හෙතෙම යම් කර්මයක් කොට නිරයෙහි හෝ තිරිසන් යෝනියෙහි හෝ ප්‍රේත ලෝකයෙහි හෝ උපදින්නේද, ඒ කර්මය කිරීමට නුසුදුසු වෙයි. යම්තාක් සෝවාන් මාර්ග ඵලයට නොපැමිණෙයිද, ඒතාක් කළුරිය කිරීමට නුසුදුසු වෙයි.

4. "මහණෙනි, යමෙකුට වනාහි මේ ධර්මයන් එසේ ප්‍රඥාව කරණකොට ප්‍රමාණ වශයෙන් දැකීමට පැමිණෙද්ද, මේ පුද්ගලතෙමේ ආර්ය මාර්ගයට පැමිණියාවූ සත්පුරුෂ භූමියට පැමිණියාවූ පෘථග්ජන භූමිය ඉක්මවූ ධම්මානුසාරී පුද්ගලයා යයි කියනු ලැබේ. හෙතෙම යම් කර්මයක් කොට නිරයෙහි හෝ තිරිසන් යෝනියෙහි හෝ ප්‍රේත ලෝකයෙහි හෝ උපදින්නේද, ඒ කර්මය කිරීමට නුසුදුසු වෙයි. යම්තාක් සෝවාන් මාර්ග ඵලයට නොපැමිණෙයිද, ඒතාක් කළුරිය කිරීමට නුසුදුසු වෙයි.

5. "මහණෙනි, යමෙක් මේ ධර්මය මෙසේ දනියිද, දකියිද, හෙතෙම අපායෙහි නොවැටෙන ස්වභාවය ඇති නියතවූ අර්හත්වයට ඒකාන්තයෙන් පැමිණෙන්නාවූ සෝවාන් පුද්ගලයායයි කියනු ලැබේ.

## 10. ඛන්ධ සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, රූපය අනිත්‍යය, පෙරලෙන ස්වභාවය, වෙනස්වන ස්වභාවය. වේදනාව අනිත්‍යය, පෙරලෙන

ස්වභාවය, වෙනස්වන ස්වභාවය, සඤ්ඤාව අනිත්‍යය පෙරලෙන ස්වභාවය. වෙනස්වන ස්වභාවය, සංස්කාරයෝ අනිත්‍යය, පෙරලෙන ස්වභාවය, වෙනස්වන ස්වභාවය. විඤ්ඤාණය අනිත්‍යය, පෙරලෙන ස්වභාවය, වෙනස්වන ස්වභාවය.

3. "මහණෙනි, යමෙක් මේ ධර්මයන් මෙසේ අදහයිද, ශ්‍රද්ධාව කරණකොට මිදෙයිද, මේ පුද්ගලතෙමේ ආර්ය මාර්ගයට පැමිණියාවූ සත්පුරුෂ භූමියට පැමිණියාවූ පෘථග්ජන භූමිය ඉක්මවූ සෝවාන් පුද්ගලයායයි කියනු ලැබේ. හෙතෙම යම් කර්මයක් කොට නිරයෙහි හෝ තිරිසන් යෝනියෙහි හෝ ප්‍රේත ලෝකයෙහි හෝ උපදින්නේද, ඒ කර්මය කිරීමට නුසුදුසු වෙයි. යම්තාක් සෝවාන් ඵලයට නොපැමිණියේද, ඒතාක් කළුරිය කිරීමට නුසුදුසු වෙයි.

4. "මහණෙනි, යමෙකුට වනාහි මේ ධර්මයෝ මෙසේ ප්‍රඥාව කරණකොට ගෙන ප්‍රමාණ වශයෙන් දැකීමට පැමිණෙත්ද, මේ පුද්ගලතෙමේ ආර්ය මාර්ගයට පැමිණියාවූ සත්පුරුෂ භූමියට පැමිණියාවූ පෘථග්ජන භූමිය ඉක්මවූ ධම්මානුසාරී පුද්ගලයායි කියනු ලැබේ.

5. "හෙතෙම යම් කර්මයක්කොට නිරයෙහි හෝ තිරිසන් යෝනියෙහි හෝ ප්‍රේත ලෝකයෙහි හෝ උපදින්නේද, ඒ කර්මය කිරීමට නුසුදුසු වෙයි. යම්තාක් සෝවාන් ඵලයට නොපැමිණේද ඒතාක් කළුරිය කිරීමට නුදුසුසු වෙයි.

"මහණෙනි, යමෙක් මේ ධර්මයන් මෙසේ දනියිද, දකියිද හෙතෙමේ අපායෙහි නොවැටීම ස්වභාවකොට ඇත්තාවූ නියතවූ අර්හත්වයට ඒකාන්තයෙන් පැමිණෙන්නාවූ සෝවාන් පුද්ගලයායයි කියනු ලැබේ."

**(චක්ඛු සූත්‍රය, රූප සූත්‍රය, විඤ්ඤාණ සූත්‍රය, ඵස්ස සූත්‍රය, වේදනා සූත්‍රය, සඤ්ඤා සූත්‍රය, චෙතනා සූත්‍රය, තණ්හා සූත්‍රය, ධාතු සූත්‍රය සහ ඛන්ධ සූත්‍රය දැයි මේ වර්ගයෙහි සූත්‍ර දසයක් වෙත්.)**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# 5. උප්පාද සංයුත්තකය.

## 1. චක්ඛු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ඇසේ යම් ඉපදීමක් පැවැත්මක් හට ගැනීමක් පහළවීමක් වේද, එය දුඃඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහළවීම වෙයි. කණේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහළවීමක් වේද, එය දුඃඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහළවීමවෙයි. නාසයේ යම්ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහළවීම වෙයි. දිවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහළවීමක් වේද එය දුඃඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහළවීම වෙයි. කයේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද, එය දුඃඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහළවීම වෙයි. සිතේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහළවීමක් වේද, එය දුඃඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයන්ගේ පහලවීම වෙයි.

3. "මහණෙනි, ඇසේ යම් නිරෝධයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ නිරෝධය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයාගේ විනාශයට යාම වෙයි. කනේ යම් නිරෝධයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ නිරෝධය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයාගේ විනාශයට යාම වෙයි. නාසයේ යම් නිරෝධයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ නිරෝධය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයාගේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

විනාශයට යාම වෙයි. දිවේ යම් නිරෝධයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ නිරෝධය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයාගේ විනාශයට යාම වෙයි. කයේ යම් නිරෝධයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ නිරෝධය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයාගේ විනාශයට යාම වෙයි. සිතේ යම් නිරෝධයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද එය දුක්ඛයාගේ නිරෝධය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයාගේ විනාශයට යාම වෙයි.

## 2. රූප සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, රූපයේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීමවෙයි. ශබ්දයන්ගේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැන්මක් පහලවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයේ පහලවීම වෙයි. ගන්ධයන්ගේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැන්මක් පහලවීමක්වේද, එය දුක්ඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයේ පහලවීම වෙයි. රසයන්ගේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැන්මක් පහලවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයේ පහලවීම වෙයි. ස්පර්ශයන්ගේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැන්මක් පහලවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයේ පහලවීම වෙයි. ධර්මයන්ගේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැන්මක් පහලවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයේ පහලවීම වෙයි.

3. "මහණෙනි, රූපයේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි. ශබ්දයේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි. ගන්ධයේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි. රසයේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි. ස්පර්ශයේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි. සිතේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි.

## 3. විඥ්ඥාණ සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

**2.** "මහණෙනි, චක්ඛු විඥ්ඥාණයේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීම වෙයි. සොත විඥ්ඥාණයෙහි යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීම වෙයි. ඝාණ විඥ්ඥාණයෙහි යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීම වෙයි. ජිව්හා විඥ්ඥාණයෙහි යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීම වෙයි. කාය විඥ්ඥාණයෙහි යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීම වෙයි. මනෝ විඥ්ඥාණයෙහි යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීම වෙයි.

3. "මහණෙනි, චක්ඛු විඤ්ඤාණයේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයාගේ විනාශයට යාම වෙයි. සොත විඤ්ඤාණයෙහි යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයාගේ විනාශයට යාම වෙයි. ඝාණ විඤ්ඤාණයෙහි යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයාගේ විනාශයට යාම වෙයි. ජිව්හා විඤ්ඤාණයෙහි යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයාගේ විනාශයට යාම වෙයි. කාය විඤ්ඤාණයෙහි යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයාගේ විනාශයට යාම වෙයි. මනොවිඤ්ඤාණයෙහි යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක්වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයාගේ විනාශයට යාම වෙයි.

## 4. ඵස්ස සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, චක්ඛුසම්ඵස්සයේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීම වෙයි. සොත සම්ඵස්සයෙහි යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීම වෙයි. ඝාණ සම්ඵස්සයෙහි යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද එය දුක්ඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීම වෙයි. ජිව්හා සම්ඵස්සයෙහි යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීම වෙයි. කාය සම්ඵස්සයෙහි යම්

ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීම වෙයි. මනොසම්ඵස්සයෙහි යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීම වෙයි.

3. "මහණෙනි, චක්ඛුසම්ඵස්සයේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි. සොතසම්ඵස්සයෙහි යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි. ඝාණසම්ඵස්සයෙහි යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයාගේ විනාශයට යාම වෙයි. ජිව්හා සම්ඵස්සයෙහි යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයාගේ විනාශයට යාම වෙයි. කායසම්ඵස්සයෙහි යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි. මනොසම්ඵස්සයෙහි යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි.

## 5. වේදනා සූත්‍රය

(මේ සූත්‍රයද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනාකරනලදී.)

2. "මහණෙනි, චක්ඛුසම්ඵස්සයෙන් උපන් වේදනාවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද, එය දුඃඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීම වෙයි. සොත සම්ඵස්සයෙන් උපන් වේදනාවේ යම් ඉපදීක් පැවැත්මක් හටගැනීමක් පහළවීමක් වේද, එය දුඃඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරා මරණයාගේ පහළවීම වෙයි.

ඝානසම්ඵස්සයෙන් උපන් වේදනාවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද, එය දුඃඛයාගේ ඉපදීම, රෝගයාගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීම වෙයි. ජිහ්වා සම්පස්සයෙන් උපන් වේදනාවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහළවීමක් වේද, එය දුඃඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීම වෙයි. කාය සම්ඵස්සයෙන් උපන් වේදනාවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද, එය දුඃඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරා මරණයාගේ පහලවීම වෙයි. මනෝ සම්ඵස්සයෙන් උපන් වේදනාවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද එය දුඃඛයාගේ ඉපදීම, රෝගයාගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීම වෙයි.

3. "මහණෙනි, චක්ඛුසම්ඵස්සයෙන් උපන් වේදනාවේ යම් නිරෝධයක් සන්සිඳීමක්, විනාශයට යාමක් වේද එය දුඃඛයාගේ නිරෝධය රෝගයන්ගේ සන්සිඳීම ජරාමරණයාගේ විනාශයට යාම වෙයි. සොත සම්ඵස්සයෙන් උපන් වේදනාවේ යම් නිරෝධයක් සන්සිඳීමක්. විනාශයට යාමක් වේද එය දුක්ඛයාගේ නිරොධය රෝගයන්ගේ සන්සිඳීම ජරා මරණයාගේ විනාශයට යාම වෙයි. ඝාණ සම්ඵස්සයෙන් උපන් වේදනාවේ යම් නිරෝධයක් සන්සිඳීමක්, විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ නිරෝධය රෝගයන්ගේ සන්සිඳීම ජරාමරණයාගේ විනාශයට යාම වෙයි ජිහ්වා සම්ඵස්සයෙන් උපන් වේදනාවේ යම් නිරෝධයක් සන්සිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ නිරෝධය රෝගයන්ගේ සන්සිඳීම ජරාමරණයාගේ විනාශයට යාම වෙයි. කාය සම්ඵස්සයෙන් උපන් වේදනාවේ යම් නිරෝධයක් සන්සිඳීමක් විනාශයට යාමක් වේද, එය දුඃඛයාගේ නිරෝධය රෝගයන්ගේ සන්සිඳීම ජරා මරණයාගේ විනාශයට යාම වෙයි. මනො සම්ඵස්සයෙන් උපන් වේදනාවේ යම් නිරෝධයක් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි.

# 6. සඤ්ඤා සූත්‍රය

(මේ සූත්‍රයද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, රූප සඤ්ඤාවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද, එය දුඃඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීමද වෙයි ශබ්ද සඤ්ඤාවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීමද වෙයි. ගන්ධ සඤ්ඤාවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීමද වෙයි. රස සඤ්ඤාවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීමද වෙයි. ස්පර්ශ සඤ්ඤාවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීමද වෙයි. ධම්ම සඤ්ඤාවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරා මරණයාගේ පහළවීමද වෙයි."

3. "මහණෙනි, රූප සඤ්ඤාවේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සන්සිඳීම ජරාමරණයාගේ විනාශයට යාම වෙයි. ශබ්ද සඤ්ඤාවේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයාගේ විනාශයට යාම වෙයි. ගන්ධ සඤ්ඤාවේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයාගේ විනාශයට යාම වෙයි. රස සඤ්ඤාවේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරා මරණයේ විනාශයට යාම වෙයි. ස්පර්ශ සඤ්ඤාවේ යම්

විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයාගේ විනාශයට යාම වෙයි. ධම්ම සඤ්ඤාවේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි.

## 7. චේතනා සූත්‍රය

(මේ සූත්‍රයද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

**2.** "මහණෙනි, රූප සංචේතනාවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරා මරණයාගේ පහලවීම වෙයි. ශබ්ද සංචේතනාවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීම වෙයි. ගන්ධ සංචේතනාවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහළවීම වෙයි. රස සංචේතනාවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහළවීම වෙයි. ස්පර්ශ සංචේතනාවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහළවීම වෙයි. ධම්ම සංචේතනාවෙ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහළවීම වෙයි.

**3.** "මහණෙනි, රූප සංචේතනාවේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි. ශබ්ද සංචෙතනාවේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ

විනාශයට යාම වෙයි. ගන්ධ සංචේතනාවේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි. රස සංචේතනාවේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි. ස්පර්ශ සංචේතනාවේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි. ධම්ම සංචේතනාවේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි.

## 8. තණ්හා සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

**2.** "මහණෙනි, රූප තණ්හාවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහළවීම වෙයි. ශබ්ද තණ්හාවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහළවීම වෙයි. ගන්ධ තණ්හාවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහළවීම වෙයි. රස තණ්හාවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහළවීම වෙයි. ස්පර්ශ තණ්හාවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහළවීම වෙයි. ධම්ම තණ්හාවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහළවීම වෙයි.

3. "මහණෙනි, රූප තණ්හාවේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි. ශබ්ද තණ්හාවේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරා මරණයේ විනාශයට යාම වෙයි. ගන්ධ තණ්හාවේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරා මරණයේ විනාශයට යාම වෙයි. රස තණ්හාවේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි. ස්පර්ශ තණ්හාවේ යම් විනාශයක් සංසිඳීමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීමක් විනාශයට යාම  විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි. ධම්ම තණ්හාවේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරා මරණයේ විනාශයට යාම වෙයි.

## 9. ධාතු සූත්‍රය

(මේ සූත්‍රයද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.

2. "මහණෙනි පෘථිවි ධාතුවේ යම් ඉපදීමක් පැවැත්මක් හට ගැනීමක් පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරා මරණයාගේ පහළවීම වෙයි. ආපෝ ධාතුවේ යම් ඉපදීමක් පැවැත්මක් හට ගැනීමක් පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරා මරණයාගේ පහළවීම වෙයි. තේජෝ ධාතුවේ යම් ඉපදීමක් පැවැත්මක් හට ගැනීමක් පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරා මරණයාගේ පහළවීම වෙයි. වායෝ ධාතුවේ යම් ඉපදීමක් පැවැත්මක් හට ගැනීමක් පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරා මරණයාගේ පහළවීම වෙයි. ආකාශ ධාතුවේ යම් ඉපදීමක් පැවැත්මක් හට

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ගැනීමක් පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරා මරණයාගේ පහළවීම වෙයි. විඤ්ඤාණ ධාතුවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහළවීම වෙයි.

3. "මහණෙනි, පෘථිවි ධාතුවේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි. ආපෝ ධාතුවේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි. තේජෝධාතුවේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි. වායෝධාතුවේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි. ආකාශ ධාතුවේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි. විඤ්ඤාණ ධාතුවේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද, එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි.

## 10. ඛන්ධ සූත්‍රය

(මේ සූත්‍රයද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, රූපස්කන්ධයේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරා මරණයාගේ පහලවීමද වෙයි. වේදනාවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද එය දුක්ඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීමද වෙයි. සඤ්ඤාවේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද එය දුක්ඛයාගේ ඉපදීම,

රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීමද වෙයි. සංස්කාරයන්ගේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහලවීමක් වේද එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීමද වෙයි. විඤ්ඤාණයේ යම් ඉපදීමක් පැවැත්මක් හටගැනීමක් පහල වීමක් වේද එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයාගේ පහලවීම වෙයි.

3. "මහණෙනි, රූපයේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි. වේදනාවේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාමක් වේද එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි. සඤ්ඤාවේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි. සංස්කාරයන්ගේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි. විඤ්ඤාණයේ යම් විනාශයක් සංසිඳීමක් විනාශයට යාමක් වේද එය දුක්ඛයාගේ විනාශය රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයේ විනාශයට යාම වෙයි.

චක්ඛු සූත්‍රය, රූප සූත්‍රය, විඤ්ඤාණ සූත්‍රය, ඵස්ස සූත්‍රය, වේදනා සූත්‍රය, සඤ්ඤා සූත්‍රය, චේතනා සූත්‍රය, තණ්හා සූත්‍රය, ධාතු සූත්‍රය සහ ඛන්ධ සූත්‍රය, යැයි සූත්‍ර දසයකි.

**උප්පාද සංයුත්තය නිමි.**

---

## 6. කිලෙස සංයුත්තය.

### 1. චක්ඛු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින්

කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ඇසෙහි යම් ඡන්දරාගයක් වේද, එය චිත්තයාගේ කිලුටුවීමයි. කණෙහි යම් ඡන්දරාගයක් වේද, එය කණෙහි කිලුටුවීමයි. නාසයෙහි යම් ඡන්දරාගයක් වේද, එය නාසයෙහි කිලුටුවීමයි. දිවෙහි යම් ඡන්දරාගයක් වේද, එය දිවෙහි කිලුටුවීමයි. කයෙහි යම් ඡන්දරාගයක් වෙයිද, එය කයෙහි කිලුටුවීමයි සිතේ යම් ඡන්දරාගයක් වෙයිද, එය චිත්තයාගේ කිලුටුවීමයි.

3. "මහණෙනි, යම් තැනක පටන් මේ සය ස්ථානයන්හි භික්ෂුවගේ සිතේ කිලුටුබව ප්‍රහීනවූයේ වෙයිද? ඔහුගේ සිත ලොකොත්තර ධර්මයට නැඹුරුවූයේ වෙයි. නෛෂ්ක්‍රම්‍ය පුරුදු කරන ලද සිත විශෙෂ ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කළ යුතු ධර්ම විෂයෙහි කර්මණ්‍ය වෙයි.

## 2. රූප සූත්‍රය.

1. (මේ සූත්‍රයේ 1, 3 වෙනි ඡෙද කිලෙස සංයුත්තයේ 1 චක්ඛු සූත්‍රයේ මෙනි.)

2. "මහණෙනි, රූපයෙහි යම් ඡන්දරාගයක් වේද, එය සිතේ කිලුටුවීමයි ශබ්දයෙහි යම් ඡන්දරාගයක් වේද, එය කණෙහි කිලුටුවීමයි. ගන්ධයෙහි යම් ඡන්දරාගයක් වේද, එය නාසයෙහි කිලුටුවීමයි. රසයෙහි යම් ඡන්දරාගයක් වේද, එය දිවෙහි කිලුටුවීමයි. ස්පර්ශයෙහි යම් ඡන්දරාගයක් වේද, එය කයෙහි කිලුටුවීමයි. ධර්මයෙහි යම් ඡන්දරාගයක් වේද, එය සිතේ කිලුටුවීමයි.

## 3. චක්ඛු විඤ්ඤාණය සූත්‍රය.

1. (මේ සූත්‍රයේ 1, 3 වෙනි ඡෙද කිලෙස සංයුත්තයේ 1 චක්ඛු සූත්‍රයේ මෙනි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

2. "මහණෙනි, චක්ඛු විඤ්ඤාණයෙහි යම් ඡන්දරාගයක් වේද, එය සිතේ කිලුටුවීමයි. සොත විඤ්ඤාණයෙහි යම් ඡන්ද රාගයක් වේද, එය කණෙහි කිලුටුවීමයි. ඝාණ විඤ්ඤාණයෙහි යම් ඡන්දරාගයක් වේද, එය නාසයේ කිලුටුවීමයි. ජිහ්වා විඤ්ඤාණයෙහි යම් ඡන්දරාගයක් වේද, එය දිවෙහි කිලුටුවීමයි. කාය විඤ්ඤාණයෙහි යම් ඡන්දරාගයක් වේද, එය කයෙහි කිලුටුවීමයි. මනෝ විඤ්ඤාණයෙහි යම් ඡන්දරාගයක් වේද, එය සිතේ කිලුටුවීමයි.

## 4. ඵස්ස සූත්‍රය.

1. (මේ සූත්‍රයේ 1, 3 වෙනි ඡේද කිලෙස සංයුත්තයේ 1 චක්ඛු සූත්‍රයේ මෙනි.)

2. "මහණෙනි, චක්ඛුසම්ඵස්සයෙහි යම් ඡන්දරාගයක්වේද, එය සිතේ කිලුටුවීමයි. සොත සම්ඵස්සයෙහි යම් ඡන්දරාගයක් වේද, එය කණෙහි කිලුටුවීමයි. ඝාණ සම්ඵස්සයෙහි යම් ඡන්ද රාගයක් වේද, එය නාසයේ කිලුටුවීමයි ජිව්හා සම්ඵස්සයෙහි යම් ඡන්දරාගයක්වේද, එය දිවෙහි කිලුටුවීමයි. කාය සම්ඵස්සයෙහි යම් ඡන්දරාගයක් වේද, එය කයෙහි කිලුටුවීමයි. මනෝ සම්ඵස්සයෙහි යම් ඡන්දරාගයක් වේද, එය සිතේ කිලුටුවීමයි.

## 5. වේදනා සූත්‍රය.

1. (මේ සූත්‍රයේ 1, 3 වෙනි ඡේද කිලෙස සංයුත්තයේ 1 චක්ඛු සූත්‍රයේ මෙනි)

2. "මහණෙනි, චක්ඛු ස්පර්ශයෙන් උපන් වේදනාවෙහි යම් ඡන්දරාගයක් වේද, එය සිතේ කිලුටුවීමයි. සොත ස්පර්ශයෙන් උපන් වේදනාවෙහි යම් ඡන්දරාගයක් වේද, එය කණෙහි කිලුටුවීමයි. ඝාණ ස්පර්ශයෙන් උපන් වේදනාවෙහි යම් ඡන්දරාගයක් වේද, එය නාසයේ කිලුටුවීමයි. ජිව්හා ස්පර්ශයෙන් උපන් වේදනාවෙහි යම් ඡන්දරාගයක් වේද එය දිවෙහි කිලුටුවීමයි. කාය ස්පර්ශයෙන් උපන් වේදනාවෙහි යම් ඡන්දරාගයක් වේද, එය කයෙහි කිලුටුවීමයි. මනො ස්පර්ශයෙන්

උපන් වේදනාවෙහි යම් ඡන්දරාගයක් වේද, එය සිත පිළිබඳ කිලුටුවීමයි.

## 6. සඤ්ඤා සූත්‍රය.

1. (මේ සූත්‍රයේ 1, 3 වෙනි ඡේද කිලෙස සංයුත්තයේ 1 චක්ඛු සූත්‍රයේ මෙනි.)

2. "මහණෙනි, රූප සඤ්ඤාවෙහි යම් ඡන්දරාගයක් වේද එය සිතේ කිලුටුවීමයි. සද්ද සඤ්ඤාවෙහි යම් ඡන්දරාගයක් වේද, එය කණෙහි කිලුටුවීමයි. ගන්ධ සඤ්ඤාවෙහි යම් ඡන්දරාගයක් වේද, එය නාසයේ කිලුටුවීමයි. රස සඤ්ඤාවෙහි යම් ඡන්දරාගයක් වේද, එය දිවෙහි කිලුටුවීමයි. ඵොට්ඨබ්බ සඤ්ඤාවෙහි යම් ඡන්දරාගයක් වේද, එය කයෙහි කිලුටුවීමයි. ධම්ම සඤ්ඤාවෙහි යම් ඡන්දරාගයක් වේද, එය සිතේ කිලුටුවීමයි.

## 7. චේතනා සූත්‍රය

1. (මේ සූත්‍රයේ 1, 3 වෙනි ඡේද කිලෙස සංයුත්තයේ 1 චක්ඛු සූත්‍රයේ මෙනි)

2. "මහණෙනි, රූප සංචේතනාවෙහි යම් ඡන්දරාගයක් වේද, එය සිතේ කිලුටුවීමයි. සද්ද සංචේතනාවෙහි යම් ඡන්දරාගයක් වේද, එය කණෙහි කිලුටු වීමයි. ගන්ධ සංචේතනාවෙහි යම් ඡන්දරාගයක් වේද, එය නාසයෙහි කිලුටුවීමයි. රස සංචේතනාවෙහි යම් ඡන්දරාගයක් වේද, එය දිවෙහි කිලුටු වීමයි. ඵොට්ඨබ්බ සංචේතනාවෙහි යම් ඡන්දරාගයක් වේද, එය කයෙහි කිලුටු වීමයි. ධර්ම සංචේතනාවෙහි යම් ඡන්දරාගයක් වේද, එය සිතේ කිලුටුවීමයි.

## 8. තණ්හා සූත්‍රය

1. (මේ සූත්‍රයේ 1, 3 වෙනි ඡේද කිලෙස සංයුත්තයේ 1 චක්ඛු සූත්‍රයේ මෙනි.)

2. "මහණෙනි, රූපතණ්හාවෙහි යම් ඡන්දරාගයක් වේද එය සිතේ කිලුටුවීමයි. සද්ද තණ්හාවෙහි යම් ඡන්දරාගයක්වේද,

එය කණෙහි කිලුටු වීමයි. ගන්ධ තණ්හාවෙහි යම් ඡන්ද රාගයක් වේද, එය නාසයෙහි කිලුටුවීමයි. රස තණ්හාවෙහි යම් ඡන්දරාගයක් වේද, එය දිවෙහි කිලුටුවීමයි. ඵොට්ඨබ්බ තණ්හාවෙහි යම් ඡන්දරාගයක් වේද, එය කයෙහි කිලුටු වීමයි ධම්ම තණ්හාවෙහි යම් ඡන්දරාගයක් වේද, එය සිතේ කිලුටු වීමයි.

## 9. ධාතු සූත්‍රය.

1. (මේ සූත්‍රයේ 1, 3 වෙනි ඡේද කිලෙස සංයුත්තයේ 1 චක්ඛු සූත්‍රයේ මෙනි.)

2. "මහණෙනි, පඨවිධාතුවෙහි යම් ඡන්දරාගයක් වේද, එය සිතේ කිලුටුවීමයි. ආපෝ ධාතුවෙහි යම් ඡන්දරාගයක් වේද, එය කණෙහි කිලුටුවීමයි. තේජෝ ධාතුවෙහි යම් ඡන්දරාගයක් වේද, එය නාසයෙහි කිලුටු වීමයි. වායෝ ධාතුවෙහි යම් ඡන්දරාගයක් වේද, එය දිවෙහි කිලුටු වීමයි. ආකාශ ධාතුවෙහි යම් ඡන්දරාගයක් වේද, එය කයෙහි කිලුටු වීමයි. විඤ්ඤාණ ධාතුවෙහි යම් ඡන්දරාගයක් වේද, එය සිතේ කිලුටු වීමයි.

## 10. ඛන්ධ සූත්‍රය.

1. (මේ සූත්‍රයේ 1, 3 වෙනි ඡේද කිලෙස සංයුත්තයේ 1 චක්ඛු සූත්‍රයේ මෙනි.)

2. "මහණෙනි, රූපස්කන්ධයෙහි යම් ඡන්දරාගයක් වේද, එය සිතේ කිලුටු වීමයි. වේදනාවෙහි යම් ඡන්දරාගයක් වේද, එය කණෙහි කිලුටු වීමයි. සඤ්ඤාවෙහි යම් ඡන්දරාගයක් වේද, එය නාසයෙහි කිලුටු වීමයි. සංස්කාරයන්හි යම් ඡන්දරාගයක් වේද, එය දිවෙහි කිලුටු වීමයි. විඤ්ඤාණයෙහි යම් ඡන්දරාගයක් වේද, එය සිතේ කිලුටුවීමයි.

චක්ඛු සූත්‍රය රූප සූත්‍රය, විඤ්ඤාණ සූත්‍රය, ඵස්ස සූත්‍රය, වේදනා සූත්‍රය සඤ්ඤා සූත්‍රය, චේතනා සූත්‍රය, තණ්හා සූත්‍රය, ධාතු සූත්‍රය සහ ඛන්ධ සූත්‍රය දැයි සූත්‍ර දසයකි.

**(කිලෙස සංයුත්තය නිමි.)**

---

# 7. ශාරීපුත්ත සංයුත්තය.

## 1. විවෙකජ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සැවැත්නුවරට නුදුරෙහිවූ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ උදය කාලයෙහි හැඳපොරවා පාත්‍ර සිවුරුගෙන සැවැත්නුවරට පිඬු පිණිස පැමිණියහ. සැවැත්නුවර පිඬු පිණිස හැසිර බතින් පසු පිණ්ඩපාතයෙන් හැරී එන්නේ අන්ධවනය යම් තැනකද එතැන්හි දවල් කාලය ගෙවීම පිණිස පැමිණියහ. අන්ධවනයට පැමිණ එක්තරා ගසක් මුල හුන්නේය. එකල්හි වනාහි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සවස් කාලයෙහි විවේකයෙන් නැගී සිටියේ ජේතවන නම්වූ අනේපිඬු සිටුහුගේ ආරාමය යම් තැනකද එතැන්හි පැමිණියහ.

2. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් දුරදීම දැක්කේය. දැක, ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට මෙසේ කීය. "ඇවැත් ශාරිපුත්‍ර ස්ථවිරයෙනි, ඔබවහන්සේගේ ඉන්ද්‍රියයෝ ප්‍රසන්නයහ. මුහුණු වර්ණය පිරිසිදුය. අතිශයින්ම පිරිසිදුය. ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ අද කවර විහරණයකින් වාසය කළ සේක්ද?" යනුයි.

3. ඇවැත්නි, මම මෙහි කාමයන්ගෙන් වෙන්ව අකුසල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරමි. ඇවැත්නි, ඒ මට 'මම ප්‍රථම ධ්‍යානයට සමවදිමියි, කියා හෝ, මම ප්‍රථම ධ්‍යානයට පැමිණියෙමි කියා හෝ, මම ප්‍රථම ධ්‍යානයෙන් නැගී සිටියෙමි කියා හෝ' මෙබඳු සිතක් නොවේ"යයි කීහ.

4. "ඒ එසේමය, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් විසින් බොහෝ කාලයක් මුළුල්ලෙහි 'මම යන හැඟීම. මගේය යන හැඟීම' මානය, හා අනුසය ධර්ම මැනවින් නසනලදහ. එබැවින්

ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට 'මම ප්‍රථමධ්‍යානයට සමවදිමියි කියා, හෝ මම ප්‍රථම ධ්‍යානයට සමවැදුණේය කියා හෝ 'මම ප්‍රථමධ්‍යානයෙන් නැඟීසිටියෙමියි' කියා හෝ මෙබඳු සිතක් නොවේ"යයි (ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම කීය.)

## 2. අවිතක්ක සූත්‍රය

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡේද මේ සංයුත්තයේ 1 වෙනි සූත්‍රයේ මෙනි.)

3. "ඇවැත්නි, මෙහි මම විතර්ක විචාරයන් සන්සිඳීමෙන් ඇතුළත පැහැදීම ඇති සිතේ එකඟබව ඇති විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කරමි.

"ඇවැත්නි, ඒ මට මම ද්විතීයධ්‍යානයට සම වදිමියි කියා හෝ මම ද්විතීයධ්‍යානයට සමවැදුනෙමි කියා හෝ මම ද්විතීයධ්‍යානයෙන් නැගීසිටියෙමියි කියා හෝ' මෙබඳු සිතක් නොවේයයි කීහ.

4. "ඒ එසේමය. ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් විසින් බොහෝ කාලයක් මුළුල්ලේ "මම යන හැඟීම, මගේ යන හැඟීම,' මානය හා අනුසය ධර්ම සම්පූර්ණ වශයෙන් නසන ලදහ. එම නිසා ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට 'මම ද්විතීය ධ්‍යානයට සමවදිමියි' කියා හෝ 'මම ද්විතීයධ්‍යානයට සමවැදුනෙමි' කියා හෝ 'මම ද්විතීයධ්‍යානයෙන් නැඟීසිටියෙමි' කියා හෝ මෙබඳු සිතක් නොවේයයි" (ආනන්ද ස්ථවිරතෙම කීය.)

## 3. පීති සූත්‍රය.

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡේද මේ සංයුත්තයේ 1 වෙනි සූත්‍රයේ මෙනි.)

3. "ඇවැත්නි, මම මෙහි ප්‍රීතියේද නොඇල්මෙන් සිහි ඇත්තේ, මනා නුවණැත්තේව උපෙක්ෂාවෙන් යුක්තව වාසය කරමි. කයින් සැපයද විඳිමි. ආර්යයෝ යමෙකුට උපෙක්ෂා ඇත්තේ සිහි

ඇත්තේ සැපවිහරණ ඇත්තේයයි කියත්ද ඒ තෘතීයධ්‍යානයට' පැමිණ වාසය කරමි.

'ඇවැත්නි, ඒ මට මම තෘතීයධ්‍යානයට සමවදිමියි කියා හෝ මම තෘතීයධ්‍යානයට සම වැදුනෙමි කියා හෝ මම තෘතීය ධ්‍යානයෙන් නැගීසිටියෙමි කියා හෝ' මෙබඳු සිතක් නොවේ යයි කීහ.

4. "ඒ එසේමය. ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් විසින් බොහෝ කාලයක් මුළුල්ලෙහි මම යන හැඟීම, මගේ යන හැඟීම,' මානය හා අනුසය ධර්ම සම්පූර්ණ වශයෙන් නසන ලදහ. එම නිසා ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට 'මම තෘතීය ධ්‍යානයට සමවදිමියි' කියා හෝ 'මම තෘතීයධ්‍යානයට සමවැදුණෙමි' කියා හෝ 'මම තෘතීයධ්‍යානයෙන් නැගීසිටියෙමි' කියා හෝ මෙබඳු සිතක් නොවේයයි" (ආනන්ද ස්ථවිරතෙම කීය.)

## 4. උපෙක්ඛා සූත්‍රය.

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡේද මේ සංයුත්තයේ 1 වෙනි සූත්‍රයේ මෙනි)

3. "ඇවැත්නි, මම මෙහි සැපයද දුරුකිරීමෙන් දුකද දුරුකිරීමෙන් පළමු කොටම සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැතිකිරීමෙන් දුක් රහිත සැප රහිත උපෙක්ෂා ස්මෘතියෙන් පිරිසිදු වූ සතරවැනි ධ්‍යානයට පැමිණ වාසය කරමි.

'ඇවැත්නි, ඒ මට මම සතරවෙනිධ්‍යානයට සම වදිමියි කියා හෝ මම සතරවෙනිධ්‍යානයට සම වැදුනෙමි කියා හෝ මම සතරවෙනිධ්‍යානයෙන් නැගීසිටියෙමියි කියා හෝ' මෙබඳු සිතක් නොවේයයි කීහ.

4. "ඒ එසේමය ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් විසින් බොහෝ කාලයක් මුළුල්ලෙහි 'මම යන හැඟීම, මගේ යන හැඟීම,' මානය හා අනුසය ධර්ම සම්පූර්ණ වශයෙන් නසන ලදහ. එම නිසා ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට 'මම සතරවෙනිධ්‍යානයට සමවදිමියි' කියා හෝ 'මම සතරවෙනි ධ්‍යානයට සමවැදුණෙමි'

කියා හෝ 'මම සතරවෙනිධ්‍යානයෙන් නැඟී සිටියෙමි' කියා හෝ මෙබඳු සිතක් නොවේයයි' (ආනන්ද ස්ථවිරතෙමේ කීය.)

## 5. ආකාසානඤ්චායතන සූත්‍රය.

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡේද මේ සංයුත්තයේ 1 වෙනි සූත්‍රයේ මෙනි)

3. "ඇවැත්නි, මෙහි මම සියලු ආකාරයෙන් රූප සඤ්ඤාවන්ගේ දුරුකිරීමෙන් හැඟීම් ස්වභාවය ඇති රූප සඤ්ඤාවන්ගේ බැහැරකිරීමෙන්, නානත්ත සඤ්ඤාවන්ගේ මෙනෙහි නොකිරීමෙන් ආකාශය අනන්තයයි ආකාසානඤ්චායතනයට පැමිණ වාසය කරමි.

"ඇවැත්නි, ඒ මට මම ආකාසානඤ්චායතන ධ්‍යානයට සම වදිමියි කියා හෝ මම ආකාසානඤ්චායතන ධ්‍යානයට සම වැදුනෙමි කියා හෝ මම ආකාසානඤ්චායතනධ්‍යානයෙන් නැගීසිටියෙමියි කියා හෝ මෙබඳු සිතක් නොවේයයි කීහ.

4. "ඒ එසේමය. ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් විසින් බොහෝ කාලයක් මුළුල්ලේ 'මම යන හැඟීම, මගේ යන හැඟීම,' මානය හා අනුසය ධර්මයෝ සම්පූර්ණ වශයෙන් නසන ලදහ. එම නිසා ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට 'මම ආකාශානඤ්චායතනයට සමවදිමියි' කියා හෝ මම ආකාශානඤ්චායතනයට සමවැදුනෙමි' කියා හෝ මම ආකාශානඤ්චායතනයෙන් නැගී සිටියෙමි' කියා හෝ මෙබඳු සිතක් නොවේයයි" (ආනන්ද ස්ථවිර තෙම කීය.)

## 6. විඤ්ඤාණඤ්චායතන සූත්‍රය.

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡේද මේ සංයුත්තයේ 1 වෙනි සූත්‍රයේ මෙනි.)

3. ඇවැත්නි, මම මෙහි සියළු ආකාරයෙන් ආකාසානඤ්චායතනය දුරුකොට විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය කරමි."

"ඇවැත්නි, ඒ මට මේ විඤ්ඤාණඤ්චායතනයට සමවදිමියි කියා හෝ මම විඤ්ඤාණඤ්චායතනයට සමවැදුනෙමි කියා හෝ මම විඤ්ඤාණඤ්චායතනයෙන් නැගී සිටියෙමියි කියා හෝ' මෙබඳු සිතක් නොවේයයි කීහ."

4. "ඒ එසේමය. ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් විසින් බොහෝ කාලයක් මුළුල්ලේ "මම යන හැඟීම, මගේ යන හැඟීම,' මානය හා අනුසය ධර්මයෝ සම්පූර්ණ වශයෙන් නසන ලදහ. එම නිසා ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට 'මම විඤ්ඤාණඤ්චායතනයට සමවදිමියි' කියා හෝ 'මම විඤ්ඤාණඤ්චායතනයට සමවැදුනෙමි' කියා හෝ 'මම විඤ්ඤාණඤ්චායතනයෙන් නැගී සිටියෙමි' කියා හෝ මෙබඳු සිතක් නොවේයයි" (ආනන්ද ස්ථවිරතෙම කීය.)

## 7. ආකිඤ්චඤ්ඤායතන සූත්‍රය.

(මේ සූත්‍රයේ 1, 2 වෙනි මේ සංයුත්තයේ 1 වෙනි සූත්‍රයේ මෙනි.)

3. "ඇවැත්නි, මම මෙහි සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරමියි."

"ඇවැත්නි, ඒ මට 'මම ආකිඤ්චඤ්ඤායතනයට සමවදිමියි කියා හෝ මම ආකිඤ්චඤ්ඤායතනයට සමවැදුනෙමි කියා හෝ, මම අකිඤ්චාඤ්ඤායතනයයෙන් නැගී සිටියෙමියි කියා හෝ, මෙබඳු සිතක්නොවේයයි' කීහ.

4. "ඒ එසේමය, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් විසින් බොහෝ කාලයක් මුළුල්ලෙහි 'මම යන හැඟීම, මගේ යන හැඟීම' මානය හා අනුශය ධර්ම සම්පූර්ණ වශයෙන් නසන ලදහ. එමනිසා ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට 'මම ආකිඤ්චඤ්ඤායතනයට සම වදිමියි' කියා හෝ "මම ආකිඤ්චඤ්ඤායතනයට සමවැදුණෙමියි' කියා හෝ 'මම ආකිඤ්චඤ්ඤායතනයෙන් නැගී සිටියෙමි, කියා හෝ මෙබඳු සිතක් නොවේයයි" (ආනන්ද ස්ථවිරතෙමකීය.)

## 8. නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සූත්‍රය.

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡේද මේ සංයුත්තයේ 1 වෙනි සූත්‍රයේ මෙනි.)

3. "ඇවැත්නි, මම මෙහි ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කරමි.

ඇවැත්නි, ඒ මට 'මම නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවදිමියි කියා හෝ මම නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සම වැදුනෙමි කියා හෝ, මම නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයෙන් නැඟී සිටියෙමියි කියා හෝ, මෙබඳුසිතක් නොවේයයි' කීහ.

4. "ඒ එසේමය, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් විසින් බොහෝ කාලයක් මුළුල්ලෙහි 'මම යන හැඟීම, මගේ යන හැඟීම' මානය හා අනුසය ධර්මයෝ සම්පූර්ණ වශයෙන් නසන ලදහ. එම නිසා ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට 'මම නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයට සමවදිමියි' කියා හෝ, 'මම නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයට සම වැදුනෙමි' කියා හෝ, 'මම නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙන් නැඟී සිටියෙමි' කියා හෝ මෙබඳු සිතක් නොවේයයි" (ආනන්ද ස්ථවිරතෙමකීය.)

## 9. නිරොධ සූත්‍රය.

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡෙද මේ සංයුත්තයේ 1 වෙනි සූත්‍රයේ මෙනි.)

3. "ඇවැත්නි, මම මෙහි සියලු ආකාරයෙන් නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයන් ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරෝධ සමාපත්තියට පැමිණ වාසය කරමි. මහණෙනි, ඒ මට 'මම සඤ්ඤාවෙදයිත නිරෝධ සමවතට සමවදිමියි කියා හෝ, මම සඤ්ඤාවෙදයිත නිරොධ සමවතට පැමිණියෙමි කියා හෝ, මම සඤ්ඤාවෙදයිත සමවතින් නැගී සිටිමි කියා හෝ මෙබඳු සිතක් නොවේයයි" කීහ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. "ඒ එසේමය, ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් විසින් දීර්ඝ කාලයක් මුළුල්ලෙහි මමය. මාගේයයි ගන්නා දෘෂ්ටි මාන අනුශය ධර්මයෝ මනාකොට නසන ලදහ. එබැවින් ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට 'මම සඤ්ඤාවෙදයිත නිරොධයට සමවදිමියි කියා හෝ, මම සඤ්ඤාදයිත නිරොධයට සමවැදුණෙමියි කියා හෝ, මම සඤ්ඤාවෙදයිත නිරෝධයෙන් නැඟී සිටියෙමියි කියා හෝ මෙබඳු සිතක් නොවේයයි" (ආනන්ද ස්ථවිරතෙම කීය.)

## 10. සුචිමුඛී සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාප නම්වූ වේළුවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි වනාහි ආයුෂ්මත් සැරියුත් තෙරුන්වහන්සේ උදය කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන රජගහ නුවරට පිඬු පිණිස පැමිණියහ. රජගහනුවර ගෙපිළිවලින් පිඬු පිණිස හැසිර ඒ පිණ්ඩපාතය එක්තරා බිත්ති අද්දරක හිඳ වළඳති.

2. එකල්හි වනාහි සුචිමුඛී නම් පරිබ්‍රාජිකාවක් ආයුෂ්මත් සැරියුත් තෙරුන් යම් තැනකද එතැනට පැමිණියාය. පැමිණ ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට මේ කාරණය කීය. 'ශ්‍රමණය කුමක් නිසා බිම බලාගෙන අනුභව කරන්නෙහිද?"

"නැගනියෙනි, මම බිම බලාගෙන නොවළඳමි."

"එසේනම් ශ්‍රමණය, උඩ බලාගෙන වළඳන්නෙහිද?"

"නැගනියනි, මම උඩ බලාගෙන නොවළඳමි."

"එසේ නම් ශ්‍රමණය, සතර දිශාවන් බලමින් වළඳන්නෙහිද?"

"නැගනියනි, මම සතර දිශාවන් බලමින් නොවළඳමි"

"එසේ නම් ශ්‍රමණය, අනු දිශාවන් බලමින් වළඳන්නෙහිද?"

"නැගනියනි, මම අනු දිශාවන් බලමින් නොවළඳමි."

3. "කිමෙක්ද ශ්‍රමණය, බිම බලාගෙන වළඳන්නෙහිදැයි අසන ලද්දේ, 'නැගනියනි, මම බිම බලාගෙන නොවළඳමි'යි කීයෙහිය.

එසේනම් ශ්‍රමණය, උඩ බලාගෙන වළඳහි දැයි අසන ලද්දේ, ‘නැගනියනි, මම උඩ බලාගෙන නොවළඳමි’යි කීයෙහිය. ‘එසේනම් ශ්‍රමණය, සතර දිශාවන් බලමින් වළඳහි දැයි අසන ලද්දේ, ‘නැගනියනි, මම සතර දිශාවන් බලමින් නොවළඳමි’යි කීයෙහිය කිමෙක්ද ශ්‍රමණය, අනු දිශාවන් බලමින් වළඳහිදැයි විචාරන ලද්දෙමි, “මම අනුදිශාවන් බලමින් නොවළඳමියි’ කීයෙහිය. ශ්‍රමණය, කෙසේ අනුභව කරහිදැයි ඇසුවාය.”

**4.** “නැගනියනි, යම්කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ වාස්තු විද්‍යාවයයි (පොළොවෙහි හොඳ නරක කියන ශාස්ත්‍රය) කියන ලද තිරිසන් විද්‍යාවවූ වැරදි දිවි පැවැත්මෙන් ජීවිකාව කරත්ද, නැගනියනි, මේ මහණ බමුණෝ බිම බලාගෙන වළඳන්නෝ වෙත්. නැගනියෙනි, යම්කිසි මහණ බමුණු කෙනෙක් නක්ෂත්‍ර විද්‍යාවයි කියන ලද තිරිසන් විද්‍යාවවූ වැරදි දිවි පැවැත්මෙන් ජීවිකාව කරත්ද, ‘නැගනියනි, මේ මහණ බමුණෝ උඩ බලාගෙන කන්නෝ වෙත්’ ‘නැගනියනි යම්කිසි ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් පණිවිඩපනත් ගෙන යෑමයයි කියන ලද තිරිසන් විද්‍යාවවූ වැරදි දිවි පැවැත්මෙන් ජීවිකාව කරත්ද, නැගනියනි, මේ මහණ බමුණෝ සතර දිශාවන් බලමින් අනුභව කරත්.

“නැගනියනි, යම්කිසි මහණ බමුණු කෙනෙක් අංග ලක්ෂණ විද්‍යාවයයි කියන ලද තිරිසන් විද්‍යාවවූ වැරදි දිවි පැවැත්මෙන් ජීවිකාව කරත්ද, නැගනියනි, මේ මහණ බමුණෝ අනුදිශාවන් බලමින් අනුභව කරත්. ‘නැගනියෙනි, වාස්තු විද්‍යාවයයි කියන ලද තිරිසන් විද්‍යාවවූ වැරදි දිවි පැවැත්මෙන් ජීවිකාව නොකරමි. නක්ෂත්‍ර විද්‍යාවයයි කියන ලද වැරදි දිවි පැවැත්මෙන් ජීවිකාව නොකරමි. පණිවිඩ පණත් ගෙන යෑමයයි කියන ලද වැරදි දිවි පැවැත්මෙන් ජීවිකාව නොකරමි. අංගවිද්‍යාවයයි කියන ලද තිරිසන් විද්‍යාවූ වැරදි දිවි පැවැත්මෙන් ජීවිකාව නොකරමි. දැහැමින් භික්ෂාව සොයමි. දැහැමින් භික්ෂාව සොයා අනුභව කරමි” යනුයි.

**5.** ඉක්බිති සූචිමුඛී පරිබ්‍රාජිකාව රජගහනුවර වීථියෙන් වීථියට සතරමං සන්ධියෙන් සතරමං සන්ධියට ගොස් මෙසේ

දැන්වූවාය. "ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ දැහැමින් ආහාර වළඳත්. ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ නිවැරැදිව ආහාර වළඳත්. ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ට ආහාර දෙවු" යනුයි.

විවෙකජ සූත්‍රය, අවිතක්ක සූත්‍රය, පීති සූත්‍රය, උපෙක්ඛා සූත්‍රය, ආකාසානඤ්චායතන සූත්‍රය, විඤ්ඤාණඤ්චායතන සූත්‍රය, ආකිඤ්චඤ්ඤායතන සූත්‍රය, නෙවසඤ්ඤානාසඤ්ඤායතන සූත්‍රය, නිරොධ සූත්‍රය හා සුචිමුඛී සූත්‍රය දැයි මෙහි සූත්‍ර දසයකි.

(හත්වෙනි සාරිපුත්ත සංයුත්තය නිමි.)

---

# 8. නාග සංයුත්තය.

## 1. සුද්ධික සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, මේ නාගයෝනි සතරකි. කවර සතරක්ද යත්. අණ්ඩජ නාගයෝය. ජලාබුජ නාගයෝය සංසෙදජ නාගයෝය. ඕපපාතික නාගයෝය. මහණෙනි, මේ සතර නාග යෝනීහුය.

## 2. පණීත රත සූත්‍රය.

(1 වෙනි ඡෙදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ මෙනි.)

2. "මහණෙනි, මේ නාගයෝනි සතරකි. කවර සතරක්ද යත්. අණ්ඩජ නාගයෝය, ජලාබුජ නාගයෝය. සංසෙදජ නාගයෝය. ඕපපාතික නාගයෝය යනුයි මහණෙනි, එහි අණ්ඩජ නාගයන්ට වඩා ජලාබුජ - සංසේදජ - ඕපපාතික නාගයෝ අතිශයින් උතුම්ය. මහණෙනි, එහි අණ්ඩජ-ජලාබුජ නාගයනට වඩා සංසෙදජ-ඕපපාතික නාගයෝ අතිශයින් උතුම්ය. මහණෙනි,

එහි අණ්ඩජ-ජලාබුජ සංසෙදජ නයින්ට වඩා ඕපපාතික නාගයෝ අතිශයින් උතුම්ය. මහණෙනි, මේ සතර නාගයෝනීහුය.

## 3. උපොසථ සූත්‍රය (1)

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසක හුන්නේය. එකත්පසක හුන්නාවූ ඒ මහණතෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීයේය.

2. "ස්වාමීනි යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැම් අණ්ඩජ නාගයෝ පෙහෙවස් සමාදන් වෙත්ද, හරන ලද කය ඇත්තෝ වෙත්ද ඊට හේතු කවරේද? ප්‍රත්‍යය කවරේද?

3. "මහණ, මේ ලෝකයෙහි ඇතැම් අණ්ඩජ නාගයන්ට මෙබඳු සිතක් වෙයි.

'අපි වනාහි පෙර කයින් දෙයාකාර ක්‍රියා ඇත්තෝ වීමු වචනයෙන් දෙවැදෑරුම් ක්‍රියා ඇත්තෝ වීමු. සිතින් දෙවැදෑරුම් ක්‍රියා ඇත්තෝ වීමු. කයින් දෙවැදෑරුම් ක්‍රියා ඇත්තාවූ වචනයෙන් දෙවැදෑරුම් ක්‍රියා ඇත්තාවූ, සිතින් දෙවැදෑරුම් ක්‍රියා ඇත්තාවූ, ඒ අපි ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු අණ්ඩජ නාගයන්ගේ සහ බවට පැමිණියෝ වෙමු. ඉදින් දැන් අපි කයින් සුචරිතයෙහි හැසිරෙන්නෙමු නම් වචනයෙන් සුචරිතයෙහි හැසිරෙන්නෙමු නම් සිතින් සුචරිතයෙහි හැසිරෙන්නෙමු නම් මෙසේ අපි ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතියයි කියන ලද ස්වර්ග ලොකයෙහි උපදින්නෙමු. එහෙයින් දැන් අපි කයින් සුචරිතයෙහි හැසිරෙමු වචනයෙන් සුචරිතයෙහි හැසිරෙමු සිතින් සුචරිතයෙහි හැසිරෙමු' යනුයි. යම් හෙයකින් මේ ලොකයෙහි ඇතැම් අණ්ඩජ නාගයෝ පෙහෙවස් වෙසෙත්ද, හරනලද කය ඇත්තෝ වෙත්ද මහණ මේ එයට හේතුවයි. මේ ප්‍රත්‍යයි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 4. උපොසථ සූත්‍රය. (2)

(1 වෙනි ඡේදය මේ වර්ගයේ තුන්වෙනි සූත්‍රයේ මෙනි.)

2. "යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැම් ජලාබුජ නාගයෝ පෙහෙවස් වෙසෙත්ද, හරන ලද කය ඇත්තාහු වෙත්ද, ස්වාමීනි, මෙයට හේතු කවරේද? ප්‍රත්‍ය කවරේද?"

3. "මහණ, මේ ලෝකයෙහි ඇතැම් ජලාබුජ නාගයන්ට මෙබඳු සිතක් වෙයි.

'අපි වනාහි පෙර කයින් දෙයාකාර ක්‍රියා ඇත්තෝ වීමු වචනයෙන් දෙවැදෑරුම් ක්‍රියා ඇත්තෝ වීමු. සිතින් දෙවැදෑරුම් ක්‍රියා ඇත්තෝ වීමු. කයින් දෙවැදෑරුම් ක්‍රියා ඇත්තාවූ වචනයෙන් දෙවැදෑරුම් ක්‍රියා ඇත්තාවූ, සිතින් දෙවැදෑරුම් ක්‍රියා ඇත්තාවූ, ඒ අපි ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු ජලාබුජ නාගයන්ගේ සහබවට පැමිණියෝ වෙමු. ඉදින් දැන් අපි කයින් සුචරිතයෙහි හැසිරෙන්නෙමු නම් වචනයෙන් සුචරිතයෙහි හැසිරෙන්නෙමු නම් සිතින් සුචරිතයෙහි හැසිරෙන්නෙමු නම් මෙසේ අපි ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතියයි කියන ලද ස්වර්ග ලොකයෙහි උපදින්නෙමු. එහෙයින් දැන් අපි කයින් සුචරිතයෙහි හැසිරෙමු. වචනයෙන් සුචරිතයෙහි හැසිරෙමු. සිතින් සුචරිතයෙහි හැසිරෙමු' යනුයි. යම් හෙයකින් මේ ලොකයෙහි ඇතැම් ජලාබුජ නාගයෝ පෙහෙවස් වෙසෙත්ද, හරන ලද කය ඇත්තෝ වෙත්ද, මහණ මේ එයට හේතුවයි. මේ ප්‍රත්‍යයයි."

## 5. උපොසථ සූත්‍රය. (3)

(1 වෙනි ඡේදය මේ වර්ගයේ තුන්වෙනි සූත්‍රයේ මෙනි.)

2. "යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැම් සංසෙදජ නාගයෝ පෙහෙවස් වෙසෙත්ද, හරන ලද කය ඇත්තෝ වෙත්ද, මෙයට හේතුව කවරේද? මෙයට ප්‍රත්‍යය කවරේද?"

3. "මහණ, මේ ලෝකයෙහි ඇතැම් සංසෙදජ නාගයන්ට මෙබඳු සිතක් වෙයි.

'අපි වනාහි පෙර කයින් දෙයාකාර ක්‍රියා ඇත්තෝ වීමු. වචනයෙන් දෙවැදෑරුම් ක්‍රියා ඇත්තෝ වීමු. සිතින් දෙවැදෑරුම් ක්‍රියා ඇත්තෝ වීමු. කයින් දෙවැදෑරුම් ක්‍රියා ඇත්තාවූ වචනයෙන් දෙවැදෑරුම් ක්‍රියා ඇත්තාවූ ඒ අපි ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු සංසෙදජ නාගයන්ගේ සහබවට පැමිණියෝ වෙමු. ඉදින් දැන් අපි කයින් සුචරිතයෙහි හැසිරෙන්නෙමු නම් වචනයෙන් සුචරිතයෙහි හැසිරෙන්නෙමු නම් සිතින් සුචරිතයෙහි හැසිරෙන්නෙමු නම් මෙසේ අපි ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතියයි කියන ලද ස්වර්ග ලොකයෙහි උපදින්නෙමු. එහෙයින් දැන් අපි කයින් සුචරිතයෙහි හැසිරෙමු. වචනයෙන් සුචරිතයෙහි හැසිරෙමු. සිතින් සුචරිතයෙහි හැසිරෙමු' යනුයි. යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැම් සංසෙදජ නාගයෝ පෙහෙවස් වෙසෙත්ද හරන ලද කය ඇත්තෝ වෙත්ද, මහණ, මේ එයට හේතුවයි, මේ ප්‍රත්‍යයයි."

## 6. උපොසථ සූත්‍රය (4)

(1 වෙනි ඡේදය මේ වර්ගයේ තුන්වෙනි සූත්‍රයේ මෙනි.)

2. "යම් හෙයකින් මේ ලෝකයෙහි ඕපපාතිකව නාගයෝ පෙහෙවස් වෙසෙත්ද, හරන ලද ශරීර ඇත්තෝ වෙත්ද, එයට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

3. "මහණ, මේ ලෝකයෙහි ඇතැම් ඕපපාතික නාගයන්ට මෙබඳු සිතක් වෙයි. 'අපි වනාහි පෙර කයින් දෙපරිද්දකින් ක්‍රියා කරන්නෝ වීමු. වචනයෙන් දෙපරිද්දකින් ක්‍රියාකරන්නෝ වීමු. සිතින් දෙපරිද්දකින් ක්‍රියා කරන්නෝ වීමු. ඒ අපි කයින් දෙපරිද්දකින් ක්‍රියා කරන්නාහු වචනයෙන් දෙපරිද්දකින් ක්‍රියා කරන්නාහු සිතින් දෙපරිද්දකින් ක්‍රියාකරන්නාහු ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු ඕපපාතික නාගයන්ගේ සහබවට පැමිණියෝ වෙමු. ඉදින් දැන් අපි කයින් සුචරිතයෙහි හැසිරෙන්නෙමු නම් වචනයෙන් සුචරිතයෙහි හැසිරෙන්නෙමු නම් සිතින් සුචරිතයෙහි හැසිරෙන්නෙමු නම් මෙසේ අපි ශරීරයාගේ බිඳීමෙන් මරණින් සුගතියයි කියන ලද ස්වර්ග

ලෝකයෙහි උපදින්නෙමු. එහෙයින් දැන් අපි කයින් සුචරිතයෙහි හැසිරෙමු. වචනයෙන් සුචරිතයෙහි හැසිරෙමු. සිතින් සුචරිතයෙහි හැසිරෙමු' යනුයි. මහණ, යම් හෙයකින් මේ ලොකයෙහි ඇතැම් ඕපපාතික නාගයෝ පෙහෙවස් වෙසෙත්ද හරන ලද කය ඇත්තෝ වෙත්ද මේ එයට හේතුවයි. මේ එයට ප්‍රත්‍යයයි."

## 7. ද්වයකාරී සූත්‍රය. (1)

(1 වෙනි ඡේදය මේ වර්ගයේ තුන්වෙනි සූත්‍රය මෙනි)

2. "යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැමෙක් ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු අණ්ඩජ නාගයන්ගේ සහබවට පැමිණෙයිද ස්වාමීනි, මෙයට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

3. "මහණ, මේ ලෝකයෙහි ඇතැමෙක් කයින් දෙපරිද්දකින් ක්‍රියා කරන්නේ වෙයිද, වචනයෙන් දෙපරිද්දකින් ක්‍රියා කරන්නේ වෙයිද, සිතින් දෙපරිද්දකින් ක්‍රියා කරන්නේ වෙයිද, ඔහු විසින් අණ්ඩජ නාගයෝ දීර්ඝායුෂ ඇත්තාහ. වර්ණවත්ය. සැප බහුලකොට ඇත්තාහයි අසන ලද්දේ වෙයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි. 'මම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු අණ්ඩජ නාගයන්ගේ සහබවට පැමිණෙන්නෙම් නම් යහපති' කියායි. හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු අණ්ඩජ නාගයන්ගේ සහබවට පැමිණෙයි.

"මහණ, යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැමෙක් ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු අණ්ඩජ නාගයන්ගේ සහබවට පැමිණේද, මේ එයට හේතුවයි. මේ ප්‍රත්‍යයයි."

## 8. ද්වයකාරී සූත්‍රය. (2)

(1 වෙනි ඡේදය මේ වර්ගයේ තුන්වෙනි සූත්‍රය මෙනි.)

2. "යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැමෙක් ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු ජලාබුජ නාගයන්ගේ සහබවට පැමිණේද, ස්වාමීනි, එයට හේතුව කවරේද? එයට ප්‍රත්‍යය කවරේද?"

3. "මහණ, මේ ලෝකයෙහි ඇතැමෙක් කයින් දෙපරිද්දකින් ක්‍රියා කරන්නේ වෙයිද, වචනයෙන් දෙපරිද්දකින් ක්‍රියාකරන්නේ වෙයිද, සිතින් දෙපරිද්දකින් ක්‍රියා කරන්නේ වෙයිද, ඔහු විසින් ජලාබුජ නාගයෝ දීර්ඝායුෂ ඇත්තාහ වර්ණවත්ය. සැප බහුලකොට ඇත්තාහයි අසන ලද්දේ වෙයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි 'මම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු ජලාබුජ නාගයන්ගේ සහබවට පැමිණෙන්නෙම් නම් යහපති' කියායි. හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු ජලාබුජ නාගයන්ගේ සහබවට පැමිණෙයි.

"මහණ, යම් හෙයකින් මේ සස්නෙහි ඇතැමෙක් ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු ජලාබුජ නාගයන්ගේ සහබවට පැමිණේද, මේ එයට හේතුවයි මේ එයට ප්‍රත්‍යයයි."

## 9. ද්වයකාරී සූත්‍රය. (3)

(1 වෙනි ඡේදය මේ වර්ගයේ තුන්වෙනි සූත්‍රය මෙනි.)

2. "යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැමෙක් ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු සංසෙදජ නාගයන්ගේ සහ බවට පැමිණේද, ස්වාමීනි, එයට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

3. "මහණ, මේ ලෝකයෙහි ඇතැමෙක් කයින් දෙපරිද්දෙකින් ක්‍රියා කරන්නේ වේද, වචනයෙන් දෙපරිද්දකින් ක්‍රියා කරන්නේ වේද, සිතින් දෙපරිද්දකින් ක්‍රියා කරන්නේ වේද, ඔහු විසින් සංසෙදජ නාගයෝ දීර්ඝායුෂ ඇත්තාහ. වර්ණවත්ය. සැප බහුලකොට ඇත්තාහයි අසන ලද්දේ වෙයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි. 'මම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු සංසෙදජ නාගයන්ගේ සහබවට පැමිණෙන්නෙම් නම් යහපති' කියායි. හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු සංසෙදජ නාගයන්ගේ සහබවට පැමිණෙයි.

"මහණ යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැමෙක් ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු සංසෙදජ නාගයන්ගේ සහබවට පැමිණේද, මහණ, මේ එයට හේතුවයි. මේ එයට ප්‍රත්‍යයයි."

## 10. ද්වයකාරී සූත්‍රය (4)

(1 වෙනි ඡේදය මේ වර්ගයේ තුන්වෙනි සූත්‍රය මෙනි.)

2. "ස්වාමීනි, යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැමෙක් ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු ඕපපාතික නාගයන්ගේ සහබවට (එක්වීමට) පැමිණෙයිද, එයට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

3. "මහණ, මේ ලෝකයෙහි ඇතැමෙක් දෙපරිද්දකින් ක්‍රියා කරන්නේ වෙයිද, වචනයෙන් දෙපරිද්දකින් ක්‍රියා කරන්නේ වෙයිද, සිතින් දෙපරිද්දකින් ක්‍රියා කරන්නේ වෙයිද, ඕපපාතික නාගයෝ බොහෝ ආයුෂ ඇත්තාහ. වර්ණවත්ය. සැප බහුලකොට ඇත්තාහයි ඔහු විසින් අසන ලද්දේ වෙයිද, ඔහුට මෙබඳු සිතක් වෙයි. 'මම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු ඕපපාතික නාගයන්ගේ එක්වීමට පැමිණෙන්නෙම් නම් යහපති' කියායි. හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු ඕපපාතික නාගයන්ගේ එක්වීමට පැමිණෙයි.

යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැමෙක් ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු ඕපපාතික නාගයන්ගේ එක්වීමට පැමිණේද මහණ, මේ වනාහි ඊට හේතුවයි. මේ වනාහි ඊට ප්‍රත්‍යයයි."

## 11. අන්නදායක සූත්‍රය.

(1 වෙනි ඡේදය මේ වර්ගයේ තුන්වෙනි සූත්‍රයේ මෙනි.)

2. "යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැමෙක් ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු අණ්ඩජ නාගයන්ගේ එක්වීමට පැමිණෙයිද, ස්වාමීනි, ඊට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

3. "මහණ, මේ ලෝකයෙහි ඇතැමෙක් කයින් දෙපරිද්දකින් ක්‍රියා කරන්නේ වෙයිද, වචනයෙන් දෙපරිද්දකින් ක්‍රියා කරන්නේ වෙයිද, සිතින් දෙපරිද්දකින් ක්‍රියා කරන්නේ වෙයිද, අණ්ඩජ නාගයෝ බොහෝ ආයුෂ ඇත්තාහ. වර්ණවත්ය. සැප බහුලකොට ඇත්තාහයි ඔහු විසින් අසනලද්දේ වෙයිද, ඕහට

මෙබඳු සිතක් වෙයි. ‘මම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු අණ්ඩජ නාගයන්ගේ එක්වීමට පැමිණෙන්නෙම් නම් යහපති’ කියායි ‘හෙතෙම ආහාර දෙයි’ හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු අණ්ඩජ නාගයන්ගේ එක්වීමට පැමිණෙයි. මහණ, මේ ඊට හේතුවයි. මේ ප්‍රත්‍යයයි.”

(මේ වර්ගයේ 11 වෙනි සූත්‍රයේ “හෙතෙම ආහාර දෙයි” යන වචන වෙනුවට මෙහි පහත දක්වන වචන 12 වෙනි සූත්‍රයේ පටන් 20 සූත්‍රය දක්වා යොදාගත යුතුයි.)

12 හෙතෙම පානයකළයුතු දේ දෙයි - පානදායක සූත්‍රය.

12 ,, වස්ත්‍ර දෙයි. - වත්ථදායක ,,

14 ,, යානාවන් දෙයි. - යාන ,, ,,

15 ,, මාලාවන් ,, - මාලා ,, ,,

16 ,, සුවඳ ,, - ගන්ධ ,, ,,

17 ,, විලවුන් ,, - විලෙපනදායක ,,

18 ,, සයනයන් ,, - සෙය්‍යදායකසූත්‍රය

19 ,, ආවාස ,, - ආවසථ ,, ,,

20 ,, පහන් ,, - පදීපෙය්‍යදායක ,,

21 11 වෙනි සූත්‍රයේ “අණ්ඩ ජනාගයින්” වෙනුවට “ජලබුජ නාගයන්” කියා 21 වෙනි සූත්‍රය යොදා ගත යුතුයි.

- අන්නදායක ජලාබුජ සූත්‍රය.

22 හෙතෙම පානය කළයුතු දේ දෙයි. - පානදායකජලාබුජ සූත්‍රය

23 ,, වස්ත්‍ර ,, - වත්ථදායක සූත්‍රය

24 ,, යානාවන් ,, - යාන ,, ,,

25 ,, මාලාවන් ,, - මාලා ,, ,,

26 ,, සුවඳ ,, - ගන්ධ ,, ,,

27 ,, විලවුන් ,, - විලෙපනදායක ,,

28 ,, සයනයන් ,, - සෙය්‍යදායක ,,

29 ,, ආවාස ,, - ආවසථ ,, ,,

30 ,, පහන් ,, - පදීපෙය්‍යදායක ,,

31 11 වෙනි සූත්‍රයේ "අණ්ඩජ නාගයින්" වෙනුවට "සංසෙදජ නාගයන්" කියා 31 වෙනි සූත්‍රය යොදාගත යුතුයි.

32 හෙතෙම පානය කළයුතු දේ දෙයි. - පානදායක සංසෙදජ සූත්‍රය

33 ,, වස්ත්‍ර ,, - වත්ථ දායක සූත්‍රය

34 ,, යානාවන් ,, - යානා ,, ,,

35 ,, මාලාවන් ,, - මාලා ,, ,,

36 ,, සුවඳ ,, - ගන්ධ ,, ,,

37 ,, විලවුන් ,, - විලෙපන ,, ,,

38 ,, සයනයන් ,, - සෙය්‍ය ,, ,,

39 ,, ආවාස ,, - ආවසථ ,, ,,

40 ,, පහන් ,, - පදීපෙය්‍ය ,, ,,

41 11 වෙනි සූත්‍රයේ "අණ්ඩජ නාගයින්" වෙනුවට "ඕපපාතික නාගයන්" කියා 41 වෙනි සූත්‍රය යොදා ගත යුතුයි.

- අන්නදායක ඕපපාතික සූත්‍රය

42 හෙතෙම පානය කළ යුතුදේ දෙයි - පානදායක ඕපපාතික සූත්‍රය

43 ,, වස්ත්‍ර ,, - වත්ථදායක ,, ,,

44 ,, යානාවන් ,, - යානා ,, ,, ,,

45 ,, මාලාවන් ,, - මාලා ,, ,, ,,

46 ,, සුවඳ ,, - ගන්ධ ,, ,, ,,

47 ,, විලවුන් ,, - විලෙපනදායක ,, ,,

48 ,, සයනයන් ,, - සෙය්‍යදායක ,, ,,

49 ,, ආවාස ,, - ආවසථ ,, ,, ,,

50 ,, පහන් ,, - පදීපෙය්‍ය ,, ,, ,,

(අටවෙනි නාගසංයුත්තය නිමි.)

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# 9. සුපණ්ණ සංයුත්තය.

## 1. සුද්ධික සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි,යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. 'මහණෙනි, මේ ගුරුළු යෝනීහු සතරකි. කවර සතරක්ද යත්? අණ්ඩජ ගුරුළෝය. ජලාබුජ ගුරුළෝය. සංසෙදජ ගුරුළෝය. ඕපපාතික ගුරුළෝය යනුයි. මහණෙනි, මේ සතර ගුරුළු යෝනීහුය."

## 2. හරින්ති සූත්‍රය.

(මෙහි 1 වෙනි ඡේදය සුද්ධික සූත්‍රයේ 1 වෙනි ඡේදය මෙනි.)

2. "මහණෙනි, මේ ගුරුළු යෝනීහු සතරකි. කවර සතරක්ද යත්? අණ්ඩජ ගුරුළෝය. ජලාබුජ ගුරුළෝය. සංසෙදජ ගුරුළෝය. ඕපපාතික ගුරුළෝය යනුයි මහණෙනි, ඒ ගුරුළන් අතරෙහි අණ්ඩජ ගුරුළෝ අණ්ඩජ නාගයන් පැහැර ගනිත්, ජලාබුජ නාගයන් පැහැර නොගනිත්. සංසෙදජ නාගයන් පැහැර නොගනිත්. ඕපපාතික නාගයන් පැහැර නොගනිත්. මහණෙනි, ඒ ගුරුළන් අතුරෙහි ජලාබුජ ගුරුළෝ අණ්ඩජ නාගයන්ද ජලාබුජ නාගයන්ද පැහැර ගනිත්. සංසෙදජ නාගයන් පැහැර නොගනිත්. ඕපපාතික නාගයන් පැහැර නොගනිත්. මහණෙනි, ඒ ගුරුළන් අතරෙහි සංසෙදජ ගුරුළෝ අණ්ඩජ නාගයන්ද ජලාබුජ නාගයන්ද සංසෙදජ නාගයන්ද පැහැර ගනිත්. ඕපපාතික නාගයන් පැහැර නොගනිත්. මහණෙනි, ඒ ගුරුළන් අතරෙහි ඕපපාතික ගුරුළෝ අණ්ඩජ, ජලාබුජ සංසෙදජ, ඕපපාතික නාගයන් පැහැර ගනිත්. මහණෙනි මේ සතර ගුරුළු යොනීහුය."

## 3. ද්වය කාරී සූත්‍රය. (1)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ ඒ මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීයේය.

2. "ස්වාමීනි, යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැම් කෙනෙක් ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු අණ්ඩජ ගුරුළන් හා එක්වීමට පැමිණෙයි. මෙයට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

3. "මහණ, මේ ලෝකයෙහි ඇතැම් කෙනෙක් කයින් දෙපරිද්දෙකින් ක්‍රියා කරන්නේ වෙයි. වචනයෙන් දෙපරිද්දෙකින් ක්‍රියා කරන්නේ වෙයි. සිතින් දෙපරිද්දෙකින් ක්‍රියා කරන්නේ වෙයි. අණ්ඩජ ගුරුළෝ බොහෝ ආයුෂ ඇත්තාහ. වර්ණවන්තයහ. සැප බහුලකොට ඇත්තාහයි ඔහු විසින් අසන ලද්දේ වෙයි. ඔහුට මෙබඳු සිතක් වෙයි "මම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු අණ්ඩජ ගුරුළන් හා එක්වීමට පැමිණෙන්නෙම් ඉතා හොඳය"යි කියායි. හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු අණ්ඩජ ගුරුළන් හා එක්වීමට පැමිණෙයි. මහණ, යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැම් කෙනෙක් ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු අණ්ඩජ ගුරුළන් හා එක්වීමට පැමිණෙයිද මේ වනාහි එයට හේතුවයි. මේ වනාහි ප්‍රත්‍යයයි."

## 4. ද්වයකාරී සූත්‍රය (2)

3. ද්වයකාරී සූත්‍රයේ "අණ්ඩජ ගුරුළන්" වෙනුවට 'ජලාබුජ ගුරුළන්' යෙදීමෙන් 4 ද්වයකාරී සූත්‍රය ඇතිවේ.

## 5. ද්වයකාරී සූත්‍රය (3)

5. ද්වයකාරී සූත්‍රයේ "අණ්ඩජ ගුරුළන්" වෙනුවට "සංසෙදජ ගුරුළන්" යෙදීමෙන් 5 ද්වයකාරී සූත්‍රය ඇතිවේ.

## 6. ද්වයකාරී සූත්‍රය (4)

3. ද්වයකාරී සූත්‍රයේ "අණ්ඩජ ගුරුළන්" වෙනුවට "ඕපපාතික ගුරුළන්" යෙදීමෙන් 6 ද්වයකාරී සූත්‍රය ඇතිවේ.

## 7. දානුපකාර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එක් පැත්තක හුන්නාවූ ඒ මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණ කීයේය.

2. "යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැම් කෙනෙක් ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු අණ්ඩජ ගුරුළන් හා එක්වීමට පැමිණේද, මෙයට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?

3. "මහණ, මේ ලෝකයෙහි ඇතැම් කෙනෙක් කයින් දෙපරිද්දකින් ක්‍රියා කරයි. වචනයෙන් දෙපරිද්දකින් ක්‍රියා කරයි. සිතින් දෙපරිද්දකින් ක්‍රියා කරයි. අණ්ඩජ ගුරුළෝ බොහෝ ආයුෂ ඇත්තාහ. වර්ණ වත්තයහ. සැප බහුල කොට ඇත්තාහයි ඔහු විසින් අසන ලද්දේ වෙයි. ඔහුට මෙබඳු සිතක් වෙයි. 'මම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු අණ්ඩජ ගුරුළන් හා එක්වීමට පැමිණෙම් නම් ඉතා හොඳය' කියායි. හෙතෙම ආහාර දෙයි. හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු අණ්ඩජ ගුරුළන් හා එක් වීමට පැමිණෙයි.

"මහණ, යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැම් කෙනෙක් ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු අණ්ඩජ ගුරුළන් හා එක්වීමට පැමිණෙයි නම් (එයට) මේ හේතුවයි. මේ ප්‍රත්‍යයයි."

(මේ වර්ගයේ 7 වෙනි සූත්‍රයේ "හෙතෙම ආහාර දෙයි" යන වචන වෙනුවට මෙහි පහත දක්වන වචන 8 වෙනි සූත්‍රයේ පටන් 16 වෙනි සූත්‍රය දක්වා යොදාගත යුතුයි.)

| | | | | |
|---|---|---|---|---|
| 8 | හෙතෙම පානය කළයුතු දේ දෙයි. | | - පානදායක | සූත්‍රය |
| 9 | ,, | වස්ත්‍ර ,, | - වත්ථදායක | ,, |
| 10 | ,, | යානාවන් ,, | - යානාදායක | ,, |

| | | | | | |
|---|---|---|---|---|---|
| 11 | ,, | මාලාවන් | ,, | - මාලාදායක | ,, |
| 12 | ,, | සුවඳ | ,, | - ගන්ධදායක | ,, |
| 13 | ,, | විලවුන් | ,, | - විලෙපනදායක | ,, |
| 14 | ,, | සයනයන් | ,, | - සෙය්‍යාදායක | ,, |
| 15 | ,, | ආවාස | ,, | - ආවසථදායක | ,, |
| 16 | ,, | පහන් | ,, | - පදීපෙය්‍යා | ,, |

17 මේ වර්ගයේ 17 වෙනි සූත්‍රයේ "අණ්ඩජ ගුරුළන්" වෙනුවට 'ජලාබුජ ගුරුළන්" කියා 17 වෙනි සූත්‍රය යොදාගත යුතුයි.

- අන්නදායක ජලාබුජ සූත්‍රය

18 හෙතෙම පානය කළයුතු දේ දෙයි. - පානදායක ජලාබුජ සූත්‍රය

| | | | | | |
|---|---|---|---|---|---|
| 19 | ,, | වස්ත්‍ර | ,, | - වත්ථදායක | ,, |
| 20 | ,, | යානාවන් | ,, | - යානාදායක | ,, |
| 21 | ,, | මාලාවන් | ,, | - මාලාදායක | ,, |
| 22 | ,, | සුවඳ | ,, | - ගන්ධදායක | ,, |
| 23 | ,, | විලවුන් | ,, | - විලෙපනදායක | ,, |
| 24 | ,, | සයනයන් | ,, | - සෙය්‍යාදායක | ,, |
| 25 | ,, | ආවාස | ,, | - ආවසථදායක | ,, |
| 26 | ,, | පහන් | ,, | - පදීපෙය්‍යාදායක | ,, |

27 6 වෙනි සූත්‍රයේ "අණ්ඩජ ගුරුළන්" වෙනුවට "සංසේදජ ගුරුළන්" කියා 27 වෙනි සූත්‍රය යොදාගත යුතුයි.

28 හෙතෙම පානය කළයුතු දේ දෙයි - පානදායක සංසේදජ සූත්‍රය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 29 | ,, | වස්ත්‍ර | ,, | - වත්ථදායක | ,, | ,, |
| 30 | ,, | යානාවන් | ,, | - යානා | ,, | ,, |
| 11 | ,, | මාලාවන් | ,, | - මාලා | ,, | ,, |
| 12 | ,, | සුවඳ | ,, | - ගන්ධ | ,, | ,, |
| 13 | ,, | විලවුන් | ,, | - විලෙපන | ,, | ,, |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 14 | ,, | සයනයන් | ,, | - සෙය්‍ය | ,, | ,, |
| 15 | ,, | ආවාස | ,, | - ආවසථ | ,, | ,, |
| 16 | ,, | පහන් | ,, | - පදීපෙය්‍ය | ,, | ,, |

37 6 වෙනි සූත්‍රයේ "අණ්ඩජ ගුරුළන්" වෙනුවට "ඕපපාතික ගුරුළන්" කියා 37 වෙනි සූත්‍රය යොදාගත යුතුයි.

### අන්නදායක ඕපපාතික සූත්‍රය

38 සිට 46 දක්වා සූත්‍රවලට යොදා ගතයුතු වචන 28 සිට 37 වෙනි සූත්‍රවලට යොදාගත් වචන මෙන් විය යුතුයි.

(සුද්ධික සූත්‍රයද, ද්වයකාරී සූත්‍ර සතරද, දානුපකාර සූත්‍ර හතළිසදැයි මේ සංයුත්තයෙහි සූත්‍ර හතළිස් හයකි.)

**(නවවෙනි සුපණ්ණ සංයුත්තය නිමි.)**

---

## 10. ගන්ධබ්බ කාය සංයුත්තය.

### 1. සුද්ධික සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, මම නුඹලාට ගන්ධබ්බකායික දෙවියන් ගැන දේශනා කරන්නෙමි, එය අසවු. මහණෙනි, ගන්ධබ්බකායික දෙවියෝ කවරහුද? මහණෙනි, මූලගන්ධයෙහි වාසය කරන දෙවියෝ ඇත්තාහ. සාර (හරය) ගන්ධයෙහි වාසය කරන දෙවියෝ ඇත්තාහ. මහණෙනි, ඵෙග්ගු (ඵලය) ගන්ධයෙහි වාසය කරන දෙවියෝ ඇත්තාහ. මහණෙනි. තච (සිවිය) ගන්ධයෙහි වාසය කරන දෙවියෝ ඇත්තාහ. මහණෙනි පපටිකා (රැක්පොතු) ගන්ධයෙහි වාසය කරන දෙවියෝ ඇත්තාහ.

මහණෙනි, පත්‍ර (කොල) ගන්ධයෙහි වාසය කරන දෙවියෝ ඇත්තාහ. මහණෙනි, පුෂ්ප (මල්) ගන්ධයෙහි වාසය කරන දෙවියෝ ඇත්තාහ. මහණෙනි, ඵල (ගෙඩි) ගන්ධයෙහි වාසය කරන දෙවියෝ ඇත්තාහ. මහණෙනි, රස ගන්ධයෙහි වාසය කරන දෙවියෝ ඇත්තාහ. මහණෙනි, ගන්ධ ගන්ධයෙහි වාසය කරන දෙවියෝ ඇත්තාහ. මහණෙනි. මොවුහු ගන්ධර්ව කායික දෙවතාවෝයයි කියනු ලැබේ."

## 2. සුචරිත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ ඒ මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීයේය.

2. "ස්වාමීනි, යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැම් සත්වකෙනෙක් ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු ගන්ධර්ව කායික දෙවියන් හා එක්වීමට පැමිණේද, (එයට) හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?

3. "මහණ, මේ ලෝකයෙහි ඇතැමෙක් කයින් සුචරිතයෙහි හැසිරෙයි. වචනයෙන් සුචරිතයෙහි හැසිරෙයි. සිතින් සුචරිතයෙහි හැසිරෙයි. ගන්ධර්වකායික දෙවතාවෝ දීර්ඝායුෂ ඇත්තාහ. වර්ණ ඇත්තාහ. සැප බහුලකොට ඇත්තාහයි ඔහු විසින් අසන ලද්දේවෙයි. ඔහුට මෙබඳු සිතක්වෙයි. 'මම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු ගන්ධබ්බකායික දෙවියන් හා එක්වීමට පැමිණෙන්නෙම් නම් ඉතා හොඳය' කියායි. හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු ගන්ධර්වකායික දෙවියන් හා එක්වීමට පැමිණෙයි. මහණ, යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැමෙක් ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු ගන්ධර්වකායික දෙවියන් හා එක්වීමට පැමිණෙයි නම් (එයට) මේ හේතුවයි. මේ ප්‍රත්‍යයයි."

## 3. මූලගන්ධ සූත්‍රය.

(මේ සූත්‍රය මේ වර්ගයේ 2 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරනලදී.)

2. "යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැමෙක් ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු මූලගන්ධයෙහි වාසය කරන දෙවියන් හා එක්වීමට පැමිණේද, ස්වාමීනි, (එයට) හේතු කවරේද, ප්‍රත්‍ය කවරේද?"

"මහණ, මේ සස්නෙහි ඇතැමෙක් කයින් සුචරිතයෙහි හැසිරෙයි. වචනයෙන් සුචරිතයෙහි හැසිරෙයි. සිතින් සුචරිතයෙහි හැසිරෙයි. මූලගන්ධයෙහි වාසය කරන දේවතාවෝ දීර්ඝායුෂ ඇත්තාහ. වර්ණ ඇත්තාහ. සැප බහුලකොට ඇත්තාහයි ඔහු විසින් අසන ලද්දේ වෙයි. ඔහුට මෙබඳු සිතක් වෙයි. 'මම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු මූලගන්ධයෙහි වාසය කරන දෙවියන් හා එක්වීමට පැමිණෙම් නම් ඉතා හොඳය' කියායි. හෙතෙම මූලගන්ධයන් දෙන්නේ වෙයි. හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු මූලගන්ධයෙහි වාසයකරන දෙවියන් හා එක්වීමට පැමිණෙයි. මහණෙනි, යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැමෙක් ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු මූලගන්ධයෙහි වාසය කරන දෙවියන් හා එක්වීමට පැමිණෙයි නම් (එයට) මේ හේතුවයි. මේ ප්‍රත්‍යයයි."

## 4. සාරගන්ධ සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ 2 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැමෙක් ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු සාරගන්ධයෙහි වාසය කරන දෙවියන් හා එක්වීමට පැමිණේද, ස්වාමීනි, (එයට) හේතු කවරේද? ප්‍රත්‍යය කවරේද?"

3. "මහණ, මේ ලෝකයෙහි ඇතැමෙක් කයින් සුචරිතයෙහි හැසිරෙයි. වචනයෙන් සුචරිතයෙහි හැසිරෙයි. සිතින් සුචරිතයෙහි හැසිරෙයි. සාරගන්ධයෙහි වාසය කරන දෙවියෝ

දීර්ඝායුෂ ඇත්තාහ. වර්ණ ඇත්තාහ. සැප බහුලකොට ඇත්තාහයි. ඔහු විසින් අසන ලද්දේ වෙයි. ඔහුට මෙබඳු සිතක් වෙයි. මම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු සාරගන්ධයෙහි වාසය කරන දෙවියන් හා එක්වීමට පැමිණෙම් නම් හොඳය' කියායි. හෙතෙම සාර ගන්ධයන් දෙන්නේ වෙයි.

"හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු සාරගන්ධයෙහි වාසයකරන දෙවියන් හා එක්වීමට පැමිණෙයි. මහණ, යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැම් කෙනෙක් ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු සාර ගන්ධයෙහි වාසය කරන දෙවියන් හා එක්වීමට පැමිණෙයි නම් (එයට) මේ හේතුවයි. මේ ප්‍රත්‍යයයි."

(මේ වර්ගයේ 4 වෙනි සූත්‍රයේ "හෙතෙම සාර ගන්ධයන් දෙන්නේ වෙයි" යන වචන වෙනුවට මෙහි පහත දක්වන වචන 5 වෙනි සූත්‍රයේ පටන් 12 වෙනි සූත්‍රය දක්වා ගත යුතුයි.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 5 | හෙතෙම | වෙග්ගු | ගන්ධයන් | දෙයි. | - | වෙග්ගු | දායක | සූත්‍රය |
| 6 | ,, | තව | ,, | ,, | - | තව | ,, | ,, |
| 7 | ,, | රුක්පතුරු | ,, | ,, | - | පපටිකා | ,, | ,, |
| 8. | ,, | කොල | ,, | ,, | - | පත්ත | ,, | ,, |
| 9 | ,, | මල් | ,, | ,, | - | පුෂ්ප | ,, | ,, |
| 10 | ,, | ගෙඩි | ,, | ,, | - | ඵල | ,, | ,, |
| 11 | ,, | රස | ,, | ,, | - | රස | ,, | ,, |
| 12 | ,, | ගන්ධ | ,, | ,, | - | ගන්ධගන්ධ | ,, | ,, |

## 13. අන්නදායක මූලගන්ධ සූත්‍රය.

(මෙහි 1 ඡේදය මේ සංයුත්තයේ 2 සූත්‍රයේ 1 වෙනි ඡේදය මෙනි.)

**2.** "යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැමෙක් ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු මූලගන්ධයෙහි වාසය කරන දෙවියන් හා එක්වීමට පැමිණේද, ස්වාමීනි, එයට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

3. "මහණෙ මේ ලෝකයෙහි ඇතැමෙක් කයින් සුචරිතයෙහි හැසිරෙයි. වචනයෙන් සුචරිතයෙහි හැසිරෙයි. සිතින් සුචරිතයෙහි හැසිරෙයි. මූලගන්ධයෙහි වාසය කරන දෙවියෝ දීර්ඝායුෂ ඇත්තාහ. වර්ණය ඇත්තාහ. සැප බහුලකොට ඇත්තාහයි ඔහු විසින් අසනලද්දේ වෙයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි. 'මේ ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු මූලගන්ධයෙහි අධිගෘහිත දෙවියන්ගේ සහබවට පැමිණෙන්නෙම් නම් හොඳය' කියායි. හෙතෙම ආහාර දෙයි.

"හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු මූලගන්ධයෙහි වාසයකරන දෙවියන් හා එක්වීමට පැමිණෙයි. මහණ, යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැමෙක් ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු මූලගන්ධයෙහි වාසයකරන දෙවියන් හා එක්වීමට පැමිණෙයි නම් (එයට) මේ හේතුවයි. මේ ප්‍රත්‍යයයි."

(මේ වර්ගයේ 13 වෙනි සූත්‍රයේ "හෙතෙම ආහාර දෙයි" යන වචන වෙනුවට මෙහි පහත දක්වන වචන 14 වෙනි සූත්‍රයේ පටන් 22 සූත්‍රය දක්වා යොදාගත යුතුයි.)

| | | | | |
|---|---|---|---|---|
| 14 | හෙතෙම | පානය කළයුතු දේ | දෙයි. | - පානදායක සූත්‍රය. |
| 15 | ,, | වස්ත්‍ර | ,, | - වත්ථදායක ,, |
| 16 | ,, | යානාවන් | ,, | - යාන දායක ,, |
| 17 | ,, | මාලාවන් | ,, | - මාලා ,, ,, |
| 18 | ,, | සුවඳ | ,, | - ගන්ධ ,, ,, |
| 19 | ,, | විලවුන් | ,, | - විලෙපන ,, ,, |
| 20 | ,, | සයනයන් | ,, | - සෙය්‍ය ,, ,, |
| 21 | ,, | ආවාස | ,, | - ආවසථ ,, ,, |
| 22 | ,, | පහන් | ,, | - පදීපෙය්‍ය ,, ,, |

23 13 වෙනි සූත්‍රයේ "මූලගන්ධයෙහි වාසය කරන දෙවියන්" යන වචන වෙනුවට, "සාරගන්ධයෙහි වාසය කරන දෙවියන්" යන වචන යෙදීමෙන් ඇති වන්නේ 23 වෙනි සූත්‍රයයි.

සූත්‍ර 24 සිට 32 දක්වා යෙදිය යුතු වචන 14 වෙනි සූත්‍රයේ සිට 22 දක්වා යොදාගත් වචන මෙන් විය යුතුයි.

13 වෙනි සූත්‍රයේ "මූලගන්ධයෙහි වාසයකරන දෙවියන්" යන වචන වෙනුවට "ඵෙග්ගු ගන්ධයෙහි වාසය කරන දෙවියන්" යන වචන යෙදීමෙන් ඇතිවන්නේ 33 වෙනි අන්නදායක සූත්‍රයයි.

සූත්‍ර 34 සිට 42 දක්වා යෙදියයුතු වචන 14 වෙනි සූත්‍රයේ සිට 22 දක්වා යොදාගත් වචන මෙන් විය යුතුයි.

43-13 වෙනි සූත්‍රයේ "මූලගන්ධයෙහි වාසය කරන දෙවියන්" යන වචන වෙනුවට "තච ගන්ධයෙහි වාසය කරන දෙවියන්" යන වචන යෙදීමෙන් ඇතිවන්නේ 43 වෙනි අන්නදායක සූත්‍රයයි.

සූත්‍ර 44 සිට 52 දක්වා යෙදිය යුතු වචන 14 වෙනි සූත්‍රයේ සිට 22 දක්වා යොදාගත් වචන මෙන් විය යුතුයි.

53 - 13 වෙනි සූත්‍රයේ "මූලගන්ධයෙහි වාසය කරන දෙවියන්" යන වචන වෙනුවට "පපටිකා ගන්ධයෙහි වාසය කරන දෙවියන්" යන වචන යෙදීමෙන් ඇතිවන්නේ 53 වෙනි අන්නදායක සූත්‍රයයි.

සූත්‍ර 54 සිට 62 දක්වා යෙදිය යුතු වචන 14 වෙනි සූත්‍රයේ සිට 22 දක්වා යොදාගත් වචන මෙන් විය යුතුයි.

63 - 13 වෙනි සූත්‍රයේ "මූලගන්ධයෙහි වාසය කරන දෙවියන්" යන වචන වෙනුවට "පත්‍ර ගන්ධයෙහි වාසයකරන දෙවියන්" යන වචන යෙදීමෙන් ඇතිවන්නේ 63 වෙනි අන්නදායක සූත්‍රයයි.

සූත්‍ර 64 සිට 72 දක්වා දෙයි යුතු වචන 14 වෙනි සූත්‍රයේ සිට 22 දක්වා යොදාගත් වචන මෙන් විය යුතුයි.

73 - 13 වෙනි සූත්‍රයේ "මූලගන්ධයෙහි වාසය කරන දෙවියන්" යන වචන වෙනුවට "පුෂ්පගන්ධයෙහි වාසය කරන දෙවියන්" යන වචන යෙදීමෙන් ඇතිවන්නේ 73 වෙනි අන්නදායක සූත්‍රයයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සූත්‍ර 74 සිට 82 දක්වා යෙදිය යුතු වචන 14 වෙනි සූත්‍රයේ සිට 22 දක්වා යොදාගත් වචන මෙන් විය යුතුය.

83 - 13 වෙනි සූත්‍රයේ "මූලගන්ධයෙහි වාසයකරන දෙවියන්" යන වචන වෙනුවට "ඵල ගන්ධයෙහි වාසය කරන දෙවියන්" යන වචන යෙදීමෙන් ඇතිවන්නේ 83 වෙනි අන්නදායක සූත්‍රයයි.

සූත්‍ර 84 සිට 92 දක්වා යෙදිය යුතු වචන 14 වෙනි සූත්‍රයේ සිට 22 දක්වා යොදා ගත් වචන මෙන් විය යුතුයි.

93 - 13 වෙනි සූත්‍රයේ "මූලගන්ධයෙහි වාසය කරන දෙවියන්" යන වචන වෙනුවට "රසගන්ධයෙහි වාසය කරන දෙවියන් යන වචන යෙදීමෙන් ඇතිවන්නේ 93 වෙනි අන්නදායක සූත්‍රයයි.

සූත්‍ර 94 සිට 102 දක්වා යෙදිය යුතු වචන 14 වෙනි සූත්‍රයේ සිට 22 දක්වා යොදාගත් වචන මෙන් විය යුතුයි.

103 13 වෙනි සූත්‍රයේ "මූලගන්ධයෙහි වාසය කරන දෙවියන්" යන වචන වෙනුවට "ගන්ධගන්ධයෙහි වාසය කරන දෙවියන්" යන වචන යෙදීමෙන් ඇතිවන්නේ 103 වෙනි අන්නදායක සූත්‍රයයි.

සූත්‍ර 104 සිට 112 දක්වා යෙදිය යුතු වචන 14 වෙනි සූත්‍රයේ සිට 22 දක්වා යොදාගත් වචන මෙන් විය යුතුයි.

(සුද්ධික සූත්‍රයද, සුචරිත සූත්‍රයද, දානාසූත්‍ර දසය සහ දානුපකාර සූත්‍ර සියයදැයි මේ සංයුත්තයෙහි සූත්‍ර එක්සියදොළසකි.)

**(දසවෙනි ගන්ධබ්බකාය සංයුත්තය නිමි.)**

---

# 11. වලාහක සංයුත්තය.

## 1. දේසනා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක.

'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2. "මහණෙනි, වලාහක කොටසට අයිති දෙවියන් ගැන දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි, වලාහක කොටසට අයිති දෙවියෝ කවරහුද? මහණෙනි, සීතවලාහක දෙවියෝ ඇත්තාහ. මහණෙනි, උණ්හවලාහක දෙවියෝ ඇත්තාහ. මහණෙනි, අබ්භවලාහක දෙවියෝ ඇත්තාහ. මහණෙනි වාතවලාහක දෙවියෝ ඇත්තාහ. මහණෙනි, වස්සවලාහක දෙවියෝ ඇත්තාහ. මහණෙනි, මොවුහු වලාහක කොටසට අයත් දෙවියෝයයි" කියනු ලැබේ.

## 2. සුචරිත සූත්‍රය.

(මේ සූත්‍රයේ 1 වෙනි ඡේදය 1789 වෙනි පිටේ ද්වයකාරී සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරණලදී.)

2. "ස්වාමීනි, යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැමෙක් ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු වලාහක කායික දෙවියන් හා එක්වීමට පැමිණෙන්නේද, (එයට) හේතු කවරේද? ප්‍රත්‍ය කවරේද?

3. "මහණ, මේ ලෝකයෙහි ඇතැමෙක් කයින් සුචරිතයෙහි හැසිරේද, වචනයෙන් සුචරිතයෙහි හැසිරේද, සිතින් සුචරිතයෙහි හැසිරේද, ඔහු විසින් (මෙසේ) අසන ලද්දේ වෙයි. වලාහක කායික දෙවියෝ දීර්ඝායුෂ ඇත්තාහ. වර්ණ ඇත්තාහ. සැප බහුලකොට ඇත්තාහ. යනුයි.

"ඔහුට මෙබඳු සිතෙක් වෙයි. 'මම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු වලාහක කායික දෙවියන් හා එක්වීමට පැමිණෙන්නෙම් නම් හොඳය' කියායි. හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු වලාහක කායික දෙවියන් හා එක්වීමට පැමිණෙයි. යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැමෙක් ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු වලාහක කායික දෙවියන් හා එක්වීමට පැමිණේද, මහණ, (එයට) මේ හේතුවයි. මේ ප්‍රත්‍යයයි."

## 3. අන්නදායක සීතවලාහක සූත්‍රය.

(මේ සූත්‍රයේ 1 වෙනි ඡේදය 1789 වෙනි පිටේ ද්වයකාරී සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරනලදී.)

2. "යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැමෙක් ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු සීත වලාහක කොටසට අයත් දෙවියන් හා එක්වීමට පැමිණේද, ස්වාමීනි, එයට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

3. "මහණ, මේ ලෝකයෙහි ඇතැමෙක් කයින් සුචරිතයෙහි හැසිරේද, වචනයෙන් සුචරිතයෙහි හැසිරේද, සිතින් සුචරිතයෙහි හැසිරේද, සීත වලාහක කොටසට අයත් දෙවියෝ දීර්ඝායුෂ ඇත්තාහ. වර්ණ ඇත්තාහ. සැප බහුල කොට ඇත්තාහයි ඔහු විසින් අසනලද්දේ වෙයි. ඕහට මෙබඳු සිතෙක් වෙයි. 'මම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු සීතවලාහක කොටසට අයිති දෙවියන් හා එක්වීමට පැමිණෙන්නෙම් නම් හොඳය' කියායි.

'හෙතෙම ආහාර දෙයි. හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු සීත වලාහක කොටසට අයත් දෙවියන් හා එක්වීමට පැමිණෙයි. යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැමෙක් ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු සීත වලාහක කොටසට අයත් දෙවියන් හා එක්වීමට පැමිණේද, මහණ එයට මේ හේතුවයි. මේ ප්‍රත්‍යයයි."

(3 වෙනි සූත්‍රයෙහි "හෙතෙම ආහාර දෙයි" යන වචන වෙනුවට මෙහි පහත දක්වන වචන 4 වෙනි සූත්‍රයේ පටන් 12 වෙනි සූත්‍රය දක්වා යොදාගත යුතුයි.)

| | | | | | |
|---|---|---|---|---|---|
| 4 | හෙතෙම | පානය කළයුතු දේ දෙයි | | - පානදායක | සූත්‍රය |
| 5 | ,, | වස්ත්‍ර | ,, | - වත්ථ ,, | ,, |
| 6 | ,, | යානාවන් | ,, | - යානා ,, | ,, |
| 7 | ,, | මාලාවන් | ,, | - මාලා ,, | ,, |
| 8 | ,, | සුවඳ | ,, | - ගන්ධ ,, | ,, |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 9 | ,, | විලවුන් | ,, | - විලෙපන | | ,, |
| 10 | ,, | සයනයන් | ,, | - සෙය්‍ය | ,, | ,, |
| 11 | ,, | ආවාස | ,, | - ආවසථ | ,, | ,, |
| 12 | ,, | පහන් | ,, | - පදීපෙය්‍ය සූත්‍රය | | |

13 - (මේ වර්ගයේ 3 වෙනි සූත්‍රයේ "සීත වලාහක කොටසට අයත් දෙවියන්" යන වචන වෙනුවට "උණ්හවලාහක කොටසට අයත් දෙවියන්' යන වචන යෙදීමෙන් ඇතිවන්නේ 13 වෙනි සූත්‍රයයි.)

(තුන්වෙනි සූත්‍රයෙහි "හෙතෙම ආහාර දෙයි" යන වචන වෙනුවට 4 සිට 12 දක්වා යෙදූ වචන යෙදීමෙන් 14 වෙනි සූත්‍රයේ පටන් 22 වෙනි සූත්‍රය දක්වා සාදාගතයුතුයි

14 වෙනි සූත්‍රයේ සිට 22 වෙනි සූත්‍රය දක්වා යෙදිය යුතු වචන 4 වෙනි සූත්‍රයේ සිට 12 වෙනි සූත්‍රවලට යොදාගත් වචන මෙනි.

23 - (මේ වර්ගයේ 3 වෙනි සූත්‍රයේ "සීත වලාහක කොටසට අයත් දෙවියන්" යන වචන වෙනුවට "අබ්භවලාහක කොටසට අයත් දෙවියන්' යන වචන යෙදීමෙන් ඇතිවන්නේ 23 වෙනි සූත්‍රයයි.)

(තුන්වෙනි සූත්‍රයෙහි 'හෙතෙම ආහාර දෙයි" යන වචන වෙනුවට 4 සිට 12 දක්වා යෙදූ වචන යෙදීමෙන් 24 වෙනි සූත්‍රයේ පටන් 32 වෙනි සූත්‍රය දක්වා සාදාගත යුතුයි.)

33 - (මේ වර්ගයේ 3 වෙනි සූත්‍රයේ "සීත වලාහක කොටසට අයත් දෙවියන්" යන වචන වෙනුවට "වාත වලාහක කොටසට අයත් දෙවියන්" යන වචන යෙදීමෙන් ඇතිවන්නේ 23 වෙනි සූත්‍රයයි.)

(තුන්වෙනි සූත්‍රයෙහි "හෙතෙම ආහාර දෙයි" යන වචන වෙනුවට 4 සිට 12 දක්වා යෙදූ වචන යෙදීමෙන් 34 වෙනි සූත්‍රයේ පටන් 42 වෙනි සූත්‍රය දක්වා සාදාගත යුතුයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

43 - (මේ වර්ගයේ 3 වෙනි සූත්‍රයේ "සීත වලාහක කොටසට අයත් දෙවියන්" යනවචන වෙනුවට "වස්සවලාහක කොටසට අයත් දෙවියන්" යන වචන යෙදීමෙන් ඇති වන්නේ 43 වෙනි සූත්‍රයයි.)

(තුන්වෙනි සූත්‍රයෙහි "හෙතෙම ආහාර දෙයි" යන වචන වෙනුවට 4 සිට 12 දක්වා යෙදූ වචන යෙදීමෙන් 44 වෙනි සූත්‍රයේ පටන් 52 වෙනි සූත්‍රය දක්වා සාදාගත යුතුයි.)

## 53. සීත සූත්‍රය

(මේ සූත්‍රය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

**2.** "ස්වාමීනි, යම් හෙයකින් සමහර දිනක සීත වේද (එයට) හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

**3.** "මහණ, සීත වලාහක නම් දෙවියෝ ඇත්තාහ. ඔවුනට යම් කලක මෙබඳු සිතක් වෙයි. 'අපි ඒකාන්තයෙන් ස්වකීය ඇල්මෙන් ප්‍රීතිවන්නෙමු කියායි.' ඔවුන්ගේ ඒ සිතේ පැතීම අනුවම සීතවෙයි. යම් හෙයකින් ඇතැම් කලක සීත වේද, මහණ එයට මේ හේතුවයි. මේ ප්‍රත්‍යයයි."

## 54. උණ්හ සූත්‍රය.

(මේ සූත්‍රය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

**2.** "ස්වාමීනි, යම් හෙයකින් ඇතැම් දිනක උණුසුම වේද, එයට හේතුව කවරේද? එයට ප්‍රත්‍ය කවරේද?"

**3.** "මහණ උෂ්ණ වලාහක නම් දෙවියෝ ඇත්තාහ. ඔවුන්ට යම් කලක මෙබඳු සිතෙක් වෙයි. 'අපි ඒකාන්තයෙන් ස්වකීය ඇල්මෙන් ප්‍රීතිවන්නෙමු' කියායි. ඔවුන්ගේ ඒ පැතීම අනුවම උණුසුම් වෙයි. යම් හෙයකින් ඇතැම් කලක උණුසුම් වේද, මහණ (එයට) මේ හේතුවයි. මේ ප්‍රත්‍යයයි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 55. අබ්භ සූත්‍රය.

(මේ සූත්‍රය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

**2.** "ස්වාමීනි, යම් හෙයකින් ඇතැම් කලක වැසි වලාකුල්වේද, එයට හේතුව කවරේද? එයට ප්‍රත්‍ය කවරේද?"

**3.** "මහණ, 'අබ්භ' වලාහක නම් දෙවියෝ ඇත්තාහ. ඔවුනට යම් කලක (මෙබඳු) සිතක් වෙයි. 'අපි ඒකාන්තයෙන් ස්වකීය ඇල්මෙන් ක්‍රීඩා කරන්නෙමු' කියායි. ඔවුන්ගේ ඒ සිතේ පැතීම අනුවම වැසි වලාකුල් වෙයි යනුයි. යම් හෙයකින් ඇතැම් කලක වැසි වලාකුල් වේද, මහණ (එයට) මේ හේතුවයි. මේ ප්‍රත්‍යයයි."

## 56. වාත සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

**2.** "ස්වාමීනි, ඇතැම් දිනක වාතය වෙයි, (එයට) හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

**3.** "මහණ 'අබ්භ' වලාහක නම් දෙවියෝ ඇත්තාහ. ඔවුනට යම් කලක (මෙබඳු) සිතක් වෙයි. 'අපි ස්වකීය ඇල්මෙන් ක්‍රීඩා කරන්නෙමු' කියායි. ඔවුන්ගේ ඒ සිතේ පැතීම අනුවම වාතය වෙයි. යම් හෙයකින් ඇතැම් දිනක වාතය වේද, මහණ (එයට) මේ හේතුවයි, මේ ප්‍රත්‍යයයි."

## 57. වස්ස සූත්‍රය.

(මේ සූත්‍රය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

**2.** "ස්වාමීනි, යම් හෙයකින් ඇතැම් දිනක අධික වර්ෂාව ඇතිවේද, එයට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

**3.** "මහණ, වස්ස වලාහක නම් දේවතාවෝ ඇත්තාහ. ඔවුන්ට යම් කලක (මෙබඳු) සිතෙක් වෙයි. 'අපි ස්වකීය ඇල්මෙන් ක්‍රීඩා කරන්නෙමු' යනුයි. ඔවුන්ගේ ඒ සිතේ පැතීම සමගම

මහා වැසි වසියි, යම් හෙයකින් ඇතැම් දිනක මහ වැසි වසියිද, මහණෙ (එයට) මේ හේතුවයි. මේ ප්‍රත්‍යයයි."

(දේසනා සූත්‍රය, සුචරිත සූත්‍රය, දානුපකාර සූත්‍ර පනසය. සීත සූත්‍රය, උණ්හ සූත්‍රය, අබ්භ සූත්‍රය, වාත සූත්‍රය සහ වස්ස සූත්‍රය දැයි මේ වලාහක සංයුත්තයෙහි සූත්‍ර පනස් හතකි.)

**(එකොළොස්වෙනි වලාහක සංයුත්තය නිමි.)**

---

## 12. වච්ඡගොත්ත සංයුත්තය.

### 1. අඤ්ඤාණ සූත්‍රය

ඉක්බිති වච්ඡගොත්ත නම් පරිබ්‍රාජකයා භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය. සතුටු විය යුතු සිහිකටයුතු කථාවන් කොට නිමවා එකත් පසෙක උන්නේය. එකත් පසක හුන් ඒ වච්ඡගොත්ත පරිබ්බාජකයා භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය.

2. "භවත් ගෞතමයන් වහන්ස, යම් ඒ නොයෙක් දෘෂ්ටීහු ලෝකයෙහි උපදිත්. 'ලෝකය නිත්‍යය කියා හෝ ලෝකය නිත්‍ය නොවේය කියා හෝ ලෝකය කෙළවරක් ඇත්තේය කියා හෝ ලෝකය කෙළවරක් නැත්තේය කියා හෝ එයම ජීවයයි එයම ශරීරයයි කියා හෝ ජීවය අනිකකි ශරීරය අනිකකි කියා හෝ මරණයෙන් මතු සත්ත්ව තෙමේ වේයයි කියා හෝ මරණයෙන් මතු සත්ත්වතෙමේ නොවේයයි කියා හෝ මරණයෙන් මතු සත්ත්වතෙමේ වන්නේද වෙයි. නොවන්නේද වෙයි කියා හෝ මරණයෙන් මතු සත්ත්වතෙමේ නොවන්නේද වෙයි. නොවන්නේද නොවෙයිද' කියා හෝයි ඊට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

3. "වච්ඡය රූපයෙහි නොදැනීම නිසා රූපයන් හට ගැනීමේ හේතුව නොදැනීම නිසා රූප නිරුද්ධවීමෙහි නොදැනීම නිසා

රූප නිරුද්ධ වීමේ ප්‍රතිපදාව නොදැනීම නිසා මේ නොයෙක් දෘෂ්ටීහු ලෝකයෙහි උපදිත්.

"ලෝකය නිත්‍යය කියා හෝ ලෝකය නිත්‍ය නොවේය කියා හෝ ලෝකය කෙළවරක් ඇත්තේය කියා හෝ ලෝකය කෙළවරක් නැත්තේය කියා හෝ එයම ජීවයයි එයම ශරීරයයි කියා හෝ ජීවය අනිකකි ශරීරය අනිකකි කියා හෝ මරණයෙන් මතු සත්ත්ව තෙමේ වේයයි කියා හෝ මරණයෙන් මතු සත්ත්ව තෙමේ නොවේයයි කියා හෝ මරණයෙන් මතු සත්ත්ව තෙමේ වන්නේද වෙයි. නොවන්නේද වෙයි කියා හෝ මරණයෙන් මතු සත්ත්ව තෙමේ නොවන්නේදවෙයි නොවන්නේද නොවෙයිද කියා හෝ යන දෘෂ්ටීහුය.

"වච්ඡය, යම් හේතුවකින් ලෝකය නිත්‍යය කියා හෝ ලෝකය නිත්‍යනොවේය කියා හෝ ලෝකය කෙළවරක් ඇත්තේය කියා හෝ ලෝකය කෙළවරක් නැත්තේය කියා හෝ එයම ජීවයයි එයම ශරීරයයි කියා හෝ ජීවය අනිකකි ශරීරය අනිකකි කියා හෝ මරණයෙන් මතු සත්ත්වතෙමේ වේයයි කියා හෝ මරණයෙන් මතු සත්ත්වතෙමේ නොවේයයි කියා හෝ මරණයෙන් මතු සත්ත්ව තෙමේ වන්නේද වෙයි නොවන්නේද වෙයි කියා හෝ මරණයෙන් මතු සත්ත්වතෙමේ නොවන්නේද වෙයි නොවන්නේද නොවෙයිද කියා හෝ යන දෘෂ්ටීහුය."

## 2. අඤ්ඤාණ සූත්‍රය

(මේ සූත්‍රයේ 1, 2, 4 ඡේද මේ සංයුත්තයේ 1 වෙනි අඤ්ඤාණ සූත්‍රයේ මෙනි.)

3. "වච්ඡය, වේදනාවෙහි නොදැනීම නිසා වේදනාව හටගැනීමේ හේතුවෙහි නොදැනීම නිසා වේදනාව නිරුද්ධ වීමෙහි නොදැනීම නිසා වේදනාව නිරුද්ධවීමේ ප්‍රතිපදාවෙහි නොදැනීමනිසා මේ නොයෙක් දෘෂ්ටීහු උපදිත්."

## 3. අඤ්ඤාණ සූත්‍රය.

(මේ සූත්‍රයේ 1, 2, 4 ඡේද මේ සංයුත්තයේ 1 වෙනි අඤ්ඤාණ සූත්‍රයේ මෙනි)

3. "වච්ඡය, සඤ්ඤාවෙහි නොදැනීම නිසා සඤ්ඤාව හටගැනීමේ හේතුව නොදැනීම නිසා, සඤ්ඤාව නිරුද්ධවීම නොදැනීම නිසා, සඤ්ඤාව නිරුද්ධවීමේ ප්‍රතිපදාව නොදැනීම නිසා මෙසේ නොයෙක් දෘෂ්ටීහු උපදිත්."

## 4. අඤ්ඤාණ සූත්‍රය

(මේ සූත්‍රයේ 1, 2, 4 ඡේද මේ සංයුත්තයේ 1 වෙනි අඤ්ඤාණ සූත්‍රයේ මෙනි.)

3. "වච්ඡය, සංස්කාරයන්හි නොදැනීම නිසා සංස්කාර හටගැනීමේ හේතුව නොදැනීම නිසා, සංස්කාර නිරුද්ධවීම නොදැනීම නිසා, සංස්කාර නිරුද්ධවීමේ මාර්ගය නොදැනීම නිසා මේ නොයෙක් දෘෂ්ටීහු ලෝකයෙහි උපදිත්."

## 5. අඤ්ඤාණ සූත්‍රය

(මේ සූත්‍රයේ 1, 2, 4 ඡේද මේ සංයුත්තයේ 1 වෙනි අඤ්ඤාණ සූත්‍රයේ මෙනි.)

3. "වච්ඡය, විඤ්ඤාණයේ නොදැනීම නිසා විඤ්ඤාණය හටගැනීමේ හේතුව නොදැනීම නිසා විඤ්ඤාණයේ නිරුද්ධවීම නොදැනීම නිසා විඤ්ඤාණ නිරොධගාමිණී ප්‍රතිපදාව නොදැනීමනිසා මේ නොයෙක් දෘෂ්ටීහු ලෝකයෙහි උපදිත්."

(මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ "රූපය නොදැකීම" නිසා යන වචන වෙනුවට මෙහි පහත දක්වන වචන යොදා ඒ ඒ සූත්‍රය සාදාගත යුතුයි.

| | |
|---|---|
| 6. රූපය නොදැකීම නිසා | අදස්සන සූත්‍රය |
| 7. වේදනාවෙහි නොදැකීම නිසා | ,, |
| 8. සඤ්ඤාවේ නොදැකීම නිසා | ,, |
| 9. සංස්කාරයන්හි නොදැකීම නිසා | ,, |
| 10. විඤ්ඤාණයෙහි නොදැකීම නිසා | ,, |
| 11. රූපයෙහි අවබෝධය නැති නිසා | අනභිසමය සූත්‍රය. |

12. වේදනාවෙහි අවබෝධය නැති නිසා ,,
13. සඤ්ඤාවෙහි අවබොධය නැති නිසා ,,
14. සංස්කාරයන්ගේ අවබොධය නැති නිසා ,,
15. විඤ්ඤාණයේ අවබෝධය නැති නිසා ,,
16. රූපයෙහි අවබොධය නැති නිසා අනනුබොධ සූත්‍රය.
17. වේදනාවෙහි අනුබොධය නැති නිසා ,,
18. සඤ්ඤාවෙහි අනුබොධය නැති නිසා ,,
19. සංස්කාරයන්හි අනුබොධය නැති නිසා ,,
20. විඤ්ඤාණයෙහි අනුබොධය නැති නිසා ,,
21. රූපයෙහි ප්‍රතිවෙධ නොකිරීම නිසා අප්පටිවෙධ සූත්‍රය.
22. වේදනාව ප්‍රතිවෙධ නොකිරීම නිසා ,,
23. සඤ්ඤාව ප්‍රතිවෙධ නොකිරීම නිසා ,,
24. සංස්කාරයන් ප්‍රතිවෙධ නොකිරීම නිසා ,,
25. විඤ්ඤාණය ප්‍රතිවෙධ නොකිරීම නිසා ,,
26. රූපය නොසැලකීම නිසා අසල්ලක්ඛණ සූත්‍රය.
27. වේදනාව නොසැලකීම නිසා ,,
28. සඤ්ඤාව නොසැලකීම නිසා ,,
29. සංස්කාරයන් නොසැලකීම නිසා ,,
30. විඤ්ඤාණය නොසැලකීම නිසා ,,
31. රූපය නැවත නැවත නොසැලකීම නිසා
අනුපලක්ඛණ සූත්‍රය.
32. වේදනාව නැවත නැවත නොසැලකීම නිසා ,,
33. සඤ්ඤාව නැවත නැවත නොසැලකීම නිසා ,,
34. සංස්කාරයන් නැවත නැවත නොසැලකීම නිසා ,,
35. විඤ්ඤාණය නැවත නැවත නොසැලකීම නිසා ,,

36. රූපය මෙනෙහි නොකිරීම නිසා අපච්චුපලක්ඛණ සූත්‍රය.

37. වේදනාව ,, ,,

38. සඤ්ඤාව ,, ,,

39. සංස්කාරය ,, ,,

40. විඤ්ඤාණය ,, ,,

41. රූපය මනාව නොබැලීම නිසා - අසමපෙක්ඛණ සූත්‍රය

42. වේදනාව ,, ,,

43. සඤ්ඤාව ,, ,,

44. සංස්කාරය ,, ,,

45. විඤ්ඤාණය ,, ,,

46. රූපය නැවත නැවත නොලැබීම නිසා

අපච්චුපෙක්ඛණ සූත්‍රය.

47. වේදනාව ,, ,,

48. සඤ්ඤාව ,, ,,

49. සංස්කාර ,, ,,

50. විඤ්ඤාණය ,, ,,

51. රූපය ප්‍රත්‍යක්ෂ නොකිරීම නිසා, රූපය හටගැනීමෙහි හේතුව ප්‍රත්‍යක්ෂ නොකිරීම නිසා, රූපය නිරුද්ධවීම ප්‍රත්‍යක්ෂ නොකිරීම නිසා, රූපය නිරුද්ධවීමේ මාර්ගය ප්‍රත්‍යක්ෂ නොකිරීම නිසා,

52. වේදනාව ප්‍රත්‍යක්ෂ නොකිරීම නිසා, වේදනාව හටගැනීමෙහි හේතුව ප්‍රත්‍යක්ෂ නොකිරීම නිසා, වේදනාව නිරුද්ධ වීම ප්‍රත්‍යක්ෂ නොකිරීම නිසා, වේදනාව නිරුද්ධවීමේ මාර්ගය ප්‍රත්‍යක්ෂ නොකිරීම නිසා,

53. සඤ්ඤාව ප්‍රත්‍යක්ෂ නොකිරීම නිසා, සඤ්ඤාව හටගැනීමේ හේතුව ප්‍රත්‍යක්ෂ නොකිරීම නිසා, සඤ්ඤාව

නිරුද්ධවීම ප්‍රත්‍යක්ෂ නොකිරීම නිසා, සඤ්ඤාව නිරුද්ධවීමේ මාර්ගය ප්‍රත්‍යක්ෂ නොකිරීම නිසා

54. සංස්කාරයන් ප්‍රත්‍යක්ෂ නොකිරීම නිසා, සංස්කාරයන් හටගැනීමේ හේතුව ප්‍රත්‍යක්ෂ නොකිරීම නිසා, සංස්කාරයන් නිරුද්ධවීම ප්‍රත්‍යක්ෂ නොකිරීම නිසා, සංස්කාරයන් නිරුද්ධවීමේ මාර්ගය ප්‍රත්‍යක්ෂ නොකිරීම නිසා,

55. විඤ්ඤාණය ප්‍රත්‍යක්ෂ නොකිරීම නිසා, විඤ්ඤාණය හට ගැනීමේ හේතුව ප්‍රත්‍යක්ෂ නොකිරීම නිසා, විඤ්ඤාණය නිරුද්ධවීම ප්‍රත්‍යක්ෂ නොකිරීම නිසා, විඤ්ඤාණය නිරුද්ධ වීමේ මාර්ගය ප්‍රත්‍යක්ෂ නොකිරීම නිසා,

**වච්ඡගොත්ත සංයුත්තය නිමි.**

---

# 13. ධ්‍යාන සංයුත්තය.

## 1. ධ්‍යායී සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ (ඒ භික්ෂූන්ට) මෙය වදාළසේක.

2. "මහණෙනි, මේ ධ්‍යානලාභීහු සතරදෙනෙක් වෙත්. ඒ සතරදෙන කවරහුදයත්? මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් ධ්‍යාන ලාභියෙක් තෙම (1) සමාධියෙහි අංග දැනීමෙහි සමත්වෙයි. සමාධියට සමවැදීමෙහි සමත් නොවෙයි. මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් ධ්‍යාන ලාභියෙක් තෙමේ (2) සමාපත්තියට සමවැදීමෙහි සමත් වෙයි. ධ්‍යානාංග දැනීමෙහි සමත් නොවෙයි. මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් ධ්‍යානාලාභියෙක් තෙමේ (3) ධ්‍යානාංග දැනීමෙහිද සමත් නොවෙයි, සමාධියට සමවැදීමෙහිද සමත් නොවෙයි. මහණෙනි,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

මේ ශාසනයෙහි ඇතැම් ධ්‍යාන ලාභියෙක් තෙමේ (4) සමාධියෙහි අංග දැනීමෙහිද සමත් වෙයි. සමාධියට සමවැදීමෙහිද සමත්වෙයි.

"මහණෙනි, (මේ ඒ සතරදෙන වෙති) එහි යම් ඒ ධ්‍යානලාභියෙක් තෙමේ සමාධියෙහි අංග දැනීමෙහිත් සමත්වේද සමාධියට සමවැදීමෙහිත් සමත්වේද, මේ තෙමේ මේ ධ්‍යානලාභි පුද්ගලයන් සතරදෙනාගෙන්ම අග්‍රද, ශ්‍රේෂ්ඨද, ප්‍රධානද, උතුම්ද, උසස්ද වෙයි.

3. "මහණෙනි, යම්සේ දෙනට වඩා කිරිද, කිරට වඩා දීද, දීවලට වඩා වෙඬරුද, වෙඬරුවලට වඩා ගිතෙල්ද, ගිතෙල්වලට වඩා ගිතෙල් මණ්ඩයද, එහි යම් සේ උතුම්යයි කියනු ලැබේද, එපරිද්දෙන්ම මහණෙනි, යම් ඒ ධ්‍යානලාභි පුද්ගලයෙක් ධ්‍යානයෙහි ධ්‍යානාංග වෙන්කිරීමෙහිත් සමත් වේද, සමාපත්තියට සමවැදීමෙහිත් සමත්වේද මේ තෙමේ මේ ධ්‍යානලාභී පුද්ගලයන් සතර දෙනාගෙන් අග්‍රද, ශ්‍රේෂ්ඨද, ප්‍රමුඛද, උතුම්ද, උසස්ද වේයයි' වදාළේය.

(මේ වර්ගයට අයිති අනිත් සූත්‍ර 54 රේ 1 ඡේද මේ වර්ගයේම 1 වෙනි ධ්‍යායි සූත්‍රය මෙනි. 2, 3 වෙනි ඡේද සාදාගැනීමට ඒ ඒ ස්ථානවලට මෙහි පහත සඳහන් කර තිබෙන ධ්‍යානලාභී පුද්ගලයින්ගේ ගති ගුණ සඳහන් කොටස් යොදා, නැවත 4 වෙනි පුද්ගලයාගේ ගතිගුණ උසස් ධ්‍යානලාභී පුද්ගලයාගේ ගතිගුණ මෙන් යොදාගත යුතුයි.)

2. - (1) ධ්‍යානාංග දැනීමෙහි සමත්වෙයි. සමාධියෙහි පිහිටීමට නොසමත් වෙයි. (2) සමාධියෙහි පිහිටීමට සමත් වෙයි. සමාධියට සමවැදීමෙහි නොසමත් වෙයි. (3) සමාධියට සමවැදීමෙහිද නොසමත් වෙයි. සමාධියෙහි පිහිටීමෙහිද නොසමත් වෙයි. (4) සමාධියට සමවැදීමෙහිද දක්ෂවෙයි. සමාධියෙහි පිහිටීමෙහිද සමර්ථවෙයි.

3. - (1) සමාධියෙහි අංග දැනීමෙහි සමත්වෙයි, සමාධියෙහි සමවතින් නැඟිසිටීමෙහි සමත් නොවෙයි. (2) සමාධියෙහි සමවතින් නැඟී සිටීමෙහි සමත් වෙයි, සමාධියෙහි අංග

දැනීමෙහි සමත් නොවෙයි (3) සමාධියෙහි අංග දැනීමෙහිද සමත් නොවෙයි, සමාධියෙහි සමවතින් නැඟීසිටීමෙහිද සමත් නොවෙයි (4) සමාධියෙහි අංග දැනීමෙහිද සමත්වෙයි, සමාධියෙහි සමවතින් නැඟී සිටීමෙහිද සමත්වෙයි.

**4.** - (1) සමාධියෙහි අංග දැනීමෙහි සමත් වෙයි, සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත් නොවෙයි. (2) සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත්වෙයි, සමාධියෙහි ධ්‍යානාංග දැනීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි ධ්‍යානාංග දැනීමෙහිද සමත් නොවෙයි. සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහිද සමත් නොවෙයි. (4) සමාධියෙහි අංග දැනීමෙහිද සමත්වෙයි, සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහිද සමත් වෙයි.

**5.** - (1) සමාධියෙහි අංග දැනීමෙහි සමත්වෙයි, සමාධියෙහි කසිණාරම්මණයන්හි සමත් නොවෙයි. (2) සමාධියෙහි කසිණාරම්මණයන්හි සමත් වෙයි, සමාධියෙහි අංග දැනීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි අංග දැනීමෙහිද සමත් නොවෙයි. සමාධියෙහි කසිණාරම්මණයන්හිද සමත් නොවෙයි. (4) සමාධියෙහි අංග දැනීමෙහිත් සමත් වෙයි, සමාධියෙහි කසිණාරම්මණයෙහිත් සමත් වෙයි.

**6.** - (1) සමාධියෙහි අංග දැනීමෙහි සමත්වෙයි, ධ්‍යානයට සුදුසු කමටහන්හිද යෝග්‍ය පිණ්ඩපාතයෙහිද සමත් නොවෙයි. (2) ධ්‍යානයට සුදුසු කමටහන්හි හා යෝග්‍ය පිණ්ඩපාතයෙහිද සමත් වෙයි, සමාධියෙහි අංග දැනීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි අංග දැනීමෙහිද සමත් නොවෙයි. සමාධියට සුදුසු කමටහන්හි හා යෝග්‍ය පිණ්ඩපාතයෙහිද සමත් නොවෙයි. (4) සමාධියෙහි අංග දැනීමෙහිද සමත් වෙයි, සුදුසු කමටහන්හි හා යෝග්‍ය පිණ්ඩපාතයෙහිද සමත් වෙයි.

**7.** - (1) සමාධියෙහි අංග දැනීමෙහි සමත් වෙයි, සමාධියට කර්මස්ථානය පැමිණවීමෙහි සමත් නොවෙයි. (2) සමාධියට කර්මස්ථානය පැමිණවීමෙහි සමත් වෙයි. සමාධියෙහි අංග දැනීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි අංග දැනීමෙහිද සමත් නොවෙයි, සමාධියට කර්මස්ථානය පැමිණවීමෙහිද සමත්

නොවෙයි. (4) සමාධියෙහි අංග දැනීමෙහිත් සමත් වෙයි. සමාධියට කර්මස්ථානය පැමිණවීමෙහිත් සමත් වෙයි.

**8.** - (1) සමාධියෙහි අංග දැනීමෙහි සමත් වේ. සමාධියෙහි මනාව කරන්නෙක් නොවේ (2) සමාධියෙහි මනාව කරන්නෙක් වෙයි, සමාධියෙහි අංග දැනීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි අංග දැනීමෙහිද සමත් නොවේ. සමාධියෙහි මනාව කරන්නෙක්ද නොවේ. (4) සමාධියෙහි අංග දැනීමෙහිත් සමත් වෙයි, සමාධියෙහි මනාව කරන්නෙක්ද වෙයි.

**9.** - (1) සමාධියෙහි අංග දැනීමෙහි සමත්වෙයි, ධ්‍යානයෙහි නිතර කරන්නෙක් නොවෙයි. (2) ධ්‍යානයෙහි නිතර කරන්නෙක් වෙයි, සමාධියෙහි අංග දැනීමෙහි සමත් නොවේ. (3) සමාධියෙහි අංග දැනීමෙහිද සමත් නොවේ. සමාධියෙහි නිතර කරන්නෙක්ද නොවේ. (4) සමාධියෙහි අංග දැනීමෙහිද සමත්වේ, සමාධියෙහි නිතර කරන්නෙක්ද වෙයි.

**10.** - (1) සමාධියෙහි අංග දැනීමෙහි සමත්වෙයි, සමාධියට උපකාර ධර්මයන් පිරීමෙහි අදක්ෂ වෙයි. (2) සමාධි උපකාර ධර්මයන් පිරීමෙහි දක්ෂවෙයි, සමාධියෙහි අංග දැනීමෙහි අදක්ෂවෙයි. (3) සමාධියෙහි අංග දැනීමෙහිත් අදක්ෂ වෙයි. සමාධියට උපකාර ධර්මයන් පිරීමෙහිත් අදක්ෂ වෙයි. (4) සමාධියෙහි අංග දැනීමෙහිත් දක්ෂ වෙයි, සමාධියට උපකාර ධර්මයන් පිරීමෙහිත් දක්ෂවෙයි.

**11.** - (1) සමාධියෙහි සමවතට සමවැදීමෙහි සමත් වෙයි, සමාපත්තියෙහි සිටීමෙහි සමත් නොවෙයි. (2) සමාපත්තියෙහි සිටීමෙහි සමත් වෙයි, සමාධියෙහි සමවතට සමවැදීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි සමවතට සමවැදීමෙහිද සමත් නොවෙයි, සමාපත්තියෙහි සිටීමෙහිද සමත් නොවෙයි. (4) සමාධියෙහි සමවතට සමවැදීමෙහිද සමත්වෙයි, සමාපත්තියෙහි සිටීමෙහිද සමත්වෙයි.

**12.** - (1) සමාධියෙහි සමවතට සමවැදීමෙහි සමත් වෙයි. සමාධියෙහි සමවතින් නැගිටීමෙහි සමත් නොවෙයි. (2) සමාධියෙහි සමවතින් නැගිටීමෙහි සමත් වෙයි. සමාධියෙහි

සමවතට සමවැදීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි සමවතට සමවැදීමෙහිද සමත් නොවෙයි. සමාධියෙහි සමවතින් නැගිටීමෙහිද සමත් නොවෙයි. (4) සමාධියෙහි සමවතට සමවැදීමෙහිද සමත් වෙයි, සමාධියෙහි සමවතින් නැගිටීමෙහිද සමත් වෙයි.

13. - (1) සමාධියෙහි සමවතට සමවැදීමෙහි සමත් වෙයි. සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත් නොවෙයි. (2) සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත්වෙයි. සමාධියෙහි සමවතට සමවැදීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි සමවතට සමවැදීමෙහිද සමත් නොවෙයි. සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහිද සමත් නොවෙයි. (4) සමාධියෙහි සමවතට සමවැදීමෙහිද සමත් වෙයි. සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහිද සමත්වෙයි.

14. - (1) සමාධියෙහි සමවතට සමවැදීමෙහි සමත්වෙයි, සමාධියෙහි ආරම්මණයන්හි සමත් නොවෙයි. (2) සමාධියෙහි ආරම්මණයන්හි සමත් වෙයි. සමාධියෙහි සමවතට සමවැදීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි ආරම්මණයන්හිත් සමත් නොවෙයි, සමාධියෙහි සමවතට සමවැදීමෙහිත් සමත් නොවෙයි. (4) සමාධියෙහි සමවතට සමවැදීමෙහිත් සමත්වේ, සමාධියෙහි ආරම්මණයන්හිත් සමත්වේ.

15. - (1) සමාධියෙහි සමවතට සමවැදීමෙහි සමත්වේ, සමාධියට සුදුසු කර්මස්ථානයෙහි සුදුසු පිණ්ඩපාතයෙහි අදක්ෂ වූයේ වෙයි. (2) සමාධියට සුදුසු කර්මස්ථානයෙහි සුදුසු පිණ්ඩපාතයෙහි දක්ෂවූයේ වෙයි, සමාධියෙහි සමවතට සමවැදීමෙහි සමත් නොවේ. (3) සමාධියෙහි සමවතට සම වැදීමෙහි සමත් නොවේ. සමාධියට සුදුසු කර්මස්ථානයෙහි සුදුසු පිණ්ඩපාතයෙහි දක්ෂවූයේ නොවෙයි. (4) සමාධියෙහි සමවතට සමවැදීමෙහි සමත්වේ, සමාධියට සුදුසු කර්මස්ථානයෙහි සුදුසු පිණ්ඩපාතයෙහි දක්ෂවේ.

16. - (1) සමාධියෙහි සමවතට සමවැදීමෙහි සමත්වෙයි, සමාධියෙහි අර්පණාවට (ධ්‍යානයේ පළමු අවස්ථාවට)

පැමිණීමෙහි සමත් නොවෙයි. (2) සමාධියෙහි අර්පණාවට පැමිණීමෙහි සමත්වෙයි, සමාධියෙහි සමවතට සමවැදීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි සමවතට සමවැදීමෙහි සමත් නොවෙයි, සමාධියෙහි අර්පණාවට පැමිණීමෙහි සමත් නොවෙයි. (4) සමාධියෙහි සමවතට සමවැදීමෙහි සමත් වෙයි, සමාධියෙහි අර්පණාවට පැමිණීමෙහි සමත්වෙයි.

**17.** - (1) සමාධියෙහි සමවතට වැදීමෙහි සමත්වෙයි, සමාධියෙහි අර්පණාවට පැමිණීම සඳහා මනාව කටයුතු නොකරන්නේ වෙයි. (2) සමාධියෙහි අර්පණාවට පැමිණීම සඳහා මනාව කටයුතු කරන්නේ වෙයි, සමාධියෙහි සමවතට සමවැදීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි සමවතට සමවැදීමෙහි සමත් නොවෙයි, සමාධියෙහි අර්පණාවට පැමිණීම සඳහා මනාව කටයුතු කරන්නේ නොවෙයි. (4) සමාධියෙහි සමවතට සමවැදීමෙහි සමත්වෙයි, සමාධියෙහි අර්පණාවට පැමිණීම සඳහා මනාව කටයුතුකරන්නේ වෙයි.

**18.** - (1) සමාධියෙහි සමවතට සමවැදීමෙහි සමත්වෙයි. සමාධියෙහි අර්පණාවට පැමිණීම සඳහා නිතර කටයුතු නොකරන්නේ වෙයි. (2) සමාධියෙහි අර්පණාවට පැමිණීම සඳහා නිතර කටයුතු කරන්නේ වෙයි, සමාධියෙහි සමවතට සමවැදීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි සමවතට සමවැදීමෙහි සමත් නොවෙයි, සමාධියෙහි අර්පණාවට පැමිණීම සඳහා නිතර කටයුතු කරන්නේ නොවෙයි. (4) සමාධියෙහි සමවතට සමවැදීමෙහි සමත් වෙයි. සමාධියෙහි අර්පණාවට පැමිණීම සඳහා නිතර කටයුතු කරන්නේ වෙයි.

**19.** - (1) සමාධියට උපකාර ධර්මයන් කිරීමෙහි සමත් වෙයි, සමාධියෙහි සමවතට සමවැදීමෙහි සමත් නොවෙයි. (2) සමාධියෙහි සමවතට සමවැදීමෙහි සමත් වෙයි. සමාධියට උපකාර ධර්මයන් පිරීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි සමවතට උපකාර ධර්මයන් පිරීමෙහිත් සමත් නොවෙයි. සමාධියෙහි සමවතට සමවැදීමෙහිත් සමත් නොවෙයි. (4) සමාධියට උපකාර ධර්මයන් පිරීමෙහි සමත්වේ. සමාධියෙහි සමවතට සමවැදීමෙහි සමත්වේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**20.** - (1) සමාධියෙහි සිටීමෙහි සමත්වෙයි. සමාධියෙන් නැගිටීමෙහි සමත් නොවෙයි. (2) සමාධියෙන් නැගිටීමෙහි සමත්වෙයි. සමාධියෙහි සිටීමට සමත් නොවේ. (3) සමාධියෙහි සිටීමෙහිද සමත් නොවෙයි. සමාධියෙහි සිටීමෙහිද සමත් නොවෙයි. (4) සමාධියෙහි සිටීමෙහිත් සමත්වෙයි, සමාධියෙන් නැගිටීමෙහිද සමත්වෙයි.

**21.** - (1) සමාධියෙහි සිටීමෙහි සමත්වෙයි. සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත් නොවෙයි. (2) සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත්වෙයි. සමාධියෙහි සිටීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි සිටීමෙහි සමත් නොවෙයි, සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත් නොවෙයි. (4) සමාධියෙහි සිටීමෙහි සමත් වෙයි, සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත්වෙයි.

**22.** - (1) සමාධියෙහි සිටීමෙහි සමත්වෙයි. සමාධියෙහි ආරම්මණයන්හි සමත් නොවෙයි. (2) සමාධියෙහි ආරම්මණයන්හි සමත්වෙයි. සමාධියෙහි සිටීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි සිටීමෙහි සමත් නොවෙයි, සමාධියෙහි ආරම්මණයන්හි සමත් නොවෙයි (4) සමාධියෙහි සිටීමෙහි සමත්වෙයි. සමාධියෙහි ආරම්මණයන්හි සමත් වෙයි.

**23.** - (1) සමාධියෙහි සිටීමෙහි සමත් වෙයි, සමාධියට සුදුසු කමටහන්හි සමත් නොවෙයි. (2) සමාධියට සුදුසු කමටහන්හි සමත්වෙයි. සමාධියෙහි සිටීමෙහි සමත් නොවෙයි (3) සමාධියෙහි සිටීමෙහි සමත් නොවෙයි. සමාධියට සුදුසු කමටහන්හි සමත් නොවෙයි, (4) සමාධියෙහි සිටීමෙහි සමත්වෙයි, සමාධියට සුදුසු කමටහන්හි සමත්වෙයි.

**24.** - සමාධියෙහි සිටීමෙහි සමත් වෙයි, සමාධිය අර්පණාවට පැමිණවීමෙහි සමත් නොවෙයි (2) සමාධිය අර්පණාවට පැමිණවීමෙහි සමත්වෙයි. සමාධියෙහි සිටීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි සිටීමෙහි සමත් නොවෙයි. සමාධිය අර්පණාවට පැමිණවීමෙහි සමත් නොවෙයි. (4) සමාධියෙහි

සිටීමෙහි සමත්වෙයි. සමාධිය අර්පණාවට පැමිණවීමෙහි සමත්වෙයි.

**25.** - සමාධියෙහි සිටීමෙහි සමත් වෙයි. සමාධියෙහි අර්පණාවට පැමිණීම සඳහා මනාකොට නොකරන්නේ වෙයි. (2) සමාධියෙහි අර්පණාවට පැමිණීම සඳහා මනාකොට කරන්නේ වෙයි. සමාධියෙහි සිටීමට සමත් නොවෙයි. (3) සමාධියෙහි සිටීමට සමත් නොවෙයි, සමාධියෙහි අර්පණාවට පැමිණීම සඳහා මනාකොට කරන්නේ නොවෙයි. (4) සමාධියෙහි සිටීමට සමත්වෙයි. සමාධියෙහි අර්පණාවට පැමිණීම සඳහා මනාකොට කරන්නේ වෙයි.

**26.** - (1) සමාධියෙහි පිහිටීමෙහි සමත් වෙයි. සමාධියෙහි අර්පණාවට පැමිණීම සඳහා නිතර කරන්නේ නොවෙයි (2) සමාධියෙහි අර්පණාවට පැමිණීම සඳහා නිතර කරන්නේ වෙයි. සමාධියෙහි පිහිටීමට සමත් නොවෙයි (3) සමාධියෙහි පිහිටීමට සමත් නොවෙයි. සමාධියෙහි අර්පණාවට පැමිණීම සඳහා නිතර කරන්නේ නොවෙයි. (4) සමාධියේ පිහිටීමෙහි සමත් වෙයි. සමාධියෙහි අර්පණාවට පැමිණීම සඳහා නිතර කරන්නේ වෙයි.

**27.** - (1) සමාධියෙහි සිටීමෙහි සමත් වෙයි. සමාධියට උපකාරක ධර්මයන් පිරීමට අසමත් වෙයි. (2) සමාධියට උපකාරක ධර්මයන් පිරීමට සමත්වෙයි. සමාධියෙහි සිටීමෙහි සමත් නොවෙයි, (3) සමාධියෙහි සිටීමෙහි සමත් නොවෙයි. සමාධියට උපකාරක ධර්මයන් පිරීමට සමත් නොවෙයි, (4) සමාධියෙහි සිටීමෙහි සමත් වෙයි, සමාධියෙහි උපකාරක ධර්මයන් පිරීමට සමත් වෙයි.

**28.** - (1) සමාධියෙහි සමවතින් නැගී සිටීමෙහි සමත් වෙයි. සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත් නොවෙයි. (2) සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත්වෙයි. සමාධියෙන් සමවතින් නැගී සිටීමෙහි සමත් වෙයි. (3) සමාධියෙහි සමවතින් නැගී සිටීමෙහි සමත් නොවෙයි, සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත් නොවෙයි. (4) සමාධියෙහි සමවතින් නැගී

සිටීමෙහිත් සමත්වෙයි, සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත් වෙයි.

**29.** - සමාධියෙහි සමවතින් නැගී සිටීමෙහි සමත්වෙයි. සමාධියෙහි ආරම්මණයන්හි සමත් නොවෙයි (2) සමාධියෙහි ආරම්මණයන්හි සමත්වෙයි, සමාධියෙහි සමවතින් නැගීසිටීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි සමවතින් නැගීසිටීමෙහි සමත් නොවෙයි, සමාධියෙහි ආරම්මණයන්හි සමත් නොවෙයි. (4) සමාධියෙහි සමවතින් නැගී සිටීමෙහි සමත් වෙයි. සමාධියෙහි ආරම්මණයන්හි සමත්වෙයි.

**30.** - (1) සමාධියෙහි සමවතින් නැගී සිටීමෙහි සමත් වෙයි, සමාධියට සුදුසු කර්මස්ථානයෙහිද යොග්‍ය පිණ්ඩපාතයෙහිද සමත් නොවෙයි. (2) සමාධියට සුදුසු කර්මස්ථානයන්හි යොග්‍ය පිණ්ඩපාතයෙහි සමත් වෙයි. සමාධියෙහි සමවතින් නැගී සිටීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි සමවතින් නැගී සිටීමෙහි සමත් නොවෙයි, සමාධියට සුදුසු කර්මස්ථානයන්හි යොග්‍ය පිණ්ඩපාතයෙහි සමත් නොවෙයි. (4) සමාධියෙහි සමවතින් නැගී සිටීමෙහි සමත් වෙයි. සමාධියට සුදුසු කර්මස්ථානයන්හි යොග්‍ය පිණ්ඩපාතයෙහි සමත් වෙයි.

**31.** - (1) සමාධියෙහි සමවතින් නැගී සිටීමෙහි සමත්වේ. සමාධියෙහි අර්පණාවට පැමිණවීමෙහි සමත් නොවෙයි. (2) සමාධියෙහි අර්පණාවට පැමිණවීමෙහි සමත්වෙයි. සමාධියෙහි සමවතින් නැගී සිටීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි සමවතින් නැගී සිටීමෙහි සමත් නොවෙයි, සමාධියෙහි අර්පණාවට පැමිණවීමෙහි සමත් නොවෙයි. (4) සමාධියෙහි සමවතින් නැගී සිටීමෙහි සමත්වෙයි, සමාධියෙහි අර්පණාවට පැමිණවීමෙහි සමත්වෙයි.

**32.** - (1) සමාධියෙහි සමවතින් නැගී සිටීමෙහි සමත්වේ. සමාධියෙහි සකසා කරන්නේ නොවෙයි. (2) සමාධියෙහි සකසා කරන්නේ වෙයි. සමාධියෙහි සමවතින් නැගී සිටීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි සමවතින් නැගී සිටීමෙහි සමත් නොවෙයි, සමාධියෙහි සකසා කරන්නේ නොවෙයි.

(4) සමාධියෙහි සමවතින් නැගී සිටීමෙහි සමත් වෙයි, සමාධියෙහි සකසා කරන්නේ වෙයි.

33. - (1) සමාධියෙහි සමවතින් නැගී සිටීමෙහි සමත් වෙයි, සමාධියෙහි නිතර කරන්නේ නොවෙයි. (2) සමාධියෙහි නිතර කරන්නේ වෙයි, සමාධියෙහි සමවතින් නැගී සිටීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි සමවතින් නැගී සිටීමෙහි සමත් නොවෙයි, සමාධියෙහි නිතර කරන්නේ නොවෙයි. (4) සමාධියෙහි සමවතින් නැගී සිටීමෙහි සමත් වෙයි. සමාධියෙහි නිතර කරන්නේ වෙයි.

34. - (1) සමාධියෙහි සමවතින් නැගී සිටීමෙහි සමත් වෙයි. සමාධියට උපකාරක ධර්මයන් පිරීමෙහි සමත් නොවෙයි. (2) සමාධියට උපකාරක ධර්මයන් පිරීමෙහි සමත්වෙයි. සමාධියෙහි සමවතින් නැගී සිටීමෙහි සමත් නොවෙයි, (3) සමාධියෙහි සමවතින් නැගී සිටීමෙහිද සමත් නොවෙයි. සමාධියට උපකාර ධර්මයන් නොකරන්නේද වෙයි. (4) සමාධියෙහි සමවතින් නැගී සිටීමෙහිද සමත්වෙයි. සමාධියට උපකාර ධර්මයන් පුරන්නේද වෙයි.

35. - (1) සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි දක්ෂවෙයි, සමාධියෙහි ආරම්මණයෙහි සමත් නොවෙයි. (2) සමාධියෙහි ආරම්මණයෙහි සමත්වෙයි, සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහිද සමත් නොවෙයි, සමාධියෙහි ආරම්මණයන්හිද සමත් නොවෙයි. (4) සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහිත් සමත්වේ, සමාධියෙහි ආරම්මණයෙහිත් සමත්වේ.

36. - (1) සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත් වෙයි, සමාධියට සුදුසු කමටහන්හි සහ පිණ්ඩපාතයෙහි සමත් නොවෙයි. (2) සමාධියට සුදුසු කමටහන්හි සහ පිණ්ඩපාතයෙහි සමත් වෙයි, සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත් නොවෙයි, සමාධියට සුදුසු කමටහන්හි සහ පිණ්ඩපාතයෙහි සමත් නොවෙයි. (4) සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සමත්වෙයි, සමාධියට සුදුසු කමටහන්හි සහ පිණ්ඩපාතයෙහි සමත්වෙයි.

37. - (1) සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත් වෙයි. සමාධිය අර්පණාවට පැමිණවීමට සමත් නොවෙයි. (2) සමාධිය අර්පණාවට පැමිණවීමට සමත් වෙයි. සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත් නොවෙයි, සමාධිය අර්පණාවට පැමිණවීමට සමත් නොවෙයි. (4) සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත්වෙයි, සමාධිය අර්පණාවට පැමිණවීමට සමත් වෙයි.

38. - (1) සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත් වෙයි. සමාධිය අර්පණාවට පැමිණවීම සඳහා මනාව ක්‍රියාකරන්නේ නොවෙයි. (2) සමාධිය අර්පණාවට පැමිණවීම සඳහා මනාව ක්‍රියාකරන්නේ වෙයි, සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත් නොවෙයි. සමාධිය අර්පණාවට පැමිණවීම සඳහා මනාව ක්‍රියා නොකරන්නේ වෙයි. (4) සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත්වෙයි. සමාධිය අර්පණාවට පැමිණවීම සඳහා මනාව ක්‍රියා කරන්නේ වෙයි.

39. - (1) සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත් වෙයි. සමාධිය අර්පණාවට පැමිණවීම සඳහා නිතර ක්‍රියා නොකරන්නේ වෙයි. (2) සමාධිය අර්පණාවට පැමිණවීම සඳහා නිතර ක්‍රියා කරන්නේ වෙයි, සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත් නොවෙයි, සමාධිය අර්පණාවට පැමිණවීම සඳහා නිතර ක්‍රියා කරන්නේ නොවෙයි. (4) සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත් වෙයි, සමාධිය අර්පණාවට පැමිණවීම සඳහා නිතර ක්‍රියාකරන්නේ වෙයි.

40. - (1) සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත් වෙයි, සමාධියට උපකාර දහම් සම්පූර්ණ නොකරන්නේ වෙයි (2) සමාධියට උපකාර දහම් සම්පූර්ණකරන්නේ වෙයි, සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත් නොවෙයි. (3) සමාධියෙහි සිත

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ශක්තිමත් කිරීමෙහි සමත් නොවෙයි, සමාධියට උපකාර දහම් සම්පූර්ණ කරන්නේ නොවෙයි. (4) සමාධියෙහි සිත ශක්තිමත් කිරීමෙහි සමත් වෙයි, සමාධියට උපකාර දහම් සම්පූර්ණ කරන්නේ වෙයි.

**41.** - (1) සමාධි ආරම්මණයන්හි දක්ෂ වෙයි, සමාධියට සුදුසු කමටහන්හි සහ සුදුසු පිණ්ඩපාතයෙහි සමත් නොවෙයි. (2) සමාධියට සුදුසු කමටහන්හි සහ පිණ්ඩපාතයෙහි සමත් වෙයි, සමාධි ආරම්මණයන්හි සමත් නොවෙයි. (3) සමාධි ආරම්මණයන්හිද අදක්ෂවෙයි, සමාධියට සුදුසු කර්මස්ථානයෙහි සහ පිණ්ඩපාතයෙහිද අදක්ෂ වෙයි. (4) සමාධි ආරම්මණයන්හිද දක්ෂවෙයි, සමාධියට සුදුසු කර්මස්ථානයන්හි සහ පිණ්ඩපාතයෙහිද දක්ෂවෙයි.

**42.** - (1) සමාධි ආරම්මණයන්හි දක්ෂවෙයි, සමාධි අර්පණාවට පැමිණවීමෙහි දක්ෂ නොවෙයි 62) සමාධිය අර්පණාවට පැමිණවීමෙහි දක්ෂවෙයි. සමාධි ආරම්මණයන්හි දක්ෂනොවෙයි. (3) සමාධි ආරම්මණයන්හි දක්ෂ නොවෙයි. සමාධිය අර්පණාවට පැමිණවීමෙහි දක්ෂ නොවෙයි. (4) සමාධි ආරම්මණයන්හි දක්ෂවෙයි, සමාධිය අර්පණාවට පැමිණවීමෙහි දක්ෂවෙයි.

**43.** - (1) සමාධි ආරම්මණයන්හි දක්ෂ වෙයි, සමාධිය අර්පණාවට පැමිණවීම සකසා නොකරන්නේ වෙයි (2) සමාධිය අර්පණාවට නැගීම හොඳින් කෙරෙයි, සමාධි ආරම්මණයන්හි දක්ෂ නොවෙයි. (3) සමාධි ආරම්මණයන්හි දක්ෂ නොවෙයි, සමාධිය අර්පණාවට නැගීම හොඳින් නොකෙරෙයි. (4) සමාධි ආරම්මණයන්හි දක්ෂවෙයි, සමාධිය අර්පණාවට නැගීම හොඳින් කෙරෙයි.

**44.** - (1) සමාධි ආරම්මණයන්හි දක්ෂ වෙයි, සමාධිය අර්පණාවට පැමිණවීම සඳහා නිතර ක්‍රියා නොකරන්නේ වෙයි. (2) සමාධිය අර්පණාවට පැමිණවීම සඳහා නිතර ක්‍රියාකරන්නේ වෙයි. සමාධි ආරම්මණයන්හි දක්ෂ නොවෙයි (3) සමාධි ආරම්මණයන්හි දක්ෂ නොවෙයි, සමාධිය අර්පණාවට

පැමිණවීම සඳහා නිතර ක්‍රියා නොකරන්නේ වෙයි (4) සමාධි ආරම්මණයන්හි දක්ෂවෙයි සමාධිය අර්පණාවට පැමිණවීම සඳහා නිතර ක්‍රියා කරන්නේ වෙයි.

**45.** - (1) සමාධි ආරම්මණයෙහි සමත් වෙයි. සමාධියට උපකාර ධර්මයන් පිරීමෙහි සමත් නොවෙයි. (2) සමාධියට උපකාර ධර්මයන් පිරීමෙහි සමත් වෙයි. සමාධි ආරම්මණයෙහි සමත් නොවෙයි. (3) සමාධි ආරම්මණයෙහි සමත් නොවෙයි, සමාධියට උපකාර ධර්මයන් පිරීමෙහි සමත් නොවෙයි. (4) සමාධි ආරම්මණයෙහි සමත්වෙයි, සමාධියට උපකාර ධර්මයන් පිරීමෙහි සමත් වෙයි.

**46.** - (1) සමාධියට සුදුසු කර්මස්ථානයන්හි හා පිණ්ඩපාතයෙහි සමත් වෙයි. සමාධිය අර්පණාවට පැමිණවීමෙහි සමත් නොවෙයි. (2) සමාධිය අර්පණාවට පැමිණවීමෙහි සමත්වෙයි. සමාධියට සුදුසු කර්මස්ථානයන්හි හා පිණ්ඩපාතයෙහි සමත් නොවෙයි. (3) සමාධියට සුදුසු කර්මස්ථානයන්හි හා පිණ්ඩපාතයෙහි සමත් නොවෙයි, සමාධිය අර්පණාවට පැමිණවීමෙහි සමත් නොවෙයි. (4) සමාධියට සුදුසු කර්මස්ථානයන්හි හා පිණ්ඩපාතයෙහි සමත් වෙයි, සමාධිය අර්පණාවට පැමිණවීමෙහි සමත් වෙයි.

**47.** - (1) සමාධියට සුදුසු කර්මස්ථානයන්හි හා පිණ්ඩපාතයෙහි දක්ෂ වෙයි, සමාධිය අර්පණාවට පැමිණවීමට මනාව ක්‍රියා නොකරයි. (2) සමාධිය අර්පණාවට පැමිණවීමට මනාව ක්‍රියා කරයි, සමාධියට සුදුසු කර්මස්ථානයන්හි හා පිණ්ඩපාතයෙහි දක්ෂ නොවෙයි. (3) සමාධියට සුදුසු කර්මස්ථානයන්හි හා පිණ්ඩපාතයෙහි දක්ෂ නොවෙයි, සමාධිය අර්පණාවට පැමිණවීමට මනාව ක්‍රියා නොකරයි. (4) සමාධියට සුදුසු කර්මස්ථානයන්හි හා පිණ්ඩපාතයෙහි දක්ෂ වෙයි, සමාධිය අර්පණාවට පැමිණවීමට මනාව ක්‍රියාකරයි.

**48.** - (1) සමාධියට සුදුසු කර්මස්ථානයන්හි හා පිණ්ඩපාතයෙහි දක්ෂවෙයි, සමාධිය අර්පණාවට පැමිණවීමෙහි නිතර ක්‍රියාකරන්නේ නොවෙයි. (2) සමාධිය අර්පණාවට

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පැමිණවීමෙහි නිතර ක්‍රියාකරන්නේ වෙයි. සමාධියට සුදුසු කර්මස්ථානයන්හි හා පිණ්ඩපාතයෙහි දක්ෂ නොවෙයි. (3) සමාධියට සුදුසු කර්මස්ථානයන්හි හා පිණ්ඩපාතයෙහි දක්ෂ නොවෙයි, සමාධිය අර්පණාවට පැමිණවීමෙහි නිතර ක්‍රියා කරන්නේ නොවෙයි. (4) සමාධියට සුදුසු කර්මස්ථානයන්හි හා පිණ්ඩපාතයෙහි දක්ෂවෙයි, සමාධිය අර්පණාවට පැමිණවීමෙහි නිතර ක්‍රියාකරන්නේ වෙයි.

**49.** - (1) සමාධියට සුදුසු කර්මස්ථානයන්හි හා පිණ්ඩපාතයෙහි දක්ෂවෙයි. සමාධියට උපකාර ධර්මයන් සම්පූර්ණ කරන්නේ නොවෙයි. (2) සමාධියට උපකාර ධර්මයන් සම්පූර්ණ කරන්නේ වෙයි. සමාධියට සුදුසු කර්මස්ථානයන්හි හා පිණ්ඩපාතයෙහි දක්ෂ නොවෙයි. (3) සමාධියට සුදුසු කර්මස්ථානයන්හි හා පිණ්ඩපාතයෙහි දක්ෂ නොවෙයි. සමාධියට උපකාර ධර්මයන් සම්පූර්ණ කරන්නේ නොවෙයි. (4) සමාධියට සුදුසු කර්මස්ථානයන්හි හා පිණ්ඩපාතයෙහි දක්ෂවේ. සමාධියට උපකාර ධර්මයන් සම්පූර්ණ කරන්නේ වෙයි.

**50.** - (1) සමාධිය අර්පණාවට පැමිණවීමෙහි සමත් වෙයි. සමාධිය අර්පණාවට පැමිණවීම සඳහා සකසා නොකරන්නේ වෙයි. (2) සමාධිය අර්පණාවට පැමිණවීම සඳහා සකසා කරන්නේ වෙයි. සමාධිය අපර්ණාවට පැමිණවීමෙහි සමත් නොවෙයි. (3) සමාධිය අපර්ණාවට පැමිණවීමෙහිද සමත් නොවෙයි සමාධිය අර්පණාවට පැමිණවීමෙහි සකසා කරන්නේද නොවෙයි. (4) සමාධිය අපර්ණාවට පැමිණවීමෙහි සමත් වෙයි. සමාධිය අපර්ණාවට පැමිණවීම සඳහා සකසා කරන්නේද වෙයි.

**51.** - (1) සමාධිය අර්පණාවට පැමිණවීමට සමත් වෙයි. සමාධිය අපර්ණාවට පැමිණවීමෙහි නිතර ක්‍රියාකරන්නේ නොවෙයි. (2) සමාධිය අර්පණාවට පැමිණවීමෙහි නිතර ක්‍රියාකරන්නේ වෙයි. සමාධිය අර්පණාවට පැමිණවීමට සමත් නොවෙයි. (3) සමාධිය අර්පණාවට පැමිණවීමට සමත් නොවෙයි. සමාධිය අර්පණාවට පැමිණවීමෙහි නිතර ක්‍රියාකරන්නේ නොවෙයි. (4) සමාධිය අර්පණාවට පැමිණවීමට

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සමත් වෙයි. සමාධිය අර්පණාවට පැමිණවීමෙහි නිතර ක්‍රියාකරන්නේ වෙයි.

52. - (1) සමාධිය අර්පණාවට පැමිණවීමෙහි සමත් වෙයි. සමාධියට උපකාර ධර්මයන් සම්පූර්ණ කරන්නේ නොවෙයි. (2) සමාධියට උපකාර ධර්මයන් සම්පූර්ණ කරන්නේ වෙයි. සමාධිය අර්පණාවට පැමිණවීමෙහි සමත් නොවෙයි. (3) සමාධිය අර්පණාවට පැමිණවීමෙහි සමත් නොවෙයි. සමාධියට උපකාර ධර්මයන් සම්පූර්ණ කරන්නේ නොවෙයි. (4) සමාධිය අර්පණාවට පැමිණවීමෙහි සමත් වෙයි. සමාධියට උපකාර ධර්මයන් සම්පූර්ණ කරන්නේවෙයි.

53. - (1) සමාධිය අර්පණාවට පැමිණවීම සකසා කරන්නේ වෙයි. සමාධිය අර්පණාවට පැමිණවීම සඳහා නිතර ක්‍රියා නොකරන්නේ වෙයි. (2) සමාධිය අර්පණාවට පැමිණවීම සඳහා නිතර ක්‍රියා කරන්නේ වෙයි. සමාධිය අර්පණාවට පැමිණවීම සඳහා සකසා නොකරන්නේ වෙයි. (3) සමාධිය අර්පණාවට පැමිණවීම සඳහා සකසා නොකරන්නේද වෙයි. සමාධිය අර්පණාවට පැමිණවීම සඳහා නිතර නොකරන්නේද (4) සමාධිය අර්පණාවට පැමිණවීම සඳහා සකසා කරන්නේද වෙයි. සමාධිය අර්පණාවට පැමිණවීම සඳහා නිතර කරන්නේද වෙයි.

54. - (1) සමාධිය ධ්‍යානයට පැමිණවීම සඳහා සකසා කරන්නේ වෙයි. සමාධියට උපකාර ධර්මයන් නුපුරන්නේ වෙයි. (2) සමාධියට උපකාර ධර්මයන් පුරන්නේ වෙයි. සමාධිය ධ්‍යානයට පැමිණවීම සඳහා සකසා කරන්නේ නොවෙයි. (3) සමාධිය ධ්‍යානයට පැමිණවීම සඳහා සකසා කරන්නේ නොවෙයි. සමාධියට උපකාර ධර්මයන් පුරන්නේ නොවෙයි (4) සමාධිය ධ්‍යානයට පැමිණවීම සඳහා කරන්නේ වෙයි. සමාධියට උපකාර ධර්මයන් පුරන්නේ වෙයි.

55. - (1) සමාධිය අර්පණාවට පැමිණවීම සඳහා නිතර කරන්නේ වෙයි. සමාධියට උපකාර ධර්මයන් පුරන්නේ වෙයි. (2) සමාධියට උපකාර ධර්මයන් පුරන්නේ වෙයි. සමාධිය අර්පණාවට පැමිණවීම සඳහා නිතර නොකරන්නේ වෙයි.

පටුන



(3) සමාධිය අර්පණාවට පැමිණවීම සඳහා නිතර කරන්නේ නොවෙයි. සමාධියට උපකාර ධර්මයන් නුපුරන්නේ වෙයි. (4) සමාධිය අර්පණාවට පැමිණවීම සඳහා නිතර කරන්නේද වෙයි. සමාධියට උපකාර ධර්මයන් පුරන්නේ වෙයි.

**(ධ්‍යායී සංයුත්තය නිමි.)**

**ඛන්ධක වර්ගය නිමි.**